බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 13.

සූත්‍රාන්තපිටකයෙහි

07 වන ග්‍රන්ථය

සංයුත්තනිකාය

ප්‍රථම භාගය

සගාථවග්ගය

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන් ත්‍රිපිටක පරිවර්තන
කාරක සභාවේ

සංයුත්තනිකාය සංශෝධක මණ්ඩලය
විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Buddha Jayanti Tripitaka Series, Volume 13

The Seventh Book in the

Suttanta-Pitaka

7

SAMYUTTANIKĀYA (I)

With the Sinhala translation by

The Samyuttanikāya Editorial Board
of
The Tripitaka Translation Committee

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

"අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ගලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ වීත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග එල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට,ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"

(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

සුත්තන්තපිටකෙ

සංයුත්තනිකායො

පඨමො භාගො

සගාථවග්ගො

සූත්‍රාන්තපිටකයෙහි

සංයුත්තනිකාය

ප්‍රථමභාගය

සගාථවර්ගීය

“තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො”–

“මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො බබලයි.”

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

පටුන

CONTENTS

				පිටුව
සංස්කාරක නිවේදනය	...	...	...	I
ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලය		...	...	II
උත්තරීතර සංස්කාරක මණ්ඩලය		...	...	II
සංයුත්තනිකාය සංශෝධක මණ්ඩලය		...	...	II
සංඥාපනය ...	...	...	...	III
සංකේත නිරූපණය — ABBREVIATIONS			...	VII
පාළිහෝඩිය — PĀLI ALPHABET		...	...	VIII
සගාථවග්ග විෂයසූචි	...	...	...	IX-XVII
පෙළ හා පරිවර්තනය	...	...	...	2-429
ගාථාදිපාදානුක්කමණිකා	...	...	...	430-440
සද්දනාමානුක්කමණිකා	...	...	...	441-445
පදානුක්කමණිකා	...	...	...	446-506

සංස්කාරක නිවේදනය

ත්‍රිපිටකපාළියෙහි සූත්‍රාන්තපිටකයට අයත් **සංයුත්සඟියෙහි සගාථ-වග්ගපාළිය** සිංහලභාෂාවට පරිවර්තනය කරණු සඳහා **ලංකා බෞද්ධ-මණ්ඩලය** විසින් – දැනට විද්‍යොදය විශ්වවිද්‍යාලයෙහි බුද්ධධර්මාධ්‍යයනෙන්ද්‍රියයෙහි විනේතෘ වූ පණ්ඩිත **පලන්නොරුවේ විමලධම්ම** නායකස්ථවිරයන් වහන්සේ වෙත පවරණලදී. එහෙත් ඒ කාර්‍ය්‍යය නිමහම් නොවූ බැවින් **ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකසභාවේ** සංයුත්තනිකාය සංශොධක මණ්ඩල-යට ඇතුලත් පණ්ඩිත **හෑගොඩ ධම්මින්ද** නායකස්ථවිරයන්වහන්සේ, පණ්ඩිත **වතුගෙදර අමරසීහ** ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත **ගලගම සරණඞ්කර ස්ථවිරයන් වහන්සේ යන තෙනම විසින් ඒ කොටස පරිවර්තනය කොට පෙළත් සමග මැනැවින් ලියා මුද්‍රණයට සකස් කරණ ලදී.**

ත්‍රිපිටකපරිවර්තන සංස්කරණය පිළිබඳ **උත්තරීතර මණ්ඩලය** විසින් සම්මත වූ පරිදි පණ්ඩිත **කෝදාගොඩ ඤාණාලෝක** නායක ස්ථවිරයන් වහන්සේ විසින් මුද්‍රණාවස්ථාවෙහි සංශෝධිත වූ මේ ග්‍රන්ථය අපගේ සංවිධානයෙන් හා අවසාන සංස්කරණයෙන් මෙසේ මුද්‍රණයට පමුණුවන ලදී.

ධර්මශාස්ත්‍රවිෂයෙහි නිපුණ වූ ආශුබොධබුද්ධිප්‍රභා ඇති **කෝදාගොඩ ඤාණාලෝක** යතීන්ද්‍රයන් වහන්සේ විසින් ත්‍රිපිටකපාල්‍යාගත පඤ්චමහා නිකායාශය සංක්ෂිප්ත කොට මෙයට ලියූ සංඥපනය ග්‍රන්ථගෞරවනිර්ණය-කරණු පිණිස පර්‍ය්‍යාප්ත වේ මැයි. එහෙයින් ග්‍රන්ථතත්ත්වය පිළිබඳ අමුතු ප්‍රපඤ්චකථා මෙහි නොයෙදේ.

පරිවර්තක ස්ථවිරවරුන් විසින් සම්පාදිත ගාථාදිපාද-සංඥනාම – පදානු-ක්‍රමණිකා සහිත වූ මේ ග්‍රන්ථය පිළිබඳ මූලිකශොධ්‍යපත්‍ර බැලීමෙන් පණ්ඩිත **ගලගම ධම්මික** ස්ථවිරයන් වහන්සේ ද අතිරේක වශයෙන් සහාය වූහ.

සිංහල ජාතිය මුද්‍රණාලයෙහි අධිකාරී වූ **සීමාසහිත ස්වදේශී ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ** මහතුන්ගේ උත්සාහයෙන් නො බෝකලෙකින් මුද්‍රිත වූ සංයුත්සඟියේ **සගාථවග්ගය** අවසන් කොට ඇති මේ ප්‍රථම භාගය **බුද්ධ-ජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලාවේ** 13 වන ග්‍රන්ථය වශයෙන් ප්‍රසිද්ධියට පැමිණ වූ **ලංකා ආණ්ඩුව** හා එහි **සාංස්කෘතික කාර්‍ය්‍යාංශයේ** අධිකාරී මහතුන් ද, මෙහි පරිවර්තන – සංශොධන – සංස්කරණකාර්‍ය්‍යයන්හි යෙදුනු මහතෙරුන් ද ශාසනසංස්ථාපනාධිකාරයට හා ශ්‍රේෂ්ඨ වූ ධර්මදානමය පුණ්‍යමහිමයට භාගී වන බව මෙහි ලා ප්‍රකාශ කරම්හ.

පරවාහැර වජිරඤාණ ස්ථවිර.

ත්‍රිපිටකපරිවර්තන කාරක සභාවෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද සම්පාදක.

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 17 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:17 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකමණ්ඩලය

---

1. වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ (සභාපති),
2. පරවාහැර වජිරඤාණ නායක ස්ථවිරයන් වහන්සේ (සම්පාදක),
3. කොසෙල්වතුගොඩ රතනජෝති නායක ස්ථවියන් වහන්සේ,
4. බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහා නායක ස්ථවිරයන් වහන්සේ,
5. හාල්දඹුවත ධම්මරක්ඛිත ස්ථවිරයන් වහන්සේ,
6. අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ,
7. කඩවැද්දුව සිරිනිවාස නායක ස්ථවිරයන් වහන්සේ,
8. පලන්නොරුවේ විමලධම්ම නායක ස්ථවිරයන් වහන්සේ,
9. දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ,
10. වේරගොඩ අමරමෝලි නායක ස්ථවිරයන් වහන්සේ,
11. පරවාහැර පඤ්ඤානන්ද ස්ථවිරයන් වහන්සේ,
12. ගලගම සරණඞ්කර ස්ථවිරයන් වහන්සේ,
13. හැගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ,
14. කටුකුරුන්දේ දේවානන්ද නායක ස්ථවිරයන් වහන්සේ,
15. ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
16. කෝදාගොඩ ඤාණාලෝක නායක ස්ථවිරයන් වහන්සේ,
17. අකුරැටියේ අමරවංශ නායක ස්ථවිරයන් වහන්සේ,
18. මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේ,
19. කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ,
20. වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේ,
21. ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ,
22. මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්ථවිරයන් වහන්සේ,
23. කොස්ගොඩ ධම්මවංස ස්ථවිරයන් වහන්සේ,
24. තලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ,

උත්තරීතරසංස්කාරකමණ්ඩලය

1. පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ,
2. ආචාර්ය පරවාහැර වජිරඤාණ නායක ස්ථවිරයන් වහන්සේ,
3. බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහා නායක ස්ථවිරයන් වහන්සේ,
4. පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
5. පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක නායක ස්ථවිරයන් වහන්සේ,

සංයුත්තනිකායසංශෝධකමණ්ඩලය

1. පණ්ඩිත හැගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ,
2. පණ්ඩිත වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේ,
3. පණ්ඩිත ගලගම සරණඞ්කර ස්ථවිරයන් වහන්සේ,

සංඥාපනය

---

1. **සංයුත්තනිකාය:**

අප බුදුන් පන්සාලිස් අවුරුද්දක් දවස් සිට දහම් අමාවහරෙ වස්වමින් සුවිසි අසඞ්ඛ්‍යයක් දෙව්මිනිසුන් අමාමහනිවන් දක්වා පිරිනිවිසඳ, මහාකාශ්‍යප මහරහතුන් ආදි සම්සක්ෂශ්‍රාවකයෝ පන්සියක් දෙනාවහන්සේ දේශ - කාල- නිදන ආදි විසින් විසිරැ සිටි ඒ ඒ දහම්මල් මල්වැලක් සෙයින් සගන්මින් පළමු වන සඞ්ගීතිය කළහ.

ඒ සඟායෙහි දී දීඝ - **මජ්ඣිම** - **සංයුත්ත** - **අඞ්ගුත්තර** - **ඛුද්දක** විසින් ආගම පසෙකින් සුතන්වලා බෙදූ තැබූහ. එහි දීඝප්‍රමාණ සූත්‍රයන් මුල් කොට ගෙතූ ගත් 'දීඝාගම' නම් වෙයි. මධ්‍යම ප්‍රමාණ සූත්‍රයන් මුල් කොට ගෙන ගෙතූ ගත් 'මජ්ඣිමාගම' නම් වෙයි. උත්තරෝත්තරයෙහි එකකදුකාදි විසින් අඞ්ග තැඟ ගත් සූත්‍රයන් මුල් කොට ගෙන ගෙතූ ගත් 'අඞ්ගුත්තරාගම' නම් වෙයි.

මෙහි පමණින් කියන තතස පිණිසැ හැඳගත් තෙල මාතක්‍රමයට නො බැසියැහෙන සූත්‍රයෝ සත්දහස් සත්සිය දෙසැට දෙනෙක් ඇත. ඒ සූත්‍රයෝ දීඝාගමයෙහි දු මජ්ඣිමාගමයෙහි දු අඞ්ගුත්තරාගමයෙහි දු නොබැස ගනිති. ඔවුන් එක්රැස් කොට ගෙතූ ගත් **සංයුත්තාගම** නම් වෙයි. එ ද, සගාථවග්ග යැ නිදානවග්ග යැ ඛන්ධකවග්ග යැ සළායතනවග්ග යැ මහාවග්ග යැ යි වග්ග විසින් පසෙක් වෙයි. සගාථවග්ගයෙහි එකොළොස් දෙනෙකැ, නිදානවග්ගයෙහි නවදෙනෙකැ, ඛන්ධකවග්ගයෙහි තෙළෙස් දෙනෙකැ, සළායතනවග්ගයෙහි නවදෙනෙකැ, මහාවග්ගයෙහි දොළොස්-දෙනෙකැ යි, සංයුක්තයෝ සූපනස්දෙනෙක් වෙති. ඒ සංයුක්තයෝ සූපනස්-දෙනා ගොස් අන්තරවගී විසින් දෙසිය අටවිසිදෙනෙක් වෙති. ඒ අන්තර-වගීයෝ දෙසිය අටවිසිදෙනා ගොස් සූත්‍ර විසින් සත්දහස්සත්සියදෙසැටදෙනෙක් වෙති. ඒ සූත්‍රයෝ සත්දහස්සත්සියදෙසැටදෙනා ගොස් අක්ෂර විසින් ලක්ෂයෝ අටදෙනෙක් වෙති. බණවරෙක් නම් අකුරු අටදහසෙක් වේ නු යි මෙ හැම බණවර විසින් සියෙකි. මේ යැ **සංයුත්තාගම** නම්.

“**ආගමිස්සන්ති අත්තත්ථපරත්ථාදයො එතෙනා’ති ආගමො**”යි ආපූර් 'ගම්' ධාතුයෙන් කරණසාධනයෙහි ලා නිරුක්ති කියත් මැ, ආත්මාර්ථපරාර්ථා-දිය තිලින් ලබත් නු යි මෙහි '**ආගම**' ශබ්දය අර්ථසිද්ධියෙහි කරණත්ව හෙළි කරන්නේ යැ. **ඔඝතරණාදි** සූත්‍රරාශිය වැදූගෙනැ සිටුනා **දෙවතා සංයුත්තාදි** සංයුක්තයන් යථොක්තාර්ථයෙහි කරණ වන බැවිනුදු, වගීවශයෙන් සංයුක්ත වන බැවිනුදු, දීඝාගමාදිය සෙයින් '**සංයුත්තාගම**' යනු අන්වර්ථ-සංඥායෙකි.

“**සංයුත්තනිකාය**” ආදි විසින් එන ශාසනව්‍යවහාර පිණිසැ **ඔහොවගට** ලියූ ප්‍රස්තාවනාව බලන්නේ යැ. තෙවළායෙහි වසරද, ගණපාමොක්, ආචාර්‍ය **පරවාහැර වජිරඤාණ හිමිපාණෝ** ඒ ඒ සසුන් වහර ගෙනැ ඒ ප්‍රස්තාවනා-යෙහි ලා මියුරු අරුත් දක්වති. ඒ ප්‍රස්තාවනාව පරවාද මථනය කරන්නේ

මතු නො වෙයි. ත්‍රිපිටකයෙහි ග්‍රන්‍ථ පිළිබඳ හැම පවත් ද විශද කරන්නේ යැ. එයින් ලැබියැහෙන එළිය තිබියැ දී තව තව කරුණු කියනු නිෂ්ප්‍රයෝජන වෙයි. සඟි පිණිසැ විසිතුරු අරුත් දනු කැමැතියන් ඒ ප්‍රස්තාවනාව බලන්නේ යැ.

2. **විශිෂ්ටතා:**

සංයුත්තාගමයෙහි විශිෂ්ටතා කියනු කැමැතියනට බුද්ධඝෝෂාචාරීන් වහන්සේගේ පදයෙදුම්හු උවදෙස් එළවති. ඔබ දීඝාගමයට අටුවා කරනුවෝ-

“දීඝස්ස දීඝසුත්තඞ්කිතස්ස නිපුණස්ස ආගමවරස්ස
බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස සද්ධාවහගුණස්ස”

යනු කියති.

මජ්ඣිමාගමයට අටුවා කරනුවෝ-

“මජ්ඣිමපපමාණ සුත්තඞ්කිතස්ස ඉධ මජ්ඣිමාගම වරස්ස
බුද්ධානුබුද්ධ සංවණ්ණිතස්ස පරවාදමථනස්ස”

යනු කියති.

සංයුත්තාගමයට අටුවා කරනුවෝ-

“සංයුත්තවග්ග පතිමණ්ඩිතස්ස සංයුත්ත - ආගමවරස්ස
බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස ඤාණප්පභෙදජනනස්ස”

යනු කියති.

අඞ්ගුත්තරාගමයට අටුවා කරනුවෝ-

“එකකදුකාදි පතිමණ්ඩිස්ස අඞ්ගුත්තරාගමවරස්ස
ධම්මකථිකපුඞ්ගවානං විචිත්තපටිභාණජනනස්ස”

යනු කියති.

මෙහි දී ශ්‍රද්ධාවහගුණය ගෙනැ දීඝාගමයත්, පරවාදමථනය ගෙනැ මධ්‍යමාගමයත්, ඥානප්‍රභේද ජනනය ගෙනැ සංයුක්තාගමයත්, ධර්මකථිකයනට විචිත්‍ර ප්‍රතිභාජනනය ගෙනැ අඞ්ගොත්තරාගමයත් වර්ණිතා කෙරෙති.

එයින් සංයුක්තාගමය ප්‍රභේදගතඥානසම්පත් උදකරනසෙ දක්වති. ලෞකික ලොකොත්තරාර්ථයන් ඇසිරි කොට සිටුනා නන් පැන පිළිවිසුම් හා විසඳුම් නෙල ආගමයෙහි බෙහෙවින් එන හෙයින් ඥානප්‍රභෙද දෙනසෙ ස්තොත්‍ර කරනු අත්‍යර්ථයෙන් මැ සරිත වෙයි. බුද්ධඝෝෂාචාරීන් වහන්සේගේ ප්‍රඥයෙහි පාටවය විමසන්නට සිතූ **මහවෙහෙර** අධිවැසි තෙවළාධර මහ-තෙරහු දු සංයුත්සඟියෙන් ගත් ගයක් දී ඔබගේ පැනවෙසෙස් විමසූහ. තෙවළාමැදුරෙහි නො නිවෙන පහන් වන **විශුද්ධිමාර්ගය** ඒ දුන් ගයෙහි ඵලය වෙයි. මහාසඞ්ඝිකාදි සප්තදශනිකායවාසීන් හා හෛමවතාදි නවනිකාය-වාසීන්ගේ ප්‍රවාදප්‍රහාර වළහමින් මහවෙහෙරට රකවල ගත් බලකොටු වන ‘විශුද්ධිමාර්ගී’ය සංයුත්සඟියෙහි එක් ගයෙකින් මතුකොට දුන් ධර්මවිෂයක ඥානප්‍රභේදජනනශක්තිවිශේෂයක්සේ කියැ හෙන්නේ යැ. එයින් නෙල සඟියෙන් උදදෙන ඥානප්‍රභේද නම් විදර්ශනා මතු නොවෙයි. එයින් නන්-නන් කාරණයෙහි විචිත්‍රප්‍රතිභා ද සඟන්නේ යැ. මේ සංයුක්තාගමයෙහි **විශිෂ්ටතා** වෙයි.

බෙහෙවින් කිම! ප්‍රථමසඞ්ගීතියෙහි ලා ප්‍රමුඛ වැ සිටි මහසුබු මහරහත්හට 'සංයුක්තාගමය' දක්වා දුන්හ. ඔබගේ ශිෂ්‍යප්‍රශිෂ්‍යයෝ සංයුත්සඟිය වනපොත් කරමින් ඇදුරෙල් නො විහිදූ අරුත් ධරමින් රැකැගත්හ. සඞ්ගීතිය අවසන්හි සමස්තමහාක්ෂීණාස්‍රවශ්‍රාවකසංහතියෙහි පෙරට වැ සිට ප්‍රථම සඞ්ගීතිය නිමහම් කළ මහාපුරුෂයාණනට ප්‍රථමභාග විසින් වෙන් කොට ගෙනැ පිරිනමනු පිණිසැ සංයුත්සඟිය පමණ වියැ. එ ද මෙහි විශිෂ්ටතා කියන්නේ යැ.

3. ප්‍රයොජනවිශෙෂ:

බුද්ධභාෂිත යැ, ශ්‍රාවකභාෂිත යැ, දේවභාෂිත යැ, ඍෂිභාෂිත යැ යන මෙසින් ආප්තවචනයක් වුවමනා වත් මැ සංයුත්සඟිය එහි නිදහනක් වැන්නැ. ඒ ඒ කරුණෙහි ලා චතුර්භාෂිතයෝ මැ මෙහි බැසැ සිටුති. ලෞකිකයන් හා ශාසනිකයනට ආත්මාර්ථපරාර්ථසංසිද්ධිය පිණිසැ තැබුව මනා උපදේශරත්නයෝ සියදහස් විසින් මෙහි ඇත. ස්කන්ධධාතුආයතන ඉන්ද්‍රියබලබොධ්‍යඞ්ග ආර්‍ය්‍යසත්‍ය ප්‍රත්‍යයාකාර ආදි ධර්මමාර්ගයන් ආගම සතරෙහි ම එතු දු සුගම උපදේශ අතින් බලත් මැ සංයුක්තාගමය ආඪ්‍ය වන්නේ යැ. තුරුවැල සහ මූ ගුවන්තල සෙයින් උපදෙශරත්නජාතයෙන් සංයුත්සඟිය සැදුණේ යැ. එයින් මැ දේශකයන් කෙරෙහි දු උපදේශකයන් කෙරෙහි දු තෙල සඟිය හත්සරක් විසින් තරතුරු තෙවුනේ වෙයි. ව්‍යාස වශයෙන් පරිකථා කරනට නිසි ගැඹුරු අරුත් ගබ් කොට සිටුනා, මනෝහර පදවැලෙන් සැදි ගාථා දේශනා විමසත් මැ, පමණින් අබැටක් සා වුව ද වීර්‍ය්‍යයෙන් පැතිරැ සිටුනා භේෂජයක් සෙයින් ධර්මදේශකයනට වෙසෙසින් හැමදෑ වැඩදෑ වෙයි.

4. ව්‍යාඛ්‍යානය:

නිකායාන්තරවාසීන් සංයුක්තාගමය වෛදිකභාෂායෙන් ලියූසෙ ලොව පළට වෙයි. ඒ මහායානවාදීන් කිසිතැනෙක අර්ථවිපරීත කොට ලියූ සංයුක්තයන් චීනදේශවාසීන් සියබසින් අරවාගත් බව ද පළට වෙයි. චීනබසින් ලියූ 'සගාථවර්ගය' අදත් එ රට ඇතිබව කියති. ඒ ව්‍යාඛ්‍යාන පෙළපොත හා සසඳත් මැ අර්ථ විසින් භේදකර තැන් ඇත යනු අසිරි නොවෙයි. මිහිඳු මාහිමිහු බුදුකැලි අටුවා හා තෙවළා හෙළදිවට අළුහ. මගධබසින් වැටෙමින් ආ බුදුකැලි අටුවා හෙළදිව ඇදුරෝ හෙළබසින් තැබූහ. ඇදුරු බුදුඝොස්මහතෙරහු ද්වීපාන්තරවාසීන්ගේ ප්‍රයෝජනය පිණිසැ ඒ අටුවා යළිදු පෙළබසින් තැබූහ. අද හෙළටුවා නැත ද පෙළෙහි අර්ථාවබෝධය පිණිසැ පාළිඅටුවා වහල් වෙයි. ඒ වහලින් තෙවළාදහම සියබසින් අරවාතබන මෙ දවස තෙල සංයුත්සඟිය පිණිසැ ද ඒ වහල මිසැ වෙන නැත. එයින් වහල් ලැබ කරන තෙල ව්‍යාඛ්‍යානය මූලැ කී නිකායාන්තරවාසීන්ගේ ව්‍යාඛ්‍යාන සෙයින් විපරීතාර්ථ ඇතියේ නොවෙයි. මහාවිහාරවාසීන්ගේ වාචනාමාර්ගය නිඃශ්‍රය කොට සිටියෙන් අර්ථ විසින් මෙහි පරම්පරාශුද්ධි ඇත.

මෙ වරැ පළකරන 'සගාථවර්ග' යෙහි සංයුක්තයෝ එකොළොස්දෙනෙකි. වර්ගයෝ අටවිසිදෙනෙකි. සූත්‍රයෝ දෙසියඑක්සැත්තෑ දෙනෙකි. මෙ හැම මෙහි සියබසින් අරවා තබන ලදී. යටගිය දවස සූත්‍රපිටකය සියබසින් ලියූබව පළට වැ ඇත ද, අද ඒ කිසිදු දක්නට නැත. එයින් එහි භාෂාප්‍රයොග ගැන කිසිදු නොකිය හෙන්නේ යැ. තෙල ව්‍යාඛ්‍යානය

භාවාර්ථප්‍රධාන කොට ගෙන ව්‍යක්තභාෂායෙන් සැපයිණ. කිසි තැනෙක පැරණි හෙළවදන් යොදනු 'සිංහලසාහිත්‍ය'ය දියුණු කරනු පිණිසැ වෙයි. එයින් තෙල ව්‍යාඛ්‍යානය ධම්දෙසනය පිණිසැ ද සිඟබස සදනු පිණිසැ ද වෙයි.

තෙවළා දහම සිඟබසින් තබනුයේ හෙළදිව් වැසියනට වැඩ සඳහා මැ වෙයි. බුදුන් පිරිනිවි දෙවාදහස් පන්සියක් ගිය ද මෙතෙක් දවස් කිසිවක්හු විසිනුදු තෙල ශාසනාර්ථය සපුරා නොකරන ලදී. දැන් එය සම්පූර්ණ වනසේ පෙනේ. එයින් හැමදෙන මේ ව්‍යාඛ්‍යාන මාර්ගයෙන් දහම් දැන ඉගෙන කුසල්දහම්හි යෙදෙමින් උභයලෝකාර්ථසිද්ධිය හා අමාමහනිවන් සිදුකරැ ගනිත්වයි පතම්හ.

කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිර.
විද්‍යාවංශ පිරිවෙන,
අහංගම.

සඞ්කෙතනිරූපණය

ABBREVIATIONS

සී. 1. —— 'පැල්මඩුල්ල' මහාවිහාර - සීහල තාලපණ්ණ පොත්ථකං

සී. 2. —— 'ගාල්ල' පරමානන්දවිහාර - සීහල තාලපණ්ණ පොත්ථකං

සීමු. 1. —— බණ්ඩරමුල්ලේ අමරසීහථෙර සංසොධිත-සීහලක්ඛර මුද්දිත පොත්ථකං

සීමු. 2. —— බෞද්ධසම්මෙලන - සීහලක්ඛර මුද්දිත පොත්ථකං

ස්‍යා. —— ස්‍යාමක්ඛර - මුද්දිත පොත්ථකං

මඡසං. —— මරම්මඡට්ඨසඞ්ගීති පිටක පොත්ථකං

PTS. —— Pali Text Society–Saṃyutta Nikāya

THE PĀLI ALPHABET

IN SINHALESE CHARACTERS.

VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

CONSONANTS

කka	ඛkha	ගga	ඝgha	ඞṅa
චca	ඡcha	ජja	ඣjha	ඤña
ටṭa	ඨṭha	ඩḍa	ඪḍha	ණṇa
තta	ථtha	දda	ධdha	නna
පpa	ඵpha	බba	භbha	මma

යya රra ලla වva සsa හha ළḷa අංṃ

කka	කාkā	කිki	කීkī	කුku	කූkū	කෙkē	කොkō
ඛkha	ඛාkhā	ඛිkhi	ඛීkhī	ඛුkhu	ඛූkhū	ඛෙkhē	ඛොkhō
ගga	=	=	=	=	=	=	=

Conjunct - Consonants

ක්කkka	ඤ්ඤñña	ත්‍රtra	ම්ඵmpha
ක්ඛkkha	ණ්හṇha	ද්දdda	ම්බ, ම්බmba
ක්‍යkya	ඤ්චñca	ද්ධ, ද්ධddha	ම්භmbha
ක්‍රිkri	ඤ්ඡ, ඤ්ඡñcha	ද්‍රdra	ම්මmma
ක්වkva	ඤ්ජ, ඤ්ජñja	ද්ව, ද්වdva	ම්හmha
ඛ්‍යkhya	ඤ්ඣñjha	ධ්වdhva	ය්‍ය, ය්යyya
ඛ්වkhva	ට්ටṭṭa	න්තnta	ය්හyha
ග්ගgga	ට්ඨ, ට්ඨṭṭha	න්ථntha	ල්ලlla
ග්ඝggha	ඩ්ඩḍḍa	න්දnda	ල්‍යlya
ඞ්කṅka	ඩ්ඪḍḍha	න්ධndha	ල්හlha
ග්‍රgra,	ණ්ණṇṇa	න්නnna,	ව්හwha
ඞ්ඛṅkha	ණ්ටṇṭa	න්හnha	ස්සssa
ඞ්ගṅga	ණ්ඨṇṭha	ප්පppa	ස්මsma
ඞ්ඝṅgha	ණ්ඩ, ණ්ඩṇḍa	ප්ඵppha	ස්වsva
ච්චcca	ණ්හṇha	බ්බbba	හ්මhma
ච්ඡccha	ත්තtta	බ්භbbha	හ්වhva
ජ්ජjja	ත්ථttha	බ්‍රbra	ළ්හḷha
ජ්ඣjjha	ත්වtva	ම්පmpa	

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ො ō

සංයුත්තනිකායො

සගාථවග්ග - විෂයසූචි

විෂයා:				පිට්ඨඞ්කානි
	1. දෙවතාසංයුත්තං			**1 - 84**
	1. නළවග්ගො			**1 - 10**
1. ඔඝතරණ	සුත්තං	...	...	1 - 4
2. නිමොක්ඛ	,,	...	...	4
3. උපනීයති	,,	...	...	4
4. අච්චෙන්ති	,,	...	...	6
5. කතිඡින්ද	,,	...	...	6
6. ජාගර	,,	...	...	6
7. අප්පටිවිදිත	,,	...	...	8
8. සුසම්මුට්ඨ	,,	...	...	8
9. නමානකාම	,,	...	...	8
10. අරඤ්ඤ	,,	...	...	10
	නළවග්ගො පඨමො.			
	2. නන්දනවග්ගො			**10 - 24**
11. නන්දන	සුත්තං	...	...	10
12. නන්දති	,,	...	...	12
13. නත්ථිපුත්තසම	,,	...	...	12
14. ඛත්තිය	,,	...	...	12
15. සණමාන	,,	...	...	14
16. නිද්දාතන්දි	,,	...	...	14
17. දුක්කර	,,	...	...	14
18. හිරි	,,	...	...	16
19. කුටිකා	,,	...	...	16
20. සමිද්ධි	,,	...	...	18 - 24
	නන්දනවග්ගො දුතියො.			
	3. සත්තිවග්ගො			**24 - 32**
21. සත්ති	සුත්තං	...	...	24
22. ඵුසති	,,	...	...	24
23. ජටා	,,	...	...	26
24. මනොනිවාරණ	,,	...	...	26
25. අරහන්ත	,,	...	...	26 - 28
26. පජ්ජෝත	,,	...	...	28
27. සර		...	...	30

28.	මහද්ධන	සුත්තං	...	...	30
29.	චතුචක්ක	,,	...	...	30
30	එණිජඞ්ඝ	,,	...	...	32

සත්තිවග්ගො තතියො.

4. සතුල්ලපකායිකවග්ගො **32 - 54**

31.	සබ්භි	සුත්තං	...	...	32 - 34
32.	මච්ඡරි	,,	...	...	36 - 38
33.	සාධු	,,	...	...	38 - 40
34.	නසන්ති	,,	...	...	40 - 42
35.	උජ්ඣානසඤ්ඤි	,,	...	...	42 - 46
36.	සද්ධා	,,	...	...	46
37.	සමය	,,	...	...	46 - 48
38.	සකලික	,,	...	...	48 - 52
39.	පජ්ජුන්නධීතු	,,	...	...	52 - 54
40.	චුල්ලපජ්ජුන්නධීතු	,,	...	...	54

සතුල්ලපකායිකවග්ගො චතුත්ථො.

5. ආදිත්තවග්ගො **56 -64**

41.	ආදිත්ත	සුත්තං	...	...	56
42.	කිංදද	,,	...	...	56
43.	අන්න	,,	...	...	58
44.	එකමූල	,,	...	...	58
45.	අනොම	,,	...	...	58
46.	අච්ඡරා	,,	...	...	58
47.	වනරොප	,,	...	...	60
48.	ජෙතවන	,,	...	...	60
49.	මච්ඡරි	,,	...	...	60 - 62
50.	ඝටීකාර	,,	...	...	62 - 64

ආදිත්තවග්ගො පඤ්චමො.

6. ජරාවග්ගො **66–70**

51.	ජරා	සුත්තං	...	...	66
52.	අජරසා	,,	...	...	66
53.	මිත්ත	,,	...	...	66
54.	වත්ථු	,,	...	...	66 - 68
55.	පඨමජනෙති	,,	...	...	68
56.	දුතියජනෙති	,,	...	...	68
57.	තතියජනෙති	,,	...	...	68
58.	උප්පථ	,,	...	...	70
59.	දුතියා	,,	...	...	70
60.	කවි	,,	...	...	70

ජරාවග්ගො ඡට්ඨො.

7. අද්ධවග්ගො — 72 - 76

61.	නාම [අද්ධභවි]	සුත්තං	...	...	72
62.	චිත්ත	,,	...	...	72
63.	තණ්හා	,,	...	...	72
64.	සංයොජන	,,	...	...	72 - 74
65.	බන්ධන	,,	...	...	74
66.	අත්තහත	,,	...	...	74
67.	උඩ්ඩිත	,,	....	...	74
68.	පිහිත	,,	...	...	74 - 76
69.	ඉච්ඡා	,,	...	...	76
70.	ලොක	,,	...	...	76

අද්ධවග්ගො සත්තමො.

8. ඡෙත්වාවග්ගො — 76 - 84

71.	ඡෙත්වා	සුත්තං	...	...	76 - 78
72.	රථ	,,	...	...	78
73.	චිත්ත	,,	...	...	78
74.	වුට්ඨි	,,	...	...	78
75.	භීත	,,	...	...	80
76.	නජීරති	,,	...	...	80
77.	ඉස්සර	,,	...	...	80 -82
78.	කාම	,,	...	...	82
79.	පාථෙය්‍ය	,,	...	...	82
80.	පජ්ජොත	,,	...	...	82 - 84
81.	අරණ	,,	...	...	84

ඡෙත්වාවග්ගො අට්ඨමො.

දෙවතාසංයුත්තං සමත්තං.

2. දෙවපුත්තසංයුත්තං — 86 - 128

1. සුරියවග්ගො — 86 - 96

82.	පඨමකස්සප	සුත්තං	...	...	86
83.	දුතියකස්සප	,,	...	...	86
84.	මාඝ	,,	...	...	88
85.	මාගධ	,,	...	...	88
86	දාමලි	,,	...	...	88 - 90
87.	කාමද	,,	...	...	90
88.	පඤ්චාලචණ්ඩ	,,	...	...	92
89.	තායන	,,	...	...	92 - 94
90.	චන්දිම	,,	...	...	94 - 96
91.	සුරිය	,,	...	...	96

සුරියවග්ගො පඨමො.

2. අනාථපිණ්ඩිකවග්ගො 98 – 106

92.	චන්දිමස	සුත්තං	...	...	98
93.	වෙණ්හු	,,	...	...	98
94.	දීඝලට්ඨි	,,	...	...	98
95.	නන්දන	,,	...	...	100
96.	චන්දන	,,	...	...	100
97.	වසුදත්ත	,,	...	...	100 – 102
98.	සුබ්‍රහ්ම	,,	...	...	102
99.	කකුධ	,,	...	...	102 – 104
100.	උත්තර	,,	...	...	104
101.	අනාථපිණ්ඩික	,,	...	...	104 – 106

අනාථපිණ්ඩිකවග්ගො දුතියො.

3. නානාතිත්ථියවග්ගො 108 – 128

102.	සිව	සුත්තං	...	...	108
103.	ඛෙම	,,	...	..	110
104.	සෙරී	,,	...	...	110 – 114
105.	ඝටීකාර	,,	...	...	114 – 116
106.	ජන්තු	,,	...	...	116 – 118
107.	රොහිතස්ස	,,	...	...	118 – 120
108.	නන්ද	,,	...	...	120
109.	නන්දිවිසාල	,,	...	...	120
110.	සුසිම	,,	...	...	122 – 126
111.	නානාතිත්ථියසාවක	,,	...	...	126 – 128

නානාතිත්ථියවග්ගො තතියො.

දෙවපුත්තසංයුත්තං සමත්තං.

3. කොසලසංයුත්තං 130 – 188

1. බන්ධනවග්ගො 130 – 144

112.	දහර	සුත්තං	...	...	130 – 132
113.	පුරිස	,,	...	...	132 – 134
114.	රාජ	,,	...	...	134
115.	පිය	,,	...	...	134 – 136
116.	අත්තරක්ඛිත	,,	...	...	136 – 138
117.	අප්පකා	,,	...	...	138 – 140
118.	අඩ්ඩකරණ	,,	...	...	140
119.	මල්ලිකා	,,	...	...	140 – 142
120.	යඤ්ඤ	,,	...	...	142 – 144
121.	බන්ධන	,,	...	...	144

බන්ධනවග්ගො පඨමො.

2. අපුත්තකවග්ගො **146 – 170**

122.	සත්තජටිල	සුත්තං	...	...	146 – 148
123.	පඤ්චරාජ	,,	...	...	148 – 152
124.	දොණපාක	,,	...	...	152
125.	පඨමසඞ්ගාම	,,	...	...	154
126.	දුතියසඞ්ගාම	,,	...	...	156 – 158
127.	ධීතු	,,	...	...	158
128.	අප්පමාද	,,	...	...	160
129.	කල්‍යාණමිත්ත	,,	...	....	160 – 164
130.	පඨමං අපුත්තක	,,	...	...	164 – 168
131.	දුතියං අපුත්තක	,,	...	...	168 – 170

අපුත්තකවග්ගො දුතියො.

3. කොසලවග්ගො **170 – 188**

132.	පුග්ගල	සුත්තං	...	...	170 – 176
133	අය්‍යකා	,,	...	...	176 – 178
134.	ලොක	,,	...	...	178 – 180
135.	ඉස්සත්ථ	,,	...	...	180 – 184
136.	පබ්බතූපම	,,	...	...	184 – 188

කොසලවග්ගො තතියො.

කොසලසංයුත්තං සමත්තං.

4. මාරසංයුත්තං 188 – 232

1. ආයුවග්ගො **188 – 200**

137.	තපොකම්ම	සුත්තං	...	...	188
138.	නාග	,,	...	...	190
139.	සුභ	,.	...	...	190
140.	පඨමපාස	,,	...	...	192
141.	දුතියපාස	,,	...	...	192 – 194
142.	සප්ප	,,	...	...	194
143.	සොප්පසි	,,	..	...	196
144.	නන්දති	,,	...	...	196
145.	පඨමආයු	,,	...	...	198
146.	දුතියආයු	,,	...	...	198 – 200

ආයුවග්ගො පඨමො.

2. රජ්ජවග්ගො **200-214**

147.	පාසාණ	සුත්තං	...	...	200
148.	සීහ	,,	...	...	200 -202
149.	සකලික	,,	...	...	202
150.	පතිරූප	,,	...	...	204
151.	මානස	..	...	...	204

152.	පත්ත	සුත්තං	204 – 206
153.	ආයතන	,, ...	206 – 208
554,	පිණ්ඩ	,, ...	208
155.	කස්සක	,, ...	210 – 212
156.	රජ්ජ	,, ...	212 – 214

රජ්ජවග්ගො දුතියො.

3. මාරවග්ගො 214 – 232

157.	සම්බහුල	සුත්තං	214 – 216
158.	සමිද්ධි	,, ...	216 – 218
159.	ගොධික	,, ...	220 – 222
160.	සත්තවස්ස	,, ...	222 – 226
161.	මාරධීතු	,, ...	226 – 232

මාරවග්ගො තතියො.

මාරසංයුත්තං සමත්තං.

5. භික්ඛුනිසංයුත්තං 232 – 246

1. භික්ඛුනිවග්ගො 232 – 246

162.	ආලවිකා	සුත්තං	232 – 234
163.	සොමා	,, ...	234
164.	ගොතමී	,, ...	236
165.	විජයා	,, ...	236 – 238
166.	උප්පලවණ්ණා	,, ...	238 – 240
167.	චාලා	,, ...	240
168.	උපචාලා	,, ...	240 – 242
169.	සිසූපචාලා	,, ...	242 – 244
170.	සෙලා	,, ...	244
171.	වජිරා	,, ...	246

භික්ඛුනිවග්ගො පඨමො

භික්ඛුනිසංයුත්තං සමත්තං.

6. බ්‍රහ්මසංයුත්තං 248 – 284

1. කොකාලිකවග්ගො 248 – 274

172.	ආයාචන	සුත්තං	248 – 252
173.	ගාරව	,, ...	252 – 254
174.	බ්‍රහ්මදෙව	,, ...	254 – 256
175.	බකබ්‍රහ්ම	,, ...	258 – 260
176.	අපරාදිට්ඨි	,, ...	260 – 264
177.	පමාද	,, ...	264 – 268
178.	කොකාලික	,, ...	268

179.	කතමොරකතිස්ස	සුත්තං	...	...	268
180.	තුදුබ්‍රහ්ම	,,	...	...	270
181.	දුතියකොකාලික	,,	...	...	270 - 274
	කොකාලිකවග්ගො පඨමො.				
	2. පරිනිබ්බාණවග්ගො				**276 - 284**
182.	සනඞ්කුමාර	සුත්තං	...	...	276
183.	දෙවදත්ත	,,	...	...	276
184.	අන්ධකවින්ද	,,	...	...	276 - 278
185.	අරුණවතී	,,	...	...	278 - 282
186.	පරිනිබ්බාණ	,,	...	...	282 - 284
	පරිනිබ්බාණවග්ගො දුතියො.				
	බ්‍රහ්මසංයුත්තං සමත්තං.				
	7. බ්‍රාහ්මණසංයුත්තං				**286 - 330**
	1. අරහන්තවග්ගො				**286 - 306**
187.	ධනඤ්ජානී	සුත්තං	...	...	286 - 288
188.	අක්කොස	,,	...	...	288 - 290
189.	අසුරින්දක	,,	...	...	292
190.	බිලඞ්ගික	,,	...	...	292 - 294
191.	අහිංසක	,,	...	...	294
192.	ජටා	,,	...	...	294 - 296
193.	සුද්ධික	,,	...	...	296
194.	අග්ගික	,,	...	...	296 - 298
195.	සුන්දරික	,,	...	...	298 - 302
196.	බහුධීතු	,,	...	...	302 - 306
	අරහන්තවග්ගො පඨමො.				
	2. උපාසකවග්ගො				**306 - 330**
197.	කසි	සුත්තං	...	...	306 - 310
198.	උදය	,,	...	...	310
199.	දෙවහිත	,,	...	...	312 - 314
200.	මහාසාල	,,	...	...	314 - 316
201.	මානත්ථද්ධ	,,	...	...	316 - 318
202.	පච්චනීක	,,	...	...	320
203.	නවකම්මික	,,	...	...	320 - 322
204.	කට්ඨහාර	,,	...	...	322 - 324
205.	මාතුපොසක	,,	...	...	324
206.	භික්ඛක	,,	...	...	326
207.	සඞ්ගාරව	,,	...	...	326 - 328
208.	ඛොමදුස්ස	,,	...	...	328 - 330
	උපාසකවග්ගො දුතියො.				
	බ්‍රාහ්මණසංයුත්තං සමත්තං.				

8. වඞ්ගීසසංයුත්තං 330 - 350

1. වඞ්ගීසවග්ගො 330 - 350

209.	නික්ඛන්ත	සුත්තං	...	...	330 - 332
210.	අරති	,,	...	...	332 - 334
211.	පෙසලඅතිමඤ්ඤනා	,,	...	...	334
212.	ආනන්ද	,,	...	...	336
213.	සුභාසිත	,,	...	...	336 - 338
214.	සාරිපුත්ත	,,	...	...	338 - 340
215.	පවාරණා	,,	...	...	340 - 342
216.	පරොසහස්ස	,,	...	...	342 - 346
217.	කොණ්ඩඤ්ඤ	,,	...	...	346 - 348
218.	මොග්ගල්ලාන	,,	...	...	348
219.	ගග්ගරා	,,	...	...	348 - 350
220	වඞ්ගීස	,,	...	...	350

වඞ්ගීසවග්ගො පඨමො.

වඞ්ගීසසංයුත්තං සමත්තං.

9. වනසංයුත්තං 352 - 366

1. වනවග්ගො 352 - 366

221.	විවෙක	සුත්තං	...	...	352
222.	උපට්ඨාන	,,	...	...	352 - 354
223.	කස්සපගොත්ත	,,	...	...	354
224.	සම්බහුලා	,,	...	...	356
225.	ආනන්ද	,,	...	...	356
226.	අනුරුද්ධ	,,	...	...	356 - 358
227.	නාගදත්ත	,,	...	...	358
228.	කුලඝරණී	,,	...	...	358 - 360
229.	වජ්ජිපුත්ත	,,	...	...	360
230.	සජ්ඣාය	,,	...	...	360
231.	අයොනිසො	,,	...	....	362
232.	මජ්ඣන්තික	,,	...	...	362
233.	පාකතින්ද්‍රිය	,,	...	...	362 - 364
234.	පදුමපුප්ඵ	,,	...	...	364 - 366

වනවග්ගො පඨමො.

වනසංයුත්තං සමත්තං.

10. යක්ඛසංයුත්තං 366 - 384

1. ඉන්දකවග්ගො 366 - 384

235.	ඉන්දක	සුත්තං	...	...	366
236.	සක්ක	,,	...	...	368

237.	සුවිලොම	සුත්තං	...	...	368 - 370
238.	මණිභද්ද	,,	...	...	370
239.	සානු	,,	...	...	370 - 372
240.	පියඞ්කර	,,	...	...	372
241.	පුනබ්බසු	,,	...	...	372 - 374
242.	සුදත්ත	,,	...	...	374 - 378
243.	පඨමසුක්කා	,,	...	...	378
244.	චීරා	,,	...	...	378
245.	දුතියසුක්කා	,,		...	380
246.	ආළවක	,,	...	...	380 - 384

ඉන්දකවග්ගො පඨමො.

යක්ඛසංයුත්තං සමත්තං.

11. සක්කසංයුත්තං 384 - 428

1. සුවීරවග්ගො 384 - 406

247.	සුවීර	සුත්තං	...	...	384 - 386
248.	සුසීම	,,	...	...	386 - 388
249.	ධජග්ග	,,	...	...	388 - 392
250.	වෙපචිත්ති	,	...	...	392 - 396
251.	සුභාසිතජය	.,	...	...	396 - 398
252.	කුලාවක	,,	...	...	400
253.	නදුබ්භිය	,,	...	...	400 - 402
254.	වෙරොචනඅසුරින්ද	,,	...	...	402
255.	අරඤ්ඤායතනඉසි	,,	...	...	402 - 404
256.	ඉසයොසමුද්දක	,,	...	...	404 - 406

සුවීරවග්ගො පඨමො.

2 සත්තවතවග්ගො 406 - 420

257.	දෙවා [සත්තවතපද]	සුත්තං	...	...	406
258,	[දුතිය] දෙවා [සත්තවතපද]	,,	...	...	408
259.	මහාලි [සත්තවතපද]	සුත්තං	...	...	408 - 410
260.	දළිද්ද	,,	...	...	412 - 414
261.	රාමණෙය්‍යක	,,	...	...	414
262.	යජමාන	.,	...	...	414
263.	වන්දනා	,,	...	...	414 - 416
264.	සක්කනමස්සන	,,	...	...	416
265.	දුතියසක්කනමස්සන	,,		...	418
266.	තතියසක්කනමස්සන	,,	...	....	418 - 420

සත්තවතවග්ගො දුතියො.

3. සක්කපඤ්චකං 422 - 426

267.	ඡෙත්වා	සුත්තං	...	...	422 - 424
268	දුබ්බණ්ණිය	,,	...	...	424
269.	මායා	,,	...	..	426
270.	අච්චය	,,	...	...	426
271.	අක්කොධ	,,	...	. .	426

සක්කපඤ්චකං.

සක්කසංයුත්තං සමත්තං.

සගාථවග්ගො නිට්ඨිතො.

සුත්තන්තපිටකෙ

සංයුත්තනිකායො

පඨමො භාගො

සගාථවග්ගො

සුත්තන්තපිටකෙ

සංයුත්තනිකායො

පඨමො භාගො

සගාථවග්ගො

1. දෙවතාසංයුත්තං

1. නළවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1. 1. 1.

ඔඝතරණසුත්තං.

1. එවම්මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච:

කථන්නු ත්වං මාරිස, ඔඝමතරීති?

[භගවා:]

අප්පතිට්ඨං ඛ්වාහං ආවුසො අනායූහං ඔඝමතරින්ති.

යථා කථං පන ත්වං මාරිස අප්පතිට්ඨං අනායූහං ඔඝමතරීති?

[භගවා:]

යදා ස්වාහං ආවුසො සන්තිට්ඨාමි. තදාස්සු සංසීදාමි. යදා ස්වාහං ආවුසො ආයූහාමි තදාස්සු නිබ්බුය්හාමි[1]. එවං ඛ්වාහං ආවුසො අප්පතිට්ඨං අනායූහං ඔඝමතරින්ති.

[දෙවතා:]

චිරස්සං වත පස්සාමි[2] බ්‍රාහ්මණං පරිනිබ්බුතං,

අප්පතිට්ඨං අනායූහං තිණ්ණං ලොකෙ විසත්තිකං.

---

1. නිව්‍යූහාමි—ස්‍යා. 2. පස්සාම—සී. 1, 2.

සූත්‍රාන්තපිටකයෙහි

සංයුත්තනිකාය

ප්‍රථම භාගය

සගාථවර්ගය

1. දේවතාසංයුත්තය

1. නළවර්ගය

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේට නමස්කාර වේවා.

1. 1. 1.

ඔඝතරණසූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි මනා ඡවිවර්ණ ඇති එක්තරා දෙවියෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

නිදුකානන් වහන්ස, නුඹවහන්සේ කෙසේ ඕඝය තරණය කළ සේක් ද?

[භගවත්හු:]

ඇවැත්නි, මම නො පිහිටමින් වෑයම් ද නො කරමින් ඕඝය තරණය කෙළෙමි.

නිදුකානන් වහන්ස, නුඹ වහන්සේ කෙසේ නම් නො පිහිටමින් වෑයම් ද නො කරමින් ඕඝය තරණය කළ සේක් ද?

[භගවත්හු:]

ඇවැත්නි, මම යම් විටෙක පිහිටා සිටිම් ද එකල්හි ගිලෙමි. ඇවැත්නි, මම යම් විටෙක වෑයම් කෙරෙම් ද එකල්හි ඉල්පෙයෙමි. ඇවැත්නි, මෙසේ මම නො පිහිටමින් වෑයම් ද නො කරමින් ඕඝය තරණය කෙළෙමි.

[දෙවි:]

නො පිහිටමින් වෑයම් ද නො කරමින් ලෝකයෙහි තෘෂ්ණාව තරණය කළ කෙලෙස් නැසූ ක්ෂීණාස්‍රවබ්‍රාහ්මණයකු කලෙකින් දකිමි.

ඉදමවොච සා දෙවතා. සමනුඤ්ඤො සත්ථා අහොසි.

අථ ඛො සා දෙවතා 'සමනුඤ්ඤො මෙ සත්ථා'ති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

1. 1. 2.

නිමොක්ඛසුත්තං.[1]

2. එවමෙම සුතං[2]. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච:

ජානාසි නො ත්වං මාරිස, සත්තානං නිමොක්ඛං පමොක්ඛං විවෙකන්ති?

[භගවා:]

ජානාමි[3] ඛ්වාහං ආවුසො සත්තානං නිමොක්ඛං පමොක්ඛං විවෙකන්ති.
[දෙවතා:]

යථා කථම්පන ත්වං මාරිස ජානාසි සත්තානං නිමොක්ඛං පමොක්ඛං විවෙකන්ති?

[භගවා:]

නන්දීභවපරික්ඛයා සඤ්ඤාවිඤ්ඤාණසඞ්ඛයා,
වෙදනානං නිරොධා උපසමා එවං ඛ්වාහං ආවුසො ජානාමි,
සත්තානං නිමොක්ඛං පමොක්ඛං විවෙකන්ති.

1. 1. 3.

උපනීයති[4]සුත්තං.

3. සාවත්ථියං—

අථ[5] ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා,
එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානීති.

[භගවා:]

උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා
එතං භයං මරණෙ පෙක්ඛමානො ලොකාමිසං පජහෙ
සන්තිපෙක්ඛොති.

---

1. බුද්ධ සීහනාද සුත්තං නාමෙතං.-අට්ඨකථා. 2. සාවත්ථිනිදානං.-මජ්සං. 3. ජානාම-සී 1, 2.
4. උපනිය - මජ්සං. උපනෙය්‍ය - ස්‍යා, PTS 5. එකමන්තං ඨිතා.-මජ්සං.

ඒ දෙවි තෙමේ මෙය කී ය. ශාස්තෘන් වහන්සේ මැනවින් අනුදත් සේක. ඉක්බිති ඒ දෙවි තෙමේ "භාග්‍යවතුන් වහන්සේ මාගේ වචනය අනුදත් සේක" යි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

1. 1. 2.

නිමොක්ඛ සූත්‍රය

2. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි මනා වණ් ඇති එක්තරා දෙවියෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්-පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

නිදුකානන් වහන්ස, නුඹ වහන්සේ සත්ත්වයන්ගේ නිමොක්ඛය ද, පමොක්ඛය ද, විවේකය ද දන්නා සේක් ද?

[භගවත්හු:]

ඇවැත්නි, මම සත්ත්වයන්ගේ නිමොක්ඛය (=මාර්ගය) ද පමොක්ඛය (=ඵලය) ද විවේකය (=නිවණ) ද දනිමි.

[දෙවි:]

නිදුකානන් වහන්ස, නුඹ වහන්සේ කෙසේ නම් සත්ත්වයන්ගේ නිමොක්ඛය ද, පමොක්ඛය ද, විවෙකය ද දන්නා සේක් ද?

[භගවත්හු:]

ඇවැත්නි, තෘෂ්ණාව මුල් කොට ඇති කර්මභවය ක්ෂය කිරීමෙන් ද, සංඥා විඥානයන් ගෙවාලීමෙන් ද, වේදනාවන්ගේ නිරෝධයෙන් හා සන්සිඳීමෙන් ද මම මෙසේ සත්ත්වයන්ගේ නිමොක්ඛය ද, පමොක්ඛය ද, විවෙකය ද දනිමියි.

1. 1. 3.

උපනීයති සූත්‍රය

3. සැවැත්නුවර—

ඉක්බිති ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

ජීවිතය මරණය කරා පමුණුවනු ලැබේ. ආයුෂ ස්වල්ප ය. ජරාව විසින් මරණය කරා පමුණුවන ලද්දහුට පිහිට වීමට රක්ෂාස්ථාන නැත. මේ (ත්‍රිවිධ) භය මරණයෙහි ලා දක්නේ සුව එළවන්නා වූ පින් කරන්නේ ය.

[භගවත්හු:]

ජීවිතය මරණය කරා පමුණුවනු ලැබේ. ආයුෂ ස්වල්ප ය. ජරාව විසින් මරණය කරා පමුණුවන ලද්දහුට (පිහිට වීමට) රක්ෂාස්ථාන නැත. මේ (ත්‍රිවිධ) භය මරණයෙහි ලා දක්නා නිවණ පතන පුඟුල්තෙමේ ලෝකාමිෂය දුරු කරන්නේයි.

1. 1. 4.

අච්චෙන්තිසුත්තං

4. සාවත්ථියං—[1]

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා අනුපුබ්බං ජහන්ති.
එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානීති.

[භගවා:]

අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා
අනුපුබ්බං ජහන්ති,
එතං භයං මරණෙ පෙක්ඛමානො ලොකාමිසං පජහෙ
සන්තිපෙක්ඛොති.

1. 1. 5.

කතිඡින්ද[2]සුත්තං

5. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:[3]

කති ඡින්දෙ කති ජහෙ කති චුත්තරි භාවයෙ,
කති සඞ්ගාතිගො 'භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චතීති.

[භගවා:]

පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,
පඤ්ච සඞ්ගාතිගො 'භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චතීති.

1. 1. 6.

ජාගරසුත්තං

6. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

කති ජාගරතං සුත්තා කති සුත්තෙසු ජාගරා,
කතිහි රජමාදෙති කතිහි පරිසුජ්ඣතීති.

[භගවා:]

පඤ්ච ජාගරතං සුත්තා පඤ්ච සුත්තෙසු ජාගරා,
පඤ්චහි රජමාදෙති පඤ්චහි පරිසුජ්ඣතීති.

---

1. ඉදං න දිස්සතෙ - සතා. 2. කතිඡින්දි - සතා. 3. භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි - මජසං.

1. 1. 4.
අච්චෙන්ති සූත්‍රය

4. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

(පෙරවරු ආදි) කාලයෝ ඉක්ම යෙති. රාත්‍රීහු පුද්ගලයා මරණය කරා පමුණුවති. වයෝරාශීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ (ත්‍රිවිධ) භය මරණයෙහි ලා දක්නේ සැප එළවන පින් කරන්නේ ය.

[භගවත්හු:]

කාලයෝ ඉක්ම යති. රාත්‍රීහු (පුරුෂයා) මරණය කරා පමුණුවති. වයෝරාශීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ බිය මරණයෙහි ලා දක්නේ, නිවන් පතනුයේ (භවත්‍රය සඞ්ඛ්‍යාත) ලෝකාමිෂය දුරු කරන්නේයි.

1. 1. 5.
කතිඡින්ද සූත්‍රය

5. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙකින් සැලකළේ ය:

කෙතෙක් සිඳින්නේ ද? කෙතෙක් දුරු කරන්නේ ද? මත්තෙහි කෙතෙක් වඩන්නේ ද? කෙතෙක් සඞ්ග (ඇලීම්) ඉක්මවූ මහණ තෙමේ 'ඔඝතිණ්ණ'ය යි කියනු ලැබේ ද?

[භගවත්හු:]

පසක් සිඳින්නේ ය. පසක් දුරු කරන්නේ ය. ඉන් මතුයෙහි පසක් වඩන්නේ ය. සඞ්ග පසක් ඉක්මවූ මහණ තෙමේ 'ඔඝතිණ්ණ' ය යි කියනු ලැබේ.

1. 1. 6.
ජාගර සූත්‍රය

6. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

(කීදෙනකුන්) නිදි වරද්දී කීදෙනෙක් නිදි ගත්තාහු වෙත් ද? (කීදෙනකුන්) නිදද්දී කීදෙනෙක් නිදිවරන්නෝ වෙත් ද? කෙතෙකින් (කෙලෙස්) රජස් ගණී ද? කෙතෙකින් පිරිසිදු වේ ද?

[භගවත්හු:]

පස් දෙනකුන් නිදි වරද්දී පස්දෙනෙක් නිදිගත්තාහු වෙත්. පස්දෙනකුන් නිදද්දී පස්දෙනෙක් නිදි වරන්නෝ වෙත්. පසෙකින් කෙලෙස් රජස් ගණී. පසෙකින් පිරිසිදු වේ යි.

1. 1. 7.

අප්පටිවිදිතසුත්තං

7. **සාවත්ථියං**—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

යෙසං ධම්මා අප්පටිවිදිතා පරවාදෙසු නීයරෙ,
සුත්තා තෙ නප්පබුජ්ඣන්ති කාලො තෙසං පබුජ්ඣිතුන්ති

[භගවා:]

යෙසං ධම්මා සුප්පටිවිදිතා[1] පරවාදෙසු න නීයරෙ,
සම්බුද්ධා සම්මදඤ්ඤාය[2] චරන්ති විසමෙ සමන්ති

1. 1. 8.

සුසම්මුට්ඨසුත්තං

8. **සාවත්ථියං**—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

යෙසං ධම්මා සුසම්මුට්ඨා පරවාදෙසු නීයරෙ,
සුත්තා තෙ නප්පබුජ්ඣන්ති කාලො තෙසං පබුජ්ඣිතුන්ති

[භගවා:]

යෙසං ධම්මා අසම්මුට්ඨා පරවාදෙසු න නීයරෙ,
සම්බුද්ධා සම්මදඤ්ඤාය[2] චරන්ති විසමෙ සමං.

1. 1. 9.

නමානකාමසුත්තං.

9. **සාවත්ථියං**—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

න මානකාමස්ස දමො ඉධත්ථි න මොනමත්ථි අසමාහිතස්ස,
එකො අරඤ්ඤෙ විහරං පමත්තො න මච්චුධෙය්‍යස්ස
තරෙය්‍ය පාරන්ති.

[භගවා:]

මානං පහාය සුසමාහිතත්තො සුචෙතසො සබ්බධි විප්පමුත්තො,
එකො අරඤ්ඤෙ විහරං අප්පමත්තො ස මච්චුධෙය්‍යස්ස
තරෙය්‍ය පාරන්ති.

---

1. සුපටිවිදිතා - ස්‍යා. 2. තෙ සම්බුද්ධා සම්මදඤ්ඤා-මජසං. *PTS.* සම්පදඤ්ඤාය - සී 1.

1. 1. 7.

අප්පටිවිදිත සූත්‍රය

7. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යම් කෙනකුන් විසින් (චතුසසත්‍ය) ධර්මයෝ අවබෝධ නොකරණ ලද්දාහු ද? (ඔහු) පරවාදයන්හි පමුණුවනු ලබත් ද? නිදිගත්තා වූ ඔහු නුපුබුදිත්. ඔවුන්ට පිබිදීමට මේ කාලය යි.

[භගවත්හු:]

යම් කෙනකුන් විසින් (චතුසසත්‍ය) ධර්මයෝ අවබෝධ කරණ ලද්දාහු ද? (ඔහු) පරවාදයන්හි නො පමුණුවනු ලබත්. (සර්වඥබුද්ධාදි) බුදුවරයෝ මනා කොට දැන විෂම ලෝකයෙහි සම ව හැසිරෙත්.

1. 1. 8.

සුසම්මුට්ඨ සූත්‍රය

8. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යම් කෙනකුන්ගේ (චතුසසත්‍ය) ධර්මයෝ වෙසෙසින් නැසුනාහු ද, (ඔහු) පරවාදයන්හි පමුණුවනු ලැබෙත්. ඔහු නිදි ගත්තාහු නො පුබුදිත්. ඔවුන්ට පිබිදීමට මේ කාලය යි.

[භගවත්හු:]

යම් කෙනකුන්ගේ (චතුසසත්‍ය) ධර්මයෝ නො නැසුනාහු ද, (ඔහු) පරවාදයන්හි නොපමුණුවනු ලැබෙත්. (සර්වඥබුද්ධාදි) බුදුවරු මැනවින් දැන විෂම ලෝකයෙහි සම ව හැසිරෙත් සී.

1. 1. 9.

නමානකාම සූත්‍රය.

1. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

මෙහි මානය කැමැත්තහුට දමයෙක් (=හිතෙහි සත්හුන් පැවැත්මෙක්) නැත. සමාධියක් නැත්තහුට මෞනයෙක් (=සිවුමග නුවණෙක්) නැත. වනයෙහි හුදෙකලා ව ප්‍රමත්ත ව වෙසෙන්නේ සසර පරතෙරට හෙවත් නිවණට නො පැමිණෙන්නේ ය.

[භගවත්හු:]

මානය දුර ලා මැනවින් එකඟ වූ සිත් ඇති සියලු උපධීන්ගෙන් මිදුනු අප්‍රමත්ත ව හුදෙකලා ව වෙනෙහි වෙසෙන හෙතෙමේ සසර පරතෙරට පැමිණෙන්නේ සී.

1. 1. 10.

අරඤ්ඤසුත්තං

10. **සාවත්ථියං—**

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

අරඤ්ඤෙ විහරන්තානං සන්තානං බ්‍රහ්මචාරිනං,
එකභත්තං භුඤ්ජමානානං කෙන වණ්ණො පසීදතීති,

[භගවා:]

අතීතං නානුසොචන්ති නප්පජප්පන්ති'නාගතං[1],
පච්චුප්පන්නෙන යාපෙන්ති තෙන වණ්ණො පසීදති,
අනාගතප්පජප්පාය අතීතස්සානුසොචනා,
එතෙන බාලා සුස්සන්ති නළොව හරිතො ලුතොති,

නළවග්ගො පඨමො.

තස්සුද්දානං;

ඔඝං නිමොක්ඛං උපනීයන්ති අච්චෙන්ති කතිඡින්දි ච,[2]
ජාගරං අප්පටිවිදිතා සුසම්මුට්ඨාතමානකාමො[3]
අරඤ්ඤෙ දසමො[4] වුත්තො වග්ගො තෙන පවුච්චති.

---

2. නන්දනවග්ගො

1. 2. 1.

නන්දනසුත්තං

11. එවමෙම සුතං එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ අඤ්ඤතරා තාවතිංසකායිකා දෙවතා නන්දනවනෙ[5] අච්ඡරාසඞ්ඝපරිවුතා දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරයමානා[6] තායං වෙලායං ඉමං ගාථං අභාසි:

න තෙ සුඛං පජානන්ති යෙ න පස්සන්ති නන්දනං,
ආවාසං නරදෙවානං තිදසානං යසස්සිනන්ති.

එවං වුත්තෙ භික්ඛවෙ අඤ්ඤතරා දෙවතා තං දෙවතං ගාථාය පච්චභාසි:

න ත්වං බාලෙ විජානාසි[7] යථා අරහතං වචො,
අනිච්චා සබ්බෙ සඞ්ඛාරා[8] උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛොති.

---

1. නප්පජප්පමනාගතං. - සං. අනාගතප්පජප්පනානාගතං - සී. 2. කති ඡින්ද-සාළුව
3. සුසම්මුට්ඨානමානකාමිනා-සාළුව 4. දසමො අරඤ්ඤෙ - සී.මු. 1. 5. නන්දනෙ වනෙ - මජසං 6. පරිචාරියමානා - සතා - P.T.S 7. පජානාසි - සාළුව
8. සඞ්ඛතසඞ්ඛාරා - මජසං. - P T S.

1. 1. 10.

අරඤ්ඤ සූත්‍රය.

10. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙකින් සැල කෙළේය:

වෙනෙහි වසන එක්වේලේ අහර වළඳන ශාන්තබ්‍රහ්මචාරීන්ගේ වර්‍ණය කවරහෙයෙකින් පහදී ද?

[භගවත්හු:]

ඉකුත් දෑ ගැණ ශෝක නො කෙරෙති. නො ලත් දෙය නො පතති. පවත්නා දෙයින් යැපෙත්. එයින් ශරීරවර්‍ණය පහදී.

නො ලත් දෙය පැතීමෙන් හා ඉකුත් දෑ ගැණ ශෝක කිරීමෙන් දූසි යන මෙයින් බාලයෝ සිඳින ලද නිලිගත් බටදඬක් සෙයින් වියලෙත්යි.

නළ වර්‍ගය පළමු වැනියි.

එහි සූත්‍රනාමාවලිය:

ඕඝතරණ, නිමොක්ඛ, උපනීයති, අච්චෙන්ති, කතිඡින්ද, ජාගර, අප්පටිවිදිත, සුසම්මුට්ඨ, නමානකාම, දස වැනි වූ අරඤ්ඤ සූත්‍රය යි එයින් පළමු වන වර්‍ගය කියනු ලැබේ.

---

2. නන්දන වර්‍ගය

1. 2. 1.

නන්දන සූත්‍රය

11. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඩු** සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්‍ෂූන් ඇමතූ සේක. ඒ භික්‍ෂූහු 'පින්වතුන් වහන්ස'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, පෙර වූවක් කියමි. තව්තිසා වැසි එක්තරා දෙවියෙක් දිවසරන් විසින් පිරිවරණ ලදුයේ දිව්‍යපඤ්චකාම සම්පත්තියෙන් සමන්විත වූයේ ඉඳුරන් පිණවන්නේ ඒ වෙලාවෙහි මේ ගාථාව කී ය:

යම් කෙනෙක් පිරිවර ඇති තව්තිසා වැසි දෙවියන්ගේ වාසස්ථාන වූ නඳුනුයන නො දකිද්ද? ඔහු සැපය නො දනිත්.

මහණෙනි, මෙසේ කී කල්හි එක්තරා දෙවියෙක් ඒ දෙවියාට ගාථාවෙකින් පිළිතුරු දුන්නේ ය:

බාලය, තෝ "සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. ඉපදීම හා නැසීම ස්වභාව කොට ඇත්තාහ. ඉපිද නිරුද්ධ වෙත්. ඔවුන්ගේ සන්හිඳීම සැප ය" යන රහතුන්ගේ වදන ලෙස නො දන්හියි.

1. 2. 2.

නන්දති[1]සුත්තං.

12. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

නන්දති පුත්තෙහි පුත්තිමා ගොමිකො[2] ගොහි තථෙව නන්දති,
උපධී හි නරස්ස නන්දනා න හි සො නන්දති යො නිරූපධීති[3]

[භගවා:]

සොචති පුත්තෙහි පුත්තිමා ගොමිකො ගොහි තථෙව සොචති,
උපධී හි නරස්ස සොචනා න හි සො සොචති යො නිරූපධීති.

1. 2. 3.

නත්ථිපුත්තසුත්තං

13. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

නත්ථි පුත්තසමං පෙමං නත්ථි ගොසමිතං ධනං,
නත්ථි සූරියසමා[4] ආභා සමුද්දපරමා සරාති.

[භගවා:]

නත්ථි අත්තසමං පෙමං නත්ථි ධඤ්ඤසමං ධනං,
නත්ථි පඤ්ඤාසමා ආභා වුට්ඨි වෙ පරමා සරාති.

1. 2. 4.

ඛත්තියසුත්තං

14. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ඛත්තියො ද්විපදං[5] සෙට්ඨො බලිවද්දො[6] චතුප්පදං,
කොමාරී[7] සෙට්ඨා භරියානං යො ච පුත්තාන[8] පුබ්බජොති.

[භගවා:]

සම්බුද්ධො ද්විපදං[5] සෙට්ඨො ආජානීයො චතුප්පදං,
සුස්සූසා සෙට්ඨා භරියානං යො ච පුත්තානමස්සවොති.

---

1. නන්දි-සයා. 2. ගොමා – මජසං. 3. නිරුපධීති.–PTS. 4. සූරියසමා - මජසං.
5. ද්විපදං – කාළුවි. 6. බලිබද්දා – මජසං බලිබද්දො – සයා. 7. කුමාරී – PTS
8. පුත්තා නං – PTS. සී. 1, 2.

1. 2. 2.

නන්‍දති සූත්‍රය.

12. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගය කී ය:

පුතුන් ඇත්තේ පුතුන්ගෙන් සතුටු වෙයි. එසේ ම ගවහිමියා ගවයන්ගෙන් සතුටු වෙයි. මේ කාමෝපධීහු ම මිනිසාගේ නන්‍දනයෝ යි. යමෙක් උපධි නැත්තේ ද හෙතෙමේ නො ම සතුටු වෙයි.

[භගවත්හු:]

පුතුන් ඇත්තේ පුතුන්ගෙන් ශෝක කෙරෙයි. එසේ ම ගවහිමියා ගවයන්ගෙන් ශෝක කෙරෙයි. මේ කාමොපධීහු ම මිනිසාගේ ශෝචනයෝයි. යමෙක් උපධි නැත්තේ ද හෙතෙමේ නො ම ශෝක කෙරේ යි.

1. 2. 3.

නත්ථිපුත්තසම සූත්‍රය

13. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගය කී ය:

පුත්‍රප්‍රේමය හා සම ප්‍රේමයෙක් නැත. ගෝධනය හා සම ධනයෙක් නැත. හිරු හා සම එළියෙක් නැත. විල්හු මුහුද පරම කොට ඇත්තාහ. (මුහුද හා සම විලෙක් නැතැයි යූ සේ යි.)

[භගවත්හු:]

ආත්මප්‍රේමය හා සම ප්‍රේමයෙක් නැත ධාන්‍ය හා සම ධනයෙක් නැත. ප්‍රඥව හා සම ආලෝකයෙක් නැත. ඒකාන්තයෙන් වැස්ස පරම විලයි.

1. 2. 4.

ඛත්තිය සූත්‍රය

14. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගය කී ය:

දෙපා ඇත්තවුන් අතුරෙන් ක්‍ෂත්‍රියයා ශ්‍රේෂ්ඨ ය. සිවුපාවුන් අතුරෙන් ගවයා ශ්‍රේෂ්ඨ ය. භාර්‍ය්‍යාවන් අතුරෙන් බාලකාලයෙහි පාවා ගන්නා ලද්දී ශ්‍රේෂ්ඨ ය. පුතුන් අතුරෙන් වැඩිමහල්ලා ශ්‍රේෂ්ඨ ය.

[භගවත්හු:]

දෙපා ඇත්තවුන් අතුරෙන් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨයහ. සිවුපාවුන් අතුරෙන් ආජානීය අශ්වයා ශ්‍රේෂ්ඨ ය. භාර්‍ය්‍යාවන් අතුරෙන් හිමියා පිණවන්නී ශ්‍රේෂ්ඨ ය. පුතුන් අතුරෙන් කීකරු වූයේ ශ්‍රේෂ්ඨ යි.

1. 2. 5.

සණමාන[1]සුත්තං

15. සාවත්‍ථියං—

[දෙවතා:]

ඨිතෙ මජ්ඣන්හිකෙ කාලෙ සන්නිසීවෙසු[2] පක්ඛිසු,
සණතෙව[3] බ්‍රහාරඤ්ඤං[4] තං භයං පටිභාති මන්ති.

[භගවා:]

ඨිතෙ මජ්ඣන්හිකෙ කාලෙ සන්නිසීවෙසු[2] පක්ඛිසු,
සණතෙව බ්‍රහාරඤ්ඤං[4] සා රතී[5] පටිභාති මන්ති.

1. 2. 6.

නිද්දාතන්දිසුත්තං

16. සාවත්‍ථියං—

[දෙවතා:]

නිද්දා තන්දි[6] විජම්භිකා[7] අරතී භත්තසම්මදො,
එතෙන නප්පකාසති අරියමග්ගො ඉධ පාණිනන්ති.

[භගවා:]

නිද්දං තන්දිං විජම්භිකං[8] අරතිං භත්තසම්මදං
විරියෙන[9] නං පණාමෙත්‍වා අරියමග්ගො විසුජ්ඣතීති.

1. 2. 7.

දුක්කරසුත්තං

17. සාවත්‍ථියං—

[දෙවතා:]

දුක්කරං දුත්තිතික්ඛඤ්ච අබ්‍යත්තෙන හි[10] සාමඤ්ඤං,
බහූ හි තත්‍ථ සම්බාධා යත්‍ථ බාලො විසීදතීති.

[භගවා:]

කතිහං චරෙය්‍ය සාමඤ්ඤං චිත්තං චෙ න නිවාරයෙ,[11]
පදෙ පදෙ විසීදෙය්‍ය සඞ්කප්පානං වසානුගො.

කුම්මොව අඞ්ගානි සකෙ කපාලෙ සමොදහං භික්ඛු මනොවිතක්කෙ,
අනිස්සිතො අඤ්ඤමහෙඨයානො පරිනිබ්බුතො න උපවදෙය්‍ය[12]
කඤ්චීති.

---

1. සකමාන-සී. මු. 2. ස්‍යා PTS. 2. සන්නිසින්නෙසු-සීමු. 2. 3. පලාතෙව-ස්‍යා. 4. මහාරඤ්ඤං - ස්‍යා PTS. සී.මු. 2. 5. සාරතී-මජසං 6. තන්දී-මජසං, ස්‍යා, PTS. 7. විජම්භිතා-මජසං, විජ්ම්භිකා-ස්‍යා 8. විජම්භිතං-මජසං, විජ්ම්භිකං-ස්‍යා 9. විරීයෙන,-මජසං. 10. ච - මජසං PTS. 11. නිවාරයෙය්‍ය-ස්‍යා. PTS.12. නූපවදෙය්‍ය-මජසං, ස්‍යා.

1. 2. 5.

සනමාන සූත්‍රය

15. **සැවැත්නුවර—**

[දෙවි:]

සිටි මද්දහනෙහි පක්ෂීන් ඉසුඹු ලන කල්හි වනය (මහත් සේ) හඬ නගන්නාක් මෙනි. එය මට බියක් ව වැටහේ.

[භගවත්හු:]

සිටි මද්දහනෙහි පක්ෂීන් ඉසුඹු ලන කල්හි මහවනය (මහත් සේ) හඬ නගන්නාක් මෙනි. එය මට සිත් පිණවන්නක් ව වැටහේ යි.

1. 2. 6.

නිද්දාතන්දි සූත්‍රය

16. **සැවත්නුවර—**

[දෙවි:]

නින්ද, තෙමරිය, ඇඟ මැලි කැඩීම, කුසල් දහම්හි නොඇල්ම, බත්මතය යන මෙයින් මෙලොව සත්ත්වයන්ට ආර්‍ය්‍යමාර්ගය ප්‍රකට නො වේ.

[භගවත්හු:]

නින්ද, තෙමරිය, ඇඟ මැලි කැඩීම, කුසල් දහම්හි නො ඇල්ම, බත්මතය යන මොවුන් වීර්‍ය්‍යයෙන් දුරුකොට (සිටියහුට) ආර්‍ය්‍යමාර්ගය පිරිසිදු වේ.

1. 2. 7.

දුෂ්කර සූත්‍රය

17. **සැවැත්නුවර—**

[දෙවි:]

බාලයා විසින් මහණදම නොකට හැක්කේ ද, නොඉවසිය හැක්කේ ද වේ. යම් මහණදමෙක්හි බාලයා පසුබසී ද, එහි ඔහුට සම්බාධයෝ බොහෝ වෙති.

[භගවත්හු:]

ඉදින් සිත (වරදින්) නොවළකන්නේ නම් කී දවසක් මහණකම කරන්නේ ද? පාපවිතර්කයන්ට වසග වූයේ පියවරක් නොහොත් අරමුණක් පාසා පසු බසින්නේ ය.

ඉදිබුවා අවයව සිය කබලෙහි බහන්නාක් මෙන් මහණ තෙමේ මනොවිතර්කයන් (භාවනාලම්බන නමැති කපල්ලෙහි) බහන්නේ නිඃශ්‍රය රහිත වූයේ අනුන් නොවෙහෙසන්නේ (කෙලෙස් පිරිනිවුමෙන්) පිරිණිවියේ කිසිවකුට උපවාද නො කරන්නේයි.

1. 2. 8.

හිරිසුත්තං

18. සාවත්ථියං—

[දෙවතා:]

හිරීනිසෙධො පුරිසො කොචි ලොකස්මිං විජ්ජති,
යො නින්දං අප්පබොධති අස්සො භද්‍රො කසාමිවාති.

[භගවා:]

හිරීනිසෙධා තනුයා යෙ චරන්ති සදා සතා,
අන්තං දුක්ඛස්ස පප්පුය්‍ය චරන්ති විසමෙ සමන්ති.

1. 2. 9.

කුටිකාසුත්තං

19. සාවත්ථියං—

[දෙවතා:]

කච්චි තෙ කුටිකා නත්ථි කච්චි නත්ථි කුලාවකා,
කච්චි සන්තානකා නත්ථි කච්චි මුත්තොසි බන්ධනාති.

[භගවා:]

තග්ඝ මෙ කුටිකා නත්ථි තග්ඝ නත්ථි කුලාවකා,
තග්ඝ සන්තානකා නත්ථි තග්ඝ මුත්තො'ස්මි බන්ධනාති.

[දෙවතා:]

කින්තාහං කුටිකං බ්‍රෑමි කින්තෙ බ්‍රෑමි කුලාවකං,
කින්තෙ සන්තාන[1]කං බ්‍රෑමි කින්තාහං බ්‍රෑමි බන්ධනන්ති.

[භගවා:]

මාතරං කුටිකං බ්‍රෑසි භරියං බ්‍රෑසි කුලාවකං,
පුත්තෙ සන්තානකෙ බ්‍රෑසි තණ්හං මෙ බ්‍රෑසි බන්ධනන්ති.

[දෙවතා:]

සාහු තෙ කුටිකා නත්ථි සාහු නත්ථි කුලාවකා,
සාහු සන්තානකා නත්ථි සාහු මුත්තොසි බන්ධනා'ති.

1 සන්තානකෙ - සී මු., 2. සී. 1, 2.

1. 2. 8.

හිරි සූත්‍රය

18. සැවැත්නුවර—

[දෙවි:]

ආජානීය අශ්වයා කසය වළකන්නාක් මෙන් යමෙක් නින්ද වළකා ද, ලජ්ජාවෙන් පව් වළකන (එබඳු) කිසියම් පුරුෂයෙක් ලොව ඇත් ද?

[භගවත්හු:]

ලජ්ජාවෙන් පව් වැළැක්වූ යම් කෙනෙක් හැමකල්හි සිහි ඇති ව හැසිරෙද්ද, දුකෙහි කෙළවරට පැමිණ විෂමලෝකයෙහි සම ව හැසිරෙද්ද, ඔහු ස්වල්ප දෙනෙකි.

1. 2. 9.

කුටිකා සූත්‍රය

19. සැවැත්නුවර—

[දෙවි:]

කිම මුඹ වහන්සේට කුටියෙක් නැද්ද? කිම (මුඹ වහන්සේට) කැදලි නැද්ද? (කිම මුඹ වහන්සේට) කුලප්‍රවෙණිහු නැද්ද? කිම බන්ධනයෙන් මිදුනෙහි ද?

[භගවත්හු:]

එකාන්තයෙන් මට කුටියෙක් නැත. එකාන්තයෙන් මට කැදලි නැත. එකාන්තයෙන් කුලප්‍රවෙණිහු නැත. එකාන්තයෙන් මම බන්ධනයෙන් මිදුනෙමි.

[දෙවි:]

මම කුමක් මුඹ වහන්සේට කුටිය කොට කියම් ද? කුමක් මුඹ වහන්සේට කැදැල්ල කොට කියම් ද? කුමක් මුඹ වහන්සේට කුලප්‍රවෙණිය කොට කියම් ද? මම කුමක් මුඹ වහන්සේට බන්ධනය කොට කියම් ද?

[භගවත්හු:]

මව මට කුටිය කොට කියති. බිරිඳ කැදැල්ල කොට කියති. පුත්‍රයන් කුලප්‍රවෙණි කොට කියති. තෘෂ්ණාව බන්ධන කොට කියති.

[දෙවි:]

මැනවි, මුඹ වහන්සේට කුටියෙක් නැත. මැනවි, කැදලි නැත. මැනවි, කුලප්‍රවෙණිහු නැත. මැනවි, බන්ධනයෙන් මිදුනෙහි යි.

1. 2. 10.

සමිද්ධිසුත්තං

20. එවම්මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති තපොදාරාමෙ.

අථ ඛො ආයස්මා සමිද්ධි රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන තපොදා තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. තපොදෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසි ගත්තානි පුබ්බාපයමානො[1].

අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං තපොදං ඔභාසෙත්වා යෙනායස්මා සමිද්ධි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වෙහාසං ඨිතා ආයස්මන්තං සමිද්ධිං ගාථාය[2] අජ්ඣභාසි:

අභුත්වා භික්ඛසි භික්ඛු න හි භුත්වාන භික්ඛසි,
භුත්වාන භික්ඛු භික්ඛස්සු මා තං කාලො උපච්චගා'ති

[සමිද්ධි:]

කාලං වො'හං න ජානාමි ඡන්නො කාලො න දිස්සති,
තස්මා අභුත්වා භික්ඛාමි මා මං කාලො උපච්චගා'ති.

අථ ඛො සා දෙවතා පථවියං[3] පතිට්ඨහිත්වා ආයස්මන්තං සමිද්ධිං එතදවොච:

දහරො ත්වං භික්ඛු පබ්බජිතො සුසුකාළකෙසො භද්‍රෙන[4] යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අනික්කීළිතාවී[5] කාමෙසු. භුඤ්ජ භික්ඛු මානුසකෙ කාමෙ. මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවී'ති.

[සමිද්ධි:]

න ඛ්වාහං ආවුසො සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවාමි. කාලිකඤ්ච ඛ්වාහං ආවුසො හිත්වා සන්දිට්ඨිකං අනුධාවාමි. කාලිකා හි ආවුසො කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භිය්‍යො[6]. සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[7] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති.

[දෙවතා:]

කථඤ්ච භික්ඛු කාලිකා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භිය්‍යො. කථං සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති.

[සමිද්ධි:]

අහං ඛො ආවුසො නවො අචිරපබ්බජිතො අධුනාගතො ඉමං ධම්මවිනයං. න ඛ්වාහං[8] සක්කොමි විත්ථාරෙන ආචික්ඛිතුං. අයං සො භගවා අරහං සම්මාසම්බුද්ධො රාජගහෙ විහරති තපොදාරාමෙ. තං භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාසි[9]. යථා තෙ භගවා ව්‍යාකරෙති,[10] තථා නං ධාරෙය්‍යාසී''ති.

---

1. පුබ්බාපයමාණො - සතා. PTS. 2. ඨිතා ඉමාය ගාථාය - සී 2. 3. පඨවියං - මජසං PTS. 4. භද්දෙන - සී 1. 5. අනිකීළිතාවී - මජසං - සතා. PTS. 6. භියො–PTS 7. ඔපනෙය්‍යිකො - මජසං 8. නතාහං - මජසං, සතා. 9. පුච්ජ - මජසං, සතා. 10. බ්‍යාකරොති - මජසං, සතා.

1. 2. 10.

සමිද්ධි සූත්‍රය

20. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර තපොදරාමයෙහි** වැඩ වසන සේක.

එකල්හි ආයුෂ්මත් **සමිද්ධි** තෙරණුවෝ රෑ අලුයම නැගිට ගාත්‍රයන් දෝනා පිණිස තපොද නදිය වෙත එළඹියහ. **තපොදනදියෙහි** ගාත්‍රයන්-දෙවා ගොඩ නැඟී ඇඟ තෙත සිදුවමින් එක් සිවුරක් ඇති ව සිටියහ.

එකල්හි මනා පැහැ ඇති එක්තරා දෙව්දුවක් රාත්‍රිය ඉක්ම ගිය කල්හි මුළු තපොදව බබුලුවා ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන් වෙත එළඹියා ය. එළඹ අහස්හි සිටියා ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන්ට ගාථායෙන් කීවා ය:

මහණ, නො වළඳා සිඟහි. වළඳා නො ම සිඟහි. මහණ, වළඳා සිඟව. කාලය තා නහමක් ඉක්ම යේවා.

[සමිද්ධි:]

මම කාලය නො දනිමි. කාලය වැසුනේ නො පෙණෙයි. එහෙයින් 'කාලය මා නහමක් ඉක්ම යේවා'යි නො වළඳා සිඟමි.

ඉක්බිති ඒ දෙව්දුව පොළොවෙහි පිහිටා ආයුෂ්මත් සමිද්ධි තෙරුන්ට මෙය කීවා ය:

මහණ, තෝ තරුණ පැවිද්දෙහි මනා කලුකෙහෙ ඇතියෙහි, සොඳුරු යොවුනෙන් හා පළමු වයසින් යුක්තයෙහි, කාමක්‍රීඩා නො කළ සුළුයෙහි, මහණ, මානුසික කාමයන් අනුභව කරණු මැනව. මෙලොව පස්කම් සැප හැර පියා පරලොව (කලෙකින් ලැබෙන) සැප නහමක් ලුහුබඳුව.

[සමිද්ධි:]

ඇවැත්නි, මම මෙලොව සැප හැර පියා කලෙකින් ලැබෙන සැප නො ම ලුහුබඳිමි. ඇවැත්නි, මම කලෙකින් ලැබෙන සැප හැර පියා මෙලොව සැප ලුහුබඳිමි. ඇවැත්නි, කාමයෝ කාලිකයහ. බොහෝ දුක් ඇත්තෝ ය. බොහෝ වෙහෙස ගෙණ දෙන්නෝ ය. මෙහි දෝෂයෝ බොහෝහ. මේ ධර්මය තමා විසින් දක්ක යුත්තේ ය. කල් නො යවා විපාක දෙන්නේ ය. එව, බලවයි' කීමට සුදුසු ය. තම සිත්හි එළවා තැබීමට සුදුසු ය. නුවණැත්-තන් විසින් තම තමා කෙරෙහි ලා දත යුත්තේ ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ.

[දෙව්දුව:]

මහණ, කෙසේ නම් 'කාමයෝ කාලිකයහ. බොහෝ දුක් ඇත්තෝ ය. දුඛී ආයාසය ඇත්තෝ ය. මෙහි දෝෂයෝ බොහෝ ය.' (කියාත්) 'කෙසේ නම්' මේ ධර්මය සන්දිට්ඨික ය. අකාලික ය. එහිපස්සික ය. ඔපනයික ය. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතු ය. (කියාත්) භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරණ ලද්දුහු ද?

[සමිද්ධි:]

ඇවැත්නි, මම නවකයෙමි. පැවිදි වූ නොබෝ කල් ඇත්තෙමි. මෙසස්නට අලුත පැමිණියෙමි. මම විස්තර වශයෙන් කියන්නට නො පොහොසත්මි. අර්හත් වූ සම්මා සම්බුදු වූ මේ භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර තපොදරාමයෙහි වැඩවසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මේ අරුත විචාරව. භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දෙකින් තිට ප්‍රකාශ කරණ සේක් ද? එපරිද්දෙන් එය දරවයි.

[දෙවතා:]

න බො භික්ඛු සුකරො සො භගවා අම්හෙහි උපසඞ්කමිතුං. අඤ්ඤාහි මහෙසක්ඛාහි දෙවතාහි පරිවුතො. සචෙ බො ත්වං භික්ඛු තං භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාසි. මයම්පි ආගච්ඡෙය්‍යාම ධම්මසවණායාති.[1]

එවමාවුසොති බො ආයස්මා සමිද්ධි තස්සා දෙවතාය පටිස්සුත්වා[2] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො ආයස්මා සමිද්ධි භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ රත්තියා පච්චූසසමයං[3] පච්චුට්ඨාය යෙන තපොදා තෙනුපසඞ්කමිං ගත්තානි පරිසිඤ්චිතුං. තපොදෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසිං ගත්තානි පුබ්බාපයමානො. අථ බො භන්තෙ අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං තපොදං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වෙහාසං ඨිතා ඉමාය ගාථාය අජ්ඣභාසි:

"අභුත්වා භික්ඛසි භික්ඛු න හි භුත්වාන භික්ඛසි,
භුත්වාන භික්ඛු භික්ඛස්සු මා තං කාලො උපච්චගා"ති.

එවං වුත්තෙ අහං භන්තෙ තං දෙවතං ගාථාය පච්චභාසිං.[4]

"කාලං වො'හං න ජානාමි ඡන්නො කාලො න දිස්සති,
තස්මා අභුත්වා භික්ඛාමි මා මං කාලො උපච්චගා"ති.

අථ බො භන්තෙ සා දෙවතා පඨවියං පතිට්ඨහිත්වා මං එතදවොච: දහරො ත්වං භික්ඛු පබ්බජිතො සුසු කාලකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, අනික්කීළිතාවී කාමෙසු. භුඤ්ජ භික්ඛු මානුසකෙ කාමෙ. මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවීති.

එවං වුත්තෙ හං [5]'භන්තෙ තං දෙවතං එතදවොචං: "න ඛ්වාහං ආවුසො සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවාමි. කාලිකඤ්ච ඛ්වාහං ආවුසො හිත්වා සන්දිට්ඨිකං අනුධාවාමි. 'කාලිකා හි ආවුසො කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො.' සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති."

එවං වුත්තෙ භන්තෙ සා දෙවතා මං එතදවොච: කථඤ්ච භික්ඛු කාලිකා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො. කථං සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

එවං වුත්තෙ'හං භන්තෙ තං දෙවතං එතදවොචං: අහං බො ආවුසො නවො අචිරපබ්බජිතො අධුනාගතො ඉමං ධම්මවිනයං. න ඛ්වාහං සක්කොමි විත්ථාරෙන ආචික්ඛිතුං. අයං සො භගවා අරහං සම්මාසම්බුද්ධො රාජගහෙ විහරති තපොදාරාමෙ. තං භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාසි. යථා තෙ භගවා ව්‍යාකරොති තථා නං ධාරෙය්‍යාසීති.

1. ධම්මස්සවණායාති. – සතා. මජ්සං 2. පටිස්සුණිත්වා. – සතා. 3. පච්චූසසමයෙ.– සිමු. 1, සි 1. 4. අජ්ඣභාසිං. – සතා. සිමු. 1, සි 1, 2 5. වුත්තාහං. – මජ්සං සතා.

[දෙව්දූ:]

මහණ, ඒ භාග්‍යවතුන් වහන්සේ එළඹෙන්නට සුකර නො වෙත්. අනෙක් මහේශාඛ්‍ය දේවතාවන් විසින් පිරිවරණ ලදහ. මහණ, ඉදින් නුඹ වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මේ අරුත විචාරන්නහු නම් අපි ද බණ අසන්නට එන්නෙමු.

ඇවැත්නි, එසේ ය යි ආයුෂමත් සමිද්ධිස්ථවිර තෙමේ ඒ දෙව්දුවට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂමත් සමිද්ධිස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

වහන්ස, මෙහි මම රෑ අලුයම නැඟිට ගාත්‍රයන් දෝනට තපොදව වෙත එළඹියෙමි. තපොදවෙහි ගාත්‍රයන් දෙවා ගෙණ ගොඩ නැගී සිරුරු තෙත සිඳුවමින් එක් සිවුරක් ඇති ව සිටියෙමි. වහන්ස, එකල්හි මනා ඡවිවණී ඇති එක්තරා දෙව්දුවක් රැය ඉක්ම ගිය කල්හි මුළු තපොදව බබුලුවා මා වෙත එළඹියා ය. එළඹ අහස්හි සිටියා මේ ගාථාවෙන් කිවු ය:

"මහණ, නො වළඳ සිඟහි. වළඳ නො ම සිඟහි, මහණ වළඳ සිඟව. කාලය තා තඟමක් ඉක්ම යේවා" යි.

වහන්ස, එසේ කී කල්හි මම ඒ දෙව්දුවට ගාථායෙන් පිළිතුරු දිනිමි.

"මම කාලය නො දනිමි. කාලය වැසුනේ නො පෙණේ. එහෙයින් කාලය මා තඟමක් ඉක්ම යේවා යි නො වළඳ සිඟමි." යි.

වහන්ස, එකල්හි ඒ දෙව්දූ තොමෝ පොළොවෙහි පිහිටා මට මෙය කිවු ය: "මහණ, නුඹ වහන්සේ තරුණ පැවිදි කෙනෙකි. මනා කළුකෙහෙ ඇති කෙනෙකි. සොඳුරු යොවුනින් හා පළමු වයසින් සමන්‍වාගතයහ. කාමක්‍රීඩා නො කළ කෙනෙකි. මහණ, මානුසිකකාමයන් අනුභව කරව. මෙලොව සැප හැර පියා කලෙකින් ලැබෙන සැප තඟමක් ලුහුබඳුව" යි.

වහන්ස, එසේ කී කල්හි මම ඒ දෙව්දුවට මෙය කීයෙමි: "ඇවැත්නි, මම මෙලොව සැප හැර පියා කලෙකින් ලැබෙන සැප නො ම ලුහුබඳිමි. ඇවැත්නි, මම කලෙකින් ලැබෙන සැප හැර දමා මෙලොව සැප ලුහුබඳිමි. ඇවැත්නි, 'කාමයෝ කාලික ය හ. බොහෝ දුක් ඇත්තෝ ය. බොහෝ වෙහෙස ගෙණ දෙන්නෝ ය. මෙහි දෝෂයෝ බොහෝහ.' 'මේ ධර්මය සන්දිට්ඨික ය. අකාලික ය. එහිපස්සික ය. ඔපනයික ය. නුවණැත්තවුන් විසින් තම තමා කෙරෙහි ලා දත යුතු'ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී."

වහන්ස, එසේ කී කල්හි ඒ දෙව්දූ මට මෙය කිවු ය: "මහණ කෙසේ නම් 'කාමයෝ කාලිකයහ. බොහෝ දුක් ඇත්තෝ ය. බොහෝ වෙහෙස ගෙණ දෙන්නෝ ය. මෙහි දෝෂයෝ බොහෝහ. (කියාත්), කෙසේ නම් මේ ධර්මය සන්දිට්ඨික ය. අකාලික ය. එහිපස්සික ය. ඔපනයික ය. නුවණැත්තවුන් විසින් තමතමන් කෙරෙහි ලා දත යුතු ය' (කියාත්) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දහු දැ?" යි.

වහන්ස, එසේ කී කල්හි මම ඒ දෙව්දුවට මෙය කීයෙමි: "ඇවැත්නි, මම නවකයෙමි. පැවිදි වූ නොබෝ කල් ඇත්තෙමි. මේ සසුනට අලුත පැමිණියෙක්මි. මම විස්තර වශයෙන් කියන්නට නො හැක්කෙමි. අර්හත් වූ සම්මාසම්බුද්ධ වූ මේ ඒ භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර තපෝදාරාමයෙහි වැඩ වසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ විචාරව. භාග්‍ය-වතුන් වහන්සේ යම් පරිද්දෙකින් තට ප්‍රකාශ කරණ සේක් නම් එපරිද්දෙන් එය දරව" යි.

එවං වුත්තෙ භන්තෙ සා දෙවතා මං එතදවොච: "න ඛො භික්ඛු සුකරො සො භගවා අම්හෙහි උපසඞ්කමිතුං, අඤ්ඤාහි මහෙසක්ඛාහි දෙවතාහි පරිවුතො. සචෙ ඛො ත්වං භික්ඛු තං භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාසි. මයම්පි ආගච්ඡෙය්‍යාම ධම්මසවණාය"ති. සචෙ භන්තෙ තස්සා දෙවතාය සච්චං වචනං, ඉධෙව සා දෙවතා අවිදූරෙති.

එවං වුත්තෙ සා දෙවතා ආයස්මන්තං සමිද්ධිං එතදවොච: පුච්ඡ භික්ඛු, පුච්ඡ භික්ඛු, අයමහං[1] අනුප්පත්තාති.

අථ ඛො භගවා තං දෙවතං ගාථාය අජ්ඣභාසි:

අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා,
අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය යොගමායන්ති මච්චුනො.

අක්ඛෙය්‍යං ච[2] පරිඤ්ඤාය අක්ඛාතාරං න මඤ්ඤති,
තඤ්හි තස්ස න හොතීති යෙන තං වජ්ජා න තස්ස අත්ථි,
සචෙ විජානාසි වදෙහි යක්ඛාති.

[දෙවතා:]

න ඛ්වාහං භන්තෙ ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු මෙ භන්තෙ භගවා තථා භාසතු. යථාහං ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති.[3]

[භගවා:]

සමො විසෙසී උදවා[4] නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති,
සචෙ විජානාසි වදෙහි යක්ඛ.

[දෙවතා:]

ඉමස්සපි ඛ්වාහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස න විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු මෙ භන්තෙ භගවා තථා භාසතු, යථාහං ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජා–නෙය්‍යන්ති.[3]

[භගවා:]

පහාසි සඞ්ඛං[5] න විමාන[6] මජ්ඣගා අච්ඡෙච්ඡි[7] තණ්හං ඉධ නාම රූපෙ,
තං ඡින්නගන්ථං අනීඝං නිරාසං පරියෙසමානා නාජ්ඣගමුං
දෙවා මනුස්සා ඉධ වා හුරං වා සග්ගෙසු වා සබ්බනිවෙසනෙසු;
සචෙ විජානාසි වදෙහි යක්ඛාති.

[දෙවතා:]

ඉමස්ස ඛ්වාහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි.

. යමහං. – මජසං, සයා, PTS 2. අනක්ඛෙය්‍යසඤ්ඤා - මජසං, සයා PTS. 3. ජානෙය්‍යන්ති – මජසං, PTS. 4. අථවා – සිමු. 2. 5. සඞ්ඛාච – සි 1. 6. න ච මාන – මජසං 2 7. අචෙඡජ්ජි - සයා, සිමු. 2.

වහන්ස, මෙසේ කී කල්හි ඒ දෙව්දූ මට මෙය කීවුය. "මහණ, ඒ භාග්‍යවතුන් වහන්සේ අප විසින් එළඹෙන්නට සුකර නො වෙති. අනෙක් මහේශාඛ්‍ය දේවතාවන් විසින් පිරිවරණ ලදහ. මහණ, ඉදින් නුඹ වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මේ අරුත විචාරන්නහු නම් අපි දු දහම් ඇසීමට එන්නෙමු" යි. වහන්ස, ඉදින් ඒ දෙව්දූවගේ වචනය ඇත්ත වේ නම් ඒ දෙව්දූ මෙහි ම නුදුරෙහි ය" යි.

එසේ කී කල්හි ඒ දෙව්දූ ආයුෂ්මත් සමිද්ධිතෙරුන්ට "මහණ, විචාරණු මැනව. මහණ, විචාරණු මැනව. මේ මම පැමිණියෙමි" යි මෙය කීවු ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ දෙව්දූවට ගාථායෙන් වදාළ සේක:

සත්ත්වයෝ පඤ්චස්කන්ධයෙහි සත්ත්වපුද්ගලාදි සංඥා ඇත්තෝ ය. පඤ්චස්කන්ධයෙහි (තෘෂ්ණා දෘෂ්ටිග්‍රාහ වශයෙන්) පිහිටියාහු ය. පඤ්චස්කන්ධයන් පිරිසිඳ නො දත මාරයාගේ වසයට යෙත්.

පඤ්චස්කන්ධයන් පිරිසිඳ දත සත්ත්වපුද්ගලාදි වශයෙන් කිසිවකු නො හඟී. යම් හෙයෙකින් ඔහුට ඒ මඤ්ඤනා නො වේ ද (එහෙයිනි). යම් කරුණෙකින් ඔහුට රාගරත්තාදි වශයෙන් කියන්නේ නම් ඒ කරුණ ද ඔහුට නැත: එම්බා දෙව්දූව, ඉදින් (එබඳු රහතකු) දනිහි නම් කියවයි.

[දෙව්දූ:]

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මේ දේශනාවෙහි අරුත විතර විසින් මම නො ම දනිමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මේ දේශනාවෙහි අරුත විතර විසින් යම්සේ මම දත ගන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එපරිද්දෙන් මට වදාරණු මැනවි යි.

[භගවත්හු:]

යමෙක් "(මම අන්‍යයන් හා) සම වෙමි"යි හෝ "විශිෂ්ටයෙමි" යි හෝ නොහොත් "හීනයෙමි" යි හෝ හඟී ද එයින් හේ (අන්‍යයන් හා) විවාද කරන්නේ ය. (යමෙක්)' ත්‍රිවිධ මානයන්හි නො සැලෙන්නේ ද ඔහුට 'සම ය, විශිෂ්ට ය, (හීන ය) යන හැඟීමෙක් නො වේ. එම්බා දෙව්දූව, ඉදින් (එබන්දකු) දනිහි නම් කියව.

[දෙව්දූ:]

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මේ දේශනාවෙහි ද අරුත විතර විසින් මම නො දනිමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මේ දේශනාවෙහි අරුත මම යම්සේ විතර විසින් දත ගන්නෙම් ද භාග්‍යවතුන් වහන්සේ එසේ මට වදාරණු මැනවි යි.

[භගවත්හු:]

ප්‍රඥප්තිය හළේ ය. විවිධ මානයට (=නවවිධ හෝ ත්‍රිවිධ මානයට) නො ගියේ ය. නොහොත් මවුකුසට නො යන්නේ ය. මේ නාමරූප සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණාව මුලුසුන් කෙළේ ය. සුන් කළ කෙලෙස් ගැට ඇති නිදුක් වූ තෘෂ්ණා රහිත වූ ඒ ක්ෂීණාස්‍රවයා සොයන්නා වූ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද මෙලොව හෝ පරලොව හෝ ස්වර්ගයන්හි හෝ සියලු සත්ත්ව නිවෙසනයන්හි හෝ නො දකිත්. එම්බා දෙව්දූව ඉදින් දනිහි නම් කියව.

[දෙව්දූ:]

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මේ දේශනාවෙහි අරුත විතර විසින් මම මෙසේ දනිමි.

[භගවා:]

පාපං න කයිරා වචසා මනසා කායෙන වා කිඤ්චන සබ්බලොකෙ,
කාමෙ පහාය සතිමා සම්පජානො දුක්ඛං න සෙවෙථ අනත්ථසංහිතන්ති.

නන්දනවග්ගො දුතියො.

තස්සුද්දානං:

නන්දනා නන්දති චෙව නත්ථි පුත්තසමෙන ච,
ඛත්තියො සනමානො ච නිද්දා තන්දි ච දුක්කරං,
හිරි කුටිකා නවමො දසමො වුත්තො සමිද්ධිනා'ති.

---

3. සත්තිවග්ගො.

1. 3. 1.

සත්තිසුත්තං.

21. **සාවත්ථියං**—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:[1]

සත්තියා විය ඔමට්ඨො ඩය්හමානොව[2] මත්ථකෙ,
කාමරාගප්පහාණාය සතො භික්ඛු පරිබ්බජෙ'ති.

[භගවා:]

සත්තියා විය ඔමට්ඨො ඩය්හමානොව[2] මත්ථකෙ,
සක්කායදිට්ඨිප්පහාණාය සතො භික්ඛු පරිබ්බජෙ'ති.

1. 3. 2

ඵුසතිසුත්තං.

22. **සාවත්ථියං**—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

නාඵුසන්තං ඵුසති ච ඵුසන්තං ච තතො ඵුසෙ,
තස්මා ඵුසන්තං ඵුසති අප්පදුට්ඨප්පදොසිනන්ති.

[භගවා:]

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති,
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං,
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො'ති.

---

1. **අජ්ඣභාසි - සිමු.** 1. 2. **ඩය්හමානො - සභා, සීමු,** 2. PTS.

[භගවත්හු:]

වචනයෙන් ද සිතින් ද කයින් ද කිසි පවක් නො කරන්නේ ය. මුළු ලොව්හි සියලු කාමයන් හැර සිහි ඇත්තේ මනා නුවණ ඇත්තේ අනර්ථ සහිත වූ දුක නො සෙවුනේ ය.

නන්දන වර්ගය දෙවෙනි යි.

එහි සූත්‍රනාමාවලිය:

නන්දන, නන්දති, නත්ථිපුත්තසම, ඛත්තිය, සනමාන, නිද්දාතන්දි, දුක්කර, හිරි, නව වන කුටිකා, දසවන සමිද්ධි සූත්‍රය ද වේ.

---

3. සත්ති වර්ගය.

1. 3. 1.

සත්ති සූත්‍රය.

21. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සැතෙකින් පහර ලද්දකු මෙන් ද, හිසැ දැවෙන්නකු මෙන් ද මහණ තෙමේ කාමරාග ප්‍රහාණය පිණිස සිහි ඇති ව වෙසෙන්නේ ය.

[භගවත්හු:]

සැතෙකින් පහර ලද්දකු මෙන් ද, හිසැ දැවෙන්නකු මෙන් ද මහණ තෙමේ සත්කායදෘෂ්ටි ප්‍රහාණය පිණිස සිහි ඇති ව වෙසෙන්නේ ය.

1. 3. 2.

ඵුසති සූත්‍රය.

22. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

කර්මය නො පහස්නහු විපාකය තෙමේ ස්පර්ශ නො කෙරෙයි. එහෙයින් කර්මය පහස්නහු විපාකය තෙමේ ස්පර්ශ කරන්නේ ය. එහෙයින් නිදොස් පුග්ගලන්ට ද්වේෂ කරණ කර්මය පහස්නහු විපාකය තෙමේ ස්පර්ශ කෙරෙයි.

[භගවත්හු:]

යමෙක් නිදොස් වූ පිරිසිදු වූ කෙලෙස් නැති පුද්ගලයකුට ද්වේෂ කෙරේ ද, ඒ පාපය තෙමේ උඩුසුලඟට දූලි සියුම රජසක් මෙන් ඒ බාලයා කරා ම පෙරළා එයි.

1. 3. 3.

ජටාසුත්තං

23. **සාවත්ථියං—**

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා,
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටන්ති.

[භගවා:]

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං,
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටන්ති.

යෙසං රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා,
ඛීණාසවා අරහන්තො තෙසං විජටිතා ජටා.

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
පටිඝං රූපසඤ්ඤා ච එත්ථෙසා[1] ඡිජ්ජතෙ ජටාති.

1. 3. 4.

මනොනිවාරණසුත්තං

24. **සාවත්ථියං—**

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

යතො යතො මනො නිවාරයෙ
න දුක්ඛමෙති නං තතො තතො,
ස සබ්බතො මනො නිවාරයෙ
ස සබ්බතො දුක්ඛා පමුච්චතීති[2]

[භගවා:]

න සබ්බතො මනො නිවාරයෙ
මනො යතත්තමාගතං,[3]
යතො යතො ච පාපකං
තතො තතො මනො නිවාරයෙ'ති.

1. 3. 5.

අරහන්තසුත්තං

25. **සාවත්ථියං—**

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

---

1. එත්ථ සා - සසා, - PTS 2. පමුච්චති - මජසං, සී. මු. PTS 3. න මනො සංයතත්තං - මජසං, සයතත්තං - PTS

1. 3. 3.

ජටා සූත්‍රය.

23. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

ඇතුළත අවුල් ය. පිටත අවුල් ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් වෙළුනී ය. එහෙයින් ගෞතමයන් වහන්ස, කවරෙක් මේ අවුල නිරවුල් කරන්නේ දැ යි? එකරුණ පුළුවුස්මි.

[භගවත්හු:]

පිළිසඳනුවණ ඇති කෙලෙස් තවන වෙර ඇති නිරණප්‍රඥායෙන් යුත් සසර බිය දක්නාසුලු ඒ සත්ත්ව තෙමේ ශීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වඩමින් මේ අවුල නිරවුල් කරන්නේ යි.

යම් කෙනකුන් විසින් රාගයත් ද්වේෂයත් අවිද්‍යාවත් දුරු කරණ ලද්දාහු ද, (ඔහු) ක්ෂීණාස්‍රව රහත්හු ය. ඔවුන් විසින් තෘෂ්ණා නැමති අවුල නිරවුල් කරණ ලදී.

යම් තැනෙක නාමයත් රූපයත් ප්‍රතිඝයත් රූපසංඥාවත් නිරවශේෂයෙන් නිරුද්ධ වේද්ද, මෙහි මේ තෘෂ්ණා නැමති අවුල සිඳේ යි.

1. 3. 4.

මනොනිවාරණසූත්‍රය

24. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යමෙකින් යමෙකින් සිත වළකන්නේ ද? එයින් එයින් ඔහුට දුක් නො පැමිණෙයි. හෙතෙමේ සියල්ලෙන් සිත වළක්වන්නේ නම් හෙතෙමේ සියලු දුකෙන් මිදෙයි.

[භගවත්හු:]

සියල්ලෙන් සිත නො වළකන්නේය. සංයත භාවයට පැමිණි සිත නො වළක්වන්නේ ය. යමෙකින් යමෙකින් අකුසල් වේ නම් එයින් එයින් සිත වළක්වන්නේය යි.

1. 3. 5.

අරහන්ත සූත්‍රය

25. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යො හොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිමදෙහධාරී,
අහං වදාමීතිපි සො වදෙය්‍ය
මමං වදන්තීතිපි සො වදෙය්‍යාති.

[භගවා:]

යො හොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිමදෙහධාරී,
අහං වදාමීතිපි සො වදෙය්‍ය
මමං වදන්තීතිපි සො වදෙය්‍ය
ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා,
වොහාරමත්තෙන සො වොහරෙය්‍යාති.

[දෙවතා:]

යො හොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිමදෙහධාරී,
මානං නු ඛො සො උපගම්ම භික්ඛු
අහං වදාමීතිපි සො වදෙය්‍ය
මමං වදන්තීතිපි සො වදෙය්‍යාති.

[භගවා:]

පහීනමානස්ස න සන්ති ගන්ථා
විධූපිතා මානගන්ථස්ස සබ්බෙ,
සො වීතිවත්තො මඤ්ඤතං[1] සුමෙධො
අහං වදාමීතිපි සො වදෙය්‍ය
මවං වදන්තීතිපි සො වදෙය්‍ය,
ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා
වොහාරමත්තෙන සො වොහරෙය්‍යා’ති.

1. 3. 6.

පජ්ජොතසුත්තං

26. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

කති ලොකස්මිං පජ්ජොතා යෙහි ලොකො පකාසති[2],
භගවන්තං[3] පුට්ඨුමාගම්ම කථං ජානෙමු තං මයං.

[භගවා:]

චත්තාරො ලොකෙ පජ්ජොතා පඤ්චමෙත්ථ න විජ්ජති,
දිවා තපති ආදිච්චො රත්තිං ආභාති[4] චන්දිමා,
අථ අග්ගි දිවාරත්තිං තහං තහං පකාසති[2],
සම්බුද්ධො තපතං සෙට්ඨො එසා ආභා අනුත්තරා’ති.

1. මඤ්ඤතා-මජසං, යමතං - ස්‍යා PTS 2. පභාසති - සීමු, 1. සී 1, 3. භවන්තං-PTS 4. රත්තිමාභාති - මජසං, ස්‍යා

සිවුමගින් කළ කිස ඇති ආශ්‍රවයන් නැසූ පශ්චිම ශරීරය දරණ යම් රහත් මහණෙක් වේ ද හෙතෙමේ "මම කියමි"යි කියාත් කියන්නේ ද? හෙතෙමේ "මට කියති" යි කියාත් කියන්නේ ද?

[භගවත්හු:]

සිවුමගින් කළ කිස ඇති ආශ්‍රවයන් නැසූ පශ්චිම ශරීරය දරණ යම් රහත් මහණෙක් වේ ද? හෙතෙමේ "මම කියමි"යි කියාත් කියන්නේ ය. හෙතෙමේ "මට කියති"යි කියාත් කියන්නේ ය. දක්‍ෂ වූ හෙතෙමේ ලෝකයෙහි ව්‍යවහාරය දැන ව්‍යවහාර මාත්‍රයෙන් ව්‍යවහාර කරන්නේ යි.

[දෙවි:]

සිවු මගින් කළ කිස ඇති ආශ්‍රවයන් නැසූ පශ්චිම ශරීරය දරණ යම් රහත් මහණෙක් වේ ද? ඒ මහණ තෙමේ මානයට පැමිණ හෝ "මම කියමි"යි කියාත් කියන්නේ ද? හෙතෙමේ "මට කියති"යි කියාත් කියන්නේ ද?

[භගවත්හු:]

ප්‍රහීණ වූ මාන ඇති ඔහුට මානග්‍රන්ථීහු නැත. ඔහු විසින් සියලු මානග්‍රන්ථීහු වෙසෙසින් නසන ලද්දුහ. මනා නුවණ ඇති හෙතෙමේ මඤ්ඤන ඉක්ම වූයේ ය. හෙතෙමේ 'මම කියමි' යි කියාත් කියන්නේ ය. හෙතෙමේ 'මට කියති'යි කියාත් කියන්නේ ය. දක්‍ෂ වූ ඒ රහත් තෙමේ ලෝකයෙහි ව්‍යවහාරය දැන ව්‍යවහාරමාත්‍රයෙන් ව්‍යවහාර කරන්නේ යි.

1. 3. 6.

පජ්ජෝත සූත්‍රය

26. **සැවැත්නුවර**—

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යමෙකින් ලොව බබලා නම් (එබඳු) එළි ලොව කෙතෙක් ද? භාග්‍යවතුන් වහන්සේ විචාරන්නට අවුත් (සිටිත) අපි එය කෙසේ දනිමු ද?

[භගවත්හු:]

ලොව එළි සතරෙකි. මෙහි පස්වැන්නෙක් නැත. හිරු දවල් බබලයි. සඳු රෑ බබලයි. තව ද, ගින්න දිවා රෑ දෙක්හි ඒ ඒ තැන බබලයි. සම්බුදුවන් වහන්සේ බබලන්නවුන් අතුරෙන් ශ්‍රේෂ්ඨයහ. මේ ආලෝකය නිරුත්තර යි.

1. 3. 7.

සරසුත්තං

27. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කුතො සරා නිවත්තන්ති කත්ථ වට්ටං න වත්තති,[1]
කත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතීති

[භගවා:]

යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති,
අතො සරා නිවත්තන්ති එත්ථ වට්ටං න වත්තති,[1]
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතී'ති.

1. 3. 8.

මහද්ධන සුත්තං

28. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

මහද්ධනා මහාභොගා රට්ඨවන්තො'පි ඛත්තියා,
අඤ්ඤමඤ්ඤාභිගිජ්ඣන්ති කාමෙසු අනලඞ්කතා
තෙසු උස්සුක්කජාතෙසු[2] භවසොතානුසාරිසු,
කෙධ[3] තණ්හං පජහිංසු කෙ ලොකස්මිං අනුස්සුකාති

[භගවා:]

හිත්වා අගාරං පබ්බජිතා[4] හිත්වා පුත්තං පසුං පියං,
හිත්වා රාගඤ්ච දොසඤ්ච අවිජ්ජඤ්ච විරාජිය
ඛීණාසවා අරහන්තො තෙ ලොකස්මිං අනුස්සුකා'ති.

1. 3. 9.

චතුචක්කසුත්තං.

29. සාවත්ථියං—

[දෙවතා:]

චතුචක්කං නවද්වාරං පුණ්ණං ලොභෙන සංයුතං,
පඞ්කජාතං මහාවීර කථං යාත්‍රා භවිස්සති.

[භගවා:]

ඡෙත්වා නද්ධිං[5] වරත්තඤ්ච ඉච්ඡාලොභඤ්ච පාපකං,
සමූලං තණ්හං අබ්බුය්හ එවං යාත්‍රා භවිස්සතී'ති.

---

1. වට්ටති - සී.මු, 1. PTS සී 2. 2. උස්සුකජාතෙසු - සං. 3. කොධ - ස්‍යා. ගධ - PTS.
4 පබ්බජිත්වා - PTS. 5. නන්දිං PTS.

1. 3. 7.

සර සූත්‍රය

27. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථා යෙන් කී ය:

සංසාර ප්‍රවාහයෝ කොහි නවතිද්ද? සසරවැසි කොහි නො වසී ද? නාමයත් රූපයත් කොතැන්හි නිරවශේෂයෙන් නිරුද්ධ වේ ද?

[භගවත්හු:]

යම් තැනක ආපෝ ධාතුවත් පඨවි ධාතුවත් තේජෝ ධාතුවත් වායෝ ධාතුවත් නො පිහිටා ද මෙහි සංසාරප්‍රවාහයෝ නවතිත්. මෙහි සසරවැසි නො වසී. මෙහි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වේ යි.

1. 3. 8.

මහද්ධන සූත්‍රය

28. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙව් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථා යෙන් කී ය:

මහත්ධන ඇති මහත්භෝග ඇති රටවල් ඇති ක්‍ෂත්‍රියයෝ ද කාමයන්හි සෑහීමට නො පැමිණියාහු ඔවුනොවුන් සැපත පතත්.

ඔවුන් (කාමයන්හි) උත්සාහවත් වූ කල්හි භවස්‍රොතස අනු ව යන කල්හි මේ ලෝකයෙහි කවුරු තෘෂ්ණාව දුරු කළාහු ද? ලෝකයෙහි කවුරු (කාමයන්හි) උත්සාහ රහිත වූවාහු ද?

[භගවත්හු:]

ගිහිගෙය හැර ප්‍රිය වූ දරුවන් ද සිවුපාවුන් ද හැර පැවිදි වූ රාගයත් ද්වේෂයත් දුරු කොට අවිද්‍යාවත් නසා (සිටි) ක්‍ෂීණාස්‍රව වූ ඒ රහත්හු ලෝකයෙහි (කාමයන් සෙවීමෙහි) උත්සාහ රහිතයෝ ය.

1. 3. 9.

චතුචක්‍ක සූත්‍රය.

29. සැවැත්නුවර—

[දෙව්:]

මහාවීරයන් වහන්ස, (මේ ශරීරයානය) සක් සතරක් ඇත්තේ ය. නව දෙරක් ඇත්තේ ය. (අශුචියෙන්) පිරුණේ ය. ලෝභයෙන් යුක්ත ය. මඩෙහි උපන. එහි නික්ම යෑම කෙසේ වන්නේ ද?

[භගවත්හු:]

රැහැන ද වරපට ද ලාමක ඉච්ඡාව ද ලෝභය ද සිඳ තෘෂ්ණාව සහමුලින් උදුරා (ලීමෙන්) මෙසේ නික්ම යෑම වන්නේ යි.

1. 3. 10.

එණිජඞ්ඝසුත්තං.

30. **සාවත්ථියං**—

[දෙවතා:]

එණිජඞ්ඝං කිසං වීරං අප්පාහාරං අලොලුපං,
සීහං වෙකචරං නාගං කාමෙසු අනපෙක්ඛිනං,
උපසඞ්කම්ම පුච්ඡාම කථං දුක්ඛා පමුච්චතීති.

[භගවා:]

පඤ්ච කාම ගුණාලොකෙ මනොඡට්ඨා පවෙදිතා,
එත්ථ ඡන්දං විරාජෙත්වා එවං දුක්ඛා පමුච්චතීති.

සත්තිවග්ගො තතියො.

තස්සුද්දානං:

සත්තියා ඵුසති චෙව ජටා මනො නිවාරණා,
අරහන්තෙන පජ්ජොතො සරා මහද්ධනෙන ච,
චතුචක්කෙන නවමං එණිජඞ්ඝෙන තෙ දසාති.

---

4. සතුල්ලපකායිකවග්ගො.

1. 4. 1.

සබ්භිසුත්තං.

31. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

අථ ඛො සම්බහුලා **සතුල්ලපකායිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු.

එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සෙය්‍යො හොති න පාපියොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

1. 3. 10.

එණිජඞ්ඝ සූත්‍රය.

30. **සැවැත්නුවර**—

[දෙවි:]

එණිමුවකුගේ මෙන් කෙණ්ඩා ඇති කෘශ වූ ස්වල්පාහාර ඇති ලොල් බැව් නැති, සිංහයකු මෙන් ඇතකු මෙන් එකලාව හැසිරෙන, කාමයන්හි නිරපේක්‍ෂක වූ වීරයන් වහන්සේ වෙත එළඹ කෙසේ දුකින් මිදේ දැ?යි විචාරමි.

[භාගවත්හු:]

ලොව මනස සවැනි කොට ඇති පඤ්චකාමගුණයෝ ප්‍රකාශ කරණ ලදහ. මෙහි ඇල්ම දුරු කොට ලීමෙන් මෙසේ දුකින් මිදෙයි.

සත්තිවර්ගය තෙවනි යි.

එහි සූත්‍රනාමාවලිය:

සත්ති, ඵුසති, ජටා, මනොනිවාරණ, අරහන්ත, පජ්ජෝත, සර, මහද්ධන සූත්‍ර ද, නවවැනි චතුචක්ක සූත්‍රය ද, එණිජඞ්ඝ සූත්‍රය දැයි දශසූත්‍ර කෙනෙක් වෙත්.

---

4. සතුල්ලපකායික වර්ගය.

1. 4. 1.

සබ්භි සූත්‍රය.

31. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරමහි වැඩ වසන සේක.

එකල්හි මනා ඡවිවණී ඇති බොහෝ වූ **සතුල්ලපකායික** දේවතාවෝ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ.

එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේ ය:

සත්පුරුෂයන් සමග ම එක් වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන (සිටියහුට) අතිවෘද්ධිය වෙයි. පිරිහීමෙක් නො වෙයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය පඤ්ඤා ලබ්භති[1] නාඤ්ඤතොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සොකමජ්ඣෙ න සොචතීති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය ඤාතිමජ්ඣෙ විරොචතීති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සත්තා ගච්ඡන්ති සුගතින්ති.[2]

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සත්තා තිට්ඨන්ති සාතතන්ති.

අථ ඛො අපරා දෙවතා භගවන්තං එතදවොච: කස්ස නු ඛො භගවා[3] සුභාසිතන්ති.

[භගවා:]

සබ්බාසං වො සුභාසිතං පරියායෙන. අපි ච මමාපි[4] සුණාථ:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සබ්බදුක්ඛා පමුච්චතීති.

ඉදමවොච භගවා. අත්තමනා තා දෙවතායො භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසූති.[5]

---

1. පඤ්ඤං ලභති - සයා. 2. සුගතින්ති - සයා. 3. භගව - PTS. 4. මමපි - මජසං. මමම්පි - PTS. 5. ඉදමවොච -පෙ- තත්ථෙවන්තරධායිංසූති පාඨො සයා, PTS; පොත්ථකෙසු න දිස්සතෙ

සත්පුරුෂයන් සමග ම එක් වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනීමෙන් ප්‍රඥාව ලැබේ. අනෙකකින් නො ලැබේ.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සත්පුරුෂයන් සමග ම එක් වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනීමෙන් ශෝක-කාරණයන් මැද ශෝක නො කෙරේ.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනීමෙන් නෑයන් මැද වෙසෙසින් බබලයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සත්පුරුෂයන් සමග ම එක් වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනීමෙන් සත්ත්වයෝ සුගතියට යෙත්.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සත්පුරුෂයන් සමග ම එක් වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනීමෙන් සත්ත්වයෝ බොහෝකල් සුව සේ සිටිත්.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: භාග්‍යවතුන් වහන්ස, කවරකු විසින් මැනවින් කියන ලද්දේ ද?

[භගවත්හු:]

තොප සියල්ලන් විසින් කරුණු වශයෙන් මැනවින් කියන ලදී. වැලි දු මගේ (වචනය) ද අසවු:

සත්පුරුෂයන් සමග ම එක් වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍රසංස්තවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනීමෙන් සියලු දුකින් මිදෙයි.

භාග්‍යවතු වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ දෙවතාවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වූහ යි.

1. 4. 2.

මච්ඡරිසුත්තං

32. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො සම්බහුලා සතුල්ලපකායිකා දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

මච්ඡෙරා ච පමාදා ච එවං දානං න දීයති,
පුඤ්ඤමාකඞ්ඛමානෙන[1] දෙය්‍යං හොති විජානතාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

යස්සෙව භීතො න දදාති මච්ඡරී තදෙවාදදතො[2] භයං,
ජිඝච්ඡා ච පිපාසා ච යස්ස භායති මච්ඡරී,
තමෙව බාලං ඵුසති අස්මිං ලොකෙ පරම්හි ච.

තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දාන මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

තෙ මතෙසු න මීයන්ති[3] අද්ධානං[4] ව සහබ්බජං[5],
අප්පස්මිං යෙ පවෙච්ඡන්ති එස ධම්මො සනන්තනො.

අප්පස්මෙකෙ පවෙච්ඡන්ති බහුනෙකෙ න දිච්ඡරෙ,
අප්පස්මා දක්ඛිණා දින්නා සහස්සෙන සමං මිතා.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

දුද්දදං දදමානානං දුක්කරං කම්ම කුබ්බතං,
අසන්තො නානුකුබ්බන්ති සතං ධම්මො දුරන්නයො[6].

තස්මා සතඤ්ච අසතඤ්ච[7] නානා හොති ඉතො ගති,
අසන්තො නිරයං යන්ති සන්තො සග්ගපරායණාති.

අථ ඛො අපරා දෙවතා භගවන්තං[8] එතදවොච: කස්ස නු ඛො භගවා සුභාසිතන්ති?

[භගවා:]

සබ්බාසං වො සුභාසිතං පරියායෙන. අපි ච මමාපි සුණාථ:

ධම්මං චරෙ යොපි සමුඤ්ජකං[9] චරං[10] දාරඤ්ච පොසං දදමප්පකස්මිං,
සතං සහස්සානං සහස්සයාගිනං කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙති

1. පුඤ්ඤං ආකඞ්ඛමානෙන - මජසං. 2. තදෙවාදදතො - PTS 3. මීය්‍යන්ති - සයා. 4. පන්ථානං-සී. 5. සභාවජං - සයා, සී.මු. 2. PTS 6. දුරන්වයො - මජසං, සයා. 7. අසතං - මජසං, 8. භගවතො සන්තිකෙ - මජසං. 9. සමුඤ්ජකං - සයා. 10. චරං. දාරඤ්ච

1. 4. 2.

මච්ඡරි සූත්‍රය

32. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. එකල්හි මනා ජවිවණි ඇති බොහෝ වූ **සතුල්ලපකායික** දේවතාවෝ පෙරයම ඉක්ම ගිය කල මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගය කී ය:

මසුරුකමින් ද ප්‍රමාදයෙන් ද මෙසේ දන් නො දෙනු ලැබේ. පින් කැමැති (දනඵල) දන්නහු විසින් දිය යුතු වේ.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය:

මසුරු පුද්ගල තෙමේ යමකට ම බිය වූයේ දන් නො දේ ද, නො දෙන ඔහුට එය ම බිය වේ. මසුරු පුද්ගල තෙමේ යමකට බිය වේ ද, ඒ බඩසය ද පවස ද ඒ බාලයා ම මෙලෙව්හිත් පරලෙව්හිත් පහස්තේ ය.

එහෙයින් මසුරුමල මැඩ ලන පුද්ගල තෙමේ මසුරුකම දුරු කොට දන් දෙන්නේ ය. පින් පරලෙව්හි දී සතුන්ට පිහිට වේ.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය:

යම් කෙනෙක් මඟ කැටු වැ යනුවනට (ලදදෙය බෙදා දෙන්නාක්) සෙයින් සවල්පයක් ඇති කල්හිත් දෙත් ද, ඔහු (අදත මරණයෙන්) මළවුන් අතර නො මියෙත්. මේ පැරණි දහමෙකි.

ඇතැම්හු සවල්පයක් ඇති කල්හිත් දෙත්. ඇතැම්හු බොහෝ භෝගයෙන් සමන්වාගත වූවාහු ද නො දෙත් මිඳ දෙයින් දෙන ලද දක්ෂිණාව දහසක් (=දහසෙකින් දෙන ලද දන) හා සම ය යි ප්‍රමාණ කරණ ලදී.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථා කී ය:

අසත්පුරුෂයෝ (සවල්පයක් ඇති කල්හි දීම වූ) දුෂ්කර දනය දෙන දුෂ්කර (සුචරිත) ක්‍රියා කරණ (සත්පුරුෂයන්ට) අනුක්‍රියා නො කෙරෙත්. සත්පුරුෂයන්ගේ ධර්මය දුෂ්පූර ය. (එහෙයිනි.)

එහෙයින් සත්පුරුෂයන්ගේත් අසත්පුරුෂයන්ගේත් මෙලොවින් පරලොව යැම එකිනෙක වෙනස් වේ. අසත්පුරුෂයෝ නිරයට යෙත්. සත්පුරුෂයෝ සවර්ගපරායණ වෙත්.

ඉක්බිති අන් දෙව්යෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: භාග්‍යවතුන් වහන්ස, කවරකු විසින් මැනවින් කියන ලද ද?

[භගවත්හු:]

තොප සියල්ලන් විසින් කරුණු විසින් මැනවින් කියන ලදී. යළි දු මගේ (වචනය) ද අසවු:

යමෙක් උඤ්ඡාචරියාවෙහි හැසිරෙන්නේ (කලවිටි ගුඩු කිරීම පිදුරු පෙළීම් ආදී වශයෙන් දුක සේ ජීවිකාව පවත්වන්නේ) අඹුදරුවනුත් පෝෂණය කරමින් සවල්පයක් ඇති කල්හිත් දෙමින් දහමෙහි හැසිරෙන්නේ ද, සහස්‍රයාග කළ (ලක්‍ෂයක් දෙනකුන්ගේ ඒ යාගක්‍රියාවෝ එබඳු දිළින්දගේ (දනක්‍රියාවන් පිළිබඳ) ශතභාගයකුත් නො අගිත්.

අථ ඛො අපරා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කො තෙස යඤ්ඤො විපුලො මහග්ගතො
සමෙන දින්නස්ස න අග්ඝමෙති,
කථං[1] සතං සහස්සානං[2] සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙති.

අථ ඛො භගවා තං දෙවතං ගාථාය අජ්ඣභාසි:

දදන්ති හෙකෙ[3] විසමෙ නිවිට්ඨා
ඡෙත්වා[4] වධිත්වා අථ සොචයිත්වා,
සා දක්ඛිණා අස්සුමුඛා සදණ්ඩා
සමෙන දින්නස්ස න අග්ඝමෙති.
එවං සතං සහස්සානං[2] සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙති.

1. 4. 8.

සාධුසුත්තං

33. සාවත්ථියං—

අථ ඛො සම්බහුලා **සතුල්ලපකායිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං **ජෙතවනං** ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සාධු ඛො මාරිස දානං.

මච්ඡෙරා ච පමාදා ච එවං දානං න දීයති,
පුඤ්ඤමාකඞ්ඛමානෙන දෙය්‍යං හොති විජානතාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සාධු ඛො මාරිස දානං. අපි ච අප්පස්මිම්පි[5] සාධු[6] දානං.

අප්පස්මෙකෙ පවෙච්ඡන්ති බහුනෙකෙ න දිච්ඡරෙ,
අප්පස්මා දක්ඛිණා දින්නා සහස්සෙන සමං මිතාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සාධු ඛො මාරිස දානං. අප්පස්මිම්පි සාධු[6] දානං. අපි ච සද්ධායපි සාධු[6] දානං.

දානඤ්ච යුද්ධඤ්ච සමානමාහු අප්පාපි සන්තා බහුකෙ ජිනන්ති,
අප්පම්පි චෙ සද්දහානො දදාති තෙනෙව සො හොති සුඛී පරත්ථාති

1. 'කථං' - සී.මු. PTS පොත්ථකෙසු නත්ථි. 2. සහස්සාන - ස්‍යා. 3. එකෙ - PTS.
4. ඣත්වා - ස්‍යා. 5. අප්පකස්මිම්පි - ස්‍යා, මජසං, 6. සාධු - ස්‍යා.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

මහත් වූ උදුරබවට පැමිණි මේ දානය දැහැමින් සෙමෙන් දෙන ලද දානයේ වටනාකමට කුමක් හෙයින් නො පැමිණේ ද? සහස්‍රයාග කළ ලක්‍ෂයක් දෙනකුන්ගේ ඒ දානක්‍රියාවෝ එබඳු (දිළින්දාගේ) දානක්‍රියා පිළිබඳ ශතභාගයකුත් කෙසේ නම් නො අගිත් ද?

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ දේවතාවාට ගාථායෙන් වදාළ සේක:

කෙනෙක් විෂම වූ (කායවාඞ්මනඃ) කර්මයෙහි පිහිටියාහු (මෙරමා) තළා මරා යළි ශෝක කරවා දෙත් ම ය. (කඳුළු වැකුණු මුහුණු ඇති කොට මෙරමාහට දඬුවම් කොට දුන් හෙයින්) **අශ්‍රුමුඛ** නම් වූ **සදණ්ඩ** නම් වූ ඒ දක්‍ෂිණාව දැහැමින් සෙමෙන් දෙන ලද දානයේ වටනාකමට නො පැමිණේ. සහස්‍රයාග කළ ලක්‍ෂයක් දෙනකුන්ගේ ඒ දානක්‍රියාවෝ එබඳු (දිළින්දාගේ) දානක්‍රියා පිළිබඳ ශතභාගයකුත් මෙසේ නො අගිත්.

1. 4. 3.

සාධු සූත්‍රය

33. **සැවැත්නුවර**—

එකල්හි මනා ඡවිවර්ණ ඇති බොහෝ වූ **සතුල්ලපකායික** දේවතාවෝ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු **දෙව්රම** බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ උදානය පහළ කෙළේ ය:

නිදුකාණන් වහන්ස, දීම මැනවි.

මසුරු කමින් ද, ප්‍රමාදයෙන් ද මෙසේ දානය නො දෙනු ලැබේ. පින් කැමැති (පින්පල) දත්තහු විසින් දිය යුතු වෙයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ උදානය පහළ කෙළේ ය:

නිදුකාණන් වහන්ස, දීම මැනවි. තව ද, මදක් ඇති කල්හිත් දීම මැනවි.

ඇතැම්හු මදක් ඇති කල්හිත් දෙති. ඇතැම්හු බොහෝ භෝගයෙන් සමන්වාගත වූවාහු ද නො දෙති. මදෙකින් දෙන ලද දක්‍ෂිණාව දහසක් හා සම ය යි ප්‍රමාණ කරණ ලදී.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීති-වාක්‍යය පහළ කෙළේ ය:

නිදුකාණන් වහන්ස, දීම මැනවි. ස්වල්පයක් ඇති කල්හි දීමත් මැනවි. තව ද, ශ්‍රද්ධායෙන් දීමත් මැනවි.

දානයත් යුද්ධයත් සමාන ය යි කියත්. ස්වල්ප වූත් වීරපුරුෂයෝ බොහෝ වූ බියසුල්ලන් දිනත්. ඉදින් සැදැහැත්තේ ස්වල්පයකුත් දේ ද, එයින් ම හෙ තෙමේ පරලොව සුව ඇත්තේ වේ.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සාධු ඛො මාරිස දානං. අප්පස්මිම්පි සාධු[1] දානං. සද්ධායපි සාධු[1] දානං. අපි ච ධම්මලද්ධස්සපි සාධු[1] දානං.

යො ධම්මලද්ධස්ස දදාති දානං උට්ඨානවිරියාධිගතස්ස ජන්තු,
අතික්කම්ම සො[2] වෙතරණිං යමස්ස දිබ්බානි ඨානානි
උපෙති මච්චොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සාධු ඛො මාරිස දානං. අප්පස්මිම්පි සාධු[1] දානං. සද්ධායපි සාධු[1] දානං.. ධම්මලද්ධස්ස පි සාධු[1] දානං. අපි ච විචෙය්‍ය දානම්පි සාධු.[3]

විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සාධු ඛො මාරිස දානං. අප්පස්මිම්පි සාධු දානං. සද්ධායපි සාධු[1] දානං. ධම්මලද්ධස්සපි සාධු[1] දානං. විචෙය්‍ය දානම්පි සාධු.[1] අපි ච පාණෙසුපි සාධු සංයමො.

යො පාණභූතෙසු[4] අහෙඨයං චරං පරූපවාදා න කරොති පාපං,
භීරුං පසංසන්ති න හි තත්ථ සූරං භයා හි සන්තො න
කරොන්ති පාපන්ති.

අථ ඛො අපරා දෙවතා භගවන්තං එතදවොච: කස්ස නු ඛො භගවා සුභාසිතන්ති?

[භගවා:]

සබ්බාසං වො සුභාසිතං පරියායෙන. අපි ච මමාපි සුණාථ

සද්ධාහි දානං බහුධා පසත්ථං
දානා ච ඛො ධම්මපදංව සෙය්‍යො.
පුබ්බෙ ච හි[5] පුබ්බතරෙ ච සන්තො
නිබ්බාණමෙවජ්ඣගමුං සපඤ්ඤාති.

1. 4. 4.

න සන්තිසුත්තං.

34. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

1. සාධූ - සයා. 2. අතික්කම්ම - සයා. 3. සාධුදානං - මජසං 4. භූතානි. - මජසං, සයා. 5. පුබ්බෙව හි - සයා, PTS.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රතිවාක්‍යය පහළ කෙළේ ය:

නිදුකාතන් වහන්ස, දීම මැනවි. මඳක් ඇති කල්හි දීමත් මැනවි. සැදැහැයෙන් දීමත් මැනවි. තව ද, දැහැමින් ලද දෙයක් දන් දහම් ඇති ආය්‍යීපුද්ගලයකුට දීමත් මැනවි.

යම් සත්ත්වයෙක් උත්‍ථානයෙන් හා වීය්‍යීයෙන් ලැබූ වස්තු දන් දහම් ඇති ආය්‍යීපුද්ගලයකුට දන් දේ ද, ඒ මිනිස් තෙමේ යමයාගේ වෙතරණී නිරය ඉක්මවා දිව්‍යස්ථානයන්ට පැමිණේ.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රතිවාක්‍යය පහළ කෙළේ ය:

නිදුකාතන් වහන්ස, දීම මැනවි, මඳක් ඇති කල්හි දීමත් මැනවි. සැදැහැයෙන් දීමත් මැනවි. දැහැමින් ලද දෙය දන් දහම් ඇත්තකුට දීමත් මැනවි. තව ද, (දානවස්තූන් හා ප්‍රතිග්‍රාහකයන්) තෝරා ගෙණ දීමත් මැනවි.

තෝරා ගෙණ දීම භාග්‍යවතුන් වහන්සේ විසින් පසස්නා ලදී. මේ සත්ත්වලෝකයෙහි යම් දක්ෂිණාහීයෝ වෙද්ද, මොවුන් විෂයෙහි දෙන ලද්දහු සරු කෙතෙක වපුළ බිජුවට මෙන් මහත්ඵල වෙත්.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රතිවාක්‍යය පහළ කෙළේ ය:

නිදුකාතන් වහන්ස, දීම මැනවි. මඳක් ඇති කල්හි දීමත් මැනවි. සැදැහැයෙන් දීමත් මැනවි. දැහැමින් ලද දෙය දන් දහම් ඇත්තකුට දීමත් මැනවි. තෝරා දීමත් මැනවි. තව ද, ප්‍රාණීන් කෙරෙහි සංයමයත් (-ප්‍රාණඝාතයෙන් වැළැක්මත්) මැනවි.

යමෙක් සත්ත්වයන් නො වෙහෙසමින් හැසිරෙන්නේ පරෝපවාද හේතුවෙන් පව් නො කෙරේ ද, එහි ලා (සත්පුරුෂයෝ) පවට බියසුල්ලාට පසසත්. (පව්කිරීමෙහි) සූරයා නො පසසත්. සත්පුරුෂයෝ උපවාදයන්ට බියෙන් පව් නො කෙරෙත් ම ය. එහෙයිනි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භාග්‍යවතුන් වහන්ස, කවරකු විසින් මැනවින් කියන ලද ද?

[භගවත්හු:]

තොප සියල්ලන් විසින් පය්‍යීයයෙන් සුභාෂිත ය. වැලි දු මාගේ (වචනය) ද අසවු:

සැදැහැයෙන් දීම නන්අයුරින් පසස්නා ලදී. දානයට වඩා ධම්පදය හෙවත් නිර්‍වාණය ම ශ්‍රෙෂ්ඨ ය. පෙර ද, ඉතා පෙර ද, නුවණැති සත්පුරුෂයෝ නිවණ ම අවබොධ කළාහු ය.

1. 4. 4.

නසන්ති සූත්‍රය.

34. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරමහි වැඩවසන සේක.

අථ ඛො සම්බහුලා **සතුල්ලපකායිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

න සන්ති කාමා මනුජෙසු නිච්චා සන්තීධ කමනීයානි යෙසු බද්ධො,
යෙසු පමත්තො අපුනාගමනං අනාගන්තා පුරිසො මච්චුධෙය්‍යාති.
ඡන්දජං අඝං ඡන්දජං දුක්ඛං ඡන්දවිනයා අඝවිනයො
අඝවිනයා දුක්ඛවිනයොති.

න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ සඞ්කප්පරාගො පුරිසස්ස කාමො,
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ අථෙත්ථ[1] ධීරා විනයන්ති ඡන්දං.

කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං සංයොජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිමසජ්ජමානං[2] අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා.

පහාසි සඞ්ඛං න ච මානමජ්ඣගා අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ,
තං ඡින්නගන්ථං අනීඝං නිරාසං පරියෙසමානා නාජ්ඣගමුං
දෙවා මනුස්සා ඉධ වා හුරං වා සග්ගෙසු වා සබ්බනිවෙසනෙසූති.

තඤ්චෙ හි නාද්දක්ඛුං තථා විමුත්තං (ඉච්චායස්මා **මොඝරාජා:**)
දෙවා මනුස්සා ඉධ වා හුරං වා,
නරුත්තමං අත්ථචරං නරානං යෙ තං නමස්සන්ති පසංසියා තෙති?

පසංසියා තෙපි භවන්ති භික්ඛූ (**මොඝරාජා'ති** භගවා:)
යෙ තං නමස්සන්ති තථා විමුත්තං,
අඤ්ඤාය ධම්මං විචිකිච්ඡං පහාය සඞ්ගාතිගා තෙපි භවන්ති භික්ඛූති.

1. 4. 5.

උජ්ඣානසඤ්ඤිසුත්තං.

35. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො සම්බහුලා **උජ්ඣානසඤ්ඤිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා වෙහාසං අට්ඨංසු. වෙහාසං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

1. අථෙත්ථ - P.T.S. .2 රූපස්මිං අසජ්ජ මානං-සී.මු. 1.

එකල්හි මනා ඡවිවණී ඇති බොහෝ වූ සතුල්ලපඤායිකා දේවතාවෝ පෙරයම ඉක්ම ගිය කල මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාකී ය:

මිනිසුන් කෙරෙහි නිත්‍ය වූ කාමයෝ නැත. යම් කාම වස්තූන් කෙරෙහි බැඳුනු යම් කාමවස්තූන්හි ප්‍රමත්ත වූ පුරුෂ තෙමේ මෘත්‍යුධෙය සඞ්ඛ්‍යාත සසරින් අපුනරාගමන සඞ්ඛ්‍යාත නිවණට නොපැමිණෙන්නේ වේ ද, (එබඳු වූ) ඉෂ්ටාලම්බනයෝ මේ ලෝකයෙහි ඇත. (පඤ්චස්කන්ධ) දුඃඛය තෘෂ්ණාච්ඡන්දයෙන් හටගන්නේ ය. (පඤ්චෝපාදානස්කන්ධ) දුඃඛය තෘෂ්ණාච්ඡන්දයෙන් හටගන්නේ ය. තෘෂ්ණාව දුරු කිරීමෙන් (පඤ්චස්කන්ධ) දුඃඛය දුරු කිරීම වේ. (පඤ්චස්කන්ධ) දුඃඛය දුරු කිරීමෙන් සියලු සංසාරදුඃඛය දුරු කිරීම වේ.

ලෝකයෙහි විචිත්‍ර වූ යම් (රූපාදි) අරමුණු ඇත් ද, ඔහු කාමයෝ නො වෙත්. පුරුෂයාගේ (ශුභාදිවශයෙන්) සංකල්පිත රාගය තෙමේ කාමය යි. ලෝකයෙහි විසිතුරු වූ (රූපාදි) අරමුණු එසේ ම සිටී. වැලින් පණ්ඩිතයෝ මේ ආරම්මණයන්හි ඡන්දරාගය දුරු කෙරෙත්.

ක්‍රෝධය දුරු කරන්නේ ය. මානය වෙසෙසින් බැහැර කරන්නේ ය. සියලු සංයෝජන ඉක්මවන්නේ ය. නාමරූප දෙක්හි නොඇලෙන රූපාදි පළිබෝධ රහිත වූ ඒ ක්ෂීණාස්‍රවයා මතුයෙහි (සංසාර) දුඃඛයෝ නො වැටෙත්.

(යමෙක්) සත්ත්වප්‍රඥප්තිය දුරු කෙළේ ද, මානයට නො පැමිණියේ ද, මේ නාමරූප දෙක්හි තෘෂ්ණාව සිඳ ලූයේ ද, සුන් කල තෘෂ්ණාග්‍රන්ථි ඇති නිදුක් වූ ආශාරහිත වූ ඒ ක්ෂීණාස්‍රවයන් වහන්සේ දෙවියෝත් මනුෂ්‍යයෝත් මෙලොව ද පරලොව ද ස්වර්ගයන්හි ද සියලු සත්ත්වනිවෙසනයන්හි ද සොයන්නාහු නමුත් නො ලබත්.

(මොඝරාජ ස්ථවිර තෙමේ මෙසේ කී ය:) ඉදින් දෙවියෝත් මනුෂ්‍යයෝත් එසේ මිදුනු ඒ සර්වඥයන් වහන්සේ මෙලොවත් පරලොවත් නො දක්නාහු ද, මිනිසුන්ට හිතවැඩ සලසන නරශ්‍රේෂ්ඨ වූ ඒ සර්වඥයන් වහන්සේට යම් කෙනෙක් නමස්කාර කෙරෙත් නම්, ඔහු පැසසිය යුත්තෝ ද?

(භාග්‍යවතුන් වහන්සේ: මොඝරාජය,) යම් කෙනෙක් එසේ මිදුනු ඒ සර්වඥයන් වහන්සේට නමස්කාර කෙරෙද්ද, ඒ භික්ෂූහු පැසසිය යුත්තෝත් වෙති. ඒ භික්ෂූහු ධර්මය දැන විචිකිච්ඡාව දුරු කොට (රාගාදි) සඞ්ගයන් ඉක්ම ගියාහු ද වෙති.

1. 4. 5.

උජ්ඣානසඤ්ඤි සූත්‍රය.

35. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල මනා ඡවිවණී ඇති බොහෝ වූ උජ්ඣානසඤ්ඤික දෙවතාවෝ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ අහසෙහි සිටියහ. අහසෙහි සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

අඤ්ඤදත්ථා සන්තමත්තානං අඤ්ඤදත්ථා යො පවෙදයෙ,
නිකච්ච කිතවස්සෙ'ව භුත්තං ථෙය්‍යෙන තස්ස තං.

[භගවා:]

යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානානං[1] පරිජානන්ති පණ්ඩිතා.

නයිදං භාසිතමත්තෙන එකන්තසවණෙන වා,
අනුක්කමිතවෙ[2] සක්කා යායං පටිපදා දළ්හා,
යාය ධීරා පමුච්චන්ති ඣායිනො මාරබන්ධනා.

න වෙ ධීරා පකුබ්බන්ති විදිත්වා ලොකපරියායං,
අඤ්ඤාය නිබ්බුතා ධීරා තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.

අථ ඛො තා දෙවතායො පථවියං පතිට්ඨහිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං. අච්චයො නො භන්තෙ, අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං,[3] යා මයං භගවන්තං ආසාදෙතබ්බං[4] අමඤ්ඤිම්හා. තාසං නො භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු[5] ආයතිං සංවරායා'ති.

අථ ඛො භගවා සිතං පාත්වාකාසි.

අථ ඛො තා දෙවතායො භීයොසොමත්තාය උජ්ඣායන්තියො වෙහාසං අබ්භුග්ගඤ්ඡුං.

එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:[6]

අච්චයං දෙසයන්තීනං යො චෙ[7] න පටිගණ්හති,
කොපන්තරො දොසගරු ස වෙරං පටිමුච්චති.

[භගවා:]

අච්චයො චෙ න විජ්ජෙථ නො චිධාපගතං[8] සියා,
වෙරානි ච සම්මෙය්‍යුං තෙනීධ කුසලො සියා.

[දෙවතා:]

කස්සච්චයා න විජ්ජන්ති කස්ස නත්ථි අපාගතං[9]
කො සම්මොහමාපාදි කො වා[10] ධීරො සදා සතොති.

---

1. භාසමානං - මජසං. 2. අනුක්කමිතුං වෙ - PTS. 3 යථාබාලා යථාමූළ්හා යථා අකුසලා - කාළුවි. 4. අපසාදෙතබ්බං - සෑ. 5. පටිග්ගණ්හාතු - මජසං, සෑ. 6. අචොචි - PTS. 7. යො වෙ - PTS 8. නො චිධ අපහතං - සෑ. 9 අපාහතං-සෑ. 10. කො ච - මජසං PTS. කොධ - සෑ.

යම් මහණෙක් අන් අයුරෙකින් පවත්නා තමා අන් අයුරෙකින් (ඇතිසැටි වළහා) ප්‍රකාශ කරන්නේ ද, ලිහිණි වැද්දාගේ (ලිහිණිමස් කෑම) මෙන් ඔහු විසින් ඒ සිවුපසය වඤ්චායෙන් රවටා හොරකමින් අනුභව කරණ ලද්දේ ය.

[භගවත්හු:]

යමක් කරන්නේ නම්, එය ම කියන්නේ ය. යමක් නොකරන්නේ නම්, එය නොකියන්නේ ය. කියන්නවුන් අතුරෙන් නොකරන්නහු පණ්ඩිතයෝ දැන ගණිත්.

යම් මේ ප්‍රතිපදායෙක් දැඩි ද, ධ්‍යාන කරණසුලු පණ්ඩිතයෝ යම් ප්‍රතිපදායෙකින් මාරබන්ධනයෙන් මිදෙද් ද, මේ ප්‍රතිපත්තිය කථිතමාත්‍රයෙකින් හෝ ශ්‍රවණමාත්‍රයෙකින් හෝ පිළිපදින්නට නො හැකි ය.

සංස්කාරලෝකයාගේ උදයව්‍යයස්වභාවය දැන (චතුස්සත්‍යය) අවබෝධ කොට ලෝකයෙහි විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරණය කළා වූ (කෙලශ පරිනිර්වාණයෙන්) පිරිනිවියා වූ පණ්ඩිතයෝ ඒකාන්තයෙන් (මෙසේ) නො කෙරෙත්.

ඉක්බිති ඒ දේවතාවෝ පොළොවෙහි පිහිටා භාග්‍යවතුන් වහන්සේගේ පා ළඟ හිසින් වැඳ වැටී භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, යම්බඳු අපි බාල බවට අනුරූප සේ මූඪබවට අනුරූපසේ අදක්‍ෂබවට අනුරූප සේ භාග්‍යවතුන් වහන්සේ වචනයෙන් ගැටිය යුත්තකු කොට සිතුමු ද, ඒ වරද අප ඉක්ම ගියේ ය. වහන්ස, ඒ අපගේ වරද ආයතිසංවරය පිණිස වරද වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක්වා" යි මෙය සැළ කළහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සිනා පහළ කළ සේක.

එකල්හි ඒ දේවතාවෝ බොහෝ ¯ සෙසින් දෙස් පහළ කෙරෙමින් අහසට නැංගහ.

එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යමෙක් දෙසන්නවුන්ගේ වරද නො පිළිගණී ද, ඇතුළත කෝප ඇති ද්වේෂය ගුරු කොට ගෙණ වසන හෙතෙමේ ඒකාන්තයෙන් වෛරය (තමා කෙරෙහි) බැඳ තබයි.

[භගවත්හු:]

ඉදින් මෙහි වරදෙක් නැත් නම්, ඉදින් අපරාධයෙකුත් නො වන්නේ නම්, වෛරයෝත් සංසිඳෙන්නාහු නම්, එයින් මෙහි (නිරවද්‍ය-වර්‍යායෙහි) දක්‍ෂයෙක් වන්නේ ය.

[දෙවි:]

කවරකුගේ වැරදි නැද්ද? කවරකුගේ අපරාධ නැද්ද? කවරෙක් මුළාවට නො පැමිණේ ද? කවරෙක් හැම කල්හි සිහි ඇත්තේ ද? පණ්ඩිත ද?

[භගවා:]

තථාගතස්ස බුද්ධස්ස සබ්බභූතානුකම්පිනො,
තස්සච්චයා න විජ්ජන්ති තස්ස නත්ථි අපාගතං,
සො න සම්මොහමාපාදි සොව[1] ධීරො සදා සතො.

අච්චයං දෙසයන්තීනං යො වෙ න පටිගණ්හති,
කොපන්තරො දෙසගරු ස වෙරං[2] පටිමුඤ්චති,
තං වෙරං නාභිනන්දාමි පතිගණ්හාමි වොච්චයන්ති.

1. 4. 6.

සද්ධාසුත්තං.

36. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො සම්බහුලා **සතුල්ලපකායිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සද්ධා දුතියා පුරිසස්ස හොති නො වෙ අස්සද්ධියං අවතිට්ඨති
යසො ච කිත්ති ච තත්වස්ස හොති.
සග්ගඤ්ච සො ගච්ඡති සරීරං පහායාති.[3]

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං සංයොජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිමසජ්ජමානං අකිඤ්චනං නානුපතන්ති සඞ්ගාති.

පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨං'ව[4] රක්ඛති

මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො පප්පොති පරමං සුඛන්ති.

1. 4. 7.

සමයසුත්තං.

37. එවං මෙ සුතං: එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං මහාවනෙ** මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච.

1. සො ච - PTS සොධ - ස්‍යා, සීමු. 1. 2. යං වෙරං - සීමු. 1. PTS 3. විහාය - මජසං
4. ශ්‍රෙෂ්ඨීව' යි සංස්කෘත ධම්මපදපාඨ'යි.

[භගවත්හු:]

චතුස්සත්‍යය අවබෝධ කළා වූ හැම සතුන් කෙරෙහි අනුකම්පා ඇති ඒ තථාගතයන් වහන්සේගේ වැරදි නැත. උන්වහන්සේගේ අපරාධ නැත. උන්වහන්සේ මූළාවට නො පැමිණෙත්. මේ ලෝකයෙහි උන්වහන්සේ ම හැම කල්හි සිහි ඇති සේක. පණ්ඩිත සේක.

ඉදින් යමෙක් දෙසන්නවුන්ගේ වරද නො පිළිගණී ද, ඇතුළත කෝප ඇති ද්වේෂය ගුරු කොට ගෙණ වසන හෙතෙමේ වෛරය (තමා කෙරෙහි) බැඳ තබයි. ඒ වෛරය නො පිළිගණිමි. තොපගේ වරද පිළිගණිමි යි.

1. 4. 6.

සද්ධා සූත්‍රය.

36. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ** අරමෙහි වැඩවසන සේක. එකල්හි විශිෂ්ට ඡවිවණ් ඇති බොහෝ වූ **සතුල්ලපකායික** දේවතාවෝ රෑ පෙරයම ඉක්ම ගියකල්හි මුළු **දෙව්රම** බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ.

එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

පුරුෂයාට ශ්‍රද්ධාව දෙවැනි වේ. ඉදින් සැදැහැ නැති බව නො සිටී නම්, ඒ හේතුවෙන් ඔහුට පිරිවර ද කීර්තිය ද වෙයි. හෙතෙමේ සිරුර හැර පියා ස්වර්ගයට ද යෙයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය:

ක්‍රෝධය දුර ලන්නේ ය. මානය වෙසෙසින් බැහැර ලන්නේ ය. සියලු සංයෝජන ඉක්මවන්නේ ය. නාමරූප දෙක්හි නොඇලෙන කෙලෙස් පළිබෝධ රහිත වූ ඔහු මත සඞ්ගයෝ නො වැටෙත්.

බාල වූ නුවණ නැත්තා වූ ජනයෝ ප්‍රමාදයෙහි යෙදෙත්. නුවණැත්තේ අප්‍රමාදය ශ්‍රේෂ්ඨ[1] ධනය මෙන් රකී.

ප්‍රමාදයෙහි නහමක් යෙදෙන්නේ ය. කාමරතියෙහි යෙදීම නො කරන්නේ ය. අප්‍රමත්ත පුද්ගල තෙමේ වනාහි ධ්‍යාන කරන්නේ උතුම් සුවයට පැමිණෙයි.

1. 4. 7.

සමය සූත්‍රය.

37. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍ය** දනව්වෙහි **කිඹුල්වත්පුර** සමීපයෙහි වූ **මහාවනයෙහි** හැම ම රහත් වූ භික්ෂූන් පන්සියක් පමණ වූ මහබික්සඟන සමඟ වැඩ වසන සේක. දසදහසක් සක්වළින් දේවතාවෝ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු-සඞ්ඝයාත් දක්නු පිණිස බෙහෙවින් රැස් වූවාහු ද වෙත්.

1. 'ශ්‍රෙෂ්ඨීව' යන්න 'සෙට්ඨීව' යි ගත හොත් 'සිටුවරයා' යි අර්ථ කිය යුතු ය.

අථ ඛො චතුන්නං: **සුද්ධාවාසකායිකානං** දෙවානං[1] එතදහොසි. අයං ඛො භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං මහාවනෙ** මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. දසහි ච ලොකධාතූහි දෙවතා[2] යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච. යන්නූන මයම්පි[3] යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ පච්චෙකගාථං[4] භාසෙය්‍යාමාති.

අථ ඛො තා දෙවතා[2] සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[5] වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය[6], එවමෙවං සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු.[7]

අථ ඛො තා දෙවතා[2] භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

මහාසමයො පවනස්මිං දෙවකායා සමාගතා,
ආගතම්හ ඉමං ධම්මසමයං දක්ඛිතායෙ අපරාජිතසඞ්ඝන්ති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

තත්‍ර භික්ඛවො සමාදහංසු චිත්තං අත්තනො[8] උජුකමකංසු,
සාරථීව නෙත්තානි ගහෙත්වා ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ඡෙත්වා ඛිලං[9] ඡෙත්වා පලිඝං[10] ඉන්දඛීලං ඌහච්ච මනෙජා,
තෙ චරන්ති සුද්ධා විමලා චක්ඛුමතා සුදන්තා සුසුනාගාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං,[11]
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්තීති.

1. 4. 8.

සකලිකසුත්තං.

38. එවං මෙ සුතං එකං සමයං භගවා **රාජගහෙ** විහරති **මද්දකුච්ඡිස්මිං** මිගදායෙ.

තෙන ඛො පන සමයෙන භගවතො පාදො සකලිකාය ඛතො හොති. භුසා[12] සුදං භගවතො වෙදනා වත්තන්ති සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා. තා සුදං භගවා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානො.

අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති[13] පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො.

---

1. දෙවතානං. - PTS. 2. දෙවතායො – ස්‍යා. 3. මයං - සීමු. 1. 4. පච්චෙකගාථා - ස්‍යා. පච්චෙකං ගාථං - මජ්ඣං, සීමු. 1. 5. සමිඤ්ජිතං 6. සමිඤ්ජෙය්‍ය - මජ්ඣං. 7. පාතුරහෙසුං - මජ්ඣං - PTS 8. චිත්තමත්තනො - මජ්ඣං 9. ඛීලං - PTS 10. පලීඝං - ස්‍යා. 11. අපායභූමිං - මජ්ඣං, - ස්‍යා PTS 12. භූසා - ස්‍යා 13. කප්පෙසි - සීමු. 1, PTS.

එකල්හි සුද්ධාවාසවැසි සිවුදෙව්කෙනකුන්ට මේ අදහස පහළ විය: "මේ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත්පුර සමීපයෙහි මහාවනයෙහි හැම ම රහත් වූ භික්ෂූන් පන්සියයක් පමණ වූ මහබික්සඟන සමග වැඩ වසන සේක. දසදහසක් සක්වළින් දේවතාවෝ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂුසඞ්ඝයාත් දකිනු පිණිස බෙහෙවින් රැස් වූවාහු ද වෙති. අපි ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙන්නමෝ නම්, එළඹ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි වෙන වෙන ම ගාථාවක් කියන්නමෝ නම්, ඉතා මැනවැ"යි

ඉක්බිති ඒ දේවතාවෝ, බලවත් පුරුෂයෙක් හැකිළූ අතක් දිගු කරන්නේ යම් සේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ යම් සේ ද, එසේ සුද්ධාවාස දෙවියන් කෙරෙහි අතුරුදන් වූවාහු භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ වූහ.

එකල්හි ඒ දේවතාවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියහ. එකත් පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කී ය:

මහවන ලැහැබෙහි මහාසමූහයෙකි. දේවසමූහයෝ රැස් වූහ. අපරාජිත සඞ්ඝයා දකිනු පිණිස මේ ධර්මසභාවට පැමිණියම්හ.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

එහි භික්ෂූහු තමන්ගේ සිත සමාධිගත කළහ. ඍජු කළහ. පණ්ඩිතයෝ රැහැන් ගෙණ (අසුන් හික්මවන) රියැදුරන් මෙන් ඉඳුරන් රකිත්.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

පසැස් ඇති බුදුරජාතන් වහන්සේ විසින් මැනවින් හික්මවන ලද පවිත්‍ර නිර්මල තරුණ නාගයන් වූ උන්වහන්සේ (රාගද්වෙෂමොහ නැමැති) කණුව සිඳ (අවිද්‍යා) කතයම සිඳ (කෙලෙස් නැමැති) ඉන්ද්‍රකීලය උදුරා පියා තෘෂ්ණාකම්පනරහිත වූවාහු හැසිරෙත්.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

යම් කිසි කෙනෙක් බුදුන් සරණ ගියාහු ද, ඔහු අපායට නොයන්නාහු මිනිස්සිරුර හැර පියා දෙව්පිරිස පුරා ලන්නාහ.

1. 4. 8.

සකලික සූත්‍රය.

38. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි මද්දකුච්ඡි නම් මුවවෙනෙහි වැඩවසන සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ පාදය ගල්පතුරෙකින් පහළේ වේ. භාග්‍යවතුන් වහන්සේට දුක් වූ දැඩි වූ රළු වූ තියුණු වූ නොමිහිරි වූ අමනාප වූ බලවත් ශාරීරික වේදනාවෝ පවතිත්. භාග්‍යවතුන් වහන්සේ සිහි ඇති ව මනා නුවණ ඇති ව නොපෙළෙමින් ඒ වේදනාවන් ඉවසන සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුර සිවුගුණු කොට පණවා දකුණු පයෙහි වම් පය මඳක් මෑත් කොට තබා දකුණුපසින් සිංහශය්‍යාව කරණ සේක.

අථ ඛො සත්තසතා **සතුල්ලපකායිකා** දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං **මද්දකුච්ඡිං** ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එසා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

නාගො වත භො සමණො ගොතමො. නාගවතා[1] ච පනුප්පන්නා[2] සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

සීහො වත භො සමණො ගොතමො. සීහවතා[1] ච පනුප්පන්නා[2] සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

ආජානීයො වත භො සමණො ගොතමො. ආජානීයවතා[1] ච පනුප්පන්නා[2] සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

නිසභො වත භො සමණො ගොතමො නිසභවතා ච පනුප්පන්නා සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

ධොරය්හො වත භො සමණො ගොතමො. ධොරය්හවතා ච පනුප්පන්නා සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

දන්තො වත භො සමණො ගොතමො. දන්තවතා ච පනුප්පන්නා සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානොති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං උදානං උදානෙසි:

---

1. වතාය ච - සී මු. 1. 2. සමුප්පන්නා-මජසං, - ස්‍යා, PTS.

ඉක්බිති මනා ඡවිවණ් ඇති පන්සියක් **සතුල්ලපකායික** දේවතාවෝ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු **මද්දකුච්ඡිය** බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ ඒකාන්තයෙන් නාගයෙකි. දුක් වූ දැඩි වූ කැකුළු වූ කටුක වූ නොමිහිරි වූ අමනාප වූ උපන් ශාරීරික වේදනාවන් නාග බැවින් ම සිහි ඇති ව මනා නුවණ ඇති ව නොපෙළෙමින් ඉවසයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ ඒකාන්තයෙන් සිංහයෙකි. දුක් වූ දැඩි වූ කැකුළු වූ කටුක වූ නොමිහිරි වූ අමනාප වූ උපන් ශාරීරික වේදනාවන් සිංහ බැවින් ම මනා නුවණ ඇති ව නොපෙළෙමින් ඉවසයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ ඒකාන්තයෙන් ආජානීයයෙකි. දුක් වූ දැඩි වූ කැකුළු වූ කටුක වූ නොමිහිරි වූ අමනාප වූ උපන් ශාරීරික වේදනාවන් ආජානීය බැවින් ම සිහි ඇති ව මනා නුවණ ඇති ව නොපෙළෙමින් ඉවසයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ නිසභයෙකි. දුක් වූ දැඩි වූ කැකුළු වූ කටුක වූ නොමිහිරි වූ අමනාප වූ උපන් ශාරීරික වේදනාවන් නිසභ බැවින් ම සිහි ඇති ව මනා නුවණැති ව නොපෙළෙමින් ඉවසයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ ඒකාන්තයෙන් ධෞරය්‍යයෙකි, (=ධුර ඉසිලීමෙහි සමර්ථයෙකි.) දුක් වූ දැඩි වූ කැකුළු වූ කටුක වූ නොමිහිරි වූ අමනාප වූ උපන් ශාරීරික වේදනාවන් ධෞරය්‍ය බැවින් ම සිහි ඇති ව මනා නුවණැති ව නොපෙළෙමින් ඉවසයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ ඒකාන්තයෙන් දාන්තයෙකි. දුක් වූ දැඩි වූ කැකුළු වූ කටුක වූ නොමිහිරි වූ අමනාප වූ උපන් ශාරීරික වේදනාවන් දාන්ත බැවින් ම සිහි ඇති ව මනා නුවණැති ව නොපෙළෙමින් ඉවසයි.

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේ ය:

පස්ස සමාධිං සුභාවිතං චිත්තඤ්ච සුවිමුත්තං[1] නචාභිනතං නචාපනතං න ච සසංඛාරනිග්ගය්හවාරිතවතං[2]. යො එවරූපං පුරිසනාගං පුරිසසීහං පුරිසාජානීයං පුරිසනිසභං පුරිසධොරය්හං පුරිසදන්තං අතික්කමිතබ්බං මඤ්ඤෙය්‍ය, කිමඤ්ඤත්‍ර අදස්සනාති.

පඤ්චවෙද සතං සමං
තපස්සී බ්‍රාහ්මණා චරං,
චිත්තඤ්ච නෙසං න සම්මා විමුත්තං
හීනත්තරූපා න පාරඞ්ගමා තෙ.

තණ්හාධිපන්නා වත සීලබද්ධා
ලූඛං තපං වස්සසතං චරන්තා,
චිත්තඤ්ච නෙසං න සම්මා විමුත්තං
හීනත්තරූපා න පාරඞ්ගමා තෙ.

න මානකාමස්ස දමො ඉධත්ථි
න මොනමත්ථි අසමාහිතස්ස,
එකො අරඤ්ඤෙ විහරං පමත්තො
න මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරන්ති

[භගවා:]

මානං පහාය සුසමාහිතත්තො
සුචෙතසො සබ්බධි විප්පමුත්තො,
එකො අරඤ්ඤෙ විහරං අප්පමත්තො
ස මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරන්ති

1. 4. 9.

පජ්ජුන්න ධීතුසුත්තං

39. එවං මෙ සුතං එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො කොකනද පජ්ජුන්නස්ස ධීතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං මහාවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො කොකනද[3] පජ්ජුන්නස්ස ධීතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි.

වෙසාලියං වනෙ[4] විහරන්තං
අග්ගං සත්තස්ස සම්බුද්ධං,
කොකනදාහමස්මි අභිවන්දෙ
කොකනද පජ්ජුන්නස්ස ධීතා.

සුතමෙව මෙ[5] පුරෙ ආසි
ධම්මො චක්ඛුමතානුබුද්ධො,
සාහං දානි සක්ඛි ජානාමි
මුනිනො දෙසයතො සුගතස්ස.

1. විමුත්තං - PTS 2. වාරිතගතං - මජසං. 3. ඛො සා දෙවතා කොකනද - මජසං සතා.
4. වෙසාලිවනෙ - සතළුවි. 5. සුතමෙව පුරෙ - මජසං, සතා

බල, සමාධිය මොනවට වඩන ලදී. සිත ද සුවිමුක්ත ය. (රාගානුගත-වශයෙන්) පෙරට නැමුනේ නො ද වෙයි. (දෙෂානුගතවශයෙන්) විමුඛ ව නැමුනේ නො ද වෙයි. (අල්පගුණසාස්‍රව සමාධිය සෙයින්) සප්‍රයොගචිත්ත-යෙන් ප්‍රත්‍යනීකධර්මයන් නිගෙන කෙලෙස් වළහා සිටියේ ද නො වෙයි. යමෙක් මෙබඳු පුරුෂනාගයකු පුරුෂසිංහයකු පුරුෂාජානීයකු පුරුෂනිෂභයකු පුරුෂධෞරෙයකු පුරුෂදන්තයකු සැවියයුතු කොට හඟනේ නම් නුනුවණ හැර අන් කිමෙක.

වේද පස දරණ සියක් වසක් මුළුල්ලෙහි තපස් ඇති ව හැසිරෙන බ්‍රාහමණයෝ වෙත් ද, ඔවුන්ගේ සිත ද මැනවින් නො මිදුනේ ය. ලාමක සවභාව ඇති ඔහු පරතෙරට නො යන්නෝ ය.

තෘෂ්ණායෙන් මඩනා ලද වෘත ශීල දෙකින් බැඳුනු සියක් වසක් මුළුල්ලෙහි රූක්ෂ තපස් කරණ (යම් බමුණෝ වෙත් ද,) ඔවුන්ගේ සිත ද මැනවින් නො මිදුනේ ය. හීනාත්මසවභාව ඇති ඔහු පරතෙරට නො යන්නෝ ය.

මෙහි මානය කැමැත්තහුට දමයෙක් නැත. සමාධියක් නැත්තහුට මෞනයෙක් නැත. වනයෙහි හුදෙකලා ව ප්‍රමත්ත ව වසන්නේ සසර පරතෙරට හෙවත් නිවණට නො පැමිණෙන්නේ ය.

[භගවත්හු:]

මානය දුර ලා මැනවින් එකඟ වූ සිත් ඇති සියලු උපධීන්ගෙන් මිදුනු අප්‍රමත්ත ව හුදෙකලා ව වෙනෙහි වෙසෙන හෙ තෙමේ සසර පරතෙරට පැමිණෙන්නේ ය.

1. 4. 9.

පජ්ජුන්නධීතු සූත්‍රය.

39. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** සමීපයෙහි වූ **මහවෙනෙහි කූටාගාරශාලාවෙහි** වැඩ වසන සේක. එකල්හි **පර්ජන්‍ය** (=වස්සවලාහක) දෙවිහුගේ දුව වූ මනා ඡවිවර්ණ ඇති **කොකනද** තොමෝ මුළු මහවනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියා ය. එකත්පසෙක සිටි පර්ජන්‍යයාගේ දුව වූ **කොකනද** තොමෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කිවු ය:

මම කොකනද වෙමි. පර්ජන්‍යයාගේ දුව වූ **කොකනද** (නම් වූ මම) **විසල්පුර මහවනෙහි** වැඩ වසන සත්ත්වයාට අග්‍ර වූ සම්බුදුයන් වහන්සේ සකසා වඳිමි.

පසැස් ඇත්තා වූ බුදුරජාණන් වහන්සේ විසින් ධර්මය අවබෝධ කරණ ලද්දේ ය යි මා විසින් පෙර අසන ලද පමණෙක් ම විය. ඒ මම දැන් දහම් දෙසන සුගත් මුනිහුගේ ධර්මය ප්‍රත්‍යක්ෂ ලෙස දනිමි.

යෙ කෙචි අරියධම්මං[1]
විගරහන්තා චරන්ති දුම්මෙධා,
උපෙන්ති රොරුවං ඝොරං
චිරරත්තං දුක්ඛමනුභවන්ති.

යෙ ච ඛො අරියධම්මෙ[2]
ඛන්තියා උපසමෙන උපෙතා,
පහාය මානුසං දෙහං
දෙවකායං පරිපූරෙස්සන්ති'ති.

1. 4. 10.

චුල්ලපජ්ජුන්නධීතුසුත්තං

40. එවං මෙ සුතං: එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං**. අථ ඛො **චුල්ල[3]කොකනද පජ්ජුන්නස්ස** ධීතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං මහාවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො චුල්ලකොකනද පජ්ජුන්නස්ස ධීතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

ඉධාගමා විජ්ජුපභාසවණ්ණා
කොකනද පජ්ජුන්නස්ස ධීතා,
බුද්ධඤ්ච ධම්මඤ්ච නමස්සමානා
ගාථා චිමා අත්ථවතී අභාසි.

බහුනාපි ඛො නං විභජෙය්‍යං
පරියායෙන තාදිසො ධම්මො,
සංඛිත්තමත්ථං ලපයිස්සාමි
යාවතා මෙ මනසා පරියත්තං.

පාපං න කයිරා වචසා මනසා
කායෙන වා කිඤ්චන සබ්බලොකෙ,
කාමෙ පහාය සතිමා සම්පජානො
දුක්ඛං න සෙවෙථ අනත්ථසංහිතන්ති.

සතුල්ලපකායිකවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

සබ්භි මච්ඡරිනා සාධු නසන්ති උජ්ඣානසඤ්ඤිනො,
සද්ධා සමයො සකලිකං උභො පජ්ජුන්නධීතරො'ති.

---

1 අරියං ධම්මං - මජසං, සතා. 2. අරියෙ ධම්මෙ - මජසං, සතා. 3. චුළ - මජසං,

නුවණ නැත්තා වූ යම් කිසි කෙනෙක් ආර්‍යධර්මය ගරහමින් හැසිරෙද්ද, ඔහු දරුණු වූ රෞරව නිරයට පැමිණෙත්. බොහෝ කලක් දුක් අනුභව කෙරෙත්.

යම් කෙනෙක් ආර්‍යධර්මයෙහි ක්‍ෂාන්තියෙන් හා ව්‍යුපශමයෙන් යුක්ත වූවාහු ද, (ඔහු) මිනිස්සිරුර හැර පියා දෙව්පිරිස පුරා ලන්නාහ.

1. 4. 10.

චූලපජ්ජුන්නධීතු සූත්‍රය

40. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** සමීපයෙහි වූ **මහවෙනෙහි කූටාගාරශාලාවෙහි** වැඩ වසන සේක. එකල **පර්ජන්‍යයාගේ** දුව වූ ඉතා ජිවිවණී ඇති **චූලකොකනද** තොමෝ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු මහවනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියා ය. එකත්පසෙක සිටි පර්ජන්‍යගේ දුව වූ **චූලකොකනද** තොමෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කිවූ ය:

පර්ජන්‍ය ගේ දුව වූ විදුලිය එළිය වැනි පැහැ ඇති කොකනද තොමෝ මෙහි අවූ ය. බුදුන් ද දහම් ද වඳිමින් අර්ථවත් වූ මේ ගාථා ද කිවූ ය.

ඒ (සවල්පවූ ද) ධර්මය බොහෝ ක්‍රමයෙනුදු බෙදන්නෙමි. ඒ ධර්මය එබඳු ය. මවිසින් සිතින් යම් තාක් පුහුණු කරණ ලද්දේ ද, (එ හැම නො කියා) සංක්‍ෂෙපමාත්‍රයක් කියන්නෙමි.

වචනයෙන් හෝ සිතින් හෝ කයින් හෝ මුළුලොව කිසි පවක් නො කරන්නේ ය. සිහි ඇත්තේ මනානුවණින් දන්නේ කාමයන් හැරපියා අනර්ථයෙන් යුක්ත වූ දුක නො සෙවුනේ යි.

සතුල්ලපකායිකවර්ගය සිවුවැනි යි.

එහි උද්දානය මෙසේ යි:

සබ්භි, මච්ඡරි, සාධු, නසන්ති, උජ්ඣානසඤ්ඤී, සද්ධා, සමය, සකලික, පජ්ජුන්නධීතු සූත්‍ර දෙක යයි සූත්‍ර දශයෙකි.

5. ආදිත්තවග්ගො.

1. 5. 1.

ආදිත්තසුත්තං.

41. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

ආදිත්තස්මිං අගාරස්මිං යං නීහරති භාජනං,
තං තස්ස හොති අත්ථාය නො ච යං තත්ථ ඩය්හති.

එවමාදිපිතො[1] ලොකො ජරාය මරණෙන ච,
නීහරෙථෙව දානෙන දින්නං හොති සුනීහතං.

දින්නං සුඛඵලං හොති නාදින්නං හොති තං තථා,
චොරා හරන්ති රාජානො අග්ගි ඩහති නස්සති.

අථ අන්තෙන ජහති සරීරං සපරිග්ගහං,
එතදඤ්ඤාය මෙධාවී භුඤ්ජෙථ ච දදෙථ ච.
දත්වා ච භුත්වා ච යථානුභාවං අනින්දිතො සග්ගමුපෙති ඨානන්ති.

1. 5. 2.

කිංදදසුත්තං.

[දෙවතා:]

42. කිංදදෙ බලදෙ හොති කිංදදෙ හොති වණ්ණදෙ.
කිංදදෙ සුඛදෙ හොති කිංදදෙ හොති චක්ඛුදෙ.
යො ච[2] සබ්බදදෙ හොති තං මෙ අක්ඛාහි පුච්ඡිතොති.

[භගවා:]

අන්නදෙ බලදෙ හොති වත්ථදෙ හොති වණ්ණදෙ,
යානදෙ සුඛදෙ හොති දීපදෙ හොති චක්ඛුදෙ.
සො ච සබ්බදදෙ හොති යො දදාති උපස්සයං,
අමතංදදෙ ච සො හොති යො ධම්මමනුසාසතීති.

---

1. එවං ආදිත්තකො. - මජසං සතා 2. කො ච - කාළුවි.

5. ආදිත්ත වර්ගය.

1. 5. 1.
ආදිත්ත සූත්‍රය.

41. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල මනා ජවිවණී ඇති එක්තරා දෙවියෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය:

ගෙය ගිනිගත් කල (ගෙහිමියා) යම් භාජනයක් බැහැර කෙරේ ද, එය ඔහුට ප්‍රයෝජනය පිණිස වෙයි. යමක් එහි දැවේ ද, එය (ප්‍රයෝජනය පිණිස) නො වේ.

මෙසේ ලෝවැසි තෙමේ ජරායෙන් හා මරණයෙන් ද ඇවිළ ගන්නා ලද්දේ ය. (එහෙයින්) දානයෙන් ම බැහැර කරන්නේ ය. දෙන ලද්ද මැනවින් බැහැර කරණ ලද්දේ වෙයි.

දෙනලද්ද සුවපල ඇත්තේ වේ. නො දෙන ලද්ද එසේ නො වේ. ඒ (තුදුන්) දෙය සොරු හැර ගණිත්. රජහු හෝ හැර ගණිත්. ගින්න හෝ දවයි. (තුබූ තැන ම හෝ) නැසෙයි. යළි නො නැසුනු භොග සහිත ශරීරය මරණයෙන් හැර පියයි.

නුවණැත්තේ මෙ කරුණ දැන අනුභව ද කරන්නේ ය. දීම ද කරන්නේ ය. ශක්තිපරිද්දෙන් දී අනුභව ද කොට අනින්දිත වූයේ සවර්ගස්ථාන යට පැමිණේ.

1. 5. 2.
කිංදද සූත්‍රය.

[දෙවි:]

42. කුමක් දෙන්නේ බලය දෙන්නේ වේ ද? කුමක් දෙන්නේ වර්ණය දෙන්නේ වේ ද? කුමක් දෙන්නේ සැපය දෙන්නේ වේ ද? කුමක් දෙන්නේ ඇස් දෙන්නේ වේ ද? යමෙක් සියල්ල දෙන්නේත් වේ ද, මා විසින් විචාරණ ලද්දෙහි එය වදාළ මැනවි.

[භගවත්හු:]

ආහාර දෙන්නේ බලය දෙන්නේ වේ. වස්ත්‍ර දෙන්නේ වර්ණය දෙන්නේ වේ. යාන දෙන්නේ සැප දෙන්නේ වේ. පහන් දෙන්නේ ඇස් දෙන්නේ වේ. යමෙක් ආවාස දේ ද, හෙතෙමේ සියල්ල දෙන්නේත් වේ. යමෙක් ධර්මානුශාසන කෙරේ ද, හෙතෙමේ අමෘතය දෙන්නේත් වෙයි.

1. 5. 3.

අන්නසුත්තං

[දෙවතා:]

43. අන්නමෙවාභිනන්දන්ති උභයෙ දෙවමානුසා,
අථ කො නාම සො යක්ඛො යං අන්නං නාභිනන්දතීති.

[භගවා:]

යෙ තං දදන්ති සද්ධාය විප්පසන්නෙන චෙතසා,
තමෙව අන්නං භජති අස්මිං ලොකෙ පරම්හි ච,

තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

1. 5. 4.

එකමූලසුත්තං

[දෙවතා:]

44. එකමූලං ද්විරාවට්ටං තිමලං පඤ්චපත්ථරං,
සමුද්දං ද්වාදසාවට්ටං පාතාලං අතරී ඉසීති.

1. 5. 5.

අනොමසුත්තං

[දෙවතා:]

45. අනොමනාමං නිපුණත්ථදස්සිං පඤ්ඤාදදං කාමාලයෙ අසත්තං
තං පස්සථ සබ්බවිදුං සුමෙධං අරියෙ පථෙ කමමානං මහෙසින්ති

1. 5. 6.

අච්ඡරාසුත්තං.

[දෙවතා:]

46. අච්ඡරාගණසඞ්ඝුට්ඨං පිසාචගණසෙවිතං,
වනන්තං මොහනං නාම කථං යාත්‍රා භවිස්සතීති.

[භගවා:]

උජුකො නාම සො මග්ගො අභයා නාම සා දිසා,
රථො අකූජනො[1] නාම ධම්මචක්කෙහි සංයුතො.

හිරි තස්ස අපාලම්බො සතස්ස[2] පරිවාරණං,
ධම්මාහං සාරථිං බ්‍රූමි සම්මාදිට්ඨිපුරෙජවං.

යස්ස එතාදිසං යානං ඉත්ථියා පුරිසස්ස වා,
ස වෙ එතෙන යානෙන නිබ්බානස්සෙව සන්තිකෙ.

අකුජ්ජනො - සතා. 2. සත්‍යස්ස. - මජසං, P.T.S.

1. 5. 3.

අන්න සූත්‍රය.

[දෙවි:]

43. දෙව්මිනිස් දෙකොටස වුවෝ ආහාරය ම පතත්. යම් හෙයෙකින් යමෙක් ආහාරය නො පතා නම්, හේ කවර නම් යකෙක් ද?

[භගවත්හු:]

යම් කෙනෙක් පහන් සිතින් සැදැහැයෙන් ඒ ආහාරය දෙද්ද, මෙලෙව්හි ද පරලෙව්හි ද ආහාරය ඔහු ම සෙවුනේ ය.

එහෙයින් මසුරුමල මැඩලන සුලු වූයේ මසුරුකම දුරු කොට දන් දෙන්නේ ය. පින් සත්ත්වයන්ට පරලොව පිහිට වේ.

1. 5. 4.

එකමූල සූත්‍රය.

[දෙවි:]

44. එක්මුලක් ඇති සළාවැටුම් දෙකක් ඇති මල තුණක් ඇති ප්‍රසාර පසක් ඇති ආවර්ත දොළසක් ඇති අගාධ වූ සමුද්‍රය මහර්ෂි තෙමේ තරණය කෙළේ ය.

1. 5. 5.

අනොම සූත්‍රය.

[දෙවි:]

45. පිරිපුන් නම් ඇති සියුම් අරුත් දක්නාසුලු නුවණ දෙන කාම-වස්තූන්හි නොඇලුනු සියල්ල දන්නා මනා නුවණ ඇති ආර්‍යමාර්ගයෙහි ගියා වූ ඒ මහර්ෂිහු බලව.

1. 5. 6.

අච්ඡරා සූත්‍රය.

[දෙවි:]

46. අප්සරස් සමූහයා විසින් සුසෝභිත වූ පිශාචයන් වැනි ඒ අප්සරස් සමූහයා විසින් සෙවුනාලද මේ වනය මෝහන නම්. (එයින්) නික්ම යැම කෙසේ වන්නේ ද?

[භගවත්හු:]

ඒ මාර්ගය ඍජුක නම් වේ. දිශාව අභයා නම් වේ. ධර්මචක්‍රයන් ගෙන් යුක්ත වූ ඒ රථය අකූජන නම් වේ.

හිරිඔතප් දෙක ඒ රථයේ වැතිර ගන්නා පුවරු (ඇඳි) යි. සිහිය ඒ රථයේ පිරිකරයි (සැරැසිල්ලයි.) විදගීනා සම්‍යග්දෘෂ්ටිය පෙරටු කොට යන ලෝකෝත්තර මාර්ග ධර්මය (එහි) රියැදුරා ය යි මම කියමි.

යම් ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ මෙබඳු යානයෙක් වේ නම්. හෙතෙමේ ඒකාන්තයෙන් මේ යානයෙන් නිවණ සමීපයෙහි ම වේ.

1. 5. 7.

වනරොපසුත්තං

[දෙවතා:]

47. කෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති,
ධම්මට්ඨා සීලසම්පන්නා කෙ ජනා සග්ගගාමිනොති.

[භගවා:]

ආරාමරොපා වනරොපා යෙ ජනා සෙතුකාරකා,
පපඤ්ච උදපානඤ්ච යෙ දදන්ති උපස්සයං.

තෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති,
ධම්මට්ඨා සීලසම්පන්නා තෙ ජනා සග්ගගාමිනොති.

1. 5. 8.

ජෙතවනසුත්තං

48. ඉදඤ්හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං,
ආවුත්ථං ධම්මරාජෙන පීතිසඤ්ජනනං මම.

[භගවා:]

කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා.

තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති.

සාරිපුත්තොව පඤ්ඤාය සීලෙනුපසමෙන ච,
යොපි පාරගතො[1] භික්ඛු එතාව පරමො සියා'ති.

1. 5. 9.

මච්ඡරිසුත්තං

[දෙවතා:]

49. යෙ'ධ මච්ඡරිනො ලොකෙ කදරියා පරිභාසකා,
අඤ්ඤෙසං දදමානානං අන්තරායකරා නරා.

කීදිසො තෙසං විපාකො සම්පරායො ච කීදිසො,
භගවන්තං පුට්ඨුමාගම්ම කථං ජානෙමු තං මයන්ති.

[භගවා:]

යෙ'ධ මච්ඡරිනො ලොකෙ කදරියා පරිභාසකා,
අඤ්ඤෙසං දදමානානං අන්තරායකරා නරා.

1 පාරඞ්ගතො. සී. මු, මජසං.

1. 5. 7.

වනරෝප සූත්‍රය.

[දෙවි:]

47. කිනම් කෙනකුන්ට හැමකල්හි දහවලුත් රෑත් පින් වැඩේ ද? දහම්හි පිහිටි සීලසම්පන්න වූ කිනම් ජනයෝ සවර්ගයට යෙත් ද?

[භගවත්හු.]

යම් ජන කෙනෙක් මල්පල උයන් වවන්නෝ වෙත් ද, පියවි වන වගා කොට දෙන්නෝ වෙත් ද, ඒදඬු පාලම් කරවන්නෝ වෙත් ද, යම් කෙනෙක් පැන්හලුත් පැන් පොකුණුත් ආවාසත් දෙද් ද,

ඔවුන්ට හැමකල්හි දහවලුත් රෑත් පින් වැඩේ. දහම්හි පිහිටි සීල සම්පන්න වූ ඒ ජනයෝ සවර්ගයට යෙත්.

1. 5. 8.

ජේතවන සූත්‍රය.

[අනාථපිණ්ඩික දෙවි:]

48. භික්ෂු සමූහයා විසින් නිතර සෙවුනා ලද ධර්මරාජ වූ බුදුරජාතන් වහන්සේ විසින් විසුම් ගන්නා ලද මේ ඒ ජේතවනය මට ප්‍රීති උපදවන්නේ ය.

කර්මය ද, විද්‍යාව ද, සමාධි ධර්මය ද, උතුම් ජීවිතය වූ සීලය ද යන මෙයින් සත්ත්වයෝ පිරිසිදු වෙත්. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් හෝ පිරිසිදු නො වෙත්.

එහෙයින් ම නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ නුවණින් දහම් රැස් කරන්නේ ය. මෙසේ ඒ ආයර්‍යමාර්ගයෙහි පිරිසිදු වෙයි.

ප්‍රඥාවෙන් ද, සීලයෙන් ද, ව්‍යුපශමයෙන් ද, ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ම (උතුම්හ) පරතෙරට (නිවණට) පැමිණි යම් මහණෙක් වේ නම්, මේ ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ම උතුම් කොට ඇත්තේ වන්නේ ය යි.

1. 5. 9.

මච්ඡරි සූත්‍රය.

[දෙවි:]

49. දැඩි මසුරුකම් ඇති, පරිභව කරණ, දන් දෙන අනුන්ට අන්තරාය කරණ, යම් මසුරු මිනිස් කෙනෙක් මෙලොව වෙද්ද,

ඔවුන්ගේ විපාකය කෙබඳු ද? පරලොව ගතියත් කෙබඳු ද? භාග්‍යවතුන් වහන්සේ විචාරන්නට අවුත් (සිටින) අපි එය කෙසේ දනිමු ද?

[භගවත්හු:]

දැඩි මසුරුකම් ඇති, පරිභව කරණ, දන් දෙන අනුන්ට අන්තරාය කරණ, යම් මසුරු මිනිස් කෙනෙක් මෙලොව වෙද් ද,

නිරයං තිරච්ඡානයොනිං යමලොකඤ්චුපපජ්ජරෙ,[1]
සචෙ එන්ති මනුස්සත්තං දළිද්දෙ ජායරෙ කුලෙ,
චොළං පිණ්ඩො රතී ඛිඩ්ඩා යත්ථ කිච්ඡෙන ලබ්භති.

පරතො ආසිංසරෙ[2] බාලා තම්පි තෙසං න ලබ්භති,
දිට්ඨෙ[3] ධම්මෙ සවිපාකො සම්පරායෙ[4] ච දුග්ගතීති.

[දෙවතා:]

ඉති හෙතං විජානාම අඤ්ඤං පුච්ඡාම ගොතම,
යෙ'ධ ලද්ධා මනුස්සත්තං වදඤ්ඤූ වීතමච්ඡරා.
බුද්ධෙ පසන්නා ධම්මෙ ච සඞ්ඝෙ ච තිබ්බගාරවා.

කීදිසො තෙසං විපාකො සම්පරායො ච කීදිසො,
භගවන්තං පුට්ඨුමාගම්ම කථං ජානෙමු තං මයන්ති.

[භගවා:]

යෙ'ධ ලද්ධා මනුස්සත්තං වදඤ්ඤූ වීතමච්ඡරා,
බුද්ධෙ පසන්නා ධම්මෙ ච සඞ්ඝෙ ච තිබ්බගාරවා,
එතෙ සග්ගෙ පකාසෙන්ති[5] යත්ථ තෙ උපපජ්ජරෙ.

සචෙ එන්ති මනුස්සත්තං අඩ්ඪෙ ආජායරෙ කුලෙ,
චොළං පිණ්ඩො රතී ඛිඩ්ඩා යත්ථාකිච්ඡෙන ලබ්භති.

පරසම්භතෙසු භොගෙසු වසවත්තීව මොදරෙ,
දිට්ඨෙ[3] ධම්මෙ සවිපාකො සම්පරායෙ ච සුග්ගතීති.

1. 5. 10.

ඝටීකාරසුත්තං

[ඝටීකාර දෙවතා:]

50. අවිහං උපපන්නාසෙ විමුත්තා සත්ත භික්ඛවො,
රාගදොසපරික්ඛීණා තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.

කෙ ච තෙ අතරුං සඞ්ගං[6] මච්චුධෙය්‍යං සුදුත්තරං,
කෙ හිත්වා මානුසං දෙහං දිබ්බං යොගං[7] උපච්චගුං.

උපකො පලගණ්ඩො ච පුක්කුසාති ච තෙ තයො,
භද්දියො භද්දදෙවො ච බාහුදන්ති ච පිඞ්ගියො.[8]
තෙ හිත්වා මානුසං දෙහං දිබ්බං යොගං[7] උපච්චගුන්ති.

[භගවා:]

කුසලී භාසසි තෙසං මාරපාසප්පහායිනං,
කස්ස තෙ ධම්මමඤ්ඤාය අච්ඡිදුං භවබන්ධනං.

---

1. යමලොකූපපජ්ජරෙ. සභා, යමලොකංඋපපජ්ජරෙ PTS 2 ආසීසරෙ - මජසං
3. දිට්ඨෙව - සී මු. 2. 4. සම්පරායො - සභා 5. සග්ගා පකාසන්ති - මජසං. 6. පඞ්කං - මජසං, සීමු. 2, PTS. යෙ ච තෙව අතරුංසඞ්ගං - සභා. කො ච කො ච - සීමු. 1. 7. දිබ්බයොගං - මජසං, සභා, PTS. 8. ඛණ්ඩදෙවො ච බාහුරග්ගි ච සිඞ්ගියො - මජසං. පිඞ්ගියො - PTS. ඛණ්ඩදෙවො ච බාහුදන්තී ච සිඞ්ගියො - සභා

(ඔහු) නරකයට ද, තිරිසන් යෝනියට ද, යමලෝකයට ද පැමිණෙත්. ඉදින් මිනිසත්බවට එත් නම්, යම් කුලයෙක වස්ත්‍ර ආහාර කාම සම්පත් හා ක්‍රීඩා දුක සේ ලැබේද් ද, (එබඳු) දිළිඳු කුලයෙක උපදී.

ඒ අඥානයෝ මෙරමාගෙන් (යමක්) බලාපොරොත්තු වෙත් නම්, එය ද ඔවුන්ට නො ලැබේ. මෙලොව ඒ විපාක යි. පරලොව ද දුගතිය වේ.

[දෙව්:]

ගෞතමයන් වහන්ස, මෙසේ මෙය දැනුම්හ. අනෙකක් විචාරමු. යම් කෙනෙක් මේ ලොකයෙහි මිනිසත්බව ලැබ පහ වූ මසුරුමල ඇත්තාහු බුදුන් දහම් සඟුන් කෙරෙහිත් පැහැදුනාහු අතිශය ගෞරව ඇත්තාහු (වදාන්‍ය) දන්කලූ වූහු ද,

ඔවුන්ගේ විපාකය කෙබඳු ද? පරලොව ගතියත් කෙබඳු ද? භාග්‍යවතුන් වහන්සේ විචාරන්නට අවුත් (සිටින) අපි එය කෙසේ දනිමු ද?

[භගවත්හු:]

යම් කෙනෙක් මේ ලෝකයෙහි මිනිසත්බව ලැබ පහ වූ මසුරුමල ඇත්තාහු බුදුන් දහම් සඟුන් කෙරෙහිත් පැහැදුනාහු අත්‍යන්ත ගෞරව ඇත්තාහු (වදාන්‍ය) දන්සොඬ වෙද්ද,ඔහු යම් තැනෙක උපදිද් ද, ඒ සවර්ගයෙහි මොහු බබලත්.

ඉදින් මිනිසත්බවට එත් නම්, යම් කුලයෙක වස්ත්‍ර ආහාර කාමවස්තු හා ක්‍රීඩා නිදුකින් ලැබේද් ද (එබඳු) ආඪ්‍ය කුලයෙක උපදිත්.

අනුන් විසින් රැස් කරණ ලද භෝගයන්හි එහි හිමියන් මෙන් සතුටු වෙත්. මෙලොව ඒ විපාක යි. පරලොවත් සුගතිය වේ.

1. 5. 10.

සපිකාර සූත්‍රය

[සටිකාර දෙව්:]

50. භික්ෂූහු සත්තමක් අවිහබඹලොවට පැමිණියාහු මිදුනාහු රාගද්වෙෂයන් ක්‍ෂය කලාහු (පඤ්චස්කන්ධ)ලොකයෙහි තෘෂ්ණාව තරණය කලාහු ය.

තරණය කිරීමට ඉතා දුෂ්කර වූ මච්චුධෙය්‍ය නම් සංසාරයත් (චතුර්විධ) ඔඝයනුත් තරණය කලාහු කවුරු ද? කිනම් කෙනෙක් මනුෂ්‍යදේහ (සංඛ්‍යාත ඔරම්භාගිය සංයෝජන පස) දුරු කොට දිව්‍යයෝග (සඞ්ඛ්‍යාත උද්ධම්භාගිය සංයොජන) පසත් ඉක්ම ගියාහු ද?

උපක පලගණ්ඩ පුක්කුසාති යන තිදෙන ද, භද්දිය භද්දදෙව බාහුදන්ති පිඞ්ගිය යන (සිවුදෙන ද) යන ඔහු මනුෂ්‍යදෙහය හැර දිව්‍යයොගය ඉක්ම ගියාහු ය.

[භගවත්හු:]

මාරපාසයන් හැර සිටියා වූ ඔවුන්ට 'අනවද්‍යයහ'යි බෙණෙහි (පසස්නෙහි). ඔහු කවරකුගේ ධර්මය දැන භවබන්ධනය සින්දැහු ද?

[ඝටීකාර:]

න අඤ්ඤත්‍ර භගවතා නාඤ්ඤත්‍ර තව සාසනා,
යස්ස තෙ ධම්මමඤ්ඤාය අවිජ්ඣුං භවබන්ධනං.

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
තං තෙ ධම්මං ඉධඤ්ඤාය අවිජ්ඣුං භවබන්ධනන්ති.

[භගවා:]

ගම්භීරං භාසසි වාචං දුබ්බිජානං සුදුබ්බුධං,
කස්ස ත්වං ධම්මමඤ්ඤාය වාචං භාසසි ඊදිසන්ති.

[ඝටීකාර:]

කුම්භකාරො පුරෙ ආසිං වෙහලිඞ්ගෙ[1] ඝටීකරො,
මාතාපෙත්තිභරො ආසිං කස්සපස්ස උපාසකො.

විරතො මෙථුනා ධම්මා බ්‍රහ්මචාරී නිරාමිසො,
අහුවා තෙ සගාමෙය්‍යො අහුවා තෙ පුරෙ සඛා.

සො'හං එතෙ[2] පජානාමි විමුත්තෙ සත්ත භික්ඛවො,
රාගදොසපරික්ඛීණෙ තිණ්ණෙ ලොකෙ විසත්තිකන්ති.

[භගවා:]

එවමෙතං තදා ආසි යථා භාසසි භග්ගව,
කුම්භකාරො පුරෙ ආසි වෙහලිඞ්ගෙ ඝටීකරො,
මාතාපෙත්තිභරො ආසි කස්සපස්ස උපාසකො.

විරතො මෙථුනා ධම්මා බ්‍රහ්මචාරී නිරාමිසො,
අහුවා මෙ සගාමෙය්‍යො අහුවා මෙ පුරෙ සඛාති.

[ථෙර:]

එවමෙතං පුරාණානං සහායානං අහු[3] සඞ්ගමො,
උභින්නං භාවිතත්තානං සරීරන්තිමධාරිනන්ති.

ආදිත්තවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

ආදිත්තං කිංදදං අන්නං එකමූලමනොමියං,
අච්ඡරාවනජෙතෙන මච්ඡරෙන ඝටීකරෙ'ති.

1. වෙකළිඞ්ගෙ - මජසං, සතා. 2. සොහමෙතෙ - මජසං, සතා. 3. සහායානමහු - සතා.

[ඝටීකාර:]

ඔහු යමකුගේ ධර්මය දැන භවබන්ධනය සින්දහු ද, ඒ භාග්‍යවතුන් වහන්සේ නොහැර යි. මුඹ වහන්සේගේ සසුන ද නොහැර යි.

යම් නිවණෙක්හි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වේද්ද, මේ සසුනෙහි ඔහු ඒ ධර්මය දැන භවබන්ධනය සින්දහු ය.

[භගවත්හු:]

ගැඹුරු වූ දැන ගැණීමට දුෂ්කර වූ අතිශයින් දුරවබෝධ වූ ·වචන කියහි. තෙපි කවරකුගේ ධර්මය දැන මෙබඳු වචන කියහු ද?

[ඝටීකාර:]

පෙර වෙහළිංග ගම්හි ඝටීකාර නම් කුඹලෙකිම් වීමි. කාශ්‍යප බුදුරජා-නන් වහන්සේගේ උපාසකයකු වූයෙම් මවුපියන් පෝෂණය කරන්නෙකිම් වීමි.

මෙවුන්දමින් වෙන් වූයෙම් නිරාමිස (=අනාගාමී) බ්‍රහ්මචාරියකු වූයෙමි. තොප හා එකගම වසන්නෙකිම් වීමි. පෙර තොපගේ යහළුවෙකිම් වීමි.

ඒ මම රාගද්වෙෂයන් ක්‍ෂය කළ ලොව තෘෂ්ණාව තරණය කළ මිදුනු මේ භික්‍ෂූන් සත්නම දනිමි.

[භගවත්හු:]

භාර්ගවය, යම්සේ කියහි නම් එකල්හි මේ එසේ වී ය. පෙර වෙහළිංග ගම්හි ඝටීකාර නම් කුඹලෙක් වූයේ ය. කාශ්‍යප බුදුරජානන් වහන්සේගේ උපාසක වූයේ මවුපියන් පෝෂණය කරන්නෙක් වූයේ ය.

මෙවුන්දමින් වැලකුනු නිරාමිස බඹසර ඇත්තෙක් වූයේ ය. මා හා එක ගම වසන්නෙක් වූයේ ය. පෙර මාගේ යහළුවෙක් වී ය.

[තෙරනු:]

වඩන ලද සිත් ඇති අන්තිම සිරුරු දරණ පාරණී යහළුවන් දෙදෙනකුගේ මේ එක්වීම මෙසේ වී ය.

ආදිත්ත වර්ගය පස්වැනි යි.

එහි උද්දානය:

ආදිත්ත, කිංදද, අන්න, එකමූල, අනොම, අච්ඡරා, වනරෝප, ජේතවන, මච්ඡරි, ඝටීකාර සූත්‍රයයි දශයෙකි.

---

6. ජරාවග්ගො.

1. 6. 1.

ජරාසුත්තං.

51. සාවත්ථියං—

[දෙවතා:]

කිංසු යාව ජරා සාධු කිංසු සාධු පතිට්ඨිතං,
කිංසු නරානං රතනං කිංසු චොරෙහි දූහරන්ති.

[භගවා:]

සීලං යාව ජරා සාධු සද්ධා සාධු පතිට්ඨිතා,
පඤ්ඤා නරානං රතනං පුඤ්ඤං චොරෙහි දූහරන්ති.

1. 6. 2.

අජරසාසුත්තං

[දෙවතා:]

52. කිංසු අජරසා සාධු කිංසු සාධු අධිට්ඨිතං,
කිංසු නරානං රතනං කිංසු චොරෙහි'හාරියන්ති.[1]

[භගවා:]

සීලං අජරසා සාධු සද්ධා සාධු අධිට්ඨිතා,
පඤ්ඤා නරානං රතනං පුඤ්ඤං චොරෙහි'හාරියන්ති.

1. 6. 3.

මිත්තසුත්තං.

[දෙවතා:]

53. කිංසු පවසතො[2] මිත්තං කිංසු මිත්තං සකෙ ඝරෙ,
කිං මිත්තං අත්ථජාතස්ස කිං මිත්තං සම්පරායිකන්ති.

[භගවා:]

සත්ථො පවසතො[2] මිත්තං මාතා මිත්තං සකෙ ඝරෙ,
සහායො අත්ථජාතස්ස හොති මිත්තං පුනප්පුනං,
සයං කතානි පුඤ්ඤානි තං මිත්තං සම්පරායිකන්ති.

1. 6. 4.

වත්ථුසුත්තං.

[දෙවතා:]

54. කිංසු වත්ථු මනුස්සානං කිං සූධ පරමො[3] සඛා,
කිංසු භූතුපජීවන්ති[4] යෙ පාණා පඨවිංසිතාති.

---

1. චොරෙහ්‍යහාරියන්ති - මජසං. චොරෙහහාරියං - සීමු 2. 2. පසවතො - සයා. සීමු. පථවතො - PTS. 3. පරමා - සයා. PTS. සීමු 1. 4. භූතා උපජීවන්ති - මජසං. සයා. PTS.

6. ජරා වග්ගය.

1. 6. 1.

ජරා සූත්‍රය.

51. සැවැත් නුවර—

[දෙවි:]

ජරාව තෙක් කුමක් මැනවි ද? කිමෙක් පිහිටියේ මැනවි ද? මිනිසුන්ට කුමක් රුවන වේ ද? සොරුන් විසින් කුමක් පැහැර නොගතහැකි වේ ද?

[භගවත්හු:]

ජරාව තෙක් ශීලය මැනවි. ශ්‍රද්ධාව පිහිටියා මැනවි. මිනිසුන්ට ප්‍රඥාව රුවන වේ. පින සොරුන් විසින් පැහැර නොගතහැකි වේ.

1. 6. 2.

අජරසා සූත්‍රය.

[දෙවි:]

52. නොදිරීමෙන් කුමක් මැනවි ද? කිමෙක් (සවසනතාතයෙහි) පිහිටියේ මැනවි ද? මිනිසුන්ට කුමක් රුවන වේ ද? කිමෙක් සොරුන් විසින් පැහැර නොගතහැකි වේ ද?

[භගවත්හු:]

නොදිරීමෙන් ශීලය මැනවි. ශ්‍රද්ධාව පිහිටියා මැනවි. ප්‍රඥාව මිනිසුන්ට රුවන වේ. පින සොරුන් විසින් පැහැර නොගතහැකි වේ.

1. 6. 3.

මිත්ත සූත්‍රය.

[දෙවි:]

53. බැහැර වසන්නහුට මිත්‍රයා කවරෙක් ද? සිය ගෙහි මිත්‍රයා කවරෙක් ද? කටයුතු ඇත්තහුට මිත්‍රයා කවරෙක් ද? පරලොව මිත්‍රයා කවරෙක් ද?

[භගවත්හු:]

බැහැර වසන්නහුට සාත්තුව (තවලම) මිතුරු ය. සියගෙහි මිතුරු මව ය. කටයුතු ඇත්තහුට යහළුවා තැවත තැවත මිතුරු වෙයි. තමා විසින් කරණ ලද පින් ඒ පරලොව මිතුරු වෙයි.

1. 6. 4.

වත්ථු සූත්‍රය.

[දෙවි:]

54. මිනිසුන්ට කුමක් පිහිට වේ ද? මෙහි උතුම් යහළුවා කවරෙක් ද? පොළොව ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙත් නම් (ඒ) සත්තවයෝ කුමක් ඇසුරු කොට ජීවත් වෙද්ද?

[භගවා:]

පුත්තා වත්ථු මනුස්සානං භරියාව[1] පරමො[2] සඛා,
වුට්ඨිං භූතුපජීවන්ති[3] යෙ පාණා පඨවිංසිතාති.[4]

1. 6. 5.

පඨමජනෙතිසුත්තං

[දෙවතා:]

55. කිංසු ජනෙති පුරිසං කිංසු තස්ස විධාවති,
කිංසු සංසාරමාපාදි කිංසු තස්ස මහබ්භයන්ති.

[භගවා:]

තණ්හා ජනෙති පුරිසං චිත්තමස්ස විධාවති,
සත්තො සංසාරමාපාදි දුක්ඛමස්ස මහබ්භයන්ති.

1. 6. 6.

දුතියජනෙතිසුත්තං

[දෙවතා:]

56. කිංසු ජනෙති පුරිසං කිංසු තස්ස විධාවති,
කිංසු සංසාරමාපාදි කිස්මා න පරිමුච්චතීති.

[භගවා:]

තණ්හා ජනෙති පුරිසං චිත්තමස්ස විධාවති,
සත්තො සංසාරමාපාදි දුක්ඛා න පරිමුච්චතීති.

1. 6. 7.

තතියජනෙතිසුත්තං

[දෙවතා:]

57. කිංසු ජනෙති පුරිසං කිංසු තස්ස විධාවති,
කිංසු සංසාරමාපාදි කිංසු තස්ස පරායණන්ති.

[භගවා:]

තණ්හා ජනෙති පුරිසං චිත්තමස්ස විධාවති,
සත්තො සංසාරමාපාදි කම්මං තස්ස පරායණන්ති.

1. භරියා ච - මජසං. PTS. 2. පරමා - සෳා. PTS. සිමු. 1. 3. භූතා උපජීවන්ති - මජසං. සෳා. PTS. 4. පඨවිස්සිතා - මජසං.

[භගවත්හු:]

54. පුත්‍රයෝ මිනිසුන්ට පිහිට වෙත්. බිරිය ම උතුම් යහළු ය. පොළොව ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙත් නම් ඒ සත්ත්වයෝ වැස්ස ඇසුරු කොට ජීවත් වෙත්.

1. 6. 5.

පඨමජනෙති සූත්‍රය.

[දෙවි:]

55. කවරෙක් සත්ත්වයා උපදවා ද? ඔහුගේ කිමෙක් ඔබ මොබ දිවේ ද? කවරෙක් සසරට පැමිණියේ ද? කිමෙක් ඔහුට මහත් බිය වේ ද?

[භගවත්හු:]

තෘෂ්ණාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඔබ මොබ දිවේ. සත්ත්වයා සසරට පැමිණියේ ය. දුක ඔහුට මහත් බිය ය.

1. 6. 6.

දුතියජනෙති සූත්‍රය.

[දෙවි:]

56 කවරෙක් සත්ත්වයා උපදවා ද? ඔහුගේ කිමෙක් ඔබ මොබ දිවේ ද? කවරෙක් සසරට පැමිණියේ ද? කුමකින් නො මිදේ ද?

[භගවත්හු:]

තෘෂ්ණාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඔබ මොබ දිවේ. සත්ත්වයා සසරට පැමිණියේ ය. දුකින් නො මිදේ.

1. 6. 7.

තතිය ජනෙති සූත්‍රය.

[දෙවි:]

57 කවරෙක් සත්ත්වයා උපදවා ද? ඔහුගේ කිමෙක් ඔබ මොබ දිවේ ද? කවරෙක් සසරට පැමිණියේ ද? කිමෙක් ඔහුට පිහිට වේ ද?

[භගවත්හු:]

තෘෂ්ණාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඔබ මොබ දිවේ. සත්ත්වයා සසරට පැමිණියේ ය. කර්මය ඔහුට පිහිට වේ.

1. 6. 8.

උප්පජ්ජසුත්තං

[දෙවතා:]

58. කිංසු උප්පජ්ජති අක්ඛාතො කිංසු රත්තින්දිවක්ඛයො,
කිං මලං බ්‍රහ්මචරියස්ස කිං සිනානමනොදකන්ති.

[භගවා:]

රාගො උප්පජ්ජති අක්ඛාතො[1] වයො රත්තින්දිවක්ඛයො,
ඉත්ථිමලං බ්‍රහ්මචරියස්ස එත්ථායං සජ්ජතෙ පජා,
තපො ච බ්‍රහ්මචරියඤ්ච තං සිනානමනොදකන්ති.

1. 6. 9.

දුතියාසුත්තං*

[දෙවතා:]

59. කිංසු දුතියා[2] පුරිසස්ස හොති කිංසු චෙනං පසාසති,
කිස්ස චාභිරතො මච්චො සබ්බදුක්ඛා පමුච්චතීති.

[භගවා:]

සද්ධා දුතියා පුරිසස්ස හොති පඤ්ඤා චෙනං පසාසති,
නිබ්බානාභිරතො මච්චො සබ්බදුක්ඛා පමුච්චතීති.

1. 6. 10.

කවිසුත්තං

[දෙවතා:]

60. කිංසු නිදානං ගාථානං කිංසු තාසං වියඤ්ජනං,
කිංසු සන්නිස්සිතා ගාථා කිංසු ගාථානමාසයො.

[භගවා:]

ඡන්දො නිදානං ගාථානං අක්ඛරා තාසං වියඤ්ජනං,
නාමසන්නිස්සිතා ගාථා කවි ගාථානමාසයො.

ජරාවග්ගො ඡට්ඨො.

තත්‍රුද්දානං:

ජරා අජරසා මිත්තං වත්ථු තීණි ජනෙති ච,
උප්පජ්ජති ච දුතියා ච කවිනා පූරිතො වග්ගොති.

---

1. අක්ඛාති. - සයා. PTS. 2. දුතියං - සයා.

* දුතිය උප්පජ්ජසුත්තං. සිමු. 2.

1. 6. 8.

උප්පථ සූත්‍රය.

[දෙවි:]

58. කිමෙක් නොමග ය යි කියන ලද්දේ ද? කිමෙක් රෑ දවල්හි ගෙවේ ද? බඹසරට කිලුට කිමෙක් ද? දිය නැති නැම කිමෙක් ද?

[භගවත්හු:]

රාගය නොමග ය යි කියන ලද්දේ ය. වයස රෑ දවල්හි ගෙවේ. ස්ත්‍රිය බඹසරට කිලුට ය. මේ සත්ත්වසමූහයා මෙහි ඇලේ. තපස ද බඹසර ද (යන) එය දිය නැති නැමයි.

1. 6. 9.

දුතියා සූත්‍රය.

[දෙවි:]

59. පුරුෂයාට කවරක් දෙවැන්නී වේ ද? කවරෙක් ඔහුට අනුශාසනා කෙරේ ද? කිමෙක මැනවින් ඇලුනු සත්ත්ව තෙමේ සියලු දුකින් මිදේ ද?

[භගවත්හු:]

ශ්‍රද්ධාව පුරුෂයාට දෙවැන්නී වේ. ප්‍රඥාව ඔහුට අනුශාසනා කෙරෙයි නිවණෙහි මැනවින් ඇලුනු සත්ත්ව තෙමේ සියලු දුකින් මිදේ.

1. 6. 10.

කවි සූත්‍රය

[දෙවි:]

60. ගාථාවන්ට කිමෙක් මුලකාරණය වේ ද? කිමෙක් ඔවුන්ගේ අරුත් පවසා ද? ගාථාවෝ කුමක් ඇසුරු කොට පවතිද්? ද කවරෙක් ගාථාවන්ට පිහිට වේ ද?

[භගවත්හු:]

ඡන්දස ගාථාවන්ට නිදාන වේ. අකුරු ඔවුන්ගේ අරුත් පවසයි. ගාථාවෝ සංඥවන් ඇසුරු කොට පවතිත්. කවි තෙමේ ගාථාවන්ට පිහිට වේ.

ජරා වර්ගය සවැනියි.

එහි උද්දානය:

ජරා, අජරසා, මිත්ත, වත්ථු සූත්‍රය, ජනෙති සූත්‍ර තුනය, උප්පථ සූත්‍රය, දුතියාසූත්‍රය, කවි සූත්‍රය යන මෙයින් වර්ගය පිරුණේ වේ.

---

7. අද්ධවග්ගො

1. 7. 1.

නාම [අද්ධභවි]සුත්තං

61. සාවත්ථියං—

[දෙවතා:]

කිංසු සබ්බං අද්ධභවි[1] කිස්මා භියො[2] න විජ්ජති,
කිස්සස්ස[3] එකධම්මස්ස සබ්බෙව වසමන්වගූති.

[භගවා:]

නාමං සබ්බං අද්ධභවි[1] නාමා භියො න විජ්ජති,
නාමස්ස එකධම්මස්ස සබ්බෙව වසමන්වගූති.

1. 7. 2.

චිත්තසුත්තං

[දෙවතා:]

62. කෙනස්සු නීයති ලොකො කෙනස්සු පරිකස්සති,[4]
කිස්සස්ස[3] එකධම්මස්ස සබ්බෙව වසමන්වගූති.

[භගවා:]

චිත්තෙන නීයති ලොකො චිත්තෙන පරිකස්සති,[4]
චිත්තස්ස එකධම්මස්ස සබ්බෙව වසමන්වගූති.

1. 7. 3.

තණ්හාසුත්තං

[දෙවතා:]

63. කෙනස්සු නීයති ලොකො කෙනස්සු පරිකස්සති,[4]
කිස්සස්ස[3] එකධම්මස්ස සබ්බෙව වසමන්වගූති.

[භගවා:]

තණ්හාය නීයති ලොකො තණ්හාය පරිකස්සති,[4]
තණ්හාය එකධම්මස්ස සබ්බෙව වසමන්වගූති.

1. 7. 4.

සංයොජනසුත්තං

[දෙවතා:]

64. කිංසු සංයොජනො ලොකො කිංසු තස්ස විචාරණං,
කිස්සස්ස[3] විප්පහානෙන නිබ්බානමිති වුච්චතීති.

1. අද්ධභවි - සීමු. 2. භියො - ඉතිපි. 3. කිස්සස්සු - මජසං. PTS. 4. පරිකිස්සති - සයා. PTS.

7. අනව වර්ගය

1. 7. 1.

නාම [අනාවහවි] සූත්‍රය

61 .සැවැත්නුවර—

[දෙවි:]

කිමෙක් සියල්ල යටපත් කොට සිටියේ ද? කිමෙකින් වැඩියෙක්නැද්ද? සියල්ලෝ ම කිනම් එකදහමක්හුගේ වසයට ගියාහු ද?

නාමය සියල්ල යටපත් කොට සිටියේ ය. නාමයෙන් වැඩියෙක් නැත. සියල්ලෝ ම නාමසඞ්ඛ්‍යාත එක ම දහම්හුගේ වසයට ගියාහු ය.

1. 7. 2.

චිත්ත සූත්‍රය

[දෙවි:]

62. ලොව කිමෙකින් පමුණුවනු ලැබේ ද? කිමෙකින් අදනා ලැබේ ද? සියල්ලෝ ම කිනම් එක් දහමක්හුගේ වසයට ගියාහු ද?

[භගවත්හු:]

සිතින් ලොව පමුණුවනු ලැබේ. සිතින් අදනා ලැබේ. සියල්ලෝ ම සිත් නමැති මේ එක ම දහම්හුගේ වසයට ගියාහු ය

1. 7. 3.

තණ්හා සූත්‍රය

[දෙවි:]

63. ලොව කිමෙකින් පමුණුවනු ලැබේ ද? කිමෙකින් අදනා ලැබේ ද? සියල්ලෝ ම කිනම් එක් දහමක්හුගේ වසයට ගියාහු ද?

[භගවත්හු:]

ලොව තෘෂ්ණායෙන් පමුණුවනු ලැබේ. තෘෂ්ණායෙන් අදනා ලැබේ. සියල්ලෝ ම තෘෂ්ණා නමැති මේ එක් දහම්හුගේ වසයට ගියාහු ය.

1. 7. 4.

සංයෝජන සූත්‍රය

[දෙවි:]

64. ලොව කුමක් බැඳුම් කොට ඇත්තේ ද? එහි පාද කිමෙක් ද? කුමක් ප්‍රහාණී කිරීමෙන් නිවණ යයි කියනු ලැබේ ද?

[භගවා:]

නන්දි[1] සංයොජනො ලොකො විතක්කස්ස විචාරණං,
තණ්හාය විප්පහානෙන නිබ්බාණමිති වුච්චතීති.

1. 7. 5.

බන්ධනසුත්තං

[දෙවතා:]

65. කිංසු සම්බන්ධනො ලොකො කිංසු තස්ස විචාරණං,
කිස්සස්ස විප්පහානෙන සබ්බං ඡින්දති බන්ධනන්ති.

[භගවා:]

නන්දි[1] සම්බන්ධනො ලොකො විතක්කස්ස විචාරණං,
තණ්හාය විප්පහානෙන සබ්බං ඡින්දති බන්ධනන්ති.

1. 7. 6.

අබ්භාහතසුත්තං

[දෙවතා:]

66. කෙනස්සුබ්භාහතො ලොකො කෙනස්සු පරිවාරිතො,
කෙන සල්ලෙන ඔතිණ්ණො කිස්ස ධූමායිතො[2] සදාති.

[භගවා:]

මච්චුනා'බ්භාහතො ලොකො ජරාය පරිවාරිතො,
තණ්හාසල්ලෙන ඔතිණ්ණො ඉච්ඡාධූමායිතො[2] සදාති.

1. 7. 7.

උඩ්ඩිතසුත්තං

[දෙවතා:]

67. කෙනස්සු උඩ්ඩිතො ලොකො කෙනස්සු පරිවාරිතො,
කෙනස්සු පිහිතො ලොකො කිස්මිං ලොකො පතිට්ඨිතොති.

[භගවා:]

තණ්හාය උඩ්ඩිතො ලොකො ජරාය පරිවාරිතො,
මච්චුනා පිහිතො ලොකො දුක්ඛෙ ලොකො පතිට්ඨිතොති

1. 7. 8.

පිහිතසුත්තං

[දෙවතා:]

68. කෙනස්සු පිහිතො ලොකො කිස්මිං ලොකො පතිට්ඨිතො,
කෙනස්සු උඩ්ඩිතො ලොකො කෙනස්සු පරිවාරිතොති.

---

1. නන්දී - මජසං. PTS. 2. ධූපායිතො-මජසං. ස්‍යා. PTS.

[භගවත්හු:]

65. ලොව රාගය බැඳුම් කොට ඇත්තේ ය. එහි පාද විතර්කයෝ යි. තෘෂ්ණාව ප්‍රහාණ කිරීමෙන් නිවණ ය යි කියනු ලැබේ.

1. 7. 5.

බන්ධන සූත්‍රය.

[දෙවි:]

ලොව කුමක් බැඳුම් කොට ඇත්තේ ද? එහි පාද කිමෙක් ද? කුමක් ප්‍රහාණ කිරීමෙන් සියලු බැඳුම් සිඳී ද?

[භගවත්හු:]

ලොව රාගය බැඳුම් කොට ඇත්තේ ය. එහි පාද විතර්කයෝ යි. තෘෂ්ණාව ප්‍රහාණ කිරීමෙන් සියලු බැඳුම් සිඳී.

1. 7. 6.

අබ්භාහත සූත්‍රය.

[දෙවි:]

66. ලොව කිමෙකින් ලුහුබඳනා ලද ද? කිමෙකින් පිරිවරණ ලද ද? කුමන හුලෙකින් බැස ගන්නා ලද ද? කිමෙකින් හැමකල්හි දුමන ලද ද?

[භගවත්හු:]

ලොව මරහු විසින් ලුහුබඳනා ලදී. ජරායෙන් පිරිවරණ ලදී. තෘෂ්ණා-හුලෙන් බැස ගන්නා ලදී තෘෂ්ණායෙන් හැමකල්හි දුමන ලදී.

1. 7. 7.

උඩ්ඩිත සූත්‍රය.

[දෙවි:]

67. ලොව කිමෙකින් තඟන ලද්දේ ද? කිමෙකින් පිරිවරණ ලද්දේ ද? කිමෙකින් වසන ලද්දේ ද? ලොව කිමෙක පිහිටියේ ද?

[භගවත්හු:]

ලොව තෘෂ්ණායෙන් තඟන ලද්දේ ය. ජරායෙන් පිරිවරණ ලද්දේ ය. ලොව මරහු විසින් වසන ලද්දේ ය. ලොව දුකෙහි පිහිටියේ ය.

1. 7. 8.

පිහිත සූත්‍රය.

[දෙවි:]

68. ලොව කිමෙකින් වසන ලද්දේ ද? ලොව කිමෙක පිහිටියේ ද? ලොව කිමෙකින් එල්බුම් ලද්දේ ද? කිමෙකින් පිරිවරණ ලද්දේ ද?

[භගවා:]

මච්චුනා පිහිතො ලොකො දුක්ඛෙ ලොකො පතිට්ඨිතො,
තණ්හාය උඩ්ඩිතො ලොකො ජරාය පරිවාරිතො.

1. 7. 9.

ඉච්ඡාසුත්තං

[දෙවතා:]

69. කෙනස්සු බජ්ඣති ලොකො කිස්ස විනයාය මුච්චති,
කිස්සස්ස විප්පහානෙන සබ්බං ඡින්දති බන්ධනන්ති.

[භගවා:]

ඉච්ඡාය බජ්ඣති ලොකො ඉච්ඡාවිනයාය මුච්චති,
ඉච්ඡාය විප්පහානෙන සබ්බං ඡින්දති බන්ධනන්ති.

1. 7. 10.

ලොකසුත්තං

[දෙවතා:]

70. කිස්මිං ලොකො සමුප්පන්නො කිස්මිං කුබ්බති සන්ථවං,
කිස්ස ලොකො උපාදාය කිස්මිං ලොකො විහඤ්ඤතීති.

[භගවා:]

ඡස්සු[1] ලොකො සමුප්පන්නො ඡස්සු[1] කුබ්බති සන්ථවං,
ඡන්නමෙව උපාදාය ඡස්සු[1] ලොකො විහඤ්ඤතීති.

අද්ධවග්ගො සත්තමො.

තස්සුද්දානං:

නාමං චිත්තඤ්ච තණ්හා ච සංයොජනඤ්ච බන්ධනා,
අබ්භාහතුඩ්ඩිතො පිහිතො ඉච්ඡා ලොකෙන තෙ දසාති.

---

8. ඣත්වා[2]වග්ගො

1. 8. 1.

ඣත්වාසුත්තං

71. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

කිං සු ඣත්වා[2] සුඛං සෙති කිං සු ඣත්වා[2] න සොචති,
කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතමාති.

---

1. ඡසු - මජ්ඣං. සයා. PTS. 2. ඡෙත්වා - මජ්ඣං. PTS. ඣත්වා - සයා.

[භගවත්හු]

ලොව මරහු විසින් වසන ලද්දේ ය. ලොව දුකෙහි පිහිටියේ ය. ලොව තෘෂ්ණායෙන් එල්බුම් ලද්දේ ය. ජරායෙන් පිරිවරණ ලද්දේ ය.

1. 7. 9.

ඉච්ඡා සූත්‍රය.

[දෙවි:]

69. ලොව කිමෙකින් බැදේ ද? කුමක් දුරු කිරීමෙන් මිදේ ද? කුමක් ප්‍රහාණ කිරීමෙන් සියලු බැඳුම් සිඳී ද?

[භගවත්හු]

ලොව තෘෂ්ණායෙන් බැදේ. තෘෂ්ණාව දුර ලීමෙන් මිදේ. තෘෂ්ණාව ප්‍රහාණ කිරීමෙන් සියලු බැඳුම් සිඳී.

1. 7. 10.

ලෝක සූත්‍රය.

[දෙවි:]

70. කුමක් හටගත් කල්හි ලොව හටගත්තේ වේ ද? කිමෙක සන්‍ථවය කෙරේ ද? ලොව කුමක් නිසා කිමෙක පෙළේ ද?

[භගවත්හු:]

ෂඩායතන හටගත් කල්හි ලොව හටගත්තේ වේ. ෂඩායතනයෙහි සන්‍ථවය කෙරේ. ෂඩායතන ම නිසා ෂඩායතනයෙහි ලොව පෙළේ.

අද්ධ වර්ගය සත්වැනියි.

එහි උද්දානය:

නාම, චිත්ත, තණ්හා, සංයෝජන, බන්ධන, අබ්භාහත, උඩ්ඩිත, පිහිත, ඉච්ඡා, ලෝක ය යි ඒ සූත්‍ර දශයෙකි.

---

8. ඡෙත්වා වර්ගය.

1. 8. 1.

ඡෙත්වා සූත්‍රය.

71. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

කුමක් නසා සුව සේ හොවී ද? කුමක් නසා ශෝක නො කෙරේ ද? ගෞතමයන් වහන්ස, කිනම් එක්දහමක්හුගේ නැසීම රුස්නෙහි ද?

[භගවා:]

ඣත්වා[1] සුඛං සෙති කොධං ඣත්වා[1] න සොචති,
කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස දෙවතෙ,
වධං අරියා පසංසන්ති තං හි ඣත්වා[1] න සොචතීති.

1. 8. 2.

රථසුත්තං

[දෙවතා:]

72. කිංසු රථස්ස පඤ්ඤාණං කිංසු පඤ්ඤාණමග්ගිනො,
කිංසු රට්ඨස්ස පඤ්ඤාණං කිංසු පඤ්ඤාණමිත්ථියාති.

[භගවා:]

ධජො රථස්ස පඤ්ඤාණං ධූමො පඤ්ඤාණමග්ගිනො,
රාජා රට්ඨස්ස පඤ්ඤාණං භත්තා පඤ්ඤාණමිත්ථියාති.

1. 8. 3.

විත්තසුත්තං.

[දෙවතා:]

73. කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං කිංසු සුචිණ්ණො සුඛමාවහාති,
කිංසු හවෙ සාදුතරං[2] රසානං කථංජීවිං ජීවිතමාහු[3] සෙට්ඨන්ති.

[භගවා:]

සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
සච්චං හවෙ සාදුතරං රසානං පඤ්ඤාජීවිං ජීවිතමාහු[3] සෙට්ඨන්ති.

1. 8. 4.

වුට්ඨිසුත්තං.

[දෙවතා:]

74. කිංසු උප්පතතං සෙට්ඨං කිංසු නිපතතං වරං,
කිංසු පවජමානානං කිංසු පවදතං වරන්ති.

[අපරා දෙවතා:]

බීජං උප්පතතං සෙට්ඨං වුට්ඨි නිපතතං වරා,
ගාවො පවජමානානං පුත්තො පවදතං වරොති.

[භගවා:]

විජ්ජා උප්පතතං සෙට්ඨා අවිජ්ජා නිපතතං වරා,
සඞ්ඝො පවජමානානං බුද්ධො පවදතං වරොති.

---

1. ඡෙත්වා - මජසං. PTS. ඣත්වා - සයා. 2. සාධුතරං. - සයා. 3. ජීවිජීවිතං - සයා

[භගවත්හු:]

ක්‍රෝධය නසා සුවසේ හොවී. ක්‍රෝධය නසා ශෝක නො කෙරේ. දෙවිය, විෂ වූ මුල ඇති මිහිරි අග ඇති ක්‍රෝධය නැසීම ආර්‍ය්‍යයෝ පසසත්. එය නසා ම ශෝක නො කෙරේ.

1. 8. 2.

රථ සූත්‍රය.

[දෙවි:]

72. රියට සලකුණ කිමෙක් ද? ගින්නට සලකුණ කිමෙක් ද? රටට සලකුණ කිමෙක් ද? ස්ත්‍රියට සලකුණ කිමෙක් ද?

[භගවත්හු:]

ධවජය රියට සලකුණ යි. දුම ගින්නට සලකුණ යි. රජ රටට සලකුණ යි. සැමියා ස්ත්‍රියට සලකුණ යි.

1. 8. 3.

විත්ත සූත්‍රය.

[දෙවි:]

73. මෙලොව සත්ත්වයාට කිමෙක් ශ්‍රේෂ්ඨ ධනය වේ ද? කුමක් මැනවින් පුරුදු කරණ ලද්දේ සුව එළවා ද? රසයන් අතුරෙන් කිමෙක් ඉතා මිහිරි ද? කෙසේ ජිවත් වන්නහු ශ්‍රේෂ්ඨ ජීවිත ඇතියහ යි කියද් ද?

[භගවත්හු:]

මෙලොව සත්ත්වයාට ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨ ධනය වේ. දහම මැනවින් පුරුදු කරණ ලද්දේ සුව එළවයි. රසයන් අතුරෙන් සත්‍යය ඒකාන්තයෙන් ඉතා මිහිරිය. නුවණින් ජිවත් වන්නහු ශ්‍රේෂ්ඨ ජීවිත ඇතිහය යි කියත්.

1. 8. 4.

වුට්ඨි සූත්‍රය.

[දෙවි:]

74. නැගගනුවන් අතුරෙන් කිමෙක් ශ්‍රේෂ්ඨ ද? හෙනුවන් අතුරෙන් කිමෙක් උතුම් ද? පයින් ගමන් කරන්නවුන් අතුරෙන් කවරෙක් උතුම් ද? කථා කරන්නවුන් අතුරෙන් කවරෙක් උතුම් ද? යි

[අනෙක් දෙවියෙක්:]

නැඟගනුවන් අතුරෙන් බිජුවට ශ්‍රේෂ්ඨ යි. හෙනුවන් අතුරෙන් වැස්ස උතුම් ය. පයින් යන්නවුන් අතුරෙන් ගවයෝ උතුම්හ. කථා කරන්නවුන් අතුරෙන් පුත්‍රයා උතුම්ය යි.

[භගවත්හු:]

නැඟගනුවන් අතුරෙන් විද්‍යාව ශ්‍රේෂ්ඨ ය. හෙනුවන් අතුරෙන් අවිද්‍යාව උතුම් ය. පයින් යන්නවුන් අතුරෙන් සඞ්ඝයා උතුම් ය. කථා කරන්නවුන් අතුරෙන් බුදුරජ උතුම් ය යි.

1. 8. 5.

භීතසුත්තං.

[දෙවතා:]

75. කිං සූ'ධ භීතා ජනතා අනෙකා මග්ගො ච නෙකායතනං පවුත්තො,
පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ කිස්මිං ඨිතො පරලොකං න භායෙති.

භගවා:

වාචං මනඤ්ච පණිධාය සම්මා කායෙන පාපානි අකුබ්බමානො,
බව්හන්නපානං[1] ඝරමාවසන්තො සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ,
එතෙසු ධම්මෙසු ඨිතො චතූසු ධම්මෙ-ඨිතො පරලොකං න භායෙති.

1. 8. 6.

නජීරතිසුත්තං

[දෙවතා:]

76. කිං සු ජීරති[2] කිං න ජීරති කිං සු උප්පථොති වුච්චති,
කිං සු ධම්මානං පරිපන්ථො කිං සු රත්තින්දිවක්ඛයො,
කිං මලං බ්‍රහ්මචරියස්ස කිං සිනානමනොදකං.

කති ලොකස්මිං ඡිද්දානි යත්ථ විත්තං න තිට්ඨති,
භගවන්තං පුට්ඨුමාගම්ම කථං ජානෙමු තං මයන්ති.

[භගවා:]

රූපං ජීරති මච්චානං නාමගොත්තං න ජීරති,
රාගො උප්පථොති වුච්චති ලොභො ධම්මානං පරිපන්ථො,
වයො රත්තින්දිවක්ඛයො ඉත්ථීමලං බ්‍රහ්මචරියස්ස
එත්ථායං සජ්ජතෙ පජා,
තපො ච බ්‍රහ්මචරියඤ්ච තං සිනානමනොදකං.

ඡ ලොකස්මිං ඡිද්දානි යත්ථ විත්තං න තිට්ඨති,
ආලස්සං[3] ච පමාදො ච අනුට්ඨානං අසංයමො,
නිද්දා තන්දි ච[4] තෙ ඡිද්දෙ සබ්බසො තං විවජ්ජයෙති.

1. 8. 7.

ඉස්සරසුත්තං.

[දෙවතා:]

77. කිං සු ඉස්සරියං ලොකෙ කිං සු භණ්ඩානමුත්තමං,
කිං සු සත්ථමලං ලොකෙ කිං සු ලොකස්මිං අබ්බුදං[5].

කිං සු හරන්තං වාරෙන්ති හරන්තො පන කො පියො,
කිං සු පුනප්පුනායන්තං අභිනන්දන්ති පණ්ඩිතාති.

---

1. බහුන්නපානං - ස්‍යා. බහ්වන්නපානං - මජසං. PTS. 2. කිං ජීරති - මජසං. PTS.
3. ආලස්‍යං - මජසං. ස්‍යා. 4. තන්දී - මජසං. ස්‍යා. PTS. 5. අබ්බුද - සීමු2

1. 8. 5.

සිත සූත්‍රය.

[දෙවි:]

75. මහාප්‍රාඥ වූ ගෞතමයන් වහන්ස, මුඹවහන්සේ විචාරමි. මාගීය ද (අටතිස් අරමුණු විසින්) නොයෙක් කරුණු ඇත්තක් කොට ප්‍රකාශ කරණ ලද්දේ ය. මේ ලෝකයෙහි නොයෙක් ජන සමූහයෝ කුමට බිය වූවාහු ද? කිමෙක සිටියේ පරලොවට බිය නොවන්නේ ද?

[භගවත්හු:]

වචනය ද සිත ද මනා කොට පිහිටුවා, කයින් පව් නොකරණ, බොහෝ ආහාරපාන ඇති ගෙහි වසන, ශ්‍රද්ධාවත්, මෘදුගුණ ඇති, බෙදා දී වළඳන සුලු, දන්කලු, සිවු දහම්හි සිටි පුද්ගල තෙමේ දහම්හි සිටියේ පරලොවට බිය නො වන්නේ ය.

1. 8. 6.

නජීරති සූත්‍රය.

[දෙවි:]

76. කිමෙක් දිරා ද? කිමෙක් නො දිරා ද? කිමෙක් නොමඟ ය යි කියනු ලැබේ ද? දහමුන්ට උවදුර කිමෙක් ද? කිමෙක් රෑදෙවෙහි ගෙවේ ද? බඹසරට කිලුට කිමෙක් ද? දියරහිත නෑම කිමෙක්ද?

යම් තැනක සිත නො සිටී නම් ලොව (එබඳු) සිදුරු කෙතෙක් ද? භාග්‍යවතුන් වහන්සේ විචාරන්නට අවුත් (සිටින) අපි ඒ කෙසේ දනිමු ද?

[භගවත්හු:]

සත්ත්වයන්ගේ රූපය දිරයි. නාමගොත්‍රය නො දිරයි. රාගය නොමග ය යි කියනු ලැබේ. ලෝභය දහමුන්ට උවදුර ය. වයස රෑදෙවෙහි ගෙවේ. ස්ත්‍රිය බඹසරට කිලුට ය. මේ සත්ත්වසමූහයා මෙහි ඇලේ, තපස ද බඹසර ද (යන) එය දිය රහිත නැමැයි.

යම් තැනෙක සිත නො සිටී නම් ලොව එබඳු සිදුරු සයෙකි. අලසබව ද පමාව ද නැඟී නො සිටීම ද අසංවරය ද නින්ද ද නෙමරිය ද ඒ සිදුරු යි. එය සර්වප්‍රකාරයෙන් දුරු කරන්නේ ය.

1. 8. 7.

ඉස්සර සූත්‍රය.

[දෙවි:]

77. ලොව අධිපති බව කිමෙක් ද? බඩු අතුරෙන් කිමෙක් උතුම් ද? ලොව මලබැඳි සැත කිමෙක් ද? ලොව උවදුර කිමෙක් ද?

හැර ගෙණ යන කවරකු වළකත් ද? හැර ගෙණ යන කවරෙක් ප්‍රිය වේ ද? පුනපුනා එන කවරකු පණ්ඩිතයෝ පිළිගණිද් ද?

[භගවා:]

වසො ඉස්සරියං ලොකෙ ඉත්ථී භණ්ඩානමුත්තමං,
කොධො සත්ථමලං ලොකෙ චොරා ලොකස්මිං අබ්බුදං[1]

චොරං හරන්තං වාරෙන්ති හරන්තො සමණො පියො,
සමණං පුනප්පුනායන්තං අභිනන්දන්ති පණ්ඩිතාති.

1. 8. 8.

කාමසුත්තං

[දෙවතා:]

78. කිමත්ථකාමො න දදෙ කිං මච්චො න පරිච්චජෙ,
කිං සු මුඤ්චෙය්‍ය[2] කල්‍යාණං පාපික[3]ඤ්ච න මොචයෙති[4].

[භගවා:]

අත්තානං න දදෙ පොසො අත්තානං න පරිච්චජෙ,
වාචං මුඤ්චෙය්‍ය[2] කල්‍යාණං පාපිකඤ්ච[3] න මොචයෙති[4].

1. 8. 9.

පාථෙය්‍යසුත්තං

[දෙවතා:]

79. කිං සු බන්ධති පාථෙය්‍යං කිං සු භොගානමාසයො,
කිං සු නරං පරිකස්සති කිං සු ලොකස්මිං දුජ්ජහං,
කිස්මිං බද්ධා පුථූ[5] සත්තා පාසෙන සකුණී යථාති.

[භගවා:]

සද්ධා බන්ධති පාථෙය්‍යං සිරි භොගානමාසයො,
ඉච්ඡා නරං පරිකස්සති ඉච්ඡා ලොකස්මිං දුජ්ජහා,
ඉච්ඡාබද්ධා පුථූ[5]සත්තා පාසෙන සකුණී යථාති.

1. 8. 10.

පජ්ජොතසුත්තං

[දෙවතා:]

80. කිං සු ලොකස්මිං[6] පජ්ජොතො කිං සු ලොකස්මිං[6] ජාගරො,
කිං සු කම්මෙ සජීවානං කිමස්ස ඉරියාපථො.

කිං සු අලසං අනලසඤ්ච මාතා පුත්තංව පොසති,
කිං සු භූතූපජීවන්ති යෙ පාණා පථවිංසිතාති.

අබ්බුද - සීමු. 2. 2. මුච්චෙය්‍ය - සයා. සීමු. 2. PTS. 3. පාපියං - සයා. සීමු. 1. PTS. න ච මොචයෙ - මජසං. 5. පුථු - මජසං. සයා 6. ලොකස්මි - මජසං. සයා.

[භගවත්හු:]

ලොව වශය (අණ පැවැත්වීම) අධිපති බව යි. බඩු අතුරෙන් සත්‍රිය උතුම් ය. ලොව ක්‍රෝධය මලබැඳි සැතයි. සොරු ලොව උවදුරුය.

හැර ගෙණ යන සොරහු වලකත්. හැර ගෙණ යන මහණ තෙමේ ප්‍රිය වේ. පුනපුනා එන මහණහු පණ්ඩිතයෝ පිළිගණිත්.

1. 8. 8.

ඛාම සූත්‍රය.

[දෙවි:]

78. වැඩ කැමැති සත්ත්ව තෙමේ කුමක් නො දෙන්නේ ද? කුමක් නො හරනේ ද? යහපත් වූ කුමක් මුදන්නේ ද? ලාමක වූ කුමක් නො මුදන්නේ ද?

[භගවත්හු:]

සත්ත්ව තෙමේ තමා නො දෙන්නේ ය. තමා නො හරනේ ය. යහපත් වචන මුදන්නේ ය. ලාමක වචන නො මුදන්නේ ය යි.

1. 8. 9.

පාථෙය්‍ය සූත්‍රය.

[දෙවි:]

79. කිමෙක් මඟඋවරණ බඳී ද? කිමෙක් භෝගයන්ට පිහිට වේ ද? කිමෙක් මිනිසා අදනේ ද? ලොව කිමෙක් දුර ලීමට දුෂ්කර ද? මළපුඩුවෙන් බැඳුනු ලිහිණියක මෙන් බොහෝ සත්ත්වයෝ කිමෙක බැඳුනාහු ද?

[භගවත්හු:]

ශ්‍රද්ධාව මඟඋවරණ බඳී. ඓශ්වර්‍ය්‍යය භෝගයන්ට ප්‍රතිෂ්ඨාස්ථාන ය යි. තෘෂ්ණාව සත්ත්වයා අදනේ ය. ලොව තෘෂ්ණාව දුරලීමට දුෂ්කර ය. මළපුඩුවෙන් බැඳුනු ලිහිණියක මෙන් බොහෝ සත්ත්වයෝ තෘෂ්ණායෙන් බැඳුනෝ ය.

1. 8. 10.

පජ්ජෝත සූත්‍රය.

[දෙවි:]

80. ලොව පහන කිමෙක් ද? ලොව නිදිවරන්නා කවරෙක් ද? සමඟ ජීවත්වන්නවුන්ට කවරෙක් කර්මාන්තයෙහි (සහාය) වේ ද? කිමෙක් ඔහුගේ ඉරියව්ව (දිවිපැවැත්ම) වේ ද?

කිමෙක් අලසයාත් අනලසයාත් මව පුතකු පුෂ්නාක් සෙයින් පුෂ්නේ ද? පොළොව ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙත් නම් (ඒ) සත්ත්වයෝ කුමක් ඇසුරු කොට ජීවත් වෙද් ද?

[භගවා:]

පඤ්ඤා ලොකස්මිං[1] පජ්ජොතො සති ලොකස්මිං[1] ජාගරො,
ගාවො කම්මෙ සජීවානං සීතස්ස ඉරියාපථො.

වුට්ඨි අලසං අනලසඤ්ච මාතා පුත්තංව පොසති,
වුට්ඨිං භූතුපජීවන්ති යෙ පාණා පථවිංසිතාති.

1. 8. 11.

අරණසුත්තං

[දෙවතා:]

81. කෙ සුධ අරණා ලොකෙ කෙසං වුසිතං න නස්සති,
කෙධ ඉච්ඡං පරිජානන්ති කෙසං භොජිස්සියං[2] සදා.

කිං සු මාතා පිතා භාතා වන්දන්ති නං පතිට්ඨිතං,
කිං සු ඉධ ජාතිහීනං අභිවාදෙන්ති ඛත්තියාති.

[භගවා:]

සමණීධ අරණා ලොකෙ සමණානං වුසිතං න නස්සති,
සමණා ඉච්ඡං පරිජානන්ති සමණානං භොජිස්සියං[2] සදා.

සමණං මාතා පිතා භාතා වන්දන්ති නං පතිට්ඨිතං,
සමණීධ ජාතිහීනං අභිවාදෙන්ති ඛත්තියාති.

ඡත්තවග්ගො අට්ඨමො.

තස්සුද්දානං:

ඡත්වා රථඤ්ච චිත්තඤ්ච වුට්ඨි භීතා න ජීරති,
ඉස්සරං කාමං පාථෙය්‍යං පජ්ජොතො අරණෙනවාති.

දෙවතාසංයුත්තං සමත්තං.

---

1. ලොකස්මි - මජසං. ස්‍යා. 2. භොජිසියං — ස්‍යා. PTS.

[භගවත්හු:]

නුවණ ලොව පහන ය. සිහිය ලොව නිදිවරන්නා ය. එක්ව ජීවත් වන්නවුන්ට කර්මාන්තයෙහි ගෙරිහු (සහාය) වෙති. හීවට ඔහුගේ ඉරියව්ව (දිවිපැවැත්ම) යි.

වැස්ස අලසයාත් අනලසයාත් මව පුතකු පුත්නාක් සෙයින් පුස්නේ ය, පොළොව ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙත් නම් ඒ සත්ත්වයෝ වැස්ස නිසා ජීවත් වෙත්.

1. 8. 11.

අරණ සූත්‍රය.

[දෙවි:]

81. මේ ලෙව්හි කවුරු කෙලෙස් නැත්තෝ ද? කවුරුන්ගේ විසීම නො නැසේ ද? මෙහි කවුරු තෘෂ්ණාව පිරිසිඳ දනිද් ද? කවුරුන්ට හැමකල්හි නිදහස්බව වේ ද?

(ශීලයෙහි) පිහිටි ඒ කවරකුට මවත් පියාත් බෑයාත් වඳිද් ද? මෙලෙව්හි පහත් ජාති ඇති කවරකුට ක්‍ෂත්‍රියයෝ වඳිද් ද?

[භගවත්හු:]

මෙලෙව්හි ශ්‍රමණයෝ කෙලෙස් නැත්තෝ ය. ශ්‍රමණයන්ගේ විසීම නො නැසේ. ශ්‍රමණයෝ තෘෂ්ණාව පිරිසිඳ දනිත්. ශ්‍රමණයන්ට හැමකල්හි නිදහස් බව වේ.

ශීලයෙහි පිහිටි ඒ ශ්‍රමණයාට මවත් පියාත් බෑයාත් වඳිත්. මෙහි පහත් ජාති ඇති ශ්‍රමණයාට ක්‍ෂත්‍රියයෝ වඳිත්.

ඛත්‍වා වර්ගය අට වැනියි.

එහි උද්දානය:

ඛත්‍වා, රථ, විත්ත, වුට්ඨි, භීත, නජීරති, ඉස්සර, කාම, පාථෙය්‍ය, පජ්ජෝත, අරණ ය යි සූත්‍ර එකොළොසෙකි.

දේවතා සංයුත්තය නිමියේ ය.

2. දෙවපුත්තසංයුත්තං

1. සුරියවග්ගො.

2. 1. 1.

පඨමකස්සපසුත්තං

82. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො කස්සපො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි.

එකමන්තං ඨිතො ඛො කස්සපො දෙවපුත්තො භගවන්තං එතදවොච: "භික්ඛුං භගවා පකාසෙසි. නො ච භික්ඛුනො අනුසාසනින්ති."[1]

[භගවා:]

තෙන හි කස්සප තඤ්ඤෙවෙත්ථ පටිභාතූති.

[කස්සපදෙවපුත්තො:]

"සුභාසිතස්ස සික්ඛෙථ සමණූපාසනස්ස ච,
එකාසනස්ස ච රහො චිත්තවූපසමස්ස චාති."

ඉදමවොච කස්සපො දෙවපුත්තො සමනුඤ්ඤො සත්ථා අහොසි.
අථ ඛො කස්සපො දෙවපුත්තො සමනුඤ්ඤො මෙ සත්ථාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

2. 1. 2.

දුතියකස්සපසුත්තං

83. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො කස්සපො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

භික්ඛු සියා ඣායී විමුත්තචිත්තො ආකඞ්ඛෙ ච හදයස්සානුපත්තිං,
ලොකස්ස ඤත්වා උදයබ්බයඤ්ච සුචෙතසො අනිස්සිතො තදානිසංසොති.

1. අනුසාසන්ති - සජචි.

2. දේවපුත්තසංයුත්තය

1. සූරිය වර්ගය

2. 1. 1.

පඨමකස්සප සූත්‍රය

82. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. එකල්හි මනා ඡවිවණී ඇති කසුප් දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය.

එකත් පසෙක සිටි කසුප් දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. "භාග්‍යවතුන් වහන්සේ මහණහු පැවසූ සේක. මහණහට අනුශාසනාව නො ද (පැවසූ සේක) යි."

[භගවත්හු:]

කාශ්‍යපය, එසේ වී නම් මෙහි ලා තොපට ම වැටහේවා.

"වාක්සුචරිතය වඩන්නේ ය. ශ්‍රමණයන් විසින් එළඹිය යුතු අටතිස් අරමුණු ද කායවිවේකය ද (අෂ්ටසමාපත්ති වශයෙන්) සිත සංහිඳුවීම ද එකලාව වඩන්නේ" යි.

කසුප් දෙව්පුත් තෙමේ මෙය කී ය. ශාස්තෲන් වහන්සේ සමාන අදහස් ඇති වූ සේක.

ඉක්බිති කසුප් දෙව්පුත් තෙමේ ශාස්තෲන්වහන්සේ මාගේ (වචන) අනුමත කළ සේකැ යි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

2. 1. 2.

දුතියකස්සප සූත්‍රය

83. සැවැත්නුවර:-

එකත්පසෙක සිටි කසුප් දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීප-යෙහි මේ ගාථාව කී ය:

මහණ තෙමේ ඉදින් හෘදයානුප්‍රාප්තිසඞ්ඛ්‍යාත අර්හත්ඣය කැමතිවන්නේ නම් ලොව පිළිබඳ උදයව්‍යය දැන ධ්‍යාන වඩන්නේක් මිදුනු සිත් ඇත්තේක් (එහෙයින් ම) මනා සිත් ඇත්තේක් (තෘෂ්ණාදෘෂ්ටීන්) අනිඃශ්‍රිතුයෙක් ඒ අර්හත්ඣය අනුසස් කොට ඇත්තේක් වන්නේ යි.

2. 1. 3.

මාඝසුත්තං

84. සාවත්ථියං—

අථ ඛො මාඝො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො මාඝො දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කිං සු ඡෙත්වා සුඛං සෙති කිං සු ඡෙත්වා න සොචති,
කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතමාති.

[භගවා:]

කොධං ඡෙත්වා සුඛං සෙති කොධං ඡෙත්වා න සොචති,
කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස වත්‍රභූ,
වධං අරියා පසංසන්ති තං හි ඡෙත්වා න සොචතීති.

2. 1. 4.

මාගධසුත්තං

85. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො මාගධො දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කති ලොකස්මිං පජ්ජොතා යෙහි ලොකො පකාසති,
භගවන්තං පුට්ඨුමාගම්ම කථං ජානෙමු තං මයන්ති.

[භගවා:]

චත්තාරො ලොකෙ පජ්ජොතා පඤ්චමෙත්ථ න විජ්ජති,
දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා.

අථ අග්ගි දිවාරත්තිං තහං තහං පකාසති,
සම්බුද්ධො තපතං සෙට්ඨො එසා ආභා අනුත්තරාති.

2. 1. 5.

දමලිසුත්තං

86. සාවත්ථියං—

අථ ඛො දමලි දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො දමලි දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

2. 1. 3.

මාඝ සූත්‍රය

84. සැවැත්නුවර-

එකල්හි මනා ජවිවණී ඇති මාඝ දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය.

එකත්පසෙක සිටි මාඝදෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථා-යෙන් කී ය:

කුමක් නසා සුවසේ හොවී ද? කුමක් නසා ශෝක නො කෙරේ ද? ගෞතමයන් වහන්ස, කිනම් එක් දහමක්හුගේ නැසීම රුස්නෙහි ද?

[භගවත්හු:]

ක්‍රෝධය නසා සුවසේ හොවී. ක්‍රෝධය නසා ශෝක නො කෙරේ. ශක්‍රය, විෂ වූ මුල ඇති මිහිරි වූ අග ඇති ක්‍රෝධය නැසීම ආයඞීයෝ පසසත්. එය නසා ම ශෝක නො කෙරේ.

2. 1. 4.

මාගධ සූත්‍රය.

85. සැවැත්නුවර-

එකත්පසෙක සිටි මාගධ දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

යමෙකින් ලොව බබලා නම් එබඳු එළි ලොව කෙතෙක් ද? භාග්‍යවතුන් වහන්සේ විචාරන්නට අවුත් (සිටින) අපි එය කෙසේ දනිමූ ද?

[භගවත්හු:]

ලොව එළි සතරෙකි. මෙහි පස්වැන්නෙක් නැත. දවල් හිරු බබලයි. සඳු රෑ බබලයි. තව ද, ගින්න රෑදෙවෙහි ඒ ඒ තැන බබලයි. සම්බුදුයන් වහන්සේ බබලන්නවුන් අතුරෙන් ශ්‍රෙෂඨයහ. මේ ආලෝකය නිරුත්තර ය.

2. 1. 5.

දමලි සූත්‍රය

86. සැවැත්නුවර-

එකල්හි මනා ජවිවණී ඇති දමලි දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේ ය. එකත් පසෙක සිටි දමලිදෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

කරණීය මෙතං[1] බ්‍රාහ්මණෙන පධානමකිලාසුනා[2],
කාමානං විප්පහානෙන න තෙනාසිංසතෙ[3] භවන්ති.

නත්ථි කිච්චං බ්‍රාහ්මණස්ස (දාමලීති භගවා) කතකිච්චො හි බ්‍රාහ්මණො,
යාව න ගාධං ලභති නදීසු ආයූහති සබ්බගත්තෙහි ජන්තු
ගාධඤ්ච ලද්ධාන ථලෙ ඨිතො සො නායූහති පාරගතො හි සොති.[4]

එසූපමා දාමලි බ්‍රාහ්මණස්ස ඛීණාසවස්ස නිපකස්ස ඣායිනො,
පප්පුය්‍ය ජාතිමරණස්ස අන්තං නායූහති පාරගතො හි සොති.

2. 1. 6.

කාමද සුත්තං

87. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො කාමදො දෙවපුත්තො භගවන්තං එතදවොච: දුක්කරං භගවා සුදුක්කරං භගවාති,

දුක්කරං වාපි කරොන්ති (කාමදාති භගවා)
සෙඛා[5] සීලසමාහිතා,
ඨිතත්තා අනගාරියුපෙතස්ස
තුට්ඨී හොති සුඛාවහාති.

දුල්ලභා භගවා යදිදං තුට්ඨීති.

දුල්ලභං වාපි ලභන්ති (කාමදාති භගවා)
චිත්තවූපසමෙ රතා,
යෙසං දිවා ච රත්තො ච
භාවනාය රතො මනොති.

දුස්සමාදහං භගවා යදිදං චිත්තන්ති.

දුස්සමාදහං වාපි සමාදහන්ති (කාමදාති භගවා)
ඉන්ද්‍රියූපසමෙ රතා,
තෙ ඡෙත්වා මච්චුනො ජාලං
අරියා ගච්ඡන්ති කාමදාති.

දුග්ගමො භගවා විසමො මග්ගොති,

[භගවා:]

දුග්ගමෙ විසමෙ වාපි
අරියා ගච්ඡන්ති කාමද,
අනරියා විසමෙ මග්ගෙ
පපතන්ති අවංසිරා,
අරියානං සමො මග්ගො
අරියා හි විසමෙ සමාති.

---

1. කරණීයමෙතං - PTS. 2. පධානං අකිලාසුනා - මජසං. 3 න තෙනාසීසතෙ - මජසං. PTS 4. සොව - මජසං 5. සෙක්ඛා - සතා..

නොමැලි වූ ක්ෂීණාස්‍රව බ්‍රාහමණයා විසින් මේ වීර්‍ය්‍යය කටයුතු ය. වස්තුකාම ක්ලේශකාමයන් පිළිබඳ ඒ විශේෂ ප්‍රහාණය හේතු කොට ගෙණ කිසි භවයක් නො පතයි.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. **දමලි** දේවපුත්‍රය, (බාහිත පාපී) බ්‍රාහමණයාට කිසෙක් නැත. ඒ බමුණු තෙමේ කළ කිස ඇත්තේ ම ය. සත්ත්ව තෙමේ ගඞ්ගාවන්හි යම්තාක් පිහිටක් නො ලබා ද? (ඒතාක්) සියලු අවයවවලින් වෑයම් කෙරෙයි. හෙ තෙමේ පිහිටක් ලැබ ගොඩ සිටියේ යම් හෙයෙකින් පරතෙරට ගියේ ද, (එහෙයින්) හෙ තෙමේ වෑයම් නො කෙරෙයි.

දමලි, ධ්‍යාන කරණසුලු ප්‍රඥ ඇති ක්ෂීණාස්‍රව බ්‍රාහමණයාට මේ උපමායෙකි. හෙ තෙමේ ජාතිමරණ දෙක්හි කෙළවරට පැමිණ පරතෙරට ගියේ ම වෑයම් නො කෙරෙයි.

2. 1. 6.

කාමද සූත්‍රය

87. **සැවැත් නුවර—**

එකත්පසෙක සිටි **කාමද** දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භාග්‍යවතුන් වහන්ස, (මහණදම් පිරීම) දුෂ්කර ය. භාග්‍ය-වතුන් වහන්ස, ඉතා දුෂ්කර ය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:

කාමද, ශීලයෙන් යුත් සවිරසවභාව ඇති ශෛක්‍ෂයෝ දුෂ්කර වූත් (මහණකම) කෙරෙත්. ගිහිගෙන් වෙන්බවට පැමිණියහුට සුව එළවන සතුට වේ.

භාග්‍යවතුන් වහන්ස, යම් ඒ සතුටෙක් වේ ද, (එය) දුලබ ය.

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක: කාමද,) යම් කෙනකුන්ගේ සිත දහවලුත් රෑත් භාවනායෙහි ඇලුනේ ද, සිත සංහිඳුවීමෙහි ඇලුනු (ඔහු) දුලබ වූත් සතුට ලබත්.

භාග්‍යවතුන් වහන්ස, යම් ඒ සිතෙක් වේ ද, එය එකඟ කිරීම දුෂ්කර ය.

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක: කාමද,) ඉඳුරන් දමනය කිරීමෙහි ඇලුනෝ එකඟ කිරීම දුෂ්කර වූත් සිත එකඟ කෙරෙත්. කාමදය, ඒ ආර්‍ය්‍යයෝ මරහුගේ දැල සිඳ ගෙණ යෙත්.

භාග්‍යවතුන් වහන්ස, මාර්ගය විෂම ය, ගමන දුෂ්කර ය.

[භගවත්හු:]

කාමදය, ආර්‍ය්‍යයෝ දුර්ගම වූත් විෂම වූත් මාර්ගයෙහි යෙත්. අනාර්‍ය්‍යයෝ විෂම මාර්ගයෙහි යටිකුරු වූ (නුවණ) හිස් ඇත්තාහු වැටෙත්. ආර්‍ය්‍යයන්ට මාර්ගය සම ය. ආර්‍ය්‍යයෝ විෂම සත්ත්වසමූහයා අතරෙහි සම වෙත් ම ය.

2. 1. 7.

පඤ්චාලචණ්ඩසුත්තං

88. **සාවත්ථියං**—

එකමන්තං ඨිතො ඛො **පඤ්චාලචණ්ඩො** දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සම්බාධෙ වත ඔකාසං අවින්දි භූරිමෙධසො,
යො ඣානමබුධා[1] බුද්ධො පටිලීනනිසභො මුනීති.

සම්බාධෙ වාපි වින්දන්ති[2] (**පඤ්චාලචණ්ඩාති** භගවා)
ධම්මං නිබ්බාණපත්තියා,
යෙ සතිං පච්චලත්ථංසු[3] සම්මා තෙ සුසමාහිතාති.

2. 1. 8.

තායනසුත්තං

89. **සාවත්ථියං**—

අථ ඛො **තායනො** දෙවපුත්තො පුරාණතිත්ථකරො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො තායනො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද[4] බ්‍රාහ්මණ,
නප්පහාය මුනී කාමෙ නෙකත්තමුපපජ්ජති.

කයිරා චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ,
සිථිලො හි පරිබ්බාජො භියේ‍යා ආකිරතෙ රජං.

අකතං දුක්කතං[5] සෙය්‍යො පච්ඡා තපති[6] දුක්කතං,
කතඤ්ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පති.

කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති,
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති.

යං කිඤ්චි සිථිලං කම්මං සංකිලිට්ඨඤ්ච යං වතං,
සංකස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලන්ති.

ඉදමවොච තායනො දෙවපුත්තො ඉදං වත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

---

1. ඣානමබුජ්ඣි - මජසං. ඣානමබුද්ධ - සයා. PTS. 2. පිවහිටඨහාති - සයා.
3. { පච්චලත්ථංසු - මජසං. PTS
{ පච්චලබ්භංසු - සයා. පච්චලද්ධංසු - සිමු
4. පනුද-සයා. 5. දුක්කටං - මජසං. සයා 6. 2. තප්පති - සයා.

2. 1. 7.

පඤ්චාලචණ්ඩ සූත්‍රය.

88. **සැවැත් නුවර—**

එකත්පසෙක සිටි **පඤ්චාලචණ්ඩ** දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

මාතය දුරු කළවුන්ට ශ්‍රේෂ්ඨ වූ යම් මුනිවරයෙක් ධ්‍යාන අවබෝධ කෙළේ ද, මහත් ප්‍රඥා ඇති ඒ බුදුරජ තෙමේ (නීවරණ) සම්බාධයෙහි ඒකාන්තයෙන් (ධ්‍යාන සඞ්ඛ්‍යාත) අවකාශය ලැබී ය.

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක: පඤ්චාලචණ්ඩය,) යම් කෙනෙක් නිවණට පැමිණීම පිණිස සිහිය ලැබුවාහු ද, ඔහු සම්බාධ ඇති කල්හි දු ධ්‍යාන ලබත්. ඔහු මනා කොට සමාහිත වූවෝ ය.

2. 1. 8.

තායන සූත්‍රය.

89. **සැවැත් නුවර—**

එකල්හි පැරණි තීර්ථකරයකු වූ මනා ජවිවණි ඇති **තායන** දෙව්-පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්-පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි තායන දෙවපුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය:

බමුණ, වීර්‍ය්‍යය කොට (තෘෂ්ණා) ශ්‍රොතස සිඳුව, කාමයන් දුරු කරව. මුනි තෙමේ කාමයන් පුහුන් නො කොට ධ්‍යානයට නො පැමිණේ.

ඉදින් කරන්නේ නම් මේ (වීර්‍ය්‍යය) කරන්නේ ය. මෙය දැඩි කොට කරන්නේ ය. ඒ එසේ මැයි, ලිහිල් ව ගත් පැවිද්ද බෙහෙවින් රජස් වගුරුවයි.

දුෂ්කෘතය නොකරණ ලද්දේ උතුම්, දුෂ්කෘතය පසු ව (එය කළහු)තවයි. යමක් කොට නො තැවේ ද, (එබඳු) සුකෘතය කරණ ලද්දේ උතුම්.

යම්සේ කුසතණ පත වරදවා ගත්තා ලද්දේ අත ම කපා ද, (එසෙයින්ම) වරදවා ගත්තා ලද මහණකම නිරයට අදියි.

යම්කිසි ලිහිල් කර්මයෙක් වේද, සකිලිටි වූ යම් ව්‍රතයෙකුත් වේද, සැක කටයුතු වූ බඹසරෙකුත් වේද, ඒ මහත්ඵල නො වේ.

තායන දෙව්පුත් තෙමේ මෙය කීය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වූයේ ය.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං තායනො නාම දෙවපුත්තො පුරාණතිත්ථකරො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො භික්ඛවෙ තායනො[1] දෙවපුත්තො මම සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

"ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ,
නප්පහාය මුනි කාමෙ නෙකත්තමුපපජ්ජති.

කයිරා චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ,
සිථිලො හි පරිබ්බාජො භිය්‍යො ආකිරතෙ රජන්ති.

අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං,
කතඤ්ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පති.

කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති,
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති.

යං කිඤ්චි සිථිලං කම්මං සඞ්කිලිට්ඨඤ්ච යං වතං,
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලන්ති."

ඉදමවොච තායනො දෙවපුත්තො, ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

උග්ගණ්හාථ භික්ඛවෙ, තායනගාථා. පරියාපුණාථ භික්ඛවෙ, තායනගාථා. ධාරෙථ භික්ඛවෙ, තායනගාථා. අත්ථසංහිතා භික්ඛවෙ, තායනගාථා. ආදිබ්‍රහ්මචරියිකාති.[2]

2. 1. 9.

චන්දිමසුත්තං.

90. සාවත්ථියං—

තෙන ඛො පන සමයෙන චන්දිමා දෙවපුත්තො රාහුනා අසුරින්දෙන ගහිතො හොති. අථ ඛො චන්දිමා දෙවපුත්තො භගවන්තං අනුස්සරමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි:

"නමො තෙ බුද්ධවීරත්ථු විප්පමුත්තොසි සබ්බධි,
සම්බාධපටිපන්නොස්මි තස්ස මෙ සරණං භවාති."

අථ ඛො භගවා චන්දිමං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාය අජ්ඣභාසි:

"තථාගතං අරහන්තං චන්දිමා සරණං ගතො,
රාහු චන්දං පමුඤ්චස්සු බුද්ධා ලොකානුකම්පකාති."

1. ඨිතො ඛො තායනො - සීමු. ස්‍යා. PTS. 2. චරියකා - ස්‍යා.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැය ඇවෑමෙන් භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, මේ රැය පැරණි තීර්ථකරයකු වූ මහා ජවිවණ් ඇති තායන නම් දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුළුවා මා වෙත එළඹියේ ය. එළඹ මට වැඳ එකත්පසෙක සිටියේ ය. මහණෙනි, එකත්පසෙක සිටි තායන දෙව්පුත් තෙමේ මා සමීපයෙහි මේ ගාථා කී ය:

බමුණ, වීර්‍ය්‍ය කොට (තෘෂ්ණා) ශ්‍රෝතස සිඳුව, කාමයන් දුරු කරව, මුනි තෙමේ කාමයන් ප්‍රහීණ නො කොට ධ්‍යානයට නො පැමිණේ.

ඉදින් කරන්නේ නම් මේ (වීර්‍ය්‍ය) කරන්නේ ය. මෙය දැඩි කොට කරන්නේ ය. ඒ එසේ මැයි. ලිහිල් ව ගත් පැවිද්ද බෙහෙවින් රජස් වගුරුවයි.

දුෂ්කෘතය නොකරණ ලද්දේ උතුම්. දුෂ්කෘතය පසුව (එය කළහු) තවයි. යමක් කොට නො තැවේ ද, (එබඳු) සුකෘතය කරණ ලද්දේ උතුම්.

යම්සේ කුසතණපත වරදවා ගන්නා ලද්දේ අත ම කපා ද, (එසෙයින් ම) වරදවා ගන්නා ලද මහණකම නිරයට අදියි.

යම් කිසි ලිහිල් කම්යෙක් වේද, සකිලිටි වූ යම් ව්‍රතයෙකුත් වේද, සැක කටයුතු වූ බඹසරෙකුත් වේද, ඒ මහත්ඵල නො වේ.

තායන දෙව්පුත් තෙමේ මෙය කී ය: මෙය කියා මට වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

මහණෙනි, තායන ගාථා උගණිවු. මහණෙනි, තායන ගාථා පිරිවහවු. මහණෙනි, තායන ගාථා දරවු. මහණෙනි, තායන ගාථා අර්ථසහිතයහ. මගබඹසරට මුල්වූවෝ ය.

2. 1 9.

චන්දිම සූත්‍රය.

90. සැවැත්නුවර—

එකල්හි සඳ දෙව්පුත් තෙමේ රාහු අසුරිඳු විසින් ගන්නා ලද්දේ වෙයි. එකල්හි සඳ දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සිහි කෙරෙමින් ඒ වේලාවෙහි මේ ගාථාව කීය:

"බුද්ධවීරයන් වහන්ස, මුබවහන්සේට නමස්කාර වේවා. සියලු තන්හි මිදුනේ වෙහි (මම) පීඩාවට පැමිණියෙම් වෙමි. ඒ මට පිහිට වනු මැනවි."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඳ දෙව්පුතු ඇරබ රාහු අසුරිඳුහට ගාථායෙන් වදාළ සේක.

"සඳ දෙව්පුත් තෙමේ අර්හත් වූ තථාගතයන් වහන්සේ සරණ ගියේ ය. එම්බා රාහු අසුරය, සඳ මුදව, බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝය."

අථ ඛො රාහු අසුරින්දො චන්දිමං දෙවපුත්තං මුඤ්චිත්වා තරමානරූපො යෙන **වෙපචිත්ති** අසුරින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි:

කින්නු සන්තරමානොව රාහු චන්දං පමුඤ්චසි,
සංවිග්ගරූපො ආගම්ම කින්නු භීතොව තිට්ඨසීති.

සත්තධා මෙ ඵලෙ මුද්ධා ජීවන්තො න සුඛං ලභෙ,
බුද්ධගාථාභිගීතොම්හි නො චෙ මුඤ්චෙය්‍ය චන්දිමන්ති.

2. 1. 10

සුරිය[1]සුත්තං.

91. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන **සුරියො**[1] දෙවපුත්තො රාහුනා අසුරින්දෙන ගහිතො හොති. අථ ඛො සුරියො[1] දෙවපුත්තො භගවන්තං අනුස්සරමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි:-

"නමො තෙ බුද්ධවීරත්‍ථු විප්පමුත්තොසි සබ්බධි,
සම්බාධපටිපන්නොස්මි තස්ස මෙ සරණං භවාති."

අථ ඛො භගවා සුරියං[1] දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාහි[2] අජ්ඣභාසි:-

"තථාගතං අරහන්තං සුරියො[1] සරණං ගතො,
රාහු සුරියං[1] පමුඤ්චස්සු බුද්ධා ලොකානුකම්පකාති.

යො අන්ධකාරෙ තමසි[3] පභඞ්කරො වෙරොචනො මණ්ඩලී උග්ගතෙජො,
මා රාහු ගිලී චරං අන්තලික්ඛෙ[4] පජං මම රාහු පමුඤ්ච සුරියන්ති."

අථ ඛො රාහු අසුරින්දො සුරියං[1] දෙවපුත්තං මුඤ්චිත්වා තරමානරූපො යෙන **වෙපචිත්ති** අසුරින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි:

"කින්නු සන්තරමානොව රාහු සුරියං පමුඤ්චසි,
සංවිග්ගරූපො ආගම්ම කින්නු භීතොව තිට්ඨසීති."

"සත්තධා මෙ ඵලෙ මුද්ධා ජීවන්තො න සුඛං ලභෙ,
බුද්ධගාථාභිගීතොම්හි නො චෙ මුඤ්චෙය්‍ය සුරියන්ති."

සුරියවග්ගො පඨමො

තත්‍රුද්දානං.

ද්වෙ කස්සපා ච මාඝො ච මාගධො දාමලි කාමදො,
පඤ්චාලචණ්ඩො තායනො චන්දිමසුරියෙන තෙ දසාති.

---

1. සූරිය - මජ්සං. 2. ගාථාය - ස්‍යා. 3. තමසි - මජ්සං. 4. චරමන්තලික්ඛෙ - මජ්සං.

ඉක්බිති රාහුඅසුරිඳු තෙමේ **සඳ**දෙව්පුතු මුදා වෙලෙවිසෑහැවි ඇත්තේ **වේපචිත්ති** අසුරිඳු වෙත එළඹියේ ය. එළඹ සංවේගයට පැමිණියේ හට ගත් ලොමුදහ ගැණුම් ඇත්තේ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි රාහු අසුරිඳු හට **වෙපචිත්ති** අසුරිඳු තෙමේ ගාථායෙන් කී ය.

එම්බා රාහුඅසුරය, කුමක් හෙයින් වෙලෙවිගති ඇතියකු මෙන් සඳ මිදුවෙහි ද? සංවෙගසවභාව ඇත්තේ අවුත් කුමක් හෙයින් බියවූවකු මෙන් සිටිහි ද?

බුඬගාථායෙන් අභිගීතයෙමි. ඉදින් සඳ නොමිදුයෙම් නම් මාගේ මුදුන සත්කඩකට පැලෙන්නේ ය. ජිවත් වන්නෙම් සැප නො ලබන්නෙමි.

2. 1. 10.

සූරිය සූත්‍රය.

91. **සැවැත්නුවර** -

එකල්හි **සිරු**දෙව්පුත් තෙමේ රාහුඅසුරිඳු විසින් ගන්නා ලද්දේ වෙයි. එකල්හි **සිරු**දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සිහි කෙරෙමින් ඒ වේලායෙහි මේ ගාථාව කී ය.

බුඬවීරයන් වහන්ස, මුබවහන්සේට නමසකාර වේවා. සියලු තන්හි මිදුනෙහි. මම පීඩාවට පැමිණියෙම් වෙමි. ඒ මට පිහිට වනු මැනව.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ **සිරු** දෙව්පුතු ඇරබ රාහු අසුරිඳු හට ගාථාවලින් වදාළ සේක.

එම්බා රාහුඅසුරය, **සිරු**දෙව්පුත් තෙමේ අභීත් වූ තථාගතයන් වහන්සේ සරණ ගියේ ය. **සිරු** දෙව්පුතු මුදව, බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝ ය.

එම්බා රාහුඅසුරය, යමෙක් ගනඳුරෙහි එළිය කරන්නේ ද, බබලන්නේ ද, මඬුලු සටහන් ඇත්තේ ද, උග්‍රතේජස් ඇත්තේ ද, අහසෙහි හැසිරෙණ එබඳු **සිරු** නො ගිලුව. එම්බා රාහුඅසුරය, මා දහම්පුත් **සිරු** මුදව.

ඉක්බිති රාහු අසුරිඳු තෙමේ **සිරු** දෙව්පුතු මුදා වෙලෙවිසැහැවි ඇත්තේ **වේපචිත්ති** අසුරිඳු වෙත එළඹියේ ය. එළඹ සංවේගයට පැමිණියේ හට ගත් ලොමුදහගැණුම් ඇත්තේ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි රාහුඅසුරිඳු හට **වෙපචිත්ති** අසුරිඳු තෙමේ ගාථායෙන් කී ය.

එම්බා රාහු, කුමක් හෙයින් වෙලෙවිගති ඇතියකු මෙන් **සිරු** මිදුවෙහි ද? සංවෙග සවභාව ඇත්තේ අවුත් කුමක් හෙයින් බිය වූවකු මෙන් සිටිහි ද?

බුඬගාථායෙන් අභිගීත (සඬායභාෂිත වශයෙන් වෙසෙසින් ගයන ලදුයෙම්) වෙමි. ඉදින් **සිරු** නො මිදුවෙම් නම් මාගේ මුදුන සත්කඩකට පැලෙන්නේ ය. ජිවත් වන්නෙම් සුව නො ලබන්නෙමි.

සූරිය වර්‍ගය පළමුවැනි යි.

එහි උද්දානය:

කස්සපසූත්‍ර දෙකය, මාඝ, මාගධ, දමලි, කාමද, පඤ්චාලචණ්ඩ, තායන, චන්දිම, සූරිය යි සූත්‍ර දශයෙකි.

2. අනාථපිණ්ඩිකවග්ගො.

2. 2. 1

චන්දිමසසුත්තං.

92. සාවත්ථියං—

අථ ඛො චන්දිමසො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො චන්දිමසො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

තෙ හි සොත්ථිං ගමිස්සන්ති කච්ඡෙවාමකසෙ මගා,
ඣානානි උපසම්පජ්ජ එකොදී නිපකා සතාති.

[භගවා:]

තෙ හි පාරං ගමිස්සන්ති ඡෙත්වා ජාලං ව අම්බුජො,
ඣානානි උපසම්පජ්ජ අප්පමත්තා රණඤ්ජහාති.

2. 2. 2.

වෙණ්හු[1]සුත්තං.

93. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො වෙණ්හු[1] දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සුඛිතා වත[2] තෙ මනුජා සුගතං පයිරුපාසිය,
යුඤ්ජං[3] ගොතම සාසනෙ අප්පමත්තානුසික්ඛරෙති.

යෙ මෙ පවුත්තෙ[4] සිවපදෙ[5] (වෙණ්හූති භගවා) අනුසික්ඛන්ති ඣායිනො,
කාලෙ තෙ අප්පමජ්ජන්තා න මච්චුවසගා[6] සියුන්ති.

2. 2. 3.

දීඝලට්ඨිසුත්තං.

94. සාවත්ථියං—

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ.

අථ ඛො දීඝලට්ඨි දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං වෙළුවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො දීඝලට්ඨි දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි[7]:

භික්ඛු සියා ඣායී විමුත්තචිත්තො ආකඞ්ඛෙ චෙ හදයස්සානුපත්තිං,
ලොකස්ස ඤත්වා උදයබ්බයඤ්ච සුචෙතසො අනිස්සිතො තදානිසංසොති.

---

1. වෙණ්බු - සයා. PTS. මජසං. 2. සුඛිතාව-මජසං. PTS. 3. යුඤ්ජ - සයා. 4. වුත්තෙ - සයා. 5. සටඨපදෙ – මජසං. 6. වසඞ්ගා - PTS. 7. භගවතො සන්තිකෙ. ඉමං ගාථං අභාසි – මජසං, සයා.

2. අනාථපිණ්ඩික වර්ගය.

2. 2. 1.

චන්දිමස සූත්‍රය.

92. **සැවැත්නුවර—**

එකල්හි චන්දිමස දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මනා ජවිවණ් ඇත්තේ, මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි චන්දිමස දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

ධ්‍යානයන්ට පැමිණීමෙන් එකඟසිත් ඇති වූ නීරණප්‍රඥ ඇති සිහි ඇති ඔහු මදුරුවන් නැති කැසෙක මුවන් මෙන් සෙතට පැමිණෙන්නාහු මය.

[භගවත්හු:]

ධ්‍යානයන් ලැබ නො පමාවන කෙලෙස් දුරලන ඔහු දූල සිඳ යන මස්කැල මෙන් පරතෙරට (නිවණට) පැමිණෙන්නාහු ම ය.

2. 2. 2.

වෙණ්හු සූත්‍රය.

93. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි වෙණ්හු දෙව්පුත් තෙමේ භාගංවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයේ ය:

(යම්) මිනිස් කෙනෙක් බුදුරජාණන් වහන්සේ පර්යුපාසනා කොට ගොයුම්සස්නෙහි යෙදෙන්නාහු නො පමාව හික්මෙත් ද, ඔහු ඒකාන්තයෙන් සුවපත් වූවෝ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක: එම්බා වෙණ්හු දේවපුත්‍රය, ධ්‍යාන කරණ යම් කෙනෙක් මා විසින් ප්‍රකාශ කරණ ලද අනුශාසනපදයෙහි සුදුසු කල්හි නොපමාවෙමින් හික්මෙද් ද, ඔහු මරුවසඟ වූවෝ නොවන්නාහ යි.

2. 2. 3.

දීඝලට්ඨි සූත්‍රය.

94. **සැවැත්නුවර—**

මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි** වැඩවසන සේක.

දීඝලට්ඨි දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මනාජවිවණ් ඇත්තේ, මුළු වේළුවනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත් පසෙක සිටි දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය:

මහණ තෙමේ ඉදින් හෘදයානුප්‍රාප්තිය (අර්හත්වය) කැමැති වන්නේ නම් ලොව පිළිබඳ උදයව්‍යය දැන ධ්‍යාන වඩන්නෙක්, මිදුනු සිතැත්තෙක්, (එසෙයින් ම) මනාසිතැත්තෙක්, (තෘෂ්ණාදෘෂ්ටීන්) අනිඃශ්‍රිතයෙක්, ඒ අර්හත්වය අනුසස් කොට ඇත්තෙක් වන්නේ ය.

2. 2. 4.

නන්දනසුත්තං.

95. සාවත්ථියං—

එකමන්තා ඨිතො ඛො නන්දනො දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ
අනාවටං භගවතො ඤාණදස්සනං
කථංවිධං සීලවන්තං වදන්ති,
කථංවිධං පඤ්ඤවන්තං[1] වදන්ති
කථංවිධො දුක්ඛමතිච්ච ඉරියති.[2]
කථංවිධං දෙවතා පූජයන්තීති.

[භගවා:]

යො සීලවා පඤ්ඤවා භාවිතත්තො
සමාහිතො ඣානරතො සතීමා,
සබ්බස්ස සොකා විගතා පහීණා
ඛීණාසවො අන්තිමදෙහධාරී.

තථාවිධං සීලවන්තං වදන්ති
තථාවිධං පඤ්ඤවන්තං[3] වදන්ති,
තථාවිධො දුක්ඛමතිච්ච ඉරියති
තථාවිධං දෙවතා පූජයන්තීති.

2. 2. 5.

චන්දනසුත්තං.

96. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො චන්දනො දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

කො සු[4] ධ තරතී ඔඝං රත්තින්දිවමතන්දිතො,
අප්පතිට්ඨෙ අනාලම්බෙ කො ගම්භීරෙ න සීදතීති.

[භගවා:]

සබ්බදා සීලසම්පන්නො පඤ්ඤවා සුසමාහිතො,
ආරද්ධවිරියො පහිතත්තො ඔඝං තරති දුත්තරං.

විරතො කාමසඤ්ඤාය රූපසඤ්ඤොජනාතිගො,
නන්දීරාගපරික්ඛීණො[5] සො ගම්භීරෙ න සීදතීති.

2. 2. 6.

වසුදත්තසුත්තං.[6]

97. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො වසුදත්තො[6] දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:-

---

1. භූරිපඤ්ඤං - PTS. 2. ඉරියති. - මජසං. ස්‍යා. PTS. 3. පඤ්ඤවන්තං - PTS
4. කථංසු - මජසං ස්‍යා, PTS. 5. නන්දිභව - සී 1. ස්‍යා - PTS. 6. සුදත්තසුත්තං-සීමු,2

2. 2. 4.

නන්දන සූත්‍රය.

95. සැවැත්නුවර—

එකත්පසෙක සිටි නන්දන දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

පතුල නුවණැති ගෞතමයන් වහන්ස, මුබවහන්සේ විචාරමි. භාග්‍යවතුන් වහන්සේගේ ඥානදර්ශනය ආවරණරහිත ය. කෙබන්දහු 'සිල්වතා 'යි කියද්ද? කෙබන්දහු නුවණැති යැ යි කියද්ද? කෙබඳු තැනැත්තේ දුක ඉක්ම විහරණය කෙරේ ද? කෙබන්දහු දෙවියෝ පුදද්ද?

[භගවත්හු:]

යමෙක් සිල්වත් ද, නුවණැත්තේ ද, වඩන ලද සිත් ඇත්තේ ද, සමාහිත වේ ද, ධ්‍යානයෙහි ඇලුනේ ද, සිහි ඇත්තේ ද, ඔහුගේ සියලු ශෝකයෝ පහ වූවාහු ද, ප්‍රහීණ වූවාහු ද, ක්ෂීණ වූ කෙලෙස් ඇත්තේ ද, අන්තිම සිරුර දරණු-හුවූ වේ ද, එබන්දහු සිල්වතා යි කියත්. එබන්දහු නුවණැතියැ යි කියත්. එබඳු තැනැත්තේ දුක ඉක්ම විහරණ කෙරේ. එබන්දහු දෙවියෝ පුදති.

2. 2. 5.

චන්දන සූත්‍රය.

96. සැවැත්නුවර—

එකත්පසෙක සිටි චන්දන දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

මෙහි කවරෙක් රෑදෙවෙහි අතලස්ව චතුරෝඝය තරණය කෙරේ ද? කවරෙක් (යට) පිහිටක් නැති (මතුයෙහි) එල්බීමක් නැති ගැඹුරෙහි නො ගිලේ ද?

[භගවත්හු:]

හැම කල්හි සිල්වත් වූ, නුවණැති, එකඟසිත් ඇති, ඇරඹූ වෙර ඇති, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති පුහුල් තෙමේ තරණය කිරීමට දුෂ්කර වූ චතු-රෝඝය තරණය කෙරෙයි.

කාමසංඥයෙන් වැළකුනු රූපසංයෝජන ඉක්ම ගිය ක්ෂීණ වූ නන්දි-රාගය ඇති හෙ තෙමේ ගැඹුරෙහි නො ගිලේ.

2. 2. 6.

වසුදත්ත සූත්‍රය.

97. සැවැත්නුවර—

එකත්පසෙක සිටි වසුදත්ත දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සත්තියා විය ඔමට්ඨො ඩය්හමානොව[1] මත්ථකෙ,
කාමරාගප්පහාණාය සතො භික්ඛු පරිබ්බජෙති.

[භගවා:]

සත්තියා විය ඔමට්ඨො ඩය්හමානොව මත්ථකෙ,
සක්කායදිට්ඨිප්පහාණාය සතො භික්ඛු පරිබ්බජෙති.

2. 2. 7.

සුබ්‍රහ්මසුත්තං.

98. **සාවත්ථියං**—

එකමන්තං ඨිතො බො **සුබ්‍රහ්මා** දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

නිච්චං උත්‍රස්තමිදං චිත්තං නිච්චං උබ්බිග්ගමිදං මනො
අනුප්පන්නෙසු කිච්ඡෙසු[2] අථො උප්පතිතෙසු ච
සචෙ අත්ථි අනුත්‍රස්තං තංමෙ අක්ඛාහි පුච්ඡිතො ති.

[භගවා:]

නාඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගා තපසා[3] නාඤ්ඤත්‍ර ඉන්ද්‍රියසංවරා,[4]
නාඤ්ඤත්‍ර සබ්බනිස්සග්ගා[5] සොත්ථිං පස්සාමි පාණිනන්ති.[6]

2. 2. 8.

කකුධසුත්තං.

99. **සාවත්ථියං**—

එවං මෙ සුතං එකං සමයං භගවා **සාකෙතෙ** විහරති **අඤ්ජනවනෙ** මිගදායෙ. අථ බො **කකුධො** දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං අඤ්ජනවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො බො කකුධො දෙවපුත්තො භගවන්තං එතදවොච:

නන්දසි සමණාති? කිං ලද්ධා ආවුසොති? තෙන හි සමණ සොචසීති? කිං ජීයිත්ථ ආවුසොති? තෙන හි සමණ නෙව නන්දසි නෙව[7] සොචසීති? එවමාවුසොති.

කච්චි ත්වං අනඝො[8] භික්ඛු කච්චි නන්දි[9] න විජ්ජති,
කච්චි තං එකමාසීනං අරති නාභිකීරතීති.

[භගවා:]

අනීඝො[8] වෙ අහං යක්ඛ අථො නන්දි න විජ්ජති,
අථො මං එකමාසීනං[10] අරති නාභිකීරතීති.

---

1. ඩය්හමානොව - සයා 2. කිච්චෙසු - සීමු 1. සයා. PTS. 3. බොජ්ඣා තපසා - මජසං.
4. නාඤ්ඤත්‍රින්ද්‍රියසංවරා - මජසං. 5. සබ්බනිස්සග්ගා - සී 1. 6. ඉදමවොච -පෙ- තත්ථෙවන්තරධායීති. මජසං. සයා 7. නච - මජසං PTS. 8 අනිඝො - සීමු. 2.
9. අථො නන්දි - PTS. 10. මමෙකමාසීනං - සයා.

සැතෙකින් පහර ලද්දකු මෙන් ද, හිසෑ දැවෙන්නකු මෙන් ද, මහණ තෙමේ කාමරාග ප්‍රහාණය පිණිස සිහි ඇති ව වෙසෙන්නේ ය.

[භගවත්හු:]

සැතෙකින් පහර ලද්දකු මෙන් ද, හිසෑ දැවෙන්නකු මෙන් ද මහණ තෙමේ සත්කායදෘෂ්ටි ප්‍රහාණය පිණිස සිහි ඇති ව වෙසෙන්නේ ය.

2. 2. 7.

සුබ්‍රහ්ම සූත්‍රය.

88. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි **සුබ්‍රහ්ම** දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

නූපන් දුක් නිමිති කොට ද, උපදුනු දුක් නිමිති කොට ද, මේ සිත නිතර තැති ගත්තේ ය. මේ සිත නිතර බියෙන් සැලුනේ ය. මා විසින් විචාරණ ලද්දෙහි. ඉදින් නොතැති ගත් සිතක් ඇත් නම් එය වදාරණු මැනව.

[භගවත්හු:]

බොජ්ඣඞ්ග භාවනාව හැර තපෝගුණය හැර ඉන්ද්‍රියසංවරය හැර නිවන් හැර සත්ත්වයන්ට සුවයක් නො දකිමි.

2. 2. 8.

කකුධ සූත්‍රය.

99. **සැවැත්නුවර—**

මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සාකේත** නුවර සමීපයෙහි **අඳුන්වන** නම් වූ මුවවෙනෙහි වැඩවසන සේක. එකල්හි මනා ජවිවණ් ඇති **කකුධ** දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු අඳුන්වනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි කකුධ දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය:

ශ්‍රමණයන් වහන්ස, සතුටු වහු ද? ඇවැත්නි, කුමක් ලැබ ද? එසේ නම් ශ්‍රමණයන් වහන්ස, ශෝක කරහු ද? ඇවැත්නි, කුමක් දිරා ගියේ ද? ශ්‍රමණයන් වහන්ස, එසේ නම් නො ම සතුටු වහු ද? නො ම ශෝක කරහු ද? ඇවැත්නි, එසේ ය.

ශ්‍රමණයන් වහන්ස, කිම, මුඹවහන්සේ නිදුක් ද? කිම, ඇල්මෙක් නැද්ද? කිම, අරතිය හුදෙකලා ව හුන් මුඹවහන්සේ නො මඩී ද?

[භගවත්හු:]

යක්‍ෂය, ඒකාන්තයෙන් මම නිදුක් වෙමි. ඇල්මෙකුත් නැත. තව ද, අරතිය එකලා ව හුන් මා නො මඩියි.

[දෙවපුත්තො:]

කථං ත්වං අනඝො[1] භික්ඛු කථං නන්දී න විජ්ජති,
කථං තං එකමාසීනං අරතී නාභිකීරතීති.

[භගවා:]

අඝජාතස්ස වෙ නන්දී නන්දීජාතස්ස වෙ අඝං,
අනන්දී අනඝො[1] භික්ඛු එවං ජානාහි ආවුසොති.

[දෙවපුත්තො:]

චිරස්සං වත පස්සාමි[2] බ්‍රාහ්මණං පරිනිබ්බුතං,
අනන්දිං අනඝං භික්ඛුං තිණ්ණං ලොකෙ විසත්තිකන්ති.

2. 2. 9.

උත්තරසුත්තං.

100. රාජගහෙ—

එකමන්තං ඨිතො ඛො උත්තරො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා,
එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානීති.

[භගවා:]

උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා,
එතං භයං මරණෙ පෙක්ඛමානො ලොකාමිසං පජහෙ සන්තිපෙක්ඛොති.

2. 2. 10.

අනාථපිණ්ඩිකසුත්තං.

101. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො අනාථපිණ්ඩිකො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

ඉදං හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං,
ආවුත්ථං ධම්මරාජෙන පීතිසඤ්ජනනං මම.

කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා.

තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති.

---

1. අනීඝො - සීමු2. 2. පස්සාම - සී. 1, 2,

[දෙව්පුත්:]

ශ්‍රමණයන් වහන්ස, මුඹවහන්සේ කෙසේ නිදුක් සේක් ද? ඇල්මෙක් කෙසේ නො වේ ද? අරතිය එකලා ව හුන් මුඹවහන්සේ කෙසේ නො මඩී ද?

[භගවත්හු:]

හටගත් දුක් (වටදුක්) ඇත්තහුට ඒකාන්තයෙන් ඇල්ම වේ. හටගත් ඇල්ම ඇත්තහුට ඒකාන්තයෙන් දුක වේ. ඇවැත්නි, මහණ තෙමේ ඇලුම් නැත්තේ ය, දුක් නැත්තේ ය සි මෙසේ දනුව.

[දෙව්පුත්:]

ලොව තෘෂ්ණාව තරණය කළ ඇලුම් නැති දුක් නැති පිරිනිවි බාහිතපාපී වූ මහණකු ඒකාන්තයෙන් කලෙකින් දකිමි.

2. 2. 9.

උත්තර සූත්‍රය.

100: **රජගහනුවර—**

එකත්පසෙක සිටි **උත්තර** දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

ජීවිතය (මරණය කරා) පමුණුවනු ලැබේ. ආයුෂ සවල්ප ය. ජරාව විසින් මරණය කරා පමුණුවන ලද්දහුට පිහිට වීමට රක්‍ෂාස්ථාන නැත. මේ (ත්‍රිවිධ) බිය මරණයෙහි ලා දක්නේ සුව ඵලවත්නා වූ පින් කරන්නේ ය.

[භගවත්හු:]

ජීවිතය මරණය කරා පමුණුවනු ලැබේ. ආයුෂ සවල්ප ය. ජරාව විසින් (මරණය කරා) පමුණුවන ලද්දහුට පිහිට වීමට රක්‍ෂාස්ථාන නැත. මේ (ත්‍රිවිධ) බිය මරණයෙහි ලා දක්නා වූ නිවණ පතන පුද්ගල තෙමේ ලොකාමිෂය දුරු කරන්නේ ය.

2. 2. 10.

අනාථපිණ්ඩික සූත්‍රය.

101. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි **අනාථපිණ්ඩික** දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කී ය:

භික්‍ෂුසමූහයා විසින් නිති සෙවුනාලද ධර්මරජන්වූ බුදුරජානන් වහන්සේ විසින් විසුම් ගන්නා ලද තෙල ප්‍රසිද්ධ ජේතවනය මට ප්‍රීති උපදවන්නේ ම ය.

කර්මය ද විද්‍යාව ද ධර්මය ද උතුම් සිල්වත් ජීවිතය ද (යන) මෙයින් සත්ත්වයෝ පිරිසිදු වෙත්. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් හෝ පිරිසිදු නො වෙත්.

එහෙයින් ම නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ නුවණින් සමාධිපාක්‍ෂිකධර්ම වඩන්නේ ය. මෙසේ ඒ ආර්‍ය්‍යමාර්ගය හේතු කොට පිරිසිදු වෙයි.

සාරිපුත්තොව පඤ්ඤාය සීලෙන උපසමෙන[1] ච,
යොපි පාරගතො[2] භික්ඛු එතාව පරමො සියාති.

ඉදමවොච **අනාථපිණ්ඩිකො** දෙවපුත්තො. ඉදං වත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.[3]

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි. ඉමං භික්ඛවෙ රත්තිං අඤ්ඤතරො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ සො දෙවපුත්තො මම සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

"ඉදං හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං,
ආවුත්ථං ධම්මරාජෙන පීතිසඤ්ජනනං මම.

කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා.

තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති.

සාරිපුත්තොව පඤ්ඤාය සීලෙන උපසමෙන ච,
යොපි පාරගතො[2] භික්ඛු එතාව පරමො සියා"ති.

ඉදමවොච භික්ඛවෙ සො දෙවපුත්තො ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

එවං වුත්තෙ ආයස්මා **ආනන්දො** භගවන්තං එතදවොච: සො හි නූන භන්තෙ **අනාථපිණ්ඩිකො** දෙවපුත්තො භවිස්සති. අනාථපිණ්ඩිකො ගහපති ආයස්මන්තෙ **සාරිපුත්තෙ** අභිප්පසන්නො අහොසීති.

සාධු සාධු ආනන්ද යාවතකං ඛො ආනන්ද තක්කාය පත්තබ්බං අනුප්පත්තං[4] තයා. අනාථපිණ්ඩිකො හි සො ආනන්ද දෙවපුත්තොති.

අනාථපිණ්ඩිකවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

චන්දිමසො ච වෙණ්හු ච දීඝලට්ඨි ච නන්දනො
චන්දනො වසුදත්තො ච සුබ්‍රහ්මා කකුධෙන ච,
උත්තරො නවමො වුත්තො දසමො අනාථපිණ්ඩිකොති.

---

1. සීලෙනුපසමෙන - PTS, සී 2.
2. පාරඞ්ගතො - මජ්සං, PTS
3. ධායීති - සීමු. 2. සතා.
4. අනුප්පත්තං තං - මජ්සං

ප්‍රඥයෙන් ද ශීලයෙන් ද ව්‍යුපශමයෙන් ද ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ම (උතුම්හ.) පරතෙරට (=නිවණට) පැමිණි යම් මහණෙක් වේ නම් එහි මේ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ම පරම වන්නාහ. (සැරියුත් තෙරනුවනට වඩා උත්තරයෙක් නැත.)

අනේපිඩු දෙව්පුත් තෙමේ මෙය කී ය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය. ඉක්බිති භාග්‍ය-වතුන් වහන්සේ ඒ රැය ඇවෑමෙන් භික්‍ෂූන් ඇමතූ සේක: මහණෙනි, මේ රාත්‍රියෙහි මනා ජවිවණ් ඇති එක්තරා දේවපුත්‍රයෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා මා වෙත එළඹියේ ය. එළඹ මා වැඳ එකත්පසෙක සිටියේ ය. මහණෙනි, එකත්පසෙක සිටි ඒ දෙව්පුත් තෙමේ මා සමීපයෙහි මේ ගාථා කී ය:

භික්‍ෂුසමූහයා විසින් නිති සෙවිනා ලද ධම්රජන් වූ බුදුරජාතන් වහන්සේ විසින් විසුම් ගන්නා ලද තෙල ප්‍රසිද්ධ ජේතවනය මට ප්‍රීති උපදවන්නේ ම ය.

කම්ය ද විද්‍යාව ද ධම්ය ද උතුම් සිල්වත් ජීවිතය ද (යන) මෙයින් සත්ත්වයෝ පිරිසිදු වෙත්. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් පිරිසිදු නො වෙත්.

එහෙයින් ම නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ නුවණින් සම්‍යක්ප්‍රාඥපාක්‍ෂිකධම් විඩින්නේ ය. මෙසේ ඒ ආයර්‍යමාගීය හේතු කොට පිරිසිදු වෙයි.

ප්‍රඥයෙන් ද ශීලයෙන් ද ව්‍යුපශමයෙන් ද ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ම (උතුම්හ.) පරතෙරට (=නිවණට) පැමිණි යම් මහණෙක් වේ නම් එහි මේ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ම පරම වන්නාහ: (සැරියුත් තෙරනුවනට වඩා විශිෂ්ටයෙක් නැත.)

මහණෙනි, ඒ දෙව්පුත් තෙමේ මෙය කීය. මෙය කී යා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, හෙ තෙමේ ඒකාන්තයෙන් අනාථපිණ්ඩික දෙව්පුත් වන්නේ ය. අනේපිඩු ගැහැවි තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කෙරෙහි බෙහෙවින් පැහැදුනේ වී ය යි මෙය සැළ කෙළේ ය.

ආනන්ද, මැනවි, මැනවි, ආනන්ද, යම්තාක් තර්කයෙන් දත යුතු නම් තොප විසින් (ඒතාක්) දන්නා ලදී. ආනන්ද, හෙ තෙමේ අනාථපිණ්ඩික දෙව්පුත් තෙමේ ම ය යි.

අනාථපිණ්ඩිකවර්ගය දෙවැනි යි.

එහි උද්දානය:

චන්ද්‍රිමස, වෙණ්ඩු, දීඝලට්ඨි, නන්දන, චන්දන, වසුදත්ත, සුබ්‍රහ්ම, කකුධ සූත්‍රය, නවවන උත්තර සූත්‍රය, දසවන අනාථපිණ්ඩික සූත්‍රය යි කියන ලදී.

3. නානාතිත්ථියවග්ගො.

2. 3. 1.

සිවසුත්තං.

102. එවං මෙ සුතං එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ

අථ ඛො **සිවො** දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සිවො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සෙය්‍යො හොති න පාපියො.

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය පඤ්ඤා ලබ්භති නාඤ්ඤතො.

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සොකමජ්ඣෙ න සොචති.

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය ඤාතිමජ්ඣෙ විරොචති

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සත්තා ගච්ඡන්ති සුගතිං.

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සත්තා තිට්ඨන්ති සාතතං.

අථ ඛො භගවා සිවං දෙවපුත්තං ගාථාය පච්චභාසි:

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සබ්බදුක්ඛා පමුච්චතීති.

3. නානාතිත්ථිය වර්ගය.

2. 3. 1.

සිව සූත්‍රය.

102. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක.

එකල්හි මනා ජවිවණ් ඇති **සිව** දෙව්පුත් තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සිව දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කී ය:

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන (සිටියහුට) අභිවෘද්ධියෙක් වෙයි. පිරිහීමෙක් නො වෙයි:

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන් ගේ සද්ධර්මය දැන (සිටියහුට) ප්‍රඥාව ලැබෙයි. අනෙකෙකින් නො ලැබෙයි.

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන් ගේ සද්ධර්මය දැන (සිටියේ) ශෝක කාරණයන් මැද ශෝක නො කෙරේ.

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන (සිටියේ) නෑයන් මැද වෙසෙසින් බබලයි.

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන (සිටි) සත්ත්වයෝ සුගතියට යෙත්.

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන (ගත්) සත්ත්වයෝ බොහෝ කල් සුවසේ සිටිත්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිව දෙව්පුත්හට ගාථායෙකින් වදාළ සේක.

සත්පුරුෂයන් සමග ම එක්වන්නේ ය. සත්පුරුෂයන් සමග ම මිත්‍ර සන්ථවය කරන්නේ ය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන (සිටියේ) සියලු දුකින් මිදෙයි.

2. 3. 2.

ඛෙමසුත්තං.

103. **සාවත්ථියං**—

එකමන්තං ඨිතො ඛො ඛෙමො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

චරන්ති බාලා දුම්මෙධා අමිත්තෙනෙව අත්තනා,
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං.

න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති,
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවති.

තඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති,
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවතීති.

[භගවා:]

පටිගච්චෙව[1] තං කයිරා යං ජඤ්ඤා හිතමත්තනො,
න සාකටිකචින්තාය මන්තා ධීරො පරක්කමෙ.

යථා සාකටිකො පත්ථං[2] සමං හිත්වා මහාපථං,
විසමං මග්ගමාරුය්හ අක්ඛච්ඡින්නොව ඣායති.

එවං ධම්මා අපක්කම්ම අධම්මමනුවත්තිය,
මන්දො මච්චුමුඛං පත්තො අක්ඛච්ඡින්නොව ඣායතීති.

2. 3. 3.

සෙරිසුත්තං

104. **සාවත්ථියං**—

එකමන්තං ඨිතො ඛො සෙරී දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

අන්නමෙවාභිනන්දන්ති උභයෙ දෙවමානුසා,
අථ කො නාම සො යක්ඛො යං අන්නං නාභිනන්දතීති.

[භගවා:]

යෙ නං දදන්ති සද්ධාය විප්පසන්නෙන චෙතසා,
තමෙව අන්නං භජති අස්මිං ලොකෙ පරම්හි ච.

තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ යාවසුභාසිතමිදං භන්තෙ භගවතා:

---

1 පටිකච්චෙව-මජසං, සයා, PTS. 2. මට්ඨං-මජසං, පසත්ථං - සයා. යථා සාකටිකො නාම මිලින්දපඤ්හ.

2. 3. 2.

ඛෙම සූත්‍රය.

103 සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඛෙම දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කී ය.

නුවණ නැති බාලයෝ යම් කර්‍මයක් තපුරු විපාක ඇත්තේ වේ නම් එබඳු අකුශලකර්‍ම කෙරෙමින් තමතට සතුරකු මැනි වූ පඤ්චස්කන්ධයෙන් යුක්ත ව හැසිරෙත්.

යම් කර්‍මයක් කොට තැවේ ද? යම් කර්‍මයක්හුගේ විපාකය කඳුළෙන් තෙත් මුහුණු ඇති ව හඬමින් සෙවුනේ ද, එබඳු අකුශලකර්‍ම කරණ ලද්දේ නො මැනවි.

යම් කර්‍මයක් කොට නො තැවේ ද? යම් කර්‍මයක්හුගේ විපාකය පිණා ගියේ මනාසිතැතියේ සෙවුනේ ද, එබඳු කර්‍මය කරණ ලද්දේ මැනවි.

[භගවත්හු:]

යමක් තමහට හිතයයි දන්නේ නම් එය පළමු කොට ම කරන්නේ ය. නුවණැති ධෘතිසම්පන්න පුද්ගල තෙමේ සාකටිකචෙතනායෙන් නැත් නො කරන්නේ ය.

ගැල්කරු තෙමේ යම්සේ සම මඟ වූ මහමඟ හැර විෂම මඟට නැඟී සුන් අකුරු ඇත්තේ බලවත් සිතිවිලි සිතා ද,

මඳ නුවණැති පුද්ගල තෙමේ එපරිද්දෙන් දහමින් ඉවත් ව අධර්‍මයට බැස ගෙණ මරුමුවට පැමිණියේ සුන් අකුරු ඇත්තකු මෙන් සිතිවිලි සිතයි.

2. 3. 3.

සෙරී සූත්‍රය.

104. සැවත්නුවර—

1. එකත්පසෙක සිටි සේරී දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

දෙව්මිනිස් දෙකොටස ආහාරය ම පතත්. යම්හෙයෙකින් ආහාරය නො පතා නම් ඒ කවර නම් සත්ත්වයෙක් ද?

[භගවත්හු:]

යම් කෙනෙක් පහන් සිතින් සැදැහැයෙන් ඒ ආහාරය දෙත් ද, මෙලෙව්හි ද පරලෙව්හි ද ආහාරය ඔහු ම සෙවුනේ ය.

එහෙයින් මසුරුමල මැඩලන සුලු වූයේ මසුරුකම දුරු කොට දන් දෙන්නේ ය. පින් සත්ත්වයන්ට පරලොව පිහිට වේ.

වහන්ස, ආශ්චර්‍ය්‍යයෙකි. වහන්ස, අද්භූතයෙකි. වහන්ස, මේය භාග්‍යවතුන් වහන්සේ විසින් ඉතා මැනවින් වදාරණ ලද්දේ ම ය:

"යෙ තං දදන්ති සද්ධාය විප්පසන්නෙන චෙතසා,
තමෙව අන්නං භජති අස්මිං ලොකෙ පරම්හි ච.

තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති."

භූතපුබ්බාහං භන්තෙ සෙරී නාම රාජා අහොසිං දායකො දානපති දානස්ස වණ්ණවාදී. තස්ස මය්හං භන්තෙ චතුසු[1] ද්වාරෙසු දානං දීයිත්ථ සමණබ්‍රාහ්මණකපණද්ධික වණිබ්බකයාචකානං. අථ ඛො මං භන්තෙ ඉත්ථාගාරං උපසඞ්කමිත්වා එතදවොච: දෙවස්සෙව[2] ඛො දානං දීයති අම්හාකං දානං න දීයති, සාධු මයම්පි දෙවං නිස්සාය දානානි දදෙය්‍යාම පුඤ්ඤානි කරෙය්‍යාමාති.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: අහං ඛොස්මි දායකො දානපති දානස්ස වණ්ණවාදී. දානං දස්සාමීති වදන්තානං[3] කින්ති වදෙය්‍යන්ති. සො ඛ්වාහං භන්තෙ පඨමං ද්වාරං ඉත්ථාගාරස්ස අදාසිං. තත්ථ ඉත්ථාගාරස්ස දානං දීයිත්ථ, මම දානං පටික්කමි.

අථ ඛො මං භන්තෙ ඛත්තියා අනුයුත්තා[4] උපසඞ්කමිත්වා මං එතදවොචුං. දෙවස්ස ඛො දානං දීයති, ඉත්ථාගාරස්ස දානං දීයති, අම්හාකං දානං න දීයති. සාධු මයම්පි දෙවං නිස්සාය දානානි දදෙය්‍යාම, පුඤ්ඤානි කරෙය්‍යාමාති.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: අහං ඛොස්මි දායකො දානපති දානස්ස වණ්ණවාදී. දානං දස්සාමීති වදන්තානං[3] කින්ති වදෙය්‍යන්ති. සො ඛ්වාහං භන්තෙ, දුතියං ද්වාරං[6] ඛත්තියානං අනුයුත්තානං[7] අදාසිං. තත්ථ ඛත්තියානං අනුයුත්තානං දානං දීයිත්ථ. මම දානං පටික්කමි.

අථ ඛො මං භන්තෙ බලකායො උපසඞ්කමිත්වා එතදවොච: දෙවස්ස ඛො දානං දීයති. ඉත්ථාගාරස්ස දානං දීයති. ඛත්තියානං අනුයුත්තානං[7] දානං දීයති. අම්හාකං දානං න දීයති. සාධු මයම්පි දෙවං නිස්සාය දානානි දදෙය්‍යාම, පුඤ්ඤානි කරෙය්‍යාමාති.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: අහං ඛොස්මි දායකො දානපති දානස්ස වණ්ණවාදී. දානං දස්සාමීති වදන්තානං[3] කින්ති වදෙය්‍යන්ති. සො ඛ්වාහං භන්තෙ තතියං ද්වාරං බලකායස්ස අදාසිං. තත්ථ බලකායස්ස දානං දීයිත්ථ. මම දානං පටික්කමි.

අථ ඛො මං භන්තෙ, බ්‍රාහ්මණගහපතිකා උපසඞ්කමිත්වා එතදවොචුං දෙවස්ස ඛො දානං දීයති. ඉත්ථාගාරස්ස දානං දීයති. ඛත්තියානං අනුයුත්තානං[7] දානං දීයති. බලකායස්ස දානං දීයති. අම්හාකං දානං න දීයති. සාධු මයම්පි දෙවං නිස්සාය දානානි දදෙය්‍යාම. පුඤ්ඤානි කරෙය්‍යාමාති.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: අහං ඛොස්මි දායකො දානපති දානස්ස වණ්ණවාදි. දානං දස්සාමීති වදන්තාන[3] කින්ති වදෙය්‍යන්ති. සො ඛ්වාහං භන්තෙ චතුත්ථං ද්වාරං බ්‍රාහ්මණගහපතිකානං අදාසිං. තත්ථ බ්‍රාහ්මණගහපතිකානං දානං දීයිත්ථ, මම දානං පටික්කමි.

1. චතුසු. - මජසං, 2. දෙවස්ස ඛො-මජසං, PTS. සආ, 3. වදන්තාන කත්ථචි - සීමු 2. PTS
4. අනුයන්තා - මජසං. 5. වදන්තා කත්ථචි. 6. දුතියද්වාරං. - සආ.
7. අනුයන්තානං- මජසං.

"යම් කෙනෙක් පහන් සිතින් සැදැහැයෙන් ඒ ආහාරය දෙත් ද, මෙලෙව්හි ද පරලෙව්හි ද ආහාරය ඔහු ම සෙවුනේ ය.

එහෙයින් මසුරුමල මැඩලනසුළු වූයේ මසුරුකම දුරු කොට දන් දෙන්නේ ය. පින් සත්ත්වයන්ට පරලොව පිහිට වේයි" යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ඉතා මැනවින් වදාරණ ලද්දේ ම ය.

පෙර වූවක් කියමි. වහන්ස, මම දායක වූ දානපති වූ දීමෙහි ගුණ කියන සේරී නම් රජෙක් වීමි. වහන්ස, ඒ මාගේ (නුවර) සිවු දොරටුවෙහි මහණ බමුණු දුගී මඟී වණිබ්බක යාචකයන්ට දන් දෙනු ලැබී ය. වහන්ස, එකල්හි අන්තඃපුරය මාවෙත එළඹ "දේවයන් වහන්සේගේ දන් ම දෙනු ලැබේ. අපගේ දන් නොදෙනු ලැබේ. අපි ද දේවයන් වහන්සේ නිසා දන් දෙන්නමෝ නම් පින් කරන්නමෝ නම් මැනවැ"යි මෙය කී ය.

වහන්ස, ඒ මට "මම වනාහි දානපති වූ දීමෙහි ගුණ කියන දායකයෙක්මි. දන් දෙන්නෙමු යි කියනුවනට කුමක් කියන්නෙම් දැ"යි මේ අදහස විය. වහන්ස, ඒ මම පළමු වන දොරටුව අන්තඃපුරයට දිනිමි. එහි ඇතොවුරන්ගේ දන් දෙනු ලැබී ය. මාගේ දානය වැළකුණේ ය.

වහන්ස, ඉක්බිති සහකාර ක්‍ෂත්‍රියයෝ මා වෙත එළඹ "දේවයන් වහන්සේගේ දන් දෙනු ලැබේ. අන්තඃපුරයාගේ දන් දෙනු ලැබේ. අපගේ දන් නො දෙනු ලැබේ. අපි ද දේවයන් වහන්සේ නිසා දන් දෙන්නමෝ නම් පින් කරන්නමෝ නම් මැනවැ" යි මෙය මට කීහ.

වහන්ස, ඒ මට "මම වූ කලි දානපති වූ දීමෙහි ගුණ කියන දායකයෙක්මි, දන් දෙන්නෙමු යි කියනුවනට කුමක් කියන්නෙම් දැ"යි මේ අදහස විය. වහන්ස, ඒ මම දෙවන දොරටුව සහකාර ක්‍ෂත්‍රියයන්ට දිනිමි. එහි සහකාර ක්‍ෂත්‍රියයන්ගේ දන්දෙනු ලැබී ය. මගේ දානය වැළකුණේ ය.

වහන්ස, ඉක්බිති බලසෙනඟ මා වෙත එළඹ "දේවයන් වහන්සේගේ දන් දෙනු ලැබේ. අන්තඃපුරයාගේ දන් දෙනු ලැබේ. සහකාර ක්‍ෂත්‍රියයන්ගේ දන් දෙනු ලැබේ. අපගේ දන් නො දෙනු ලැබේ. අපි ද දේවයන් වහන්සේ නිසා දන් දෙන්නමෝ, පින් කරන්නමෝ නම් මැනවැ"යි මෙය කීහ

වහන්ස, ඒ මට "මම වූ කලි දානපති වූ දීමෙහි ගුණ කියන දායකයෙක්මි. දන් දෙන්නෙමු යි කියනුවනට කුමක් කියන්නෙම් දැ"යි මේ අදහස විය. වහන්ස, ඒ මම තෙවන දොරටුව බලසෙනඟට දිනිමි. එහි බලසෙන්හුගේ දන් දෙනු ලැබී ය. මගේ දානය වැළකුණේ ය.

වහන්ස, ඉක්බිති බමුණු ගැහැවියෝ මා වෙත එළඹ "දේවයන් වහන්සේගේ දන් දෙනු ලැබේ. අන්තඃපුරයාගේ දන් දෙනු ලැබේ. සහකාර ක්‍ෂත්‍රියයන්ගේ දන්දෙනු ලැබේ. බලසෙන්හුගේ දන් දෙනු ලැබේ. අපගේ දන් නොදෙනු ලැබේ. අපි ද දේවයන් වහන්සේ නිසා දන් දෙන්නමෝ නම්, පින් කරන්නමෝ නම් මැනවැ"යි මෙය කීහ.

වහන්ස, ඒ මට "මම වූ කලි දානපති වූ දීමෙහි ගුණ කියන දායකයෙක්මි. දන් දෙන්නෙමු යි කියනුවනට කුමක් කියන්නෙම් දැ"යි මේ අදහස විය. වහන්ස, ඒ මම සිවුවන දොරටුව බමුණු ගැහැවියන්ට දිනිමි. එහි බමුණු ගැහැවියන්ගේ දන් දෙනු ලැබී ය. මගේ දානය වැළකුණේ ය.

අථ ඛො මං භන්තෙ පුරිසා උපසඞ්කමිත්වා එතදවොචුං: න ඛො දානි දෙවස්ස කොචි දානං දීයතීති.

එවං වුත්තෙ[1]හං භන්තෙ තෙ පුරිසෙ එතදවොචං: තෙන හි භණෙ යො බාහිරෙසු ජනපදෙසු ආයො සඤ්ජායති, තතො උපඩ්ඪං අන්තෙපුරෙ[2] පවෙසෙථ, උපඩ්ඪං තත්ථෙව දානං දෙථ සමණබ්‍රාහ්මණකපණද්ධික වණිබ්බක-යාචකානන්ති.

සො ඛ්වාහං භන්තෙ එවං දීඝරත්තං කතානං පුඤ්ඤානං එවං දීඝ-රත්තං කතානං කුසලානං[3] පරියන්තං නාධිගච්ඡාමි, එත්තකං පුඤ්ඤන්ති වා එත්තකො පුඤ්ඤවිපාකොති වා එත්තකං සග්ගෙ ඨාතබ්බන්ති වාති. අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ යාවසුභාසිතමිදං භන්තෙ භගවතා:[4]

"යෙ තං දදන්ති සද්ධාය විප්පසන්නෙන චෙතසා,
තමෙව අන්නං භජති අස්මිං ලොකෙ පරම්හි ච.

තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්"ති.

2. 3. 4.

ඝටීකාරසුත්තං.

105. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො ඝටීකාරො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

අවිහං උපපන්නාසෙ විමුත්තා සත්ත භික්ඛවො,
රාගදොසපරික්ඛීණා තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.

[භගවා:]

කෙ ච කෙ ච අතරුං සඞ්ගං මච්චුධෙය්‍යං සුදුත්තරං,
කෙ හිත්වා මානුසං දෙහං දිබ්බං යොගං උපච්චගුන්ති.

[දෙවපුත්තො:]

උපකො පලගණ්ඩො[5] ච පුක්කුසාති ච තෙ තයො,
භද්දියො භද්දදෙවො ච බාහුදන්ති ච පිඞ්ගියො[6],
තෙ හිත්වා මානුසං දෙහං දිබ්බං යොගං උපච්චගුන්ති

[භගවා:]

කුසලී භාසසී තෙසං මාරපාසප්පහායිනං,
කස්ස තෙ ධම්මමඤ්ඤාය අච්ඡිදුං භවබන්ධනන්ති.

[දෙවපුත්තො:]

න අඤ්ඤත්‍ර භගවතා නාඤ්ඤත්‍ර තව සාසනා,
යස්ස තෙ ධම්මමඤ්ඤාය අච්ඡිදුං භවබන්ධනං.

---

1. වුත්තාහං - කම්බො 2. අන්තෙපුරං - කම්බො 3. කුසලානං ධම්මානං - මජසං.
4. මිදං භගවතා - PTS. 5. ඵලගණ්ඩො - සී1. 6. බාහුදන්තී ජානියො - සී1.

වහන්ස, ඉක්බිති රාජපුරුෂයෝ මා වෙත එළඹ "දේවයන් වහන්සේගේ දූතයක් දූත් කිසි තැනෙක නොදෙනු ලැබේ ය"යි මෙය කීහ.

වහන්ස, මෙසේ මම කියනලද්දෙම් ඒ පුරුෂයන්ට "සගයෙනි, එසේ නම් පිටත දනවුවල යම් අයෙක් උපදී ද? එයින් අඩක් ඇතොවුර කෙරෙහි යවවු. අඩකින් එහි ම මහණ බමුණු දුගී මගී වණිබ්බක යාචකයන්ට දන් දෙව් ය"යි මෙය කීයෙමි.

වහන්ස, ඒ මම මෙසේ දිගුකලක් මුළුල්ලෙහි කළ පින්කම්වල මෙසේ දිගුකලක් කළ කුසල්වල පින මෙතෙකැයි කියා හෝ පුණ්‍යවිපාකය මෙතෙකැයි කියා හෝ මෙපමණ කලක් සගෙහි සිටියයුතු යයි කියා හෝ කෙළවරක් නො දනිමි.

වහන්ස, ආශ්චර්යයෙකි! වහන්ස, අද්භූතයෙකි!! වහන්ස, "යම් කෙනෙක් සැදැහැයෙන් පහන්සිතින් ඒ ආහාරය දේද් ද? මෙලොවහි ද පරලොවහි ද ආහාරය ඔහු ම සෙවුනේ ය. එහෙයින් මසුරු මල මැඩලන සුලු වූයේ මසුරුකම දුරු කොට දන් දෙන්නේ ය. පින් සත්ත්වයන්ට පරලොව පිහිට වෙයි" යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ඉතා මැනැවින් වදාරණ ලද්දේම ය.

2. 3. 4.

ඝටිකාර සූත්‍රය.

105. සැවැත්නුවර—

එකත්පසෙක සිටි ඝටිකාර දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

භික්ෂූහු සත්තමක් අවිහ බඹලොවට පැමිණියාහු මිදුනාහු රාගද්වෙෂයන් ක්ෂය කළාහු (පඤ්චස්කන්ධ) ලෝකයෙහි තෘෂ්ණාව ක්ෂය කළාහු ය.

[භගවත්හු:]

තරණය කිරීමට ඉතා දුෂ්කර වූ මච්චුධෙය්‍ය නම් සංසාරයත් (චතුර්විධ) සඞ්ගයනුත් කවුරු කවුරු තරණය කළාහු ද? කිනම් කෙනෙක් මනුෂ්‍යදේහ (සඞ්ඛ්‍යාත ඔරම්භාගිය සංයෝජන පස) දුරු කොට දිව්‍යයෝග (සඞ්ඛ්‍යාත උද්ධම්භාගිය සංයෝජන පස) ඉක්ම ගියාහු ද?

[දෙව්පුත්:]

උපක, පලගණ්ඩ, පුක්කුසාති යන තිදෙන ද, **භද්දිය, භද්දදෙව, බාහුදන්ති, පිඞ්ගිය** යන (සිවුදෙන ද) ඔහු මනුෂ්‍යදේහය හැර දිව්‍යයොගය ඉක්ම ගියාහු ය.

[භගවත්හු:]

මාරපාසයන් හැර සිටියා වූ ඔවුන්ට අතවද්‍ය කාම් ඇතියහයි පසස්නෙහි ය. ඔහු කවරකුගේ ධර්මය දැන භවබන්ධනය සින්දැහු ද?

[දෙව්පුත්:]

ඔහු යම්කුගේ ධර්මය දැන භවබන්ධනය සින්දැහු ද, (ඒ) භාග්‍යවතුන් වහන්සේ නො හැරයි. මුබවහන්සේගේ සසුන ද නො හැරයි.

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
තං තෙ ධම්මං ඉධඤ්ඤාය අච්ඡිදුං භවබන්ධනන්ති.

[භගවා:]

ගම්භීරං වාචසි වාචං දුබ්බිජානං සුදුබ්බුධං,
කස්ස ත්වං ධම්මමඤ්ඤාය වාචං භාසසි ඊදිසන්ති.

[දෙවපුත්තො:]

කුම්භකාරො පුරෙ ආසිං වෙහලිඞ්ගෙ ඝටීකාරො,
මාතාපෙත්තිභරො ආසිං කස්සපස්ස උපාසකො.

විරතො මෙථුනා ධම්මා බ්‍රහ්මචාරී නිරාමිසො,
අහුවා තෙ සගාමෙය්‍යො අහුවා තෙ පුරෙ සඛා.

සොහං එතෙ පජානාමි විමුත්තෙ සත්ත භික්ඛවො,
රාගදොසපරික්ඛීණෙ තිණ්ණෙ ලොකෙ විසත්තිකන්ති.

[භගවා:]

එවමෙතං තදා ආසි යථා භාසසි භග්ගව,
කුම්භකාරො පුරෙ ආසි වෙහලිඞ්ගෙ ඝටීකාරො,
මාතාපෙත්තිභරො ආසි කස්සපස්ස උපාසකො.

විරතො මෙථුනා ධම්මා බ්‍රහ්මචාරී නිරාමිසො,
අහුවා මෙ සගාමෙය්‍යො අහුවා මෙ පුරෙ සඛාති.

[ථෙරා:]

එවමෙතං පුරාණානං සහායානං අහු සඞ්ගමො,
උභින්නං භාවිතත්තානං සරීරන්තිමධාරිනන්ති.

2. 3. 5.

ජන්තු සුත්තං.

106. එවං මෙ සුතං එකං සමයං සම්බහුලා භික්ඛූ කොසලෙසු විහරන්ති හිමවන්තපස්සෙ අරඤ්ඤකුටිකායං[1] උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා.

අථ ඛො ජන්තු දෙවපුත්තො තදහුපොසථෙ පණ්ණරසෙ යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ භික්ඛූ ගාථාහි අජ්ඣභාසි:

සුඛජීවිනො පුරෙ ආසුං භික්ඛූ ගොතමසාවකා,
අනිච්ඡා පිණ්ඩමෙසනා අනිච්ඡා සයනාසනං,
ලොකෙ අනිච්චතං ඤත්වා දුක්ඛස්සන්තං අකංසු[2] තෙ.

1. අරඤ්ඤකුටිකාය - මජසං. කුටිකං - සී මු 1. සී 1. 2 දුක්ඛස්සන්තමකංසු - සයා, PTS

යම් තැනෙක නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් ද, ඔහු මේ සසුනෙහි ඒ නිර්වාණ ධර්මය දැන භවබන්ධනය සින්දහු ය.

[භගවත්හු:]

ගැඹුරු වූ දැන ගැණීමට දුෂ්කර වූ අතිශයින් දුරවබෝධ වූ වචන කියහි. තෙපි කවරකුගේ ධර්මය දැන මෙබඳු වචන කියහු ද?

[දෙව්පුත්:]

පෙර වෙහලිඞ්ග ගම්හි ඝටීකාර නම් කුඹලෙකිම් වීමි. කාශ්‍යප බුදුරජාතන් වහන්සේගේ උපාසකයෙක් වූයෙම් මවු පියන් පෝෂණය කෙළෙම් වීමි.

මෛථුන්දම්න් වෙන් වූයෙම් නිරාමිෂ (=අනාගාමි) බ්‍රහමචාර ඇතියෙම් තොප හා එක්ගම විසූයෙම් වීමි. පෙර තොපගේ යහළුවෙකිම් වීමි.

ඒ මම රාගද්වේෂයන් ක්ෂය කළ ලොව භාෂණාව තරණය කළ මිදුනු මේ භික්ෂූන් සත් තම දනිමි.

[භගවත්හු:]

භාග්ගව, යම්සේ කියහි නම් එකල්හි මෙය එසේ වී ය. පෙර වෙහලිඞ්ග ගම්හි ඝටීකාර නම් කුඹලෙක් විය. කාශ්‍යප බුදුරජාතන් වහන්සේගේ උපාසකයෙක් වූයේ මවුපියන් පොෂණය කෙළේ විය.

මෛථුන්දම්න් වැළකුනු නිරාමිෂ බඹසර ඇත්තෙක් වූයේ ය. මා හා එක් ගම විසූයෙක් වූයේ ය. පෙර මාගේ යහළුවෙක් විය.

[තෙරහු:]

වඩන ලද සිත් ඇති අන්තිම සිරුර දරණ පැරැණි යහළුවන් දෙදෙනකුන්ගේ මේ එක් වීම මෙසේ විය.

2. 3. 5.

ජන්තු සූත්‍රය.

106. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක කොසොල් දනව්වෙහි හිමවත් පෙදෙස වනකිළියෙක උඩඟු වූ තඟා ගත් මාන තළ ඇති චපල වූ රළු වචන ඇති දෙඩමලු වූ මුලා වූ සිහි ඇති මනා නුවණ නැති නොඑකඟ සිත් ඇති නොසන්සුන් සිත් ඇති පියවි ඉඳුරන් ඇති බොහෝ භික්ෂූහු වෙසෙත්.

එකල්හි ජන්තු දෙව්පුත් තෙමේ පුණුරුසි පොහොය වූ එදින ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන්ට ගාථාවලින් කීය:

පෙර ආශා රහිත ව පිඬු සොයන ආශා රහිත ව සෙනසුන් සොයන ගොයුම් සව් වූ මහණහු සුඛජීවී වූහ ඔහු ලොව අනිස් බැව් දැන දුක් කෙළවර කළහ.

දුප්පොසං කත්වා අත්තානං ගාමෙ ගාමණිකා විය,
භුත්වා භුත්වා නිපජ්ජන්ති පරගාරෙසු මුච්ඡිතා.

සබ්බස්ස අඤ්ජලිං කත්වා ඉධෙකවෙව වඳාමහං,
අපවිද්ධා[1] අනාථා තෙ යථා පෙතා තථෙව ච.[2]

යෙ ඛො පමත්තා විහරන්ති තෙ මෙ සන්ධාය භාසිතං,
යෙ අප්පමත්තා විහරන්ති නමො තෙසං කරොමහන්ති.

2. 3. 6.

රොහිතස්සසුත්තං.

107. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො රොහිතස්සො දෙවපුත්තො භගවන්තං එතදවොච. යත්ථ නු ඛො භන්තෙ, න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති[3] සක්කා නු ඛො සො භන්තෙ ගමනෙන ලොකස්ස අන්තො ඤාතුං වා දට්ඨුං වා පාපුණිතුං වාති.

යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති[3] නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ යාව සුභාසිතමිදං භන්තෙ, භගවතා, යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති[3] නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.

භූතපුබ්බාහං භන්තෙ, රොහිතස්සො නාම ඉසි අහොසිං භොජපුත්තො ඉද්ධිමා වෙහාසඞ්ගමො. තස්ස මය්හං භන්තෙ එවරූපො ජවො අහොසි: සෙය්‍යථාපි නාම දළ්හධම්මා[4] ධනුග්ගහො සික්ඛිතො[5] කතහත්ථො කතයොග්ගො කතූපාසනො ලහුකෙන අසනෙන අප්පකසිරෙනෙව තිරියං තාලච්ඡායං අතිපාතෙය්‍ය.

තස්ස මය්හං භන්තෙ, එවරූපො පදවීතිහාරො අහොසි: සෙය්‍යථාපි[6] පුරත්ථිමසමුද්දා පච්ඡිමො සමුද්දො. තස්ස මය්හං භන්තෙ, එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි: "අහං ගමනෙන ලොකස්ස අන්තං පාපුණිස්සාමී"ති.

සො ඛ්වාහං භන්තෙ එවරූපෙන ජවෙන සමන්නාගතො එවරූපෙන ච පදවීතිහාරෙන අඤ්ඤත්‍රෙව අසිතපීතඛායිතසායිතා අඤ්ඤත්‍ර උච්චාරපස්සාවකම්මා අඤ්ඤත්‍ර නිද්දාකිලමථපටිවිනොදනා වස්සසතායුකො වස්සසතජීවී වස්සසතං ගන්ත්වා අප්පත්වා ච[7] ලොකස්ස අන්තං අන්තරාව කාලකතො[8]

1. අපවිට්ඨා - සයා. 2. තෙ මජසං, සයා, PTS. 3. උපපජ්ජති - මජසං, සයා. 4. දළ්හධම්මො - සීමු. 2. PTS සයා. සී 1. 5. සුසික්ඛිතො - මජසං 6. සෙය්‍යථාපි නාම - මජසං, 7. අප්පත්වා ච - සී. මු, PTS. 8. කාලං කතො - මජසං, PTS.

මම සබ්සයාට ඇඳිලි බැඳ කියමි: මෙහි ඇතැම්හු ගම්හි නින්දිත ගම්දෙටුවන් මෙන් තමන් දුක සේ පෝෂණය කළහැක්කවුන් කොට අත්ගෙවල පුතපුතා වලදමින් මුසපත් ව හොවිත්. සත්හෙත් බැහැර වූ ඔ - අසරණයෝ ය. සොහොනෙහි දමන ලද මලසිරුරු බඳු වෙත්.

යම් කෙනෙක් ප්‍රමත්ත ව වෙසෙත් ද, මා විසින් ඔවුන් සඳහා කියන ලදි: යම් කෙනෙක් අප්‍රමත්ත ව වෙසෙද් ද, මම ඔවුන්ට නමස්කාර කරමි.

2. 3. 6.

රෝහිතස්සසූත්‍රය.

සැවැත්නුවර—

107. **එකත්පසෙක සිටි රෝහිතස්ස** දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේය කී ය:

“වහන්ස, යම්තැනෙක නූපදී ද, නො දිරා ද, නො මියේ ද, ච්‍යුත නො වේ ද, නො හට ගණී ද. වහන්ස, ඒ ලෝකයේ කෙළවර පාගමනින් දත හැකි ද, දක්නට හෝ පැමිණෙන්නට හෝ හැක්කේ ද?”යි.

ඇවැත්නි, යම් තැනෙක නූපදී ද, නො දිරා ද, නො මියේ ද, ච්‍යුත නො වේ ද, නො හට ගණී ද ඒ ලෝකයේ කෙළවර පාගමනින් දත හැකි ය, දක්ක හැකි ය, පැමිණිය හැකිය යි මම නො කියමි.

වහන්ස, ආශ්චර්‍ය්‍යයෙකි, වහන්ස, අද්භූතයෙකි. වහන්ස, “ඇවැත්නි, යම් තැනෙක නූපදී ද, නො දිරා ද, නො මියේ ද, ච්‍යුත නො වේ ද, නො හට ගණී ද, ඒ ලෝකයේ කෙළවර පාගමනින් දත හැකි ය දක්ක හැකි ය පැමිණිය හැකිය යි මම නො කියමි”යි යන මේය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් වදාරණ ලද්දේ මය,

පෙරවූවක් කියමි. වහන්ස, මම **භෝජ පුත්‍ර** වූ සෘද්ධි ඇති අහසින් යන **රෝහිතස්ස** නම් තවුසෙක් වීමි වහන්ස, ඒ මට දැඩිදුනු ඇති පුහුණු වූ කළ පුරාදු ඇති කළ තරාහ ඇති දක්වූ ශිල්ප ඇති දුනුවායෙක් සැහැල්ලු ඊතලයෙකින් තල්සෙය සරස නිදුකින් ම යම්සේ ඉක්මවන්නේ ද, එබඳු ජවයෙක් වී ය.

වහන්ස, ඒ මට පෙරදිග මුහුදින් අපරදිග මුහුද යම්සේ දුර ද,. එබඳු පා තැබීමෙක් වී ය, වහන්ස, ඒ මට “මම පාගමනින් ලොව කෙළවරට පැමිණෙන්නෙමි”යි මෙබඳු ආශායෙක් උපන.

වහන්ස, ඒ මම මෙබඳු ජවයෙන් යුක්ත වූයෙමි මෙබඳු පදවීතිහාරයෙන් යුක්ත වූයෙමි සියවසක් ආයු ඇත්තෙමි සියවසක් ජීවත්වන සුලු වූයෙමි කන බොන බුදින රස විඳින වෙලාවන් හැර මල මූ පහ කරණ වෙලාවන් හැර නිදන විඩා හරිණ වෙලාවන් හැර සියවසක් ගමන් කොට ලොව කෙළවරට නො පැමිණ ම අතරමගදී ම කලුරිය කෙළෙමි.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව සුභාසිතමිදං භන්තෙ, භගවතා: "යත්ථ ඛො ආවුසො න ජායති, න ජීයති, න මීයති, න චවති, න උපපජ්ජති නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති-වදාමී"ති.

න ඛො පනාහං ආවුසො, අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපි චාහං ආවුසො ඉමස්මිඤ්ඤෙව බ්‍යාමමත්තෙ කළෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤපෙමි, ලොකසමුදයඤ්ච ලොකනිරොධඤ්ච ලොකනිරොධගාමිනිඤ්ච පටිපදන්ති.

ගමනෙන න පත්තබ්බො ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං.

තස්මා හවෙ ලොකවිදූ සුමෙධො ලොකන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා නාසිංසති[1] ලොකමිමං පරඤ්චාති.

2. 3. 7.

නන්දසුත්තං.

108. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො නන්දො දෙවපුත්තො භගවතො සන්තිකෙ ඉමං-ගාථං අභාසි:

අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා අනුපුබ්බං ජහන්ති,
එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානීති.

[භගවා:]

අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා අනුපුබ්බං ජහන්ති,
එතං භයං මරණෙ පෙක්ඛමානො ලොකාමිසං පජහෙ සන්තිපෙක්ඛොති:

2. 3. 8.

නන්දිවිසාලසුත්තං.

109. සාවත්ථියං—

එකමන්තං ඨිතො ඛො නන්දිවිසාලො දෙවපුත්තො භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

චතුචක්කං නවද්වාරං පුණ්ණං ලොභෙන සංයුතං,
පඞ්කජාතං මහාවීර කථං යාත්‍රා භවිස්සතීති.

[භගවා:]

ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච ඉච්ඡා ලොභඤ්ච පාපකං,
සමූලං තණ්හං අබ්බුය්හ එවං යාත්‍රා භවිස්සතීති.

---

1 නාසීසති - මජසං.

වහන්ස, ආශ්චර්‍යයෙකි, වහන්ස, අද්භූතයෙකි. වහන්ස, "ඇවැත්නි, යම් තැනෙක නූපදී ද, නො දිරා ද, නො මියේ ද, ච්‍යුත නොවේ ද, නැවත නො හටගණී ද, ලෝකයේ ඒ කෙළවර පාගමනින් දතහැකි ය, දක්කහැකි ය, පැමිණිය හැකි ය යි මම නො කියමි"යි යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් වදාරණ ලද්දේ මය.

ඇවැත්නි, මම ලොව කෙළවරට නො පැමිණ දුක් කෙළවර කිරීමක් නො ම කියමි. ඇවැත්නි, වැලිදු මම සංඥා සහිත සිත් සහිත බඹයක් පමණ වූ මේ සිරුරෙහි ම ලෝකයත්, ලෝකසමුදයයත්, ලෝකනිරෝධයත්, ලෝකනිරෝධගාමිනී පටිපදාවත් පණවමි.

පාගමනින් කිසිකලෙක ලොව කෙළවර නො පැමිණිය හැක්කේ ය. ලොව කෙළවරට නො පැමිණ දුකෙන් මිදීමෙකුත් නැත.

එහෙයින් ලොව දත්තා මහනුවණැති ලොව කෙළවරට ගිය වැස නිමවූ මගබඹසර ඇති පව් සංසිඳ වූ පුද්ගල තෙමේ ලොව කෙළවර දැන මෙ ලොව ද පරලොව ද නො පතයි.

2. 3. 7.

නන්ද සූත්‍රය.

108. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි නන්ද දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

පෙරවරු ආදී කාලයෝ ඉක්ම යෙති. රාත්‍රීහු පුද්ගලයා මරණය කරා පමුණුවති. වයොරාශීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ ත්‍රිවිධභය මරණයෙහි ලා දක්තේ සැප එළවන පින් කරන්නේ ය.

[භගවත්හු:]

කාලයෝ ඉක්ම යත්. රාත්‍රීහු පුරුෂයා මරණය කරා පමුණුවත්. වයොරාශීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ බිය මරණයෙහි ලා දක්නේ නිවන් පතනුයේ (භවත්‍රය සඞ්ඛ්‍යාත) ලොකාමිෂය දුරු කරන්නේ ය.

2. 3. 8.

නන්දිවිසාල සූත්‍රය.

109. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි නන්දිවිසාල දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙකින් කී ය.

මහාවීරයන් වහන්ස, (මේ ශරීරයානය) සක් සතරක් ඇත්තේ ය. නවදොරක් ඇත්තේ ය. (අශුචියෙන්) පිරුණේ ය. ලෝභයෙන් යුක්ත ය. මඩෙහි උපන. එහි නික්ම යෑම කෙසේ වන්නේ ද?

[භගවත්හු:]

රැහැන ද වරපට ද ලාමක ඉච්ඡාව ද ලෝභය ද සිඳ තෘෂ්ණාව සහමුලින් උදුරා (ලීමෙන්) මෙසේ නික්ම යෑම වන්නේ ය.

2. 3. 9.

සුසිමසුත්තං.

110. සාවත්ථියං—

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච: තුය්හම්පි නො ආනන්ද සාරිපුත්තො රුච්චතීති.

කස්ස හි නාම භන්තෙ, අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස ආයස්මා සාරිපුත්තො න රුච්චෙය්‍ය. පණ්ඩිතො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. මහාපඤ්ඤො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. පුථුපඤ්ඤො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. හාසුපඤ්ඤො[1] භන්තෙ, ආයස්මා සාරිපුත්තො. ජවනපඤ්ඤො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. තික්ඛපඤ්ඤො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. නිබ්බෙධිකපඤ්ඤො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. අප්පිච්ඡො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. සන්තුට්ඨො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. පවිවිත්තො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. අසංසට්ඨො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. ආරද්ධ-විරියො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. වත්තා භන්තෙ, ආයස්මා සාරිපුත්තො. වචනක්ඛමො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. චොදකො භන්තෙ, ආයස්මා සාරිපුත්තො. පාපගරහී භන්තෙ, ආයස්මා සාරිපුත්තො. කස්ස හි නාම භන්තෙ, අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස ආයස්මා සාරිපුත්තො න රුච්චෙය්‍යාති.

එවමෙතං ආනන්ද, එවමෙතං ආනන්ද. කස්ස හි නාම ආනන්ද, අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස සාරිපුත්තො න රුච්චෙය්‍ය. පණ්ඩිතො ආනන්ද සාරිපුත්තො, මහාපඤ්ඤො ආනන්ද සාරිපුත්තො, පුථුපඤ්ඤො ආනන්ද සාරිපුත්තො, හාසුපඤ්ඤො ආනන්ද සාරිපුත්තො, ජවනපඤ්ඤො ආනන්ද සාරිපුත්තො, තික්ඛපඤ්ඤො ආනන්ද සාරිපුත්තො, නිබ්බෙධිකපඤ්ඤො ආනන්ද සාරිපුත්තො, අප්පිච්ඡො ආනන්ද සාරිපුත්තො, සන්තුට්ඨො ආනන්ද සාරිපුත්තො, පවිවිත්තො ආනන්ද සාරිපුත්තො, අසංසට්ඨො ආනන්ද සාරිපුත්තො, ආරද්ධවිරියො ආනන්ද සාරිපුත්තො, වත්තා ආනන්ද සාරිපුත්තො, වචනක්ඛමො ආනන්ද සාරිපුත්තො, චොදකො ආනන්ද සාරිපුත්තො, පාපගරහී ආනන්ද සාරිපුත්තො. කස්ස හි නාම ආනන්ද අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස සාරිපුත්තො න රුච්චෙය්‍යාති.

---

1. හාසපඤ්ඤො - මජසං, ස්‍යා, සිමු, PTS. හාසුපඤ්ඤොති පච්ඡමනිඳදිසු ච සංයුත්ත අට්ඨකථාය ච දිස්සතෙ.

2. 3. 9.

සුසිම සූත්‍රය.

110. **සැවැත්නුවර**—

එකල්හි ආයුෂමත් **ආනන්ද** ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂමත් **ආනන්ද** තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ "ආනන්දය, තොපට ද **ශාරිපුත්‍ර** තෙමේ තුරුස්නේ දැ" යි මෙය වදාළ සේක.

වහන්ස, බාල නො වූ දුෂ්ට නො වූ මූළ්‍හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාහට නම් ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ තුරුස්නාහු ද? වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ පණ්ඩිතයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ මහාප්‍රාඥයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෘථුප්‍රාඥය හ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ හාසබහුල ප්‍රඥාවෙන් යුක්තයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ජවනප්‍රඥාවෙන් යුක්තයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ තීක්ෂණප්‍රාඥයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ නිර්වෙදිකප්‍රඥා ඇත්තාහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ අල්පෙච්ඡයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ සන්තුෂ්ටයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන්වහන්සේ ප්‍රකවිවිවෙක ඇත්තාහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ අසංශෘෂ්ටයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ පිරිපුන් වීය්‍ර්‍ය ඇත්තාහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ වක්තෘහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ වචනක්‍ෂමයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ චොදකයහ. වහන්ස, ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ පාපගර්හිහ. වහන්ස, බාල නො වූ දුෂ්ට නො වූ මූළ්‍හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාට නම් ආයුෂමත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ තුරුස්නාහු ද?

ආනන්දය, එය එසේ ය. ආනන්දය, එය එසේ ය. ආනන්දය, බාල නො වූ දුෂ්ට නො වූ මූළ්‍හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාහට නම් ශාරිපුත්‍ර තෙමේ තුරුස්නේ ද? ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ පණ්ඩිත ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ මහාප්‍රාඥ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ පෘථුප්‍රාඥ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ හාසබහුල ප්‍රඥා ඇත්තේ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ ජවනප්‍රඥා ඇත්තේ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ තීක්ෂණප්‍රඥා ඇත්තේ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ නිර්වේදිකප්‍රඥාවෙන් යුක්ත ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ අල්පේච්ඡ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ සන්තුෂ්ට ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ ප්‍රකවිවේක-යෙන් යුක්ත ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ අසංශෘෂ්ට ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ පිරිපුන් වීය්‍ර්‍ය ඇත්තේ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ වක්තෘ ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ වචනක්‍ෂම ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ චොදක ය. ආනන්ද, ශාරිපුත්‍ර තෙමේ පාපගර්හී ය. ආනන්ද, බාල නො වූ දුෂ්ට නො වූ මූළ්‍හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාහට නම් ශාරිපුත්‍ර තෙමේ තුරුස්නේ ද?

අථ ඛො සුසිමො දෙවපුත්තො ආයස්මතො සාරිපුත්තස්ස වණ්ණෙ භඤ්ඤමානෙ මහතියා දෙවපුත්තපරිසාය පරිවුතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සුසිමො[1] දෙවපුත්තො භගවන්තං එතදවොච: එවමෙතං භගවා. එවමෙතං සුගත. කස්ස හි නාම භන්තෙ, අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස ආයස්මා සාරිපුත්තො න රුච්චෙය්‍ය? පණ්ඩිතො භන්තෙ, ආයස්මා සාරිපුත්තො -පෙ- පාපගරහී භන්තෙ, ආයස්මා සාරිපුත්තො. කස්ස හි නාම භන්තෙ, අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස ආයස්මා සාරිපුත්තො න රුච්චෙය්‍යාති.

අහම්පි හි භන්තෙ, යඤ්ඤදෙව දෙවපුත්තපරිසං උපසඞ්කමිං. එතදෙව බහුලං සද්දං සුණාමි: පණ්ඩිතො ආයස්මා සාරිපුත්තො. -පෙ- පාපගරහී ආයස්මා සාරිපුත්තො. කස්ස හි නාම අබාලස්ස අදුට්ඨස්ස අමූළ්හස්ස අවිපල්ලත්ථචිත්තස්ස ආයස්මා සාරිපුත්තො න රුච්චෙය්‍යාති.

අථ ඛො සුසිමස්ස දෙවපුත්තස්ස දෙවපුත්තපරිසා ආයස්මතො සාරිපුත්තස්ස වණ්ණෙ භඤ්ඤමානෙ අත්තමනා පමුදිතා පීතිසොමනස්සජාතා උච්චාවචා වණ්ණනිභා උපදංසෙති.

සෙය්‍යථාපි නාම මණිවෙළුරියො සුභො ජාතිමා[2] අට්ඨංසො සුපරිකම්මකතො පණ්ඩුකම්බලෙ නික්ඛිත්තො භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙවං සුසිමස්ස දෙවපුත්තස්ස දෙවපුත්තපරිසා ආයස්මතො සාරිපුත්තස්ස වණ්ණෙ භඤ්ඤමානෙ අත්තමනා පමුදිතා පීතිසොමනස්සජාතා උච්චාවචා වණ්ණනිභා උපදංසෙති.

සෙය්‍යථාපි නාම නෙක්ඛං[3] ජම්බොනදං දක්ඛකම්මාරපුත්තෙන උක්කාමුඛෙ සුකුසලසම්පහට්ඨං[4] පණ්ඩුකම්බලෙ නික්ඛිත්තං භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙවං සුසිමස්ස දෙවපුත්තස්ස දෙවපුත්තපරිසා -පෙ- උච්චාවචා වණ්ණනිභා උපදංසෙති.

සෙය්‍යථාපි නාම [සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ][4] රත්තියා පච්චූසසමයං ඔසධිතාරකා භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙවං සුසිමස්ස දෙවපුත්තස්ස දෙවපුත්තපරිසා -පෙ- උච්චාවචා වණ්ණනිභා උපදංසෙති.

සෙය්‍යථාපි නාම සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සුක්කමානො[5] සබ්බං ආකාසගතං තමං[6] අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙවං සුසිමස්ස දෙවපුත්තස්ස දෙවපුත්තපරිසා -පෙ- උච්චාවචා වණ්ණනිභා උපදංසෙති.

අථ ඛො සුසිමො දෙවපුත්තො ආයස්මන්තං සාරිපුත්තං ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

1. සුසීලමා - මජසං, සයා; PTS. 2. ජොතිමා - සයා. 3. නික්ඛං - මජසං.
4. [ලක්ඛණෙහි අනන්තරිත] පාඨො සීහලපොත්ථකෙසු චෙව PTS. පොත්ථකෙ ච න දිස්සති
5. අබ්භුස්සක්කමානො - මජසං. සීමු,2. 6. තමගතං - මජසං; සයා.

ඉක්බිති සුසිමදෙව්පුත් තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ-ගේ ගුණ කියනු ලබන කල්හි මහත් දෙව්පුත්පිරිස විසින් පිරිවරණ ලද්දේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සුසිමදෙව්පුත් තෙමේ භාග්‍ය-වතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භාග්‍යවතුන් වහන්ස, එය එසේ ය. සුගතයන් වහන්ස, එය එසේ ය. වහන්ස, බාල නො වූ, දුෂ්ට නො වූ, මූළ්හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ නො රුස්නාහු ද? වහන්ස, ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ පණ්ඩිතය හ. ... වහන්ස, ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ පාප-ගර්හී හ. වහන්ස, බාල නො වූ දුෂ්ට නො වූ මූළ්හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ නුරුස්නාහු ද?

වහන්ස, මම ද යම් යම් දෙව්පුත් පිරිසකට එළඹුනෙම් ද, "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පණ්ඩිතයහ. ... ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පාපගර්හීහ. බාල නො වූ දුෂ්ට නො වූ මූළ්හ නො වූ නො පෙරළුනු සිත් ඇති කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ නුරුස්නාහු ද" යන මේ ශබ්ද ය ම බහුල වශයෙන් අසමි.

ඉක්බිති සුසිමදෙව්පුත්හුගේ දෙව්පුත්පිරිස ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ගුණ කියනු ලබන කල්හි සතුටු සිත් ඇත්තාහු ප්‍රමුදිත වූවාහු හටගත් ප්‍රීතිසෞමනස් ඇත්තාහු නන්වැදෑරුම් වර්ණයන් පහළ කෙරෙත්.

ශුභ වූ ජාතිමත් වූ අවැස් වෛරෟඩ්මාණික් මැනවින් පිරියම් කරණ ලද්දේ රත්පලසෙක තබන ලද්දේ යම් සේ බබලා ද, දිලිසේ ද, පැහැ විහිදුවා ද. එපරිද්දෙන් ම සුසිමදෙව්පුත්හුගේ දෙව්පිත්පිරිස ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ගුණ කියනු ලබන කල්හි සතුටු සිත් ඇත්තාහු ප්‍රමුදිත වූවාහු ප්‍රීතිසෞමනස් ඇත්තාහු නන්වැදෑරුම් වර්ණයන් පහළ කෙරෙත්.

දක්‍ෂරන්කරු පුතකු විසින් කෝවාමූවෙහි මොනවට පිස ශුද්ධ කරණ ලද දඹරන්මූවා නිකෙක් රත්පලසෙක තබන ලද්දේ යම් සේ බබලා ද, දිලිසේ ද, පැහැ විහිදුවා ද, එසෙයින් ම සුසිමදෙව්පුත්හුගේ දෙව්පුත් පිරිස ... නන් වැදෑරුම් වර්ණයන් පහළ කෙරෙත්.

ශරත් කල රෑ අලුයම පහ වූ වලාකුල් ඇති අහස පිරිසිදු වූ කල්හි පහන්තරුව යම් සේ බබලා ද, දිලිසේ ද, පැහැ විහිදුවා ද, එසෙයින් ම සුසිම දෙව්පුත්හුගේ දෙව්පුත් පිරිස ... නන් වැදෑරුම් වර්ණයන් පහළ කෙරෙත්.

ශරත් කල පහ වූ වලාකුල් ඇති අහස පිරිසිදු වූ කල්හි හිරු අහසට නැඟෙන්නේ අහසෙහි වූ සියලු අඳුර නසා යම් සේ බබලා ද, දිලිසේ ද පැහැ විහිදුවා ද, එසෙයින් ම සුසිම දෙව්පුත්හුගේ දෙව්පුත් පිරිස ... නන් වැදෑරුම් වර්ණයන් පහළ කෙරෙත්.

සුසිම දෙව්පුත් තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

පණ්ඩිතොති සමඤ්ඤාතො සාරිපුත්තො අකොධනො,
අප්පිච්ඡො සොරතො දන්තො සත්ථුවණ්ණාභතො[1] ඉසීති.

අථ ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආරබ්භ සුසීමං දෙවපුත්තං ගාථාය අජ්ඣභාසි:[2]

පණ්ඩිතොති සමඤ්ඤාතො සාරිපුත්තො අකොධනො,
අප්පිච්ඡො සොරතො දන්තො කාලං කඞ්ඛති සුදන්තොති[3].

2. 3. 10.

නානාතිත්ථියසාවකසුත්තං

111. එවං මෙ සුතං එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ.**

අථ ඛො සම්බහුලා නානාතිත්ථියසාවකා දෙවපුත්තා **අසමො** ච **සහලී** ච **නිඞ්කො** [5]ච **ආකොටකො** ච **වෙටම්බරී** ච[6] **මාණවගාමියො** ච අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං වෙළුවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතො ඛො අසමො දෙවපුත්තො **පූරණං කස්සපං** ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ඉධ ඡින්දිතමාරිතෙ හතජානීසු කස්සපො,
පාපං[7] න සමනුපස්සති පුඤ්ඤං වා පන අත්තනො,
ස වෙ විස්සාසමාචික්ඛි සත්ථා අරහති මානනන්ති.

අථ ඛො සහලී දෙවපුත්තො **මක්ඛලිං ගොසාලං** ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

තපොජිගුච්ඡාය සුසංවුතත්තො වාචං පහාය කලහං ජනෙන,
ස මොසවජ්ජා විරතො සච්චවාදී නහනූන තාදී පකරොති පාපන්ති.[8]

අථ ඛො නිඞ්කො දෙවපුත්තො **නිගණ්ඨං නාතපුත්තං** ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ජෙගුච්ඡී නිපකො භික්ඛු චාතුයාමසුසංවුතො,
දිට්ඨං සුතඤ්ච ආචික්ඛං නහනූන කිබ්බිසී සියාති.

අථ ඛො ආකොටකො දෙවපුත්තො **නානාතිත්ථියෙ** ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

පකුධකො කාතියානො නිගණ්ඨො යෙ චාපිමෙ මක්ඛලිපූරණාසෙ,
ගණස්ස සත්ථාරො සාමඤ්ඤප්පත්තා නහනූන[9] තෙ සප්පුරිසෙහි දූරෙති.

1. සත්ථුවණ්ණභතො - සසා. 2. පච්චභාසි - මජසං, PTS 3. භන්තො සුදන්තොති සිමු භාවිතො සුදන්තොති - සසා සී. 1, 2. භතිකො සුදන්තොති - PTS. 4. සහලි - මජසං 5. නීකො මජසං, නිකො සසා 6. වෙගබ්භරී - මජසං, 7. න පාපං - මජසං, සසා. 8. නහිනූන තාදිසං කරොති පාපන්ති - මජසං, PTS 9. නහිනූන - මජසං, PTS.

පණ්ඩිත යයි ප්‍රකට වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ නො කිපෙන සුල්ලභ. අපිස්ඝ. මොලොක්හ. දමුනඟ හි ශාස්තෘන් වහන්සේ විසින් වණිතලද ගුණ ඇති ඍෂිවරයෙකි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් ශාරිපුත්‍රයන් ඇරබ සුසීම දෙව්පුත්හට ගාථායෙකින් වදාළ සේක,

පණ්ඩිත යයි ප්‍රසිද්ධ වූ නො කිපෙන සුලු අපිස් මොලොක් දමුණු ඉතා දමුණු සැරියුත් තෙමේ කාලය අපේක්‍ෂා කරයි.

2. 3. 10.

නානාතිත්ථියසාවක සූත්‍රය.

111. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩ වෙසෙන සේක.

එකල්හි නොයෙක් නොයෙක් තීර්ථකයන් ගේ ශ්‍රාවක වූ මනා ජවිවණී ඇති **අසම** ද **සහලි** ද **නිඞ්ක** ද **ආකොටක** ද **වෙටම්බරි** ද **මානවගාමිය** ද යන බොහෝ දෙව්පුත්හු රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු **වේළුවනය** බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි **අසම** දෙව්පුත් තෙමේ **පූරණකාශ්‍යප** ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

කසුප් ශාස්තෘ තෙමේ සිඳීමෙහි ද මැරීමෙහි ද පෙළීමෙහි ද ධනහානියෙහි ද තමහට පවක් හෝ පිණක් හෝ නො දකියි. හෙ තෙමේ ඒකාන්තයෙන් විශ්වාසය කී ය. (එහෙයින්) බුහුමනට සුදුසු ය.

ඉක්බිති **සහලි** දෙව්පුත් තෙමේ **මක්ඛලිගොසාල** ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

(කය පෙළන) තපසින් හා පවට පිළිකුල් කිරීමෙන් යුක්ත වූ හෙ තෙමේ ජනයා සමග කලහ වචන හැර මුසාවාදයෙන් තොර වූයේ සැබෑ තෙපුල් කියන සුලු වූයේ එබඳු ගුණ ඇත්තේ ඒකාන්තයෙන් පවක් නොම කෙරෙයි.

ඉක්බිති **නිඞ්ක** දෙව්පුත් තෙමේ **නිගණ්ඨනාතපුත්‍ර** ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

පවට පිළිකුල් කරණ නුවණැති සසර භය දක්නා චාතුර්‍යාමසංවරයෙන් යුත් (නිගණ්ඨනාථපුත්‍ර තෙමේ) දක්නා ලද්ද ද, අසන ලද්ද ද කියන්නේ එකාන්තයෙන් පව් කරන්නෙක් නො ම වන්නේ ය.

ඉක්බිති **ආකොටක** දෙව්පුත් තෙමේ නොයෙක් තීර්ථකයන් ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

පකුධකාත්‍යායන තෙමේ ද **නිගණ්ඨනාතපුත්‍ර** තෙමේ ද යම් මේ **මක්ඛලිගොසාල පූරණකස්සප** දෙදෙනා ද යන ගණයාව ශාස්තෘ වූ මහණකමෙහි කෙළ පැමිණී ඔහු ඒකාන්තයෙන් සත්පුරුෂයන් ගෙන් දුර නොවෙත්

අථ ඛො **වෙටම්බරී** දෙවපුත්තො **ආකොටකං** දෙවපුත්තං ගාථාය පච්චභාසි:

සහාචරිතෙන ඡවො සිගාලො
න කොත්ථුකො සීහසමො කදාචි,
නග්ගො මුසාවාදී ගණස්ස සත්ථා
සඞ්කස්සරාචාරො න සතං සරික්ඛොති.

අථ ඛො **මාරො** පාපිමා **වෙටම්බරිං** දෙවපුත්තං අන්වාවිසිත්වා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

තපො ජිගුච්ඡාය ආයුත්තා පාලයං පවිවෙකියං,
රූපෙ ච යෙ නිවිට්ඨාසෙ දෙවලොකාභිනන්දිනො,
තෙ වෙ සම්මානුසාසන්ති පරලොකාය මාතියාති.

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාය පච්චභාසි:

යෙ කෙචි රූපා ඉධ වා හුරං වා
යෙ අන්තලික්ඛස්මිං පභාසවණ්ණා,
සබ්බෙව තෙ තෙ නමුචිප්පසත්ථා
ආමිසංව මච්ඡානං වධාය ඛිත්තාති.

අථ ඛො **මාණවගාමියො**[1] දෙවපුත්තො භගවන්තං ආරබ්භ භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

විපුලො රාජගහීයානං[2] ගිරි සෙට්ඨො පවුච්චති,
සෙතො හිමවතං සෙට්ඨො ආදිච්චො අඝගාමිනං.

සමුද්දො උදධිනං සෙට්ඨො නක්ඛත්තානඤ්ච[3] චන්දිමා,
සදෙවකස්ස ලොකස්ස බුද්ධො අග්ගො පවුච්චතීති.

නානාතිත්ථියවග්ගො තතියො.

තත්‍රුද්දානං:

සිවො ඛෙමො ච සෙරී ච ඝටී ජන්තු ච රොහිතො,
නන්දො නන්දිවිසාලො ච සුසීමො නානාතිත්ථියෙන තෙ දසාති.

දෙවපුත්තසංයුත්තං සමත්තං

---

1. මානවගාමියො - සී. 1. 2. රාජගහිකානං. - සතා. 3. නක්ඛත්තානං - මජසං, PTS.

ඉක්බිති වෙටම්බරී දෙව්පුත් තෙමේ ආනන්දමක දෙව්පුත්හට ගාථායෙන් පෙරළා කී ය.

කොත්‍ථුක නම් වූ ලාමක කළුසිවල් තෙමේ එක් ව හැසිරීමෙන් කිසි කලෙකත් සිංහයකු හා සම නො වේ. එහෙයින් නග්න වූ බොරු කියන සුළු වූ සැක කට යුතු හැසුරුම් ඇති ගණශාස්තෘ තෙමේ බුද්ධාදිසත්-පුරුෂයන්ට සම නො වේ.

ඉක්බිති පවිටු මාර තෙමේ වෙටම්බරී දෙව්පුත්හට ආවිෂ්ට ව භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

තපසෙහි ද පවට පිළිකුල් කිරීමෙහි ද විවේක බව රකින රූපයෙහි පිහිටි යම් කෙනෙක් දෙව්ලොව පතත් ද, ඒ මනුෂ්‍යයෝ ඒකාන්තයෙන් පරලොව පිණිස මැනවින් අනුශාසනා කෙරෙත්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මාරයා ය යි මෙසේ දැන පවිටු මාරයාහට ගාථායෙන් පෙරළා වදාළ සේක:

මෙලොව හෝ පරලොව හෝ අහසෙහි හෝ පැහැපත් වණ් ඇති යම් කිසි රූපයෝ වෙද්ද, මාරය, ඒ සියල්ලෝ තා විසින් පසස්නා ලදහ. මසුන් නැසීම පිණිස ලූ ඇමක් මෙනි.

ඉක්බිති මානවගාමිය දෙව්පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේ ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කී ය.

රජගහනුවර පර්වතයන්ට වෙපුල්‍යපර්වතය ශ්‍රේෂ්ඨ ය යි කියනු ලැබේ. හිමවත් පර්වතයන්ට කෛලාසය ශ්‍රේෂ්ඨ ය. අහසෙහි යන්නවුන්ට සූර්‍ය්‍යයා ශ්‍රේෂ්ඨ ය.

ජලාශයනට මුහුද ශ්‍රේෂ්ඨ ය. නැකැත්තරුවලට සඳ ශ්‍රේෂ්ඨ ය. දෙවියන් සහිත ලෝකයාහට බුදුරජානන් වහන්සේ ශ්‍රේෂ්ඨයහ යි කියනු ලැබේ.

නානාතිත්ථිය වර්ගය තුන්වැනි යි.

එහි උද්දානය:

සිව, ඛෙම, සෙරී, ඝටීකාර, ජන්තු, රෝහිතස්ස, නන්ද, නන්දිවිසාල, සුසීම, නානාතිත්ථියසාවක සූත්‍ර ය යි ඔහු දශයෙකි.

දේවපුත්තසංයුත්තය සමාප්ත ය.

3. කොසලසංයුත්තං

1. බන්ධනවග්ගො

8. 1. 1.

දහරසුත්තං.

112. එවං මෙ සුතං එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො රාජා **පසෙනදි කොසලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: භවම්පි නො ගොතමො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පටිජානාතී?ති.

යං හි තං මහාරාජ සම්මා වදමානො වදෙය්‍ය, අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති, මමං[2] තං සම්මා වදමානො වදෙය්‍ය. අහං හි මහාරාජ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති.

යෙ'පි තෙ භො ගොතම සමණබ්‍රාහ්මණා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා බහුජනස්ස. සෙය්‍යථීදං:[3] **පූරණො කස්සපො**, **මක්ඛලි ගොසාලො**, **නිගණ්ඨො නාතපුත්තො**, **සඤ්ජයො බෙලට්ඨපුත්තො**,[4] පකුධො[5] **කච්චායනො**, **අජිතො කෙසකම්බලො**. තෙ'පි "මයා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධාති* පටිජානාථා"ති පුට්ඨා සමානා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධාති* න පටිජානන්ති. කිං පන භවං ගොතමො දහරො චෙව ජාතියා නවො ච පබ්බජ්ජායාති.

චත්තාරො ඛො, මෙ මහාරාජ දහරාති න උඤ්ඤාතබ්බා, දහරාති න පරිභොතබ්බා. කතමෙ චත්තාරො? ඛත්තියො ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො, දහරොති න පරිභොතබ්බො. උරගො ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො, දහරොති න පරිභොතබ්බො. අග්ගි ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො, දහරොති න පරිභොතබ්බො. භික්ඛු ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො, දහරොති න පරිභොතබ්බො. ඉමෙ ඛො මහාරාජ චත්තාරො දහරාති න උඤ්ඤාතබ්බා, දහරාති න පරිභොතබ්බාති.

ඉදමවොච භගවා, ඉදං වත්වා[6] සුගතො අථාපරං එතදවොච සත්ථා:

ඛත්තියං ජාතිසම්පන්නං අභිජාතං යසස්සිනං,
දහරොති නාවජානෙය්‍ය න නං පරිභවෙ නරො.

---

1. සාරණීයං - මජසං. 2. මමෙව - මජසං. 3. සෙය්‍යථීදං - මජසං. 4. බෙලට්ඨි පුත්තො - සිමු. 1. 5. කකුධො - PTS. 6. වත්වාන - මජසං. PTS.
*අභිසම්බුද්ධොති - සබ්බත්ථ.

3. කෝසල සංයුත්තය

1. බන්ධන වර්ගය

3. 1. 1.

දහර සූත්‍රය.

112. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල **පසේනදි කොසොල්** රජ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වි ය. සතුටු විය යුතු සිහි කරත්තට නිසි කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය.

"භවත් ගෞතමයන් වහන්සේත් නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමි ය" යි ප්‍රතිඥා කරණ සේක් ද? "මහරජ, මැනවින් කියන්නෙක් නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබොධ කෙළේ ය" යි යමකු සඳහා කියන්නේ නම් මැනවින් කියන්නේ ඒ මා සඳහා කියන්නේ ය. මහරජ, මම වනාහි නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමි.

භවත් ගෞතමයන් වහන්ස, පැවිදි සමූහයා ඇති පැවිදි ගණයා ඇති ගණාචාර්‍ය්‍ය වූ ප්‍රසිද්ධ වූ යසශී ඇති ලබ්ධිකර වූ (අදබල්) බොහෝදෙනා විසින් සාධු සම්මත වූ යම් ඒ මහණබමුණෝ ඇද්ද ඔහු කවරහ: **පූරණකාශ්‍යප** ය, **මක්ඛලිගොසාල** ය, **නිගණ්ඨනාතපුත්ත** ය, **සඤ්ජය බෙලට්ඨපුත්ත** ය, **පකුධකච්චායන** ය, **අජිතකෙසකම්බල** ය යන මොහු යි. ඔහුත් "නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළම්හ යි ප්‍රතිඥා කරහු දැයි මා විසින් විචාරණ ලද්දහු "නිරුත්තර සම්මාසම්බෝධිය අවබොධ කළම්හ" යි ප්‍රතිඥා නො කෙරෙත්. කිම? භවත් ගෞතමයන් වහන්සේ උපතින්හුදු ළදරු වන සේක. පැවිද්දෙනුත් නවක වන සේක.

මහරජ, මේ සිව් දෙනෙක් ළදරු හ යි අවමන් නො කට යුත්තාහ, ළදරු හ යි පරිභව නො කට යුත්තාහ. කවර සිව් දෙනෙක යත්: මහරජ, ක්ෂත්‍රිය තෙමේ ළදරු ය යි අවමන් නො කට යුත්තේ ය, ළදරු ය යි පරිභව නො කට යුත්තේ ය. මහරජ, සර්පයා ළදරු ය යි අවමන් නො කට යුත්තේ ය, ළදරු ය යි පරිභව නො කට යුත්තේ ය. මහරජ, ගිනි ළදරු ය යි අවමන් නො කට යුත්තේ ය, ළදරු ය යි පරිභව නො කට යුත්තේ ය. මහරජ, මහණ ළදරු ය යි අවමන් නො කට යුත්තේ ය, ළදරු ය යි පරිභව නො කට යුත්තේ ය. මහරජ, මේ සිව් දෙන ළදරු හ යි අවමන් නො කට යුත්තාහ, ළදරුහ යි පරිභව නො කට යුත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. නවද සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා ඉක්බිති අන්‍ය තෙල ගය ද වදාළ සේක.

මිනිස් තෙමේ ජාතිසම්පන්න වූ යිශිෂ්ට කුලයෙහි උපන් යශස්වී වූ කැත් කුමරා ළදරු ය යි අවමන් නො කරන්නේ ය. ඔහුට පරිභව ද නො කරන්නේ ය.

ඨානං හි සො මනුස්සින්දො[1] රජ්ජං ලද්ධාන ඛත්තියො
සො කුද්ධො රාජදණ්ඩෙන තස්මිං පක්කමතෙ භුසං,
තස්මා තං පරිවජ්ජෙය්‍ය රක්ඛං ජීවිතමත්තනො.

ගාමෙ වා යදි වා, රඤ්ඤෙ යත්ථ පස්සෙ භුජඞ්ගමං,
දහරොති නාවජානෙය්‍ය න තං පරිභවෙ නරො.

උච්චාවචෙහි වණ්ණෙහි උරගො චරති තෙජසී[2],
සො ආසජ්ජ ඩසෙ[3] බාලං නරං නාරිඤ්ච එකදා,
තස්මා තං පරිවජ්ජෙය්‍ය රක්ඛං ජීවිතමත්තනො.

පහූතභක්ඛං ජාලිනං[4] පාවකං කණ්හවත්තනිං,
දහරොති නාවමඤ්ඤෙය්‍ය න තං පරිභවෙ නරො.

ලද්ධා හි සො උපාදානං මහා හුත්වාන පාවකො,
සො ආසජ්ජ ඩහෙ බාලං නරං නාරිඤ්ච එකදා,
තස්මා තං පරිවජ්ජෙය්‍ය රක්ඛං ජීවිතමත්තනො.

වනං යදග්ගි ඩහති පාවකො කණ්හවත්තනී,
ජායන්ති තත්ථ පාරොහා අහොරත්තානමච්චයෙ.

යං ච ඛො සීලසම්පන්නො භික්ඛු ඩහති තෙජසා
න තස්ස පුත්තා පසවො දායාදා වින්දරෙ ධනං,
අනපච්චා අදායාදා තාලාවත්ථු[5] භවන්ති තෙ.

තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො
භුජඞ්ගමං පාවකඤ්ච ඛත්තියඤ්ච යසස්සිනං,
භික්ඛුං ච සීලසම්පන්නං සම්මදෙව සමාචරෙති.

එවං වුත්තෙ රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති.[6] එවමෙවං[7] භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

3. 1. 2.

පුරිසසුත්තං.

113. **සාවත්ථියං**—

අථ ඛො රාජා **පසෙනදි කොසලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: කති නු ඛො භන්තෙ පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායාති?

---

1. මනුජින්දො - මජසං. 2. තෙජසා. - සීමු. 3. ඩංසෙ - මජසං. 4. ජලිතං - සී. 1, 2.
5. තාලවත්ථු - සයා. PTS. 6. දක්ඛන්තීති - මජසං. සයා. 7. එවමෙව - සයා.

තව කරුණෙක් ඇත. මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ ඒ ක්‍ෂත්‍රිය තෙමේ රජය ලැබ කිපියේ (තමහට අවමන් කළ) ඔහු කෙරෙහි රාජදණ්ඩයෙන් අත්‍යර්ථයෙන් උපක්‍රම කෙරේ. එහෙයින් තමදිවි රක්නේ ඔහු නො ගටන්නේ ය.

ඉදින් මිනිස් තෙමේ ගම්හි හෝ අරණෙහි හෝ යම් තැනෙක සර්පයකු දක්නේ ද? ඔහු ලදරු ය යි අවමන් නො කරන්නේ ය. ඔහුට පරිභව ද නො කරන්නේ ය.

තේජස්වී වූ සර්ප තෙමේ නන් වැදෑරුම් වෙසින් හැසිරෙයි. හේ කිසි-විටෙක (තමහට අවමන් කළ) අඥ පුරුෂයා හා සත්‍රිය කරා පැමිණ දෂ්ට කරන්නේ ය. එහෙයින් තම දිවි රක්නේ ඔහු නො ගටන්නේ ය.

ප්‍රභූතභක්‍ෂ්‍යා ඇති (බොහෝ දේ දවන) ගිනිදැල් ඇති කළුමග ඇති ගින්න ලදරු ය යි අවමන් නො කරන්නේ ය. මිනිස් තෙමේ ඊට පරිභවද නො කරන්නේ ය.

ඒ ගින්න පසයන් ලැබ විශාල ව ඇතැම් විටෙක (තමහට අවමන් කළ) අඥ පුරුෂයා හා සත්‍රිය කරා පැමිණ ඩැහ ගන්නේ ය. එහෙයින් තම දිවි රක්නේ එය නො ගටන්නේ ය.

කළුමග ඇති පාවක නම් වූ ගින්න යම් වනයක් ඩැහගන්නේ ද, දවරුය ඉක්ම ගිය කල්හි එහි ප්‍රරෝහයෝ (මුලින් නගින අකුරු) හට ගණිත්.

සිල්වත් මහණෙක් තෙදින් යමකු දවා ද? ඔහුට පුත්‍රයෝ ද සිවුපාවෝ ද නො වෙත්. දායාදයෝ ධනය නො ලබත්. (මෙසේ) ඔහු දරුවන් නැත්තාහු දායාදයන් නැත්තාහු මුදුන සුන් තල්රුක්බඳු වෙත්. එහෙයින් නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ සර්පයා ද, ගිනි ද, කීර්තිමත් ක්‍ෂත්‍රියයා ද, සිල්වත් මහණහු ද මැනවින් ම ඇසුරු කරන්නේ ය.

මෙසේ වදාළ කල්හි පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය: වහන්ස, ඉතා මැනවි. වහන්ස, ඉතා මැනවි. වහන්ස, යම්සේ යටිකුරු වූවක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුනු දෙයක් විවර කරන්නේ හෝ වේ ද, මං මුළා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූප දක්නාහු ය යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එසෙයින් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරෙන් දහම් පවසන ලදී. වහන්ස, මේ මම භාග්‍යවතුන් වහන්-සේත් දහමත් බික්සඟනත් සරණ කොට යෙමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිම් කොට තෙරුවන් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා යි.

3. 1. 2.

පුරිස සුත්‍රය.

113. සැවැත්නුවර—

2. එකල්හි පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, කෙතෙක් ධර්මයෝ පුරුෂයාගේ සිය සතන්හි උපදනාහු අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදිත් ද" යි තෙල සැළ කෙළේ ය.

තයො බො මහාරාජ පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො? ලොභො බො මහාරාජ පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො බො මහාරාජ පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. මොහො බො මහාරාජ පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. ඉමෙ බො මහාරාජ තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායාති.

ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරංව සම්ඵල[1]න්ති

3. 1. 3.

රාජසුත්තං.

114. සාවත්ථියං—

එකමන්තං නිසින්නො බො රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: අත්ථි නු බො භන්තෙ ජාතස්ස අඤ්ඤත්‍ර ජරාමරණා[2]ති?

නත්ථි බො මහාරාජ ජාතස්ස අඤ්ඤත්‍ර ජරාමරණා. යෙපි තෙ මහාරාජ ඛත්තියමහාසාලා අඩ්ඪා[3] මහද්ධනා මහාභොගා පහූතජාතරූපරජතා පහූතවිත්තූපකරණා පහූතධනධඤ්ඤා. තෙසම්පි ජාතානං නත්ථි අඤ්ඤත්‍ර ජරාමරණා. යෙපි තෙ මහාරාජ බ්‍රාහ්මණමහාසාලා -පෙ- යෙපි තෙ මහාරාජ ගහපතිමහාසාලා අඩ්ඪා මහද්ධනා මහාභොගා පහූතජාතරූපරජතා පහූතවිත්තූපකරණා පහූතධනධඤ්ඤා. තෙසම්පි ජාතානං නත්ථි අඤ්ඤත්‍ර ජරාමරණා. යෙපි තෙ මහාරාජ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤාවිමුත්තා. තෙසම්පායං කායො භෙදනධම්මො නික්ඛෙපනධම්මොති.

ජීරන්ති වෙ රාජරථා සුචිත්තා අථො සරීරම්පි ජරං උපෙති,
සතඤ්ච ධම්මො න ජරං උපෙති සන්තො හවෙ සබ්භි පවෙදයන්ති.

3. 1. 4.

පියසුත්තං

115. සාවත්ථියං—

එකමන්තං නිසින්නො බො රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස[4] එවං චෙතසො පරිවිතක්කො උදපාදි: කෙසං නු බො පියො අත්තා, කෙසං අප්පියො අත්තාති.

1. සප්ඵලන්ති - සභා. 2. ජරාමරණං - මජසං: 3. අද්ධා. - මජසං. 4 පතිසල්ලීනස්ස - සිමු 1.

මහරජ, දහම්හු තිදෙනෙක් පුරුෂයාගේ සිය සතන්හි උපදනාහු අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදිත්. කවර තිදෙනෙක ලක්: මහරජ, ලෝභය පුරුෂයාගේ සිය සතන්හි උපදනේ අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදී. මහරජ, ද්වේෂය පුරුෂයාගේ සිය සතන්හි උපදනේ අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදී. මහරජ, මෝහය පුරුෂයාගේ සිය සතන්හි උපදනේ අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදී. මහරජ, මේ දහම්හු තුන්දෙන පුරුෂයාගේ සිය සතන්හි උපදනාහු අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදිත්.

ලෝභය ද ද්වේෂය ද මෝහය ද සිය සතන්හි හටගන්නාහු ලමු අදහස් ඇති පුරුෂයා සිය ඵලය (හුණ බට ආදී) පොතුහර ගසක් පෙළන්නාක් මෙන් පෙළත්.

3. 1. 3.

රාජ සූත්‍රය.

114. **සැවැත්නුවර—**

එකත්පසෙක සිටි **පසේනදි කොසොල්** රජ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, උපන්නහුට ජරාමරණ හැර අනෙකෙක් ඇද්ද" යි තෙල සැල කෙළේ ය.

මහරජ, උපන්නහුට ජරාමරණ හැර අනෙකෙක් නැත. මහරජ, ආඪ්‍ය වූ මහද්ධන ඇති මහත් භෝග ඇති බොහෝ රන්රිදී ඇති බොහෝ විත්ති හා උවරණ (වස්තූපකරණ) බොහෝ ධනධාන්‍ය ඇති කැත්මහසල් කෙනෙකුත් වෙද්ද: උපන් ඔවුන ට ද ජරාමරණ හැර අනෙකෙක් නැත. මහරජ, යම් ඒ බමුණුමහසල් කෙනෙකුත් වෙද්ද? ... මහරජ, ආඪ්‍ය වූ මහද්ධන ඇති මහත් භෝග ඇති බොහෝ රන් රිදී ඇති බොහෝ වස්තූපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති ගැහැවිමහසල් කෙනෙකුත් වෙද්ද? උපන් ඔවුනට ද ජරාමරණ හැර අනෙකෙක් නැත. මහරජ, රහත් වූ ක්‍ෂය කළ ආශ්‍රවයන් ඇති මගබඹසර වැස නිම වූ කළ සිවුමඟ කිස ඇති බහා තැබූ කෙලෙස් බර ඇති පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇති ක්‍ෂය කළ භවසංයෝජන ඇති මැනවින් දැන මිදුනු යම් රහත් මහණ කෙනෙකුත් වෙද්ද? ඔවුන්ගේ ද මේ කය බිඳෙන සවභාව ඇත්තේ ය. බැහැර ලිය යුතු සවභාව ඇත්තේ ය යි.

විසිතුරු වූ රාජරථයෝ ඒකාන්තයෙන් දිරත්. තවද සිරුර ද දිරීමට පැමිණේ. සත්පුරුෂයන්ගේ ධර්මය දිරීමට නො පැමිණේ. සත්පුරුෂයෝ ඒකාන්තයෙන් සත්පුරුෂයන් සමග මෙසේ ප්‍රකාශ කෙරෙත්.

3. 1. 4.

පිය සූත්‍රය

115. **සැවැත්නුවර—**

එකත්පසෙක හුන් **පසේනදි කොසොල්රජ** භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. වහන්ස: මෙහි රහසිගත වූ එකලාව හුන් මාගේ සිත්හි "කිනම් කෙනකුන්ට තෙමේ ප්‍රිය" වේ ද? කිනම් කෙනකුන්ට තෙමේ අප්‍රිය වේ ද? යි මෙබඳු විතර්කයෙක් පහළ විය.

තස්ස මය්හං භන්තෙ, එතදහොසි: යෙ ච ඛො කෙචි කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති, තෙසං අප්පියො අත්තා, කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං "පියො නො අත්තා"ති, අථ ඛො තෙසං අප්පියො අත්තා. තං කිස්ස හෙතු: යං හි අප්පියො අප්පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති. තස්මා තෙසං අප්පියො අත්තා.

යෙ ච ඛො කෙචි කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, තෙසං පියො අත්තා, කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං "අප්පියො නො අත්තාති" අථ ඛො තෙසං පියො අත්තා. තං කිස්ස හෙතු: යං හි පියො පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති. තස්මා තෙසං පියො අත්තා.

එවමෙතං මහාරාජ, එවමෙතං මහාරාජ, යෙ හි කෙචි මහාරාජ, කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති, තෙසං අප්පියො අත්තා. කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං, "පියො නො අත්තා"ති. අථ ඛො තෙසං අප්පියො අත්තා. තං කිස්ස හෙතු: යං හි මහාරාජ, අප්පියො අප්පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති. තස්මා තෙසං අප්පියො අත්තා.

යෙ ච ඛො කෙචි මහාරාජ, කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, තෙසං පියො අත්තා. කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං "අප්පියො නො අත්තාති", අථ ඛො තෙසං පියො අත්තා. තං කිස්ස හෙතු: යං හි මහාරාජ, පියො පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති. තස්මා තෙසං පියො අත්තාති.

අත්තානං චෙ පියං ජඤ්ඤා න නං පාපෙන සංයුජෙ,
න හි තං සුලභං හොති සුඛං දුක්කත[1]කාරිනා.

අන්තකෙනාධිපන්නස්ස ජහතො මානුසං භවං,
කිං හි තස්ස සකං හොති කිඤ්ච ආදාය ගච්ඡති,
කිඤ්චස්ස අනුගං හොති ඡායාව අනපායිනී?[2].

උභො පුඤ්ඤඤ්ච පාපඤ්ච යං මච්චො කුරුතෙ ඉධ,
තං හි තස්ස සකං හොති තඤ්ච[3] ආදාය ගච්ඡති,
තං චස්ස[4] අනුගං හොති ඡායාව අනපායිනී.

තස්මා කරෙය්‍ය කල්‍යාණං නිචයං සම්පරායිකං,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

3. 1. 5.

අත්තරක්ඛිතසුත්තං

116. සාවත්ථියං:—

එකමන්තං නිසින්නො ඛො රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: "ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො "උදපාදි: කෙසං නු ඛො රක්ඛිතො අත්තා, කෙසං අරක්ඛිතො අත්තා"ති.

1. දුක්කට - මජසං. ස්‍යා. 2. අනුපායිනී - ස්‍යා 3. තංව - මජසං. 4. චස්ස - මජසං.

වහන්ස, ඒ මට මෙල අදහස විය: යම් කිසි කෙනෙක් කයින් දුසිරිත් කෙරෙත් ද, වචනයෙන් දුසිරිත් කෙරෙත් ද, සිතින් දුසිරිත් කෙරෙත් ද, ඔවුන්ට තෙමේ අප්‍රිය ය. ඔවුන් "අපට තෙමේ ප්‍රිය ය"යි මෙසේ කියතුදු වැලිත් ඔවුන්ට තෙමේ අප්‍රිය ය. ඒ කවර හෙයින යත්: අප්‍රිය තැනැත්තේ අප්‍රියයාට යමක් කරන්නේ ඔහු එය තුමූ ම තමන්ට කෙරෙති. එහෙයින් ඔවුන්ට තෙමේ අප්‍රිය ය.

යම් කෙනෙක් කයින් සුසිරිත් කෙරෙත් ද, වචනයෙන් සුසිරිත් කෙරෙත් ද, සිතින් සුසිරිත් කෙරෙත් ද, ඔවුන්ට තෙමේ ප්‍රිය ය. ඔහු "අපට තෙමේ අප්‍රිය ය"යි මෙසේ කියන්නාහු නමුදු, වැලිත් ඔවුන්ට තෙමේ ප්‍රිය ය. ඒ කවර හෙයින යත්: ප්‍රිය තැනැත්තේ ප්‍රියයාට යමක් කරන්නේ නම් ඔහු එය තුමූ ම තමන්ට කෙරෙති. එහෙයින් ඔවුන්ට තෙමේ ප්‍රිය ය.

මහරජ, මෙල එසේ ය. මහරජ, මෙල එසේ ය. මහරජ, යම් කිසි කෙනෙක් කයින් දුසිරිත් කෙරෙත් ද, වචනයෙන් දුසිරිත් කෙරෙත් ද, සිතින් දුසිරිත් කෙරෙත් ද, ඔවුන්ට තෙමේ අප්‍රිය ය. කිසිසෙයෙකින් ඔහු "අපට තෙමේ ප්‍රිය ය" යි මෙසේ කියන්නාහු නමුදු, ඔවුන්ට තෙමේ අප්‍රිය ය. ඒ කවර හෙයින යත්: මහරජ, අප්‍රිය තැනැත්තේ අප්‍රියයාට යමක් කරන්නේ නම් ඔහු එය තුමූ ම තමන්ට කෙරෙති. එහෙයින් ඔවුන්ට තෙමේ අප්‍රිය ය.

මහරජ, යම් කිසි කෙනෙක් කයින් සුසිරිත් කෙරෙද්ද, වචනයෙන් සුසිරිත් කෙරෙද්ද, සිතින් සුසිරිත් කෙරෙද්ද ඔවුන්ට තෙමේ ප්‍රිය ය කිසියේ ඔහු "අපට තෙමේ අප්‍රිය ය" යි මෙසේ කියන්නාහු නමුදු, වැලිත් ඔවුන්ට තෙමේ ප්‍රිය ය. ඒ කවර හෙයින යත්: මහරජ, ප්‍රිය තැනැත්තේ ප්‍රියයාට යමක් කෙරේ නම් ඔහු එය තුමූ ම තමන්ට කෙරෙත්. එහෙයින් තෙමේ තමන්ට ප්‍රිය ය.

ඉදින් 'ආත්මය ප්‍රිය ය' යි දන්නේ නම් ඒ ආත්මය පව හා නො යොදන්නේ ය. පව් කරන්නහු විසින් ඒ සුවය සුව සේ නො ලද හැකි ය.

මරුවා විසින් වැතිරෙන ලද, මිනිස්භවය හැර දමන ඔහුට කිමෙක් තමන්ගේ වේ ද? කිමෙක් රැගෙණ යේ ද? වෙන් නො වන සෙවනැල්ල මෙන් කිමෙක් ඔහු අනු ව යන්නේ වේ ද?

මිනිස් තෙමේ මෙලෙව්හි යම් පින්පව් දෙකක් කෙරේ ද, එය ඔහුට සිය දෑ වෙයි. එය ම රැගෙණ යෙයි. වෙන් නො වන සෙවනැල්ල මෙන් එය ම ඔහු අනු ව යන්නේ වෙයි. එහෙයින් පරලොවට හිත දෑ රැස් කරන්නේ පින් කරන්නේ ය. පින් පරලෙව්හි දී සත්ඣයන්ට පිහිට වෙයි.

3. 1. 5.

116 සැවැත්නුවර—

අත්තරක්ඛිත සූත්‍රය

එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, මෙහි රහසිගත ව එකලාව හුන් මගේ සිත්හි "කවුරුන් විසින් ආත්මය රක්නා ලද්දේ ද, කවුරුන් විසින් ආත්මය නො රක්නා ලද්දේ දෑ"යි මෙබඳු විතර්කයෙක් පහළ විය.

තස්ස මය්හං භන්තෙ, එතදහොසි: යෙ බො[1] කෙචි කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති, තෙසං අරක්ඛිතො අත්තා. කිඤ්චාපි තෙ හත්ථිකායො වා රක්ඛෙය්‍ය, අස්සකායො වා රක්ඛෙය්‍ය, රථකායො වා රක්ඛෙය්‍ය, පත්තිකායො වා රක්ඛෙය්‍ය, අථ ඛො තෙසං අරක්ඛිතො අත්තා. තං කිස්ස හෙතු: බාහිරා හෙසා රක්ඛා, නෙසා රක්ඛා අජ්ඣත්තිකා. තස්මා තෙසං අරක්ඛිතො අත්තා. යෙ ච ඛො කෙචි කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, තෙසං රක්ඛිතො අත්තා. කිඤ්චාපි තෙ නෙව හත්ථිකායො රක්ඛෙය්‍ය, න අස්සකායො රක්ඛෙය්‍ය, න රථකායො රක්ඛෙය්‍ය, න පත්තිකායො රක්ඛෙය්‍ය, අථ ඛො තෙසං රක්ඛිතො අත්තා. තං කිස්ස හෙතු: අජ්ඣත්තිකා හෙසා රක්ඛා, නෙසා රක්ඛා බාහිරා. තස්මා තෙසං රක්ඛිතො අත්තාති.

එවමෙතං මහාරාජ, එවමෙතං මහාරාජ, යෙ හි කෙචි මහාරාජ කායෙන දුච්චරිතං චරන්ති - පෙ - තෙසං අරක්ඛිතො අත්තා. කිඤ්චාපි තෙ හත්ථිකායො වා රක්ඛෙය්‍ය, -පෙ- පත්තිකායො වා රක්ඛෙය්‍ය, අථ ඛො තෙසං අරක්ඛිතො අත්තා. තං කිස්ස හෙතු: බාහිරා හෙසා මහාරාජ රක්ඛා, නෙසා රක්ඛා අජ්ඣත්තිකා. තස්මා තෙසං අරක්ඛිතො අත්තා. යෙ ච ඛො කෙචි මහාරාජ, කායෙන සුචරිතං චරන්ති, -පෙ- මනසා සුචරිතං චරන්ති, තෙසං රක්ඛිතො අත්තා. කිඤ්චාපි තෙ නෙව හත්ථිකායො රක්ඛෙය්‍ය, -පෙ- න පත්තිකායො රක්ඛෙය්‍ය, අථ ඛො තෙසං රක්ඛිතො අත්තා. තං කිස්ස හෙතු: අජ්ඣත්තිකා හෙසා මහාරාජ, රක්ඛා, නෙසා රක්ඛා බාහිරා. තස්මා තෙසං රක්ඛිතො අත්තාති.

කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො,
මනසා සංවරො සාධු සාධු සබ්බත්ථ සංවරො,
සබ්බත්ථ සංවුතො ලජ්ජී රක්ඛිතොති පවුච්චතීති.

3. 1. 6.

අප්පකාසුත්තං.

117. සාවත්ථියං—

එකමන්තං නිසින්නො ඛො රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අප්පකා තෙ සත්තා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා න චෙව මජ්ජන්ති, න ච පමජ්ජන්ති, න ච කාමෙසු ගෙධං ආපජ්ජන්ති, න ච සත්තෙසු විප්පටිපජ්ජන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා මජ්ජන්ති චෙව පමජ්ජන්ති ච, කාමෙසු ච ගෙධං ආපජ්ජන්ති, සත්තෙසු ච විප්පටිපජ්ජන්තී"ති

1. යෙච ඛො - සහා.

වහන්ස, ඒ මට මේ අදහස විය: යම් කිසි කෙනෙක් කයින් දුසිරිත් කෙරෙද්ද, වචනයෙන් දුසිරිත් කෙරෙද්ද, සිතින් දුසිරිත් කෙරෙද්ද, ඔවුන් විසින් තෙමේ නොරක්නා ලද්දේ ය. කිසියේ ඔවුන් ඇත්මුළු හෝ රක්නේ නම්, අස්කැල හෝ රක්නේ නම්, රියපෙල හෝ රක්නේ නම්, පාබල සෙනඟ හෝ රක්නේ නම්, වැලිත් ඔවුන් විසින් තෙමේ නො රක්නා ලද්දේ ය. ඒ කවරහෙයින: මේ රැක්ම බැහැර ය. මේ රැක්ම ඇතුළත නො වේ. එහෙයින් ඔවුන් විසින් තෙමේ නො රක්නා ලද්දේ ය. යම් කිසි කෙනෙක් කයින් සුසිරිත් කෙරෙද්ද, වචනයෙන් සුසිරිත් කෙරෙද්ද, සිතින් සුසිරිත් කෙරෙද්ද, ඔවුන් විසින් තෙමේ රක්නා ලද්දේ ය. කිසිසෙයෙකින් ඔවුන් ඇත් මුළ නො ම රක්නේ නම්, අස්කැල නො ම රක්නේ නම්, රියපෙල නො ම රක්නේ නම්, පාබලසෙනඟ නො ම රක්නේ නම්' වැලිත් ඔවුන් විසින් තෙමේ රක්නා ලද්දේ ය. ඒ කවරහෙයින: මේ රැක්ම ඇතුළත ය, මේ රැක්ම බැහැර නො වේ. එහෙයින් ඔවුන් විසින් තෙමේ රක්නා ලද්දේ ය.

මහරජ, තෙල එසේ ය. මහරජ, තෙල එසේ ය. මහරජ, යම් කිසි කෙනෙක් කයින් දුසිරිත් කෙරෙද්ද, ... ඔවුන් විසින් තෙමේ නො රක්නා ලද්දේ ය. කිසිසේත් ඔවුන් ඇත්මුළු හෝ රක්නේ ද, ... පාබලසෙනඟ හෝ රක්නේ නම් වැලිත් ඔවුන් විසින් තෙමේ නො රක්නා ලද්දේ ය. ඒ කවර හෙයින: මහරජ, මේ රැක්ම බැහැර ය. මේ රැක්ම ඇතුළත නො වේ. එහෙයින් ඔවුන් විසින් තෙමේ නො රක්නා ලද්දේ ය. මහරජ, යම් කිසි කෙනෙක් කයින් සුසිරිත් කෙරෙද් ද, ... සිතින් සුසිරිත් කෙරෙද් ද, ඔවුන් විසින් තෙමේ රක්නා ලද්දේ ය. කිසි සේත් ඔවුන් ඇත්සෙනඟ නො ම රක්නේ නම් ... පාබලසෙනඟ නො ම රක්නේ නම් එහෙත් ඔවුන් විසින් තෙමේ රක්නා ලද්දේ ය. ඒ කවරහෙයින: මහරජ, මේ රැක්ම ඇතුළත ය, මේ රැක්ම බැහැර නො වේ. එහෙයින් ඔවුන් විසින් තෙමේ රක්නා ලද්දේ ය.

කයින් සංවරය මැනවි. වචනයෙන් සංවරය මැනවි. සිතින් සංවරය මැනවි. හැම තන්හි සංවරය මැනවි. හැම තන්හි සංවෘත වූ ලජ්ජා ඇත්තේ රැකුනේ ය යි කියනු ලැබේ.

3. 1. 6.

අප්පකා සූත්‍රය.

117. සැවැත්නුවර—

එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, මෙහි රහසිගත ව එකලා ව හුන් මගේ සිත්හි මෙබඳු විතර්කයෙක් පහළ වි ය. යම් කෙනෙක් ප්‍රණීත වූත් බොහෝ වූත් මහත් මහත් භෝගයන් ලැබ නො ම මත් වෙත් ද, නො ම පමා වෙත් ද, කාමයන්හි ගිජුබවටත් නො ද පැමිණෙද්ද, සතුන් කෙරෙහිත් වරදවා නො පිළිපදිද්ද, ඒ සත්ත්වයෝ ලොව ස්වල්පයහ. වැලිදු යම් කෙනෙක් ප්‍රණීත වූත් බොහෝ වූත් මහත් මහත් භෝගයන් ලැබ මත් වෙත් ද, පමාත් වෙද්ද, කාමයන්හි ගිජුබවටත් පැමිණෙද්ද, සතුන් කෙරෙහිත් වරදවා පිළිපදිද්ද, මේ සත්ත්වයෝ ම ලොව ඉතා බොහෝහ.

එවමේතං මහාරාජ, එවමේතං මහාරාජ, අප්පකා තෙ මහාරාජ සත්තා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා න චෙව මජ්ජන්ති, න ච පමජ්ජන්ති, න ච කාමෙසු ගෙධං ආපජ්ජන්ති, න ච සත්තෙසු විප්පටිපජ්ජන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා මජ්ජන්ති චෙව පමජ්ජන්ති ච, කාමෙසු ච ගෙධං ආපජ්ජන්ති, සත්තෙසු ච විප්පටිපජ්ජන්තීති.

සාරත්තා කාමභොගෙසු ගිද්ධා කාමෙසු මුච්ඡිතා,
අතිසාරං න බුජ්ඣන්ති මිගා කූටංව ඔඩ්ඩිතං,
පච්ඡාසං කටුකං හොති විපාකො හිස්ස පාපකොති.

3. 1. 7.

අඩ්ඩකරණසුත්තං.[1]

118 සාවත්ථියං—

එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ අඩ්ඩකරණෙ නිසින්නො පස්සාමි ඛත්තියමහාසාලෙපි බ්‍රාහ්මණමහාසාලෙපි ගහපතිමහාසාලෙපි අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං සම්පජානමුසා භාසන්තෙ, තස්ස මය්හං භන්තෙ එතදහොසි: අලන්දානි මෙ අඩ්ඩකරණෙන, භද්‍රමුඛො දානි අඩ්ඩකරණෙන පඤ්ඤායිස්සතීති.

*යෙ පි තෙ මහාරාජ ඛත්තියමහාසාලා බ්‍රාහ්මණමහාසාලා ගහපතිමහාසාලා අඩ්ඪා මහද්ධනා මහාභොගා පහූතජාතරූපරජතා පහූතවිත්තූපකරණා පහූතධනධඤ්ඤා කාමහෙතු කාමනිදානං කාමාධිකරණං සම්පජානමුසා භාසන්ති, තෙසං තං භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

සාරත්තා කාමභොගෙසු ගිද්ධා කාමෙසු මුච්ඡිතා,
අතිසාරං න බුජ්ඣන්ති මච්ඡා ඛිපං[2]ව ඔඩ්ඩිතං,
පච්ඡාසං කටුකං හොති විපාකො හිස්ස පාපකොති.

3. 1. 8.

මල්ලිකාසුත්තං.

119 සාවත්ථියං—

තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො මල්ලිකාය දෙවියා සද්ධිං උපරිපාසාදවරගතො හොති. අථ ඛො රාජා පසෙනදි කොසලො මල්ලිකං දෙවිං එතදවොච: අත්ථි නු ඛො තෙ මල්ලිකෙ කො චඤ්ඤො අත්තනා පියතරොති?

---

1. අට්ටකරණ සුත්තං - මජසං. 2. ඛිප්පං - මජසං. සගා. PTS. සී. 1, 2.

* ඉධ "එවමෙතං මහාරාජ, එවමෙතං මහාරජ" ඉතිපාඨො මරම්ම සාම පොත්ථකෙසු දිස්සතෙ.

මහරජ, එසේ ය. මහරජ, එසේ ය. මහරජ, යම් කෙනෙක් ප්‍රණීතවූත් බොහෝ වූත් තෙල මහත් මහත් භෝගයන් ලැබ නො ම මත් වෙද්ද, නො ම පමාත් වෙද්ද, කාමයන්හි ගිජුබවට නො ද මහත් මහත් පැමිණෙද්ද, සතුන් කෙරෙහිත් නො ද වරදවා පිළිපදිද් ද, ඒ සත්ත්වයෝ ලොව ඉතා ස්වල්පයහ. වැලිදු යම් කෙනෙක් ප්‍රණීත වූත් බොහෝ වූත් භොගයන් ලැබ මත් වෙද්ද පමාත් වෙද්ද, කාමයන්හි ගිජුබවටත් පැමිණෙත් ද, සතුන් කෙරෙහිත් වරදවා පිළිපදිද්ද, මේ සත්ත්වයෝ ම ලොව ඉතා බොහෝහ.

කාමවස්තූන්හි ඇලුනු කාමයන්හි ගිජු වූ මුසපත් වූ සත්ත්වයෝ කුසල් සීමාව ඉක්ම යැම නො දනිත්. දමන ලද පාසය නො දන්නා මුවන් මෙනි. පසු ව ඔවුන්ට දුක වෙයි. එහි විපාකය ඒකාන්තයෙන් ලාමක ය යි.

3. 1. 7.

අඩ්ඩකරණ සූත්‍රය.

118 **සැවැත්නුවර-**

එකත්පසෙක හුන් **පසේනදි කොසොල්රජ** භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: වහන්ස, මෙහි මම විනිශ්චයාසනයෙහි හුන්නෙම් ආඪ්‍ය වූ මහද්ධන ඇති මහත් භෝග ඇති බොහෝ රන්රිදී ඇති බොහෝ වූ මනවඩන ද ඇති බොහෝ ධනධාන්‍ය ඇති කැත් මහසලුන් ද, බමුණු මහසලුන් ද, ගැහැවි මහසලුන් ද කාමයන් හෙතු කොට ගෙණ කාමයන් නිදාන කොට ගෙණ කාමයන් කරුණු කොට ගෙණ දැන දැන මුසා බණන්නවුන් දකිමි. වහන්ස, ඒ මට "දැන් මා විසින් නඩු විසඳීමෙන් කම් නැත. දැන් නඩුහලෙහි සොඳුරුමුව ඇත්තෙක් නො පෙණේ ය" යි මේ අදහස විය.

මහරජ ආඪ්‍යවූ මහද්ධන ඇති මහත් භෝග ඇති බොහෝ වූ රන්රිදී ඇති බොහෝ වූ මනවඩන වස්තූපකරණ ඇති බොහෝවූ ධනධාන්‍ය ඇති යම් ඒ කැත්මහසල්ලූත්, බමුණු මහසල්ලූත්, ගැහැවි මහසල්ලූත් කාමයන් හේතු කොට ගෙණ කාමයන් නිදාන කොට ගෙණ කාමයන් කරුණු කොට ගෙණ දැන දැන මුසා බෙණෙද්ද, ඔවුන්ට එය බොහෝ කලක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේ ය.

කාමවස්තූන්හි ඇලුනු කාමයන්හි ගිජු වූ මුසපත් වූ සත්ත්වයෝ කුසල් ඉම ඉක්ම යැම නො දනිත්. අටවන ලද කෙම්නට තමන් වදනා බව නො දන්නා මසුන් මෙනි. පසු ව ඔවුන්ට දුක වේ. එහි විපාකය ඒකාන්තයෙන් ලාමක ය.

3. 1. 8.

මල්ලිකා සූත්‍රය.

119 **සැවැත්නුවර—**

එකල්හි **පසේනදි කොසොල්රජ මල්ලිකාදේවිය** සමග උතුම් පහයෙහි මතුම්හලව ගියේ වෙයි. ඉක්බිති පසේනදි කොසොල්රජ මල්ලිකා දෙවියට "මල්ලිකාවෙනි, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් තොපට ඇද්ද"යි තෙල කී ය.

නත්ථි ඛො මෙ මහාරාජ කො චඤ්ඤො අත්තනා පියතරො. තුය්හං පන මහාරාජ අත්ථඤ්ඤො කොචි අත්තනා පියතරොති? මය්හම්පි ඛො මල්ලිකෙ නත්ථඤ්ඤො කොචි අත්තනා පියතරොති.

අථ ඛො රාජා පසෙනදි කොසලො පාසාදා ඔරොහිත්වා[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ මල්ලිකාය දෙවියා සද්ධිං උපරිපාසාදවරගතො මල්ලිකං දෙවිං එතදවොචං: “අත්ථි නු ඛො තෙ මල්ලිකෙ කො චඤ්ඤො අත්තනා පියතරො”ති. එවං වුත්තෙ භන්තෙ මල්ලිකාදෙවී මං එතදවොච: “නත්ථි ඛො මෙ මහාරාජ කො චඤ්ඤො අත්තනා පියතරො. තුය්හං පන මහාරාජ අත්ථඤ්ඤො කොචි අත්තනා පියතරො”ති. එවං වුත්තාහං භන්තෙ මල්ලිකං දෙවිං එතදවොචං. “මය්හම්පි ඛො මල්ලිකෙ නත්ථඤ්ඤො කොචි අත්තනා පියතරො”ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං ගාථං අභාසි:

සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා
නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි,
එවං පියො පුථු අත්තා පරෙසං
තස්මා න හිංසෙ පරං අත්තකාමොති.[2]

3. 1. 9.

යඤ්ඤසුත්තං.

120. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන රඤ්ඤො **පසෙනදිස්ස**[3] **කොසලස්ස** මහායඤ්ඤො පච්චුපට්ඨිතො හොති. පඤ්ච ච උසභසතානි පඤ්ච ච වච්ඡතරසතානි පඤ්ච ච වච්ඡතරීසතානි පඤ්ච ච අජසතානි පඤ්ච ච උරබ්භසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය. යෙ පිස්ස තෙ හොන්ති දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්ති.

අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු.[4] සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ, රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස මහායඤ්ඤො පච්චුපට්ඨිතො හොති, පඤ්ච ච උසභසතානි පඤ්ච ච වච්ඡතරසතානි පඤ්ච ච වච්ඡතරීසතානි[5] පඤ්ච ච අජසතානි පඤ්ච ච උරබ්භසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය. යෙපිස්ස භන්තෙ[6] තෙ හොන්ති දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්තීති.

1. ඔතරිත්වා - සීමු. 2. පරමත්තකාමො - මජසං, 3. පසෙනදි කොසලස්ස - සීමු. 2. ස්‍යා. PTS. 4. පාවිසිංසු - PTS. 5. වච්ඡතරී – මජසං. ස්‍යා. 6. යෙපිස්ස තෙ – මජසං. ස්‍යා.

මහරජ, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් මට නැත. මහරජ, තමහට වඩා ප්‍රිය වූ අන් කිසිවෙක් තොපට ඇද්ද? මල්ලිකාවෙනි, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් මට ද නැත.

ඉක්බිති පසේනදි කොසොල්රජ පහයෙන් බැස භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය. වහන්ස, මෙහි මම මල්ලිකාදෙවිය සමග උතුම් පහාතලමත අරා සිටියෙම් මල්ලිකාදෙවියට "මල්ලිකාවෙනි, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් තොපට ඇද්දැ" යි තෙල කීමි. වහන්ස, මෙසේ කී කල්හි මල්ලිකා-දෙවිය මට "මහරජ, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් මට නැත. මහරජ, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් තොපට ඇද්දැ" යි තෙල බස් කිවු ය. වහන්ස, මෙසේ කියන ලද මම මල්ලිකාදෙවියට "මල්ලිකාවෙනි, තමහට වඩා ඉතා ප්‍රිය වූ අන් කිසිවෙක් මටත් නැතැ" යි තෙල කීයෙමි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලායෙහි මේ ගාථාව වදාළ සේක:

සියලු දිගුන් සිතින් අනුගමනය කොට තමහට වඩා ඉතා ප්‍රිය වූවකු කිසි තැනෙක නො ම ලදිමි. මෙසේ අන් බොහෝ දෙනාට ද තෙමේ ප්‍රිය ය. එහෙයින් තමහට වැඩ කැමැත්තේ මෙරමා නො පෙළන්නේ ය.

3. 1. 9.

යඤ්ඤ සූත්‍රය.

120. සැවැත්නුවර-

එකල්හි පසේනදි කොසොල් රජහට මහායාගයෙක් එළඹ සිටියේ වෙයි. පන්සියක් ගොන්නු ද, පන්සියක් තහඹුහු ද, පන්සියක් තැහැඹියෝද, පන්සියක් එළුවෝ ද, පන්සියක් තිරෙළුවෝ ද යාගය පිණිස වැඹ ඇරැ බඳනා ලද්දාහු වෙත්. ඔහුගේ දාසයෝ ය කියා හෝ දූතයෝ ය කියා හෝ කම්කරුවෝය කියා හෝ යම් ඒ කෙනෙක් වෙත්නම් ඔහුත් දඬුවමින් තැති ගත්තාහු බියෙන් තැති ගත්තාහු කඳුළු වැකුනු මුහුණු ඇත්තාහු අඬමින් පිරියම් කෙරෙත්.

ඉක්බිති බොහෝ භික්ෂූහු පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ සැවැත් නුවරට පිඩු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩ-පාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍ය-වතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ. වහන්ස, මෙහි පසේනදි කොසොල් රජහට මහායාගයෙක් එළඹ සිටියේ වෙයි. පන්සියක් ගොන්නු ද, පන්සියක් තහඹු වස්සෝ ද, පන්සියක් තහඹු වැස්සෝ ද, පන්සියක් එළුවෝ ද, පන්සියක් ලදරුමැඩහු ද යාගය පිණිස වැඹ ඇරැ බඳන ලදුවෝ වෙත්. ඔහුගේ දාසයෝ ය කියා හෝ දූතයෝ ය කියා හෝ කම්කරුවෝ ය කියා හෝ යම් ඒ කෙනෙක් වෙත් නම් ඔහුත් දඬුවමින් තැති ගත්තාහු බියෙන් තැති ගත්තාහු කඳුළු වැකුනු මුහුණු ඇත්තාහු හඬමින් පිරියම් කෙරෙත්.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගලං,
මහායඤ්ඤා මහාරම්භා[1] න තෙ හොන්ති මහප්ඵලා.

අජෙළකා ච ගාවො ච විවිධා යත්ථ හඤ්ඤරෙ,
න තං සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො.

යෙ ච යඤ්ඤා නිරාරම්භා යජන්ති අනුකුලං[2] සදා,
අජෙළකා ච ගාවො ච විවිධා නෙත්ථ හඤ්ඤරෙ

එතං සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො,
එතං යජෙථ මෙධාවී එසො යඤ්ඤො මහප්ඵලො.

එතං හි යජමානස්ස සෙය්‍යො හොති න පාපියො,
යඤ්ඤො ච විපුලො හොති පසීදන්ති ච දෙවතාති.

3. 1. 10.

බන්ධනසුත්තං.

121. **සාවත්ථියං—**

තෙන ඛො පන සමයෙන රඤ්ඤා **පසෙනදි[3]කොසලෙන** මහාජනකායො බන්ධාපිතො හොති, අප්පෙකච්චෙ රජ්ජූහි අප්පෙකච්චෙ අන්දූහි අප්පෙකච්චෙ සඞ්ඛලිකාහි.

අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ රඤ්ඤා පසෙනදිකොසලෙන මහාජනකායො බන්ධාපිතො අප්පෙකච්චෙ රජ්ජූහි අප්පෙකච්චෙ අන්දූහි අප්පෙකච්චෙ සඞ්ඛලිකාහීති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජඤ්ච,[4]
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා.

එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං,
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාම සුඛං පහායාති.

බන්ධනවග්ගො පඨමො.

---

1. නිරග්ගලං මහාරම්භා - මජසං. 2. අනුකුලං - PTS, යජන්තානුකුලං - සයා.
3. පසෙනදිනා - මජසං, PTS. 4. පබ්බජඤ්ච-මජසං-. සයා,. PTS.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලායෙහි මේ ගාථාවන් වදාළ සේක:

අස්සමෙධ ය, පුරිසමෙධ ය, සම්මාපාස ය, වාජපෙය්‍ය ය, නිරග්ගල ය යන (කෘත්‍ය වශයෙන්) මහත් ආරම්භ ඇති ඒ මහායාගයෝ මහත්ඵල නො වෙත්.

යම් යාගයෙක්හි නන්වැදෑරුම් වූ එළුතිරෙළුවෝ ද, ගෙරිහු ද නසනු ලැබෙත් නම් ඒ යාගයට සම්‍යක්ප්‍රතිපන්න වූ බුද්ධාදි මහර්ෂිහු නො පැමිණෙත්.

යම් යාග කෙනෙක් අල්පාරම්භ ඇත්තාහු ද, (එබඳු යාගයන්) කුලයක් පාසා හැම කල්හි කෙරෙත්. මෙහි නන්වැදෑරුම් වූ එළුතිරෙළුවෝ ද, ගෙරිහු ද නො නසනු ලැබෙත්.

සම්‍යක්ප්‍රතිපන්න වූ බුද්ධාදි මහර්ෂිහු මේ යාගයට පැමිණෙත්. නුවණැත්තේ තෙල යාගය කරන්නේ ය. තෙල යාගය මහත්ඵල ය.

තෙල යාගය කරන්නහුට වැඩීමෙක් වේ. පිරිහීමෙක් නො වේ. යාගය ද විපුල වේ. දෙවියෝත් පහදිති.

3. 1. 10.

බන්ධන සූත්‍රය.

121. **සැවැත්නුවර**—

එකල්හි පසේනදි කොසොල් රජු විසින් ඇතැම්හු රැහැණින් ද, ඇතැම්හු යදමින් ද, ඇතැම්හු හැකිල්ලෙන් දැ යි මෙසේ මහාජන පිරිස් බඳවන ලද්දාහු වෙත්.

එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරු හැඳ පොරොවා පාසිවුරු ගෙණ සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මෙහි පසේනදි කොසොල්රජු විසින් ඇතැම්හු රැහැණින් ද, ඇතැම්හු යදමින් ද, ඇතැම්හු හැකිල්ලෙන් දැ යි මෙසේ මහාජන පිරිස් බඳවන ලද්දාහු ය" යි තෙල සැළ කළහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලායෙහි මේ ගාථාවන් වදාළ සේක.

යමුවා වූ ද දැවමුවා වූ ද බබුස්තණමුවා වූ ද යම් බන්ධනයෙක් වේ ද, ඒ බන්ධනය දැඩි ය යි ප්‍රාඥයෝ නො කියත්. මිණිකොඬොල්හි ද දරුවන් කෙරෙහි ද අඹුවන් කෙරෙහි ද දැඩිඇලුමින් ඇලුනු යම් අපේක්ෂායෙක් වේ ද,

යට (=සිවු අපායට) ඇද ලන ලිහිල් වූ මිදීමට දුෂ්කර වූ මේ බන්ධනය දැඩි ය යි නුවණැත්තෝ කියත්. කාමයන්හි අපේක්ෂා නැත්තාහු මේ බන්ධනය ද සිඳ කම්සුව හැර දමා ගිහිගෙය හැර යෙත්.

බන්ධනවර්ගය පළමුවැනි යි.

තස්සුද්දානං:

දහරො පුරිසො රාජා පියං අත්තානරක්ඛිතො,
අප්පකා අඩ්ඩකරණා මල්ලිකා යඤ්ඤබන්ධනන්ති.

---

2. අපුත්තකවග්ගො

3. 2. 1.

සත්තජටිලසුත්තං.

122. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **පුබ්බාරාමෙ මිගාරමාතු-පාසාදෙ.** තෙන ඛො පන සමයෙන භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො බහිද්වාරකොට්ඨකෙ නිසින්නො හොති. අථ ඛො රාජා **පසෙනදි-කොසලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

තෙන ඛො පන සමයෙන සත්ත ච ජටිලා සත්ත ච නිගණ්ඨා සත්ත ච අචෙලකා[1] සත්ත ච එකසාටකා සත්ත ච පරිබ්බාජකා පරූළ්හකච්ඡනඛලොමා ඛාරිවිවිධමාදාය[2] භගවතො අවිදූරෙ අතික්කමන්ති. අථ ඛො රාජා පසෙනදි කොසලො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණ-ජාණුමණ්ඩලං පථවියං නිහන්ත්වා යෙන තෙ සත්ත ච ජටිලා සත්ත ච නිගණ්ඨා සත්ත ච අචෙලකා සත්ත ච එකසාටකා සත්ත ච පරිබ්බාජකා තෙනඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං නාමං සාවෙසි: රාජාහං භන්තෙ **පසෙනදි කොසලො**, -පෙ- රාජාහං භන්තෙ **පසෙනදි කොසලොති.**

අථ ඛො රාජා පසෙනදි කොසලො අචිරපක්කන්තෙසු තෙසු සත්තසු ච ජටිලෙසු සත්තසු ච නිගණ්ඨෙසු සත්තසු ච අචෙලකෙසු සත්තසු ච එකසාටකෙසු සත්තසු ච පරිබ්බාජකෙසු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: යෙ තෙ භන්තෙ ලොකෙ අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා එතෙ තෙසං අඤ්ඤතරාති.

දුජ්ජානං ඛො එතං මහාරාජ තයා ගිහිනා කාමභොගිනා පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තෙන කාසිකචන්දනං පච්චනුභොන්තෙන මාලාගන්ධවිලෙපනං ධාරයන්තෙන ජාතරූපරජතං සාදියන්තෙන 'ඉමෙ වා අරහන්තො ඉමෙ වා අරහත්තමග්ගං සමාපන්නා'ති.

---

1. අචෙලා - සයා. PTS. සී. 1 2. 2. ඛාරිවිධං ආදාය - PTS.

එහි උද්දානය:

දහර,, පුරිස, රාජ, පිය, අත්තරක්ඛිත, අප්පකා, අත්ථකරණ, මල්ලිකා, යඤ්ඤ, බන්ධන ය යි සූත්‍ර දශයෙකි.

---

2. අපුත්තක වර්ගය.

3. 2. 1.

සත්තජටිල සූත්‍රය.

122. **එක් කලෙක** භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **පුවරම්** නම් **මුවරමා පහයෙහි** වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පලසමවතින් නැඟී සිටියේක් බිහිදෙරකොටුවෙහි වැඩහුන් සේක. ඉක්බිති **පසේනදි කොසොල්** රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය.

එකල්හි වැඩුනු කැසතියලොම් ඇති ජටිලයෝ සත් දෙනෙක් ද, නිගණ්ඨයෝ සත් දෙනෙක් ද, අචේලකයෝ සත් දෙනෙක් ද, ඒකසාටකයෝ සත් දෙනෙක් ද, පරිව්‍රාජකයෝ සත් දෙනෙක් ද නත් තවුස්පිරිකර ගෙණ භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි (එ පෙදෙස) ගෙවා යෙති. ඉක්බිති පසේනදි කොසොල්රජ හුනස්නෙන් නැඟිට උතුරුසළුව එකස් කොට දකුණු දණමඬල පොළොවෙහි හැන ජටිලයන් සත්දෙන ද නිගණ්ඨයන් සත්දෙන ද අචේලකයන් සත්දෙන ද ඒකසාටකයන් සත්දෙන ද පරිව්‍රාජකයන් සත්දෙන ද වෙත ඇඳිලි බැඳ "වහන්ස, මම පසේනදි කොසොල් රජ වෙමි. ... වහන්ස, මම පසේනදි කොසොල්රජ වෙමි"යි තෙවරක් නම ඇස්වී ය.

ඉක්බිති ඒ ජටිලයන් සත්දෙන ද නිගණ්ඨයන් සත්දෙන ද අචෙලකයන් සත්දෙන ද ඒකසාටකයන් සත්දෙන ද පරිව්‍රාජකයන් සත්දෙන ද ගිය නොබෝ වෙලෙහි පසේනදි කොසොල්රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, ලොව යම් ඒ කෙනෙක් රහත්හු හෝ රහත්මඟට පිළිපන්නාහු හෝ වෙත් ද, තුලුහු ඔවුනතර එක්තරා කෙනෙකැ"යි තෙල සැළ කෙළේ ය.

මහරජ, ගිහි වූ කම්සැප විඳින දරුවන්ගෙන් පළිබොධ ඇති යහන්හි වෙසෙන සිතිඳු සඳුන් ගල්වන මල්ගඳවිලෙවුන් දරණ රන්රිදී ඉවසන තොප විසින් 'මොහු රහත්හු ය කියා හෝ මොහු රහත්මඟට පිළිපන්නෝ ය යි' කියා හෝ තෙල නොදත හැකි ය.

සංවාසෙන ඛො මහාරාජ සීලං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං[1]. මනසිකරොතා නො අමනසිකරොතා. පඤ්ඤවතා[2] නො දුප්පඤ්ඤෙන. සංවොහාරෙන ඛො මහාරාජ සොචෙය්‍යං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං[1]. මනසිකරොතා නො අමනසිකරොතා. පඤ්ඤවතා[2] නො දුප්පඤ්ඤෙන. ආපදාසු ඛො මහාරාජ ථාමො වෙදිතබ්බො. සො ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං[1]. මනසිකරොතා නො අමනසි-කරොතා. පඤ්ඤවතා[2] නො දුප්පඤ්ඤෙන. සාකච්ඡාය ඛො මහාරාජ පඤ්ඤා වෙදිතබ්බා. සා ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං[1]. මනසිකරොතා නො අමනසිකරොතා. පඤ්ඤවතා[2] නො දුප්පඤ්ඤෙනාති.

අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ, යාව සුභාසිතමිදං භන්තෙ භගවතා: 'දුජ්ජානං ඛො එතං මහාරාජ තයා ගිහිනා කාමභොගිනා -පෙ- පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනා'ති.

එතෙ භන්තෙ මම පුරිසා චාරා[3] ඔචරකා ජනපදං ඔචරිත්වා ආගච්ඡන්ති. තෙහි පඨමං ඔචිණ්ණං[4] අහං පච්ඡා ඔයායිස්සාමි[5]. ඉදානි තෙ භන්තෙ රජොජල්ලං පවාහෙත්වා සුන්හාතා සුවිලිත්තා කප්පිතකෙසමස්සු ඔදාතවත්ථ-වසනා[6] පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙස්සන්තීති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

න වණ්ණරූපෙන නරො සුජානො
න විස්සසෙ ඉත්තරදස්සනෙන,
සුසඤ්ඤතානං හි වියඤ්ජනෙන
අසඤ්ඤතා ලොකමිමං චරන්ති.

පතිරූපකො මත්තිකා[7] කුණ්ඩලොව
ලොහඩ්ඪමාසොව සුවණ්ණච්ඡන්නා,
චරන්ති එකෙ[8] පරිවාරඡන්නා
අන්තො අසුද්ධා බහි සොභමානාති.

3. 2. 2.

පඤ්චරාජසුත්තං.

123. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන පඤ්චන්නං රාජූනං පසෙනදිපමුඛානං පඤ්චහි කාමගුණෙහි සමප්පිතානං සමඞ්ගීභූතානං පරිචාරයමානානං අයමන්තරා කථා උදපාදි: කින්නු ඛො කාමානං අග්ගන්ති?

1. ඉතරං – PTS. ස්‍යා. 2. පඤ්ඤාවතා - PTS. 3. චොරා – සීමු. 2 චරා - මජසං. PTS. 4. ඔචිණ්ණං – සී මු2 5. ඔසාපයිස්සාමි - මජසං., PTS. ඔහයිස්සාමි - ස්‍යා. 6. ඔදාත වත්ථා – මජසං., PTS. 7. මත්තිකා - ස්‍යා. PTS. 8. ලොකෙ - මජසං., ස්‍යා.

මහරජ, එක් ව විසීමෙන් ශීලය දත යුතු ය. එ ද දිගුකලෙකිනි. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසිනි. නොමෙනෙහි කරන්නහු විසින් නො වේ. පැණැත්තහු විසිනි. පැණ නැතියහු විසින් නො වේ. මහරජ, කථාව්‍යවහාරයෙන් පවිත්‍රබව දත යුතු ය. එ ද දිගුකලෙකිනි. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසිනි. නො මෙනෙහි කරන්නහු විසින් නො වේ. නුවණැත්තහු විසිනි. නුවණ නැතියහු විසින් නො වේ. මහරජ, විපතෙහි දී ඥනශක්තිය දත යුතු ය. එ ද දිගුකලෙකිනි. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසිනි. නො මෙනෙහි කරන්නහු විසින් නොවේ. නුවණැත්තහු විසිනි. මූඪයා විසින් නො වේ. මහරජ, සාකච්ඡා යෙන් නුවණ දත යුතු ය. එ ද දිගුකලෙකිනි. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසිනි. නො මෙනෙහි කරන්නහු විසින් නො වේ. නුවණැත්තහු විසිනි. ඥනහීනයා විසින් නො වේ.

වහන්ස, ආශ්චර්යයෙකි. වහන්ස, අද්භූතයෙකි. වහන්ස, "මහරජ ගිහි වූ කම්සැප විඳින තොප විසින් මෙය දුකසේ දතයුතුය ... නුවණැත්තහු විසිනි. නුනුවණහු විසින් නො වේ ය" යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ඉතා මැනවින් දේශනා කරණ ලදි.

වහන්ස, මොහු මාගේ පවත් විමසන චරපුරුෂයෝ ය. . ජනපදය විමසා එති. ඔවුන් විසින් පළමු කොට විමසන ලද පෙදෙසට මම පසු ව බැස ගන්නෙමි. වහන්ස, දැන් ඔහු රජස්දූලි සෝද හැර මොනවට නැවාහු මොනවට සුවඳවිලෙවුන් ගැල්වූවාහු අන්දම් තබා සැරසූ කෙස්රවුළු ඇත්තාහු සුදුවත් හැඳ ගත්තාහු පස්කම්ගුණයෙන් පිණා ගියාහු යුක්ත වූවාහු ඉඳුරන් හසුරු වන්නාහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ගාථාවන් වදාළ සේක:

මිනිස් තෙමේ රූපවහනින් මැනවින් නො දත හැකි ය. සවල්පමාත්‍ර දශීනයෙන් නො අදහන්නේ ය. ඒ එසේ මැයි. සංයම නැත්තෝ මනා- සංයම ඇත්තන්ගේ පරිෂ්කාරභාණ්ඩලක්ෂණයෙන් යුක්ත ව මෙලොව හැසිරෙත්.

ඇතුළත අපිරිසිදු වූ පිටත හොබනා වූ ඇතැම් කෙනෙක් ස්වර්ණප්‍රති- රූපක වූ මැටිමුවා කොඩොලක් මෙන් ද, රණින් වැසුනු ලෝහොමුවා අඩමස්සක් මෙන් ද පිරිවරින් වැසුනාහු හැසිරෙත්.

3. 2. 2.

පඤ්චරාජ සුත්‍රය.

123. සැවැත්නුවර—

එකල්හි පස්කම්ගුණයෙන් පිණා ගියා වූ එයින් යුක්ත වූ ඉඳුරන් පිණවන්නා වූ පසේනදි කොසොල් රජුන් ප්‍රමුඛ කොට ඇති පස් රජුන් අතර "කාමවස්තු අතුරෙන් කුමක් අග්‍ර ද?" යන මේ අතුරු කතාව පහළ විය.

තත්‍රෙකච්චෙ එවමාහංසු: රූපා කාමානං අග්ගන්ති. එකච්චෙ එවමාහංසු: සද්දා කාමානං අග්ගන්ති. එකච්චෙ එවමාහංසු: ගන්ධා කාමානං අග්ගන්ති. එකච්චෙ එවමාහංසු: රසා කාමානං අග්ගන්ති. එකච්චෙ එවමාහංසු: ඵොට්ඨබ්බා කාමානං අග්ගන්ති. යතො ඛො තෙ රාජානො[1] නාසක්ඛිංසු අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙතුං. අථ ඛො රාජා පසෙනදි කොසලො තෙ රාජානො එතදවොච: ආයාම මාරිසා යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම. උපසඞ්කමිත්වා භගවන්තං එතමත්ථං පටිපුච්ඡිස්සාම, යථා නො භගවා ව්‍යාකරිස්සති තථා නං ධාරෙස්සාමාති[2]

එවං මාරිසාති ඛො තෙ රාජානො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පච්චස්සොසුං. අථ ඛො තෙ පඤ්ච රාජානො පසෙනදිපමුඛා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: "ඉධ භන්තෙ අම්හාකං පඤ්චන්නං රාජූනං පඤ්චහි කාමගුණෙහි සමප්පිතානං සමඞ්ගීභූතානං පරිචාරයමානානං අයමන්තරා කථා උදපාදි: කින්නු ඛො කාමානං අග්ගන්ති?. එකච්චෙ එවමාහංසු: රූපා කාමානං අග්ගන්ති. එකච්චෙ එවමාහංසු: සද්දා -පෙ- ඵොට්ඨබ්බා කාමානං අග්ගන්ති. කින්නු ඛො භන්තෙ කාමානං අග්ග"න්ති?

මනාපපරියන්තං ඛ්වාහං මහාරාජ පඤ්චසු කාමගුණෙසු අග්ගන්ති වදාමි. තෙ'ව[3] මහාරාජ රූපා එකච්චස්ස මනාපා හොන්ති. තෙ'ව[3] රූපා එකච්චස්ස අමනාපා හොන්ති. යෙහි ච යො රූපෙහි අත්තමනො හොති. පරිපුණ්ණ-සඞ්කප්පො, සො තෙහි රූපෙහි අඤ්ඤං රූපං උත්තරිතරං වා පණීතතරං වා න පත්ථෙති. තෙ තස්ස රූපා පරමා හොන්ති. තෙ තස්ස රූපා අනුත්තරා හොන්ති.

තෙ'ව[3] මහාරාජ සද්දා -පෙ- තෙ'ව මහාරාජ ගන්ධා -පෙ- තෙ'ව[3] මහාරාජ රසා -පෙ- තෙ'ව[3] මහාරාජ ඵොට්ඨබ්බා එකච්චස්ස මනාපා හොන්ති. තෙ'ව[3] ඵොට්ඨබ්බා එකච්චස්ස අමනාපා හොන්ති. යෙහි ච යො ඵොට්ඨබ්බෙහි අත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො, සො තෙහි ඵොට්ඨබ්බෙහි අඤ්ඤං ඵොට්ඨබ්බං උත්තරිතරං වා පණීතතරං වා න පත්ථෙති. තෙ තස්ස ඵොට්ඨබ්බා පරමා හොන්ති. තෙ තස්ස ඵොට්ඨබ්බා අනුත්තරා හොන්තීති.

තෙන ඛො පන සමයෙන චන්දනඞ්ගලිකො උපාසකො තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො චන්දනඞ්ගලිකො උපාසකො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා, පටිභාති මං සුගතාති.

"පටිභාතු තං චන්දනඞ්ගලිකාති" භගවා අවොච.

අථ ඛො චන්දනඞ්ගලිකො උපාසකො භගවතො සම්මුඛා තදනුරූපාය ගාථාය අභිත්ථවි:

---

1. මහාරාජානො - සීමු 1. 2. ධාරෙය්‍යාමාති - සීමු 2. ස්‍යා, PTS. 3. තෙ ච - සීමු, 2. PTS. යෙ ච - ස්‍යා.

එහි ඇතැම් කෙනෙක් කාමවස්තූන් අතුරෙන් රූපයෝ අග්‍රහ යි මෙසේ කී හ. ඇතැම් කෙනෙක් කාමවස්තූන් අතුරෙන් ශබ්දයෝ අග්‍රහ යි මෙසේ කී හ. ඇතැම් කෙනෙක් කාමවස්තූන් අතුරෙන් ගන්ධයෝ අග්‍රහ යි මෙසේ කී හ. ඇතැම් කෙනෙක් කාමවස්තූන් අතුරෙන් රසයෝ අග්‍රහ යි මෙසේ කී හ. ඇතැම් කෙනෙක් කාමවස්තූන් අතුරෙන් ස්ප්‍රෂ්ටව්‍යයෝ අග්‍රහ යි මෙසේ කී හ. යම් හෙයෙකින් ඒ රජවරු ඔවුනොවුන් හඟවන්නට නො හැකි වූහු ද? එකල **පසේනදි කොසොල්** රජ තෙමේ ඒ රජවරුන්ට "නිදුකානෙනි, යම්හ, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙම්හ. එළඹ භාග්‍යවතුන් වහන්සේ ගෙන් මේ කරුණ විචාරන්නමෝ යම් පරිද්දෙකින් භාග්‍යවතුන් වහන්සේ අපට විසඳන සේක් ද, එපරිද්දෙන් එය දරන්නෙමු"යි තෙල කී ය.

නිදුකානෙනි, එසේ ය යි ඒ රජවරු පසේනදි කොසොල්රජහට පිළිතුරු දුන්හ. ඉක්බිති පසේනදි කොසොල්රජ ප්‍රමුඛ කොට ඇති ඒ පස් රජහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් **පසේනදි කොසොල්** රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය. වහන්ස, මෙහි පස්කම්ගුණෙන් පිණාගියා වූ එයින් යුක්ත වූ ඉඳුරන් හසුරුවන්නා වූ අප පස් රජුන් අතර–කාමවස්තූන් අතුරෙන් කිමෙක් අග්‍ර ද" යන මේ අතුරු කතාව පහළ විය. ඇතැම් කෙනෙක් කාමවස්තූන් අතුරෙන් රූපයෝ අග්‍රහ යි මෙසේ කීහ. ඇතැම් කෙනෙක් ශබ්දයෝ ...... කාමවස්තූන් අතුරෙන් ස්ප්‍රෂ්ටව්‍යයෝ අග්‍රහ යි මෙසේ කීහ. වහන්ස, කාමවස්තූන් අතුරෙන් කිමෙක් අග්‍ර ද?

මහරජ, මම වනාහි පඤ්චකාමගුණයන් අතුරෙන් මනාපය කෙළවර කොට ඇත්තේ අග්‍රය යි කියමි. මහරජ, ඒ රූපයෝ ම ඇතමකුට මනාප වෙත්. ඒ රූපයෝ ම ඇතමකුට අමනාප වෙත්. යමෙක් යම් රූපවලින් සතුටු සිත් ඇත්තේ පිරිපුන් සඞ්කල්ප ඇත්තේ වේ ද, හෙ තෙමේ ඒ රූපයන්ට වඩා ඉතා උසස් වූ හෝ ඉතා ප්‍රණීත වූ හෝ අන් රූපයක් නො පතයි. ඔහුට ඒ රූපයෝ උතුම් වෙත්. ඔහුට ඒ රූපයෝ අනුත්තර වෙත්.

මහරජ, ඒ ශබ්දයෝ ම ... මහරජ, ඒ ගන්ධයෝ ම ... මහරජ, ඒ රසයෝ ම ... මහරජ, ඒ ස්ප්‍රෂ්ටව්‍යයෝ ම ඇතමකුට මනාප වෙත්. ඒ ස්ප්‍රෂ්ටව්‍යයෝ ම ඇතමකුට අමනාප වෙත්. යමෙක් යම් ස්ප්‍රෂ්ටව්‍යයන්ගෙන් සතුටු සිත් ඇත්තේ පිරිපුන් සඞ්කල්ප ඇත්තේ වේ ද, හෙ තෙමේ ඒ ස්ප්‍රෂ්ටව්‍යයන්ට වඩා ඉතා උසස් වූ හෝ ඉතා ප්‍රණීත වූ හෝ අන් ස්ප්‍රෂ්ටව්‍යයක් නො පතයි. ඔහුට ඒ ස්ප්‍රෂ්ටව්‍යයෝ උතුම් වෙත්. ඔහුට ඒ ස්ප්‍රෂ්ටව්‍යයෝ අනුත්තර වෙත්.

එකල්හි චන්දනඞ්ගලික උපාසක තෙමේ ඒ පිරිස්හි හුන්නේ වේ. ඉක්බිති චන්දනඞ්ගලික උපාසක තෙමේ හුනස්නෙන් නැගිට උතුරුසළුව එකඟ කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මට වැටහෙයි, සුගතයන් වහන්ස, මට වැටහේ ය" යි තෙල සැළ කෙළේ ය:

"චන්දනඞ්ගලික, තොපට වැටහේවා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති චන්දනඞ්ගලික උපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි ඊට සුදුසු ගාථායෙන් සතුති කෙළේ ය.

පදුමං යථා කොකනදං සුගන්ධං
පාතො සියා ඵුල්ලමවීතගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තලික්ඛෙති.

අථ ඛො තෙ පඤ්ච රාජානො චන්දනඞ්ගලිකං උපාසකං පඤ්චහි උත්තරාසඞ්ගෙහි අච්ඡාදෙසුං. අථ ඛො චන්දනඞ්ගලිකො උපාසකො තෙහි පඤ්චහි උත්තරාසඞ්ගෙහි භගවන්තං අච්ඡාදෙසීති.

3. 2. 3.

දොණපාකසුත්තං.

124. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන රාජා **පසෙනදි කොසලො** දොණපාකං සුදං[1] පරිභුඤ්ජති. අථ ඛො රාජා පසෙනදි කොසලො භුත්තාවී මහස්සාසී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

අථ ඛො භගවා තං රාජානං පසෙනදිං කොසලං භුත්තාවිං මහස්සාසිං විදිත්වා තායං වෙලායං ඉමං ගාථං අභාසි:

මනුජස්ස සදා සතීමතො මත්තං ජානතො ලද්ධභොජනෙ,
තනු තස්ස[2] භවන්ති වෙදනා සනිකං ජීරති ආයුපාලයන්ති.

තෙන ඛො පන සමයෙන **සුදස්සනො** මාණවො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පිට්ඨිතො ඨිතො හොති. අථ ඛො රාජා පසෙනදි කොසලො සුදස්සනං මාණවං ආමන්තෙසි: "එහි ත්වං තාත සුදස්සන, භගවතො සන්තිකෙ ඉමං ගාථං පරියාපුණිත්වා මම භත්තාභිහාරෙ භාස. අහඤ්ච තෙ දෙවසිකං කහාපණසතං නිච්චභික්ඛං[3] පවත්තයිස්සාමීති" එවං දෙවාති ඛො සුදස්සනො මාණවො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා[4] භගවතො සන්තිකෙ ඉමං ගාථං පරියාපුණිත්වා පසෙනදිස්ස කොසලස්ස භත්තාභිහාරෙ සුදං භාසති:

"මනුජස්ස සදා සතීමතො මත්තං ජානතො ලද්ධභොජනෙ,
තනු තස්ස[2] භවන්ති වෙදනා සනිකං ජීරති ආයුපාලයන්ති."

අථ ඛො රජා පසෙනදි කොසලො අනුපුබ්බෙන නාළිකොදනපරමතාය සණ්ඨාසි. අථ ඛො රජා පසෙනදි කොසලො අපරෙන සමයෙන සල්ලිඛිතගත්තො[5] පාණිනා ගත්තානි අනුමජ්ජන්තො තායං වෙලායං ඉමං උදානං උදානෙසි: "උභයෙන වත මං සො භගවා අත්ථෙන අනුකම්පි, දිට්ඨධම්මිකෙන චෙව අත්ථෙන සම්පරායිකෙන චා"ති.

1. දොණපාකකුරං – මජ්සං. දොණපාකසුදං – සීමු. 2. තනුකාස්ස – මජ්සං, සයා.
3 නිච්චං භික්ඛං – මජ්සං. නිච්චභත්තං - සයා. 4. පටිස්සුණිත්වා - සයා PTS.
5. සුසල්ලිඛිතගත්තො - මජ්සං. සයා.

සුවඳ ඇති රත් පියුම අලුයම පිපුනේ යම්සේ පහ නො වූ සුවඳ ඇත්තේ වන්නේ ද, එසෙයින් අහසෙහි බබලන හිරු මෙන් විරාජමාන වූ බුදුරජානන් වහන්සේ බලව.

ඉක්බිති ඒ පස් රජහු උතුරුසළු පසෙකින් චණ්ඩභාලික උපාසකයා හැඳවූහ. ඉක්බිති චණ්ඩභාලික උපාසක තෙමේ ඒ උතුරුසළු පසින් භාග්‍යවතුන් වහන්සේ පිදී ය.

3. 2. 3.

දොණපාක සූත්‍රය.

124. **සැවැත්නුවර—**

එකල්හි **පසේනදි කොසොල්** රජ තෙමේ නිඹක්සාලෙහි බත අනුභව කෙරෙයි. ඉක්බිති පසේනදි කොසොල් රජ තෙමේ අනුභව කෙලේ මහත් කොට සුසුම් හෙළන සුලු වූයේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ පසේනදි කොසොල් රජු, අනුභව කළහු, මහත් කොට සුසුම් හෙළන්නහු දූන ඒ වේලාවෙහි මේ ගාථාව වදාළ සේක:

හැම කල්හි සිහි ඇති, ලද බොජුන්හි පමණ දන්නා ඒ මිනිසාගේ (දුඃඛ). වේදනාවෝ තුනී වෙත්. (වැළඳූ අහර) සෙමෙන් දිරයි. ආයුෂ රක්නේයි.

එකල්හි **සුදස්සන** මාණවක තෙමේ කොසොල් රජු පිටිපස සිටියේ වෙයි. ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ සුදස්සන මාණවකයා ඇමතී ය. දරුව, සුදස්සන, එව තෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගය පිරිවහා මා බත් වළඳන කල්හි කියව. මම ද තට දවස් පතා කහවණු සියයක නිත්‍ය-භික්‍ෂාවක් (=වැටුපක්) පවත්වන්නෙමි යි. එසේ ය, දේවයන් වහන්සැ යි සුදස්සන මාණවක තෙමේ පසේනදි කොසොල් රජහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව පිරිවහා පසේනදි කොසොල් රජු බත් වළඳන කල්හි කියයි:

"හැම කල්හි සිහි ඇති, ලද බොජුන්හි පමණ දන්නා ඒ මිනිසාගේ (දුඃඛ) වේදනාවෝ තුනී වෙත්. (වැළඳූ අහර) සෙමෙන් දිරයි. ආයුෂ රක්නේයි.

ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ පිළිවෙළින් සහල් නැළියක බත වැඩි ම ආහාරය කොට ඇති බැව්හි සිටියේ ය. ඉක්බිති පසේනදි කොසොල් රජ තෙමේ පසු කලෙක සැහැල්ලු සිරුරු ඇත්තේ අතින් ශරීරාවයවයන් පිරිමදනේ ඒ වේලාවෙහි "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙලොව අභිවෘද්ධියෙන් ද, පරලොව අභිවෘද්ධියෙන් ද යන උභයාර්ථයෙන් ම මට අනුකම්පා කළ සේකැ"යි මේ ප්‍රීති_වාක්‍යය පහළ කෙළේ ය.

3. 2. 4.

පඨමසඞ්ගාමසුත්තං.

125. **සාවත්ථියං—**

අථ ඛො රාජා මාගධො **අජාතසත්තු** වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රාජානං **පසෙනදිං කොසලං** අබ්භුය්‍යාසි යෙන **කාසි.**

අස්සොසි ඛො රාජා පසෙනදි කොසලො "රාජා කිර මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා මමං අබ්භුය්‍යාතො යෙන කාසී"ති. අථ ඛො රාජා පසෙනදි කොසලො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං පච්චුය්‍යාසි යෙන කාසි.

අථ ඛො රාජා ච මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජා ච පසෙනදි කොසලො සඞ්ගාමෙසුං. තස්මිං ඛො පන සඞ්ගාමෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජානං පසෙනදිං කොසලං පරාජෙසි. පරාජිතො ච රාජා පසෙනදි කොසලො සකමෙව රාජධානිං සාවත්ථිං පායාසි[1].

අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

ඉධ භන්තෙ රජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රජානං පසෙනදිං කොසලං අබ්භුය්‍යාසි යෙන කාසි. අස්සොසි ඛො භන්තෙ රජා පසෙනදි කොසලො "රජා කිර මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා මමං අබ්භුය්‍යාතො යෙන කාසී"ති. අථ ඛො භන්තෙ රජා පසෙනදි කොසලො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං පච්චුය්‍යාසි යෙන කාසි. අථ ඛො භන්තෙ රජා ච මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රජා ච පසෙනදි කොසලො සඞ්ගාමෙසුං.

තස්මිං ඛො පන භන්තෙ, සඞ්ගාමෙ රාජා මාගධො **අජාතසත්තු** වෙදෙහිපුත්තො රජානං **පසෙනදිං** කොසලං පරාජෙසි. පරාජිතො ච භන්තෙ, රජා පසෙනදි කොසලො සකමෙව රාජධානිං සාවත්ථිං පායාසීති.

රාජා භික්ඛවෙ, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පාපමිත්තො පාපසහායො පාපසම්පවඞ්කො. රජා ච ඛො භික්ඛවෙ, පසෙනදි කොසලො කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. අජ්ජතඤ්ච[2] භික්ඛවෙ රජා පසෙනදි කොසලො ඉමං රත්තිං දුක්ඛං සෙස්සති[3] පරාජිතොති.

ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතො,
උපසන්තො සුඛං සෙති හිත්වා ජයපරාජයන්ති.

1. පච්චුය්‍යාසි - මජ්ඣසං. ස්‍යා, - සීමු 1. 2. අජ්ජෙව - මජ්ඣසං. සී 1. ස්‍යා, 3. සෙති, මජ්ඣසං. සී 1.

3. 2. 4.

පඨමසඞ්ගාම සූත්‍රය.

125. **සැවැත්නුවර**—

එකල්හි මගධේශ්වර වූ වේදේහිපුත්‍ර **අජාතසත්තු** රජ තෙමේ සිවුරඟ සෙනඟ (සත්‍රාඟ) සන්නද්ධ කොට ගෙණ **පසේනදි කොසොල්** රජුට විරුද්ධ ව යුද පිණිස කසී ගම කරා ඉදිරියට ගියේ ය.

පසේනදි කොසොල් රජ තෙමේ "මගධේශ්වර වූ වෙදෙහිපුත්‍ර අජාතසත්තු රජ සිවුරඟ සෙනඟ සරසා ගෙණ මට විරුද්ධ ව යුද පිණිස කසී ගම කරා පැමිණියේ ය"යි ඇසී ය. ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ සිවුරඟ සෙනඟ සරසවා ගෙණ මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජුට විරුද්ධ ව කසී ගම කරා යුද පිණිස ඉදිරියට ගියේ ය.

මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ ද, පසේනදි කොසොල්රජ තෙමේ ද යුද කළ හ. ඒ යුදෙහි දී මගධේශ්වරවූ වේදේහි-පුත්‍ර අජාතසත්තුරජ තෙමේ පසේනදි කොසොල්රජු පැරදවී ය. පැරදුනු පසේනදි කොසොල්රජ තෙමේ සවකීය රජධානිය වූ සැවැනුවරට ම පෙරළා ගියේ ය.

ඉක්බිති බොහෝ භික්‍ෂූහු පෙරවරු හැඳ පොරොව පා සිවුරු ගෙණ සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ.

වහන්ස, මෙහි මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ සිවුරඟ සෙනඟ සරසා ගෙණ පසේනදි කොසොල් රජුට විරුද්ධ ව යුද පිණිස කසීගම කරා ඉදිරියට ගියේ ය. වහන්ස, පසේනදි කොසොල් රජ තෙමේ "මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ මට විරුද්ධ ව යුද පිණිස සිවුරඟ සෙනඟ සරසා ගෙණ කසීගම කරා ඉදිරියට ගියේ ය"යි ඇසී ය. වහන්ස, ඉක්බිති පසේනදි කොසොල් රජ තෙමේ සිවුරඟ සෙනඟ සරසා ගෙණ මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජුට විරුද්ධ ව යුද පිණිස කසීගම කරා ඉදිරියට ගියේ ය. වහන්ස, එකල්හි මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ ද, පසේනදි කොසොල්රජ තෙමේ ද යුද කළ හ.

වහන්ස, ඒ යුදෙහි දී මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ පසේනදි කොසොල් රජු පැරද වීය. වහන්ස, පැරදුනු පසේනදි කොසොල් රජ තෙමේ සිය රජධානිය වූ සැවැත්නුවරට ම පෙරළා ගියේ ය.

මහණෙනි, මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ පවිටු මිතුරන් ඇත්තේ ය. පවිටු යහළුවන් ඇත්තේ ය. පවිටන් කෙරෙහි නැමුනේ ය. මහණෙනි, පසේනදි කොසොල්රජ තෙමේ කලණ මිතුරන් ඇත්තේ ය. කලණ යහළුවන් ඇත්තේ ය. කලණයන් කෙරෙහි නැමුනේ ය. මහණෙනි, පසේනදි කොසොල්රජ තෙමේ පැරදුනේ අද මේ රැයත් දුක සේ හොවින්නේ ය.

දිනන්නේ වෛරී ජනයා ලබයි. පැරදුනේ දුක සේ වෙසෙයි. දිනුම් පැරදුම් දෙක හැර සන්සිඳුනේ සුව සේ වෙසෙයි.

3. 2. 5.

දුතියසඞ්ගාමසුත්තං.

126. සාවත්ථියං—

අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රාජානං පසෙනදිං කොසලං අබ්භුය්‍යාසි යෙන කාසි.[1] අස්සොසි ඛො රාජා පසෙනදි කොසලො රාජා කිර මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා මමං අබ්භුය්‍යාතො යෙන කාසීති.

අථ ඛො රාජා පසෙනදි කොසලො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං පච්චුය්‍යාසි යෙන කාසි.[1] අථ ඛො රාජා ච මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජා ච පසෙනදි කොසලො සඞ්ගාමෙසුං. තස්මිං ඛො පන සඞ්ගාමෙ රාජා පසෙනදි කොසලො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං පරාජෙසි, ජීවගාහඤ්ච[2] නං අග්ගහෙසි.

අථ ඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස එතදහොසි: කිඤ්චාපි ඛො ම්‍යායං රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො අදුබ්භන්තස්ස දුබ්භති. අථ ච පන මෙ භාගිනෙය්‍යො හොති. යන්නූනාහං රඤ්ඤො මාගධස්ස අජාතසත්තුනො[3] වෙදෙහිපුත්තස්ස සබ්බං හත්ථිකායං පරියාදියිත්වා සබ්බං අස්සකායං පරියාදියිත්වා සබ්බං රථකායං පරියාදියිත්වා සබ්බං පත්තිකායං පරියාදියිත්වා ජීවන්තමෙව නං ඔස්සජෙය්‍යන්ති[4].

අථ ඛො රාජා පසෙනදි කොසලො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුනො වෙදෙහිපුත්තස්ස සබ්බං හත්ථිකායං පරියාදියිත්වා -පෙ- ජීවන්තමෙව නං ඔස්සජ්ජි[5].

අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

ඉධ භන්තෙ, රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රාජානං පසෙනදිං කොසලං අබ්භුය්‍යාසි යෙන කාසි. අස්සොසි ඛො භන්තෙ, රාජා පසෙනදිකොසලො -පෙ- කාසීති. අථ ඛො භන්තෙ, රාජා පසෙනදි කොසලො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං පච්චුය්‍යාසි යෙන කාසි. අථ ඛො භන්තෙ, රාජා ච මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජා ච පසෙනදි කොසලො සඞ්ගාමෙසුං. තස්මිං ඛො පන භන්තෙ, සඞ්ගාමෙ රාජා පසෙනදි කොසලො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං පරාජෙසි. ජීවගාහඤ්ච නං අග්ගහෙසි.

1. කාසී - PTS. 2. ජීවග්ගාහං - මජසං, PTS. 3. අජාතසත්තුස්ස - සීමු. 1. 2.
4. ඔසජ්ජෙය්‍යං - මජසං 5. ඔසජ්ජි - මජසං.

3. 2. 5.

දුතිය සඞ්ගාම සූත්‍රය.

126. **සැවැත්නුවර-**

එකල්හි මගධේශ්වර වූ වේදේහිපුත්‍ර **අජාතසත්තු** රජ තෙමේ සිවුරඟ සෙනඟ සරසා ගෙණ **පසේනදි කොසොල්** රජුහට විරුද්ධ ව කසීගම කරා ඉදිරියට ගියේ ය. පසේනදි කොසොල් රජතෙමේ “මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජ තෙමේ සිවුරඟ සෙනග සරසා ගෙණ මට විරුද්ධ ව කසීගම කරා ඉදිරියට පැමිණියේ යැ යි” ඇසීය.

ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ සිවුරඟ සෙනඟ සරසා ගෙණ මගධෙශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජුහට විරුද්ධ ව කසීගම කරා ඉදිරියට ගියේය. එකල්හි මගධාධිපති වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජ තෙමේ ද පසේනදි කොසොල්රජ තෙමේ ද යුද කළහ. ඒ යුදෙහි දී පසේනදි කොසොල්රජ තෙමේ මගධාධිපති වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජු පැරද විය. ජීවග්‍රාහයෙන් ද ඔහු අල්ලා ගත්තේ ය.

එකල්හි පසේනදි කොසොල් රජහට මේ අදහස විය: මගධේශ්වර වූ වේදේහිපුත්‍ර මේ අජාතසත්තු රජ තෙමේ කිසිසේත් ද්‍රෝහ නො කරණ මට ද්‍රෝහ කෙරෙයි. එතකුදු වුවත් මාගේ බෑනනුවෝ වෙති. මම මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජහුගේ සියලු ඇත්සෙනඟ පැහැර ගෙණ, සියලු අස්සෙනඟ පැහැර ගෙණ, සියලු රිය සෙනඟ පැහැර ගෙණ, සියලුපාබල සෙනඟ පැහැර ගෙණ ඔහු ජීවත් වත්නහු ම මුදා හරණෙම් නම් මැනව යි කියා සී.

ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තු රජුගේ සියලු ඇත් සෙනඟ පැහැර ගෙණ ... ඔහු ජීවත්වත්නහු ම මුදා හළේ ය.

ඉක්බිති බොහෝ භික්‍ෂූහු පෙරවරු හැඳ පොරොවා පාසිවුරු ගෙණ සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ:

වහන්ස, මෙහි මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ සිවුරඟ සෙනඟ සරසා ගෙණ පසේනදි කොසොල්රජුට විරුද්ධ ව යුද පිණිස කසීගම කරා ඉදිරියට ගියේ ය. වහන්ස, පසේනදි කොසොල්රජ තෙමේ ... කසීගම කරා ඉදිරියට පැමිණියේ ය යි ඇසී ය. වහන්ස, ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ සිවුරඟ සෙනඟ සරසා ගෙණ මගධාධිපති වේදේහිපුත්‍ර අජාතසත්තුරජුට විරුධ ව යුද පිණිස කසීගම කරා ඉදිරියට ගියේ ය. වහන්ස, ඉක්බිති මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජ තෙමේ ද, පසේනදි කොසොල් රජ තෙමේ ද යුද කළහ. වහන්ස, ඒ යුදෙහි දී පසේනදි කොසොල් රජ තෙමේ මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජු පැරද විය. ඔහු ජීවග්‍රාහයෙන් ද අල්ලා ගත්තේ ය.

අථ ඛො භන්තෙ, රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස එතදහොසි: කිඤ්චාපි ඛො ම්‍යායං රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො අදුබ්භන්තස්ස දුබ්භති, අථ ච පන මෙ භාගිනෙය්‍යො හොති. යන්නූනාහං රඤ්ඤො මාගධස්ස අජාතසත්තුනො වෙදෙහිපුත්තස්ස සබ්බං හත්ථිකායං පරියාදියිත්වා සබ්බං අස්සකායං පරියාසිදිත්වා සබ්බං රථකායං පරියාදියිත්වා සබ්බං පත්තිකායං පරියාදියිත්වා ජීවන්තමෙව තං ඔස්සජෙය්‍යන්ති. අථ ඛො භන්තෙ, රාජා පසෙනදි කොසලො රඤ්ඤො මාගධස්ස අසතජාතසත්තුනො වෙදෙහිපුත්තස්ස සබ්බං හත්ථිකායං පරියාදියිත්වා සබ්බං අස්සකායං පරියාදියිත්වා සබ්බං රථකායං පරියාදියිත්වා සබ්බං පත්තිකායං පරියාදියිත්වා ජීවන්තමෙව තං ඔස්සජ්ජි.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

විලුම්පතෙව පුරිසො යාවස්ස උපකප්පති,
යදා චඤ්ඤෙ විලුම්පන්ති සො විලුත්තො විලුප්පති[1].

ඨානං හි මඤ්ඤති බාලො යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ[2] බාලො දුක්ඛං නිගච්ඡති.

හන්තා ලභති හන්තාරං ජෙතාරං ලභතෙ ජයං,
අක්කොසකො ච අක්කොසං රොසෙතාරඤ්ච රොසකො,
අථ කම්මවිවට්ටෙන සො විලුත්තො විලුප්පතීති[1].

3. 2. 6.

ධීතුසුත්තං.

127. සාවත්ථියං—

අථ ඛො රාජා **පසෙනදි කොසලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

අථ ඛො අඤ්ඤතරො පුරිසො යෙන රාජා පසෙනදි කොසලො තෙනු-පසඞ්කමි. උපසඞ්කමිත්වා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස උපකණ්ණකෙ ආරොචෙසි: මල්ලිකා දෙව, දෙවී ධීතරං විජාතාති. එවං වුත්තෙ රාජා පසෙනදි කොසලො අනත්තමනො අහොසි.

අථ ඛො භගවා රාජානං පසෙනදිං කොසලං අනත්තමනං[3] විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

ඉත්ථී පි හි එකච්චියා සෙය්‍යා පොස ජනාධිප,
මෙධාවිනී සීලවතී සස්සුදෙවා පතිබ්බතා.

තස්සා යො ජායති පොසො සූරො හොති දිසම්පති,
තාදිසා සුභගියා[4] පුත්තො රජ්ජම්පි අනුසාසතීති.

---

1. විලුම්පති - ස්‍යා, සීමු, 1. 2.සී 2, PTS. 2. අථ දුක්ඛං - මජසං. 3. අනත්තමනතං - මජසං, සීමු 1, PTS. 4. සුභරියා - PTS.

වහන්ස, ඉක්බිති පසේනදි කොසොල්රජහට මේ අදහස විය: "මගධාධිපති වේදේහිපුත්‍ර මේ අජාතසත්තුරජ තෙමේ කිසිසේත් ද්‍රෝහ නො කරන්නා වූ මට ද්‍රෝහ කෙරෙයි. එතෙකුදු වුවත් මාගේ බෑනනුවෝ වෙති. මම මගධෙශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජහුගේ සියලු ඇත්සෙනග පැහැර ගෙණ, සියලු අස්සෙනග පැහැර ගෙණ, සියලු රියසෙනග පැහැර ගෙණ, සියලු පාබල සෙනග පැහැර ගෙණ ඔහු ජීවත්වන්නහු ම මුදා හරණෙම් නම් මැනවැ" යි කියා යි. වහන්ස, ඉක්බිති පසේනදි කොසොල්රජ තෙමේ මගධේශ්වර වූ වේදේහිපුත්‍ර අජාතසත්තුරජුගේ සියලු ඇත්සෙනග පැහැර අල්ලා ගෙණ, සියලු අස්සෙනග පැහැර අල්ලා ගෙණ, සියලු රියසෙනග පැහැර අල්ලා ගෙණ, සියලු පාබලසෙනග පැහැර අල්ලා ගෙණ ඔහු ජීවත් වන්නහු ම මුදා හළේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි දී මේ ගාථා වදාළ සේක:

යම් තාක් ඔහුට හැකි වේ ද, (ඒ තාක්) පුරුෂ තෙමේ වනසා ම ය. යම් කලෙක අන්‍යයෝ (තමා) නසද්ද, එකල්හි ඒ (මෙරමා) නැසූ පුද්ගල තෙමේ (මෙරමා විසින්) නසනු ලැබේ.

යම් තාක් පාපය විපාක නො දේ ද, (ඒතාක්) අඥන තෙමේ (සතුටට) කරුණකැ යි හඟී. යම් කලෙකත් පාපය විපාක දේ ද, එකල්හි අඥන තෙමේ දුකට පැමිණේ.

(මෙරමා) නසන්නා (තමා) නසන්නකු ලබයි. (මෙරමා) දිනන්නා (තමා) දිනන්නකු ලබයි. ආක්‍රෝශ කරන්නා ආක්‍රෝශ කරන්නකු ලබයි. කිපෙන්නා කිපෙන්නකු ලබයි. නව ද කර්මය මිහි කිරීමෙන් ඒ (මෙරමා) නැසූ පුද්ගල තෙමේ (මෙරමා විසින්) නසනු ලැබේ.

3. 2. 6.

ධීතු සූත්‍රය.

127. **සැවැත්නුවර—**

ඉක්බිති **පසේනදි කොසොල් රජ** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පසෙක හුන්නේ ය.

එකල්හි එක්තරා පුරුෂයෙක් පසේනදි කොසොල්රජු වෙත එළඹියේ ය. එළඹ පසේනදි කොසොල් රජහට "දේවයන් වහන්ස, මල්ලිකාදේවී තොමෝ දුවක වැදුවා ය"යි කණ ලඟ සැළ කෙළේ ය. එසේ කී කල්හි පසේනදි කොසොල්රජ නො සතුටු සිත් ඇත්තේ විය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පසේනදි කොසොල්රජු නොසතුටු සිත් ඇත්තහු දැන ඒ වේලාවෙහි මේ ගාථා වදාළ සේක.

රජතුමනි, ඇතැම් ස්ත්‍රිය ද ශ්‍රේෂ්ඨ ය. (එහෙයින්) පොෂණය කරණු මැන. නුවණැති සිල්වත් නැදිමයිලන් දෙවි කොට වෙසෙන පතිවත රක්නා (යම් ස්ත්‍රියක් වේ ද,)

දිශාවන්ට අධිපති රජතුමනි, ඇයට යම් පුතෙක් උපදී ද, (හෙ තෙමේ) දක්ෂයෙක් වෙයි. එබඳු යහපත් නැනැත්තියගේ පුත්‍ර තෙමේ රාජ්‍යානුශාසනා ද කෙරෙයි.

3. 2. 7.

අප්පමාදසුත්තං.

128. සාවත්ථියං—

ඒකමන්තං නිසීදි, ඒකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: අත්ථි නු ඛො භන්තෙ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ[1] තිට්ඨති, දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති.

අත්ථි ඛො මහාරාජ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ[1] තිට්ඨති, දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති.

කතමො පන භන්තෙ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ[1] තිට්ඨති, දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති?

අප්පමාදො ඛො මහාරාජ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ[1] තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති. සෙය්‍යථාපි මහාරාජ යානි කානිචි ජඞ්ගමානං[2] පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන. එවමෙව ඛො මහාරාජ අප්පමාදො එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ[1] තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති.

ආයුං ආරොග්‍යං වණ්ණං සග්ගං උච්චාකුලීනතං,
රතියො පත්ථයන්තෙන උළාරා අපරාපරා,
අප්පමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා

අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති[3] පණ්ඩිතො,
දිට්ඨෙ ධම්මෙ ච යො අත්ථො යො චත්ථො සම්පරායිකො,
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චතීති.

3. 2. 8.

කල්‍යාණමිත්තසුත්තං.*

129. සාවත්ථියං—

ඒකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ස්වාක්ඛාතො භගවතා ධම්මො. සො ච ඛො කල්‍යාණමිත්තස්ස කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස නො පාපමිත්තස්ස නො පාපසහායස්ස නො පාපසම්පවඞ්කස්සාති.

---

1. සමධිග්ගය්හ - මජසං, සයා, STP. 2. ජඞ්ගලානං - මජසං, සයා. 3. අධිග්ගණ්හාති- මජසං, සයා.

* දුතියප්පමාදසුත්තං - සයා, PTS

3. 2. 7.

අප්පමාද සූත්‍රය.

128. සැවැත්නුවර—

එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. වහන්ස, යම් දහමෙක් මෙලොව අභිවෘද්ධියත් පරලොව අභිවෘද්ධියත් යන දෙවැදෑරුම් අභිවෘද්ධිය ම අත්පත් කොට ගෙණ සිටී නම් එබඳු එක් දහමෙක් ඇද්ද?

මහරජ, යම් දහමෙක් මෙලොව අභිවෘද්ධියත් පරලොව අභිවෘද්ධියත් යන දෙවැදෑරුම් අභිවෘද්ධිය ම අත්පත් කොට ගෙණ සිටී නම් එබඳු එක් දහමෙක් ඇත.

වහන්ස, යම් දහමෙක් මෙලොව අභිවෘද්ධියත් පරලොව අභිවෘද්ධියත් යන දෙවැදෑරුම් අභිවෘද්ධිය ම අත්පත් කොට ගෙණ සිටී නම් එබඳු එක් දහම කිමෙක් ද?

මහරජ, යම් දහමෙක් මෙලොව අභිවෘද්ධියත් පරලොව අභිවෘද්ධියත් යන දෙවැදෑරුම් අභිවෘද්ධිය ම අත්පත් කොට ගෙණ සිටී නම් එබඳු එක් දහම අප්‍රමාදය යි. මහරජ, ඇවිදින ප්‍රාණීන්ගේ යම් කිසි පා සටහන්හු වෙත් නම් ඒ සියල්ලෝ ඇත්පියෙහි ඇතුලත් වීමට යෙද්ද, යම් ඒ මහත්ත්වයෙන් ඇත්පිය ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබේ ද, මහරජ, එසෙයින් ම යම් දහමෙක් මෙලොව අභිවෘද්ධියත් පරලොව අභිවෘද්ධියත් යන දෙවැදෑරුම් අභිවෘද්ධිය ම අත්පත් කොට ගෙණ සිටී නම් අප්‍රමාදය ඒ එක් දහම යි.

ආයුෂ ද, නීරෝගබව ද, ශරීර වර්ණය ද, ස්වර්ගය ද, උසස්කුල ඇති බව ද, උදාර වූ අත්‍යෝත්‍ය වූ සිත් අලවන දෑ ද පතන්නහු විසින් පුණ්‍ය-ක්‍රියාවන්හි නොපමාවීම නුවණැත්තෝ පසසත්.

මෙලොව යම් අභිවෘද්ධියෙකුත් වේ ද, පරලොව යම් අභිවෘද්ධියෙකුත් වේ ද, පණ්ඩිත තෙමේ නො පමා වූයේ ඒ දෙවැදෑරුම් අභිවෘද්ධිය ම ලබයි. ධෘතිසම්පන්න පුද්ගල තෙමේ අර්ථප්‍රතිලාභය හේතු කොට ගෙණ පණ්ඩිත ය යි කියනු ලැබේ.

3. 2. 8.

කල්‍යාණමිත්ත සූත්‍රය.

129. සැවැත්නුවර—

එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. වහන්ස, මෙහි රහසිගත ව එකලාව හුන් මා සිත්හි "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මැනවින් වදරණ ලදී. හෙ ද කලණ මිතුරන් ඇත්තහුට ය. කලණ යහළුවන් ඇත්තහුට ය. කල්‍යාණයන් කෙරෙහි නැමුනහුට ය. පවිටු මිතුරන් ඇත්තහුට නො වේ. පවිටු යහළුවන් ඇත්තහුට නො වේ. පවිටන් කෙරෙහි නැමුනහුට නො වේ" යන මෙබඳු චිත්ත විතර්කයෙක් පහළ විය.

එවමෙතං මහාරජ, එවමෙතං මහාරජ, ස්වාක්ඛාතො මහාරජ මයා ධම්මො. සො ච ඛො කල්‍යාණමිත්තස්ස කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස. නො පාපමිත්තස්ස නො පාපසහායස්ස නො පාපසම්පවඞ්කස්සාති.

එකමිදහං මහාරජ, සමයං සක්කෙසු විහරාමි නාගරකං[1] නාම සක්‍යානං නිගමො. අථ ඛො මහාරජ ආනන්දො භික්ඛු යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහාරජ ආනන්දො භික්ඛු මං එතදවොච: උපඩ්ඪමිදං භන්තෙ බ්‍රහ්මචරියස්ස යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති. එවං වුත්තාහං මහාරජ ආනන්දං භික්ඛුං එතදවොචං: මා හෙවං ආනන්ද, මා හෙවං ආනන්ද, සකලමෙව හිදං ආනන්ද බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා. කල්‍යාණමිත්තස්සෙතං ආනන්ද භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති[2] අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති.

කථඤ්ච ආනන්ද භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො "අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති"[3] අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති? ඉධානන්ද භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සම්මාසඞ්කප්පං භාවෙති - සම්මාවාචං භාවෙති - සම්මාකම්මන්තං භාවෙති, - සම්මාආජීවං භාවෙති - සම්මාවායාමං භාවෙති - සම්මාසතිං භාවෙති - සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො ආනන්ද භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති.

තදමිනාපෙතං ආනන්ද පරියායෙන වෙදිතබ්බං: යථා සකලමෙවිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති.

මමං හි ආනන්ද කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති. ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති. ව්‍යාධිධම්මා සත්තා ව්‍යාධිතා[4] පරිමුච්චන්ති. මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති. සොක-පරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසෙහි පරිමුච්චන්ති. ඉමිනා ඛො එතං ආනන්ද පරියායෙන වෙදිතබ්බං: යථා සකලමෙවහිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති.

තස්මාතිහ තෙ මහාරාජ එවං සික්ඛිතබ්බං: කල්‍යාණමිත්තො භවිස්සාමි කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කොති. එවං හි තෙ මහාරාජ සික්ඛිතබ්බං. කල්‍යාණමිත්තස්ස තෙ මහාරාජ කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස අයං එකො ධම්මො උපනිස්සාය විහාතබ්බො අප්පමාදො කුසලෙසු ධම්මෙසු.

1. නගරකං - මජසං. සසා. 2. භාවෙය්‍ය - සීමු. 3. අයංපාඨො න දිස්සතෙ. PTS. පොත්ථකෙ. 4. ව්‍යාධිතො - මජසං. සසා. ව්‍යාධියා - PTS.

මහරජ, තෙල එසේ ය. මහරජ, තෙල එසේ ය. මහරජ, මා විසින් ධර්මය ස්වාඛ්‍යාත ය. එ ද කලණ මිතුරන් ඇත්තහුට ය. කලණ යහළුවන් ඇත්තහුට ය. කලණයන් කෙරෙහි නැමුනහුට ය. පවිටු මිතුරන් ඇත්තහුට නො වේ. පවිටු යහළුවන් ඇත්තහුට නො වේ. පවිටන් කෙරෙහි නැමුනහුට නො වේ.

මහරජ, එක් කාලෙක මම ශාක්‍ය දනව්වෙහි ශාක්‍යයන්ගේ නාගරක නම් නියම්ගම්හි වෙසෙමි. මහරජ, එකල අනඳ මහණ තෙමේ මා වෙත එළඹියේ ය. එළඹ මා වැඳ එකත්පසෙක හුන්නේ ය. මහරජ, එකත්පසෙක හුන් අනඳ මහණ තෙමේ මට "වහන්ස, යම් මේ කල්‍යාණමිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ ද, මෙය මගබඹසර පිළිබඳ හරි අඩෙකැ"යි මෙය සැල කෙළේ ය. මහරජ, එසේ කියන ලද මම අනඳ මහණහට මෙය කීයෙමි. ආනඳ, එසේ නො කිය, ආනඳ, එසේ නො කිය, ආනඳ, යම් මේ කලණ මිතුරන් ඇතිබවෙක් කලණ යහළුවන් ඇතිබවෙක් කලණයන් කෙරෙහි නැමුනුබවෙක් වේ ද, මෙය මුළු මගබඹසර ම ය. ආනඳ, "අරිඅටඟිමග වඩන්නේ ය. අරිඅටඟිමග බහුල කරන්නේ" ය යන මෙය කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙන මහණහු විසින් කැමති විය යුතු යි.

ආනඳ, කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙන මහණ තෙමේ කෙසේ නම් අරිඅටඟිමග වඩා ද? අරිඅටඟිමග බහුල කෙරේ ද? යත්: ආනඳ, මෙහි මහණ තෙමේ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවණට නමන සුලු සම්‍යක් දෘෂ්ටිය වඩයි. ... සම්‍යක්සඞ්කල්පය වඩයි. ... සම්‍යක්වචනය වඩයි. ... සම්‍යක් කර්මාන්තය වඩයි. ... සම්‍යක් ආජීවය වඩයි. ... සම්‍යක් ස්මෘතිය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවණට නමන සුලු සම්‍යක්සමාධිය වඩයි. ආනඳ, කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙන මහණ තෙමේ මෙසේ අරිඅටඟිමග වඩයි, අරිඅටඟිමග බහුල කෙරෙයි.

ආනඳ, යම් මේ කල්‍යාණමිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ නම් මෙය යම්සේ මුළු බඹසර වේ ද, එය මේ ක්‍රමයෙන් ද දත යුතු යි.

ආනඳ, කල්‍යාණමිත්‍ර වූ මා නිසා ම ඉපදීම ස්වභාව කොට ඇති සත්ත්වයෝ ඉපදීමෙන් මිදෙත්. දිරීම ස්වභාව කොට ඇති සත්ත්වයෝ දිරීමෙන් මිදෙත්. මරණය ස්වභාව කොට ඇති සත්ත්වයෝ මරණයෙන් මිදෙත්. ශෝකය වැලපීම දුක් දොම්නස් දුඃඛආයාස ස්වභාව කොට ඇති සත්ත්වයෝ ශෝකපරිදෙව දුක්දොම්නස් උපායාසයන්ගෙන් මිදෙත්. ආනඳ, යම් මේ කල්‍යාණමිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ නම් මෙය යම්සේ මුළු බඹසර වේ ද, එය මේ ක්‍රමයෙනුදු දත යුතු යි.

මහරජ, එහෙයින් මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු යි. "කලණමිතුරන් ඇත්තෙක් කලණයහළුවන් ඇත්තෙක් කලණයන් කෙරෙහි නැමෙන්නෙක් වන්නෙමි"යි. මහරජ, මෙසේ ම තොප විසින් හික්මිය යුතු යි. මහරජ, කලණමිතුරන් ඇති කලණයහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමුනු තොප විසින් කුශලධර්මයන්හි අප්‍රමාදය වූ මේ එක ම ධර්මය ඇසුරු කොට විසිය යුතු යි.

අප්පමත්තස්ස තෙ මහාරාජ, විහරතො අප්පමාදං උපනිස්සාය ඉත්ථාගාරස්ස[1] එවං භවිස්සති: රාජා ඛො අප්පමත්තො විහරති අප්පමාදං උපනිස්සාය. හන්ද මයම්පි අප්පමත්තා විහරාම අප්පමාදං උපනිස්සායාති.

අප්පමත්තස්ස තෙ මහාරාජ විහරතො අප්පමාදං උපනිස්සාය ඛත්තියානම්පි අනුයුත්තානං[2] එවං භවිස්සති: රාජා ඛො අප්පමත්තො විහරති අප්පමාදං උපනිස්සාය. හන්ද මයම්පි අප්පමත්තා විහරාම අප්පමාදං උපනිස්සායාති.

අප්පමත්තස්ස තෙ මහාරාජ විහරතො අප්පමාදං උපනිස්සාය බලකායස්සපි එවං භවිස්සති: රාජා ඛො අප්පමත්තො විහරති අප්පමාදං උපනිස්සාය. හන්ද මයම්පි අප්පමත්තා විහරාම අප්පමාදං උපනිස්සායාති.

අප්පමත්තස්ස තෙ මහාරාජ විහරතො අප්පමාදං උපනිස්සාය නෙගමජානපදස්සාපි[3] එවං භවිස්සති: රාජා ඛො අප්පමත්තො විහරති අප්පමාදං උපනිස්සාය. හන්ද මයම්පි අප්පමත්තා විහරාම අප්පමාදං උපනිස්සායාති.

අප්පමත්තස්ස තෙ මහාරාජ විහරතො අප්පමාදං උපනිස්සාය අත්තාපි ගුත්තො රක්ඛිතො භවිස්සති, ඉත්ථාගාරම්පි ගුත්තං රක්ඛිතං භවිස්සති, කොසකොට්ඨාගාරම්පි ගුත්තං රක්ඛිතං භවිස්සතීති.

භොගෙ පත්ථයමානෙන උළාරෙ අපරාපරෙ,
අප්පමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා.

අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො,
දිට්ඨෙ[4] ධම්මෙ ච යො අත්ථො යො චත්ථො සම්පරායිකො,
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චතීති.

3. 2. 9.

පඨමං අපුත්තකසුත්තං.

130. සාවත්ථියං—

අථ ඛො රාජා පසෙනදි කොසලො දිවාදිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං[5] කොසලං භගවා එතදවොච: හන්ද කුතො නු ත්වං මහාරාජ ආගච්ඡසි දිවාදිවස්සාති?

---

1. ඉත්ථාගාරස්ස අනුයන්තස්ස - මජ්ඣං., අනුයායන්තස්ස. සයා. 2. අනුයුත්තානං – සයා, මජ්ඣං. 3. ජානපදස්සපි - මජ්ඣං. PTS. 4. දිට්ඨෙව ධම්මෙ – සිමු. 5. පසෙනදි - කත්ථචි.

මහරජ, අප්‍රමත්ත ව අප්‍රමාදය ඇසුරු කොට වසන්නා වූ තොපගේ ඇතොවුරට (අන්තඃපුරස්ත්‍රීන්ට) ද "රජ තෙමේ අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වාසය කෙරෙයි. එබැවින් අපි ද අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙමු" යි මෙසේ අදහස් වන්නේ ය.

මහරජ, අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වාසය කරන්නා වූ තොපගේ අනුයුක්ත (සහකාර) ක්ෂත්‍රියයන්ට ද "අපගේ රජ තෙමේ අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වාසය කෙරෙයි. එබැවින් අපි ද අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙමු"යි මෙසේ අදහස් වන්නේ ය.

මහරජ, අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වාසය කරන්නා වූ තොපගේ බලසෙනගට ද "රජ තෙමේ අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙයි. එබැවින් අපි ද අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙමු" යි මෙසේ අදහස් වන්නේ ය.

මහරජ, අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙන තොපගේ නියම්ගම්දනව්වැස්සන්ට ද "රජ තෙමේ අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙයි. එබැවින් අපි ද අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙමු" යි මෙසේ අදහස් වන්නේ ය.

මහරජ, අප්‍රමාදය ඇසුරු කොට අප්‍රමත්ත ව වෙසෙන තොප විසින් තෙමේත් ගෝපනය කරණ ලද්දේ රක්නා ලද්දේ වන්නේ ය. ඇතොවුර ද ගෝපනය කරණ ලද්දේ රක්නා ලද්දේ වන්නේ ය. ධනගබඩා හා කොටුගුල් ද ගෝපනය කරණ ලද්දේ රක්නා ලද්දේ වන්නේ ය.

මහත් වූ නන්වැදෑරුම් සැපත් පතන්නහු විසින් තොපමා වියයුතු යි. පණ්ඩිතයෝ කුශලක්‍රියාවන්හි අප්‍රමාදය පසසත්.

අප්‍රමත්ත වූ පණ්ඩිත තෙමේ දිට්ඨදම්යෙහි යම් අර්ථයෙක් වේ ද, පරලෙව්හි යම් අර්ථයෙක් වේ ද මේ උභයාර්ථය ලබයි. මේ උභයාර්ථලාභයෙන් නුවණැත්තේ පණ්ඩිත යයි කියනු ලැබේ.

3. 2. 9.

පඨම අපුත්තක සූත්‍රය.

130. **සැවැත්නුවර—**

එකල්හි පසේනදි කොසොල්රජ තෙමේ දෙවෙන් දවහල්හි (මධ්‍යාහ්නයෙහි) භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "මහරජ, දැන් තෙපි දෙවෙන් දවහල කොහි සිට එවු දැ"යි.

ඉධ භන්තෙ සාවත්ථියං සෙට්ඨි ගහපති කාලකතො.[1] තමහං අපුත්තකං සාපතෙය්‍යං රාජන්තෙපුරං අතිහරිත්වා ආගච්ඡාමි. අසීති භන්තෙ සතසහස්සානි හිරඤ්ඤස්සෙව, කො පන වාදො රූපියස්ස. තස්ස ඛො පන භන්තෙ සෙට්ඨිස්ස ගහපතිස්ස එවරූපො භත්තභොගො අහොසි: කණාජකං භුඤ්ජති බිලඞ්ගදුතියං. එවරූපො වත්ථභොගො අහොසි: සාණං ධාරෙති තිපක්ඛවසනං. එවරූපො යානභොගො අහොසි: ජජ්ජරරථකෙන යාති පණ්ණච්ඡත්තකෙන ධාරියමානෙනාති.

එවමෙතං මහාරාජ, එවමෙතං මහාරාජ, අසප්පුරිසො ඛො මහාරාජ උළාරෙ භොගෙ ලභිත්වා නෙව අත්තානං සුඛෙති පීණෙති. න මාතාපිතරො සුඛෙති පීණෙති. න පුත්තදාරං සුඛෙති පීණෙති. න දාසකම්මකරපොරිසෙ සුඛෙති පීණෙති. න මිත්තාමච්චෙ සුඛෙති පීණෙති. න සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. තස්ස තෙ භොගෙ එවං සම්මා අපරිභුඤ්ජියමානෙ[2] රාජානො වා හරන්ති, චොරා වා හරන්ති. අග්ගි වා ඩහති. උදකං වා වහති. අප්පියා වා දායාදා හරන්ති. එවං ස තෙ[3] මහාරාජ භොගා සම්මා අපරිභුඤ්ජියමානා[4] පරික්ඛයං ගච්ඡන්ති නො පරිභොගං.

සෙය්‍යථාපි මහාරාජ, අමනුස්සට්ඨානෙ පොක්ඛරණී අච්ඡොදකා සීතොදකා සාතොදකා සෙතකා[5] සුපතිත්ථා රමණීයා. තං ජනො නෙව හරෙය්‍ය, න පිවෙය්‍ය, න නහායෙය්‍ය, න යථාපච්චයං වා කරෙය්‍ය. එවං හි තං මහාරාජ උදකං සම්මා අපරිභුඤ්ජියමානං පරික්ඛයං ගච්ඡෙය්‍ය නො පරිභොගං.

එවමෙව ඛො මහාරාජ, අසප්පුරිසො උළාරෙ භොගෙ ලභිත්වා නෙවත්තානං සුඛෙති පීණෙති -පෙ- අප්පියා වා දායාදා හරන්ති. එවං ස තෙ භොගා සම්මා අපරිභුඤ්ජියමානා පරික්ඛයං ගච්ඡන්ති නො පරිභොගං.

සප්පුරිසො ච ඛො මහාරාජ උළාරෙ භොගෙ ලභිත්වා අත්තානං සුඛෙති පීණෙති. මාතාපිතරො සුඛෙති පීණෙති. පුත්තදාරං සුඛෙති පීණෙති. දාසකම්මකරපොරිසෙ සුඛෙති පීණෙති. මිත්තාමච්චෙ සුඛෙති පීණෙති. සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. තස්ස තෙ භොගෙ එවං සම්මා පරිභුඤ්ජියමානෙ නෙව රාජානො හරන්ති. න චොරා හරන්ති. න අග්ගි ඩහති. න උදකං වහති. න අප්පියා දායාදා හරන්ති. එවං ස තෙ මහාරාජ භොගා සම්මා පරිභුඤ්ජියමානා පරිභොගං ගච්ඡන්ති නො පරික්ඛයං.

සෙය්‍යථාපි මහාරාජ ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ පොක්ඛරණී අච්ඡොදකා සීතොදකා සාතොදකා සෙතකා සුපතිත්ථා රමණීයා. තං ජනො හරෙය්‍යපි පිවෙය්‍යපි නහායෙය්‍යපි යථාපච්චයම්පි කරෙය්‍ය. එවං හි තං මහාරාජ උදකං සම්මා පරිභුඤ්ජියමානං පරිභොගං ගච්ඡෙය්‍ය නො පරික්ඛයං. එවමෙව ඛො මහාරාජ ධීරො සප්පුරිසො උළාරෙ භොගෙ ලභිත්වා අත්තානං සුඛෙති පීණෙති -පෙ- එවං ස තෙ භොගා සම්මා පරිභුඤ්ජියමානා පරිභොගං ගච්ඡන්ති නො පරික්ඛයන්ති.

---

1. කාලඞ්කතො - මජසං 2 අපරිභුඤ්ජමානො - සීමු. PTS. සී 2 3. එවංසන්තෙ - සීමු. PTS. සී2. 4. අපරිභුඤ්ජමානා - සීමු. සභා. PTS. සී2. 5. සෙතොදකා - මජසං

වහන්ස, මෙහි සැවැත්නුවර සිටුගැහැවි තෙමේ කලුරිය කෙළේ ය. මම අපුත්‍රක වූ ඒ ධනය ඇතුළු රජගෙට ගෙන්වා තබා එමි. වහන්ස, (එහි) රන්මිල ම අසූලක්‍ෂයෙකි. රිදී ගැණ කියනු කිම? (එහෙත්) වහන්ස, ඒ සිටුගැහැවිහුගේ බත් වැළඳීම මෙබඳු විය: කාඞි දෙවෙනි කොට ඇති තිවුඹුහාලේ බත් බුදිසි. වස්ත්‍රපරිභෝගය මෙබඳු විය: කැබැලි තුනක් සැමැත්නු හණවැහැරියක් දරයි. යානපරිභෝගය මෙබඳු වි ය: දරණු ලබන පත්කුඩයෙකින් යුත් දුදුරු වූ කුඩාරියෙකින් යයි.

මහරජ, තෙල එසේ ය. මහරජ, තෙල එසේ ය. මහරජ, අසත් (ලාමක) පුරුෂ තෙමේ මහත් භෝග ලැබ (ද) තමා තො ම සුඛිත කෙරෙයි. තො ම පිණවයි. මවුපියන් සුඛිත තො කෙරෙයි තො පිණවයි. අඹුදරුවන් සුඛිත තො කෙරෙයි තො පිණවයි. දස්කම්කරු පුරුෂයන් සුඛිත තො කෙරෙයි. තො පිණවයි. මිත්‍රයන් හා සහකාරයන් සුඛිත තො කෙරෙයි. තො පිණවයි. මහණබමුණන් කෙරෙහි මතුමත්තෙහි සුව දෙන සවර්ගයට හිත සුඛවිපාක ඇති සවර්ගය පිණිස පවත්නා දක්‍ෂිණාව තො පිහිටුවයි. (තොදෙයි). මෙසේ මැනවින් පරිභෝග තොකරණ ඔහුගේ ඒ ධනය රජහු හෝ හැර ගණිත්. සොරු හෝ පැහැර ගණිත්. ගින්න හෝ දවයි. ජලය හෝ නඟයි. අප්‍රිය වූ දායාදයෝ (දුදරු පරපුර) හෝ හැර ගණිත්. මහරජ, මෙසේ ඔහු විසින් මැනවින් පරිභෝග තොකරණු ලබන එ භෝගයෝ විනාශයට පැමිණෙත්. පරිභෝගයට තො පැමිණෙත්.

මහරජ, යම්සේ අමනුෂ්‍යයන් විසින් අධිගෘහිත වූ තැනෙක පහන් දිය ඇති සිහිල්දිය ඇති මිහිරිදිය ඇති හෙළ රළරැලි ඇති මනා තොට ඇති සිත්කලු පොකුණෙක් වේ නම් ජන තෙමේ ඒ දිය තො ම හරණේ ය. තො බොන්නේ ය. තො නහන්නේ ය. පසවැටෙන සෙයින් හෝ තො කරන්නේ ය. මහරජ, එසේ ඒ දිය මැනවින් පරිභෝග තොකරණු ලබන්නේ සිඳී යන්නේ ය. පරිභෝගයට තො පැමිණෙන්නේ ය.

මහරජ, එමෙන් ම ලාමක පුරුෂ තෙමේ මහත්භෝග ලැබ තමා තො ම සුඛිත කෙරෙයි තො පිණවයි. ... අප්‍රිය වූ දායාදයෝ හෝ හැර ගණිත්. මෙසේ ඔහු විසින් මැනවින් පරිභෝග තොකරණු ලබන්නා වූ ඒ භෝගයෝ විනාශයට පැමිණෙත්. පරිභෝගයට තො පැමිණෙත්.

මහරජ, සත්පුරුෂ තෙමේ මහත් භෝග ලැබ තමා සුඛිත කෙරෙයි, පිණවයි. මවුපියන් සුඛිත කෙරෙයි, පිණවයි. අඹුදරුවන් සුඛිත කෙරෙයි, පිණවයි. දස්කම්කරු පුරුෂයන් සුඛිත කෙරෙයි, පිණවයි. මිත්‍රයන් හා සහකාරයන් සුඛිත කෙරෙයි, පිණවයි. මහණබමුණන් කෙරෙහි මතු මත්තෙහි සුව ගෙණ දෙන සවර්ගයට හිත සුඛවිපාක ඇති සවර්ගය පිණිස පවත්නා දක්‍ෂිණාව පිහිටුවයි. මෙසේ මැනවින් පරිභෝග කරණු ලබන ඔහුගේ ඒ භෝගයන් රජහු තොම හැර ගණිත්. සොරු තො පැහැර ගණිත්. ගින්න තො දවයි. ජලය තො නඟයි. අප්‍රිය වූ දායාදයෝ තො හැර ගණිත්. මහරජ, මෙසේ මැනවින් පරිභෝග කරණු ලබන ඒ භෝගයෝ පරිභෝගයට යෙති. සිඳීමට තො යෙත්.

මහරජ, යම්සේ ගමක් හෝ නියම්ගමක් අසල පහන්දිය ඇති සිහිල් දිය ඇති මිහිරිදිය ඇති සුදු රළරැලි ඇති මනා තොට ඇති සිත්කලු පොකුණෙක් වේ නම් ජන තෙමේ ඒ දිය ගෙණ යන්නේත්, බොන්නේත්, නහන්නේත් පසවැටෙනසෙයින් හෝ කරන්නේත් වේ. මහරජ, මෙසේ පරිභෝග කරණු ලබන ඒ ජලය පරිභෝගයට යන්නේය. තොසිඳී යන්නේ ය. මහරජ, එපරිද්දෙන් ම නුවණැති සත්පුරුෂ තෙමේ මහත් භෝගයන් ලැබ තමා සුඛිත කෙරෙයි. පිණවයි. ... මෙසේ ඒ භෝගයෝ මැනවින් පරිභෝග කරණු ලබන්නාහු පරිභෝගයට යෙති. විනාශයට තො පැමිණෙති.

අමනුස්සට්ඨානෙ උදකං ව සීතං තදපෙය්‍යමානං පරිසොසමෙති,
එවං ධනං කාපුරිසො ලභිත්‍වා නෙවත්තනා භුඤ්ජති නො දදාති.

ධීරො ච විඤ්ඤූ අධිගම්ම භොගෙ යො භුඤ්ජති කිච්චකරො ච හොති,
සො ඤාතිසඞ්ඝං නිසභො භරිත්‍වා අනින්දිතො සග්ගමුපෙති ඨානන්ති.

3. 2. 10.

දුතියං අපුත්තකසුත්තං.

131. සාවත්ථියං—

අථ ඛො රාජා **පසෙනදි කොසලො** දිවාදිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්‍වා භගවන්තං අභිවාදෙත්‍වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං භගවා එතදවොච: හන්ද කුතො නු ත්‍වං මහාරාජ ආගච්ඡසි දිවාදිවස්සාති?

ඉධ භන්තෙ සාවත්ථියං සෙට්ඨි ගහපති කාලකතො. තමහං අපුත්තකං සාපතෙය්‍යං රාජන්තෙපුරං අතිහරිත්‍වා ආගච්ඡාමි. සතං භන්තෙ සතසහස්සානං[1] හිරඤ්ඤස්සෙව, කො පන වාදො රූපියස්ස. තස්ස ඛො පන භන්තෙ සෙට්ඨිස්ස ගහපතිස්ස එවරූපො භත්තභොගො අහොසි: කණාජකං භුඤ්ජති බිලඞ්ගදුතියං. එවරූපො වත්ථභොගො අහොසි: සාණං ධාරෙති තිපක්ඛවසනං. එවරූපො යානභොගො අහොසි: ජජ්ජරරථකෙන යාති පණ්ණච්ඡත්තකෙන ධාරියමානෙනාති.

එවමෙතං මහාරාජ, එවමෙතං මහාරාජ, භූතපුබ්බං සො මහාරාජ සෙට්ඨි ගහපති **තගරසිඛිං**[2] නාම පච්චෙකසම්බුද්ධං[3] පිණ්ඩපාතෙන පටිපාදෙසි. "දෙථ සමණස්ස පිණ්ඩන්ති" වත්‍වා උට්ඨායාසනා පක්කාමි. දත්‍වා ච පන පච්ඡා විප්පටිසාරී අහොසි: "වරමෙතං පිණ්ඩපාතං දාසා වා කම්මකරා වා භුඤ්ජෙය්‍යුන්ති." භාතුච්ච පන එකපුත්තකං සාපතෙය්‍යස්ස කාරණා ජීවිතා වොරොපෙසි.

යං ඛො සො මහාරාජ සෙට්ඨි ගහපති තගරසිඛිං[2] පච්චෙකසම්බුද්ධං[3] පිණ්ඩපාතෙන පටිපාදෙසි, තස්ස කම්මස්ස විපාකෙන සත්තක්ඛත්තුං සුගතිං සග්ගං ලොකං උපපජ්ජි, තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන ඉමිස්සායෙව සාවත්ථියා සත්තක්ඛත්තුං සෙට්ඨිත්තං කාරෙසි.

යං ඛො සො මහාරාජ සෙට්ඨි ගහපති දත්‍වා පච්ඡා විප්පටිසාරී අහොසි: "වරමෙතං පිණ්ඩපාතං දාසා වා කම්මකරා වා භුඤ්ජෙය්‍යුන්ති," තස්ස කම්මස්ස විපාකෙන නාස්සුළාරාය භත්තභොගාය චිත්තං නමති. නාස්සුළාරාය වත්ථභොගාය චිත්තං නමති. නාස්සුළාරාය යානභොගාය චිත්තං නමති. නාස්සුළාරානං පඤ්චන්නං කාමගුණානං භොගාය චිත්තං නමති.

1. සතසහස්සානි - කත්ථචි. 2. තග්ගරසිඛිං පච්චෙකසම්බුද්ධං - මජසං. 3. පච්චෙකබුද්ධං - සී PTS.

අමනුෂ්‍යයන් විසින් අධිගෘහීත වූ තැනෙක සිහිල් ජලයෙක් වේ ද, එය පානය නොකරණු ලබන්නේ වියළීමට යේ ද, එසේ ලාමක පුරුෂ තෙමේ ධනය ලැබ තෙමේත් නොම පරිභෝග කෙරෙයි. අනුන්ට ද නොදෙයි. ධෘතිසම්පන්න නුවණැති යම් පුරුෂයෙක් වේ ද, හෙ තෙමේ භොගයන් ලැබ අනුභව කෙරෙයි. කටයුතු කරන්නේ ද වෙයි. ඒ ශ්‍රේෂ්ඨ පුරුෂ තෙමේ නෑ සමූහයා පෝෂණය කොට (ලොකයා විසින්) පසස්නා ලද්දේ දෙව්ලොවට පැමිණෙයි

3. 2. 10.

දුතියඅපුත්තක සූත්‍රය.

131. **සැවැත්නුවර—**

එකල්හි **පසේනදි කොසොල්**රජ තෙමේ දෙවෙන් දවහල භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජහට භාග්‍යවතුන් වහන්සේ මහරජ, "දැන් තෙපි මධ්‍යාහ්නයෙහි කොහි සිට එවු ද"යි මෙය වදාළ සේක.

වහන්ස, මේ සැවැත්නුවර සිටු ගෘහපති තෙමේ කාලගත විය. මම ඒ දරුවන් නැති සැපත ඇතුළුරජගෙට නගා යවා එමි. වහන්ස, රන්මිල ම සියක්ලක්ෂයෙකි. රිදී ගැණ කියනු කිම? වහන්ස, ඒ සිටුගෘහපතිහුගේ බත් වැළඳීම මෙබඳු විය: කාඩි දෙවෙනි කොට ඇති නිවුඩු සහලේ බත බුදියි. වස්ත්‍රපරිභෝගය මෙබඳු විය: සැමැත්නු තුන්කඩක් ඇති හණ වැහැරිවතක් දරයි. රථපරිභෝගය මෙබඳු විය: දරණු ලබන පත්කුඩයක් ඇති දුදුරු වූ කුඩා රියෙකින් ගමන් කරයි.

මහරජ, තෙල එසේ ය. මහරජ තෙල එසේය. පෙර වූවක් (කියමි): මහරජ, ඒ සිටු ගෘහපති තෙමේ **තගරසිඛී** නම් පසේබුදු රජුන්හු පිණ්ඩපාතයෙන් පැවරී ය. "මහණහුට පිඬු දෙව"යි කියා හුනස්නෙන් නැගිට ගියේ ය. දී පසුව "මේ පිණ්ඩාහාරය දසයෝ හෝ කම්කරුවෝ හෝ අනුභව කළාහු නම් යහපතැ"යි විපිළිසර ඇත්තේ විය. ධනහේතුවෙන් බෑයාගේ එක ම කුඩාපුතු ද දිවියෙන් තොර කෙළේ ය.

මහරජ, ඒ සිටු ගෘහපති තෙමේ තගරසිඛී නම් පසේබුදුරජුන් පිණ්ඩපාතයෙන් පැවරී යන යමක් ඇද්ද ඒ කර්මවිපාකයෙන් සත්වරක් සුගති සඞ්ඛ්‍යාත සවර්ගලෝකයට (උත්පත්තිවශයෙන්) පැමිණියේ ය. ඒ කර්මයාගේ ම විපාකාවශේෂයෙන් මේ සැවැත්නුවර ම සත්වරක් සිටුකම් කරවී ය.

මහරජ, ඒ සිටු ගෘහපති තෙමේ දී(පසුව) "මේ පිණ්ඩාහාරය දසයෝ හෝ කම්කරුවෝ හෝ අනුභව කළාහු නම් යහපතැයි" පසු ව විපිළිසර ඇති වී යන යමක් ඇද්ද, ඒ කර්මයාගේ විපාකය හේතු කොට ගෙණ උදාර වූ බත් වැළඳීම පිණිස සිත නො නැමෙයි. උදාර වූ වස්ත්‍රපරිභෝගය පිණිස සිත නො නැමෙයි. උදාර වූ රථපරිභෝගය පිණිස සිත නො නැමෙයි. උදාර වූ පස්කම් සැප අනුභවය පිණිස සිත නො නැමෙයි.

යං ඛො සො මහාරාජ සෙට්ඨී ගහපති භාතුච්ච පන එකපුත්තකං සාපතෙය්‍යස්ස කාරණා ජීවිතා වොරොපෙසි. තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්ථ. තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන ඉදං සත්තමං අපුත්තකං සාපතෙය්‍යං රාජකොසං පවෙසෙති. තස්ස ඛො පන මහාරාජ සෙට්ඨිස්ස ගහපතිස්ස පුරාණඤ්ච පුඤ්ඤං පරික්ඛීණං, නවඤ්ච පුඤ්ඤං අනුපචිතං. අජ්ජ පන මහාරාජ සෙට්ඨී ගහපති මහාරොරුවනිරයෙ[1] පච්චතීති. එවං භන්තෙ සෙට්ඨී ගහපති මහාරොරුවං නිරයං උපපන්නොති? එවං මහාරාජ සෙට්ඨී ගහපති මහාරොරුවං නිරයං උපපන්නොති.

ධඤ්ඤං ධනං රජතං ජාතරූපං පරිග්ගහං වාපි[2] යදත්ථි කිඤ්චි,
දාසා කම්මකරා පෙස්සා යෙ චස්ස අනුජීවිනො,
සබ්බං නාදාය ගන්තබ්බං සබ්බං නික්ඛිප්පගාමිනං[3].

යඤ්ච කරොති කායෙන වාචාය උද චෙතසා,
තං හි තස්ස සකං හොති තඤ්ච ආදාය ගච්ඡති,
තඤ්චස්ස අනුගං හොති ඡායාව අනපායිනී.

තස්මා කරෙය්‍ය කල්‍යාණං නිචයං සම්පරායිකං,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

අපුත්තකවග්ගො දුතියො.

තස්සුද්දානං:-

ජටිලා පඤ්ච රාජානො දොණපාකසඞ්ගාමා ද්වෙ ති ච,
ධීතරා ද්වෙ අප්පමාදා ද්වෙ අපුත්තකෙන චාති[4].

---

3. කොසලවග්ගො.

3. 3. 1.

පුග්ගලසුත්තං

132. සාවත්ථියං—

අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිකොසලං භගවා එතදවොච: චත්තාරොමෙ මහාරාජ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො? තමොතමපරායණො[5] තමොජොතිපරායණො ජොතිතමපරායණො ජොතිජොතිපරායණොති.

---

1. මහාරොරුවෙ - මජසං. 2. චාපි. - සිමු. 3. නික්ඛිපගාමිනං - සතා.
4. ජටිලා පඤ්ච රාජානො දොණපාකකුරෙන ච
සඞ්ගාමෙන ද්වෙ වුත්තානි මල්ලිකාය ද්වෙ අප්පමාදෙන ච
අපුත්තකෙන ද්වෙ වුත්තා වග්ගො තෙන පවුච්චතීති. - මජසං.
5. පරායනො - සබ්බත්ථ.

මහරජ, ඒ සිටු ගෘහැවි තෙමේ ධනහේතුවෙන් සොහොයුරාගේ එක ම කුඩාපුතු ද දිවියෙන් තොර කෙළේ යන යමක් ඇද්ද, ඒ කම්විපාකයෙන් බොහෝ ගණන් හවුරුදු බොහෝ සිය ගණන් හවුරුදු බොහෝ දහස් ගණන් හවුරුදු බොහෝ සියදහස් ගණන් හවුරුදු නරකයෙහි පැසුනේ ය. ඒ කර්‍මයාගේ ම ඉතිරිවිපාකය වශයෙන් මේ සත්වැනි දරුවත් නැති වස්තුසමූහය රජකොෂ්ඨාගාරයට ඇතුළු කෙරෙයි. මහරජ, ඒ සිටු ගෘහැවිහුගේ පැරණි පිණ ගෙවී ගියේ ය. අලුත් පිණෙක් ද රැස් නො කරණ ලද්දේය. මහරජ, අද සිටුගෘහැවි තෙමේ මහාරෞරව නරකයෙහි පැසේ යයි. වහන්ස, එසේ ද? සිටුගෘහැවි තෙමේ මහාරෞරව නරකයට (උපපත්තිවශයෙන්) පැමිණියේ ද? මහරජ, එසේ ය, සිටු ගෘහැවි තෙමේ මහාරෞරව නරකයට පැමිණියේ ය.

ධාන්‍ය ද ධන ද රිදී ද රන් ද තමා සතු යම් කිසි අනෙකෙක් ඇත් නම් එ ද දසයෝ ද කම්කරුවෝ ද මෙහෙකරුවෝද යන ඔහු අනුව ජීවත්වන යම් කෙනෙක් ඇත් නම් ඔහු ද යන සියල්ල නො ගෙණ යායුතුයි. සියල්ල (මෙහි ම) හැර දමා යන සැහැවි ඇත.

කයින් ද වචනයෙන් ද වැලි සිතින් ද යම් කර්‍මයකුත් කෙරේ ද එය ම ඔහුට තමා සතු වස්තුව වේ. එය ම රැගෙණ පරලොව යෙයි එය ම අත් නො හැර යන සෙවනැල්ල මෙන් ඔහු අනු ව යන්නේ වේ.

එහෙයින් පරලොවට හිතවූ දෑ රැස් කරන්නේ පින් කරන්නේ ය. පින් පරලෙව්හි දී සත්ත්වයන්ට පිහිට වේ.

අපුත්තක වර්‍ගය දෙවෙනි යි.

එහි උද්දානය:

ජටිල, පඤ්චරාජ, දොණපාක, යන සූත්‍ර ද සඞ්ගාම සූත්‍ර දෙක ද ධීතු සූත්‍රය ද අප්පමාද සූත්‍ර දෙක ද අපුත්තක සූත්‍ර දෙකදැයි සූත්‍ර දශයෙකි.

---

3. කෝශල වර්‍ගය.

3. 3. 1.

පුග්ගල සූත්‍රය.

132. **සැවැත්නුවර—**

එකල්හි පසේනදි කොසොල්රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මහරජ, ලෝකයෙහි මේ පුද්ගලයෝ සිවු දෙනෙක් ඇත. කවර සිවු දෙනෙක? යත්: "අඳුරෙන් අඳුරට යන්නේ ය. අඳුරෙන් එළියට යන්නේ ය. එළියෙන් අඳුරට යන්නේ ය. එළියෙන් එළියට යන්නේ ය"යි.

කථඤ්ච මහාරාජ, පුග්ගලො තමොතමපරායණො හොති? ඉධ මහාරාජ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා වෙණකුලෙ වා නෙසාදකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති. සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො, කාණො වා හොති කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති. වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

සෙය්‍යථාපි මහාරාජ පුරිසො අන්ධකාරා වා අන්ධකාරං ගච්ඡෙය්‍ය, තමා වා තමං ගච්ඡෙය්‍ය, ලොහිතමලා වා ලොහිතමලං ගච්ඡෙය්‍ය, තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි. එවං ඛො මහාරාජ පුග්ගලො තමොතමපරායණො හොති.

කථඤ්ච මහාරාජ, පුග්ගලො තමොජොතිපරායණො හොති? ඉධ මහාරාජ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති, චණ්ඩාලකුලෙ වා වෙණකුලෙ[1] වා නෙසාදකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති. සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො[2] කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති. වාචාය සුචරිතං චරති. මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

සෙය්‍යථාපි මහාරාජ පුරිසො පථවියා වා පල්ලඞ්කං ආරොහෙය්‍ය පල්ලඞ්කා වා අස්සපිට්ඨිං ආරොහෙය්‍ය අස්සපිට්ඨියා වා හත්ථික්ඛන්ධං ආරොහෙය්‍ය හත්ථික්ඛන්ධා වා පාසාදං ආරොහෙය්‍ය, තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි. එවං ඛො මහාරාජ පුග්ගලො තමොජොතිපරායණො හොති.

---

1. වෙනකුලෙ - මජසං. PTS. 2. බහ්වාබාධො. - මජසං.

මහරජ, කෙසේ නම් පුද්ගල තෙමේ අඳුරෙන් අඳුරට යන්නේ වේ ද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම් කුලයෙක්හි දුකසේ කෑම් හැඳීම් ලැබේ ද, එබඳු සවල්පාහාරපානභොජන ඇති දුකසේ දිවි පවත්වන දිළිඳු සැඩොල් කුලයෙහි හෝ කුලුපොතු කුලයෙහි හෝ වැදි කුලයෙහි හෝ සොම්මර කුලයෙහි හෝ පුප්සඩු කුලයෙහි හෝ හීන කුලයෙක උපන්නේ වෙයි. හෙ තෙමේ නොමනා පැහැ ඇතියෙක් කුරුසැහැවි ඇතියෙක් නපුරු දකුම් ඇතියෙක් බොහෝ ආබාධ ඇතියෙක් කණෙක් හෝ වකත්ඇතියෙක් පාකොරෙක් අඩක්නටුයෙක් හෝ වේ ද, ආහාරපාන වසත්‍ර යාන මල්ගඳ විලෙවුන් යහන් ලැගුම් පහන් උපකරණ නො ලබන්නෙක් වෙ යි. හෙ තෙමේ කයින් දුසිරිත්. කෙරෙයි වචනයෙන් දුසිරිත් කෙරෙයි. සිතින් දුසිරිත් කෙරෙයි. හෙ තෙමේ කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු පහ වූ සුව ඇති නපුරුගති ඇති විවස ව පතිත වන නිරයට උතපත්ති වශයෙන් පැමිණෙන්නේ ය.

මහරජ, පුරුෂයෙක් අඳුරෙකින් අඳුරකට යන්නේ හෝ වේ නම් කළුවරින් කළුවරට යන්නේ හෝ වේ නම් ලෙහෙමලින් ලෙහෙමලට යන්නේ හෝ වේ නම් මහරජ, මම මේ පුහුලා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහරජ, මෙසේ පුහුල් තෙමේ අඳුරෙන් අඳුරට යන්නේ වේ.

මහරජ, කෙසේ නම් පුද්ගල තෙමේ අඳුරෙන් එළියට යන්නේ වේ ද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම් කුලයකේහි දුකසේ කෑම් හැඳීම් ලැබේ ද, එබඳු සවල්පාහාරපානභෝජන ඇති දුකසේ දිවි පවත්වන දිළිඳු වූ සැඩොල් කුලයෙහි හෝ කුලුපොතු කුලයෙහි හෝ වැදිකුලයෙහි හෝ සොම්මර කුලයෙහි හෝ පුප්සඹු කුලයෙහි හෝ හීන කුලයෙක උපන්නේ වෙයි. හෙ තෙමේත් නො මනා පැහැඇතියෙක් නපුරු දකුම් ඇතියෙක් කුරුසැහැවි ඇතියෙක් බොහෝ ආබාධ ඇතියෙක් කණෙක් හෝ වකත්-ඇතියෙක් පාකොරෙක් පක්ෂඝාතයෙක් හෝ වෙයි. ආහාරපාන වසත්‍රයාන මල් ගඳ විලෙවුන් යහන් ලැගුම් ප්‍රදීපෝපකරණ නො ලබන්නෙක් වේ. හෙ තෙමේ කයින් සුසිරිත් කෙරෙයි. වචනයෙන් සුසිරිත් කෙරෙයි. සිතින් සුසිරිත් කෙරෙයි. හෙ තෙමේ කයින් සුසිරිත් කොට වචනයෙන් සුසිරිත් කොට සිතින් සුසිරිත් කොට කාබුන් මරණින් මතු මනාගති ඇති සවර්ගලෝකයට පැමිණෙයි.

මහරජ, යමසේ පුරුෂයෙක් තෙමේ බිමින් පලඟකට නගින්නේ හෝ වේ නම් පලඟින් අසුපිටට නගින්නේ හෝ වේ නම් අසුපිටින් ඇත්කඳකට නගින්නේ හෝ වේ නම් ඇත්කඳින් පහයකට නගින්නේ හෝ වේ නම් මහරජ, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහරජ, මෙසේ පුද්ගල තෙමේ අඳුරෙන් එළියට යන්නේ වේ.

කථඤ්ච මහාරාජ, පුග්ගලො ජොතිතමපරායණො හොති? ඉධ මහාරාජ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා බ්‍රාහ්මණමහාසාලකුලෙ වා ගහපතිමහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති. වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. සෙය්‍යථාපි මහාරාජ පුරිසො පාසාදා වා හත්ථික්ඛන්ධං ඔරොහෙය්‍ය, හත්ථික්ඛන්ධා වා අස්සපිට්ඨිං ඔරොහෙය්‍ය, අස්සපිට්ඨියා වා පල්ලඞ්කං ඔරොහෙය්‍ය, පල්ලඞ්කා වා පඨවිං ඔරොහෙය්‍ය, පඨවියා වා අන්ධකාරං පවිසෙය්‍ය[1], තථූපමාහං මහාරාජ. ඉමං පුග්ගලං වදාමි. එවං ඛො මහාරාජ පුග්ගලො ජොතිතමපරායණො හොති,

කථඤ්ච මහාරාජ, පුග්ගලො ජොතිජොතිපරායණො හොති? ඉධ මහාරාජ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා බ්‍රාහ්මණමහාසාලකුලෙ වා ගහපතිමහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති. වාචාය සුචරිතං චරති. මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. සෙය්‍යථාපි මහාරාජ පුරිසො පල්ලඞ්කා වා පල්ලඞ්කං සඞ්කමෙය්‍ය, අස්සපිට්ඨියා වා අස්සපිට්ඨිං සඞ්කමෙය්‍ය, හත්ථික්ඛන්ධා වා හත්ථික්ඛන්ධං සඞ්කමෙය්‍ය පාසාදා වා පාසාදං සඞ්කමෙය්‍ය. තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි. එවං ඛො මහාරාජ පුග්ගලො ජොතිජොතිපරායණො හොති.

ඉමෙ ඛො මහාරාජ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

දලිද්දො[2] පුරිසො රාජ අස්සද්ධො හොති මච්ඡරී,
කදරියො පාපසඞ්කප්පො මිච්ඡාදිට්ඨි අනාදරො.

සමණෙ බ්‍රාහ්මණෙ වාපි අඤ්ඤෙ වාපි වණිබ්බකෙ[3],
අක්කොසති පරිභාසති නත්ථිකො හොති රොසකො,
දදමානං නිවාරෙති යාචමානාන භොජනං.

තාදිසො පුරිසො රාජ මීයමානො ජනාධිප,
උපෙති නිරයං ඝොරං තමොතමපරායණො.

දලිද්දො පුරිසො රාජ සද්ධො හොති අමච්ඡරී,
දදාති සෙට්ඨසඞ්කප්පො අබ්‍යග්ගමනසො[4] නරො.

1. ඔරොහෙය්‍ය - සිමු. PTS 2. දලිද්දෙ - මජසං, PTS. 3. වනිබ්බකෙ - මජසං.
4. අව්‍යග්ගමනසො - සී 2. ආ

මහරජ, කෙසේ නම් පුද්ගල තෙමේ එළියෙන් අඳුරට යන්නේ වේ ද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආඪ්‍ය වූ මහත් ධන ඇති මහත් භෝග ඇති බොහෝ රන් රිදී ඇති බොහෝ මනවඩන ද ඇති බොහෝ ධනධාන්‍ය ඇති කැත්මහසල් කුලයෙහි හෝ බමුණුමහසල් කුලයෙහි හෝ ගෘහවිමහසල් කුලයෙහි හෝ උසස් කුලයෙක උපන්නේ වේ. හෙ තෙමේ මනා රූ ඇත්තේත් දැකුම්කලු වූයේත් ප්‍රසාද එළවන්නේත් උතුම් පැහැසටහනින් යුක්තවූයේත් ආහාර පාන වස්ත්‍ර යානවාහන මල්ගඳවිලෙවුන් යහන් ලැගුම් ප්‍රදීපොපකරණ ලබන්නේත් වෙයි. හෙ තෙමේ කයින් දුසිරිත් කෙරෙයි. වචනයෙන් දුසිරිත් කෙරෙයි. සිතින් දුසිරිත් කෙරෙයි. කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු පහ වූ සුව ඇති නපුරුගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. මහරජ, යම්සේ පුරුෂයෙක් පහයෙකින් ඇත්කඳකට බස්නේ හෝ වේ නම් ඇත්කඳෙකින් අසුපිටකට බස්නේ හෝ වේ නම් අසුපිටෙකින් පලඟකට බස්නේ හෝ වේ නම් පලඟෙකින් පොළොවට බස්නේ හෝ වේ නම් පොළොවින් අඳුරකට පිවිසෙන්නේ හෝ වේ නම් මහරජ, මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තකු කොට මම කියමි. මහරජ, මෙසේ පුද්ගල තෙමේ එළියෙන් අඳුරට යන්නේ වෙයි.

මහරජ, කෙසේ නම් පුද්ගල තෙමේ එළියෙන් එළියට යන්නේ වේ ද ? මහරජ, මෙහි ඇතැම් පුද්ගලයෙක් ආඪ්‍ය වූ මහද්ධන ඇති, මහාභෝග ඇති, බොහෝ රන්රිදී ඇති, බොහෝ සිත් පිනවන ද ඇති, බොහෝ ධනධාන්‍ය ඇති කැත්මහසල් කුලයෙහි හෝ බමුණු මහසල් කුලයෙහි හෝ ගැහැවි මහසල් කුලයෙහි හෝ උසස්කුලයෙක උපන්නේ වෙයි. හෙ තෙමේ මනා රූ ඇත්තේත් දැකුම්කලු වූයේත් ප්‍රසාද එළවන්නේත් උතුම් පැහැසටහනින් යුක්තවූයේත් ආහාර පාන වස්ත්‍ර යාන වාහන මල් ගඳවිලෙවුන් යහන් ලැගුම් ප්‍රදීපොප-කරණ ලබන්නේත් වෙයි. හෙ තෙමේ කයින් සුසිරිත් කෙරෙයි. වචනයෙන් සුසිරිත් කෙරෙයි. සිතින් සුසිරිත් කෙරෙයි. කයින් සුසිරිත් කොට වචන-යෙන් සුසිරිත් කොට සිතින් සුසිරිත් කොට කාබුන් මරණින් මතු මනා ගති ඇති සවර්ගලෝකයට පැමිණෙයි. මහරජ, යම්සේ පුරුෂයෙක් පලඟෙකින් පල-ඟකට යන්නේ හෝ වේ නම් අසුපිටෙකින් අසුපිටකට යන්නේ හෝ වේ නම් පහයෙකින් පහයකට යන්නේ හෝ වේ නම් මහරජ, මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තකු කොට මම කියමි. මහරජ, මෙසේ පුද්ගල තෙමේ එළියෙන් එළියට යන්නේ වෙයි.

මහරජ, මේ පුද්ගලයෝ සිවුදෙන ලොව ඇත

මහරජ, දිළිඳු පුද්ගල තෙමේ සැදැහැ නැත්තේ වේ ද, මසුරු වේ ද, තදමසුරු වේ ද, පව්ටු අදහස් ඇත්තේ මිසදිටු වූයේ බුද්ධාදීන් කෙරෙහි ආදර නැත්තේ වේ ද,

මහණුන්ටත් බමුණන්ටත් (මෙසින්) අන්‍ය වූ වණිබ්බකයන්ටත් ආක්‍රෝශ කෙරේ ද, පරිභව කෙරේ ද, නැතැයි කියන්නේ වේ ද, මෙරමා ගටන්නේ වේ ද, ඉල්ලන්නවුන්ට බොජුන් දෙන්නහු වළකා ද,

ජනාධිපති මහරජ, අඳුරෙන් අඳුරට යන එබඳු පුද්ගල තෙමේ මැරෙන්-නේ දරුණු නිරයට පැමිණේ.

රජතුමනි, දිළිඳු පුරිස් තෙමේ සැදැහැත්තේ නොමසුරු වූයේ වේ ද, ශ්‍රේෂ්ඨ අදහස් ඇති ඒ මිනිස් තෙමේ එකඟ සිත් ඇත්තේ දන් දේ ද,

සමණෙ බ්‍රාහ්මණෙ වාපි අඤ්ඤෙ වාපි වණිබ්බකෙ,
උට්ඨාය අභිවාදෙති සමචරියාය සික්ඛති,
දදමානං න වාරෙති[1] යාචමානාන භොජනං.

තාදිසො පුරිසො රාජ මීයමානො[2] ජනාධිප,
උපෙති තිදිවං ඨානං තමොජොතිපරායණො.

අඩ්ඪො වෙ පුරිසො රාජ අස්සද්ධො හොති මච්ඡරී,
කදරියො පාපසඞ්කප්පො මිච්ඡාදිට්ඨි අනාදරො.

සමණෙ බ්‍රාහ්මණෙ වාපි අඤ්ඤෙ වාපි වණිබ්බකෙ,
අක්කොසති පරිභාසති නත්ථිකො හොති රොසකො,
දදමානං නිවාරෙති යාචමානාන භොජනං.

තාදිසො පුරිසො රාජ මීයමානො ජනාධිප,
උපෙති නිරයං ඝොරං ජොතිතමපරායණො.

අඩ්ඪො වෙ පුරිසො රාජ සද්ධො හොති අමච්ඡරී,
දදාති සෙට්ඨසඞ්කප්පො අබ්‍යග්ගමනසො නරො.

සමණෙ බ්‍රාහ්මණෙ වාපි අඤ්ඤෙ වාපි වණිබ්බකෙ,
උට්ඨාය අභිවාදෙති සමචරියාය සික්ඛති,
දදමානං න වාරෙති යාචමානාන භොජනං.

තාදිසො පුරිසො රාජ මීයමානො ජනාධිප,
උපෙති තිදිවං ඨානං ජොතිජොතිපරායණොති.

3. 3. 2.

අය්‍යකාසුත්තං.

133. **සාවත්ථියං—**

අථ ඛො රාජා **පසෙනදි කොසලො** දිවාදිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං භගවා එතදවොච: හන්ද කුතො නු ත්වං මහාරාජ, ආගච්ඡසි දිවාදිවස්සාති?

1. නිවාරෙති, සීමු1. 2. මීය්‍යමානො, සභා, සීමු1, PTS.

මහණුන් ද, බමුණන් ද, මෙසින් අන්‍ය වූ වණිබ්බකයන් ද හුනස්නෙන් නැඟිට වදී ද, සමවරියයෙහි හික්මේ ද, යාචකයන්ට බොජුන් දෙන්නහු නොවළහා ද,

ජනශ්‍රේෂ්ඨ වූ මහරජ, අඳුරෙන් එළියට යන එබඳු පුරිස් තෙමේ මැරෙණුයේ දෙව්ලොවට පැමිණේ.

මහරජ, ආඪ්‍ය වූ පුරිස් තෙමේ ඉදින් සැදැහැ නැත්තේ මසුරු වූයේ තද මසුරු වූයේ පච්වූ අදහස් ඇත්තේ මිසදිටු වූයේ (බුදුබාදීන් කෙරෙහි) ආදර රහිත වූයේ වේ ද,

මහණුන්වත් බමුණන්වත් මෙසින් අන්‍යවූ වණිබ්බකයන්වත් ආක්‍රෝශ කෙරේ ද, පරිභව කෙරේ ද, නැතැ'යි කියන්නේ වේ ද, මෙරමා ගටන්නේ වේ ද, ඉල්ලන්නවුන්ට බොජුන් දෙන්නහු වළහා ද,

ජනශ්‍රේෂ්ඨ වූ මහරජ, එළියෙන් අඳුරට යන එබඳු පුරිස් තෙමේ මැරෙණුයේ දරුණු නිරයට පැමිණෙයි.

මහරජ, ආඪ්‍ය වූ පුද්ගල තෙමේ ඉදින් සැදැහැත්තේ නොමසුරු වූයේ වේ ද, උසස් අදහස් ඇති ඒ මිනිස් තෙමේ එකඟසිත් ඇත්තේ දන් දේ ද,

මහණුන් ද බමුණන් ද, මෙසින් අන්‍ය වූ වණිබ්බකයන් ද, හුනස්නෙන් නැඟිට වදී ද, සමවරියයෙහි හික්මේ ද, ඉල්ලන්නවුන්ට බොජුන් දෙන්නහු නො වළහා ද,

ජනාධිපති වූ මහරජ, එළියෙන් එළියට යන එබඳු පුරිස් තෙමේ මැරෙණුයේ දෙව්ලොවට පැමිණේ.

3. 3. 2.

අය්‍යකා සූත්‍රය

133. **සැවත්නුවර—**

එකල්හි **පසේනදි කොසොල්** රජ තෙමේ දෙවෙන් දවල භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පසේනෙදි කොසොල් රජහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: මහරජ, දැන් දෙවෙන් දවල තෙපි කොහි සිට එවු ද?

අය්‍යකා මෙ භන්තෙ, කාලකතා[1] ජිණ්ණා වුද්ධා[2] මහල්ලිකා අද්ධගතා වයොඅනුප්පත්තා වීසංවස්සසතිකා ජාතියා. අය්‍යකා ඛො පන මෙ භන්තෙ, පියා අහොසි[3] මනාපා. හත්ථිරතනෙන චෙපහං[4] භන්තෙ, ලභෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති, හත්ථිරතනම්පා[5]හං දදෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති. අස්සරතනෙන චෙපහං භන්තෙ, ලභෙය්‍යං, මා මෙ අය්‍යකා කාලමකාසීති, අස්සරතනම්පහං දදෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති. ගාමවරෙන චෙපහං භන්තෙ, ලභෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති, ගාමවරම්පහං දදෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති. ජනපදෙන[6] චෙපහං භන්තෙ, ලභෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති, ජනපදම්පහං දදෙය්‍යං මා මෙ අය්‍යකා කාලමකාසීති.

සබ්බෙ සත්තා මහාරාජ, මරණධම්මා මරණපරියොසානා මරණං අනතීතාති.

අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ, යාව සුභාසිතමිදං භන්තෙ, භගවතා සබ්බෙ සත්තා මරණධම්මා මරණපරියොසානා මරණං අනතීතාති.

එවමෙතං මහාරාජ, එවමෙතං මහාරාජ, සබ්බෙ සත්තා මරණධම්මා මරණපරියොසානා මරණං අනතීතාති. සෙය්‍යථාපි මහාරාජ, යානි කානි චි කුම්භකාරභාජනානි[7] ආමකානි චෙව පක්කානි ච, සබ්බානි තානි භෙදනධම්මානි භෙදනපරියොසානානි භෙදනං අනතීතානි. එවමෙව ඛො මහාරාජ සබ්බෙ සත්තා මරණධම්මා මරණපරියොසානා මරණං අනතීතාති.

සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං,
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා,
නිරයං පාපකම්මන්තා පුඤ්ඤකම්මා ච සුග්ගතිං.[8]

තස්මා කරෙය්‍ය කල්‍යාණං නිචයං සම්පරායිකං,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

3. 3. 3.

ලොකසුත්තං.

134. සාවත්ථියං—

එකමන්තං නිසින්නො ඛො රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: කති නු ඛො භන්තෙ ලොකස්ස ධම්මා උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායාති?

---

1. කාලඞ්කතා - මජසං. සයා. PTS. 2. වුඩ්ඪා - මජසං. සයා. 3. පියා හොති - මජසං. 4. චෙපාහං සීදු. මජසං, PTS. 5. හත්ථිරතනං පහං - මජසං PTS. 6. ජනපදප්පදෙසෙන - මජසං 7 කුම්භකාරකභාජනානි. - සීමු. 2. PTS. 8. සුගතිං - සයා.

3. වහන්ස, ජරාජීර්ණ වූ වයෝවෘද්ධ වූ මහලු වූ දිගුකලක් ගෙවූ පිළිවෙළින් පැසුලුවයසට පැමිණි උපතින් එක්සියවිසිවයස් වූ මාගේ මිත්තනියෝ කාලගත වූහ. වහන්ස, මිත්තනියෝ මට ප්‍රිය ද මනාප ද වූහ. වහන්ස, මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා සි ඇත්රුවනිනුදු ඉදින් මම ලබන්නෙම් නම් මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා! සි ඇත්රුවන ද මම දෙන්නෙමි. වහන්ස, මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා සි අස්රුවනිනුදු ඉදින් මම ලබන්නෙම් නම් මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා සි අස්රුවන ද මම දෙන්නෙමි. වහන්ස, මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා! සි ගම්වරෙකිනුදු ඉදින් මම ලබන්නෙම් නම් මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා සි ගම්වරකුදු මම දෙන්නෙමි. වහන්ස, මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා සි දනව්වෙකිනුදු ඉදින් මම ලබන්නෙම් නම් මාගේ මිත්තනියෝ කලුරිය නො කෙරෙත්වා සි දනව්වකුදු මම දෙන්නෙමි.

මහරජ, සියලු සත්ත්වයෝ මරණය සවභාව කොට ඇත්තාහ. මරණය කෙළවර කොට ඇත්තාහ. මරණය නො ඉක්මවූවෝ ය.

වහන්ස, ආශ්චර්‍ය්‍යයෙකි. වහන්ස, අද්භූතයෙකි. වහන්ස, "සියලු සත්ත්වයෝ මරණය සවභාව කොට ඇත්තාහ. මරණය කෙළවර කොට ඇත්තාහ. මරණය නො ඉක්ම වූවෝ ය" යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් අත්‍යර්ථයෙන් මැ මැනවින් දේශනා කරණ ලද්දේ ය.

මහරජ, තෙල එසේ ය. මහරජ, තෙල එසේ ය. සියලු සත්ත්වයෝ මරණය සවභාව කොට ඇත්තෝ ය. මරණය කෙළවර කොට ඇත්තෝ ය. මරණය නො ඉක්මවූවෝ ය. මහරජ, අමු වූත් පැලහුත් යම්කිසි කුඹල්බඳුන් වේ නම්, ඒ සියල්ල යම්සේ බිඳීම සවභාව කොට ඇත්තේ බිඳීම කෙළවර කොට ඇත්තේ බිඳීම නො ඉක්ම වූයේ වේ ද, මහරජ, එසෙයින්ම සියලු සත්ත්වයෝ මරණය සවභාව කොට ඇත්තාහ. මරණය කෙළවර කොට ඇත්තාහ. මරණය නො ඉක්ම වූවෝ ය.

සියලු සත්ත්වයෝ මැරෙන්නාහ. ජීවිතය මරණය කෙළවර කොට ඇත්තේ ය එහෙයිනි. පින්පව්පල අනුව ගියාහු පව්කම් ඇත්තෝ නිරයට ද පින්කම් ඇත්තෝ සුගතියට දැයි මෙසේ කම් වූ පරිද්දෙන් (පරලොව) යන්නාහු ය.

එහෙයින් පරලොවට හිත ද රැස් කරන්නේ පින් කරන්නේ ය. පින් සත්ත්වයන්ට පරලොව පිහිට වේ.

3. 3. 3.

ලෝක සූත්‍රය.

134. සැවැත්නුවර—

එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. වහන්ස, කෙතෙක් ලෝකධර්මයෝ උපදනාහු අහිත පිණිස දුක් පිණිස අපහසු විහරණය පිණිස උපදිද්ද ද?

තයො ඛො මහාරාජ ලොකස්ස ධම්මා උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො? ලොභො ඛො මහාරාජ ලොකස්ස ධම්මො උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසු-විහාරාය. දොසො ඛො මහාරාජ ලොකස්ස ධම්මො උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. මොහො ඛො මහාරාජ ලොකස්ස ධම්මො උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. ඉමෙ ඛො මහාරාජ තයො ලොකස්ස ධම්මා උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායාති.

ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරං ච සම්ඵලන්ති[1].

3. 3. 4.

ඉස්සත්ථසුත්තං.

135. **සාවත්ථියං—**

එකමන්තං නිසින්නො ඛො රාජා **පසෙනදි කොසලො** භගවන්තං එතදවොච: කත්ථ නු ඛො භන්තෙ දානං දාතබ්බන්ති? යත්ථ ඛො මහාරාජ, චිත්තං පසීදතීති. කත්ථ පන භන්තෙ දින්නං මහප්ඵලන්ති. අඤ්ඤං ඛො එතං මහාරාජ කත්ථ දානං දාතබ්බං. අඤ්ඤං පනෙතං කත්ථ දින්නං මහප්ඵලන්ති. සීලවතො ඛො මහාරාජ දින්නං මහප්ඵලං නො තථා දුස්සීලෙ. තෙන හි මහාරාජ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි.

තං කිම්මඤ්ඤසි මහාරාජ, ඉධ ත්‍යාස්ස යුද්ධං පච්චුපට්ඨිතං සඞ්ගාමො සමුපබ්බූළ්හො[2], අථ ආගච්ඡෙය්‍ය ඛත්තියකුමාරො අසික්ඛිතො අකතහත්ථො අකතයොග්ගො අකතුපාසනො[3] භීරුච්ඡම්භී උත්‍රාසී පලායී. භරෙය්‍යාසි තං පුරිසං? අත්ථො ච තෙ තාදිසෙන පුරිසෙනාති. නාහං භන්තෙ භරෙය්‍යං තං පුරිසං. න ච මෙ අත්ථො තාදිසෙන පුරිසෙනාති.

අථ ආගච්ඡෙය්‍ය බ්‍රාහ්මණකුමාරො අසික්ඛිතො -පෙ- අථ ආගච්ඡෙය්‍ය වෙස්සකුමාරො අසික්ඛිතො -පෙ- අථ ආගච්ඡෙය්‍ය සුද්දකුමාරො අසික්ඛිතො -පෙ- භරෙය්‍යාසි තං පුරිසං? අත්ථො ච ඛො තෙ තාදිසෙන පුරිසෙනාති? නාහං භන්තෙ භරෙය්‍යං තං පුරිසං. න ච මෙ අත්ථො තාදිසෙන පුරිසෙනාති.

1. සප්ඵලං - සයා. 2 සමුපව්‍යූළ්හො - සයා 3. අකතූපාසනො - සීමු 2. සයා, PTS.

මහරජ, ලෝදහම් තුනෙක් උපදනේ අහිත පිණිස දුක් පිණිස නො පහසු විහරණය පිණිස උපදී. කවර තුනෙක් ද? යත්: මහරජ, ලෝභ සඞ්ඛ්‍යාත ලෝකධම්මය උපදනේ අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදී. මහරජ, ද්වේෂසඞ්ඛ්‍යාත ලෝකධම්මය උපදනේ අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදී. මෝහ-සඞ්ඛ්‍යාත ලෝකධම්මය උපදනේ අහිත පිණිස දුක් පිණිස නොපහසු විහරණය පිණිස උපදී. මහරජ, මේ ලෝකධම් තුන උපදනේ අහිත පිණිස දුක් පිණිස නො පහසු විහරණය පිණිස උපදී.

ලෝභය ද ද්වේෂය ද මෝහය ද තමා තුළ හටගත්තාහු පවිටු සිත් ඇති මිනිසා පෙළත්. සිය පලය පොතුහර රුකක් (තසත්තාක්) මෙනි.

3. 3. 4.

ඉස්සත්ථ සූත්‍රය.

136. සැවැත්නුවර—

එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. වහන්ස, කවුරුන් විෂයෙහි දන් දියයුතු ද?

මහරජ, යමකු කෙරෙහි සිත පහ දී ද (ඔහුට දියයුතුයි) වහන්ස, කවුරුන් කෙරෙහි දෙන ලද්දේ මහත්ඵල වේ ද?

මහරජ, කවුරුන් කෙරෙහි දන් දියයුතු ද? යන මෙය අනෙකෙකි. කවුරුන් කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වේ ද? යන මෙය අනෙකෙකි. මහරජ, සිල්වතාට දෙන ලද්ද මහත්ඵල වේ. දුශ්ශීලයා කෙරෙහි එසේ නො වේ. මහරජ, එසේ නම් මෙහි ලා තොපම පුළුවුස්නෙමි. යම්සේ තොපට වැටහේ නම් එසේ එය පවසව.

මහරජ, ඒ කුමැයි හඟිහු ද? මෙහි තොපට යුද්ධයෙක් එළඹ සිටියේ වන්නේ ය. යුදසෙනඟ රැස්වූයේ වන්නේ ය. එකල්හි දුනුසිප්හි නුපුහුණු කෘතහස්ත නො වූ විදීමෙහි නුපුරුදු සිප් දක්වූම් නො කළ බියගුළු වෙවුලන තැතිගත්තා සුලු පලා යන කැත් කුමරෙක් එන්නේ නම් ඒ පුරුෂයා පෝෂණය කරවු ද, එබඳු පුරුෂයකුගෙන් තොපට වැඩ ඇත් ද? වහන්ස, මම එබඳු පුරුෂයා පෝෂණය නොකරන්නෙමි. එබඳු පුරුෂයකුගෙන් මට වැඩෙක් ද නැත.

එකල්හි නුපුහුණු බමුණු කුමරෙක් එන්නේ නම් ... එකල්හි නුපුහුණු වෙස්කුමරෙක් එන්නේ නම් ... එකල්හි නුපුහුණු ශුද්‍ර කුමරෙක් එන්නේ නම් ... ඒ පුරුෂයා පෝෂණය කරන්නහු ද,? එබඳු පුරුෂයකුගෙන් තොපට වැඩෙක් ඇද්ද? වහන්ස, මම ඒ පුරුෂයා පෝෂණය නො කරන්නෙමි. එබඳු පුරුෂයකුගෙන් මට වැඩෙක් ද නැත.

තං කිම්මඤ්ඤසි මහාරාජ, ඉධ ත්‍යාස්ස යුද්ධං පච්චුපට්ඨිතං සඞ්ගාමො සමුපබ්බූළ්හො[1]. අථ ආගච්ඡෙය්‍ය ඛත්තියකුමාරො සුසික්ඛිතො[2]. කතහත්ථො කතයොග්ගො කතූපාසනො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී. භරෙය්‍යාසි තං පුරිසං? අත්ථො ච තෙ තාදිසෙන පුරිසෙනාති? භරෙය්‍යාහං භන්තෙ තං පුරිසං අත්ථො ච මෙ තාදිසෙන පුරිසෙනාති.

අථ ආගච්ඡෙය්‍ය බ්‍රාහ්මණකුමාරො සුසික්ඛිතො[2] -පෙ- වෙස්සකුමාරො සුසික්ඛිතො[2] -පෙ- සුද්දකුමාරො සුසික්ඛිතො[2] කතහත්ථො කතයොග්ගො කතූපාසනො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී. භරෙය්‍යාසි තං පුරිසං? අත්ථො ච තෙ තාදිසෙන පුරිසෙනාති? භරෙය්‍යාහං භන්තෙ තං පුරිසං, අත්ථො ච මෙ තාදිසෙන පුරිසෙනාති.

එවමෙව ඛො මහාරාජ, යස්මා කස්මා[3] චෙපි කුලා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: සො ච හොති පඤ්චඞ්ගවිප්පහීනො පඤ්චඞ්ගසමන්නාගතො, තස්මිං දින්නං මහප්ඵලං හොති[4].

කතමානි පඤ්ච අඞ්ගානි පහීනානි[5] හොන්ති? කාමච්ඡන්දො පහීනො හොති, බ්‍යාපාදො පහීනො හොති, ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්චකුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති. ඉමානි පඤ්ච අඞ්ගානි පහීනානි හොන්ති.

කතමෙහි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො හොති? අසෙඛෙන[6] සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන[6] සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන[6] පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන[6] විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන[6] විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. ඉමෙහි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො හොති.

ඉති පඤ්චඞ්ගවිප්පහීනෙ පඤ්චඞ්ගසමන්නාගතෙ දින්නං මහප්ඵලන්ති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

ඉස්සත්ථං[7] බලවිරියඤ්ච යස්මිං විජ්ජෙථ මාණවෙ,
තං යුද්ධත්ථො භරෙ රජා නාසූරං ජාතිපච්චයා.

තථෙව ඛන්ති සොරච්චං ධම්මා යස්මිං පතිට්ඨිතා,
තමරියවුත්තිං[8] මෙධාවිං හීනජච්චම්පි පූජයෙ.

කාරයෙ අස්සමෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ,
පපඤ්ච විවනෙ කයිරා දුග්ගෙ සඞ්කමනානි ච.

අන්නං පානං ඛාදනීයං වත්ථසෙනාසනානි ච,
දදෙය්‍ය උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

---

1. සමුපබ්‍යූළ්හො - සයා. 2. සික්ඛිතො - සීමු2, 3. යස්මා චෙපි - සීමු, සයා
4. මහප්ඵලං - සීමු, 5. විප්පහීනානි - සීමු, 6. අසෙක්ඛෙන. - මජ්සං, සයා PTS.
7. ඉස්සත්තං - මජ්සං, PTS. 8. අරියවුත්තිං - මජ්සං.

මහරජ, ඒ කුමකැයි හඟිහු ද? මෙහිතොපට යුද්ධයෙක් එළඹසිටියේ වන්නේ ය. යුද්සෙනහ රැස් වූයේ වන්නේ ය. එකල්හි දුනුසිප්හි මැනවින් පුහුණු වූ කෘතහස්ත වූ කළපුරුදු ඇති සිප් දක්වුම් කළ බියගුලු නො වූ නොවෙවුලන නො නැතිගන්නා පලා නො යනසුලු කැත්කුමරෙක් එන්නේ නම් ඒ පුරුෂයා පෝෂණය කරන්නහු ද? එබඳු පුරුෂයකු ගෙන් තොපට වැඩෙක් ඇද්ද? වහන්ස, මම ඒ පුරුෂයා පෝෂණය කරන්නෙමි. එබඳු පුරුෂයකුගෙන් මට වැඩෙක් ඇත.

එකල්හි මැනවින් පුහුණු වූ බමුණු කුමරෙක් එන්නේ නම්... මැනවින් පුහුණු වූ වෙස් කුමරෙක් ... මැනවින් පුහුණු වූ කෘතහස්ත වූ කළපුරුදු ඇති කළ සිප් දක්වුම් ඇති බියගුලු නො වූ නො වෙවුලන නොනැති ගන්නා පලා නො යන සුලු සුදු කුමරෙක් ... ඒ පුරුෂයා පෝෂණය කරන්නහු ද? එබඳු පුරුෂයකුගෙන් තොපට වැඩෙක් ඇද්ද? වහන්ස, මම ඒ පුරුෂයා පෝෂණය කරන්නෙමි. එබඳු පුරුෂයකුගෙන් මට වැඩෙක් ඇත.

මහරජ, එසෙයින් ම යම් කවර කුලයෙකින් හෝ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වේ ද? හෙ තෙමේත් ප්‍රහීණ වූ පසඟක් ඇත්තේ පසඟෙකින් සමන්විත වූයේ නම් ඔහු කෙරෙහි දෙන ලද්දේ මහත්ඵල වෙයි.

කවර පසක් ප්‍රහීණ වූයේ වේ ද? යත්: කාමච්ඡන්දය ප්‍රහීණ වූයේ වෙයි. ව්‍යාපාදය ප්‍රහීණ වූයේ වෙයි. ථීනමිද්ධය ප්‍රහීණ වූයේ වෙයි. උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණ වූයේ වෙයි. විචිකිච්ඡාව ප්‍රහීණ වූයේ වෙයි. මේ පසඟ ප්‍රහීණ වූයේ වේ.

කවර පසඟෙකින් සමන්විත වූයේ ද? යත්: අශෛක්‍ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ වෙයි. අශෛක්‍ෂ වූ සමාධිස්කන්ධයෙන් සමන්විත වූයේ වෙයි. අශෛක්‍ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන් සමන්විත වූයේ වෙයි. අශෛක්‍ෂ වූ විමුක්තිස්කන්ධයෙන් සමන්විත වූයේ වෙයි. අශෛක්‍ෂ වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්විත වූයේ වෙයි. මේ පසඟින් සමන්විත වූයේ වෙයි. මෙසේ ප්‍රහීණ වූ පසඟක් ඇති පසඟෙකින් සමන්විත වූවහු කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා නැවත පසු ව මෙය ද වදාළ සේක.

යම් තරුණයකු කෙරෙහි ධනුශිල්පයත් කායික චෛතසික වීර්‍ය්‍යයත් විද්‍යමාන වේ නම් රජ තෙමේ ඔහු යුද පිණිස පෝෂණය කරන්නේ ය. අදක්‍ෂයා ජාතිය හේතු කොට ගෙණ පෝෂණය නොකරන්නේ ය.

එපරිද්දෙන් ම යමකු කෙරෙහි ඉවසීම ද රහත්බව ද යන ධර්මයෝ පිහිටියාහු ද ආර්‍ය්‍ය පැවතුම් ඇති නුවණැති ඔහු හීනජාතිකයකු වූව ද පුදන්නේ ය.

සිත්කලු අසපු කරවන්නේ ය. එහි බහුශ්‍රැතයන් වස්වන්නේ ය. නිරුදක අරණ්‍යයෙහි පැන්පොකුණු ද නොසමබිම්හි සක්මන්මලු ද කරවන්නේ ය.

අහර ද පැන් ද කැවිලි ද වත්සෙනසුන් ද රහතුන් කෙරෙහි පහන්සිතින් දෙන්නේ ය.

යථා හි මෙඝො ථනයං විජ්ජුමාලී සතක්කකු[1],
ථලං නින්නඤ්ච පූරෙති අභිවස්සං වසුන්ධරං.

තථෙව සද්ධො සුතවා[2] අභිසඞ්ඛච්ච භොජනං,
වණිබ්බකෙ තප්පයති අන්නපානෙන පණ්ඩිතො,
ආමොදමානො[3] පකිරෙති දෙථ දෙථාති භාසති.

තං හිස්ස ගජ්ජිතං හොති දෙවස්සෙව පවස්සතො,
සා පුඤ්ඤධාරා විපුලා දාතාරං අභිවස්සතීති.

3. 3. 5.

පබ්බතූපමසුත්තං

136. සාවත්ථියං—

එකමන්තං නිසින්නං ඛො රාජානං **පසෙනදිං කොසලං** භගවා එතදවොච: හන්ද කුතො නු ත්වං මහාරාජ ආගච්ඡසි දිවාදිවස්සාති?

යානි තානි භන්තෙ රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං ඉස්සරියමද-මත්තානං කාමගෙධපරියුට්ඨිතානං ජනපදත්ථාවරියප්පත්තානං මහන්තං පථවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසන්තානං රාජකරණීයානි සන්ති[4], තෙස්වාහං[5] එතරහි උස්සුක්කං ආපන්නොති.

තං කිම්මඤ්ඤසි මහාරාජ, ඉධ තෙ පුරිසො ආගච්ඡෙය්‍ය පුරත්ථිමාය දිසාය සද්ධායිකො පච්චයිකො. සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: යග්ඝෙ මහාරාජ ජානෙය්‍යාසි: අහං ආගච්ඡාමි පුරත්ථිමාය දිසාය. තත්ථද්දසං මහන්තං පබ්බතං අබ්භසමං. සබ්බෙ පාණෙ නිප්පොථෙන්තො[6] ආගච්ඡති. යං තෙ මහාරාජ කරණීයං තං කරොහීති. අථ දුතියො පුරිසො ආගච්ඡෙය්‍ය දක්ඛිණාය දිසාය -පෙ- අථ තතියො පුරිසො ආගච්ඡෙය්‍ය පච්ඡිමාය දිසාය -පෙ- අථ චතුත්ථො පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාය දිසාය සද්ධායිකො පච්චයිකො. සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: යග්ඝෙ මහාරාජ ජානෙය්‍යාසි: අහං ආගච්ඡාමි උත්තරාය දිසාය තත්ථද්දසං මහන්තං පබ්බතං අබ්භසමං. සබ්බෙ පාණෙ නිප්පොථෙන්තො[6] ආගච්ඡති. යං තෙ මහාරාජ කරණීයං තං කරොහීති. එවරූපෙ තෙ මහාරාජ මහති මහබ්භයෙ සමුප්පන්නෙ දාරුණෙ මනුස්සක්ඛයෙ දුල්ලභෙ මනුස්සත්තෙ කිමස්ස කරණීයන්ති?

එවරූපෙ මෙ භන්තෙ මහති මහබ්භයෙ සමුප්පන්නෙ දාරුණෙ මනුස්ස-ක්ඛයෙ දුල්ලභෙ මනුස්සත්තෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලකිරියාය පුඤ්ඤකිරියායාති.[7]

ආරොචෙමි ඛො තෙ මහාරාජ, පතිවෙදයාමි[8] ඛො තෙ මහාරාජ, අධිවත්තති ඛො තං මහාරාජ ජරාමරණං. අධිවත්තමානෙ ච තෙ මහාරාජ, ජරාමරණෙ කිමස්ස කරණීයන්ති?

---

1. සතක්කකු – PTS. 2. සුත්වා - සෑ. 3. අනුමොදමානො - සෑ 4. භවන්ති, සෑ, මජ්සං. 5. තෙසුබ්බාහං-මජ්සං. 6. නිප්පොථෙන්තා - සීමු, 2. නිප්පොථෙන්තො – මජ්සං. සෑ 7. අඤ්ඤත්‍ර සමචරියාය අඤ්ඤත්‍ර කුසලකිරියාය අඤ්ඤත්‍ර පුඤ්ඤකිරියායාති - මජ්සං. සෑ 8. පටිවෙදෙමි - මජ්සං. සෑ. PTS. සී 1. 2.

යම්සේ විදුලි පෙළ ඇති සියගණන් (වලා) කුළු ඇති මේඝය ගුගුරමින් පොළොව තෙමන්නේ වළ ද ගොඩ ද පුරවා ද,

එසේ ම සැදැහැති ඇසූ පිරූ තැන් ඇති නුවණැත්තේ බොජුන් පිළියෙල කොට ආහාරපානයෙන් වණිබ්බකයන් සතප්වයි. සතුටු වන්නේ සර්වප්‍රකාරයෙන් විසුරුවන්නාක් මෙන් දන් දෙයි. නොනොත් දන්හලෙහි හැසිරෙයි. දෙව දෙව යි කියයි.

වස්නා වැස්සෙක (ගර්ජනය) මෙන් එය ඔහුගේ ගර්ජනය වෙයි. මහත් වූ ඒ පින් දහර දෙන්නහු මැනවින් තෙමයි.

3. 3. 5.

පබ්බතූපම සූත්‍රය.

136. **සැවැත්නුවර—**

එකත්පසෙක හුන් **පසේනදි කොසොල්** රජහට භාග්‍යවතුන් වහන්සේ මේය වදාළ සේක. මහරජ තෙපි දූන් මේ දෙවෙන් දවාලෙහි කොහි සිට එවුද?

වහන්ස, ඉසුරුමෙදෙන් මත් වූ කාමයෙහි ගිජු බැවින් මැඩුනු දනව්හි තිරබවට පත් මුදුන්හි අභිෂේක කරණ ලද මහත් පොළෝමඩල දිනා අධිපතිව වෙසෙන කැත් රජුන්ට යම් ඒ රජකටයුතු ඇද්ද, මම දූන් එහි උත්සුකබවට පැමිණියෙම් වෙම්.

මහරජ, ඒ කුමකැයි හඟිහු ද? මෙහි තොප විසින් ඇදහියයුතු පිළිගත හැකි වචන ඇති පුරුෂයෙක් පෙර දිගින් එන්නේ ය. හෙ තෙමේ තොප වෙත එළඹ "දේවයන් වහන්ස, දූත වදාළ මැනවි. මම පෙරදිග සිට එමි. එහි අහස හා සම වූ මහපව්වක් දිටිමි. සියලු සතුන් සුණු කෙරෙමින් එයි. දේවයන් වහන්ස, නුඹවහන්සේ විසින් යමක් කටයුතු නම් එය කරණු මැනවැ"යි මෙසේ සැළ කරන්නේ ය. ඉක්බිති දෙවෙනි පුරුෂයෙක් දකුණු දිග සිට එයි ...... ඉක්බිති තෙවෙනි පුරුෂයෙක් පැසුළු දිග සිට එයි. ...... ඉක්බිති ඇදහිය යුතු පිළිගත හැකි වචන ඇති සිවුවැනි පුරුෂයෙක් උතුරු දිග සිට එයි. හෙ තෙමේ තොප වෙත එළඹ "දේවයන් වහන්ස, දූත වදාළ මැනවි. මම උතුරුදිග සිට එමි. එහි අහස හා සම වූ මහපව්වක් දිටිමි. සියලු සතුන් සුණු කෙරෙමින් එයි. දේවයන් වහන්ස, නුඹවහන්සේ විසින් යමක් කටයුතු නම් එය කරණු මැනවැ"යි මෙසේ සැළ කරන්නේය. මහරජ, දරුණු වූ මිනිසුන් නසන මහත් වූ මෙබඳු නපුරු බියක් හටගත් කල්හි දුබල මිනිසත් බැව්හි වූ තොප විසින් කිමෙක් කටයුතු වන්නේ ද?

වහන්ස, දරුණු වූ මිනිසුන් නසන මහත් වූ මෙබඳු නපුරු බියක් හටගත් කල්හි දුලබ මිනිසත් බැව්හි ධර්මචර්‍ය්‍යාව සමචර්‍ය්‍යාව කුශලක්‍රියාව පුණ්‍යක්‍රියාව හැර අන් කිමෙක් කටයුතු වන්නේ ද.

මහරජ, තොපට කියමි. මහරජ, තොපට දන්වමි. මහරජ, ජරාමරණ දෙක තොප මැඩ ගෙණ සිටී. මහරජ, ජරාමරණ දෙක තොප මැඩ ගෙණ සිටි කල්හි තොප විසින් කිමෙක් කටයුතු වන්නේ ද?

අධිවත්තමානෙ ච මෙ භන්තෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලකිරියාය පුඤ්ඤකිරියාය.

යානි තානි භන්තෙ රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං ඉස්සරියමදමත්තානං කාමගෙධපරියුට්ඨිතානං ජනපදත්ථාවරියප්පත්තානං මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසන්තානං හත්ථියුද්ධානි භවන්ති. තෙසම්පි භන්තෙ හත්ථියුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරාමරණෙ.

යානිපි තානි භන්තෙ රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං – පෙ – අස්සයුද්ධානි භවන්ති – පෙ – රථයුද්ධානි භවන්ති – පෙ – පත්තියුද්ධානි භවන්ති. තෙසම්පි භන්තෙ පත්තියුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරාමරණෙ.

සන්ති ඛො පන භන්තෙ ඉමස්මිං රාජකුලෙ මන්තිනො මහාමත්තා යෙ පහොන්ති ආගතෙ පච්චත්ථිකෙ මන්තෙහි භෙදයිතුං. තෙසම්පි භන්තෙ මන්තයුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරාමරණෙ.

සංවිජ්ජති ඛො පන භන්තෙ ඉමස්මිං රාජකුලෙ පහූතං හිරඤ්ඤසුවණ්ණං භූමිගතඤ්චෙව වෙහාසට්ඨඤ්ච. යෙන මයං පහොම ආගතෙ පච්චත්ථිකෙ ධනෙන උපලාපෙතුං. තෙසම්පි භන්තෙ ධනයුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරාමරණෙ.

අධිවත්තමානෙ ච මෙ භන්තෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලකිරියාය පුඤ්ඤකිරියායාති.

එවමෙතං මහරාජ, එවමෙතං මහාරාජ, අධිවත්තමානෙ ච තෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලකිරියාය පුඤ්ඤකිරියායාති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

යථාපි සෙලා විපුලා නභං ආහච්ච පබ්බතා,
සමන්තා අනුපරියෙය්‍යුං[1] නිප්පොථෙන්තා[2] චතුද්දිසා.

එවං ජරා ච මච්චු[3] ච අධිවත්තන්ති පාණිනො[4],
ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ,
න කිඤ්චි පරිවජ්ජෙති සබ්බමෙවාභිමද්දති.

න තත්ථ හත්ථීනං[5] භූමි න රථානං න පත්තියා,
න චාපි මන්තයුද්ධෙන සක්කා ජෙතුං ධනෙන වා.

තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
බුද්ධෙ ධම්මෙ ච සඞ්ඝෙ ච ධීරො සද්ධං නිවෙසයෙ.

1 සමන්තානුපරියායෙය්‍යුං - මජසං. 2. නිප්පොථෙන්තා - මජසං. 3. මරණං - සී 1
4. පාණිනෙ - මජසං. 5. හත්ථිනං - මජසං, ස්‍යා, PTS.

වහන්ස, ජරාමරණ දෙක (අප) මැඩ ගෙණ සිටි කල්හි ධම්චයර්‍යාව සමචරියාව කුසලක්‍රියාව පුණ්‍යක්‍රියාව හැර මා විසින් අන් කිමෙක් කටයුතු වන්නේ ද.

වහන්ස, ඉසුරුමෙදෙන් මත් වූ කාමයෙහි ගිජුබැවින් මඩනාලද දනව්හි තිරබවට පත් මහත් පොළෝමඩල දිනා අධිපති ව වෙසෙන මුදුන අභිෂේක කළ කැත් රජුන්ගේ යම් ඒ ඇත්යුද වේ නම් වහන්ස, ජරාමරණදෙක (අප) මැඩ ගෙණ සිටි කල්හි ඒ ඇත් යුදවලට ද වැඩෙක් නැත. සමත්බවෙක් නැත.

වහන්ස, මුදුන අභිෂේක කළ ... කැත් රජුන්ගේ යම් ඒ අස්යුද වේ නම් ... රථයුද වේ නම් ...... පාබලයුද වේ නම් වහන්ස, ජරා මරණ දෙක අප මැඩ ගෙණ සිටි කල්හි ඒ පාබල යුදවලට ද වැඩෙක් නැත. සමත් බවෙක්ද නැත.

වහන්ස, යම් කෙනෙක් ආවා වූ සතුරන් මන්ත්‍රණයෙන් බිඳුවා ලන්නට සමත් වෙත් නම් එබඳු මැති ඇමතිකෙනෙක් මේ රජකුලයෙහි ඇත. වහන්ස, ජරාමරණ දෙක අප මැඩ ගෙණ සිටි කල්හි ඒ මන්ත්‍රයුද්ධයන්ට ද වැඩෙක් නැත. සමත් බවෙක් නැත.

වහන්ස, ආවා වූ සතුරන් ධනයෙන් පොළඹවා ගන්නට යම් ධනයෙකින් අපි සමර්ථ වමෝ නම් බිම පිහිටියා වූත් අහස සිටියා වූත් එබඳු බොහෝ රන් අමුරන් මේ රදකුලයෙහි ඇත. වහන්ස, ජරාමරණදෙක අප මැඩ ගෙණ සිටි කල්හි ඒ ධනයුද්ධයන්ට ද වැඩෙක් නැත. සමත් බැවෙක් නැත.

වහන්ස, ජරාමරණදෙක මා මැඩ ගෙණ සිටි කල්හි ධම්චයර්‍යාව, සමචයර්‍යාව, කුශලක්‍රියාව, පුණ්‍යක්‍රියාව හැර මා විසින් අන් කිමෙක් කටයුතු වන්නේ ද.

මහරජ, තෙල එසේය. මහරජ, තෙල එසේ ය. ජරාමරණදෙක (තොප) මැඩගෙණ සිටි කල්හි ධම්චයර්‍යාව, සමචයර්‍යාව, කුශලක්‍රියාව, පුණ්‍යක්‍රියාව හැර තොප විසින් අන් කිමෙක් කටයුතු වන්නේ ද.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා වැලි අන්‍ය වූ තෙල ගාපෙල ද වදාළ සේක:

යම්සේ මහත් වූ ශෛලමය වූ අහස හැපී (සිටි) පර්වතයෝ හාත්පස සිවු දිගුන් සුණු කොරෙමින් පෙරළී එත්නාහු ද,

එසේ ජරාවත් මරණයත් ක්ෂත්‍රියයන් ද බ්‍රාහමණයන් ද වෛශ්‍යයන් ද ශුද්‍රයන් ද සැඩොල් පුප්සඹු කුලයෙහි වූවන් ද යන සියලු සතුන් යට කෙරෙත්. කිසිවක් අත් නො හරී. සියල්ල ම මඩී.

එහි ඇතුන්ට ද රථයන්ට ද පාබලසෙනඟ ට ද විෂයසථාන නො වේ. මන්ත්‍රයුද්ධයෙන් හෝ ධනයෙන් හෝ දිනන්නට නො ම හැක්කේ ය.

එහෙයින් ධෛර්‍යවත් වූ නුවණැති පුරුෂ තෙමේ තමහට වැඩ දක්නේ බුදුන් කෙරෙහි ද ධර්මය කෙරෙහි ද සඞ්ඝයා කෙරෙහි ද ශ්‍රද්ධාව පිහිටුවන්නේ ය.

යො ධම්මචාරී[1] කායෙන වාචාය උද චෙතසා,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති.

කොසලවග්ගො තතියො.

තස්සුද්දානං:

පුග්ගලො අය්‍යකා ලොකො ඉස්සත්ථං පබ්බතූපමං,
දෙසිතං බුද්ධසෙට්ඨෙන ඉමං කොසලපඤ්චකන්ති.

කොසලසංයුත්තං සමත්තං.

---

4. මාරසංයුත්තං

1. ආයුවග්ගො.

4. 1. 1.

තපොකම්මසුත්තං.

137. එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ **අජපාලනිග්‍රොධමූලෙ** පඨමාභිසම්බුද්ධො. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: මුත්තො වතම්හි තාය දුක්කරකාරිකාය. සාධු මුත්තො වතම්හි තාය අනත්ථසංහිතාය දුක්කරකාරිකාය. සාධු ඨිතො සතො බොධිං සමජ්ඣගන්ති[2].

අථ ඛො මාරො පාපිමා භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

තපොකම්මා අපක්කම්ම යෙන සුජ්ඣන්ති මානවා,
අසුද්ධො මඤ්ඤසි සුද්ධො සුද්ධිමග්ගමපරද්ධොති[3].

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:

අනත්ථසංහිතං ඤත්වා යං කිඤ්චි අමරං තපං,
සබ්බං නත්ථාවහං හොති පියාරිත්තං[4] ව ධම්මනි.

සීලං සමාධිං පඤ්ඤඤ්ච[5] මග්ගං බොධාය භාවයං,
පත්තොස්මි පරමං සුද්ධිං නිහතො ත්වමසි අන්තකාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

---

1. ධම්මං චරී - මජසං. 2. සාධු වතම්හි සතො බොධිසමජ්ඣගූති. සයා. සාධු වතම්හි මුත්තො බොධිං සමජ්ඣගන්ති, මජසං. 3. සුද්ධිමග්ගා අපරද්ධාති – මජසං. 4. ඵියා – මජසං 5 සමාධිපඤ්ඤඤ්ච. මජසං, PTS.

යමෙක් කයින් ද වචනයෙන් ද යලි සිතින් ද ධර්මයෙහි හැසිරේණ සුළු ද (නුවණැත්තෝ) මෙලොව ම ඔහු පසසත්. පරලොව ස්වර්ගයෙහි සතුටු වෙයි.

කෝසල වර්ගය තුන් වැනියි.

එහි උද්දානය:

පුග්ගල, අය්‍යකා, ලොක, ඉස්සත්ථ, පබ්බතූපම සූත්‍රය යන මේ කෝසලපඤ්චකය ශ්‍රේෂ්ඨ වූ බුදුරජානන් වහන්සේ විසින් දේශනා කරණ ලදී.

කෝසලසංයුත්තය නිමියේ ය.

---

4. මාරසංයුත්තය.

1. ආයුවර්ගය.

4. 1. 1.

තපොකම්ම සූත්‍රය.

137. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදුව පළමු කොට **උරුවෙල්දනව්වෙහි** **නේරඤ්ජරා** **තෙර** **අජපල්** නුගරුක්මුල වැඩවසන සේක. එකල්හි එකලා වූ චිත්තවිවේකයෙන් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට "ඒ දුෂ්කරක්‍රියායෙන් ඒකාන්තයෙන් මිදුනෙම් වෙමි. ඒ නොවැඩ ඇසුරු කල දුෂ්කරක්‍රියායෙන් ඒකාන්තයෙන් මැනවින් මිදුනෙම් වෙමි. ස්ථිර ව එලඹසිටි සිහි ඇත්තෙම් මැනවින් සත්‍යාවබෝධය කෙළෙමි"යි මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය.

ඉක්බිති පවිටු මරු තෙමේ තමසිතින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තවිතර්කය දැන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

යම් තපසෙකින් මනුෂ්‍යයෝ පිරිසිදු වෙද්ද, ඒ තපස්කර්මයෙන් ඉවත් ව අශුද්ධ වූයේ ම ශුද්ධිමාර්ගය වැරදවූයේ ශුද්ධි යයි හඟිහි ද,

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මාරයා යි දැන පවිටු මාරයාහට ගාථාවලින් පෙරලා වදාළ සේක:

අමර නම් වූ යම්කිසි තපසෙක් වේ ද, (ඒ සියල්ල) අනර්ථසංහිත යයි දැන (අත්හළෙමි.) ඒ සියල්ල වැඩ සිදුකරන්නේ නො වේ. (කෙසේ ද? යත්:) මරුකතරෙහි රිටිපලුපත් මෙනි. (මරුකතරෙහි වූ නැවක් රිටිපලුපත් ගෙණ පදවන්නට නො හැක්කාක් මෙනි.)

ශීලය ද සමාධිය ද ප්‍රඥාව ද යන ආයර්‍යමාර්ගය සත්‍යාවබෝධය පිණිස වඩමින් පරමශුද්ධියට පැමිණියෙමි වෙමි. මාරය, තෝ නටුයෙහි.

ඉක්බිති පවිටු මරු තෙමේ භාග්‍යවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනී යයි දුකට පැමිණියේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 1. 2.

නාගසුත්තං.

188. එවං මෙ සුතං: එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධමූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අජ්ඣොකාසෙ[1] නිසින්නො හොති. දෙවො ච එකමෙකං ඵුසායති.

අථ ඛො මාරො පාපිමා භගවතො භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො මහන්තං හත්ථිරාජවණ්ණං අභිනිම්මිනිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. සෙය්‍යථාපි නාම මහාඅරිට්ඨකො මණි, එවමස්ස සීසං හොති. සෙය්‍යථාපි නාම සුද්ධං රූපියං, එවමස්ස දන්තා හොන්ති. සෙය්‍යථාපි නාම නඞ්ගලීසා[2], එවමස්ස සොණ්ඩො හොති.

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාය අජ්ඣභාසි:

සංසරං[3] දීඝමද්ධානං වණ්ණං කත්වා සුභාසුභං,
අලං තෙ තෙන පාපිම නිහතො ත්වමසි අන්තකාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

4. 1. 3.

සුභසුත්තං.

139. එවං මෙ සුතං: එකං සමයං භගවා උරුවෙලායං විහරති -පෙ- පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අජ්ඣොකාසෙ[4] නිසින්නො හොති. දෙවො ච එකමෙකං ඵුසායති.

අථ ඛො මාරො පාපිමා භගවතො භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො අවිදූරෙ උච්චාවචා වණ්ණනිභා උපදංසෙති සුභා චෙව අසුභා ච.

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි අජ්ඣභාසි:

සංසරං දීඝමද්ධානං වණ්ණං කත්වා සුභාසුභං,
අලං තෙ තෙන පාපිම නිහතො ත්වමසි අන්තක.

යෙ ච කායෙන වාචාය මනසා ච සුසංවුතා,
න තෙ මාරවසානුගා න තෙ මාරස්ස බද්ධගුති[5].

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

---

1. අබ්භොකාසෙ - මජසං. 2. නාඞ්ගලසීසා - PTS. 3. සංසාරං - සංසා. PTS. සී 1, 2.
4. අබ්භොකාසෙ - මජසං. 3. 5. පච්චගුති - සීමු, සංසා. PTS. සී 1' 2.

4. 1. 2.

නාග සූත්‍රය.

138. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදු ව පළමු කොට උරුවෙල් දනව්වෙහි නේරඤ්ජරා නෙරඹ අජපල්නුගරුක්මුල වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ දුඹිගනදුරෙහි එළිමහනෙහ වැඩහුන් සේක. වැස්ස ද එක්එක් පොද හෙළයි.

ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට බිය වෙවුළුම ලොමුදැහැගැන්ම උපදවනු කැමැත්තේ මහත් ඇත්රජවෙසක් මවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ඔහුගේ හිස මහකළුගලක් වැන්න. ඔහුගේ දත් පිරිසිදු රිදී වැන්න. ඔහුගේ සොඬය නගුලිස්දඬක් වැන්න.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මාරයා යී දැන පවිටු මාරයාහට ගාථායෙන් වදාළ සේක. දීඝීකාලයක් මුළුල්ලෙහි සැරිසරන්නේ ශුභාශුභ වෙශවිලාස කොට (මා වෙත) පැමිණියෙහි ය. මාරය, එයින් තට කම් නැත. මාරය, තෝ නටුයෙහි.

ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවත් තෙමේ මා දනී. සුගත තෙමේ මා දනී යයි දුකට පැමිණියේ නොසතුටුසිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 1. 3.

සුභ සූත්‍රය.

139. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සම්බෝධියෙන් පළමුවලා උරුවෙල් දනව්වෙහි ... වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ දුඹිගනදුරෙහි අබවස වැඩහුන් සේක. වැස්ස ද එක්එක් පොද හෙළයි.

එකල්හි පවිටු මරු තෙමේ භාග්‍යවතුන් වහන්සේට බියවෙවුළුම ලොමුදැහැගැන්ම උපදවනු කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ප්‍රිය වූත් අප්‍රිය වූත් විසිතුරු සටහන් දක්වයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මරු යයි දැන පවිටු මරුහට ගාථාවලින් වදාළ සේක:

දීඝීකාලයක් මුළුල්ලෙහි සැරිසරන්නේ ශුභාශුභවේශ විලාස කොට (මා වෙත ආයෙහි ය.) එම්බල පවිටු මරුව, තට එයින් කම් නැත. මරුව තෝ නටුයෙහි.

යම් කෙනෙක් කයින් ද වචනයෙන් ද සිතින් ද සංවෘත වෙද්ද, මරුව, ඔහු තට වසඟ නොවෙත්. ඔහු මාරයාගේ බැම්මට අනු (-අනුවැත්තෝ) නො වෙත්.

එකල්හි පවිටු මරු තෙමේ "භාග්‍යවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනී ය"යි දුකට පත් වූයේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් වි ය.

4. 1. 4.

පඨමපාසසුත්තං.

140. එවං මෙ සුතං. එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ මිගදායෙ.** තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මය්හං ඛො භික්ඛවෙ යොනිසො මනසිකාරා යොනිසො සම්මප්පධානා අනුත්තරා විමුත්ති අනුප්පත්තා, අනුත්තරා විමුත්ති සච්ඡිකතා. තුම්හෙපි භික්ඛවෙ යොනිසො මනසිකාරා යොනිසො සම්මප්පධානා අනුත්තරං විමුත්තිං අනුපාපුණාථ. අනුත්තරං විමුත්තිං සච්ඡිකරොථාති.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

බද්ධො'සි[1] මාරපාසෙන යෙ දිබ්බා යෙ ච මානුසා,
මාරබන්ධනබද්ධොසි[1] න මෙ සමණ මොක්ඛසීති.

[භගවා:]

මුත්තොහං[2] මාරපාසෙන යෙ දිබ්බා යෙ ච මානුසා,
මාරබන්ධනමුත්තොම්හි නිහතො ත්වමසි අන්තකාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

4. 1. 5.

දුතියපාසසුත්තං.

141. එවං මෙ සුතං එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ මිගදායෙ.** තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මුත්තොහං[2] භික්ඛවෙ සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා. තුම්හෙපි භික්ඛවෙ මුත්තා සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා. චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය[3] අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන ද්වෙ අගමිත්ථ[4]. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අහම්පි භික්ඛවෙ යෙන උරුවෙලා සෙනානිගමො[5] තෙනුපසඞ්කමිස්සාමි ධම්මදෙසනායාති.

---

1. බන්ධො'සි - සෳා. 2. මුත්තාහං, මජසං, සෳා. 3. ලොකානුකම්පකාය, සීමු2, PTS.
4. අගමත්ථ සීමු2 5. සෙනානිගමො - මජසං, සෳා, PTS.

4. 1. 4.

පඨමපාස සූත්‍රය.

140. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **බරණැස්නුවර** සමීපයෙහි **ඉසිපතන** නම් වූ මුවවෙනෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්ස යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මේය වදාළ සේක:

මහණෙනි, මා විසින් නුවණින් මෙනෙහි කිරීමෙන් නුවණින් ප්‍රධන්වීර්‍ය්‍ය කිරීමෙන් නිරුත්තර විමුක්තිය ලබන ලදී, නිරුත්තර විමුක්තිය ප්‍රත්‍යක්‍ෂ කරණ ලදී. මහණෙනි, තෙපි ද නුවණින් මෙනෙහි කිරීමෙන් නුවණින් ප්‍රධන්වීර්‍ය්‍ය වැඩීමෙන් නිරුත්තර විමුක්තියට පැමිණෙව. නිරුත්තර විමුක්තිය ප්‍රත්‍යක්‍ෂ කරව.

එකල්හි පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

මාරපාශයෙන් බඳනා ලද්දෙහි: දිව්‍ය වූ යම් බන්ධනයෝ වෙද්ද, මිනිසුන් පිළිබඳ වූ යම් බන්ධනයෝත් වෙද්ද, (ඒ සියලු) මාරබන්ධනයෙන් බැඳුනෙහි. මහණ, මා කෙරෙන් නො මිදෙන්නෙහි ය.

[භගවත්හු:]

මාරබන්ධනයෙන් මිදුනෙම් වෙමි. දෙවියන් පිළිබඳ වූ යම් බන්ධනයෝ වෙද්ද, මිනිසුන් පිළිබඳ වූ යම් බන්ධනයෝත් වෙද්ද, (ඒ සියලු) මාර බන්ධනයෙන් මිදුනෙම් වෙමි. මරුව තෝ නටුයෙහි.

ඉක්බිති පවිටු මරු භාග්‍යවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනී ය යි දුකට පත් වූයේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 1. 5.

දුතියපාස සූත්‍රය.

141. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **බරණැස්නුවර සමීපයෙහි ඉසිපතන** නම් වූ මුවවෙනෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "පින්වතුන් වහන්ස"යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, දෙවියන් පිළිබඳ වූ යම් බන්ධනයෝ වෙද්ද, මිනිසුන් පිළිබඳ වූ යම් බන්ධනයෝත් වෙද්ද (ඒ) සියලු බන්ධනයන් ගෙන් මම මිදුනෙම් වෙමි. මහණෙනි, තෙපි ද දෙවියන් පිළිබඳ වූ යම් බන්ධනයෝත් මිනිසුන් පිළිබඳ වූ යම් බන්ධනයෝත් වෙත් නම් (ඒ) සියලු බන්ධනයන් ගෙන් මිදුනහු ය. මහණෙනි, බොහෝ දනහට හිත පිණිස, බොහෝ දනහට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස චාරිකායෙහි හැසිරෙව. එක් මඟෙකින් දෙදෙනෙක් නො යව. මහණෙනි, මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ අරුත් සහිත වූ ව්‍යඤ්ජනයෙන් පිරිපුන් දහම් දෙසව. කේවල පරිපූර්ණ පිරිසුදු මගබඹසර හෙළි කොට දක්වව. පැණෙසෙහි සවල්ප වූ කෙලෙස්රජස් ඇති සත්ත්වයෝ ඇත. ධර්මය නොඇසීමෙන් (ඔහු) පිරිහෙත්. ධර්මය අවබෝධ කරන්නෝ වන්නාහ. මහණෙනි, මම ද දහම් දෙසනු පිණිස උරුවෙල්-දනව්වෙහි **සේනානි** නියම්ගමට එළඹෙන්නෙමි.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

බද්ධොසි සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා,
මහාබන්ධනබද්ධොසි න මෙ සමණ මොක්ඛසීති.

[භගවා:]

මුත්තාහං සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා,
මහාබන්ධනමුත්තොම්හි නිහතො ත්වමසි අන්තකාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

4. 1. 6.

සප්පසුත්තං.

142. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අජ්ඣොකාසෙ[1] නිසින්නො හොති. දෙවො ච එකමෙකං ඵුසායති.

අථ ඛො මාරො පාපිමා භගවතො භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො මහන්තං සප්පරාජවණ්ණං අභිනිම්මිනිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. සෙය්‍යථාපි නාම මහතී එකරුක්ඛිකා නාවා, එවමස්ස කායො හොති. සෙය්‍යථාපි නාම මහන්තං සොණ්ඩිකාකිළඤ්ජං, එවමස්ස ඵණො හොති. සෙය්‍යථාපි නාම මහතී කොසලිකා කංසපාතී, එවමස්ස අක්ඛීනි භවන්ති. සෙය්‍යථාපි නාම දෙවෙ ගළගළායන්තෙ විජ්ජුල්ලතා නිච්ඡරන්ති, එවමස්ස මුඛතො ජිව්හා නිච්ඡරති. සෙය්‍යථාපි නාම කම්මාරගග්ගරියා ධමමානාය සද්දො හොති, එවමස්ස අස්සාසපස්සාසානං සද්දො හොති.

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි අජ්ඣභාසි:

යො සුඤ්ඤගෙහානි සෙවති සෙය්‍යා සො මුනි අත්තසඤ්ඤතො,
වොස්සජ්ජ චරෙය්‍ය තත්ථ සො පතිරූපං හි තථාවිධස්ස තං.

චරකා බහූ භෙරවා බහූ අථො ඩංසසිරිංසපා[2] බහූ,
ලොමම්පි න තත්ථ[3] ඉඤ්ජයෙ සුඤ්ඤාගාරගතො මහාමුනි.

නභං ඵලෙය්‍ය පථවී චලෙය්‍ය සබ්බෙ ච පාණා උද සන්තසෙය්‍යුං,
සල්ලම්පි චෙ උරසි පකප්පයෙය්‍යුං[4] උපධීසු තාණං න කරොන්ති බුද්ධාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

---

1. අබ්භොකාසෙ - මජසං. 2. ඩංසසරීසපා - මජසං. 3. තත්ථ සො - මජසං. සයා.
4. පකම්පයෙය්‍යුං - සීමු. 2.

ඉක්බිති පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

දෙවියන් පිළිබඳ යම් පාසයෝත් මිනිසුන් පිළිබඳ යම් පාසයෝත් වෙත් නම් ඒ සියලු පාසයන් ගෙන් බැඳුනෙහි. මහකෙලෙස්බැම්මෙන් බඳනා ලද්දෙහි. මහණ, මා කෙරෙන් නො මිදෙන්නෙහි ය.

[භගවත්හු]:

දෙවියන් පිළිබඳ යම් පාසයෝත් මිනිසුන් පිළිබඳ යම් පාසයෝත් වෙත් නම් ඒ සියලු පාසයන්ගෙන් මම මිදුනෙම් වෙමි. මහාක්ලෙශ-බන්ධනයෙන් මිදුනෙම් වෙමි. මරුව, තෝ නටුයෙහි.

ඉක්බිති පවිටු මරු භාග්‍යවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනී යයි දුකට පැමිණියේ නොසතුටුසිත් ඇත්තේ එහි ම අතුරුදන් වි ය.

4. 1. 6.

සප්ප සූත්‍රය.

142 මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර සමීපයෙහි කලන්‍දකනිවාප නම් වේළුවනාරාමයෙහි** වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ රෑ බොල්අඳුරෙහි අබවස වැඩහුන්-නාහු වෙති. වැස්ස ද එකිඑකි පොද හෙළයි.

එකල පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට බිය තැතිගැන්ම ලොමුදගගැන්ම උපදවනු කැමැත්තේ මහත් නාරජවෙසක් මවාගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ඔහුගේ සිරුර එක්රුක්තෙන් මැවූ මහ ඔරුවක් බඳු වෙයි. ඔහුගේ පෙණය රාකරුවත්තේ රා පෙරණ මහත් මවුලූකස්සක් බඳු වෙයි. ඔහුගේ ඇස් කොසොල්රජුගේ මහත් කස්ත-ලියක් (භාජනපාතියක්) බඳු වෙයි. මේඝය ගිගිරි කරණ කල යම්සේ විදුලිය නික්මේ ද, එපරිද්දෙන් ඔහුගේ මුවෙන් දිව නික්මෙයි. කඹුරුසම වයින් පුරණ කල්හි ශබ්දය යම්සේ ද, ඔහුගේ ආශ්වාසප්‍රශ්වාස ශබ්දය ද එබඳු වෙයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මරු ය යි දැන පවිටු මරුහට ගාථාවින්ගෙන් වදාළ සේක:

යමෙක් ශයනය පිණිස ශුන්‍යාගාරයන් සෙවුනෝ ද, ඒ බුද්ධමුනි තෙමේ සංයත වූ ආත්මභාව ඇත්තේ වේ. හෙ තෙමේ ඒ ආත්මභාවයෙහි (ආලය) හැරපියා හැසිරෙන්නේ ය. එය එබඳු බුද්ධමුනිහට සුදුසු මැයි.

(සිංහව්‍යාඝ්‍රාදි) බිහිසුනු ජඞ්ගම සත්තු ද බොහෝහ. බිහිසුනු ස්ථාවර අරමුණු ද බොහෝහ. වැලි ඩැහැ ලේ බොන මැස්සෝ ද සර්පයෝ ද බොහෝහ. ශුන්‍යාගාරයට වන් සර්වඥමුනි තෙමේ ඒ අරමුණු නිමිති කොට ලෝම මාත්‍රයකුදු කම්පන නො කරන්නේ ය.

අහස පැලෙන්නේ නම්, පොළොව සැලෙන්නේ නම්, වැලිත් සියලු සත්තු තැතිගන්නාහු නම්, ඉදින් ළෙහි තියුණු හුල් ගසන්නාහු නම්, බුදුවරයෝ උපධීන් කෙරෙහි පරිත්‍රාණයක් නො කෙරෙති.

එකල්හි පවිටු මරු භාග්‍යවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනී යයි දුකට පැමිණියේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 1. 7.

සොප්පසිසුත්තං.

143. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො භගවා බහුදෙවරත්තිං අබ්භොකාසෙ චඞ්කමිත්වා රත්තියා පච්චූසසමයං පාදෙ පක්ඛාලෙත්වා විහාරං පවිසිත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි, පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කිං සොප්පසි කින්නු සොප්පසි කිමිදං සොප්පසි දුබ්භගො[1] විය,
සුඤ්ඤමගාරන්ති සොප්පසි කිමිදං සොප්පසි සුරියෙ[2] උග්ගතෙ.

[භගවා:]

යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ,
සබ්බූපධීනං[3] පරික්ඛයා බුද්ධො සොප්පති කිං තවෙත්ථ මාරාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

4. 1. 8.

නන්දතිසුත්තං.

144. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

නන්දති පුත්තෙහි පුත්තිමා ගොමිකො[4] ගොහි තථෙව නන්දති,
උපධී හි නරස්ස නන්දනා න හි සො නන්දති යො[5] නිරූපධීති.

[භගවා:]

සොචති පුත්තෙහි පුත්තිමා ගොමිකො ගොහි තථෙව සොචති,
උපධී හි නරස්ස සොචනා න හි සො සොචති යො නිරූපධීති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා -පෙ- තත්ථෙවන්තරධායීති.

---

1. දුබ්භතො-සයා. දුබ්භයො-PTS. 2. සූරියෙ-මජ්ඣං. 3. සබ්බූපධිපරික්ඛයා - මජ්ඣං.
4. ගොවා - මජ්ඣං. 5. යොනි-සීමු. 1.

4. 1. 7.

සොප්පසි සූත්‍රය.

143. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** කලන්දකනිවාප නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් අබවස සක්මන් කොට රෑ පහන් වේලෙහි පා දෙව වෙහෙරට පිවිස (දකුණු) පය මත (වම්) පය මඳක් හැද තබා සිහි නුවණ ඇති ව නැඟී සිටුනා වේලාව මෙනෙහි කොට දකුණැලයෙන් සිංහශය්‍යාව කළ සේක.

එකල්හි පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

කිම නිදයි ද? කුමක් හෙයින් නිදයි ද? මළ එකකු මෙන් කුමකට නිදයි ද? ශූන්‍යාගාරයක් මා විසින් (ලද) යි නිදයි ද? කුමක් හෙයින් හිරු නැඟි කල්හි නිදයි ද?

[භගවත්හු:]

යමකුගේ ජාලිනී නම් වූ විසත්තිකා නම් වූ තෘෂ්ණා තොමෝ කිසි භවයෙක්හි පමුණුවන්නට නැද් ද, ඒ සම්බුද්ධ තෙමේ සියලු උපධීන් ක්‍ෂය කිරීමෙන් හොවී. මරුව, මෙහිලා තට කිම?

ඉක්බිති පවිටු මරු භාග්‍යවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනීය යි දුකට පැමිණියේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 1. 8.

නන්දති සූත්‍රය.

144. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. එකල්හි පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

දරුවන් ඇත්තේ දරුවන් හේතු කොට ගෙණ සතුටු වෙයි. එසේ ම ගෙරින් ඇත්තේ ගෙරින් හේතු කොට ගෙණ සතුටු වෙයි. උපධීහු මිනිසාගේ නන්දනයෝ ය යමෙක් උපධි රහිත වේ නම් හෙ තෙමේ සතුටු නො වෙයි.

[භගවත්හු:]

දරුවන් ඇත්තේ දරුවන් හේතු කොට ගෙණ ශෝක කෙරෙයි. එසේ ම ගෙරින් ඇත්තේ ගෙරින් හේතු කොට ගෙණ ශෝක කෙරෙයි. උපධීහු මිනිසාගේ ශෝචනයෝ ය. යමෙක් උපධි රහිත නම් හෙ තෙමේ ශොක නො කෙරේ මැයි.

ඉක්බිති පවිටු මරු භාග්‍යවත් තෙමේ මා දනී. ... එහි ම අතුරුදන් වි ය.

4. 1. 9.

පඨමආයු සුත්තං.

145. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං. යො[1] භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භියොති.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

දීඝමායු මනුස්සානං න නං හීළෙ සුපොරිසො,
චරෙය්‍ය ඛීරමත්තොව නත්ථි මච්චුස්ස ආගමොති.

[භගවා:]

අප්පමායු මනුස්සානං හීළෙය්‍ය නං සුපොරිසො,
චරෙය්‍යාදිත්තසීසොව නත්ථි මච්චුස්ස නාගමොති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

4. 1. 10.

දුතියආයුසුත්තං.

146 එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු. ගමනීයො සම්පරායො, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං. යො භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භියොති[2].

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

නාච්චයන්ති අහොරත්තා ජීවිතං නොපරුජ්ඣති,
ආයු අනුපරියාති[3] මච්චානං නෙමීව රථකුබ්බරං.

[භගවා:]

අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඔදකන්ති.

---

1. යො හි - සීමු. 1. 2. ඛීයෙථාති - PTS. 3. අනුපරියායති - මජසං, අනුචරියති - සයා, ආයුං පරියෙති - සී. 1, 2.

4. 1. 9.

පඨම ආයුසුත්‍රය.

145. මා විසින් මෙසේ අසන ලදී: එකල්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ නුවර** සමීපයෙහි කලන්‍දකනිවාප නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්‍ෂූන් ඇමතූ සේක. ඒ භික්‍ෂූහු පින්වතුන් වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුෂය අල්ප ය, පරලොව යා යුතු ය, කුසල් කටයුතු ය, බඹසර හැසිරිය යුතු ය, උපන්නහුට නොමැරීමෙක් නැත. මහණෙනි, යමෙක් බොහෝ කලක් ජීවත් වේ නම් හෙ තෙමේ සියක් වසක් ජීවත් වෙයි. බෙහෙවෙක් වේ නම් අල්පයෙක් හෝ වෙයි.

එකල්හි පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

මිනිසුන්ගේ ආයුෂ දිග ය. සත්පුරුෂ තෙමේ එය හෙළා නො දක්නේ ය. තනපා මතුයෙන් වැවෙන (සාතතඬය) ළදරුවකු මෙන් හැසිරෙන්නේ ය. මරණයාගේ ඊමෙක් නැත.

[භගවත්හු:]

මිනිසුන්ගේ ආයුෂය අල්ප ය. සත්පුරුෂ තෙමේ එය හෙළා දක්නේ ය. හිස ගිනි ගත්තකු මෙන් හැසිරෙන්නේ ය. මරණයාගේ නොඊමෙක් නැත.

ඉක්බිති පවිටු මාරයා ... එහි ම අතුරුදන් විය.

4. 1. 10.

දුතිය ආයුසුත්‍රය.

146 මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි කලන්‍දකනිවාප නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්‍ෂූන් ඇමතූ සේක. ඒ භික්‍ෂූහු පින්වතුන් වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුෂ ස්වල්ප ය, පරලොව යා යුතු ය, කුසල් කටයුතු ය, බඹසර හැසිරිය යුතු ය. උපන්නහුට නො මැරීමෙක් නැත. මහණෙනි, යමෙක් බොහෝ කල් ජීවත් වේ ද, හෙ තෙමේ සියක් වසක් ජීවත් වෙයි. බෙහෙවෙක් වේ නම් අල්පයෙක් හෝ වෙයි.

එකල්හි පවිටු මාරයා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය:

රෑ දවල්හු ඉක්ම නො යෙත්. ජීවිතය නිරුද්ධ නොවේ. මිනිසුන්ගේ ආයුෂය (ඔවුන්) අනුව ම යේ. රියෙහි කිඹුල්මුව අනුව යන රියනිම්-වලල්ල මෙනි.

[භගවත්හු:]

රෑ දවල්හු ඉක්ම යෙත්. ජීවිතය නිරුද්ධ වේ. මිනිසුන්ගේ ආයුෂය ගෙවේ. කුඩා නදීන්ගේ දිය මෙනි.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

ආයුවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

තපොකම්මඤ්ච නාගො ච සුභං පාසෙන තෙ දුවෙ,
සප්පො සොප්පසි නන්දති ආයුනා අපරෙ දුවෙති.

---

2. රජ්ජවග්ගො.

4. 2. 1.

පාසාණසුත්තං.

147. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අජ්ඣොකාසෙ[1] නිසින්නො හොති. දෙවො ච එකමෙකං ඵුසායති.

අථ ඛො මාරො පාපිමා භගවතො භයං **ඡම්භිතත්තං** ලොමහංසං උප්පාදෙතුකාමො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො අවිදූරෙ මහන්තෙ මහන්තෙ පාසාණෙ[2] පදෙලෙසි[3]

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාය අජ්ඣභාසි:

සචෙමං[4] කෙවලං සබ්බං ගිජ්ඣකූටං චලෙය්‍යාසි,[5]
නෙව සම්මා විමුත්තානං බුද්ධානං අත්ථි ඉඤ්ජිතන්ති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

4. 2. 2.

සීහසුත්තං[6]

148. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙති.

අථ ඛො මාරස්ස පාපිමතො එතදහොසි: අයං ඛො සමණො ගොතමො මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙති. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං විචක්ඛුකම්මායාති. අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

---

1. අබ්භොකාසෙ. - මජ්සං. 2. මහන්තෙ පාසාණෙ - මජ්සං. 3 පවට්ටලෙසි - ස්‍යා. පදලෙසි - සීමු. 1. 2. මජ්සං. PTS. 4. සචෙපි-කම්බො. 5 චලෙස්සසි - කම්බො 6. සීහනුසීහ-සුත්තං - මජ්සං.

ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවත් තෙමේ මා දනී. සුගත තෙමේ මා දනීයි දුකට පත්වූයේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය

ආයුවර්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

තපො කම්ම සූත්‍රය ද නාග සූත්‍රය ද සුභ සූත්‍රය ද ඒ පාස සූත්‍ර දෙක ද සප්ප, සොප්පසි, නන්‍දති සූත්‍ර ද, අනෙක් ආයු සූත්‍ර දෙකද යි සූත්‍ර දශයකි.

---

2. රජ්ජ වර්ගය.

4. 2. 1.

පාසාණ සූත්‍රය.

147. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **ගිජ්ඣකූළ** පව්වෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොල්අඳුරුයෙහි අබවස වැඩහුන්නාහු වෙති. වැස්ස ද එකි එකි පොද හෙළයි.

එකල්හි පවිටු මාරයා භාග්‍යවතුන් වහන්සේට බිය තැතිගැණුම ලොමු-දහගැණුම උපදවනු කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ නොදුරෙහි මහත් මහත් ගල් විසිවි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මාරයා යි දැන පවිටු මාරයාහට ගාථායෙන් වදාළ සේක:

ඉදින් මේ මුළු ගිජ්ඣකූළපව්ව ම සලනෙහි නම්, මොනොවට මිදුනු බුදුවරයන්ට කම්පනයෙක් නහමක් ඇත් මැ ය.

ඉක්බිති පවිටු මාරයා භාග්‍යවත් තෙමේ මා දනී. සුගත තෙමේ මා දනී ය යි දුකට පත් වූයේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 2. 2.

සීහ සූත්‍රය.

148. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ අනේපිඬු සිටුහුගේ අරමහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දාහු දහම් දෙසන සේක.

එකල්හි පවිටු මරුට "මේ මහණ ගොයුම් තෙමේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දේ දහම් දෙසයි. (බණ අසන්නවුන්ගේ) නුවණැස වනසන්නට මහණ ගොයුම්හු වෙත මම එළඹෙන්නෙම් නම් මනා මැ නු"යි මේ අදහස වි ය. ඉක්බිති පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

කිංනු සීහොව නදසි පරිසායං විසාරදො,
පටිමල්ලො හි තෙ අත්ථි විජිතාවී නු මඤ්ඤසීති.

[භගවා:]

නදන්ති වෙ මහාවීරා පරිසාසු විසාරදා,
තථාගතා බලප්පත්තා තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

4. 2. 3.

සකලිකසුත්තං

149. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති මද්දකුච්ඡිස්මිං මිගදායෙ. තෙන ඛො පන සමයෙන භගවතො පාදො සකලිකාය ඛතො හොති. භුසා[1] සුදං භගවතො වෙදනා වත්තන්ති සාරීරිකා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා. තා සුදං භගවා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානො. අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ[2] පාදං අච්චාධාය සතො සම්පජානො.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

මන්දියා නු ඛො[3] සෙසි උදාහු කාවෙය්‍යමත්තො
අත්ථා නු තෙ සම්පචුරා න සන්ති,
එකො විවිත්තෙ සයනාසනම්හි
නිද්දාමුඛො[4] කිමිදං සොප්පසෙවාති.

[භගවා:]

න මන්දියා සයාමි නාපි කාවෙය්‍යමත්තො
අත්ථං සමෙච්චාහ මපෙතසොකො,
එකො විවිත්තෙ සයනාසනම්හි
සයාමහං සබ්බභූතානුකම්පී.

යෙසම්පි සල්ලං උරසි පවිට්ඨං
මුහුං මුහුං හදයං වෙධමානං,
තෙපීධ[5] සොප්පං ලභරෙ[6] සසල්ලා
කස්මා[7] අහං න සුපෙ වීතසල්ලො.

ජග්ගං න සඞ්කෙ නපි භෙමි සොත්තුං
රත්තින්දිවා නානුතපන්ති මා මං,
හානිං න පස්සාමි කුහිඤ්චි ලොකෙ
තස්මා සුපෙ සබ්බභූතානුකම්පීති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා -පෙ- තත්ථෙවන්තරධායීති.

---

1. භුසා - සයා. 2. පාදෙන - සයා 3. මන්දියා නු සෙසි - සයා. PTS. 4. නිද්දාසි ඛො -සී 1, 2 5. තෙචාපි - PTS. 6. ලභරෙ - සබ්බත්ථ. 7. තස්මා - මජසං,

කිම? පිරිස්හි සිංහයකු මෙන් විශාරද ව (=නො බිය පත් ව) නාද කෙරෙහි නු? දුනු විජය ඇතියෙමි සි හඟිහි ද? තුබට ප්‍රතිමල්ලයෙක් (=සතුරෙක්) ඇත් ම ය.

[භගවත්හු:]

ලොව තෘෂ්ණාව තරණය කළ බලයට පැමිණි මහාවීර වූ තථාගතයෝ ඒකාන්තයෙන් පිරිස්හි විශාරද වූවාහු නාද කෙරෙත්.

ඉක්බිති පවිටු මාර තෙමේ තථාගත තෙමේ මා දනී. සුගත තෙමේ මා දනී යයි දුකට පත්වූයේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 2. 3.

සකලික සූත්‍රය.

149. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි මද්දකුච්ඡි නම් මුවවෙනෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ පාදය ගල්කඩෙකින් පහරණ ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට ශරීරයේ හටගත් දැඩි රළු කුළු නොමිහිරි නොකල් මහත් දුක් වේදනාවෝ පවතිත්. භාග්‍යවතුන් වහන්සේ සිහි නුවණ ඇති ව නොපෙළෙමින් ඒ වේදනාවන් ඉවසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුර සිවුගුණ කොට පණවා දකුණු පා මත වම් පා මඳක් හයා තබා සිහි නුවණ ඇති ව දකුණැලයෙන් සිංහශය්‍යාව කළ සේක.

එකල්හි පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

මුළා බැවින් හෝ කවිභාවයෙන් මත්වූයේ හෝනෙහි නු? තුබට බොහෝ වූ වැඩ නැත් ද? ජනයාගෙන් වෙන් වූ සෙනසුන්හි නිදිබර මුහුණු ඇති ව හුදෙකලාව ම කුමක් හෙයින් හෝනෙහි ද?

[භගවත්හු:]

මුළා බැවින් නො නිදමි. කවිභාවයෙන් මත්වූයෙමි නො නිදමි. මම පරමාර්ථයට මැනවින් පැමිණ පහ ව ගිය ශෝක ඇත්තෙම් වෙමි. මම සර්වභූතහිතානුකම්පී ව ජනයාගෙන් වෙන් වූ සෙනසුන්හි හුදෙකලාව හෝනෙමි.

යම් කෙනකුන්ගේත් ළෙහි තියුණු හුලෙක් පිවිසියේ ද, හෘදය ක්ෂණ ක්ෂණයෙහි සැලෙන්නේ වේ ද, මේ ලෝකයෙහි (ඒ රාගාදි) හුල් ඇති ඔහු ද නිදි ලබත්. පහව ගිය (රාගාදි) හුල් ඇති මම කුමක් හෙයින් නො නිදම් ද!

නිදි වරන්නෙම් ද සැක නො කරමි. නිදන්නටත් නොබමි. රැදවල්හු මා තහමක් තවත්. ලොව කිසිතැනෙක (මාගේ) පිරිහීමක් නො දකිමි. එහෙයින් සියලු සතුන් කෙරෙහි අනුකම්පා කරණ සුළු වූයෙම් හෝනෙමි.

එකල්හි පවිටු මාර තෙමේ භාග්‍යවත් තෙමේ මා දනී ... එහි ම අතුරුදන් විය.

4. 2. 4.
පතිරූපසුත්තං.

150. එකං සමයං භගවා **කොසලෙසු** විහරති **එකසාලායං** බ්‍රාහ්මණගාමෙ. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙති.

අථ ඛො මාරස්ස පාපිමතො එතදහොසි: අයං ඛො සමණො ගොතමො මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙති. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං විචක්ඛුකම්මායාති. අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

නෙතං තව පතිරූපං යදඤ්ඤමනුසාසසි,
අනුරොධවිරොධෙසු මා සජ්ජිත්ථො[1] තදාචරන්ති.

[භගවා:]

හිතානුකම්පී සම්බුද්ධො යදඤ්ඤමනුසාසති,
අනුරොධවිරොධෙහි[2] විප්පමුත්තො තථාගතොති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

4. 2. 5.
මානසසුත්තං.

151. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

අන්තලික්ඛචරො පාසො ය්වායං[3] චරති මානසො,
තෙන තං බාධයිස්සාමි න මෙ සමණ මොක්ඛසීති.

[භගවා:]

රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා,
එත්ථ මෙ විගතො ඡන්දො නිහතො ත්වමසි අන්තකාති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

4. 2. 6.
පත්තසුත්තං.

152. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන භගවා පඤ්චන්නං උපාදානක්ඛන්ධානං උපාදාය භික්ඛූ[4] ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා[5] මනසි කත්වා සබ්බචෙතසා[6] සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

---

1. සජ්ජිත්ථ - ස්‍යා. 2. විරොධෙසු - සී 1, 2. 3. ස්වායං - මජසං. ස්‍යා. 4. භික්ඛූනං - මජසං. 5. අට්ඨිං කත්වා - මජසං. 6. සබ්බං චෙතසා - සීමු. 1. 2.

4. 2. 4.

පතිරූප සූත්‍රය.

150. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **කොසොල්** දනව්වෙහි **ඒකසාල** නම් බමුණුගම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දාහු දහම් දෙසන සේක.

ඉක්බිති පවිටු මරුහට මේ මහණ ගොයුම් තෙමේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දේ දහම් දෙසයි. (බණ අසන්නවුන්ගේ) පැණැස වනසන්නට මහණ ගොයුම්හු වෙත මම එළඹෙන්නෙම් නම් මනා මැ නු යි! මේ අදහස වි ය. ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කිය.

යම් හෙයෙකින් මෙරමාහට අනුශාසනා කෙරෙහි ද, එය මුබට සුදුසු නො වේ. එය කෙරෙමින් රාග ප්‍රතිඝ දෙක්හි නො ලැගව

[භගවත්හු:]

යම් හෙයෙකින් සම්බුද්ධ තෙමේ හිතානුකම්පා ඇති ව මෙරමාහට අනුශාසනා කෙරේ ද, (ඒ) තථාගත තෙමේ රාග ප්‍රතිඝ දෙකින් විශේෂයෙන් මිදුනේ වේ.

ඉක්බිති පවිටු මාර තෙමේ ... එහි ම අතුරුදන් විය.

4. 2. 5

මානස සූත්‍රය.

151. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක.

එකල්හි පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

අන්තරික්ෂචර වූ (අහස හැසිරෙන්නවුන් පවා බඳනා වූ) සිත්හි හට-ගත්තා වූ යම් මේ (රාග) පාශයෙක් හැසිරේ ද, එයින් මුබ පෙළන්නෙමි. මහණ, මාගේ විෂයයෙන් නො මිදෙන්නෙහි ය.

[භගවත්හු:]

සිත්කලු වූ රූපයෝ ය, ශබ්දයෝ ය, රසයෝ ය, ගන්ධයෝ ය, ස්ප්‍රෂ්ටව්‍යයෝ ය, යන මේ පඤ්චකාමවස්තූන් කෙරෙහි වූ මාගේ රාගය පහවූයේ ය. මරුව තෝ නටුයෙහි.

ඉක්බිති පවිටු මරු ... එහි ම අතුරුදන් විය.

4. 2. 6.

පතන සූත්‍රය.

152. **සැවැත්නුවර**—

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උපාදානස්කන්ධ පස පිළිබඳ දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වන සේක. සමාදන් කරවන සේක. සමාදානයෙහි උත්සාහවත් කරණ සේක. හිත හඟී ගන්වන සේක. ඒ භික්ෂූහු ද වැඩ ඇත්තක් කොට ගෙණ මෙනෙහි කොට ගෙණ මුළු සිතින් එක් කොට ගෙණ යොමු කළ කන් ඇති ව බණ අසත්.

අථ ඛො මාරස්ස පාපිමතො එතදහොසි: අයං ඛො සමණො ගොතමො පඤ්චන්නං උපාදානක්ඛන්ධානං උපාදාය භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බචෙතසා[1] සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං විචක්ඛුකම්මායාති.

තෙන ඛො පන සමයෙන සම්බහුලා පත්තා අජ්ඣොකාසෙ නික්ඛිත්තා හොන්ති. අථ ඛො මාරො පාපිමා බලිවද්දවණ්ණං අභිනිම්මිනිත්වා යෙන තෙ පත්තා තෙනුපසඞ්කමි. අථ ඛො අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං එතදවොච: භික්ඛු භික්ඛු එසො බලිවද්දො පත්තෙ භින්දෙය්‍යාති.

එවං වුත්තෙ භගවා තං භික්ඛුං එතදවොච: න සො භික්ඛු බලිවද්දො මාරො එස පාපිමා, තුම්හාකං විචක්ඛුකම්මාය ආගතොති. අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි[2] අජ්ඣභාසි:

රූපං වෙදයිතං සඤ්ඤං විඤ්ඤාණං යඤ්ච සඞ්ඛතං,
නෙසො හමස්මි නෙතං මෙ එවං තත්ථ විරජ්ජති.

එවං විරත්තං[3] ඛෙමත්තං සබ්බසංයොජනාතිගං,
අන්වෙසං සබ්බට්ඨානෙසු මාරසෙනාපි නාජ්ඣගාති.

අථ ඛො මාරො පාපිමා - පෙ - තත්ථෙවන්තරධායීති.

4. 2. 7.

ආයතනසුත්තං.

153. එකං සමයං භගවා. **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං.** තෙන ඛො පන සමයෙන භගවා ඡන්නං ඵස්සායතනානං උපාදාය භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බචෙතසා සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

අථ ඛො මාරස්ස පාපිමතො එතදහොසි: අයං ඛො සමණො ගොතමො ඡන්නං ඵස්සායතනානං උපාදාය භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බචෙතසා සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං විචක්ඛුකම්මායාති.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො අවිදූරෙ මහන්තං භයභෙරවසද්දං අකාසි. අපිස්සුදං[4] පඨවි මඤ්ඤෙ උද්‍රීයති.[5]

1 සබ්බචෙතසා - සීමු 1, 2. සබ්බං චෙතසා - සාමවි. 2. ගාථාය - මජසං සෑ. PTS. 3. විරත්තං - සී 1, 2. 4. අපිස්සුනං. - සීමු. 1. අපිසුදං - PTS. 5. උන්‍ද්‍රියති - මජසං.

එකල්හි පවිටු මරුහට මේ අදහස වි ය මේ මහණ ගොයුම් උපාදානස්කන්ධ පස පිළිබඳ දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වයි. සමාදන් කරවයි. තෙද ගන්වයි. සිත හඞි ගන්වයි. ඒ භික්ෂූහු ද වැඩ ඇත්තක් කොට ගෙණ මෙනෙහි කොට ගෙණ මුළු හිතින් සමන්නා ගෙණ යොමු කළ කන් ඇති ව බණ අසත්. (බණ අසන්නවුන්ගේ) පැණැස වනසන්නට මහණ ගොයුම්හු වෙත මම එළඹෙන්නෙම් නම් මනා මැ නු සි!

එකල්හි බොහෝ පාත්‍රයෝ එළියෙහි බහන ලද්දාහු වෙත්. එකල්හි පවිටු මාර තෙමේ ගොන්වෙසක් මවා ගෙණ ඒ පාත්‍රයන් වෙත එළඹියේ ය. එකල්හි එක්තරා මහණෙක් එක්තරා මහණකුට "මහණ, මහණ, මේ ගොණා පාත්‍රයන් බිඳුනේ ය"යි මෙය කී ය.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ එ මහණහට "මහණ, හේ ගොණෙක් නො වේ. මේ පවිටු මරු ය. තොපගේ පැණැස වනසන්නට පැමිණියේ ය"යි මෙය වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මරු ය යි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් වදාළ සේක:

රූපය හා වේදනාව හා සංඥාව හා විඥානය හා යම් සංස්කාරධර්මයෙක් වේ නම් එය හා මේ පස්කඳ මම නො වෙමි. තෙල මා ගැත්තේ නොවේ යයි මෙසේ එහි නො ඇලේ.

මෙසේ නො ඇලුනු ක්ෂේමප්‍රාප්ත අත්බැව් ඇති සියලු බවබැඳුම් ඉක්මවා සිටි රහත්හු කොහිදැයි සියලු තන්හි සොයන මරපිරිස් ද නො දුක්කේ ය.

ඉක්බිති පවිටු මාර තෙමේ ... එහි ම අතුරුදන් වි ය.

4. 2. 7.

ආයතන සූත්‍රය.

153. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීපයෙහි වූ මහ–වෙනෙහි කූටාගාරශාලායෙහි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ ෂට්ස්පර්ශායතනයන් පිළිබඳ දැහැමි කතාවෙන් භික්ෂූන්ට කරුණු දක්වන සේක. සමාදන් කරවන සේක. තෙද ගන්වන සේක. හිත හඞි ගන්වන සේක. ඒ මහණහු ද වැඩ ඇත්තක් කොට ගෙණ මෙනෙහි කොට ගෙණ මුළු සිතින් එක් කොට ගෙණ යොමු කළ කන් ඇත්තාහු බණ අසත්.

එකල පවිටු මරුහට මේ අදහස විය: "මේ මහණගොයුම් ෂට් ස්පර්ශායතනයන් පිළිබඳ දැහැමි කතාවෙන් භික්ෂූන්ට කරුණු දක්වයි. සමාදන් කරවයි. උත්සාහවත් කරයි. හඞි ගන්වයි. ඒ මහණහු ද වැඩ ඇත්තක් කොට ගෙණ මෙනෙහි කොට ගෙණ මුළු සිතින් එක් කොට ගෙණ යොමු කළ කන් ඇත්තාහු බණ අසත්. පැණැස වනසන්නට මහණගොයුම් වෙත මම එළඹෙන්නෙම් නම් මනා මැ නු සි"

ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මහත් බියජනන හඬක් කෙළේ ය. පොළොව පෙරළන්නාක් සෙයිනි.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං එතදවොච: භික්ඛු භික්ඛු එසා පථවී මඤ්ඤෙ උද්‍රීයතීති.

එවං වුත්තෙ භගවා තං භික්ඛුං එතදවොච: නෙසා භික්ඛු පථවී උද්‍රීයති[2]. මාරො එසො පාපිමා තුම්හාකං විචක්ඛුකම්මාය ආගතොති. අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි[1] අජ්ඣභාසි:

රූපා සද්දා රසා ගන්ධා ඵස්සා ධම්මා ච කෙවලා,
එතං ලොකාමිසං ඝොරං එත්ථ ලොකො'ධිමුච්ඡිතො.[2]

එතඤ්ච සමතික්කම්ම සතො බුද්ධස්ස සාවකො,
මාරධෙය්‍යමතික්කම්ම[3] ආදිච්චොව විරොචතීති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති

4. 2. 8.

පිණ්ඩසුත්තං.

154. එකං සමයං භගවා **මගධෙසු** විහරති **පඤ්චසාලායං** බ්‍රාහ්මණගාමෙ. තෙන ඛො පන සමයෙන පඤ්චසාලායං බ්‍රාහ්මණගාමෙ කුමාරකානං පාහුණකානි භවන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්ත-චීවරමාදාය පඤ්චසාලං බ්‍රාහ්මණගාමං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන පඤ්චසාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා මාරෙන පාපිමතා අන්වාවිට්ඨා භවන්ති මා සමණො ගොතමො පිණ්ඩමලත්ථාති.

අථ ඛො භගවා යථාධොතෙන පත්තෙන පඤ්චසාලං බ්‍රාහ්මණගාමං පිණ්ඩාය පාවිසි. තථාධොතෙන පත්තෙන පටික්කමි.

අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: අපි සමණ[4] පිණ්ඩමලත්ථාති?

තථා නු ත්වං පාපිම අකාසි, යථා'හං පිණ්ඩං න ලභෙය්‍යන්ති.

තෙන හි භන්තෙ භගවා දුතියම්පි පඤ්චසාලං බ්‍රාහ්මණගාමං පවිසතු. තථා'හං කරිස්සාමි, යථා භගවා පිණ්ඩං ලච්ඡතීති.

[භගවා:]

අපුඤ්ඤං පසවී මාරො ආසජ්ජ නං තථාගතං,
කිං නු මඤ්ඤසි පාපිම න මෙ පාපං විපච්චති?.

සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං,
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථාති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

---

1. ගාථාය - මජ්ඣසං. ස්‍යා. 2. ලොකො විමුච්ඡිතො - මජ්ඣසං. ස්‍යා. 3. මාරධෙය්‍යං අතික්කම්ම - මජ්ඣසං. 4. අපි ත්වං සමණ - මජ්ඣසං.

ඉක්බිති එක්තරා මහණෙක් එක්තරා මහණකුට "මහණ, මහණ, මේ පොළොව ('පටත් පටත්' යන අනුකරණ දෙමින්) පෙරළෙන්නාක් මෙනැයි මෙය කී ය.

මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහට මහණ, මේ පොළොව පෙරළෙන්නේ නොවේ. මේ පවිටු මරු ය. තොපගේ පැණසස වනසන්නට ආයේ යයි මෙය වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මරු ය යි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් වදාළ සේක:

සියලු රූපයෝ ද ශබ්දයෝ ද රසයෝ ද ගන්ධයෝ ද ස්පර්ශයෝ ද ධර්මයෝ ද යන මෙය දරුණු ලෝකාමිෂය වේ. ලෝ වැස්සා මෙහි දැඩි ලෙස ඇලුනේ ය.

බුදුරජානන් වහන්සේගේ සිහි ඇති ශ්‍රාවක තෙමේ මේ ෂඩායතන ද ඉක්මවා මරුට සන්‍රාස වූ භවත්‍රය ද පසු කොට හිරු මෙන් බබලයි.

ඉක්බිති පවිටු මරු තෙමේ ... එහි ම අතුරුදන් විය.

4. 2. 8.

පිණ්ඩ සූත්‍රය.

154. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මගද දනව්වෙහි පඤ්චශාලා නම් බමුණුගම්හි වැඩවසන සේක. එකල්හි පඤ්චශාලා බමුණුගමෙහි කුමරුන්ගේ (ඔවුනොවුන් යවන) තුටුපඩුරු කෙනෙක් වෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙණ පඤ්චශාලා නම් බමුණුගමට පිඬු පිණිස පිවිසි සේක. එකල්හි පඤ්චශාලා වැසි බමුණු ගෘහපතියෝ පවිටු මරු විසින් "මහණගොයුම් තෙමේ පිඬු නොලබාවා!" යි ආවිෂ්ට වෙත්.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ යථාධෞත පාත්‍රයෙන් (හිස්පසින්) යුක්ත ව පඤ්චශාලා බමුණුගමට පිඬු පිණිස පිවිසි සේක් ද, තථාධෞත පාත්‍රයෙන් (හිස්පසින්) යුක්ත ව පෙරළා වැඩි සේක.

ඉක්බිති පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: ශ්‍රමණය, පිඬු ලැබුවෙහි ද?

පවිට, මම යම්සේ පිඬු නො ලබන්නෙම් නම් තෝ එසේ කෙළෙහි නො?

වහන්ස, එසේ නම් භගවත් තෙමේ දෙවනවට දු පඤ්චශාලා බමුණුගමට පිවිසේවා. භගවත් තෙමේ යම්සේ පිඬු ලබන්නේ නම් මම එසේ කරන්නෙම්.

[භගවත්හු:]

මාර තෙමේ ඒ තථාගතයන් ගටා පව් රැස් කෙළේ ය. පවිට, "මාගේ පව් නොපැසෙති"යි කිම සිතයි ද?

යම්බඳු වූ අපට (රාගාදි) ක්ලේශජාතයෙක් නැද්ද (එසේ වූ අපි) ඒකාන්තයෙන් ඉතා සැපසේ ජීවත් වම්හ. ආභස්සර බඹලොව වැසි දෙවියන් මෙන් ප්‍රීතිය ම ආහාර කොට ඇත්තමෝ වම්හ.

එකල්හි පවිටු මාර තෙමේ ... එහි ම අතුරුදන් විය.

4. 2. 9.

කස්සකසුත්තං.

155. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ නිබ්බාණපටිසංයුත්තාය ධම්මියා කථාය සංදස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බචෙතසා සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

අථ ඛො මාරස්ස පාපිමතො එතදහොසි: අයං ඛො සමණො ගොතමො භික්ඛූ නිබ්බාණපටිසංයුත්තාය ධම්මියා කථාය -පෙ- සම්පහංසෙති. තෙ ච භික්ඛූ -පෙ- ධම්මං සුණන්ති. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං විචක්ඛුකම්මායාති.

අථ ඛො මාරො පාපිමා කස්සකවණ්ණං අභිනිම්මිනිත්වා මහන්තං නඞ්ගලං ඛන්ධෙ කරිත්වා දීඝං පාචනයට්ඨිං[1] ගහෙත්වා හටහටකෙසො සාණසාටිනිවත්ථො[2] කද්දමමක්ඛිතෙහි පාදෙහි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: අපි සමණ බලිවද්දෙ අද්දසාති.

කිම්පන පාපිම තෙ බලිවද්දෙහීති?

මමෙව සමණ චක්ඛු, මම රූපා, මම චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණායතනං. කුහිං මෙ සමණ ගන්ත්වා මොක්ඛසි? මමෙව සමණ සොතං, මම සද්දා, මම සොතසම්ඵස්සවිඤ්ඤාණායතනං. මමෙව සමණ ඝාණං, මම ගන්ධා, මම ඝාණසම්ඵස්සවිඤ්ඤාණායතනං. මමෙව සමණ ජිව්හා, මම රසා, මම ජිව්හාසම්ඵස්සවිඤ්ඤාණායතනං. මමෙව සමණ කායො, මම ඵොට්ඨබ්බා, මම කායසම්ඵස්සවිඤ්ඤාණායතනං. මමෙව සමණ මනො, මම ධම්මා, මම මනොසම්ඵස්සවිඤ්ඤාණායතනං. කුහිං මෙ සමණ ගන්ත්වා මොක්ඛසීති.?

තවෙව පාපිම චක්ඛු, තව රූපා, තව චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණායතනං. යත්ථ ච ඛො පාපිම නත්ථි චක්ඛු, නත්ථි රූපා, නත්ථි චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණායතනං. අගති තව තත්ථ පාපිම.

තවෙව පාපිම සොතං, තව සද්දා, තව සොතසම්ඵස්සවිඤ්ඤාණායතනං. යත්ථ ච ඛො පාපිම නත්ථි සොතං, නත්ථි සද්දා, නත්ථි සොතසම්ඵස්සවිඤ්ඤාණායතනං. අගති තව තත්ථ පාපිම.

තවෙව පාපිම ඝාණං, තව ගන්ධා, තව ඝාණසම්ඵස්සවිඤ්ඤාණායතනං. -පෙ- අගති තව තත්ථ පාපිම.

තවෙව පාපිම ජිව්හා, තව රසා, තව ජිව්හාසම්ඵස්සවිඤ්ඤාණායතනං. -පෙ- අගති තව තත්ථ පාපිම.

---

1. දීඝපාචනයට්ඨිං - මජසං. දීඝං පාචනලට්ඨිං—සී 1, 2. 2. සාණසාටකනිවත්ථො සයා. -

4. 2. 9.

කස්සක සූත්‍රය.

155. සැවැත්නුවර—

එකල්හි භාග්‍යවතුන් වහන්සේ නිවණ පිළිබඳ දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වන සේක. සමාදන් කරවන සේක. තෙද ගන්වන සේක. සිත හඹී ගන්වන සේක. ඒ භික්ෂූහු ද වැඩ ඇත්තක් කොට ගෙණ මෙනෙහි කොට ගෙණ මුළු සිතින් එක් කොට ගෙණ යොමු කළ කන් ඇත්තාහු බණ අසත්.

එකල්හි පවිටු මරුහට මේ අදහස විය. "මේ මහණ ගොයුම් නිවණ පිළිබඳ දැහැමි කථායෙන් භික්ෂූන් ... හඹී ගන්වයි ඒ භික්ෂූහු ද ... බණ අසත්. පැණැස වනසන්නට මහණ ගොයුම් වෙත මම එළඹෙන්නෙම් නම් මනා මැ නු යි!

ඉක්බිති පවිටු මාර තෙමේ ගොවිවෙසක් මවා ගෙණ මහ නගුලක් කර තබාගෙණ දික් කෙවිට්ලියක් ගෙණ හෑනාහෑන කෙශ (බබමොබ විසිර ගිය කෙහෙ) ඇත්තේ හණ වතක් ඇද ගත්තේ මඩ වැකුණු පසින් යුක්තව භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. ශ්‍රමණය, ගොණුන් දුක්කෙහි ද?

පවිට, තට ගොණුන්ගෙන් කවර වැඩෙක් ද?

ශ්‍රමණය, ඇස මාගේ ම ය. රූප මාගේ ම ය. චක්ඛුසම්ඵස්සය හා විඤ්ඤාණායතන ය ද මාගේ ම ය. ශ්‍රමණය, කොහි ගොස් මාකෙරෙන් මිදෙන්නෙහි ද? ශ්‍රමණය, කණ මාගේ ම ය. ශබ්දයෝ මාගේ ම ය. සොතසම්ඵස්සහා විඤ්ඤාණායතනය ද මාගේ ම ය. ශ්‍රමණය, නැහැය මාගේ ම ය, ගන්ධයෝ මාගේ ම ය, ඝාණසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද මාගේ ම ය. ශ්‍රමණය, දිව මාගේ ම ය, රස මාගේ ම ය, ජිව්හාසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද මාගේ ම ය. ශ්‍රමණය, කය මාගේ ම ය, ස්ප්‍රෂ්ටව්‍ය මාගේ ම ය, කායසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද මාගේ ම ය. ශ්‍රමණය, සිත මාගේ ම ය, දහම් මාගේ ම ය, මනොසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද මාගේ ම ය. ශ්‍රමණය, කොහි ගොස් මාකෙරෙන් මිදෙන්නෙහි ද?

පවිට; ඇස තාගේ ම ය, රූප තාගේ ම ය, චක්ඛුසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද තාගේ ම ය. එවිට, යම් තැනෙක ඇස නැද්ද, රූප නැද්ද, චක්ඛුසම්ඵස්ස හා විඤ්ඤාණායතනය නැද්ද, එවිට එහි තාගේ ගමනෙක් නැත.

කණ තාගේ ම ය, ශබ්ද තාගේ ම ය, සෝතසම්ඵස්ස හා විඤ්ඤාණායතනය තාගේ ම ය. පවිට, යම්තැනෙක කණ නැද්ද, ශබ්ද නැද්ද, සෝතසම්ඵස්ස හා විඤ්ඤාණායතනය නැද්ද, එවිට එහි තාගේ ගමනෙක් නැත.

පවිට, නැහැය තාගේ ම ය, ගන්ධයෝ තාගේ ම ය, ඝාණසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද තාගේ ම ය ... පවිට, එහි තාගේ ගමනෙක් නැත.

පවිට, දිව තාගේ ම ය, රස තාගේ ම ය, ජිව්හාසම්ඵස්ස හා විඤ්ඤාණායතනය ද තාගේ ම ය. ... පවිට, එහි තාගේ ගමනෙක් නැත.

තවෙව පාපිම කායො, තව ඵොට්ඨබ්බා තව කායසම්ඵස්සවිඤ්ඤාණායතනං -පෙ- අගති තව තත්‍ථ පාපිම.

තවෙව පාපිම මනො, තව ධම්මා, තව මනොසම්ඵස්සවිඤ්ඤාණායතනං. යත්‍ථ ච ඛො පාපිම නත්‍ථි මනො, නත්‍ථි ධම්මා, නත්‍ථි මනොසම්ඵස්සවිඤ්ඤාණායතනං. අගති තව තත්‍ථ පාපිමාති.

[මාරො:]

යං වදන්ති මම ඉදන්ති[1] යෙ වදන්ති මමන්ති ච,
එත්‍ථ චෙ තෙ මනො අත්‍ථි න මෙ සමණ මොක්ඛසීති.

[භගවා:]

යං වදන්ති න තං මය්හං යෙ වදන්ති න තෙ අහං,
එවං පාපිම ජානාහි න මෙ මග්ගම්පි දක්ඛසීති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්‍ථෙවන්තරධායීති.

4. 2. 10

රජ්ජසුත්තං.

156. එකං සමයං භගවා **කොසලෙසු** විහරති හිමවන්තපදෙසෙ[2] අරඤ්ඤකුටිකායං. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. සක්කා නු ඛො රජ්ජං කාරෙතුං අහනං අඝාතයං අජිනං අජාපයං අසොචං අසොචාපයං ධම්මෙනාති.

අථ ඛො මාරො පාපිමා භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්‍වා භගවන්තං එතදවොච: කාරෙතු භන්තෙ භගවා රජ්ජං, කාරෙතු සුගතො රජ්ජං, අහනං අඝාතයං අජිනං අජාපයං අසොචං අසොචාපයං ධම්මෙනාති.

[භගවා:]

කිම්පන ත්‍වං පාපිම, පස්සසි, යං මං ත්‍වං එවං වදෙසි: කාරෙතු භන්තෙ භගවා රජ්ජං, කාරෙතු සුගතො රජ්ජං, අහනං අඝාතයං අජිනං අජාපයං අසොචං අසොචාපයං ධම්මෙනාති.

[මාරො:]

භගවතා ඛො භන්තෙ චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්‍ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. ආකඞ්ඛමානො ච පන භන්තෙ භගවා හිමවන්තං පබ්බතරාජං සුවණ්ණන්තෙව අධිමුච්චෙය්‍ය සුවණ්ණපබ්බතස්සාති.[3]

[භගවා:]

පබ්බතස්ස සුවණ්ණස්ස ජාතරූපස්ස කෙවලො[4],
ද්විත්තාව නාලමෙකස්ස ඉති විද්වා සමඤ්චරෙ.

---

1. මමයිදන්ති - මජසං. සතා. PTS. 2. හිමවන්තපදෙසෙ - මජසං. සතා. PTS
3. සුවණ්ණස්සෙව පනස්සාති-මජසං. සුවණ්ණස්සෙව පබ්බතස්සාති - PTS 4. කෙවලා-සතා.

පවිට, කය තාගේ ම ය, ස්ප්‍රෂ්ටව්‍යය තාගේ ම ය, කායසම්ඵස්ස හා විඥ්ඥණායතනය ද තාගේ ම ය. ... එහි තාගේ ගමනෙක් නැත.

පවිට, සිත තාගේ ම ය, දහම් තාගේ ම ය, මනොසම්ඵස්ස හා විඥ්ඥණායතනය ද තාගේ ම ය. පවිට, යම් තැනෙක සිත නැද් ද, දහම් නැද් ද, මනොසම්ඵස්සය හා විඥ්ඥණායතනයත් නැද් ද, එවිට එහි තාගේ ගමනෙක් නැත.

[මරු:]

මේ මාගේ ය යි යමක් කියද් ද, යම් කෙනෙක් මා ගැත්තෝ ය යි කියද්ද, ඉදින් එහි ලා මුඹගේ සිතෙක් ඇත් නම් ශ්‍රමණය, මා කෙරෙන් නොමිදෙන්නෙහි ය.

[භගවත්හු:]

(මාගේ ය යි) යමක් කියද් ද, එය මාගේ නොවෙයි. යම් කෙනෙක් මා ගැත්තෝ ය යි කියද් ද, මම 'ඔහු'ද නොවෙමි. පවිට, මෙසේ දනුව. මා ගිය මඟත් නොදක්නෙහි ය.

ඉක්බිති පවිටු මරු තෙමේ එහි ම අතුරුදන් විය.

4. 2. 10.

රජ්ජසූත්‍රය.

156. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි හිමවත් පෙදෙසෙහි වන කිළියෙක වැඩ වසන සේක. එකල්හි එකලා වූ චිත්ත-විවෙකයෙහි යෙදුනු භාග්‍යවතුන් වහන්සේට "නො නස්මින් නො නස්වමින් පරස්වහරණය (ධනහානිය) නො කරමින්-නොකරවමින් ශෝක නො කරමින් නොකරවමින් දැහැමින් රජය කරවන්නට හැක්කේ දෝ"යි මෙබඳු චිත්ත-විතර්කයෙක් පහළ විය.

ඉක්බිති පවිටු මාර තෙමේ තම සිතින් භාග්‍යවතුන් වහන්සේගේ සිත්හි පරිවිතර්කය දැන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: වහන්ස, භගවත් තෙමේ නො නසමින් නො නස්-වමින් ධනහානි නො කරමින්-නො කරවමින් ශොක නො කරමින් ශොක නො කරවමින් දැහැමින් රජය කෙරේවා. සුගත තෙමේ රජය කෙරේවා යි.

[භගවත්හු:]

පවිට, "වහන්ස, භගවත් තෙමේ නො නස්මින් නො නස්වමින් ධනහානි නො කරමින් නො කරවමින් ශොක නො කරමින් නො කරවමින් දැහැමින් රජය කෙරේවා, සුගත තෙමේ රජය කෙරේවා"යි යම්හෙයෙකින් තෝ මට මෙසේ කියහි ද, තෝ කුමක් දකිහි ද?

[මරු:]

වහන්ස, භගවත්හු විසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලද්දහ. බහුල කරණ ලද්දහ. යානයක් මෙන් කරන ලද්දහ. වාස්තුවක් මෙන් කරණ ලද්දහ. නිතර තමා කෙරෙහි පිහිටුවන ලද්දහ. පුරුදු කරණ ලද්දහ. භාවනායෙන් සම්පූර්ණ කරණ ලද්දහ. වහන්ස, ඉදින් භගවත් තෙමේ කැමති වන්නේ හිමවත් මහපව්ව රන් ම යයි සිතන්නේ නම් රන්පව්වෙක් වන්නේ ය.

[භගවත්හු:]

සවර්ණසඞ්ඛ්‍යාත ජාතරූපයෙන් නිමි හුදු පව්වෙක් වේ නම් එමෙන් දෙගුණයක් මහත් පව්වක් වුව ද එක් පුරුෂයකුගේ සිතට නොසෑහේ. මෙසේ දන්නා නුවණැත්තේ සම ව හැසිරෙන්නේ ය.

යො දුක්ඛමද්දක්ඛි යතොනිදානං කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
උපධිං විදිත්වා සඞ්ගොති ලොකෙ තස්සෙව ජන්තු විනයාය සික්ඛෙති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං භගවා, ජානාති මං සුගතොති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

රජ්ජවග්ගො දුතියො.

තස්සුද්දානං:

පාසාණො සීහො සකලිකා පතිරූපං ච මානසං,
පත්තං ආයතනං පිණ්ඩං කස්සකං රජ්ජෙන තෙ දසාති.

---

3. මාරවග්ගො.

4. 3. 1.

සම්බහුලසුත්තං.

157. එවං මෙ සුතං: එකං සමයං භගවා **සක්කෙසු** විහරති **සිලාවතියං**. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො අවිදූරෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්ති.

අථ ඛො මාරො පාපිමා බ්‍රාහ්මණවණ්ණං අභිනිම්මිනිත්වා මහන්තෙන ජටණ්ඩුවෙන අජිනක්ඛිපනිවත්ථො ජිණ්ණො ගොපානසිවඞ්කො ඝුරුඝුරුපස්සාසී උදුම්බරදණ්ඩං ගහෙත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: දහරා භවන්තො පබ්බජිතා සුසුකාලකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනිකීළිතාවිනො[1] කාමෙසු, භුඤ්ජන්තු භොන්තො[2] මානුසකෙ කාමෙ, මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිත්ථාති.

න ඛො මයං බ්‍රාහ්මණ සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවාම, කාලිකඤ්ච ඛො මයං බ්‍රාහ්මණ හිත්වා සන්දිට්ඨිකං අනුධාවාම. කාලිකා හි බ්‍රාහ්මණ කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භීයො. සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[3] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

එවං වුත්තෙ මාරො පාපිමා සීසං ඔකම්පෙත්වා ජිව්හං නිල්ලාලෙත්වා තිවිසාඛං[4] නලාටෙන ලාටිකං උට්ඨාපෙත්වා දණ්ඩමොලුබ්භ පක්කාමි.

---

1. අනික්කීළිතාවිනො - මජසං. 2. භවන්තො - මජසං. 3. ඔපනෙය්‍යිකො - මජසං.
4. තිවිසාඛිකං - සී 1, 2.

යම් පස්කම් කෙතකුත්ගේ හේතුයෙන් දුක පහළ වේ යයි යමෙක් දුක දිටි නම් ඒ සත්ත්ව තෙමේ කෙසේ පස් කම් සුවෙහි නැමෙන්නේ ද (නුවණැති) සත්ත්ව තෙමේ ලෝකයෙහි පස්කම්හු 'සඞ්ගයහ'යි දැන පස්කම් දුරලීම පිණිස ම හික්මෙන්නේ ය.

ඉක්බිති පවිටු මාර තෙමේ භගවත් තෙමේ මා දනී, සුගත තෙමේ මා දනී යයි දුකට පත් වූයේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

රජ්ජවර්ගය දෙවෙනි යි.

එහි උද්දානය:

පාසාණ, සීහ, සකලිකා, පතිරූප, මානස, පත්ත, ආයතන, පිණ්ඩ, කස්සක, රජ්ජ ය යි සූත්‍ර දශයෙකි.

---

3. මාර වර්ගය

4. 3. 1.

සම්බහුලසූත්‍රය.

157. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යදනව්වෙහි සිලාවතී ගම්හි වැඩවසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ හුදුරෙහි නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙත්.

එකල්හි පවිටු මාර තෙමේ බමුණු වෙසක් මවා ගෙණ මහත් දළසුඹුළුයෙන් යුක්ත ව හැඳි පෙරෙවි අඳුන්දිවිසම් ඇතියේ ජරායෙන් දිරූයේ ගොවනැස්සක් මෙන් වක් වූයේ ඝුරු ඝුරු හඬින් ප්‍රශ්වාස කරණසුළු වූයේ දිඹුල්දඬක් අතින් ගෙණ ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන්ට "භවත් පැවිද්දෝ දහරයහ. මනා අභිනීල කෙහෙ ඇතිය හ. සොඳුරු යොව්නෙන් පළමු වයසින් යුක්තයහ. කම්කෙළියෙහි කෙළම් නොකළසුල්ලහ. භවත්හු මිනිස් කම්සුව විඳිත්වා. මේ අත්බැව්හි වින්ද යුතු සුව හැර කල් ගෙවා වින්ද යුතු වූ සුව කරා නුදුවත් වා" යි කී.

බමුණ, අපි මේ අත්බැව්හි වින්ද යුතු සුව හැර කල් ගෙවා වින්ද යුතු සුව කරා නොදුවමු. බමුණ, අපි කල් ගෙවා වින්ද යුතු සුව හැර මේ අත්බැව්හි වින්ද යුතු සුව කරා දුවමු. බමුණ, කාමයෝ කාලිකයහ. බොහෝ දුක් ඇතියහ. දැඩි ආයාස ඇතියහ. මෙහි දෙස් බොහෝහ. මේ ලොවුතුරු දහම මේ අත්බැව්හි තමන් විසින් ම වින්ද යුතු ය. කල් නොයවා විපාක දෙන සුළු ය. එව බලව යි කීමට සුදුසු ය. තමසිත්හි පමුණුවා ලීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතුය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය.

මෙසේ කී කල්හි පවිටු මාර තෙමේ හිස යටිකුරු කොට සලා දිව නෙරා ලෙලවා නළලෙහි තුන් රැළි ඇති බැම්බිදුම් තංවා දණ්ඩ එල්බ ගෙණ ගියේ ය.

අථ ඛො තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ මයං භන්තෙ භගවතො අවිදූරෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාම. අථ ඛො භන්තෙ අඤ්ඤතරො බ්‍රාහ්මණො මහන්තෙන ජටණ්ඩුවෙන අජිනක්ඛිපනිවත්ථො ජිණ්ණො ගොපානසිවඞ්කො ඝුරුඝුරුපස්සාසී උදුම්බරදණ්ඩං ගහෙත්වා යෙන මයං[1] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අම්හෙ එතදවොච:

දහරා භවන්තො පබ්බජිතා සුසුකාළකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනික්කීළිතාවිනො කාමෙසු, භුඤ්ජන්තු භොන්තො මානුසකෙ කාමෙ මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිත්ථාති. එවං වුත්තෙ මයං භන්තෙ තං බ්‍රාහ්මණං එතදවොචුම්හ: න ඛො මයං බ්‍රාහ්මණ සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවාම, කාලිකඤ්ච ඛො මයං බ්‍රාහ්මණ හිත්වා සන්දිට්ඨිකං අනුධාවාම. කාලිකා හි බ්‍රාහ්මණ කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො. සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. එවං වුත්තෙ භන්තෙ සො බ්‍රාහ්මණො සීසං ඔකම්පෙත්වා ජිව්හං නිල්ලාලෙත්වා තිවිසාඛං නලාටෙ නලාටිකං වුට්ඨාපෙත්වා දණ්ඩමොලුබ්භ පක්කන්තොති.

නෙසො භික්ඛවෙ බ්‍රාහ්මණො. මාරො එස[2] පාපිමා. තුම්හාකං විචක්ඛු-කම්මාය ආගතොති. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං ගාථං අභාසි:

යො දුක්ඛමද්දක්ඛි යතොනිදානං කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
උපධිං විදිත්වා සඞ්ගොති ලොකෙ තස්සෙව ජන්තු විනයාය සික්ඛෙති.

4. 3. 2.

සමිද්ධිසුත්තං.

158. එකං සමයං භගවා **සක්කෙසු** විහරති **සිලාවතියං**. තෙන ඛො පන සමයෙන ආයස්මා **සමිද්ධි** භගවතො අවිදූරෙ අප්පමත්තො ආතාපී පහිතත්තො විහරති.

අථ ඛො ආයස්මතො සමිද්ධිස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. ලාභා වත මෙ සුලද්ධං වත මෙ යස්ස මෙ සත්ථා අරහං සම්මාසම්බුද්ධො. ලාභා වත මෙ සුලද්ධං වත මෙ යො'හං[3] එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතො. ලාභා වත මෙ සුලද්ධං වත මෙ යස්ස මෙ සබ්‍රහ්මචාරයො.[4] සීලවන්තො කල්‍යාණධම්මාති.

---

1. යෙන අම්හෙ - PTS. 2. එසො - මජසං. සෘ. PTS. 3. ස්වාහං - මජසං.
4. බ්‍රහ්මචාරිනො - මජසං. සෘ.

ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ: වහන්ස, මෙහි අපි භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි නො පමාව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ව වෙසෙමු. වහන්ස, එකල්හි එක්තරා බමුණෙක් මහත් දළසුඹුළුයෙකින් යුක්තව අඳුන් දිවිසම් හැඳ පෙරෙවියේ ජරායෙන් දිරූයේ ගොවනැස්සක් මෙන් වක් වූයේ ඝුරු ඝුරු යන හඬින් ප්‍රශ්වාස කරණ සුළු වූයේ දිඹුල් දණ්ඩක් අතින් ගෙණ අප වෙත එළඹියේ ය. එළඹ අපට මෙය කී ය.

“භවත් පැවිද්දේ දහරයහ. කළුකෙහෙ ඇතියහ. සොඳුරු යොව්නෙන් පළමු වයසින් යුක්තයහ. කාමයෙහි ක්‍රීඩා නොකළහ. භවත්හු මිනිස් කම්සුව විඳින් වා. මේ අත්බැව්හි වින්ද යුතු සුවය හැර කලෙකින් ලැබෙන සුවය කරා නො දුවත්වා”යි. වහන්ස, මෙසේ කී කල්හි ඒ බමුණාට අපි මෙය කීමු. “බමුණ, අපි මේ අත්බැව්හි වින්දයුතු සුව හැර කල් ගෙවා ලැබෙන සුව කරා නො දුවමු. බමුණ, අපි කල් ගෙවා ලැබෙන සුව අත් හැර මේ අත්බැව්හි වින්ද යුතු සුව කරා දුවමු. බමුණ, කාමයෝ කාලිකයහ. බොහෝ දුක් ඇතියහ. දැඩි ආයාස ඇතියහ. මෙහි ආදීනව බොහෝහ. මේ ලොවුතුරු දහම මේ අත්බැව්හි තමා විසින් ම වින්ද යුතුය. කල් නො යවා විපාක දෙන සුළු ය. එව, බලවයි කීමට සුදුසු ය. තම සිත්හි පමුණුවා ලීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය”යි. වහන්ස, මෙසේ කී කල්හි ඒ බමුණු තෙමේ හිස යටිකුරු කොට සලා දිව තෙරා ලෙළවා නළලෙහි තුන්රැළි ඇති බැමබිඳුම් නංවා දණ්ඩ එල්බ ගෙණ ගියේ ය.

මහණෙනි, මේ බමුණෙක් නො වේ. මේ පවිටු මරු ය. තොපගේ නුවණැස වනසාලීම පිණිස පැමිණියේ ය යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරුණ දැන ඒ වේලායෙහි මේ ගාථාව වදාළ සේක:

යමෙක් දුක යම් පඤ්චකාම ගුණයක් නිදාන කොට ඇතැයි දුටුයේ ද, ඒ සත්ත්ව තෙමේ කාමයන්හි කෙසේ නැමෙන්නේ ද, (නො නැමේ මැ යි) ඒ සත්ත්ව තෙමේ ලෙව්හි කාමගුණෝපධිය (රාගාදි) සඞ්ගය යි දැන ඒ කාමගුණෝපධිය ම දුරලනු පිණිස හික්මෙන්නේ ය.

4. 3. 2.

සමිද්ධි සූත්‍රය.

158. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යදනව්වෙහි සිලාවති ගම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙති.

ඉක්බිති එකලා වූ චිත්තවිවේකයෙන් යුක්ත වූ ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන්ට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය. ඒ මාගේ ශාස්තෘ තෙමේ අර්හත් ය. සම්‍යක් සම්බුද්ධ ය. ඒ මට එකාන්තයෙන් මහත් ලාභයෙකි. එකාන්තයෙන් මනා ලැබීමෙකි. ඒ මම මෙසේ ස්වාක්ඛාත වූ ශාසනයෙහි පැවිදි වූයෙමි. ඒ මට එකාන්තයෙන් මහත් ලාභයෙකි. එකාන්තයෙන් මනා ලැබීමෙකි. ඒ මට සිල්වත් කලණ දහම් ඇති සබ්‍රම්සරහු වෙති. ඒ මට එකාන්තයෙන් මහත් ලාභයෙකි. එකාන්තයෙන් මනා ලැබීමෙකි

අථ ඛො මාරො පාපිමා ආයස්මතො සමිද්ධිස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය යෙනායස්මා සමිද්ධි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතො සමිද්ධිස්ස අවිදූරෙ මහන්තං භයභෙරවසද්දං අකාසි, අපිස්සුදං පථවි මඤ්ඤෙ උද්‍රියතීති.[1]

අථ ඛො ආයස්මා සමිද්ධි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සමිද්ධි භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ භගවතො අවිදූරෙ අප්පමත්තො ආතාපී පහිතත්තො විහරාමි. තස්ස මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යස්ස මෙ සත්ථා අරහං සම්මාසම්බුද්ධො. ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යො'හං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතො. ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යස්ස මෙ සබ්‍රහ්මචාරයො සීලවන්තො කල්‍යාණධම්මාති. තස්ස මය්හං භන්තෙ අවිදූරෙ මහාභයභෙරවසද්දො අහොසි, අපිස්සුදං පථවි මඤ්ඤෙ උද්‍රියතීති.[1]

[භගවා:]

නෙසා සමිද්ධි පථවි උද්‍රියති. මාරො එසො පාපිමා. තුය්හං විචක්ඛුකම්මාය ආගතො. ගච්ඡ ත්වං සමිද්ධි තත්ථෙව අප්පමත්තො ආතාපී පහිතත්තො විහරාහීති.

එවම්භන්තෙති ඛො ආයස්මා සමිද්ධි භගවතො පටිස්සුත්වා[2] උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. දුතියම්පි ඛො ආයස්මා සමිද්ධි තත්ථෙව අප්පමත්තො ආතාපී පහිතත්තො විහාසි. දුතියම්පි ඛො ආයස්මතො සමිද්ධිස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. ලාභා වත මෙ, සුලද්ධං වත මෙ -පෙ- යස්ස මෙ සබ්‍රහ්මචාරයො සීලවන්තො කල්‍යාණධම්මාති. දුතියම්පි ඛො මාරො පාපිමා ආයස්මතො සමිද්ධිස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය -පෙ- අපිස්සුදං පථවි මඤ්ඤෙ උද්‍රියතීති.[1]

අථ ඛො අයස්මා සමිද්ධි මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාය අජ්ඣභාසි:

සද්ධායාහං පබ්බජිතො අගාරස්මා අනගාරියං,
සති පඤ්ඤා ච මෙ බුද්ධා චිත්තඤ්ච සුසමාහිතං,
කාමං කරස්සු රූපානි නෙව මං බ්‍යාධයිස්සසීති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං සමිද්ධි භික්ඛූති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

1. උඩ්ඩීයතීති. - මජසං. 2. පටිස්සුණිත්වා. - PTS.

ඉක්බිති පවිටු මාර තෙමේ (තම) සිතින් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන්ගේ චිත්තපරිවිතර්කය දැන ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන් නුදුරෙහි මහත් බිය ජනන හඬක් කෙළේ ය. තවද එය පොළොව පෙරළන්නාක් සෙයින් වෙයි.

ඉක්බිති ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ: වහන්ස, මෙහි මම භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි නොපමා ව කෙලෙස් තවන වෙර ඇතිව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව වෙසෙමි. වහන්ස, එකලා වූ චිත්තවිවේකයෙන් හුන් ඒ මට මේබඳු චිත්තවිතර්කයෙක් පහළ විය. ඒ මාගේ ශාස්තෘ තෙමේ අර්හත් ය. සම්‍යක් සම්බුද්ධ ය. එය මට ඒකාන්තයෙන් මහත් ලාභයෙකි. ඒකාන්තයෙන් මනා ලැබීමෙකි. ඒ මම මෙසේ ස්වාක්ඛාත වූ ශාසනයෙහි පැවිදි වූයෙමි. එය මට ඒකාන්තයෙන් මහත් ලාභයෙකි. එකතින් මනා ලැබීමෙකි. ඒ මට සිල්වත් කලණ දහම් ඇති සබ්‍රහ්මසරහු වෙති. එය මට එකතින් මහත් ලාභයෙකි. එකතින් මනා ලැබීමෙකි. වහන්ස, ඒ මාගේ නුදුරෙහි පොළොව පෙරළන්නාක් සෙයින් බිය ජනන හඬක් විය.

[භගවත්හු:]

සමිද්ධි, මේ පොළොව නො පෙරළෙයි. මේ පවිටු මරු ය. තොපගේ නුවණැස වනසා ලන්නට පැමිණියේ ය. සමිද්ධි, තෙපි යව. නොපමා ව කෙලෙස් තවන වෙර ඇතිව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව එහි ම වසව.

වහන්ස, එසේ ය යි ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියහ: දෙවනවට ද ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ නොපමාව කෙලෙස් තවන වෙර ඇතිව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව එහි ම විසූහ. දෙවනවට ද එකලා ව චිත්තවිවේකයෙන් හුන් සමිද්ධි තෙරණුවන්ට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය. ... ඒ මට සිල්වත් කලණදහම් ඇති සබ්‍රහ්මසරහු වෙති. එය මට එකතින් මහත් ලාභයෙකි. එකතින් මට මනා ලැබීමෙකි. දෙවනවට ද පවිටු මාර තෙමේ (තම) සිතින් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන්ගේ චිත්තපරිවිතර්කය දැන ... තවද, පොළොව පෙරළන්නාක් සෙයිනි.

ඉක්බිති ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ මේ පවිටු මරු ය යි දැන පවිටු මරුහට ගාථායෙන් කීහ.

මම සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වීමි. මා විසින් සිහිය හා නුවණ අවබෝධ කරණ ලදී. සිත ද මොනොවට පිහිටුවන ලද්දේ ය. (එහෙයින් බිහිසුණු) රූපයන් කැමති පරිද්දෙන් කරව. මා නොම පෙළන්නෙහි ය.

ඉක්බිති පවිටු මරු තෙමේ සමිද්ධි මහණ තෙමේ මා දනී යයි දුකට පැමිණියේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

4. 3. 3.

ගොධිකසුත්තං

159. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ගොධිකො ඉසිගිලි-පස්සෙ විහරති කාළසිලායං. අථ ඛො ආයස්මා ගොධිකො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො සාමයිකං[1] චෙතොවිමුත්තිං ඵුසි. අථ ඛො ආයස්මා ගොධිකො තාය[2] සාමයිකාය චෙතොවිමුත්තියා පරිහායි.

දුතියම්පි ඛො ආයස්මා ගොධිකො අප්පමත්තො -පෙ- විහරන්තො සාමයිකං[1] චෙතොවිමුත්තිං ඵුසි. දුතියම්පි ඛො ආයස්මා ගොධිකො තාය[2] සාමයිකාය චෙතොවිමුත්තියා පරිහායි. තතියම්පි ඛො ආයස්මා ගොධිකො -පෙ- පරිහායි. චතුත්ථම්පි ඛො ආයස්මා ගොධිකො -පෙ- පරිහායි. පඤ්චමම්පි ඛො ආයස්මා ගොධිකො -පෙ- පරිහායි. ඡට්ඨම්පි ඛො ආයස්මා ගොධිකො - පෙ - පරිහායි.

සත්තමම්පි ඛො ආයස්මා ගොධිකො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො සාමයිකං චෙතොවිමුත්තිං ඵුසි අථ ඛො ආයස්මතො ගොධිකස්ස එතදහොසි: යාව ඡට්ඨං ඛ්වාහං සාමයිකාය චෙතොවිමුත්තියා පරිහීනො. යන්නූනාහං සත්ථං ආහරෙය්‍යන්ති.

අථ ඛො මාරො පාපිමා ආයස්මතො ගොධිකස්ස චෙතසා චෙතො-පරිවිතක්කමඤ්ඤාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාහි අජ්ඣභාසි:

මහාවීර මහාපඤ්ඤ ඉද්ධියා යසසා ජලං[3],
සබ්බවෙරභයාතීත පාදෙ වන්දාමි චක්ඛුම.

සාවකො තෙ මහාවීර මරණං මරණාභිභූ,
ආකඞ්ඛති චෙතයති තං නිසෙධ ජුතින්ධර.

කථං හි භගවා තුය්හං සාවකො සාසනෙ රතො,
අප්පත්තමානසො සෙඛො කාලං කයිරා ජනෙසුතාති.

තෙන ඛො පන සමයෙන ආයස්මතා ගොධිකෙන සත්ථං ආහරිතං හොති.

අථ ඛො භගවා මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාය අජ්ඣභාසි:

එවං හි ධීරා කුබ්බන්ති නාවකඞ්ඛන්ති ජීවිතං,
සමූලං තණ්හං අබ්බුය්හ[4] ගොධිකො පරිනිබ්බුතොති.

---

1. සාමායිකං - PTS. සාමාසිකං - සයා. 2: තම්හා. 3. ජල - මජ්ඣං. සයා.
4. තණ්හාමබ්බුය්හ - මජ්ඣං

4. 3. 3.

ගොධික සූත්‍රය

159. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි කලන්‍දකනිවාප නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් **ගෝධික** තෙරණුවෝ **ඉසිගිලි** පවු ඇලයෙහි කළුගල් තලායෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වසන්නාහු ලෞකික සමවතක් ලැබූහ. එකල්හි ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික සමවතින් පිරිහුනහ.

දෙවනවට ද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නො පමාව ... වසන්නාහු ලෞකික සමවත ලැබූහ. දෙවනවට ද ආයුෂ්මත් ගොධික තෙරණුවෝ ඒ ලෞකික සමවතින් පිරිහුනහ. තෙවනවට ද ආයුෂ්මත් ගොධික තෙරණුවෝ ... පිරිහුනහ. සිවුවනවට ද ආයුෂ්මත් ගොධික තෙරණුවෝ ... පිරිහුනහ. පස්වනවට ද ආයුෂ්මත් ගොධික තෙරණුවෝ ... පිරිහුනහ. සවනවට ද ආයුෂ්මත් ගොධික තෙරණුවෝ ... පිරිහුනහ.

සත්වනවට ද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නො පමාව කෙලෙස් තවන වෙර ඇතිව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව වසන්නාහු ලෞකික සමවත ලැබූහ. ඉක්බිති ආයුෂ්මත් ගෝධික තෙරණුවන්ට "මම සවනවට තෙක් ලෞකික සමවතින් පිරිහිනිමි. මම සැත් අරනෙම් නම්, මනා නො!"යි මේ සිත වි ය.

ඉක්බිති පවිටු මාර තෙමේ තම සිතින් ආයුෂ්මත් ගෝධික තෙරණුවන් ගේ චිත්තපරිවිතර්කය දැන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථාවලින් කී ය.

මහාවීරයෙනි, මහාප්‍රඥතියෙනි, ඍද්ධියෙන් හා පිරිවරින් බබලනුවෙනි, සියලු (ප්‍රාණාතිපාතාදි) වෙර හා බිය ඉක්ම වූ තැනැත්තෙනි, පසැස් ඇතියෙනි, පා වදිමි.

මරණය මැඩලන සුළු මහාවීරයෙනි, මුබගේ සව්වෙක් මරණය කැමති වෙයි. පියෝ කෙරෙයි. මහතෙදැතියෙනි, එය වළක්වනු මැනවි.

ජනයා කෙරෙහි ප්‍රසිද්ධ වූ භාග්‍යවතුන් වහන්ස, සස්නෙහි ඇලුනු නොපත් රහත්ඵල ඇති ශෛක්‍ෂ වූ මුබ සව්වෙක් කෙසේ නම් කලුරිය කරන්නේ ද?

එකල්හි ආයුෂ්මත් ගෝධික තෙරණුවන් විසින් සැත් අරනලද්දේ වෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පවිටු මරැයයි දැන පවිටු මරුහට ගාථායෙන් වදාළ සේක.

නුවණැත්තෝ මෙසේ ද කෙරෙත්. දිවි නො පතත්. ගෝධික තෙමේ මුල්සහිත තෘෂ්ණාව උපුටා හැර පිරිනිවියේ ය. (සමසීසී වැ පිරිනිවියෙන් ස්කන්ධපරිනිර්වාණයෙන් පිරිනිවියේ ය.)

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ආයාම භික්ඛවෙ යෙන **ඉසිගිලිපස්සං** කාළසිලා තෙනුපසඞ්කමිස්සාම, යත්‍ථ ගොධිකෙන කුලපුත්තෙන සත්‍ථං ආහරිතන්ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන ඉසිගිලිපස්සං කාළසිලා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මන්තං ගොධිකං දූරතොව මඤ්චකෙ විවත්තක්ඛන්ධං සෙමානං.[1]

තෙන ඛො පන සමයෙන ධූමායිතත්තං තිමිරායිතත්තං ගච්ඡතෙව පුරිමං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අධො, ගච්ඡති අනුදිසං.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං ධූමායිතත්තං තිමිරායිතත්තං. ගච්ඡතෙව පුරිමං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අධො, ගච්ඡති අනුදිසන්ති. එවං භන්තෙ. එසො ඛො භික්ඛවෙ මාරො පාපිමා ගොධිකස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං සමන්වෙසති[2], කත්‍ථ ගොධිකස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං පතිට්ඨිතන්ති. අප්පතිට්ඨිතෙන ච භික්ඛවෙ විඤ්ඤාණෙන ගොධිකො කුලපුත්තො පරිනිබ්බුතොති.

අථ ඛො මාරො පාපිමා **බෙලුවපණ්ඩුවීණං** ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

උද්ධං අධො ච තිරියඤ්ච දිසා අනුදිසාස්වහං,
අන්වෙසං නාධිගච්ඡාමි ගොධිකො සො කුහිං ගතොති?

[භගවා:]

සො ධීරො ධිතිසම්පන්නො ඣායී ඣානරතො සදා,
අහොරත්තං අනුයුඤ්ජං ජීවිතං අනිකාමයං.

ජෙත්වාන මච්චුනො සෙනං අනාගන්ත්වා පුනබ්භවං,
සමූලං තණ්හමබ්බුය්හ ගොධිකො පරිනිබ්බුතොති.

[ථෙරා:]

තස්ස සොකපරෙතස්ස වීණා කච්ඡා අභස්සථ,
තතො සො දුම්මනො යක්ඛො තත්ථෙවන්තරධායථාති[3].

4. 3. 4.

සත්තවස්ස සුත්තං.

160. එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ **අජපාලනිග්‍රොධෙ**. තෙන ඛො පන සමයෙන මාරො පාපිමා සත්තවස්සානි භගවන්තං අනුබන්ධො[4] හොති ඔතාරාපෙක්ඛො ඔතාරං අලභමානො. අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

සොකාවතිණ්ණො නු වනම්හි[5] ඣායසි විත්තං නු ජීනො උද පත්ථයානො,
ආගුං නු ගාමස්මිමකාසි කිඤ්චි කස්මා ජනෙන න කරොසි සක්ඛිං
සක්ඛී න සම්පජ්ජති කෙන චි තෙති.

---

1. සෙය්‍යමානං - ස්‍යා, සෙය්‍යොපමානං - සීමු. 1. 2. සමන්නෙසති - මජසං., PTS. 3. තත්ථෙ-වන්තරධායිථාති - ස්‍යා. 4. අනුබන්ධො මජසං. ස්‍යා, සීමු. 5. වනම්හි - ස්‍යා, PTS.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, යම්හ, යම්තැනෙක දී ගෝධික කුලපුත්‍ර විසින් සැත් අරන ලද්දේ නම් ඒ ඉසිගිලි ඇළයෙ කළුගල්තලාව වෙත එළඹෙන්නෙමු. වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග ඉසිගිලිපව්පස කළුගල්තලාව වෙත එළඹි සේක. භාග්‍යවතුන් වහන්සේ පෙරළුනු කඳ ඇති ඇඳෙහි උඩුකුරු ව හෝනා ආයුෂ්මත් ගොධික තෙරුන් දුර දී ම දුටු සේක.

එකල්හි ධූමායිත බවෙක් තිමිරායිත බවෙක් (දුම්ක්හු, අඳුරක්හු සෙයින් හැසිරෙන සෙයක් = මාරුවෙශ අවතාර රූප) පෙරදිගට යේ ම ය. පැළදිගට යේ ම ය උතුරුදිගට යේ ම ය. දකුණුදිගට යේ ම ය. උඩට යේ ම ය. යටට යේ ම ය. අනුදිගට යේ ම ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, තෙපි තෙල දකිවූ ද? ධූමායිත බවෙක් තිමිරායිත බවෙක් (දුම්ක්හු, අඳුරක්හු සෙයින් හැසිරෙන සෙයක් = මාරුවෙශ අවතාර රූප) පෙරදිගට යේ ම ය. පැසුලුදිගට යේ ම ය. උතුරුදිගට යේ ම ය. දකුණුදිගට යේ ම ය. උඩට යේ ම ය. යටට යේ ම ය. අනුදිගට යේ ම ය. වහන්ස, එසේ ය. මහණෙනි, මේ පව්ටු මාර තෙමේ "ගෝධික කුලපුත්‍රගේ විඥානය කොහි පිහිටියේ දැයි ගෝධික කුලපුත්‍රගේ විඥානය සොයයි. මහණෙනි, ගොධික කුලපුත් තෙමේ නොපිහිටි විඥානයෙන් පිරිනිවියේ ය.

ඉක්බිති පව්ටු මාර තෙමේ බෙලුවපණ්ඩු (විලිකුත් බෙල්පක් පැහැබඳු පැහැ ඇති රන් මුවා) මහවෙණ ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය:

මම උඩ ද, යට ද, සරස ද, සිවුදිග හා අනුදිග ද ඒ ගොධික තෙමේ කොහි ගියේ දැයි සොයන්නෙම් නොලබමි.

[භගවත්හු:]

නුවණැති ධෘතිමත් වූ ධ්‍යානකරණ සුලු හැමකල්හි ධ්‍යානයෙහි ඇලුනු ඒ ගොඩික තෙමේ දිවි නොතකමින් දවරු දෙක්හි පිළිවෙත් කරනුයේ මරසෙනඟ සිඳ පුනර්භවයට නො පැමිණ තෘෂ්ණාව සහමුලු කොට උපුටා හැර පිරිනිවියේ ය.

[තෙරහු:]

ශෝකයෙන් මැඩුනු ඒ මාරයාගේ කැසින් වීණාව ගිලිහුනේ ය. එයින් නොසතුටු සිත් ඇති ඒ මාර තෙමේ එහි ම අතුරුදන් විය.

4. 3. 4.

සත්තවස්ස සූත්‍රය.

160. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ උරුවෙල්දනව්වෙහි නේරඤ්ජරා ගංතෙර අජපල්නුගරුකමුල වැඩවසන සේක. එකල්හි පව්ටු මරු සිදුරු සොයන්නේ සිදුරු නො විඳුමින් සත්වසක් මුළුල්ලෙහි භාග්‍යවතුන් වහන්සේ ලුහුබැන්දේ වේ. ඉක්බිති පව්ටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

වෙනෙහි සිහිවිලි සිතයි ද? ශෝකයට බටුයෙහි ද? ධනයක් පැරදූ- නෙහි ද? වැලි, පතමින් (හිඳිහි ද?) ගමෙහි කිසියම් අපරාධයක් කෙළෙහි ද? කුමක්හෙයින් මහජනයා සමග මිත්‍රභාවය නො කෙරෙහි ද? කිසිවකු හා නුබගේ මිත්‍රභාවයෙක් නො සැපයේ ද,

[භගවා:]

සොකස්ස මූලං පලිඛාය සබ්බං අනාගු ඣායාමි අසොචමානො,
ඡෙත්වාන සබ්බං භවලොභජප්පං අනාසවො ඣායාමි පමත්තබන්ධු.

[මාරො:]

යං වදන්ති මමෙදන්ති යෙ වදන්ති මමන්ති ච,
එත්ථ චෙ තෙ මනො අත්ථි න මෙ සමණ මොක්ඛසීති.

[භගවා:]

යං වදන්ති න තං මය්හං යෙ වදන්ති න තෙ අහං,
එවං පාපිම ජානාහි න මෙ මග්ගම්පි දක්ඛසීති.

[මාරො:]

සචෙ මග්ගං අනුබුද්ධං ඛෙමං අමතගාමිනං,
අපෙහි ගච්ඡ ත්වමෙවෙකො කිමඤ්ඤමනුසාසසීති.

[භගවා:]

අමච්චුධෙය්‍යං පුච්ඡන්ති යෙ ජනා පාරගාමිනො,
තෙසාහං පුට්ඨො අක්ඛාමි යං සච්චං තං[1] නිරූපධින්ති.

සෙය්‍යථාපි භන්තෙ ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ පොක්ඛරණී, තත්‍ර'ස්ස කක්කටකො. අථ ඛො භන්තෙ සම්බහුලා කුමාරකා වා කුමාරිකායො වා තම්හා ගාමා වා නිගමා වා නික්ඛමිත්වා යෙන සා පොක්ඛරණී තෙනුපසඞ්කමෙය්‍යුං උපසඞ්කමිත්වා තං කක්කටකං උදකා උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙය්‍යුං, යං යදෙව හි සො භන්තෙ කක්කටකො අළං අභිනින්නාමෙය්‍ය, තං තදෙව තෙ කුමාරකා වා කුමාරිකායො වා කට්ඨෙන වා කඨලාය වා සඤ්ඡින්දෙය්‍යුං සම්භඤ්ජෙය්‍යුං. එවං හි සො භන්තෙ කක්කටකො සබ්බෙහි අළෙහි සඤ්ඡින්නෙහි සම්භග්ගෙහි සම්පලිභග්ගෙහි අභබ්බො තං පොක්ඛරණිං පුන[2] ඔතරිතුං සෙය්‍යථාපි පුබ්බෙ.[2]

එවමෙව ඛො භන්තෙ යානි[3] විසූකායිකානි[4] විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි සබ්බානි[5] තානි භගවතා සඤ්ඡින්නානි, සම්භග්ගානි සම්පලිභග්ගානි. අභබ්බො දානාහං[6] භන්තෙ පුන භගවන්තං උපසඞ්කමිතුං යදිදං ඔතාරාපෙක්ඛො'ති. අථ ඛො මාරො පාපිමා භගවතො සන්තිකෙ ඉමා නිබ්බෙජනියා ගාථායො අභාසි:

මෙදවණ්ණඤ්ච පාසාණං වායසො අනුපරියගා,
අපෙත්ථ මුදු[7] වින්දෙම අපි අස්සාදනා සියා.

අලද්ධා තත්ථ අස්සාදං වායසෙත්තො[8] අපක්කමෙ,
කාකොව සෙලමාසජ්ජ නිබ්බිජ්ජාපෙම ගොතමා'ති.

---

1. සබ්බිහානං - සීමු. 2. PTS. 2 "පුන" ඉති ච "සෙය්‍යථාපි පුබ්බෙ" ඉති ච නදිස්සන්ත - මජසං. 3. යානි කානිචි - මජසං. 4. විසූකායිතානි - සයා.
5. විප්ඵන්දිතානි සබ්බානි - මජසං. සයා. 6. අභබ්බො ච දානාහං - සීමු, 2. අභබ්බො වදානාහං - PTS. 7. මුදුං - මජසං. 8. වායසමත්තො - සයා.

[භගවත්හු:]

මාරය, ශෝකමූල හැම සාරා දමා ශෝක නොකරමින් නිරපරාධ ව සිට ධ්‍යාන කරමි. සියලු භවලොභසංඛ්‍යාත තෘෂ්ණාව සිඳ ආශ්‍රවරහිත වූයෙම් ධ්‍යාන කරමි.

[මරු:]

මේ මාගේ යයි යමක් කියද් ද, යම් කෙනෙකුත් මා ගැත්තෝ යයි කියද් ද, ඉදින් මෙහි මුබගේ සිතෙක් ඇත් නම් ශ්‍රමණය, මාගෙන් නො මිදෙන්නෙහි ය.

[භගවත්හු:]

මාගේ යයි යමක් කියද් ද, එය මාගේ නො වේ. යම් කෙනෙක් (මාගේ යයි) කියද් ද මම හේ නො වෙමි. පව්ට, මෙසේ දනුව. මා ගිය මග ද නෝ නොදක්නෙහි ය.

[මරු:]

ඉදින් නිර්‍භය වූ නිවණට යන මග අවබොධ කරණ ලද්දේ නම් (මාගේ විෂයයෙන්) පහවනු මැනව. මුබ ම එකලා ව (ඒ මග) යනු මැනව. කුමක් හෙයින් මෙරමාහට අනුශාසනා කෙරෙහිද්දයි.

[භගවත්හු:]

පරතෙර යන සුලු යම් ජන කෙනෙක් මරුහට විෂය නො වූ නිවණ විචාරද් ද, ඔවුන් විසින් විචාරණ ලද්දෙම් මම යමෙක් සත්‍ය වේ ද, උපධි රහිත ද, එය කියමි.

[මරු:]

වහන්ස, ගමකට හෝ නියම්ගම්කට නුදුරෙහි පොකුණෙක් වේ. එහි කකුළුවෙක් වන්නේ ය. වහන්ස, එකල්හි බොහෝ කුමරුවෝ හෝ කුමරියෝ හෝ ඒ ගමින් හෝ නියම්ගමින් නික්ම ඒ පොකුණ වෙත එළඹෙන්නාහු ය. එළඹ ඒ කකුළුවා ජලයෙන් නගා ගොඩ තබන්නාහු ය. වහන්ස, ඒ කකුළුවා යම් යම් අලක් ඉදිරියට නමන්නේ ය. ඒ කුමරුවෝ හෝ කුමරියෝ හෝ ඒ ඒ අල ම ලීයෙකින් හෝ කැබිලිත්තෙකින් හෝ සිඳින්නාහු ය. බිඳින්නාහු ය. වහන්ස, මෙසේ ඒ කකුළුවා සිඳින ලද බිඳින ලද කැබැලි කැබැලි කොට බිඳින ලද සියලු අල කරණ කොට හෙණ පෙර මෙන් නැවත ඒ පොකුණට බස්නට අභව්‍ය වන්නේ ය.

වහන්ස, එසෙයින් ම කිසියම් විසූකයෝ (මරවිසුළු) ඇද්ද, කිසියම් විලොම ද ඇද්ද, කිසියම් කිසියම් සලන සුලු දුකුම් ඇද්ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ විසින් සිඳින ලදී. බිඳින ලදී. කැබැලි කැබැලි කරණ ලදී. වහන්ස, දැන් මම සිදුරු සොයන්නෙම් භාග්‍යවතුන් වහන්සේ වෙත නැවත එළඹෙන්නට නුසුදුස්සෙම් වෙමි යි. ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි උකටලියට කරුණු වූ මේ ගාථා කී ය:

කවුඩෙක් මේද තෙල්පැහැ ඇති ගලක් (දැක) එහි මොලොක් බව විඳිම් නම් මැනවි, රස විඳ ගැණීමෙක් වන්නේ නම් මැනැවි යි ඒ සිසාරන්නේ වේ ද,

ඒ කවුඩු තෙමෙ එහි ආස්වාදයක් නො ලැබ (යම්සේ) එයින් පහ වන්නේ ද, (මේද තෙල් පැහැ ඇති) ගල වෙත පැමිණ (ආශ්වාදයක් නොලත් මේ) කවුඩා මෙන් කලකිරී ගෞතමයන් වහන්සේ කෙරෙන් පහව යම්හ.

අථ ඛො මාරො පාපිමා භගවතො සන්තිකෙ ඉමා නිබ්බෙජනීයා ගාථායො අභාසිත්වා තම්හා ඨානා අපක්කම්ම භගවතො අවිදූරෙ පඨවියං පල්ලඞ්කෙන නිසීදි තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො කට්ඨෙන භූමිං විලිඛන්තොති.

4. 3. 5.

මාරධීතුසුත්තං

161. උරුවෙලායං—

අථ ඛො තණ්හා ච අරති[1] රගා ච මාරධීතරො යෙන මාරො පාපිමා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මාරං පාපිමන්තං ගාථාය අජ්ඣභාසිංසු:

කෙනාසි දුම්මනො තාත පුරිසං කන්නු සොචසි?
මයං තං රාගපාසෙන ආරඤ්ඤමිව[2] කුඤ්ජරං,
බන්ධිත්වා ආනයිස්සාම වසගො තෙ භවිස්සතීති.

[මාරො:]

අරහං සුගතො ලොකෙ න රාගෙන සුවානයො,
මාරධෙය්‍යමතික්කන්තො තස්මා සොචාමහං භුසන්ති.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොචුං: පාදෙ තෙ සමණ පරිචාරෙමාති. අථ ඛො භගවා න මනසාකාසි යථා තං අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො එකමන්තං අපක්කම්ම එවං සමචින්තෙසුං: උච්චාවචා ඛො පුරිසානං අධිප්පායා. යන්නූන මයං එකසතං එකසතං කුමාරිවණ්ණසතං අභිනිම්මිනෙය්‍යාමාති.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො එකසතං එකසතං කුමාරිවණ්ණසතං අභිනිම්මිනිත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොචුං: පාදෙ තෙ සමණ පරිචාරෙමාති. තම්පි භගවා න මනසාකාසි යථා තං අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො එකමන්තං අපක්කම්ම එවං සමචින්තෙසුං: උච්චාවචා ඛො පුරිසානං අධිප්පායා. යන්නූන මයං එකසතං එකසතං අවිජාතවණ්ණසතං අභිනිම්මිනෙය්‍යාමාති.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො එකසතං එකසතං අවිජාතවණ්ණසතං අභිනිම්මිනිත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොචුං: පාදෙ තෙ සමණ පරිචාරෙමාති. තම්පි භගවා න මනසාකාසි යථා තං අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

---

1. අරතී ච - කණ්ඩව 2. අරඤ්ඤ- - සීමු 1. ස්‍යා PTS.

ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි උකටලියට කරුණු වූ මේ ගාථාවන් කියා එතැනින් පහ ව භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි නිහඬ වූයේ තෙද නැති වූයේ බහාලූ කර ඇතියේ යටිහුරු මුහුණු ඇතියේ සිතිවිලි සිතමින් කිසිත් වටහා ගත නො හැකි වූයේ ලී කැබැල්ලෙකින් බිම ඉරි අඳිමින් බිම පලක් බැඳ ගෙණ හුන්නේ ය.

4. 3. 5.

මාරධීතු සූත්‍රය.

161. උරුවේලාවෙහි—

ඉක්බිති තණ්හා අරති රගා ද යන මාරකන්‍යාවෝ පවිටු මරු වෙත එළඹියහ. එළඹ පවිටු මරුහට ගාථායෙන් කියුහු:

පියාණෙනි, කවරහෙයින් නොසතුටු සිත් ඇත්තෙහි ද? කිනම් පුරුෂයකු සිතයි ද? අපි ඔහු වනඇතකු මෙන් රාගපාශයෙන් බැඳ ගෙණ එන්නමු. එවිට තොපට වසඟ වන්නේ යයි.

[මරු:]

සුගත තෙමේ ලෝකයෙහි අර්හත් ය. රාගයෙන් (බැඳ) සුවසේ ගෙණ ඉය නොහැක්කේ ය. මාරවිෂය ඉක්ම වූයේ ය. එහෙයින් මම අතිශයින් සිතිවිලි සිතමි.

ඉක්බිති තණ්හා අරති රගා ද යන මාරකන්‍යාවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට "මහණ, මුබ පා හමුයෙහි මෙහෙවර කරමෝ ව"යි මෙය කියූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ යම් සෙයින් අනුත්තර තිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙනෙහි නොකෙරේ ද එසෙයින් එද නොමෙනෙහි කළ සේක.

ඉක්බිති තණ්හා අරති රගා ද යන මරදූහු එකත්පසෙකට ඉවත් ව පුරුෂයන්ගේ අදහස් විසිතුරු ය. (එහෙයින්) අපි සියක් සියක් කොට කුමරිවෙස් සියක් මවා ගන්නමෝ නම් යෙහෙකැයි මෙසේ සිතූහ.

ඉක්බිති තණ්හා අරති රගා ද යන මාරකන්‍යාවෝ (එකක් එකක්) සියක් සියක් කොට කුමරිවෙස් සියක් (තුන්සියක් විලස්) මවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට "මහණ, මුබ පා හමුයෙහි මෙහෙ කරමෝ ව"යි මෙය කියූහ. භාග්‍යවතුන් වහන්සේ යම් සෙයින් අනුත්තර නිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙනෙහි නො කෙරේ ද එසෙයින් එ ද නොමෙනෙහි කළ සේක.

ඉක්බිති තණ්හා අරති රගා ද යන මරදූහු එකත්පසකට ඉවත් ව පුරුෂයන්ගේ අදහස් විසිතුරුය. අපි සියක් සියක් නොවැදූ ඉතිරින් වෙස් සියක් මවා ගන්නමෝ නම් මැනවැයි මෙසේ සිතූහ.

ඉක්බිති තණ්හා අරති රගාද යන මරදූහු එක්සිය එක්සිය නොවැදූ ඉතිරින්වෙස් සියක් මවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට "මහණ, මුබගේ පා හමුයෙහි මෙහෙවර කරමෝ ව"යි මෙය කියූහ. භාග්‍යවතුන් වහන්සේ යම් සෙයින් අනුත්තර නිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙනෙහි නො කෙරේ ද එසෙයින් එ ද නො මෙනෙහි කළ සේක.

අථ ඛො තණ්හා ච -පෙ- සම්බහුලා: යන්නූන මයං එකසතං එකසතං සකිං විජාතවණ්ණසතං අභිනිම්මිනෙය්‍යාමාති.

අථ ඛො තණ්හා ච -පෙ- සකිං විජාතවණ්ණසතං අභිනිම්මිනිත්වා යෙන භගවා -පෙ- අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

අථ ඛො තණ්හා ච -පෙ- යන්නූන මයං -පෙ- දුවිජාතවණ්ණසතං අභිනිම්මිනෙය්‍යාමාති.

අථ ඛො තණ්හා ච -පෙ- දුවිජාතවණ්ණසතං අභිනිම්මිනිත්වා යෙන භගවා -පෙ- අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

අථ ඛො තණ්හා ච -පෙ- යන්නූන මයං -පෙ- මජ්ඣිමිත්ථිවණ්ණසතං අභිනිම්මිනෙය්‍යාමාති.

අථ ඛො තණ්හා ච -පෙ- මජ්ඣිමිත්ථිවණ්ණසතං අභිනිම්මිනිත්වා යෙන භගවා -පෙ- අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

අථ ඛො තණ්හා ච -පෙ- යන්නූන මයං -පෙ- මහිත්ථිවණ්ණසතං අභිනිම්මිනෙය්‍යාමාති.

අථ ඛො තණ්හා ච -පෙ- මහිත්ථිවණ්ණසතං අභිනිම්මිනිත්වා යෙන භගවා -පෙ- අනුත්තරෙ උපධිසඞ්ඛයෙ විමුත්තො.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො එකමන්තං අපක්කම්ම එතදවොචුං: සච්චං කිර නො පිතා අවොච:

"අරහං සුගතො ලොකෙ න රාගෙන සුවානයො
මාරධෙය්‍යං අතික්කන්තො තස්මා සොචාමහං භුසං"න්ති.

යං හි මයං සමණං වා බ්‍රාහ්මණං වා අවීතරාගං ඉමිනා උපක්කමෙන උපක්කමෙය්‍යාම හදයං වාස්ස ඵලෙය්‍ය. උණ්හං වා ලොහිතං මුඛතො උග්ගච්ඡෙය්‍ය. උම්මාදං වා පාපුණෙය්‍ය චිත්තවික්ඛෙපං වා. සෙය්‍යථා[1] වා පන නළො හරිතො ලුතො උස්සුස්සති විසුස්සති මිලායති, එවමෙව උස්සුස්සෙය්‍ය විසුස්සෙය්‍ය මිලායෙය්‍යාති.

අථ ඛො තණ්හා ච අරතී රගා ච මාරධීතරො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තණ්හා මාරධීතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

1 සෙය්‍යථාපි - සිමු 1. ස්‍යා.

ඉක්බිති තණ්හා ... අපි සියක් සියක් කොට එක්වර වැදූ ඉතිරින්වෙස් සියක් මවා ගන්නමෝ නම් මැනවැයි සිතූහ.

ඉක්බිති තණ්හා ... එක්වර වැදූ ඉතිරින්වෙස් සියක් මවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත ... යම් සෙයින් අනුත්තර නිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙතෙහි නො කෙරේ ද එසෙයින් එ ද නොමෙනෙහි කළ සේක.

ඉක්බිති තණ්හා ... අපි ... දෙවර වැදූ ඉතිරින්වෙස් සියක් මවා ගන්නමෝ නම් මනාමැනුයි.

ඉක්බිති තණ්හා ... දෙවර වැදූ ඉතිරින්වෙස් සියක් මවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත ... යම් සෙයින් අනුත්තර නිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙතෙහි නො කෙරේ ද එසෙයින් එ ද නොමෙනෙහි කළ සේක.

ඉක්බිති තණ්හා ... අපි ... මැදුම්විය ඉතිරින්වෙස් සියක් මවා ගන්නමෝ නම් මනාමැනුයි

ඉක්බිති තණ්හා ... මැදුම්විය ඉතිරින්වෙස් සියක් මවා ගෙණ භාග්‍ය-වතුන් වහන්සේ වෙත ... යම් සෙයින් අනුත්තර නිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙතෙහි නො කෙරේ ද එසෙයින් එ ද නො මෙනෙහි කළ සේක.

ඉක්බිති තණ්හා ... අපි ... වයසින් වැඩුනු ඉතිරින්වෙස් සියක් මවා ගන්නමෝ නම් මැනවැයි.

ඉක්බිති තණ්හා ... වයසින් වැඩුනු ඉතිරින්වෙස් සියක් මවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත ... යම් සෙයින් අනුත්තර නිවණෙහි ලා මිදුනෙක් (නිවන්හි ඇලුනු පලසමවත් ඇතියෙක්) මෙතෙහි නො කෙරේ ද එසෙයින් එද නොමෙනෙහි කළ සේක.

ඉක්බිති තණ්හා අරති රගා ද යන මරදූහු එකත්පසකට ඉවත්ව මෙසේ කියූහ. අපගේ පිය තෙමේ සැබැවක් කීයේ ම ය.

"සුගත තෙමේ ලෝකයෙහි අර්හත් ය. රාගයෙන් බැඳ නොගෙණිය හැක්කේ ය. මාර විෂය ඉක්ම වූයේ ය. එහෙයින් මම අතිශයින් සිතිවිලි සිතමි"යි.

අපි පහ නොවූ රාග ඇති යම් මහණකු හෝ බමුණකු හෝ වෙත මේ උපක්‍රමයෙන් එළඹෙන්නමෝ නම් ඔහුගේ ලය හෝ පැළෙන්නේ ය. මුවෙන් උණුලේ හෝ නැඟෙන්නේය. උමතුවට හෝ සිත් පෙරළියට හෝ පැමිණෙන්නේ ය. සිඳින ලද නිල්වන් බටනයෙක් යම්සේ වියළේ ද, වෙසෙසින් වියළේ ද, මැලවේ ද, එසෙයින් ම වියළෙන්නේය වෙසෙසින් වියළෙන්නේය මැලවෙන්නේය යි.

ඉක්බිති තණ්හා අරති රගා ද යන මරදූහු භාග්‍යවතුන් වහන්සේ වෙතූ එළඹියහ. එළඹ එකත්පසෙක සිටියහ. එකත් පසෙක සිටි තණ්හා මර දූ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කිවුය:

සොකාවතිණ්ණො නු වනම්හි ඣායසි විත්තං නු ජිනො උද පත්ථයානො
ආගුං නු ගාමස්මිමකාසි කිඤ්චි කස්මා ජනෙන න කරොසි සක්ඛිං
සක්ඛී න සම්පජ්ජති කෙනචි තෙති.

[භගවා:]

අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං ජෙත්වාන සෙනං පියසාතරූපං
එකාහං ඣායං සුඛමනුබොධිං තස්මා ජනෙන න කරොමි සක්ඛිං
සක්ඛී න සම්පජ්ජති කෙනචි මෙති.

අථ ඛො **අරති** මාරධීතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කථං විහාරී බහුලොධ භික්ඛු පඤ්චොඝතිණ්ණො අතරී ධ ඡට්ඨං,
කථං ඣායිං බහුලං කාමසඤ්ඤා පරිබාහිරා හොන්ති අලද්ධ යො තන්ති.

[භගවා:]

පස්සද්ධකායො සුවිමුත්තචිත්තො අසඞ්ඛාරානො සතිමා අනොකො,
අඤ්ඤාය ධම්මං අවිතක්කඣායී න කුප්පති න සරති න ථිනො.

එවංවිහාරී බහුලොධ භික්ඛු පඤ්චොඝතිණ්ණො අතරීධ ඡට්ඨං,
එවං ඣායිං බහුලං කාමසඤ්ඤා පරිබාහිරා හොන්ති අලද්ධ යො තන්ති.

අථ ඛො **රගා** මාරධීතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

අච්ඡෙජ්ජ තණ්හං ගණසඞ්ඝචාරී අද්ධා චරිස්සන්ති බහූ ච සත්තා,
බහුං වතායං ජනතං අනොකො අච්ඡෙජ්ජ නෙස්සති මච්චුරාජස්ස පාරන්ති.

[භගවා:]

නයන්ති වෙ මහාවීරා සද්ධම්මෙන තථාගතා
ධම්මෙන නයමානානං කා උසූයා විජානතන්ති.

අථ ඛො තණ්හා ච අරතිරගා ච මාරධීතරො යෙන මාරො පාපිමා තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො මාරො පාපිමා තණ්හඤ්ච අරතිඤ්ච රගඤ්ච මාරධීතරො දූරතොව ආගච්ඡන්තියො දිස්වාන ගාථාහි අජ්ඣභාසි:

බාලා කුමුදනාලෙහි පබ්බතං අභිමන්ථථ
ගිරිං නඛෙන ඛණථ අයො දන්තෙහි ඛාදථ.

සෙලංව සිරසූහච්ච[2] පාතාලෙ ගාධමෙසථ
ඛාණුංව උරසාසජ්ජ නිබ්බිජ්ජාපෙථ ගොතමාති.[3]

1. අභිමත්ථථ - මජසං. PTS. 2. සිරසි ඌහච්ච - සීමු. 3. "ඉදමවොචාති" සඞ්ගීතිකාරා දෙසනං නිට්ඨපෙන්තීති - අට්ඨකථා.

ශෝකයට බටුයෙහි ද? වෙනෙහි සිතිවිලි සිතහි ද? වස්තුවක් පැරදුනෙහි ද? වැලි පතමින් (හිඳහි ද?) ගම්හි කිසියම් අපරාධයක් කෙළෙහි ද? කුමක් හෙයින් මහජනයා සමග මිත්‍රභාවය නොකෙරෙහි ද? කිසිවකු හා මුඹගේ මිත්‍රභාවයෙක් නොසැපයේ ද?

[භගවත්හු:]

මම ප්‍රියස්වරූප සාතස්වරූප ඇති කෙලශසේනාව දිනා හුදෙකලාව ධ්‍යාන කෙරෙමින් අභිමතාර්ථයාගේ පැමිණීම වූ ද, හෘදයශාන්තිය වූ ද රහත්ඵල සුවය අවබොධ කෙළෙමි. එබැවින් මහාජනයා සමග මිත්‍රභාවය නො කරමි. කිසිවකු හා මාගේ මිත්‍රභාවයෙක් නො සැපයේ.

ඉක්බිති අරති මරදු භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කිවුය.

මෙසස්නෙහි කෙබඳු විහරණයක් බහුල කොට ඇති මහණ තෙම තරණය කළ පඤ්චද්වාරික ක්ලේශඕඝ ඇත්තේ (මනොද්වාරික වූ) සවන ක්ලේශඕඝය තරණය කෙළේ ද? කාමසංඥාවෝ කෙබඳු ධ්‍යානයක් බහුල කොට ඇත්තා වූ ඔහු නොලබා හාත්පසින් බැහැර වෙද්ද ද?

[භගවත්හු:]

සන්හුන් කය ඇති මොනවට මිදුනු සිත් ඇති කම් රැස් නොකරණ සිහි ඇති ආලය නැති (රහත් තෙමේ) දහම් දැන විතර්ක රහිත ධ්‍යානයෙහි යෙදුනේ නො කිපෙයි. (රාග වශයෙන්) සිහි නොකෙරෙයි. (මොහ වශයෙන්) හැකුලුනේ නොවෙයි

මෙහි එබඳු විහරණ බහුල කොට ඇති මහණ තෙමේ තරණය කළ පඤ්චද්වාරික ක්ලේශඕඝ ඇත්තේ මේ ලෝකයෙහි (මනොද්වාරික වූ) සවන ක්ලේශඕඝය තරණය කෙළේ ය. කාම සංඥාවෝ මෙසේ ධ්‍යාන බහුල කොට ඇති ඔහු නොලැබ හාත්පසින් බැහැර වෙත්.

ඉක්බිති රගා මර දූ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කිවුය.

ගණයා කෙරෙහිත් සමූහයා කෙරෙහිත් හැසිරෙණ මෙ ශාස්තෘ තෙමේ තෘෂ්ණාව සින්දේ ය. බොහෝ සත්ත්වයෝ ද එකතින් තෘෂ්ණාව සිඳින්නාහ. ආලය නැති මේ ශාස්තෘ තෙමේ බොහෝ ජන සමූහයක් මාරයා අතින් පැහැර ගෙණ පරතෙරට පමුණුවන්නේ ය.

[භගවත්හු:]

මහාවීර වූ තථාගතවරයෝ සද්ධර්මයෙන් සත්ත්වයන් එතෙර කෙරෙත්. නුවණැතියන් ධර්මයෙන් එතෙර කරණ කල්හි කවර ඊර්ෂ්‍යාවෙක් ද?

ඉක්බිති තණ්හා අරති රගා ද යන මරදූහු කෘෂ්ණ මාරයා වෙත එළඹියහ. කෘෂ්ණ මාර තෙමේ දුරදී ම එන්නා වූ තණ්හාව හා අරතිය හා රගා ද යන මරදූන් දැක්කේ ය. දැක ගාථාවන්ගෙන් කී ය.

බල්දරුයෙනි, හෙළලපුල්දඬුයෙන් පර්වතයක් අළලවූ ද? මහගලක් නියෙන් කණිවූ ද? දතින් යකඩ කවූ ද?

මහගලක් හිසමතුයෙහි තබා ගෙණ ගැඹුරෙහි පිහිටක් සොයවූ ද? ලයෙහි හුලක් හැනගෙන මෙන් ගෞතමයන් කෙරෙන් කලකිරී පහ ව අවූ ය?

[ථෙරා:]

දද්දල්ලමානා ආගඤ්ඡුං තණ්හා ච අරතීරගා
තා තත්ථ පනුදී සත්ථා තූලං භට්ඨංව මාළුතොති.

මාරවග්ගො තතියො.

තස්සුද්දානං:

සම්බහුලා සමිද්ධි ච ගොධිකං සත්තවස්සානි ධීතරං
දෙසිතං බුද්ධසෙට්ඨෙන ඉමං මාරපඤ්චකන්ති.

මාරසංයුත්තං සමත්තං.

---

5. භික්ඛුනීසංයුත්තං.

1. භික්ඛුනීවග්ගො.

5. 1. 1.

ආළවිකාසුත්තං.

162. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

අථ ඛො **ආළවිකා** භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **සාවත්ථිං** පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන **අන්ධවනං** තෙනුපසඞ්කමි විවෙකත්ථිනී.

අථ ඛො මාරො පාපිමා ආළවිකාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො විවෙකම්හා චාවෙතුකාමො යෙන ආළවිකා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආළවිකං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

නත්ථි නිස්සරණං ලොකෙ කිං විවෙකෙන කාහසි,
භුඤ්ජස්සු කාමරතියො මාහු පච්ඡානුතාපිනීති.

අථ ඛො ආළවිකාය භික්ඛුනියා එතදහොසි: 'කො නුඛ්වායං[1] මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතී'ති? අථ ඛො ආළවිකාය භික්ඛුනියා එතදහොසි: 'මාරො ඛො අයං පාපිමා මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො විවෙකම්හා චාවෙතුකාමො ගාථං භාසතී'ති. අථ ඛො ආළවිකා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:[2]

---

1. ඛො අයං - සයා 2. අජ්ඣභාසි - සයා.

[තෙරහු:]

තණ්හා අරති රගා ද යන මරදූහු අතිශයින් දිලිසෙමින් ආවාහු ය. එහි දී ශාස්තෲන් වහන්සේ ඔවුන් නෙරූ සේක. කෙසේ ද යත්: වාතය තෙමේ ගිලිහුනු පිලිනක් නෙරෙන්නාක් සෙයිනි.

මාර වර්ගය තෙවෙනි යි.

එහි උද්දානය:

සම්බහුල, සමිද්ධි, ගොධික, සත්තවස්ස, ධීතර ය යි මේ මාර පඤ්චකය ශ්‍රෙෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරණ ලදී.

මාරසංයුත්තය නිමියේ ය.

---

5. භික්ඛුනීසංයුත්තය.

1. භික්ඛුනී වර්ගය.

5. 1. 1.

ආලවිකාසූත්‍රය.

162. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඩු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක.

එකල්හි **ආලවිකා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්**නුවරට පිඩු පිණිස පිවිසි යා ය. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනී විවේකය කැමැත්තී **අන්ධවනය** වෙත එළඹියා ය.

එකල පවිටු මරු ආලවිකා මෙහෙණට බිය තැති ගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ විවේකයෙන් පහ කරණු කැමැත්තේ ආලවිකා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ ආලවිකා මෙහෙණට ගාථායෙන් කී ය:

ලොව නිවණෙක් නැත. විවේකයෙන් කුමක් කරන්නෙහි ද, කාමරතීන් විඳුව, නහමක් පසුතැවිලි වව.

ඉක්බිති ආලවිකා මෙහෙණහට 'මේ කවරෙක් දෝ මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ ගාථාව කියා දැ'යි මේ අදහස විය. ඉක්බිති ආලවිකා මෙහෙණහට 'මේ පවිටු මාර තෙමේ මට බිය තැති ගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ විවේකයෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා'යි මේ අදහස විය එකල්හි ආලවිකා මෙහෙණ මෙ පවිටු මරු යයි දැන පවිටු මරුට ගාථාවන්ගෙන් පෙරළා කිවු ය:

අත්ථි නිස්සරණං ලොකෙ පඤ්ඤාය මෙ සුඵස්සිතං,[1]
පමත්තබන්ධු පාපිම න ත්වං ජානාසි තං පදං.

සත්තිසූලූපමා කාමා ඛන්ධාසං අධිකුට්ටනා,
යං ත්වං කාමරතිං බ්‍රෑසි අරති මය්හං[2] සා අහූති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං **ආළවිකා** භික්ඛුනීති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

5. 1. 2.

සොමාසුත්තං.

163. **සාවත්ථියං**—

අථ ඛො **සොමා** භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **සාවත්ථිං** පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තා යෙන **අන්ධවනං** තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං[3] නිසීදි.

අථ ඛො මාරො පාපිමා සොමාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන සොමා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සොමං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

යත්තං ඉසීහි පත්තබ්බං ඨානං දුරභිසම්භවං,
න තං ද්වඞ්ගුලපඤ්ඤාය සක්කා පප්පොතුමිත්ථියාති.

අථ ඛො සොමාය භික්ඛුනියා එතදහොසි: 'කො නු ඛ්වායං[4] මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතී'ති. අථ ඛො සොමාය භික්ඛුනියා එතදහොසි: 'මාරො ඛො අයං පාපිමා මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතී'ති. අථ ඛො සොමා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි අජ්ඣභාසි:

ඉත්ථිභාවො කිං කයිරා චිත්තම්හි සුසමාහිතෙ,
ඤාණම්හි වත්තමානම්හි සම්මා ධම්මං විපස්සතො.

යස්ස නූන සියා එවං ඉත්ථාහං[5] පුරිසොති වා,
කිඤ්චි වා පන අඤ්ඤස්මිං තං මාරො වත්තුමරහතීති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං සොමා භික්ඛුනීති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

1. සුඵුස්සිතං - මජසං. සහා. PTS. 2. මයන - මජසං. සහා. සී 1. 3. දිවාවිහාරත්ථාය - සීමු. 2. PTS. 4. නු ඛො අයං. - සහා. 5. ඉත්ථීහං. - සහා. 6. අඤ්චිති — සහාළු.

ලොව නිවණෙක් ඇත. මා විසින් (පස්විකන) නුවණින් දක්නා ලදී. පව්ටු මරුව, තෝ ඒ නිවන්පදය නොදනිහි.

කාමයෝ අඩයටි හුල් වැන්නහ. සකන්ධයෝ මොවුන්ට මස්ලොබු වැන්නහ. තෝ යම් කාමරතියක් කියහි ද, එය මට අරතියෙක් වි ය.

ඉක්බිති පව්ටු මරු ආලවිකා මෙහෙණ මා දනිති සි දුකට පැමිණියේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් වි ය.

5. 1. 2.

සොමාසූත්‍රය.

163. **සැවැත්නුවර**---

එකල්හි **සෝමා** මෙහෙණ පෙරවරු හැද පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්**නුවරට පිඬු පිණිස පිවිසියා ය. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹුනී ය. අන්ධවනයට පිවිස එක්තරු ගසක්මුල දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පව්ටු මරු සෝමා මෙහෙණට බිය තැතිගැණුම් ලොමු-දහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් තොර කරණු කැමැත්තේ සොමා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ සොමා මෙහෙණට ගාථායෙන් කී ය:

ඉසිවරුන් විසින් ලැබියයුතු දුලබ වූ යම් ඒ පදවියෙක් වේ ද, එය දෑහුල්නුවණ ඇති ස්ත්‍රිය විසින් නොලැබිය හැක්ක.

ඉක්බිති සෝමා මෙහෙණට 'මේ කවරෙක් දෙ මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ ගාථාව කියා දැ'යි මේ අදහස වි ය. එකල්හි සෝමා මෙහෙණට 'මේ පව්ටු මරු ය. මට බිය තැතිගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා' යී මේ අදහස වි ය.

සිත මැනවින් සමාධිගත වූ කල්හි නුවණ පවත්නා කල්හි මනා කොට දහම දක්නහුට ඉතිරිබව කුමක් කරන්නේ ද? මම ස්ත්‍රියක් මූ යි හෝ පුරුෂයෙක් මියි හෝ අන් කිසිවෙකිම් වෙමි යි හෝ යමකුට මෙසේ අදහස් වන්නේ නම් මාර තෙමේ ඔහුට කියන්නට සුදුසු වෙයි.

ඉක්බිති පව්ටු මාර තෙමේ **සෝමා** මෙහෙණ මා දනිති යි දුකට පැමිණියේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් වි ය.

5. 1. 3.

ගොතමීසුත්තං.

164. සාවත්ථියං—

අථ ඛො කිසාගොතමී භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්ත-චීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡා-භත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා කිසාගොතමියා භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන කිසාගොතමී භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කිසාගොතමිං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

කින්නු ත්වං හතපුත්තාව එකමාසි[1] රුදම්මුඛී,
වනමජ්ඣගතා එකා පුරිසං නු ගවෙසසීති.

අථ ඛො කිසාගොතමියා භික්ඛුනියා එතදහොසි: කො නුඛ්වායං මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතී ති. අථ ඛො කිසාගොතමියා භික්ඛුනියා එතදහොසි: මාරො ඛො අයං පාපිමා මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතීති. අථ ඛො කිසාගොතමී භික්ඛුනී මාරො ඛො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:[2]

අච්චන්තං මතපුත්තා'ම්හි[3] පුරිසා එතදන්තිකා,
න සොචාමි න රොදාමි න තං භායාමි ආවුසො.

සබ්බත්ථ විහතා[4] නන්දි තමොක්ඛන්ධො පදාලිතො,
ජෙත්වාන මච්චුනො[5] සෙනං විහරාමි අනාසවාති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං කිසාගොතමී භික්ඛුනීති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

5. 1. 4.

විජයා සුත්තං

165 සාවත්ථියං—

අථ ඛො විජයා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා විජයාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන විජයා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා විජයං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

---

1. එකමාසී – සීමු. 1. සයා. 2 අජ්ඣභාසි – සයා. 3. හතපුත්තම්හි – සයා. PTS සී 1
4 විහිතා – සයා. 5. ජෙත්වා නමුචිනො – සීමු. 1

5. 1. 3.

ගොතමීසූත්‍රය.

164. **සැවැත්නුවර**—

එකල **කිසාගොතමී** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පා සිවුරු ගෙණ **සැවැත්නුවරට** පිඬු පිණිස පිවිසිනී ය. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹිනී ය. අන්ධවනයට වැද එක්තරා ගසක්මුල දිවාවිහරණය පිණිස හුන.

එකල්හි පවිටු මාර තෙමේ කිසාගෝතමී මෙහෙණට බිය තැතිගැණුම ලොමුදහගැණුම උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ කිසාගෝතමී මෙහෙණ වෙත එළඹින. එළඹ කිසාගෝතමී මෙහෙණට ගාථායෙන් කිය:

කිම, තෝ මළපුතුන් ඇති කඳුළු මුසු මුහුණැතියක සෙයින් එකලා ව හිඳිහි ද? කිම, එකලා ව වනමැදට පැමිණි තෝ පුරුෂයකු සොයයි ද?

එකල කිසාගෝතමී මෙහෙණට 'මේ කවරෙක් දෝ, මිනිසෙක් හෝ නො මිනිසෙක් හෝ ගාථාව කියා ද'යි මේ අදහස විය. ඉක්බිති කිසා-ගොතමී මෙහෙණට 'මේ පවිටු මරු ය. මට බිය තැතිගැණුම් ලොමු දහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා' යි මේ සිත විය. ඉක්බිති කිසාගෝතමී මෙහෙණ මේ පවිටු මරු යයි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් පෙරළා කිවු ය.

අත්‍යන්ත කොට මළපුතුන් ඇත්තියකිම් වෙමි. ස්වාමිපුරුෂයෝ ද එත දන්තයහ. (පුත්‍රාන්තය සේ ම තෙලෙකින් පුරුෂයන්ගේ අන්තය ද ඇත.) ශෝක නොකරමි. නො හඬමි. ඇවැත්නි, තට නො බිමි.

හැමතන්හි තෘෂ්ණාව නසන ලදු. අඳුරුකඳ බිඳින ලදී. මරසෙන් දිනා නිකෙලෙස් ව වෙසෙමි.

ඉක්බිති පවිටු මරු **කිසාගෝතමී** මෙහෙණ මා දනිතියි දුකට පැමිණියේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් වීය.

5. 1. 4.

විජයා සූත්‍රය.

165. **සැවැත්නුවර**—

එකල්හි **විජයා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්නුවරට** පිඬු පිණිස පිවිසිනී ය. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹුනු. අන්ධවනයට පිවිස එක්තරා රුකක්මුල දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පවිටු මරු විජයා මෙහෙණට බිය තැතිගැණුම් ලොමු දහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ විජයා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ විජයා මෙහෙණට ගාථායෙන් කී ය:

දහරා ත්වං රූපවතී අහඤ්ච දහරො සුසු,
පඤ්චඞ්ගිකෙන තුරියෙන එහය්‍යෙභිරමාමසෙති[1]

අථ ඛො විජයාය භික්ඛුනියා එතදහොසි: 'කො නු ඛ්වායං[2] මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතී'ති අථ ඛො විජයාය භික්ඛුනියා එතදහොසි: 'මාරො ඛො අයං පාපිමා මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතී'ති. අථ ඛො විජයා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:[3]

රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා,
නිය්‍යාතයාමි තුය්හෙව[4] මාර නාහං තෙනත්ථිකා[5].

ඉමිනා පූතිකායෙන භින්දනෙන පභඞ්ගුනා,
අට්ටීයාමි[6] හරායාමි කාමතණ්හා සමූහතා.

යෙ ච රූපූපගා සත්තා යෙ ච ආරුප්පට්ඨායිනො[7],
යා ච සන්තා සමාපත්ති සබ්බත්ථ විහතො තමොති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං විජයා භික්ඛුනීති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

5. 1. 5.

උප්පලවණ්ණාසුත්තං.

166. **සාවත්ථියං**—

අථ ඛො **උප්පලවණ්ණා** භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **සාවත්ථිං** පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන **අන්ධවනං** තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං සුපුප්ඵිතසාලරුක්ඛමූලෙ අට්ඨාසි.

අථ ඛො මාරො පාපිමා උප්පලවණ්ණාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන උප්පලවණ්ණා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උප්පලවණ්ණං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

සුපුප්ඵිතග්ගං උපගම්ම භික්ඛුනී එකා ත්වං තිට්ඨසි සාලමූලෙ,
න චත්ථි තෙ දුතියා වණ්ණධාතු ඉධාගතා තාදිසිකා භවෙය්‍යුං
බාලෙ න ත්වං භායසි ධුත්තකානන්ති.

අථ ඛො උප්පලවණ්ණාය භික්ඛුනියා එතදහොසි: 'කො නු ඛ්වායං මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතී'ති. අථ ඛො උප්පලවණ්ණාය භික්ඛුනියා එතදහොසි: 'මාරො ඛො අයං පාපිමා මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතී'ති. අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:[8]

---

1. එහි අය්‍යෙ රමාමසෙ - සීමු 1. රමාමිහසෙ - සතා. 2. ඛො අයං - PTS. 3. අජ්ඣභාසි - සීමු 1. සී1.2. 4. තුම්හෙව. -PTS. 5. නත්ථි තෙන අත්ථිකා - සතා. STP 6. අට්ටියාමි - සීමු 2. සතා, PTS. 7. අරූපට්ඨායිනො - මජසං. අරූපනායිනො. - සතා. ආරුප්පට්ඨායිනො - PTS. 8. අජ්ඣභාසි - සතා

අරිඳුවනියෙහි, නෙපි සුරූපි ලඳුරියනු. මම ද යොව්නෙහි සිටුනා ලඳරුයෙමි. එව පසඟතුරුයෙන් අභිරමණය කරමු.

එකල විජයා මෙහෙණට 'මේ කවරෙක් ද? මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ ගාථාව කියා ද සි' මේ අදහස විය. ඉක්බිති විජයා මෙහෙණහට 'මේ පවිටු මරු ය. මට බිය තැතිගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා' යි මේ සිත විය. එකල විජයා මෙහෙණ පවිටු මරු යයි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් පෙරළා කිවූ ය:

මරුව, සිත්කලු රූපයෝ ද ශබ්දයෝ ද ගන්ධයෝ ද රසයෝ ද ස්‍ප්‍රෂ්ටව්‍යයෝ ද (වෙත් නම් ඒ සියල්ල) තට ම දක්වා දෙමි. මම එයින් වැඩ ඇතියකිම් නො වෙමි.

බිඳෙනසුලු වැනසෙනසුලු මේ කුණුකයින් පීඩිත වෙමි. ලජ්ජිතයෙමි. කාමතෘෂ්ණාව (මා විසින්) නසන ලද්දී ය.

රූපභවයට (උත්පත්ති වශයෙන්) එළඹි යම් සත්ත්ව කෙනෙක් වෙද් ද, අරූපභවයෙහි සිටුනා යම් සත්ත්ව කෙනෙකුත් වෙද් ද, යම් ශාන්ත වූ ලෞකික සමාපත්තියෙකුත් වේ ද, ඒ සියල්ලෙහි (මූලාබව නමැති) අඳුර (මා විසින්) නසන ලදී.

එකල්හි පවිටු මරු විජයා මෙහෙණ මා දනිති යි දුකට පත් වූයේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

5. 1. 5

උප්පලවණ්ණාසුත්‍රය.

166. **සැවැත්නුවර—**

එකල්හි **උප්පලවණ්ණා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්නුවරට** පිඬු පිණිස පිවිසිනී ය. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස අන්ධවනයට එළඹුන. අන්ධවනයට පිවිස එක්තරා සුපිපි සල්රුකක්මුල සිටියා. ඉක්බිති පවිටු මාර තෙමේ උප්පලවණ්ණා මෙහෙණට බිය තැතිගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ උප්පලවණ්ණා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ උප්පලවණ්ණා මෙහෙණට ගාථායෙන් කි ය:

මෙහෙණ, නො අග පටන් සුපිපි සල්රුකක් වෙත එළඹ ඒ සල්රුක මුල එකලා ව සිටිහි. තිගේ පැහැසටහන් සා දෙවන පැහැසටහනෙක් ද නැත. මෙහි පැමිණි අන්හු ද තොප වැන්නාහුය. (තොපසෙයිත් සැඟ හා සෙනෙහස නැතියහ) බාලාවෙනි. හෝ සලෙලුනට නො බිහි ද?

ඉක්බිති උප්පලවණ්ණා මෙහෙණට 'මේ කවරෙක් ද? මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ ගාථාව කියා ද'යි මේ සිත වි ය. එකල්හි උප්පලවණ්ණා මෙහෙණට 'මේ පවිටු මරු ය. මට බිය තැතිගැණුම් ලොමුදහ ගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා' ය යි මේ අදහස විය. එකල්හි උප්පලවණ්ණා මෙහෙණ මේ පවිටු මරු යයි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් පෙරළා කිවූ ය:

සතං සහස්සානිපි ධුත්තකානං ඉධාගතා තාදිසිකා[1] භවෙය්‍යුං,
ලොමං න ඉඤ්ජාමි න සන්තසාමි න මාර භායාමි තමෙකිකාපි.

එසා අන්තරධායාමි කුච්ඡිං වා පවිසාමි තෙ,
පඛුමන්තරිකායම්පි තිට්ඨන්තිං මං න දක්ඛසි.

චිත්තස්මිං වසීභූතාමහි ඉද්ධිපාදා සුභාවිතා,
සබ්බබන්ධනමුත්තාමහි න තං භායාමි ආවුසොති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං උප්පලවණ්ණා භික්ඛුනීති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

5. 1. 6.

චාලාසුත්තං.

167. සාවත්ථියං—

අථ ඛො චාලා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා යෙන චාලා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චාලං භික්ඛුනිං එතදවොච:

කින්නු[2] ත්වං භික්ඛුනී න රොචෙසීති.

[චාලාභික්ඛුනී:]
ජාතිං ඛ්වාහං ආවුසො න රොචෙමීති.

[මාරො:]
කින්නු ජාතිං න රොචෙසි ජාතො කාමානි භුඤ්ජති,
කො නු තං ඉදමාදපයි ජාතිං මා රොච[3] භික්ඛුනීති.

[චාලාභික්ඛුනී:]
ජාතස්ස මරණං හොති ජාතො දුක්ඛානි ඵුස්සති[4],
බන්ධං වධං පරික්ලෙසං තස්මා ජාතිං න රොචයෙ.

බුද්ධො ධම්මමදෙසෙසි ජාතියා සමතික්කමං,
සබ්බදුක්ඛප්පහාණාය යො මං[5] සච්චෙ නිවෙසයි.

යෙ ච රූපූපගා සත්තා යෙ ච ආරුප්පට්ඨායිනො,
නිරොධං අප්පජානන්තා ආගන්තාරො පුනබ්භවන්ති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

5. 1. 7.

උපචාලාසුත්තං.

168. සාවත්ථියං—

අථ ඛො උපචාලා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

---

1. තාදිසකා - මජසං. 2. කින්නු ඛො ත්වං - ස්‍යා. 3. රොචෙසි - සීමු 2. 4. ඵස්සති - සීමු. 1. ස්‍යා; 5. යොමං - මජසං. ස්‍යා.

තා වැනි ධූර්තයන් සියදහස්හු මෙහි පැමිණියාහු වෙත් ද, ලොමයකුත් නොසලමි. නො ම තැති ගනිමි. මාරය, එකලා වූ ද මම තට නො බිමි.

තෙල මම අතුරුදන් වෙමි. තොප කුසට හෝ පිවිසෙමි. දෙඇස අතුරෙහි නැගැවසවෙහි සිටුනා ද මා නො දකිහි.

සිතෙහි ලා වශී වෙමි. ඍද්ධිපාදයෝ මැනවින් වඩන ලදහ. සියලු බැම්මෙන් මිදුනිම් වෙමි ඇවැත, මම තට නො බිමි.

ඉක්බිති පවිටු මරු තෙමේ උප්පලවණ්ණා මෙහෙණ මා දනී යයි දුකට පත් වූයේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

5. 1. 6.

වාලාසූත්‍රය.

167. **සැවැත්නුවර—**

එකල්හි **වාලා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙ ව පාසිවුරු ගෙණ **සැවැත්නුවර**ට පිඩු පිණිස පිවිසිනී ය. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹුන. අන්ධවනයට පිවිස එක්තරා රුක්මුලෙක දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පවිටු මරු වාලා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ වාලා මෙහෙණහට මෙය කී ය.

මෙහෙණ, තෝ කුමක් නොරුස්නෙහි ද?

[වාලා මෙහෙණ:]

ඇවැත්නි, මම ජාතිය නො රුස්නෙමි.

[මරු:]

කුමක් හෙයින් ජාතිය නො රුස්නෙහි ද? උපන් තැනැත්තේ කම්සැප විඳී. මෙහෙණ, ජාතිය නුරුස්ව යන මේ දෘෂ්ටිය කවර අදබලෙක් තිට ගැන්වී ද?

[වාලා මෙහෙණ:]

උපන්නහුට මරණය වෙයි උපන් තැනැත්තේ බැඳුම් වද උවදුරු යන දුක් විඳී. එහෙයින් ජාතිය නො රුස්නෙමි.

යමෙක් මා සත්‍යයෙහි පිහිට වී ද, ඒ සම්බුදුයන් වහන්සේ ජාතිය ඉක්මවන දහම සියලු දුක් නැසීම පිණිස දෙසූ සේක.

රූපභවයට පැමිණි යම් සත්ත්ව කෙනෙක් වෙද් ද, අරූපභවයෙහි සිටින යම් සත්ත්ව කෙනෙකුත් වෙද්ද, නිවණ නො දත්තා ඔහු පුනර්භවයට පැමිණෙන සුලු වෙති.

ඉක්බිති පවිටු මරු තෙමේ ... එහි ම අතුරුදන් වි ය.

5. 1. 7.

උපචාලාසූත්‍රය.

168. **සැවැත්නුවර—**

එකල්හි **උපචාලා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්නුවර**ට පිඩු පිණිස පිවිසුන. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී **අන්ධවනය** වෙත දිවාවිහරණය පිණිස එළඹිනී ය. අන්ධවනයට පිවිස එක්තරා රුක්මුලෙක දිවාවිහරණය පිණිස හුන.

අථ ඛො මාරො පාපිමා යෙන උපචාලා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උපචාලං භික්ඛුනිං එතදවොච:

කත්ථ නු ත්වං භික්ඛුනී උපපජ්ජිතුකාමාති?

[උපචාලා:]

න ඛ්වාහං ආවුසො කත්ථචි උපපජ්ජිතුකාමාති.

[මාරො:]

තාවතිංසා ච යාමා ච තුසිතා චාපි දෙවතා,
නිම්මාණරතිනො දෙවා යෙ දෙවා වසවත්තිනො,
තත්ථ චිත්තං පණිධෙහි රතිං පච්චනුභොස්සසීති.

[උපචාලා:]

තාවතිංසා ච යාමා ච තුසිතා චාපි දෙවතා,
නිම්මාණරතිනො දෙවා යෙ දෙවා වසවත්තිනො,
කාමබන්ධනබද්ධා[1] තෙ එන්ති මාරවසං පුන.

සබ්බො ආදිපිතො[2] ලොකො සබ්බො ලොකො පධූපිතො,
සබ්බො පජ්ජලිතො ලොකො සබ්බො ලොකො පකම්පිතො.

අකම්පිතං අජලිතං[3] අපුථුජ්ජනසෙවිතං,
අගති යත්ථ මාරස්ස තත්ථ මෙ නිරතො මනොති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

5. 1. 8.

සීසූපචාලාසුත්තං*.

169. **සාවත්ථියං**—

අථ ඛො සීසූපචාලා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා යෙන සීසූපචාලා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සීසූපචාලං භික්ඛුනිං එතදවොච:

කස්ස නු ත්වං භික්ඛුනී පාසණ්ඩං රොචෙසීති?

[සීසූපචාලා:]

න ඛ්වාහං ආවුසො කස්සචි පාසණ්ඩං රොචෙමීති,

[මාරො:]

කින්නු උද්දිස්ස මුණ්ඩාසි සමණී විය දිස්සසි,
න ච රොචෙසි පාසණ්ඩං කිමිව[4] චරසි මොමූහාති.

---

* සිසපචාලා – සී 1, 2.

1. බන්ධා - ස්‍යා. 2. ආදිප්පිතො - සීමු 1. ආදීපිතො - ස්‍යා. 3. අපජ්ජලිතං - මජසං. ස්‍යා. PTS. 4. කිමිදං - ස්‍යා.

ඉක්බිති පවිටු මරු උපචාලා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ උපචාලා මෙහෙණට-

මෙහෙණ, තො කොහි උපදිනු කැමැත්තිහි ද යි මෙය කී ය.

[උපචාලාවෝ:]

ඇවැත්නි, මම කොහිදු උපදිනු නො කැමැත්තෙමි යි.

[මරු:]

තව්තිසා දෙවියෝ ය, යාම දෙවියෝ ය, තුසිත දෙවියෝ ය, නිම්මාණරතී දෙවියෝ ය, යම් වශවර්තී දෙවි කෙනෙක් වෙත් නම් ඔහු ය යන මොවුන් කෙරෙහි සිත පිහිටුව, පඤ්චකාමරතිය විඳුනෙහි ය.

තව්තිසා දෙවියෝ ය, යාම දෙවියෝ ය, තුසිත දෙවියෝ ය, නිම්මාණරතී දෙවියෝ ය, යම් වශවර්තී දෙවි කෙනෙක් වෙත් නම් ඔහු ය යන ඒ සියල්ලෝ පඤ්චකාමබන්ධනයෙන් බැඳුනාහු නැවත මාර වශයට පැමිණෙත්.

මුළුලොව ඇවිළුන මුළුලොව තැවින. මුළුලොව දිලියින. මුළුලොව වෙසෙසින් සැලින.

යමෙක් අකම්පිත ද, අචලිත ද, පුහුදුන් විසින් නො සෙවුනා ලද ද, යම් තැනෙක මරුට පිහිටෙක් නැද්ද, එහි (නිවණෙහි) මාගේ සිත ඇලුනේ ය.

ඉක්බිති පවිටු මාර තෙමේ ... එහි ම අතුරුදන් විය.

5. 1. 8.

සීසූපචාලා සූත්‍රය.

169. **සැවැත්නුවර—**

එකල්හි සීසූපචාලා මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ සැවැත්නුවරට පිඩු පිණිස පිවිසුන. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස අන්ධවනය වෙත එළඹුන. අන්ධවනයට බැසගෙන එක්තරු රුකක්මුල දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පවිටු මරු සීසූපචාලා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ සීසූපචාලා මෙහෙණනට මෙය කීය:

මෙහෙණ තො කවරකුගේ පාෂාණ්ඩය (දෘෂ්ටිය) ක් රුස්නෙහි ද?

[සීසූපචාලාවෝ:]

ඇවැත්නි, මම කිසිවකුගේ පාෂාණ්ඩයක් නො ම රුස්නෙමි.

[මරු:]

මෙහෙණක මෙන් පෙණෙහි. කවරකු උදෙසා මුඩු වූ යෙහි ද? පාෂාණ්ඩයක් නුරුස්නෙහි ද? කුමක් හෙයින් මුළා වූවක මෙන් හැසිරෙහි ද?

[සීසුපචාලා:]

ඉතො බහිද්ධා පාසණ්ඩා දිට්ඨීසු පසීදන්ති තෙ,
න තෙසං ධම්මං රොචෙමි න තෙ ධම්මස්ස කොවිදා.

අත්ථි සක්‍යකුලෙ ජාතො බුද්ධො අප්පටිපුග්ගලො,
සබ්බාභිභූ මාරනුදො සබ්බත්ථමපරාජිතො,
සබ්බත්ථ මුත්තො අසිතො[1] සබ්බං පස්සති චක්ඛුමා.

සබ්බකම්මක්ඛයං[2]පත්තො විමුත්තො උපධිසඞ්ඛයෙ,
සො මය්හං භගවා සත්ථා තස්ස රොචෙමි සාසනන්ති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

5. 1 9.

සෙලාසුත්තං.

170. **සාවත්ථියං**—

අථ ඛො **සෙලා** භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **සාවත්ථිං** පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන **අන්ධවනං** තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා සෙලාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන සෙලා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සෙලං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

කෙනිදං පකතං බිම්බං ක්වනු[3] බිම්බස්ස කාරකො,
ක්වනු[4] බිම්බං සමුප්පන්නං ක්වනු[3] බිම්බං නිරුජ්ඣතීති.

අථ ඛො සෙලාය භික්ඛුනියා එතදහොසි: කො නු ඛ්වායං මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතීති. අථ ඛො සෙලාය භික්ඛුනියා එතදහොසි: මාරො ඛො අයං පාපිමා. මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතීති. අථ ඛො සෙලා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:

නයිදං අත්තකතං[5] බිම්බං නයිදං පරකතං[6] අඝං,
හෙතුං පටිච්ච සම්භූතං හෙතුභඞ්ගා නිරුජ්ඣති.

යථා අඤ්ඤතරං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති,
පථවීරසඤ්ච[7] ආගම්ම සිනෙහඤ්ච තදූභයං.

එවං ඛන්ධා ච ධාතුයො ඡ ච ආයතනා ඉමෙ,
හෙතුං පටිච්ච සම්භූතා හෙතුභඞ්ගා නිරුජ්ඣරෙ.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

---

1 අසසිතො - සයා. 2. සබ්බකම්මක්ඛයං - මජසං. සයා, PTS. 3. කවනු. - මජසං. 4. කවඤ්ච - සිමු. කවචි - සයා. 5. නයිදං පකතං - සයා. 6. පකතං - සයා. 7. පථවිරසඤ්චාගම්ම - මජසං.

[සීසූපචාලාථෙරී:]

පාෂාණ්ඩයෝ මේ සස්නෙන් පිටත්හ. ඔහු මිථ්‍යාදෘෂ්ටීන්හි ගැලෙත්. ඔවුන්ගේ දහම නුරුස්නෙමි. ඔහු දහම්හි අදක්‍ෂයයහ.

ශාක්‍යවංශයෙහි උපන් සමාන පුද්ගලයන් නැති සියලු ස්කන්ධාදීන් මැඩ සිටියා වූ මරුන් නෙරූපූ සියලු තන්හි නො පැරදුනු සියලු තන්හි මිදුනු (තෘෂ්ණා දෘෂ්ටීන්) අනිඃශ්‍රිත වූ සර්‍වඥයන් වහන්සේ ඇති සේක. සියලු කර්‍මයන් ක්‍ෂය කිරීමට පැමිණි උපධිසඞ්ඛය සඞ්ඛ්‍යාත නිර්‍වාණයෙහි ලා මිදුනු පසැස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ සියල්ල දක්නා සේක. එ මාගේ ශාස්තෘන් වහන්සේ ය. උන්වහන්සේගේ සස්න රුස්නෙමි.

ඉක්බිති පවිටු මරු තෙමේ ... එහි ම අතුරුදන් විය.

5. 1. 9.

සේලා සූත්‍රය.

170. **සැවැත්නුවර—**

එකල්හි **සේලා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්නුවරට** පිඩු පිණිස පිවිසුනා ය. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹුනා ය. අන්ධවනයට පිවිස එක්තරා රුක්මූලෙක දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පවිටු මරු සේලා මෙහෙණහට බිය තැතිගැණුම් ලොමු-දහ ගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ සේලා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹී සෙලා මෙහෙණට ගාථායෙන් කී ය:

මේ අත්බව කවරකු විසින් කරණ ලද ද? මේ අත්බැව්හි කාරකයා කවරේ ද? මේ අත්බව කුමක් නිසා උපත්තේ ද? මේ අත්බව කෙසේ නිරුද්ධ වේ ද ?

එකල්හි සේලා මෙහෙණට 'මේ කවරෙක් ද' මිනිසෙක් හෝ නොමිනි-සෙක් හෝ ගාථාව කියා ද"යි මේ අදහස විය. එකල්හි සෙලා මෙහෙණට 'මේ පවිටු මරු ය. මට බිය තැති ගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා'යි මේ අදහස විය. ඉක්බිති සෙලා මෙහෙණ මේ පවිටු මරු යයි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් පෙරළා කිවුය:

මේ අත්බැව තමා විසින් කරණලද්දෙක් නොවේ. මේ දුකට පිහිට වූ අත්බව මෙරමා විසින් කරණලද්දෙක් ද නොවේ. හේතුව නිසා හට ගත්තේ ය. හේතුව බිඳීමෙන් නිරුද්ධ වේ.

කෙතෙහි වපුළ යම්කිසි බිජුවටෙක් පොළෝරසය ද ජලය ද යන ඒ දෙක ලැබගෙන යම්සේ අකුරු නගා ද?

එසෙයින් ම ස්කන්ධයෝ ද, ධාතුහු ද, ෂඩායතනයෝ ද යන මොහු හේතුව නිසා හට ගත්තෝ ය. හේතුභඞ්ගයෙන් නිරුද්ධ වෙත්.

ඉක්බිති පවිටු මරු තෙමේ ... එහි ම අතුරුදන් විය.

5. 1. 10

වජිරාසුත්තං.

171. **සාවත්ථියං**[1]—

අථ ඛො **වජිරා** භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **සාවත්ථිං** පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන **අන්ධවනං** තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා වජිරාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන වජිරා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වජිරං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

කෙනායං පකතො සත්තො කුවං[2] සත්තස්ස කාරකො,
කුවං සත්තො සමුප්පන්නො කුවං සත්තො නිරුජ්ඣතීති.

අථ ඛො වජිරාය භික්ඛුනියා එතදහොසි: 'කො නු ඛ්වායං මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතී'ති. අථ ඛො වජිරාය භික්ඛුනියා එතදහොසි: 'මාරො ඛො අයං පාපිමා මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතී'ති. අථ ඛො වජිරා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:

කින්නු සත්තොති පච්චෙසි මාරදිට්ඨිගතන්නු තෙ,
සුද්ධසඞ්ඛාරපුඤ්ජොයං නයිධ සත්තුපලබ්භති.

යථා හි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති,
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති[3].

දුක්ඛමෙව හි සම්භොති දුක්ඛං තිට්ඨති වෙති ච,
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤත්‍ර දුක්ඛා නිරුජ්ඣතීති.

අථ ඛො මාරො පාපිමා ජානාති මං වජිරා භික්ඛුනීති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායීති.

භික්ඛුනීවග්ගො පඨමො.

තස්සුද්දානං:

ආළවිකා ච සොමා ච ගොතමී විජයා සහ
උප්පලවණ්ණා ච චාලා උපචාලා සීසූපචාලා
සෙලා වජිරාය තෙ දසාති.

භික්ඛුනීසංයුත්තං සමත්තං.

---

1. එවං මෙ සුතං -පෙ- අනාථපිණ්ඩිකස්සආරාමෙ. සිමු. 2. 2. කිංචි - ස්‍යා. 3. සම්මති - ස්‍යා.

5. 1. 10.

වජිරා සූත්‍රය.

171. **සැවැත්නුවර—**

එකල්හි **වජිරා** මෙහෙණ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්නුවරට** පිඩු පිණිස පිවිසුනා ය. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹුනා ය. අන්ධවනයට පිවිස එක්තරා රුක් මුලෙක දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පවිටු මරු වජිරා මෙහෙණට බිය තැති ගැණුම් ලොමුදහ ගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ වජිරා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ වජිරා මෙහෙණට ගාථායෙන් කී ය:

මේ සත්ත්වයා කවරකු විසින් කරණ ලද්දේ ද? මේ සත්ත්වයා කළ තැනැත්තා කොහි ද? මේ සත්ත්වයා කොහි හටගත්තේ ද? මේ සත්ත්වයා කොහි නිරුද්ධ වේ ද?

ඉක්බිති වජිරා මෙහෙණහට 'මේ කවරෙක් ද?' මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ මේ ගාථාව කියා ද'යි මේ අදහස විය. එකල්හි වජිරා මෙහෙණහට 'මේ පවිටු මරු ය. මට බිය තැති ගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා'යි මේ සිත විය. ඉක්බිති වජිරා මෙහෙණ මේ පවිටු මරු ය යි දැන පවිටු මරුහට ගාථාවෙන් ගෙන් පෙරළා කිවු ය:

මරුව, කිම සත්ත්වයෙකැ යි අදහන්නෙහි ද? තාගේ මාරදෘෂ්ටියෙක් නො වේ ද? මේ හුදු සංස්කාර පිණ්ඩයෙකි. මෙහි සතෙක් නො ලැබේ.

අවයව සමූහය හේතු කොට ගෙණ යම්සේ රථය යන ශබ්දයෙක් වේ ද? එසේ ම පඤ්චස්කන්ධයන් ඇති කල්හි සත්ත්වයා ය යන ලොකව්‍යවහාරය වේ.

දුක ම ලැබේ. දුක ම පවතී. දුක ම විදී. දුක හැර අනිකෙක් නො ලැබේ දුක හැර අනිකෙක් නිරුද්ධ නො වේ.

ඉක්බිති පවිටු මාරයා වජිරා මෙහෙණ මා දනී ය යි දුකට පැමිණියේ නොසතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදන් විය.

භික්ඛුනී වර්ගය පළමුවැනියි.

එහි උද්දානය:

ආළවිකා, සෝමා, ගොතමී, විජයා, උප්පලවණ්ණා, චාලා, උපචාලා, සිසුපචාලා, සෙලා, වජිරා යයි ඒ සූත්‍ර දසයෙකි.

භික්ඛුනීසංයුත්තය නිමියේ යි.

6. බ්‍රහ්මසංයුත්තං

1. කොකාලිකවග්ගො

6. 1. 1.

ආයාචනසුත්තං

172. එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ **අජපාල**නිග්‍රොධමූලෙ පඨමාභිසම්බුද්ධො.

අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසම්මුදිතා[1] ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො. ඉදම්පි ඛො ඨානං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො[2] විරාගො නිරොධො නිබ්බානං. අහඤ්චෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං. පරෙ ච මෙ න ආජානෙය්‍යුං. සො මමස්ස කිලමථො සා මමස්ස විහෙසාති.

අපිස්සුදං[3] භගවන්තං ඉමා අනච්ඡරියා ගාථායො පටිභංසු. පුබ්බෙ අස්සුතපුබ්බා:

කිච්ඡෙන මෙ අධිගතං හලන්දානි පකාසිතුං,
රාගදොසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො.

පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං,
රාගරත්තා න දක්ඛින්ති[4] තමොක්ඛන්ධෙන ආවුතාති.[5]

ඉති[6] භගවතො පටිසඤ්චික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනාය.

අථ ඛො බ්‍රහ්මුනො **සහම්පතිස්ස** භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය එතදහොසි: නස්සති වත භො ලොකො. විනස්සති වත භො ලොකො යත්‍ර හි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනායාති. අථ ඛො බ්‍රහ්මා සහම්පති සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[7] වා බාහං පසාරෙය්‍ය. පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි.

---

1. සම්මුදිතා - ස්‍යා. PTS. 2 තණ්හාක්ඛයො - මජසං. 3. අපිස්සු - මජසං. 4. දක්ඛන්ති.- මජසං. 5 ආවුටාති - මජසං. 6. ඉතිහ - මජසං. 7. සමිඤ්ජිතං - මජසං.

6. බ්‍රහ්මසංයුත්තය

1. කෝකාලිකවර්ගය

6. 1. 1.

ආයාචනසූත්‍රය

172. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදු ව පළමු කොට උරුවෙල්දනව්වෙහි නේරඤ්ජරා ගංතෙර අජපල් නුගරුකමුල වැඩ වසන සේක.

එකල්හි එකලාව චිත්තවිවේකයෙන් හුන් භාග්‍යවතුන් වහන්සේට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් පහළ විය. මා විසින් අවබෝධ කළ මේ ධර්මය ගැඹුරුය. දුකසේ දක්ක යුතු ය. දුකසේ අවබෝධ කටයුතු ය. ශාන්ත ය. ප්‍රණීත ය. තර්කයෙන් බැසගත නොහැක්ක. සියුම් ය. පණ්ඩිතයන් විසින් දක්ක යුතු ය. මේ සත්ත්ව සමූහයා (පඤ්චකාමගුණ නමැති) ආලයෙහි බැඳුනේ ය. ආලයෙහි ඇලුනේ ය. ආලයෙහි සතුටු විය. ආලයෙහි බැඳුනු ආලයෙහි ඇලුනු ආලයෙහි සතුටු වූ මේ සත්ත්ව සමූහයා විසින් ඉදප්පච්චයතා පටිච්ච-සමුප්පාද නම් වූ යම් මේ දහමෙක් වේ ද, එය දුකසේ දක්ක යුතු ය. සියලු සංස්කාරයන්ගේ සංසිඳීම වූ සියලු උපධිධර්මයන්ගේ දුරලීම වූ තෘෂ්ණාව ක්‍ෂය කිරීම වූ විරාගය වූ නිරෝධය වූ යම් මේ නිවණෙක් වේ නම් මේ දහම් ද දුකසේ දක්ක යුතුය. මම ද දහම් දෙසන්නෙම් නම් පරහුදු මාගේ ධර්මය දැන නොගන්නාහු නම් ඒ මට කළකිරෙනු වෙයි. ඒ මට වෙහෙසෙක් වෙයි.

තව ද භාග්‍යවතුන් වහන්සේට අනච්ඡරිය වූ (නැවත නැවත ආශ්චර්යවත්) පෙර නො ඇසූවිරූ මේ ගාථාවෝ වැටහුනහ.

මා විසින් දුකසේ අවබෝධ කරණ ලද ධර්මය දැන් පැවසීම නිෂ්ඵල ය. රාග ද්වේෂයෙන් මැඩුනවුන් විසින් මේ දහම සුවසේ අවබෝධ නො කට හැක්ක.

රාගයෙන් රත් වූ මෝහඳුරෙන් වැසුනු සත්ත්වයෝ උඩුහොයට යන සියුම් ගැඹුරු දුකසේ දතයුතු ඉතා සියුම් මේ දහම නොදකිත්.

මෙසේ සලකන භාග්‍යවතුන් වහන්සේගේ සිත මන්දෝත්සාහයට, දහම් නො දෙසීමට නැමෙයි.

එකල්හි තමසිතින් භාග්‍යවතුන් වහන්සේගේ සිත පිරිසිඳ දත් සහම්පති බඹහට මේ අදහස විය. යම් ලොවෙක තථාගත වූ අර්හත් වූ සම්මාසම්බුද්ධ-රජානන් වහන්සේගේ සිත මන්දෝත්සාහයට, දහම් නො දෙසීමට නැමේ ද, පින්වත්නි, ඒ ලොව ඒකාන්තයෙන් නැසේ. පින්වත්නි, ඒ ලොව ඒකාන්තයෙන් වැනසේ යි. ඉක්බිති සහම්පතී බ්‍රහ්ම තෙමේ යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ හෝ, දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම බඹලොව අතුරුදන් වූයේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය.

අථ බො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණ-ජාණුමණ්ඩලං පඨවියං නිහන්ත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "දෙසෙතු භන්තෙ භගවා ධම්මං දෙසෙතු සුගතො ධම්මං. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා. අස්සවණතා ධම්මස්ස පරිහායන්ති භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො"ති. ඉදමවොච බ්‍රහ්මා **සහම්පති.** ඉදං වත්වා අථාපරං එතදවොච:

පාතුරහොසි මගධෙසු පුබ්බෙ ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො,
අවාපුරෙතං[1] අමතස්ස ද්වාරං සුණන්තු ධම්මං විමලෙනානුබුද්ධං.

සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ පාසාදමාරුය්හ සමන්තචක්ඛු,
සොකාවතිණ්ණං[2] ජනතමපෙතසොකො අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං.

උට්ඨෙහි වීර විජිතසඞ්ගාම සත්ථවාහ අනණ විචර ලොකෙ,
දෙසස්සු[2] භගවා ධම්මං අඤ්ඤාතාරො භවිස්සන්තීති.

අථ බො භගවා බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤතං පටිච්ච බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙසි. අද්දසා බො භගවා බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ මහා-රජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ [අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො[3] විහරන්තෙ]. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි[4] අන්තො නිමුග්ගපොසීනි. අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි. අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම ඨිතානි[5] අනුපලිත්තානි උදකෙන. එවමෙවං භගවා බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ [අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ]. දිස්වාන බ්‍රහ්මානං සහම්පතිං ගාථාය පච්චභාසි:

1. අපාපුරෙතං - මජසං. සයා 2. දෙසෙතු - සයා. PTS. 3. භයදස්සාවිනො - මජසං
4. උදකානුග්ගතානි - සයා. 5. ඨිතානි - සීමු 2. සයා. PTS.

[-] අන්තරිත පාඨො සීහළපොත්ථකෙසු න දිස්සන්ති.

ඉක්බිති **සහම්පති** බ්‍රහ්ම තෙමේ උතුරුසළුව එකස්කොට දකුණු දණමඩල බිම හැන භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. සුගතයන් වහන්සේ දහම් දෙසන සේක්වා. පැණැසෙහි මඳකෙලෙස් රජස් ඇති සත්ත්වයෝ ඇත. දහම් නො අසනබැවින් ඔහු පිරිහෙත්. දහම් අවබෝධ කරනුවෝ වන්නාහ"යි සහම්පති බ්‍රහ්ම තෙමේ මෙය කී ය. මෙය කියා වැලිදු මෙය කී ය.

පෙර මගධදනව්වෙහි මල සහිතයන් විසින් සිතන ලද අශුද්ධධර්මයෙක් පහළ වි ය. මේ නිවන්දොර අරිණු මැනවි. නිර්මලයන් වහන්සේ විසින් අවබෝධ කරණ ලද ධර්මය අසත්වා!

සෙල්මුවා පව්මුදුනෙක්හි සිටියෙක් හාත්පස ජනසමූහයා යම්සේ දක්නේ ද, ප්‍රාඥයන් වහන්ස, සර්වඥ වූ පහ වූ ශෝක ඇති මුඹවහන්සේ ද එබඳු දහම්මුවා පහයට නැග ජාතිජරාදුකෙන් වැඩුනු ශෝකයට බට ජනසමූහයා බලන සේක්වා!

දිනූ යුද ඇති වීරයන් වහන්ස, නැගී සිටිනු මැනව. අනෘණ සැහැවි ඇති සාර්වාහයන් වහන්ස, ලොව හැසිරෙණු මැනව. භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. අවබෝධ කරන්නෝ වන්නාහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බඹහුගේ ඇරයුම ද ලැබ සත්ත්වයන් කෙරෙහි කරුණාවත් බවත් නිසා බුදුඇසින් ලොව බලා වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් ලොව බලන සේක් නුවණැස්හි මඳ-කෙලෙස් රජස් ඇති සත්ත්වයන් ද බොහෝ කෙලෙස් රජස් ඇති සත්ත්වයන් ද තියුණු (ශ්‍රද්ධා ආදී) ඉඳුරන් ඇති සත්ත්වයන් ද මෘදු ඉඳුරන් ඇති සත්ත්වයන් ද, (ශ්‍රද්ධා ආදී) උතුම් ආකාර ඇති සත්ත්වයන් ද නපුරු ආකාර ඇති සත්ත්වයන් ද පහසුවෙන් අවබෝධ කරවිය හැකි සත්ත්වයන් ද පහසුවෙන් අවබෝධ කරවිය නොහැකි සත්ත්වයන් ද පරලොව හා වරද භය විසින් දක්නාසුලු ව වසන ඇතැම් සත්ත්වයන් ද පරලොව හා වරද භය විසින් නො දක්නාසුලු ව වසන ඇතැම් සත්ත්වයන් ද දුටු සේක. යම්සේ උපුල්බෙනෙක හෝ පියුම්විලෙක හෝ හෙළපියුම්විලෙක හෝ ඇතැම් උපුල්හු හෝ පියුම්හු හෝ හෙළපියුම්හු හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුනාහු දියෙන් මතු නොවූවාහු දිය ඇතුලත ගිලී වැඩෙන්නාහු වෙද්ද? ඇතැම් උපුල්හු හෝ පියුම්හු හෝ හෙළපියුම්හු හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුනාහු දිය-මතුපිට සම ව සිටියාහු වෙද්ද, ඇතැම් උපුල්හු හෝ පියුම්හු හෝ හෙළපියුම්හු හෝ දියෙහි හටගත්නාහු දියෙහි වැඩුනාහු දියෙන් උඩට නැගී දියෙන් නො තැවරුණාහු සිටිද් ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් ලොව බලනසේක් අප්පරජක්ඛ සත්ත්වයන් ද, මහාරජක්ඛ සත්ත්වයන් ද, තික්ඛින්ද්‍රිය සත්ත්වයන් ද, මුදින්ද්‍රිය සත්ත්වයන් ද, ස්වාකාර සත්ත්වයන් ද, ද්වාකාර සත්ත්වයන් ද, සුවිඤ්ඤාපය සත්ත්වයන් ද, දුවිඤ්ඤාපය සත්ත්වයන් ද, පරලොකවජ්ජභයදස්සාවී ව වසන ඇතැම් සත්ත්වයන් ද, පරලොකවජ්ජභයදස්සාවී නො ව වසන ඇතැම් සත්ත්වයන් ද දුටු වදාළ සේක. දුටු සහම්පති බඹුහට ගාථායෙන් පෙරළා වදාළ සේක.

අපාරුතා තෙසං[1] අමතස්ස ද්වාරා යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං,
විහිංසසඤ්ඤී පගුණං න භාසිං ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙති.

අථ ඛො බ්‍රහ්මා සහම්පති කතාවකාසො ඛොම්හි භගවතා ධම්මදෙසනායාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

6. 1. 2.

ගාරවසුත්තං.

173. එවං මෙ සුතං: එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධමූලෙ[2] පඨමාභිසම්බුද්ධො.

අථ ඛො භගවතො රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: දුක්ඛං ඛො අගාරවො විහරති අප්පතිස්සො. කන්නු ඛ්වාහං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරු කත්වා[3] උපනිස්සාය විහරෙය්‍යන්ති.

අථ ඛො භගවතො එතදහොසි: අපරිපුණ්ණස්ස ඛො සීලක්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරෙය්‍යං, න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අත්තනා සීලසම්පන්නතරං අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා යමහං සක්කත්වා ගරු කත්වා[3] උපනිස්සාය විහරෙය්‍යන්ති.

අපරිපුණ්ණස්ස ඛො සමාධික්ඛන්ධස්ස පාරිපූරියා -පෙ- අත්තනා සමාධිසම්පන්නතරං අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා, යමහං සක්කත්වා ගරු කත්වා[3] උපනිස්සාය විහරෙය්‍යන්ති.

අපරිපුණ්ණස්ස ඛො පඤ්ඤාක්ඛන්ධස්ස පාරිපූරියා -පෙ- අත්තනා පඤ්ඤාසම්පන්නතරං අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා, යමහං සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති.

අපරිපුණ්ණස්ස ඛො විමුත්තික්ඛන්ධස්ස පාරිපූරියා -පෙ- අත්තනා විමුත්තිසම්පන්නතරං අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා, යමහං සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති

අපරිපුණ්ණස්ස ඛො විමුත්තිඤාණදස්සනක්ඛන්ධස්ස පාරිපූරියා[4] අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරු කත්වා[3] උපනිස්සාය විහරෙය්‍යං, න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අත්තනා විමුත්තිඤාණදස්සනසම්පන්නතරං අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා යමහං සක්කත්වා ගරු කත්වා[5] උපනිස්සාය විහරෙය්‍යං. යන්නූනාහං ය්වායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරු කත්වා[5] උපනිස්සාය විහරෙය්‍යන්ති.

1. තෙ - ස්‍යා. 2. නිග්‍රොධෙ - සීමු. 1. ස්‍යා. PTS. සී 1, 2. 3. ගුරුං කත්වා - මජ්සං.
4. පරිපූරියා - අ. 5. ගරුංකත්වා, - සී1.

ඔවුන්ට අමාදොර නොවැසිත. යම් කෙනෙක් කන් ඇත්තාහු නම් ශ්‍රද්ධාව මුදත්වා. බ්‍රහ්මය, මිනිසුන් අතර වෙහෙසීම් පමණකැයි යන හැඟීම් ඇත්තෙම් ප්‍රගුණ වූ ප්‍රණීත ධර්මය නො කීයෙමි.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මදේශනාව පිණිස කරණ ලද අවකාශ ඇත්තෙම් වෙමි යි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

6. 1. 2.

ගාරවසූත්‍රය.

173. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදුව පළමු කොට උරුවෙල්දනව්වෙහි නේරඤ්ජරා ගංතෙර අජපල්-නුගරුකමුල වැඩවසන සේක.

එකල්හි එකලා ව චිත්තවිවේකයෙන් හුන් භාග්‍යවතුන් වහන්සේට කිසිවකු ගුරුතන්හි නො තබා කිසිවකු දෙටු තන්හි නො තබා වසන්නේ දුකයේ වෙසෙසි. මම කවර මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් දැ යි මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මේ අදහස විය. නොපිරිපුන් සීලස්කන්ධය පිරීම පිණිස අන් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් ද, (එසේ) මම යමකු සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් නම් තමහට වැඩිතරම් සීලසම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි මම නො දකිමි.

නො පිරිපුන් සමාධිස්කන්ධය පිරීම පිණිස ... මම යමකු සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් නම් තමහට වැඩි තරම් සමාධි-සම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ ...

නො පිරිපුන් ප්‍රඥාස්කන්ධය පිරීම පිණිස ... මම යමකු සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් තමහට වැඩි තරම් ප්‍රඥා සම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ ...

නොපිරිපුන් විමුක්තිස්කන්ධය පුරලීම පිණිස ... මම යමකු සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් නම් තමහට වැඩිතරම් විමුක්ති-සම්පන්න වූ අන් මහණකු හෝ බමුණකු හෝ ...

නොපිරිපුන් විමුක්තිඥානදර්ශනස්කන්ධය පුරලීම පිණිස අන් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වෙසෙන්නෙම් (එසේ) මම යමකු සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසන්නෙම් නම් තමහට වැඩිතරම් විමුක්තිඥානදර්ශන සම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි මම නොදකිමි. යම් ඒ ධර්මයක් මා විසින් මනාකොට අවබෝධ කරණ ලද්දේ ද, ඒ ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වෙසෙන්නෙම් නම් මැනවැ යි.

අථ ඛො බ්‍රහ්මා **සහම්පති** භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි.

අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: එවමෙතං භගවා, එවමෙතං සුගත. යෙපි තෙ භන්තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරිංසු. යෙපි තෙ භන්තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරිස්සන්ති. භගවාපි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරතූති. ඉදමවොච බ්‍රහ්මා **සහම්පති**. ඉදං වත්වා අථාපරං එතදවොච:

> යෙ චබ්භතීතා[1] සම්බුද්ධා යෙ ච බුද්ධා අනාගතා,
> යො චෙතරහි සම්බුද්ධො බහුන්නං[2] සොකනාසනො.
>
> සබ්බෙ සද්ධම්මගරුනො විහංසු[3] විහරන්ති ච,
> අථොපි[4] විහරිස්සන්ති එසා බුද්ධාන ධම්මතා.
>
> තස්මා හි අත්ථකාමෙන[5] මහත්තමභිකඞ්ඛතා,
> සද්ධම්මො ගරුකාතබ්බො සරං බුද්ධානසාසනං.

6. 1. 3.

බ්‍රහ්මදෙවසුත්තං.

174. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරිස්සා බ්‍රාහ්මණියා **බ්‍රහ්මදෙවො** නාම පුත්තො භගවතො සන්තිකෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති.

අථ ඛො ආයස්මා බ්‍රහ්මදෙවො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා බ්‍රහ්මදෙවො අරහතං අහොසි.

---

1. යෙ ච අතීතා — මජසං, සයා, PTS. 2. බහුන්නං - මජසං. 3. විහරිංසු — සයා PTS. සී 1, 2, 4. අථාපි — සයා. තථාපි - මජසං 5. අත්තකාමෙන—සයා. මජසං.

ඉක්බිති **සහම්පති** බ්‍රහ්ම තෙමේ තමසිතින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තපරිවිතර්කය දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ හෝ, දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම බඹලොව අතුරුදහන් වූයේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ උතුරුසළුව එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භාග්‍යවතුන් වහන්ස, පෙල එසේ ම ය. සුගතයන් වහන්ස, පෙල එසේ ම ය. වහන්ස, අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධ කෙනෙක් වූ සේක් නම් ඒ භාග්‍යවතුන් වහන්සේත් ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට විසූ සේක. වහන්ස, අනාගත කාලයෙහි යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධ කෙනෙක් වන සේක් නම් ඒ භාග්‍යවතුන් වහන්සේත් ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වාසය කරණ සේක. වහන්ස, දැන් භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේත් ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වෙසෙන සේක්වායි. **සහම්පති** බ්‍රහ්ම තෙමේ මෙය සැළ කෙළේ ය. මෙය සැළ කොට යළිත් මෙය ද කීය:

අතීතකාලික වූ යම් සම්බුද්ධ කෙනෙක් වූ සේක් ද, අනාගතකාලික වූ යම් සම්බුද්ධ කෙනෙක් වන සේක් ද, බොහෝ දෙනාගේ ශෝකය නසන යම් සම්බුද්ධ කෙනෙකුන් දැන් ඇත් ද,

ඒ සියලු බුදුරජාණන් වහන්සේ ම සද්ධර්මය ම ගරු කොට ගත්තාහු විසූ සේක. දැන් වසන සේක. වැලිත් (මතු ද) වසන සේක. මේ බුදුවරුන්ගේ ස්වභාව යි.

එහෙයින් වැඩ කැමති මහත්බව පතන්නහු විසින් බුදුසසුන සිහි කරමින් සදහම ගුරු කටයුත්තේ ය.

6. 1. 3.

බ්‍රහ්මදේවසූත්‍රය.

174. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. එකල්හි එක්තරා බැමිණියකගේ **බ්‍රහ්මදේව** නම් පුතෙක් ගිහිගෙන් නික්ම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්දට පැමිණියේ වෙයි.

එකල්හි ආයුෂ්මත් **බ්‍රහ්මදේව** තෙමේ එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වසන්නේ යමක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ම ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද්ද, සසුන් බඹසරට අවසන් වූ ඒ නිරුත්තර රහත්ඵලය මේ අත්බැව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ විසී ය. ජාතිය ක්ෂීණ වූවා ය. මගබඹසර වැස නිමවන ලදී. සොළොස් කරණී කොට නිමවන ලදී. මෙල කරණී පිණිස නොහොත් රහත්බව පිණිස කළයුතු අන් කරණී නැතැයි වෙසෙසින් දැනගත්තේ ය. ආයුෂ්මත් බ්‍රහ්මදෙවයෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

අථ ඛො ආයස්මා **බ්‍රහ්මදෙවො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො යෙන සකමාතුනිවෙසනං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන. ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතා බ්‍රාහ්මණී බ්‍රහ්මුනො ආහුතිං නිච්චං පග්ගණ්හාති. අථ ඛො බ්‍රහ්මුනො සහම්පතිස්ස එතදහොසි: අයං ඛො ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතා බ්‍රාහ්මණී බ්‍රහ්මුනො ආහුතිං නිච්චං පග්ගණ්හාති, යන්නූනාහං තං උපසඞ්කමිත්වා සංවෙජෙය්‍යන්ති.

අථ ඛො බ්‍රහ්මා **සහම්පති** සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතුනිවෙසනෙ පාතුරහොසි. අථ ඛො බ්‍රහ්මා සහම්පති වෙහාසං ඨිතො ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතරං බ්‍රාහ්මණිං ගාථාහි අජ්ඣභාසි:

දූරෙ ඉතො බ්‍රාහ්මණි බ්‍රහ්මලොකො යස්සාහුතිං පග්ගණ්හාසි නිච්චං,
නෙතාදිසො බ්‍රාහ්මණි බ්‍රහ්මභක්ඛො කිං ජප්පසි බ්‍රහ්මපථං අජානන්තී.[1]

එසො හි තෙ බ්‍රාහ්මණි බ්‍රහ්මදෙවො නිරුපධිකො[2] අතිදෙවපත්තො,
අකිඤ්චනො භික්ඛු අනඤ්ඤපොසී[3] යො තෙ සො පිණ්ඩාය ඝරං පවිට්ඨො.

ආහුනෙය්‍යො[4] වෙදගූ භාවිතත්තො නරානං දෙවානඤ්ච[5] දක්ඛිණෙය්‍යො,
බාහිත්වා පාපානි අනුපලිත්තො[6] ඝාසෙසනං ඉරියති[7] සීතිභූතො.

න තස්ස පච්ඡා න පුරත්ථමත්ථි සන්තො විධූමො අනීඝො නිරාසො,
නික්ඛිත්තදණ්ඩො තසථාවරෙසු සො ත්‍යාහුතිං භුඤ්ජතු අග්ගපිණ්ඩං

විසෙනිභූතො උපසන්තචිත්තො නාගොව දන්තො චරති අනෙජො,
භික්ඛු සුසීලො සුවිමුත්තචිත්තො සො ත්‍යාහුතිං භුඤ්ජතු අග්ගපිණ්ඩං.

තස්මිං පසන්නා අවිකම්පමානා පතිට්ඨපෙසි දක්ඛිණං දක්ඛිණෙය්‍යෙ,
කරොහි පුඤ්ඤං සුඛමායතිකං දිස්වා මුනිං බ්‍රාහ්මණි ඔඝතිණ්ණන්ති.

තස්මිං පසන්නා අවිකම්පමානා පතිට්ඨපෙසි දක්ඛිණං දක්ඛිණෙය්‍යෙ,
අකාසි පුඤ්ඤං සුඛමායතිකං දිස්වා මුනිං බ්‍රාහ්මණී ඔඝතිණ්ණන්ති.

---

1. අජානං - මජසං. ස්‍යා. 2. නිරූපධිකො - මජසං. ස්‍යා. 3. අනඤ්ඤපොසියො— PTS. 4. ආහුනියො - ස්‍යා. 5. දෙවාන ච. — ස්‍යා. 6. අනූපලිත්තො - මජසං. ස්‍යා. 7. ඉරියති — සීමු 2.

ඉක්බිති ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙමේ පෙරවරු හැද පෙරෙව පාසිවුරු ගෙණ සැවැත්නුවරට පිඩු පිණිස පිවිසියේ ය. සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඩු පිණිස හැසිරෙන්නේ සිය මවුනිවස වෙත එළඹියේ ය. එකල්හි ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මවු බැමිණි තොමෝ බඹහට නිරන්තරයෙන් හෝමපූජා කෙරෙයි. එකල්හි සහම්පති බඹහට ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මේ මවුබැමිණි තොමෝ නිරන්තරයෙන් බඹහට හෝමපූජා කෙරෙයි. මම ඇය වෙත එළඹ සංවේග දනවන්නෙම් නම් යෙහෙකැයි මේ සිත විය.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ හෝ, දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම බඹලොව අතුරුදන් වූයේ ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මවු නිවසෙහි පහළ විය. ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ අහසෙහි සිටියේ ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මවු බැමිණියට ගාථාවන්ගෙන් කීය.

බැමිණිය, යම් බඹකුට නිතර හෝම කිරීම දැකි කොට ගණිහි ද, (ඔහුගේ ඒ) බඹලොව මෙයින් දුරය මෙබඳු පායාසයෙක් බ්‍රහ්මයන් විසින් අනුභව කළ යුත්තෙක් නො වේ. බ්‍රහ්මපථය නො දන්නී කිම නන් දෙඩවහි ද?

බැමිණිය, තිගේ (පුත් වූ) මේ බ්‍රහ්මදේව තෙරණුවෝ උපධි රහිතයහ. දේවාතිදේව භාවයට පැමිණියහ. රාගාදි පලිබොධ රහිතයහ (තෙල අත්බව පියා) අන් අත්බැවක් හෝ අඹුදරුවන් හෝ පෝෂණය නො කරන්නෙකි. ඒ රහතුන් වහන්සේ තිගේ ගෙට පිඩු පිණිස පිවිසි සේක.

(ඒ රහත් තෙමේ) ආහුතපිණ්ඩය හා පාහුන පිණ්ඩය ද පිළිගැණීමට සුදුසු ය. චතුරමාර්ග සංඛ්‍යාත වේදයෙහි කෙළවරට පැමිණියේ ය. වඩන ලද සිත් ඇත්තේ ය. මිනිසුන්ගේ ද දෙවියන්ගේ ද දක්ෂිණාවට සුදුසු ය. පව් බැහැර කොට නො තැවරුණේ සිහිල් වූයේ අහර සෙවීම කෙරෙයි.

උන්වහන්සේට අතීත සකන්ධයන්හි ද ඡන්දරාගයෙක් නැත. අනාගත සකන්ධයන්හි ද ඡන්දරාගයෙක් නැත. ශාන්තය. ක්‍රොධදුම් රහිත ය. දුක් රහිත ය. ආශා නැත. අස්ථිර ස්ථිර සත්ත්වයන් (පෘථග්ජන ක්ෂීණාස්‍රවයන්) කෙරෙහි බහා තැබූ දඬු ඇත්තෙක. හෙ තෙමේ තිගේ ආහුති සඞ්ඛ්‍යාත අග්‍ර පිණ්ඩය වළඳාවා.

කෙලෙශසේනා රහිත වූයේ මොනවට සන්හුන් සිත් ඇත්තේ දැමුනු හස්තියකු මෙන් හැසිරෙයි. තෘෂ්ණා නැති මනාසිල් ඇති මැනවින් මිදුනු සිත් ඇති ඒ රහත් තෙමේ තිගේ ආහුති සඞ්ඛ්‍යාත අග්‍ර පිණ්ඩය වළඳාවා.

බැමිණිය, පහන්සිත් ඇති ව අචලශ්‍රද්ධා ඇතිව දක්ෂිණාර්හ වූ උන්වහන්සේ කෙරෙහි දක්ෂිණාව පිහිටුව. චතුරෞඝ තරණය කළ ඒ රහතුන් වහන්සේ දැක මතු සැප එළවන පින් කරව.

ඒ බැමිණි තොමෝ උන්වහන්සේ කෙරෙහි පහන්සිත් ඇති ව අචලශ්‍රද්ධා ඇතිව දක්ෂිණාවට සුදුසු වූ උන්වහන්සේ කෙරෙහි දක්ෂිණාව පිහිටුවාලූ ය. චතුරෞඝතරණය කළ ඒ රහතුන් වහන්සේ දැක මතු සැප එළවන පින් කළා ය.

6. 1. 4.

බකබ්‍රහ්මසුත්තං.

175. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **බකස්ස** බ්‍රහ්මුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: ඉදං නිච්චං, ඉදං ධුවං, ඉදං සස්සතං, ඉදං කෙවලං, ඉදං අචවනධම්මං. ඉදං හි න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති. ඉතො ච පනඤ්ඤං උත්තරිං නිස්සරණං[1] නත්ථීති.

අථ ඛො භගවා බකස්ස බ්‍රහ්මුනො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි. අද්දසා ඛො බකො බ්‍රහ්මා භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච: එහි ඛො මාරිස. ස්වාගතං තෙ මාරිස. චිරස්සං ඛො මාරිස ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. ඉදං හි මාරිස නිච්චං, ඉදං ධුවං, ඉදං සස්සතං, ඉදං කෙවලං, ඉදං අචවනධම්මං. ඉදං හි න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති. ඉතො ච පනඤ්ඤං උත්තරිං නිස්සරණං නත්ථීති.

එවං වුත්තෙ භගවා බකබ්‍රහ්මානං ඉදමවොච[2]: අවිජ්ජාගතො වත භො බකො බ්‍රහ්මා, අවිජ්ජාගතො වත භො බකො බ්‍රහ්මා. යත්‍ර හි නාම අනිච්චඤ්ඤෙව[3] සමානං නිච්චන්ති වක්ඛති. අද්ධුවඤ්ඤෙව[4] සමානං ධුවන්ති වක්ඛති. අසස්සතඤ්ඤෙව සමානං සස්සතන්ති වක්ඛති. අකෙවලඤ්ඤෙව සමානං කෙවලන්ති වක්ඛති. චවනධම්මඤ්ඤෙව සමානං අචවනධම්මන්ති වක්ඛති. යත්ථ ච පන ජායති ච ජීයති ච මීයති ච චවති ච උප්පජ්ජති[5] ච. තඤ්ච තථා වක්ඛති: ඉදං හි න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති. සන්තඤ්ච පනඤ්ඤං උත්තරිං නිස්සරණං, නත්ථඤ්ඤං උත්තරිං නිස්සරණන්ති වක්ඛතීති.

[බකො බ්‍රහ්මා:]

ද්වාසත්තති ගොතම පුඤ්ඤකම්මා වසවත්තිනො ජාතිජරං අතීතා,
අයමන්තිමා වෙදගූ බ්‍රහ්මුපපත්ති අස්මාභිජප්පන්ති ජනා අනෙකාති.

[භගවා:]

අප්පං හි එතං න හි දීඝමායු යං ත්වං බක මඤ්ඤසි දීඝමායුං.
සතං සහස්සානං නිරබ්බුදානං ආයුං[6] පජානාමි තවාහං බ්‍රහ්මෙති.

---

1. උත්තරි නිස්සරණං - මජසං. 2. එතදවොච - මජසං. සයා. 3. යෙව - මජසං. සයා. PTS. 4 අධුවඤ්ඤෙව - මජසං සයා. 5. උප්පජ්ජති - මජසං. සයා. 6. ආයු - PTS

6. 1. 4.

බකබ්‍රහ්මසූත්‍රය.

175. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩවසන සේක. එකල්හි **බක බ්‍රහ්මයා**හට "මෙය (බ්‍රහ්මස්ථානය) නිත්‍ය ය. මෙය ස්ථිරය, මෙය ශාශ්වත ය. මෙය කේවලය. මෙය ච්‍යුත නො වන ස්වභාව ඇත්තේ ය. මෙය නූපදී සි. නො දිරයි. නො මියෙයි. ච්‍යුත නො වේ. නො හටගණී. මෙයින් මතු අන් නිස්සරණයෙක් නැතැ"යි මෙබඳු ලාමක මිථ්‍යාදෘෂ්ටියෙක් උපන.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ තමසිතින් බකබඹහුගේ චිත්තපරිවිතර්කය දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම දෙව්රම්හි අතුරුදන් වූසේක් ඒ බඹලොව පහළ වූ සේක. බකබ්‍රහ්ම තෙමේ එන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදී ම දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: "නිදුකානෙනි, එනු මැනව. නිදුකානෙනි, මුබට ස්වාගත වේවා. නිදුකානෙනි, මෙහි පැමිණීම පිණිස බොහෝ කලෙකින් මේ පර්‍යාය කෙළෙහි ය. නිදුකානෙනි, මෙය නිත්‍යය, මෙය ස්ථිරය, මෙය ශාශ්වත ය, මෙය කෙවලය. මෙය ච්‍යුත නොවන ස්වභාවය ඇත්තේ ය, මෙය නූපදී, නො දිරයි, නො මියේ, ච්‍යුත නො වේ, නො හටගණී. මෙයින් මතු අනික් නිස්සරණයෙක් ද නැතැයි.

මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ බක බඹහට මෙය වදාළ සේක: "යමෙක් තම් අනිත්‍ය වූවක් ම නිත්‍ය යයි කියා ද, අස්ථිර වූවක් ම ස්ථිර යයි කියා ද, අශාශ්වත වූවක් ම ශාශ්වත යයි කියා ද, ඛණ්ඩ වූවක් ම අඛණ්ඩ යයි කියා ද, ච්‍යුතවන ස්වභාව ඇත්තක් ම ච්‍යුත නො වන ස්වභාව ඇත්තෙකැයි කියා ද, යමෙක් හටගණී ද, දිරා ද, මියේ ද, ච්‍යුත වේ ද, නො හටගණී ද, එයත් මෙය නූපදී, නො දිරයි, නො මියෙයි, ච්‍යුත නො වෙයි, නො හටගණීයයි එසේ කියා ද, ඇත්තා වූ ම මත්තෙහි වූ අනෙක් නිස්සරණයෙක් වේ ද, (එසේ වතුදු) මතු අනෙක් නිස්සරණයෙක් නැතැයි කියා ද පින්වත්නි, ඒ බකබ්‍රහ්ම තෙමේ ඒකාන්තයෙන් අවිද්‍යාවෙන් අන්ධ වූයේ ය. පින්වත්නි, ඒ බකබ්‍රහ්ම තෙමේ ඒකාන්තයෙන් අවිද්‍යාවෙන් අන්ධ වූයේ ය"යි.

[බක බ්‍රහ්ම:]

ගෞතමයෙනි, (අපි) දෙසැත්තෑදෙනෙක් (කළ) පින්කම් ඇත්තමෝ ජාතිය හා ජරාව හා ඉක්ම වූම්හ. අනුත් තමන් විසිය ලා වැටෙම්හ. වෙදසඞ්ඛ්‍යාත ඥනයෙහි කෙළවරට පැමිණියම්හ. මේ අන්තිම බ්‍රහ්මලෝකෝත්පත්ති යයි නොයෙක් ජනයෝ අප ප්‍රාර්ථනා කෙරෙත්.

[භගවත්හු:]

බකබ්‍රහ්මය, තෝ යම් දීර්ඝායුෂයක් සිතයි ද, තෙල දීර්ඝායුෂයෙක් නො වේ. තගේ (ඉතිරිවූ) ආයුෂ නිරබ්බුද ලක්‍ෂයෙකැ යි මම දනිමි.

[බකො බ්‍රහ්මා:]

අනන්තදස්සී භගවාහමස්මි ජාතිජරං සොකමුපාතිවත්තො,
කිං මෙ පුරාණං වත සීලවත්තං ආචික්ඛ මෙතං යමහං විජඤ්ඤන්ති.

[භගවා:]

යං ත්වං අපායෙසි බහූ මනුස්සෙ පිපාසිතෙ ඝම්මනි සම්පරෙතෙ,
තං තෙ පුරාණං වත සීලවත්තං සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

යං එණිකූලස්මිං ජනං ගහීතං අමොචයී ගය්හකං නීයමානං,
තං තෙ පුරාණං වත සීලවත්තං සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

ගඞ්ගාය සොතස්මිං ගහීතනාවං ලුද්දෙන නාගෙන මනුස්සකම්‍යා,
පමොචයිත්ථ[1] බලසා පසය්හ තං තෙ පුරාණං වත සීලවත්තං
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

කප්පො ච තෙ බද්ධචරො අහොසිං සම්බුද්ධිමන්තං[2] වතිනං අමඤ්ඤං[3]
තං තෙ පුරාණං වත සීලවත්තං සුත්තප්පබුද්ධොව අනුස්සරාමීති.

[බකො බ්‍රහ්මා:]

අද්ධා පජානාසි මමෙතමායුං අඤ්ඤම්පි[4] ජානාසි තථා හි බුද්ධො,
තථා හි ත්‍යායං ජලිතානුභාවො ඔභාසයං තිට්ඨති බ්‍රහ්මලොකන්ති.

6. 1. 5.

අපරාදිට්ඨිසුත්තං.

176. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස බ්‍රහ්මුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති. නත්ථි සො සමණො වා බ්‍රාහ්මණො වා යො ඉධ ආගච්ඡෙය්‍යාති.

අථ ඛො භගවා තස්ස බ්‍රහ්මුනො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව ජෙතවනෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි. අථ ඛො භගවා තස්ස බ්‍රහ්මුනො උපරි වෙහාසං පල්ලඞ්කෙන නිසීදි තෙජොධාතුං සමාපජ්ජිත්වා.

---

1. පචචරා - ස්‍යා. 2. සම්බුද්ධිවන්තං - සිමු PTS. 3. අමඤ්ඤි - මජ්ස. 4. අඤ්ඤම්පි - මජ්ස. ස්‍යා.

[බක බ්‍රහ්ම:]

භාග්‍යවත්නි, (හෙපි) මම අනන්තදර්ශී වෙමි යි, ජාතිය හා ජරාව ද, ශෝකය ද ඉක්ම සිටියෙමි වෙමියි (කියව). මාගේ පුරාතන කර්මය කිම, ව්‍රතසමාදානය කිම? ශීලය කිම? යමක් (තොප අතිත් අසා) මම දන්නෙම් නම් එය මට කියනු මැනව.

[භගවත්හු:]

ග්‍රීෂ්මකාලයෙහි පීඩිත පිපාසිත වූ බොහෝ මිනිසුන්ට තෝ යම් හෙයෙකින් පැන් පෙවූයෙහි ද, තාගේ ඒ පුරාතන වූ ව්‍රතය හා ශීලය හා නිද්‍ර පිබිදියක්හු මෙන් (මම) සිහි කරමි.

ගංඉවුරෙහි (සොරුන් විසින්) අල්ලා ගන්නා ලද අත්පා බැඳ ගෙණ යනු ලබන ජනයා යම් හෙයෙකින් මිදී ද, තාගේ ඒ පුරාතන වූ ව්‍රතය හා ශීලය නිද්‍ර පිබිදියක්හු මෙන් (මම) සිහි කරමි.

මිනිසුන් නසනු කැමැත්තෙන් රෞද්‍ර වූ නාගයා විසින් ගඟ සලා මැද දී ගන්නා ලද නැව බලාත්කාරයෙන් මැඩ මිදූවෙහි ය. ඒ පුරාතන වූ තාගේ ව්‍රතය හා ශීලය නිද්‍ර පිබිදියකු මෙන් සිහි කරමි.

තට කප්ප නම් අතැවැස්සෙකිම් විමි. (ඒ තා) නුවණැත්තකු කොට ද ව්‍රතසම්පන්නයකු කොට ද (මම) සිතුවෙමි. ඒ පුරාතන වූ තාගේ ව්‍රතය හා ශීලය නිද්‍ර පිබිදියකු මෙන් සිහි කරමි.

[බක බ්‍රහ්ම:]

මාගේ මේ ආයුෂය ඒකාන්තයෙන් දනිහි, සෙස්ස ද දනිහි, එහෙයින් (මුඹ) බුද්ධ වව. එහෙයින් ම මුඹගේ මේ දිලියෙන අනුභාවය මුළුබඹලොව බබුලුවමින් සිටී.

6. 1. 5.

අපරාදිට්ඨිසුත්‍රය.

176. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු මහසිටුහුගේ අරමහි වැඩවසන සේක. එකල්හි එක්තරා බඹකුට යමෙක් මෙහි පැමිණෙන්නේ නම් එබඳු මහණෙක් හෝ බමුණෙක් හෝ නැතැයි මෙබඳු ලාමක මිථ්‍යා-දෘෂ්ටියෙක් උපන්නේ වෙයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ බඹහුගේ චිත්තපරිවිතර්කය (තම) සිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එපරිද්දෙන් දෙව්රමහි අතුරුදන් වූ සේක් ඒ බඹලොව්හි පහළ වූ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තේජෝධාතු සමවතට සමවැද ඒ බඹහුගේ මත්තෙහි අහස පලක් බැඳ වැඩ හුන් සේක.

අථ ඛො ආයස්මතො **මහාමොග්ගල්ලානස්ස** එතදහොසි: කහං නු ඛො භගවා එතරහි විහරතීති. අද්දසා ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන තස්ස බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසින්නං තෙජොධාතුං සමාපන්නං. දිස්වාන සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි.

අථ ඛො ආයස්මා **මහාමොග්ගල්ලානො** පුරත්ථිමං දිසං නිස්සාය[1] තස්ස බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසීදි, තෙජොධාතුං සමාපජ්ජිත්වා නීචතරං භගවතො.

අථ ඛො ආයස්මතො **මහාකස්සපස්ස** එතදහොසි: කහං නු ඛො භගවා එතරහි විහරතීති. අද්දසා ඛො ආයස්මා මහාකස්සපො භගවන්තං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන තස්ස බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසින්නං තෙජොධාතුං සමාපන්නං. දිස්වාන සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි. අථ ඛො ආයස්මා මහාකස්සපො දක්ඛිණං දිසං නිස්සාය තස්ස බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසීදි, තෙජොධාතුං සමාපජ්ජිත්වා නීචතරං භගවතො.

අථ ඛො ආයස්මතො **මහාකප්පිනස්ස** එතදහොසි: කහං නු ඛො භගවා එතරහි විහරතීති. අද්දසා ඛො ආයස්මා මහාකප්පිනො භගවන්තං දිබ්බෙන චක්ඛුනා -පෙ- බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසින්නං තෙජොධාතුං සමාපන්නං. දිස්වාන සෙය්‍යථාපි නාම බලවා පුරිසො -පෙ- එවමෙව ජෙතවනෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි. අථ ඛො ආයස්මා මහාකප්පිනො පච්ඡිමං දිසං නිස්සාය තස්ස බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසීදි, තෙජොධාතුං සමාපජ්ජිත්වා නීචතරං භගවතො.

අථ ඛො ආයස්මතො **අනුරුද්ධස්ස** එතදහොසි: කහං නු ඛො භගවා එතරහි විහරතීති. අද්දසා ඛො ආයස්මා අනුරුද්ධො භගවන්තං දිබ්බෙන -පෙ- අථ ඛො ආයස්මා අනුරුද්ධො උත්තරං දිසං නිස්සාය තස්ස බ්‍රහ්මුනො උපරිවෙහාසං පල්ලඞ්කෙන නිසීදි, තෙජොධාතුං සමාපජ්ජිත්වා නීචතරං භගවතො.

අථ ඛො ආයස්මා **මහාමොග්ගල්ලානො** තං බ්‍රහ්මානං ගාථාය අජ්ඣභාසි:

අජ්ජාපි තෙ ආවුසො සා දිට්ඨි යා තෙ දිට්ඨි පුරෙ අහු,
පස්සසි වීතිවත්තන්තං බ්‍රහ්මලොකෙ පභස්සරන්ති.[2]

---

1. උපනිස්සාය - සී මු. 2. පරියන්තානි - ස්‍යා.

ඉක්බිති ආයුෂමත් **මහමුගලන්** තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වැඩවසත සේක් දැයි මේ සිත විය. ආයුෂමත් මහමුගලන් තෙරනුවෝ ඒ බඹහුගේ මත්තෙහි අහස තේජෝධාතු සමවතට සමවැද පලඟින් වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ මිනිසැස ඉක්මවා පැවැති පිරිසිදු දිවැසින් දුටහ. දක යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද; දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එපරිද්දෙන් දෙව්රම්හි අතුරුදන් වූවාහු ඒ බඹලොව පහළ වූහ.

ඉක්බිති ආයුෂමත් මහමුගලන් තෙරනුවෝ තේජෝධාතු සමවතට සමවැද පෙරදිග ඇසුරු කොට, භාග්‍යවතුන් වහන්සේට යටත්සේ ඒ බඹහුගේ මත්තෙහි අහස පලඟින් වැඩ හුන්හ.

ඉක්බිති ආයුෂමත් **මහාකස්සප** තෙරනුවන්ට භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වැඩවසත සේක් දැයි මේ සිත විය. ආයුෂමත් මහාකස්සප තෙරනුවෝ තේජෝධාතු සමවතට සමවැද ඒ බඹහුගේ මත්තෙහි අහස පයඞ්කයෙන් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ මිනිසැස ඉක්මවා පැවැති පිරිසිදු දිවැසින් දුටහ. දක යම් සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එපරිද්දෙන් දෙව්රම්හි අතුරුදන් වූවාහු ඒ බඹලොව පහළ වූහ. එකල්හි ආයුෂමත් මහසුප් තෙරනුවෝ දකුණු දිග ඇසුරු කොට භාග්‍යවතුන් වහන්සේට යටත්සේ ඒ බඹහුගේ මත්තෙහි අහස තේජෝධාතු සමවතට සමවැද පයඞ්කයෙන් වැඩ හුන්හ.

ඉක්බිති ආයුෂමත් **මහාකප්පින** තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වැඩවසත සේක් දැ යි මේ සිත විය. ආයුෂමත් මහාකප්පින තෙරනුවෝ තේජෝධාතු සමවතට සමවැද බඹහුගේ මත්තෙහි අහස පලඟින් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ... දිවසින් දුටහ. දක යම් සේ බලවත් පුරුෂයෙක් ... එපරිද්දෙන් දෙව්රම්යි අතුරුදන් වූවාහු ඒ බඹලොව පහළ වූහ, ඉක්බිති ආයුෂමත් මහාකප්පින තෙරනුවෝ පැසුලු දිග ඇසුරු කොට භාග්‍යවතුන් වහන්සේට යටත්සේ ඒ බඹහුගේ මත්තෙහි අහස තේජෝධාතුවට සමවැද පලඟින් වැඩ හුන්හ.

ඉක්බිති ආයුෂමත් **අනුරුද්ධ** තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වැඩවෙසෙත සේක් දැ යි මේ සිත විය. ආයුෂමත් අනුරුද්ධ තෙරනුවෝ භාග්‍යවතුන් වහන්සේ ... දිවැසින් දුටහ. ... ඉක්බිති ආයුෂමත් අනුරුද්ධ තෙරනුවෝ උතුරුදිග ඇසුරු කොට භාග්‍යවතුන් වහන්සේට යටත්සේ ඒ බඹහුගේ මත්තෙහි අහස තේජෝධාතු සමවතට සමවැද පලඟින් වැඩ හුන්හ.

ඉක්බිති ආයුෂමත් **මහමුගලන්** තෙරනුවෝ ඒ බඹහට ගාථායෙන් වදාළහ.

ඇවැත්නි, පෙර තාගේ යම් දෘෂ්ටියෙක් වී ද, තාගේ ඒ දෘෂ්ටිය අදත් තිබේ ද, බඹලොව (ප්‍රභා) මැඩ පවත්වමින් බබලන බුදුරජාතන් වහන්සේ දකිහි.

[බ්‍රහ්මා:]

න මෙ මාරිස සා දිට්ඨි යා මෙ දිට්ඨි පුරෙ අහු,
පස්සාමි වීතිවත්තන්තං බ්‍රහ්මලොකෙ පභස්සරං,
ස්වාහං අජ්ජ කථං වජ්ජං අහං නිච්චොම්හි සස්සතොති

අථ ඛො භගවා තං බ්‍රහ්මානං සංවෙජෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව තස්මිං බ්‍රහ්මලොකෙ අන්තරහිතො ජෙතවනෙ පාතුරහොසි.

අථ ඛො සො බ්‍රහ්මා අඤ්ඤතරං බ්‍රහ්මපාරිසජ්ජං ආමන්තෙසි: එහි ත්වං මාරිස යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එවං වදෙහි: අත්ථි නු ඛො මාරිස මොග්ගල්ලාන අඤ්ඤෙපි තස්ස භගවතො සාවකා එවං මහිද්ධිකා එවං මහානුභාවා, සෙය්‍යථාපි නාම[1] භවං මොග්ගල්ලානො කස්සපො කප්පිනො අනුරුද්ධොති. එවං මාරිසාති ඛො සො බ්‍රහ්මපාරිසජ්ජො තස්ස බ්‍රහ්මුනො පටිස්සුත්වා[2] යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: අත්ථි නු ඛො මාරිස මොග්ගල්ලාන අඤ්ඤෙපි තස්ස භගවතො සාවකා එවං මහිද්ධිකා එවං මහානුභාවා, සෙය්‍යථාපි නාම භවං මොග්ගල්ලානො කස්සපො කප්පිනො අනුරුද්ධොති

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං බ්‍රහ්මපාරිසජ්ජං ගාථාය අජ්ඣභාසි:

තෙවිජ්ජා ඉද්ධිපත්තා[3] ච චෙතොපරියායකොවිදා,
ඛීණාසවා අරහන්තො බහූ බුද්ධස්ස සාවකාති.

අථ ඛො සො බ්‍රහ්මපාරිසජ්ජො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා යෙන සො බ්‍රහ්මා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං බ්‍රහ්මානං එතදවොච: ආයස්මා මාරිස මහාමොග්ගල්ලානො එවමාහ:

"තෙවිජ්ජා ඉද්ධිපත්තා ච චෙතොපරියායකොවිදා,
ඛීණාසවා අරහන්තො බහූ බුද්ධස්ස සාවකා"ති.

ඉදමවොච සො බ්‍රහ්මපාරිසජ්ජො අත්තමනො ච සො බ්‍රහ්මා තස්ස බ්‍රහ්මපාරිසජ්ජස්ස භාසිතං අභිනන්දීති.

6. 1. 6

පමාදසුත්තං

177. *එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

1. නාම ඉති න දිස්සති - මජසං - PTS. 2 පටිස්සුණිත්වා - සයා. 3 ඉද්ධිපත්තා - මජසං - සයා.

* සාවත්ථිනිදානං - මජසං

[බ්‍රහ්මයා:]

නිදුකාණෙනි, පෙර මාගේ යම් දෘෂ්ටියෙක් වී ද, ඒ දෘෂ්ටිය (දැන්) නැත. මේ බඹලොව (ප්‍රභා) මැඩ සිටුමින් බබලන බුදුරජාණන් වහන්සේ දකිමි. ඒ මම අද නිත්‍ය වෙමියි ශාශ්වත වෙමියි කෙසේ කියම් ද.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ බඹහට සංවේග දනවා යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම ඒ බඹලොව අතුරුදන් වූ සේක් දෙව්රම්හි පහළ වූ සේක.

ඉක්බිති ඒ බ්‍රහ්ම තෙමේ එක්තරා අතැවැසි බ්‍රහ්මයකු ඇමතීය. "නිදුකාණෙනි, එව තෝ ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වෙත එළඹෙව. එළඹ මහමුගලන් තෙරුන්ට නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, භවත් මොග්ගල්ලාන, කස්සප, කප්පින අනුරුද්ධ තෙරවරුන් වැනි මෙසේ මහත් ඍද්ධි ඇති මහත් අනුභාව ඇති ඒ භාග්‍යවතුන් වහන්සේගේ වෙනත් සව්වෝත් ඇද්දැයි මෙසේ කියව"යි. ඒ අතැවැසි බඹ තෙමේ නිදුකාණෙනි, එසේ යයි ඒ බඹහට පිළිතුරු දී ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට "නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, භවත් මොග්ගල්ලාන කස්සප කප්පින අනුරුද්ධ තෙරවරුන් මෙන් මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති භාග්‍යවතුන් වහන්සේගේ වෙනත් සව්වෝත් ඇද්ද"යි මෙය කී ය.

ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරනුවෝ ඒ අතැවැසි බඹහට ගාථායෙන් වදාළහ

ත්‍රිවිද්‍යා ඇති ඍද්ධිවිධඥනයට පැමිණි පරසිත් දැනීමෙහි දක්ෂ වූ ක්ෂය කළ ආශ්‍රව ඇති රහත් වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ බොහෝ හ.

ඉක්බිති ඒ අතැවැසි බඹ තෙමේ ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ගේ වචනය පිළිගෙණ අනුමෝදන් ව ඒ බඹු වෙත එළඹියේ ය. එළඹ ඒ බඹුහට මෙය කීය. නිදුකාණෙනි, ආයුෂ්මත් මහමුගලන් තෙරනුවෝ මෙසේ කීහ.

"ත්‍රිවිද්‍යා ඇති ඍද්ධිවිධඥනයට පැමිණි පරසිත් දැනීමෙහි දක්ෂ වූ ක්ෂය කළ ආශ්‍රව ඇති රහත් වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ බොහෝ හ"යි.

ඒ අතැවැසි බඹ තෙමේ මෙය කීය. සතුටු සිත් ඇති ඒ බඹ තෙමේ ඒ අතැවැසි බඹහුගේ භාෂිතය පිළිගත්තේ ය.

6. 1. 6.

පමාදසුත්‍රය.

177. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක.

තෙන ඛො පන සමයෙන භගවා දිවාවිහාරගතො හොති පටිසල්ලීනො. අථ ඛො **සුබ්‍රහ්මා** ච පච්චෙකබ්‍රහ්මා **සුද්ධාවාසො** ච පච්චෙකබ්‍රහ්මා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා පච්චෙකං[1] ද්වාරබාහං උපනිස්සාය අට්ඨංසු. අථ ඛො සුබ්‍රහ්මා පච්චෙකබ්‍රහ්මා සුද්ධාවාසං පච්චෙකබ්‍රහ්මානං එතදවොච: අකාලො ඛො තාව මාරිස භගවන්තං පයිරුපාසිතුං දිවාවිහාරගතො භගවා පටිසල්ලීනො ච. අසුකො ච බ්‍රහ්මලොකො ඉද්ධො චෙව ඵීතො ච. බ්‍රහ්මා ච තත්‍ර පමාදවිහාරං විහරති. ආයාම මාරිස යෙන සො බ්‍රහ්මලොකො තෙනුපසඞ්කමිස්සාම උපසඞ්කමිත්වා තං බ්‍රහ්මානං සංවෙජෙය්‍යාමා[2]ති. එවං මාරිසාති ඛො සුද්ධාවාසො පච්චෙකබ්‍රහ්මා සුබ්‍රහ්මුනො පච්චෙකබ්‍රහ්මුනො පච්චස්සොසි.

අථ ඛො සුබ්‍රහ්මා ච පච්චෙකබ්‍රහ්මා සුද්ධාවාසො ච පච්චෙකබ්‍රහ්මා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව භගවතො පුරතො අන්තරහිතා තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහෙසුං[3].

අද්දසා ඛො සො බ්‍රහ්මා තෙ බ්‍රහ්මානො දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන තෙ බ්‍රහ්මානො එතදවොච: හන්ද කුතො නු තුම්හෙ මාරිසා ආගච්ඡථාති.

අථ ඛො මයං මාරිස ආගච්ඡාම[4] තස්ස භගවතො සන්තිකා අරහතො සම්මාසම්බුද්ධස්ස. ගච්ඡෙය්‍යාසි පන ත්වං මාරිස තස්ස භගවතො උපට්ඨානං අරහතො සම්මාසම්බුද්ධස්සාති.

එවං වුත්තෙ[5] ඛො සො බ්‍රහ්මා තං වචනං අනධිවාසෙන්තො සහස්සක්ඛත්තුං අත්තානං අභිනිම්මිනිත්වා සුබ්‍රහ්මානං පච්චෙකබ්‍රහ්මානං එතදවොච: පස්සසි මෙ නො ත්වං මාරිස එවරූපං ඉද්ධානුභාවන්ති.

පස්සාමි ඛො ත්‍යාහං මාරිස එවරූපං ඉද්ධානුභාවන්ති.

සො ඛ්වාහං මාරිස එවං මහිද්ධිකො එවං මහානුභාවො කස්ස අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා උපට්ඨානං ගමිස්සාමීති.

අථ ඛො සුබ්‍රහ්මා පච්චෙකබ්‍රහ්මා ද්විසහස්සක්ඛත්තුං අත්තානං අභිනිම්මිනිත්වා තං බ්‍රහ්මානං එතදවොච: පස්සසි මෙ නො ත්වං මාරිස එවරූපං තං[6] ඉද්ධානුභාවන්ති.

පස්සාමි ඛො ත්‍යාහං මාරිස එවරූපං ඉද්ධානුභාවන්ති.

තයා ච ඛො මාරිස මයා ච සෙව්ව භගවා මහිද්ධිකතරො චෙව මහානුභාවතරො ච. ගච්ඡෙය්‍යාසි ත්වං මාරිස තස්ස භගවතො උපට්ඨානං අරහතො සම්මාසම්බුද්ධස්සාති.

අථ ඛො සො බ්‍රහ්මා සුබ්‍රහ්මානං පච්චෙකබ්‍රහ්මානං ගාථාය අජ්ඣභාසි:

---

1. පච්චෙකද්වාරබාහං - PTS. 2. සංවෙජෙස්සාමාති - සී 1. 2. 3. පාතුරහංසු - සී 1. 2.
4. ආගතා ඛො මයං මාරිස අම්හ - මජ්ඣං. 5. වුත්තො - සතා. 6. 'තං' ඉති නදිස්සතෙ - මජ්ඣං, PTS.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ දිවාවිහරණයට පැමිණිසේක් චිත්ත-විවේකයෙන් වැඩහුන් සේක. ඉක්බිති පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම ද පච්චේක-බ්‍රහ්ම වූ සුද්ධාවාස ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ වෙන වෙන ම දොර බා ඇසුරැ කොට සිටියහ. ඉක්බිති පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම තෙමේ පච්චේකබ්‍රහ්ම වූ සුද්ධාවාසහට "නිදුකානෙනි, භාග්‍යවතුන් වහන්සේ දිවාවිහාර ගත වූ සේක් චිත්තවිවේකයෙන් වැඩහුන් සේක. (එහෙයින් ඒ) භාග්‍යවතුන් වහන්සේ ඇසුරැ කරන්නට තව කල් නොවේ.

"අසුවල් බඹලොව (ධ්‍යානසුඛයෙන්) සමෘද්ධවූයේත් (අභිඥ පුෂ්පයෙන්) පිපියේත් වෙයි. බ්‍රහ්ම තෙමේ ද එහි ප්‍රමාදවිහරණයෙන් වාසය කෙරෙයි නිදුකානෙනි, යම්හ ඒ බඹලොව කරා එළඹෙන්නෙමු. එළඹ ඒ බඹහට සංවේග දනවන්නෙමු"යි මෙය කීය. පච්චේකබ්‍රහ්ම වූ සුද්ධාවාස තෙමේ නිදුකානෙනි, එසේය යි පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්මහට පිළිවදන් ඇස්වීය.

ඉක්බිති පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම තෙමේ ද පච්චේකබ්‍රහ්ම වූ සුද්ධාවාස තෙමේ ද යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද එසෙයින් භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි අතුරුදන් වූවාහු ඒ බඹලොව පහළ වූහ.

ඒ බ්‍රහ්ම තෙමේ එන්නා වූ ඒ බ්‍රහ්මයන් දුරදී ම දුක්කේය. දැක ඒ බ්‍රහ්මයන්ට "නිදුකානෙනි, දැන් තෙපි කොහි සිට එවු ද"යි මෙය කීය.

එකල්හි නිදුකානෙනි, අපි ඒ භාග්‍යවත් අතීත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේ සමීපයෙහි සිට එමු. නිදුකානෙනි, තෙපි ඒ භාග්‍යවත් අතීත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේට උවටැන් කිරීමට යන්නහු ද?

මෙසේ කියන ලද ඒ බඹ තෙමේ ඒ වදන නො ඉවසමින් දහස් වරක් තමා මවා ගෙණ පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්මහට නිදුකානෙනි, තොපි මාගේ මෙබඳු වූ ඍද්ධ්‍යනුභාවය නො දකිවු ද යි මෙය කී ය.

නිදුකානෙනි, මම තොපගේ මෙබඳු ඍද්ධ්‍යනුභාවය දකිම් ම ය.

නිදුකානෙනි, ඒ මම මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙම් මෙබඳු මහත් අනුභාව ඇත්තෙම් අන් කවර මහණකුට හෝ බමුණකුට හෝ උවටැන් කිරීමට යන්නෙම් ද?

ඉක්බිති පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම තෙමේ දෙදහස් වරක් තමා මවා ගෙණ ඒ බඹහට නිදුකානෙනි, තෙපි මාගේ මෙබඳු ඍද්ධ්‍යනුභාවය නො දකිවු ද"යි මෙය කී ය.

නිදුකානෙනි, මම තොපගේ මෙබඳු ඍද්ධ්‍යනුභාවය දකිම් ම ය.

නිදුකානෙනි, තොපට ද අපට ද වඩා ඒ භාග්‍යවතුන් වහන්සේ ම මහත් ඍද්ධින් ඇති සේක. මහත් අනුභාවත් ඇති සේක. නිදුකානෙනි, තෙපි ඒ භාග්‍යවත් අතීත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේගේ උවටැනට යවු.

ඉක්බිති ඒ බඹ තෙමේ පච්චේකබ්‍රහ්ම වූ සුබ්‍රහ්මහට ගාථායෙන් කී ය.

තයො සුපණ්ණා චතුරො ච හංසා බ්‍යග්ඝිනියා පඤ්චසතා ච ඣායිනො,
තයිදං විමානං ජලතෙ[1] ච බ්‍රහ්මෙ ඔභාසයං උත්තරස්සං දිසායන්ති.

කිඤ්චාපි තෙ තං ජලතෙ විමානං ඔභාසයං උත්තරස්සං දිසායං,
රූපෙ රණං දිස්වා සදා පවෙධිතං තස්මා න රූපෙ රමතී සුමෙධොති.

අථ ඛො සුබ්‍රහ්මා ච පච්චෙකබ්‍රහ්මා සුද්ධාවාසො ච පච්චෙකබ්‍රහ්මා තං බ්‍රහ්මානං සංවෙජෙත්වා තත්ථෙවන්තරධායිංසු. අගමාසි ච ඛො සො බ්‍රහ්මා අපරෙන සමයෙන භගවතො උපට්ඨානං අරහතො සම්මාසම්බුද්ධස්සාති.

6. 1 7.

කොකාලිකසුත්තං.

178. සාවත්ථියං—

තෙන ඛො පන සමයෙන භගවා දිවාවිහාරගතො හොති පටිසල්ලීනො. අථ ඛො සුබ්‍රහ්මා ච පච්චෙකබ්‍රහ්මා සුද්ධාවාසො ච පච්චෙකබ්‍රහ්මා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා පච්චෙකං ද්වාරබාහං නිස්සාය අට්ඨංසු. අථ ඛො සුබ්‍රහ්මා පච්චෙකබ්‍රහ්මා කොකාලිකං භික්ඛුං ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

අප්පමෙය්‍යං පමිනන්තො කො'ධ විද්වා විකප්පයෙ,
අප්පමෙය්‍යං පමායිනං නිවුතං[2] තං[3] මඤ්ඤෙහං පුථුජ්ජනන්ති.

6. 1. 8.

කතමොරකතිස්සසුත්තං.

179. සාවත්ථියං—

තෙන ඛො පන සමයෙන භගවා දිවාවිහාරගතො හොති පටිසල්ලීනො. අථ ඛො සුබ්‍රහ්මා ච පච්චෙකබ්‍රහ්මා සුද්ධාවාසො ච පච්චෙකබ්‍රහ්මා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා පච්චෙකං ද්වාරබාහං නිස්සාය අට්ඨංසු. අථ ඛො සුද්ධාවාසො පච්චෙකබ්‍රහ්මා කතමොරකතිස්සං භික්ඛුකං ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

අප්පමෙය්‍යං පමිනන්තො කො'ධ විද්වා විකප්පයෙ,
අප්පමෙය්‍යං පමායිනං නිවුතං තං මඤ්ඤෙහං අකිස්සවන්ති.

---

1. ජලති - ස්‍යා සී 2 2. නිබ්බුතං - ස්‍යා, නිවුතං මඤ්ඤෙහං - PTS. 3. කතමොදකතිස්ස - මජ්සං

තුන්සියක් ගුරුළුරූ නොහොත් ගුරුළුපඬකාති ද, හාරසියක් හංසරූප නොහොත් හංසපඬකාති ද, පන්සියක් ව්‍යාඝ්‍රසදෘශ මෘගරූප නොහොත් වගවැලු ද ධ්‍යායී වූ මාගේ (විමානයෙහි වෙත්) බ්‍රහ්මය, ඒ මේ විමන උතුරුදික්හි ආලොක කරමින් බබලයි. (මෙසේ ඉසුරුමත් මම අන්-කවරකුට නම් උවටැන් කරන්නෙම් ද?)

වැලි තොපගේ මේ විමන උතුරුදික්හි ආලෝක කෙරෙමින් බබලා ද (එහෙත්) රූපයෙහි දෙෂය ද, හැමකල්හි කම්පිත බවද දැක එහෙයින් මනා නුවණැත්තෝ රූපයෙහි නො ඇලෙයි.

ඉක්බිති පච්චෙකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම ද පච්චෙකබ්‍රහ්ම වූ සුද්ධාවාස ද ඒ බඹහට සංවේග දනවා එහි ම අතුරුදන් වූහ. පසු කලෙක ඒ බඹ තෙමේ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාතන් වහන්සේගේ උවටැනට ගියේ ද විය.

6. 1. 7.

කොකාලිකසූත්‍රය.

178. **සැවැත්නුවර—**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ දිවාවිහාරය පිණිස වැඩිසේක් විවෙකී වූ සේක. එකල්හි පච්චෙකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම තෙමේ ද පච්චෙකබ්‍රහ්ම වූ සුද්ධාවාස තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ. එළඹ වෙන් වෙන් දෙරබා ඇසුරු කොට සිටියහ. ඉක්බිති පච්චෙකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම තෙමේ කොකාලික මහණ ඇරබ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කී ය.

මේ ලෝකයෙහි කවර නම් නුවණැත්තෙක් අප්‍රමෙය වූ ක්ෂීණාස්‍රවයා පමණ කෙරෙමින් කල්පනා කරන්නේ ද, අප්‍රමෙය වූ ක්ෂීණාස්‍රවයන් පමණ කරන්නාවූ ඒ පෘථග්ජනයා අවකුජ්ජපඤ්ඤ පුද්ගලයෙකැයි හඟිමි.

6. 1. 8.

කතමොරකතිස්සසූත්‍රය.

179. **සැවැත්නුවර—**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ දිවාවිහාරය පිණිස වැඩිසේක් විවෙකී වූ සේක. එකල්හි පච්චෙකබ්‍රහ්ම වූ සුබ්‍රහ්ම තෙමේ ද පච්චෙකබ්‍රහ්ම වූ සුද්ධාවාස තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ. එළඹ වෙන් වෙන් දෙරබා ඇසුරු කොට සිටිය හ. ඉක්බිති පච්චෙකබ්‍රහ්ම වූ සුද්ධාවාස තෙමේ කතමොරකතිස්සක මහණහු ඇරබ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කී ය.

මේ ලෝකයෙහි කවර නම් නුවණැත්තෙක් අප්‍රමෙය වූ ක්ෂීණාස්‍රවයා පමණ කෙරෙමින් කල්පනා කරන්නේ ද, අප්‍රමෙය වූ ක්ෂීණාස්‍රවයන් පමණ කරන්නා වූ ඔහු අවකුජ්ජපඤ්ඤ වූ අඥනයෙකැ යි හඟිමි.

6. 1. 9

තුදුබ්‍රහ්ම[1]සුත්තං.

180. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන **කොකාලිකො** භික්ඛු ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො තුදුපච්චෙකබ්‍රහ්මා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන කොකාලිකො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වෙහාසං ඨිතො කොකාලිකං භික්ඛුං එතදවොච: පසාදෙහි කොකාලික සාරිපුත්ත-මොග්ගල්ලානෙසු චිත්තං. පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

කොසි ත්වං ආවුසොති? අහං තුදුපච්චෙකබ්‍රහ්මාති. න නු[2] ත්වං ආවුසො භගවතා අනාගාමී බ්‍යාකතො. අථ කිඤ්චරහි[3] ඉධාගතො[4]. පස්ස යාවඤ්ච තෙ ඉදං අපරද්ධන්ති.

පුරිසස්ස හි ජාතස්ස කුඨාරී[5] ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

අප්පමත්තො[6] අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

සතං සහස්සානං නිරබ්බුදානං ඡත්තිංසති පඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී[7] නිරයං උපෙති වාචං මනඤ්ච පණිධාය පාපකන්ති.

6. 1. 10.

දුතියකොකාලික සුත්තං.

181. **සාවත්ථියං**—

අථ ඛො **කොකාලිකො**[8] භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: පාපිච්ඡා භන්තෙ සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසඞ්ගතාති.

එවං වුත්තෙ භගවා කොකාලිකං භික්ඛුං එතදවොච: මාහෙවං කොකාලික අවච. මා හෙවං කොකාලික අවච. පසාදෙහි කොකාලික සාරිපුත්ත-මොග්ගල්ලානෙසු චිත්තං. පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

1. තුරූබ්‍රහ්ම - මජ්ඣසං. 2. කිංනු - ස්‍යා. 3. කථංචරහි - ස්‍යා. 4. ඉධාගතොසි - ස්‍යා. 5. කුධාරි - ස්‍යා. 6. අප්පමත්තකො - මජ්ඣසං. PTS. 7. යමරියෙ ගරහී - ස්‍යා. 8 කොකාලිකො - සී 1, 2.

6. 1. 9.

තුදුබ්‍රහ්මසූත්‍රය.

180. සැවැත්නුවර—

එකල්හි කෝකාලික මහණ තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ අධිමාත්‍ර කොට ගිලන් වූයේ වේ. ඉක්බිති මහා ජව්වණී ඇති තුදු නම් පච්චේකබ්‍රහ්ම තෙමේ රැ පෙරයම් ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා කොකාලික මහණ වෙත එළඹියේ ය. එළඹ අහස සිටියේ කොකාලික මහණහට මෙය කී ය. කොකාලික, සැරියුත් මුගලන් දෙතම කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ප්‍රියශීලී හ යි.

ඇවැත්නි, තෝ කවරෙහි ද? මම තුදුපච්චේකබ්‍රහ්ම වෙමි. ඇවත්නි, තෝ අනාගාමී යයි භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දේ නො වේ ද? එසේ ඇති කල්හි කුමකට මෙහි ආයෙහි ද? තා විසින් මේ කොතරම් අපරාධයෙක් කරණ ලද්දේ දැයි බලව.

අඥාන තෙමේ දුබැයි බෙණෙමින් යමෙකින් තමා සිඳී ද? උපන් (එබඳු) මිනිසා ගේ මුවෙහි (ඒ තමා නසන) කෙටේරිය හට ගණී.

යමෙක් නිඥා කටයුත්තා පසසා ද, යමෙක් පැසසිය යුත්තේ නම් ඔහුට නිඥා හෝ කෙරේ ද, හෙ තෙමේ මුවෙන් පව් රැස් කෙරේ. ඒ පවින් සුවයක් නො විඳී.

දූකෙළීම් ආදියෙහි යම් වස්තු පරාජයෙක් වේ ද, තමනුත් සමග සියලු දේ සම්බන්ධ (යම් පරිහාණියෙකුත් වේ ද,) ඒ අපරාධය ඉතා ස්වල්ප ය. යමෙක් ශෝභන ගති ඇත්තවුන් කෙරෙහි සිත දූෂට කරන්නේ ද, මෙය ම ඉතා මහත් අපරාධ යයි.

ආයඝීයන්ට ගරහන පුද්ගල තෙමේ ලාමක වූ වචන ද, සිත ද පිහිටුවා (ඒ හෙතුවෙන්) යම් නිරයකට පැමිණේ ද, (එහි ආයුෂ) නිරබ්බුද ලක්‍ෂයෙක් ද සතිසෙක් ද, අබ්බුද පසෙක් ද වෙත්.

6. 1. 10.

දුතියකොකාලිකසූත්‍රය.

181. සැවැත්නුවර—

එකල්හි කෝකාලික මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් කොකාලික මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. වහන්ස, සැරියුත් මුගලන් තෙරහු ලාමක ආශා ඇත්තෝ ය. ලාමක ආශාවන්ට වසඟ වූවෝ ය.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ කෝකාලික මහණහට මෙය වදාළ සේක. කෝකාලික, එසේ නො කියව. කෝකාලික, එසේ නො කියව. කෝකාලික, සැරියුත් මුගලන් දෙතම කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් දෙතම ප්‍රියශීලිහ.

දුතියම්පි ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: කිඤ්චාපි මෙ භන්තෙ භගවා සද්ධායිකො පච්චයිකො. අථ ඛො පාපිච්ඡාව සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතාති.

දුතියම්පි ඛො භගවා කොකාලිකං භික්ඛුං එතදවොච: මා හෙවං කොකාලික අවච මා හෙවං කොකාලික අවච. පසාදෙහි කොකාලික සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං. පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

තතියම්පි ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච -පෙ- පාපිකානං ඉච්ඡානං වසං ගතාති.

තතියම්පි ඛො භගවා කොකාලිකං භික්ඛුං එතදවොච -පෙ- පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

අථ ඛො කොකාලිකො භික්ඛු උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අචිරපක්කන්තස්ස ච කොකාලිකස්ස භික්ඛුනො සාසපමත්තීහි පිළකාහි[1] සබ්බො කායො ඵුටො[2] අහොසි. සාසපමත්තියො හුත්වා මුග්ගමත්තියො අහෙසුං. මුග්ගමත්තියො හුත්වා කලායමත්තියො[3] අහෙසුං කලායමත්තියො[4] හුත්වා කොලට්ඨිමත්තියො අහෙසුං. කොලට්ඨිමත්තියො හුත්වා කොලමත්තියො අහෙසුං. කොලමත්තියො හුත්වා ආමලකමත්තියො අහෙසුං. ආමලකමත්තියො හුත්වා බෙලුව[4]සලාටුකමත්තියො අහෙසුං. බෙලුවසලාටුකමත්තියො හුත්වා බිල්ලමත්තියො අහෙසුං. බිල්ලමත්තියො හුත්වා පභිජ්ජිංසු. පුබ්බඤ්ච ලොහිතඤ්ච පග්ඝරිංසු. අථ ඛො කොකාලිකො භික්ඛු තෙනෙව ආබාධෙන කාලමකාසි. කාලකතො ච කොකාලිකො භික්ඛු පදුමනිරයං[5] උපපජ්ජි. සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වා.

අථ ඛො බ්‍රහ්මා සහම්පති අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො බ්‍රහ්මා සහම්පති භගවන්තං එතදවොච: කොකාලිකො භන්තෙ භික්ඛු කාලමකාසි[6]. කාලකතො ච භන්තෙ කොකාලිකො භික්ඛු පදුමං නිරයං උපපන්නො සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වාති. ඉදමවොච බ්‍රහ්මා සහම්පති ඉදං වත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං බ්‍රහ්මා සහම්පති අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති මං එතදවොච: කොකාලිකො භන්තෙ භික්ඛු කාලමකාසි. කාලකතො ච භන්තෙ කොකාලිකො භික්ඛු පදුමනිරයං උපපන්නො සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වාති. ඉදමවොච භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

1. පිළකාහි - මජසං. සයා 2. ඵුටො - සයා 3. කලායමත්තියො - සිමු. සයා
4. වෙලුව - සයා. 5. පදුමං නිරයං - මජසං. 6. කාලඞ්කතො - මජසං.

දෙවනුවට ද කෝකාලික මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා විසින් ඇදහියයුතු වචන ඇත්තාහු ම ය. විශ්වාස කටයුතු වචන ඇත්තාහු ම ය. එතෙකුදු වුවත් සැරියුත්මුගලන් තෙරහු ලාමක ආශා ඇත්තාහු ම ය. ලාමක ආශාවන්ගේ වශයට ගියාහු ම යයි.

දෙවනුවට ද භාග්‍යවතුන් වහන්සේ කෝකාලික මහණහට මෙය වදාළ සේක: "කෝකාලික, එසේ නොකියව. කෝකාලික, එසේ නොකියව. කෝකාලික, සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත පහදව. සැරියුත්මුගලන් තෙරහු ප්‍රියශීලීහ"යි.

තෙවනුවට ද කෝකාලික මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය ... ලාමක ආශාවන්ගේ වශයට ගියාහු යි.

තෙවනුවට ද භාග්‍යවතුන් වහන්සේ කෝකාලික මහණහට මෙය වදාළ සේක. .. සැරියුත්මුගලන් තෙරහු ප්‍රියශීලීහ" යි.

ඉක්බිති කෝකාලික මහණ තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය. ගිය නොබෝ කල් ඇති කෝකාලික මහණහුගේ මුළුකය අබ පමණ වූ ගඩුයෙන් පතුළේ විය. අබ පමණ ව මුං පමණ වූහ මුං පමණ ව මෑ පමණ වූහ. මෑ පමණ ව ඩෙබරඇට පමණ වූහ. ඩෙබරඇට පමණ ව ඩෙබර පමණ වූහ. ඩෙබර පමණ ව ඇඹුළුපක් පමණ වූහ. ඇඹුලුපක් පමණ ව බෙලිබොබොළු පමණ වූහ. බෙලිබොබොළු පමණ ව බෙලි පමණ වූහ. බෙලි පමණ ව බිඳුනාහු ය. පූයාව ද ලේ ද වැගුරුණහ. ඉක්බිති කෝකාලික මහණ තෙමේ ඒ රෝගයෙන් ම කලුරිය කෙළේ ය. කලුරිය කළ කෝකාලික මහණ තෙමේ සැරියුත්-මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ පදුම් නිරයට පැමිණියේ ය.

ඉක්බිති මනා ජිවිවණී ඇති සහම්පති බ්‍රහ්ම තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සහම්පති බ්‍රහ්ම තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. වහන්ස, කෝකාලික මහණ තෙමේ කලුරිය කෙළේ ය. වහන්ස, කලුරිය කළ කොකාලික මහණ තෙමේ සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ පදුමනිරයට පැමිණියේ යයි. සහම්පති බ්‍රහ්ම තෙමේ මෙය කී ය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැය ඉක්ම යැමෙන් භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, මේ රැය මනා ජිවිවණී ඇති සහම්පති බ්‍රහ්ම තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු දෙව්රම බබුලුවා මා වෙත එළඹියේ ය. එළඹ මට වැඳ එකත්පසෙක සිටියේ ය. මහණෙනි, එකත්පසෙක සිටි සහම්පති බ්‍රහ්ම තෙමේ මට මෙය කී ය. වහන්ස, කොකාලික මහණ තෙමේ කලුරිය කෙළේ ය. වහන්ස, කලුරිය කළ කොකාලික මහණ තෙමේ සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ පදුම්නිරයට පැමිණියේ යයි. මහණෙනි, සහම්පති බ්‍රහ්ම තෙමේ මෙය කී ය. මෙය කියා මට වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වී ය.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: කීවදීඝං නු ඛො භන්තෙ පදුමනිරයෙ ආයුප්පමාණන්ති. දීඝං ඛො භික්ඛු පදුමනිරයෙ ආයුප්පමාණං, තං න සුකරං සඞ්ඛාතුං — එත්තකානි වස්සානි ඉති වා, එත්තකානි වස්සසතානි ඉති වා, එත්තකානි වස්සසහස්සානි ඉති වා, එත්තකානි වස්සසතසහස්සානි ඉති වාති. සක්කා පන භන්තෙ උපමං[1] කාතුන්ති. සක්කාති භික්ඛූති භගවා අවොච.

සෙය්‍යථාපි භික්ඛු වීසතිඛාරිකො කොසලකො තිලවාහො, තතො පුරිසො වස්සසතස්ස වස්සසතස්ස[2] අච්චයෙන එකමෙකං තිලං උද්ධරෙය්‍ය. ඛිප්පතරං ඛො සො භික්ඛු වීසතිඛාරිකො කොසලකො තිලවාහො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, නත්වෙව එකො අබ්බුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අබ්බුදා නිරයා,[3] එවමෙකො නිරබ්බුදො නිරයො[4]. සෙය්‍යථාපි භික්ඛු වීසති නිරබ්බුදා නිරයා, එවමෙකො අබබො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අබබා නිරයා, එවමෙකො අටටො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අටටා නිරයා, එවමෙකො අහහො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අහහා නිරයා, එවමෙකො කුමුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති කුමුදා නිරයා, එවමෙකො සොගන්ධිකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති සොගන්ධිකා නිරයා, එවමෙකො උප්පලො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති උප්පලා[5] නිරයා, එවමෙකො පුණ්ඩරීකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති පුණ්ඩරීකා නිරයා, එවමෙකො පදුමො නිරයො. පදුමං ඛො පන භික්ඛු නිරයං කොකාලිකො භික්ඛු උපපන්නො සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වාති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

අප්පමත්තො[6] අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

සතං සහස්සානං නිරබ්බුදානං ඡත්තිංසති පඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී නිරයං උපෙති වාචං මනඤ්ච පණිධාය පාපකන්ති.

කොකාලිකවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

ආයාචනං ගාරවො බ්‍රහ්මදෙවො බකො ච බ්‍රහ්මා අපරා ච දිට්ඨි,
පමාද කොකාලිකතිස්සකො ච තුදු ච බ්‍රහ්මා අපරො ච කොකාලිකොති.

1. උපමා - සීමු 2. 2. වස්සසහස්සස්ස - සයා, සී 1. 2. 3. අබ්බුදෙ නිරයො - සයා.
4. නිරබ්බුදනිරයො - මජසං. 5. උප්පලකා - සීමු 2 6. අප්පමත්තකො - මජසං.

මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. වහන්ස, පදුමනිරයෙහි ආයුඃප්‍රමාණය කොපමණ දිග ද? මහණෙනි, පදුමනිරයෙහි ආයුඃප්‍රමාණය දිග ම ය. එය වර්ෂ මෙපමණයයි කියා හෝ වර්ෂ මෙතෙක් සියයෙකැයි කියා හෝ වර්ෂ මෙතෙක් දහසෙකැයි කියා හෝ වර්ෂ මෙතෙක් ලක්‍ෂයෙකැයි කියා හෝ ගණන් කරන්නට පහසු නො වේ. වහන්ස, උපමාවක් කරන්නට හැක්කේ ද? මහණ හැකි යයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

මහණ, යම්සේ කොසොල්රට ගණනින් විංශත්ඛාරියක් ගන්නා තලයාළෙක් වේ ද, පුරුෂයෙක් සියවසක් සියවසක් ඇවෑමෙන් එයින් එක් එක් තලඇටය ඉවත දමන්නේ නම්, මහණ, කොසොල්රට ගණනින් විසිඛාරියක් ඇති ඒ තලයාළ මේ උපක්‍රමයෙන් වහා ගෙවීමට අවසන් වීමට යන්නේ ය. (එහෙත්) එක් අබ්බුද නිරයක ආයුෂය නො ගෙවෙන්නේ ම ය. මහණ, අබ්බුද නිරය විස්සෙක ආයුඃප්‍රමාණය යම් බඳු ද, එක් නිරබ්බුද නිරයෙක ආයුඃප්‍රමාණය එබඳු ය. මහණ, නිරබ්බුද නිරය විස්සෙක් යම් බඳු ද, එක් අබබ නිරයෙක් එබඳු වෙයි. මහණ, අබබනිරය විස්සෙක් යම් බඳු ද, එක් අටට නිරයෙක් එබඳු වෙයි. මහණ, අටටනිරය විස්සෙක් යම්සේ ද. එක් අහහ නිරයෙක් එසේ ය. මහණ, අහහ නිරය විස්සෙක් යම් සේ ද, එක් කුමුද නිරයෙක් එසේ ය. මහණ, කුමුද නිරය විස්සෙක් යම්සේ ද එක් සොගන්ධික නිරයෙක් එසේ ය. මහණ, සොගන්ධික නිරය විස්සෙක් යම්සේ ද, එක් උප්පලනිරයෙක් එසේ ය. මහණ, උප්පලනිරය විස්සෙක් යම්සේ ද, එක් පුණ්ඩරීක නිරයෙක් එසේ ය. මහණ පුණ්ඩරීක නිරය විස්සෙක් යම්සේ ද, එක් පදුම නිරයෙක් එසේ ය. මහණ, කොකාලික මහණ තෙමේ සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත වෛර බැඳ (ඒ) පදුම නිරයට පැමිණියේයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදාරා නැවත ද මෙය වදාළ සේක.

අඥාන තෙමේ දුබැසි බෙණෙමින් යමෙකින් තමා සිඳී ද, උපන් (එබඳු) මිනිසාගේ මුවෙහි (ඒ තමා සසන) කෙටේරිය හටගණී,

යමෙක් නින්දා කටයුත්තා පසසා ද, යමෙක් පැසසිය යුත්තේ නම් ඔහුට නින්දා හෝ කෙරේ ද, හෙ තෙමේ මුවෙන් පව් රැස් කෙරෙයි. ඒ පවින් සුවයක් නො විඳී.

දූකෙළීම් ආදියෙහි යම් වස්තු පරාජයෙක් වේ ද, තමනුත් සමග සියලු දෙය සම්බන්ධ (යම් පරිහානියකුත් වේද,) ඒ අපරාධය ඉතා ස්වල්ප ය. යමෙක් සෝභන ගති ඇත්තවුන් කෙරෙහි සිත දූෂ්‍ය කරන්නේ ද, මෙය ම ඉතා මහත් අපරාධ යයි.

ආර්‍ය්‍යයන්ට ගරහන පුද්ගල තෙමේ ලාමක වූ වචන ද සිත ද, පිහිටුවා (ඒ හෙතුවෙන්) යම් නිරයකට පැමිණේ ද, එහි ආයුෂය නිරබ්බුද ලක්‍ෂයෙක් ද සතිසෙක් ද අබ්බුද පසෙක් ද වේත්.

කොකාලික වර්ගය පළමු වැනියි.

උද්දානය:

ආයාචන, ගාරව, බ්‍රහ්මදෙව, බකබ්‍රහ්ම, අපරාදිට්ඨි, පමාද, කොකාලික, තිස්සක, තුදුබ්‍රහ්ම, අනෙක් කොකාලික සූත්‍ර යයි සූත්‍ර දශයෙකි.

2. පරිනිබ්බාණවග්ගො.

6. 2. 1.

සනඞ්කුමාරසුත්තං.

182. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **සප්පිනීතීරෙ** අථ ඛො බ්‍රහ්මා **සනඞ්කුමාරො** අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං සප්පිනීතීරං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො බ්‍රහ්මා සනඞ්කුමාරො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො සො සෙට්ඨො දෙවමානුසෙති.

ඉදමවොච බ්‍රහ්මා සනඞ්කුමාරො, සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො බ්‍රහ්මා සනඞ්කුමාරො සමනුඤ්ඤො මෙ සත්ථාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

6. 2. 2

දෙවදත්තසුත්තං.

183. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ අචිරපක්කන්තෙ දෙවදත්තෙ. අථ ඛො බ්‍රහ්මා **සහම්පති** අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ගිජ්ඣකූටං පබ්බතං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො බ්‍රහ්මා සහම්පති දෙවදත්තං ආරබ්භ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං[1]
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථාති.

6. 2. 3.

අන්ධකවින්දසුත්තං.

184. එකං සමයං භගවා **මගධෙසු**[2] විහරති **අන්ධකවින්දෙ**. තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අජ්ඣොකාසෙ[3] නිසින්නො හොති. දෙවො ච එකමෙකං ඵුසායති.

අථ ඛො බ්‍රහ්මා **සහම්පති** අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං අන්ධකවින්දං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො බ්‍රහ්මා සහම්පති භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

---

1 නලං - PTS. 2. මාගධෙසු - මජසං 3. අබ්භොකාසෙ - මජසං.

2. පරිනිබ්බාණ වග්ගය.

6. 2. 1.

සනඞකුමාරසූත්‍රය.

182. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **සප්පිනී** ගංතෙර වැඩවසන සේක. එකල්හි මනා ඡවිවණ් ඇති **සනඞකුමාර** බ්‍රහම තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු සප්පිනී ගංතෙර බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සනඞකුමාර බ්‍රහම තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය.

ප්‍රජායෙහි යම් කෙනෙක් වංශය සලකත්තාහු ද (ඔවුන් අතුරෙන්) ක්‍ෂත්‍රිය තෙමේ ශ්‍රෙෂ්ඨ යි. ත්‍රිවිද්‍යාවෙන් හා පසළොස්වරණ ධර්මයන් ගෙන් යුක්ත වූ ඒ ක්‍ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ දෙව් මිනිසුන් අතරෙහි ශ්‍රෙෂ්ඨ වේ.

සනඞකුමාර බ්‍රහම තෙමේ මෙය කී ය: ශාස්තෲන් වහන්සේ අනුමෝදන් වූ සේක. ඉක්බිති සනඞකුමාර බ්‍රහම තෙමේ ශාස්තෲන් වහන්සේ මාගේ වචනය අනුමෝදන් වූ සේකැ යි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් විය.

6. 2. 2.

දේවදත්තසූත්‍රය.

183. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **දෙව්දත්** සස්තෙන් බැහැර ගිය නො බොහෝ කලැ ම **රජගහනුවර** සමීපයෙහි **ගිජුකුළුපව්වෙහි** වැඩවසන සේක. එකල්හි මනා ඡවිවණ් ඇති **සහම්පති** බ්‍රහම තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු ගිජුකුළුපව්ව බබුලුවා භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සහම්පති බ්‍රහම තෙමේ දෙව්දතු ඇරබ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය,

යම්සේ ඵලය තෙමේ ඒකාන්තයෙන් කෙසෙල්ගස නසා ද, ඵලය තෙමේ මහහුණ නසා ද, ඵලය රනහුණ නසා ද, දරුගැබ (ගද්‍රභයාට දාව උපන් තනඹු) වෙළෙඹ නසා ද, එසෙයින් ම සත්කාරය තෙමේ නීචයා පුරුෂයා නසයි.

6. 2. 3.

අන්ධකවින්දසූත්‍රය.

184. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **මගදරට අන්ධකවින්ද** ගම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොල් අඳුරෙහි අබවස වැඩ හුන් සේක. මෙසය ද එකී එකී පොද හෙළයි.

එකල්හි මනා ඡවිවණ් ඇති **සහම්පති** බ්‍රහම තෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු අන්ධකවින්දය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සහම්පති බ්‍රහම තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කී ය.

සෙවෙථ පන්තානි සෙනාසනානි[1] චරෙය්‍ය සංයොජනවිප්පමොක්ඛා;
සචෙ රතිං නාධිගච්ඡෙය්‍ය තත්ථ සඞ්ඝෙ වසෙ රක්ඛිතත්තො සතීමා[2].

කුලාකුලං පිණ්ඩිකාය චරන්තො ඉන්ද්‍රියගුත්තො නිපකො සතීමා[2],
සෙවෙථ පන්තානි සෙනාසනානි භයා පමුත්තො අභයෙ විමුත්තො.

යත්ථ භෙරවා සිරිංසපා[3] විජ්ජු සඤ්චරති ථනෙති[4] දෙවො,
අන්ධකාරතිමිසාය රත්තියා නිසීදි තත්ථ භික්ඛු විගතලොමහංසො.

ඉදං හි ජාතු මෙ දිට්ඨං නයිදං ඉතිහීතිහං,
එකස්මිං බ්‍රහ්මචරියස්මිං සහස්සං මච්චුහායිනං.

භියො[5] පඤ්චසතා සෙඛා දසා ච දසධා දස,
සබ්බෙ සොතසමාපන්නා අතිරච්ඡානගාමිනො.

අථායං ඉතරා පජා පුඤ්ඤභාගාති මෙ මනො,
සඞ්ඛාතුං නොපි සක්කොමි මුසාවාදස්ස ඔත්තපෙති[6].

6. 2. 4.

අරුණවතිසුත්තං.

185. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ රාජා අහොසි **අරුණවා** නාම. රඤ්ඤො ඛො පන භික්ඛවෙ අරුණවතො **අරුණවතී** නාම රාජධානී අහොසි. අරුණවතිං[7] ඛො පන භික්ඛවෙ රාජධානිං[8] **සිඛී** භගවා අරහං සම්මාසම්බුද්ධො උපනිස්සාය විහාසි. සිඛිස්ස ඛො පන භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස **අභිභූසම්භවං** නාම සාවකයුගං අහොසි. අග්ගං භද්දයුගං.

අථ ඛො භික්ඛවෙ සිඛී භගවා අරහං සම්මාසම්බුද්ධො අභිභුං භික්ඛුං ආමන්තෙසි: ආයාම බ්‍රාහ්මණ යෙන අඤ්ඤතරො බ්‍රහ්මලොකො තෙනුපසඞ්කමිස්සාම, යාව භත්තස්ස කාලො භවිස්සති. එවං භන්තෙති ඛො භික්ඛවෙ අභිභූ භික්ඛු සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පච්චස්සොසි.

අථ ඛො භික්ඛවෙ සිඛී භගවා අරහං සම්මාසම්බුද්ධො අභිභූ ච භික්ඛු සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව අරුණවතියා රාජධානියා අන්තරහිතා තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහෙසුං.

---

1. සයනාසනානි - සසා. 2. සතිමා - සීමු 1. PTS. 3. සරීසපා - මජසං. 4. එහයන්ති - මජසං. 5. භීයො - සාළුවි. 6 ඔහනාපෙන්ති - මජසං. සසා 7 අරුණවතියං - PTS. 8. රාජධානියං - PTS.

ගැඹුරු වල සෙනසුන් සෙවුනේ ය. සංයෝජනයන් ගෙන් මිදීම පිණිස හැසිරෙන්නේ ය. එහි ඉදින් ඇල්මක් නොලබන්නේ නම් රක්නා ලද සිත් ඇතිව (සබ්‍රම්සරුන් නො ගවා) සිහි ඇති ව සඞ්ඝයා අතර වෙසෙන්නේ ය.

ගෝපනය කරණ ලද ඉඳුරන් ඇති ව තීරණප්‍රඥ ඇති ව සිහි ඇති ව කුලයෙන් කුලයට පිඬු පිණිස හැසිරෙමින් ප්‍රාන්ත වූ වනසෙනසුන් සෙවුනේ ය. සසරබියෙන් මිදුනේ නිවණෙහි අධිමුක්ත ව (වසන්නේ ය.)

යම් තැනෙක බිහිසුනු අරමුණුත් සපියෝත් වෙද් ද. විදුලිය ලෙළෙයි ද, මෙසය ගිගිරි කෙරේ ද, මහණ තෙමේ එහි රෑ ගණඳුරෙහි පහවූ ලොමුදහ ගැණුම් ඇතිව හුන්නේ ය.

මෙය වූ කලී මා විසින් ඒකාන්තයෙන් දක්නා ලද්දේ ය. මම මෙය මෙසේ මෙසේ යයි (තර්කාදි වශයෙන්) නො කියමි. එක් දහම් දෙසුමෙක මරු පරයා සිටි රහතුන් දහසෙක් ද (වෙයි.)

බොහෝ සේ ශෛක්ෂයෝ පන්සියයෙක් ද දශයෙක් ද සියයෙක් ද (වෙති) සියල්ලෝ මාර්ගස්‍රෝතසට පැමිණියාහු අවිනිපාත ස්වභාව ඇත්තෝ වෙති. යලි මේ අන්‍යප්‍රජා තොමෝ පිණට හිමි යයි මාගේ අදහසයි. (ඔවුන්) ගණින්නට නො හැක්කෙමි. බොරුවට (මා අසුවෙතැයි) බිමි.

6. 2. 4.

අරුණවතීසූත්‍රය.

185. මා විසින් මෙසේ අසන ලදි: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬුසිටුහුගේ** අරමෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්සැයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

පෙරවූවක් කියමි. මහණෙනි, **අරුණවත්** නම් රජෙක් විය. මහණෙනි, අරුණවත් රජහට **අරුණවතී** නම් රාජධානියෙක් විය. මහණෙනි, භාග්‍යවත් අර්හත් **සිඛී** සම්මාසම්බුදුරජාතන් වහන්සේ අරුණවතී රාජධානිය ඇසුරු කොට වැඩවිසූ සේක. මහණෙනි, භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාතන් වහන්සේට **අභිභූසම්භව** නම් අග්‍ර වූ භද්‍රයුගලය වූ ශ්‍රාවක යුගලයෙක් වී ය.

ඉක්බිති භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාතන් වහන්සේ අභිභූ මහණ ඇමතූ සේක. "බමුණ, යමු බත් වේලාව යම්තාක් වේ ද, එක්තරා බඹලොවකට එළඹෙන්නෙමු"යි. මහණෙනි, අභිභූ මහණ තෙමේ වහන්ස, එසේ යයි භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාතන් වහන්සේට පිළිවදන් ඇස්වී ය.

මහණෙනි, ඉක්බිති භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාතන් වහන්සේ ද අභිභූ මහණ තෙමේ ද යම්සේ බලවත් පුරුෂයෙක් හකුළු-අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම අරුණවතී රාජධානියෙන් අතුරුදන් වූවාහු ඒ බඹලොව පහළ වූහ.

අථ ඛො භික්ඛවෙ සිඛී භගවා අරහං සම්මාසම්බුද්ධො අභිභුං භික්ඛුං ආමන්තෙසි: පටිභාතු තං බ්‍රාහ්මණ බ්‍රහ්මුනො ච බ්‍රහ්මපරිසාය ච බ්‍රහ්මපාරිසජ්ජානඤ්ච ධම්මී කථාති. එවං භන්තෙති ඛො භික්ඛවෙ අභිභූ භික්ඛු සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පටිස්සුත්වා බ්‍රහ්මානඤ්ච බ්‍රහ්මපරිසඤ්ච බ්‍රහ්මපාරිසජ්ජෙ ච ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා ච බ්‍රහ්මපරිසා ච බ්‍රහ්මපාරිසජ්ජා ච උජ්ඣායන්ති ඛීයන්ති[1] විපාචෙන්ති: අච්ඡරියං වත භො අබ්භුතං වත භො, කථං හි නාම සත්ථරි සම්මුඛීභූතෙ සාවකො ධම්මං දෙසෙස්සතීති.

අථ ඛො භික්ඛවෙ සිඛී භගවා අරහං සම්මාසම්බුද්ධො අභිභුං භික්ඛුං ආමන්තෙසි: උජ්ඣායන්ති ඛො තෙ බ්‍රාහ්මණ බ්‍රහ්මා ච බ්‍රහ්මපරිසා ච බ්‍රහ්මපාරිසජ්ජා ච. අච්ඡරියං වත භො අබ්භුතං වත භො, කථං හි නාම සත්ථරි සම්මුඛීභූතෙ සාවකො ධම්මං දෙසෙස්සතීති. තෙන හි ත්වං බ්‍රාහ්මණ භිය්‍යොසොමත්තාය බ්‍රහ්මානඤ්ච බ්‍රහ්මපරිසඤ්ච බ්‍රහ්මපාරිසජ්ජෙ ච සංවෙජෙහීති.

එවං භන්තෙති ඛො භික්ඛවෙ අභිභූ භික්ඛු සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පටිස්සුත්වා දිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි. අදිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි. දිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඪකායෙන අදිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඪකායෙන ධම්මං දෙසෙසි. දිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඪකායෙන අදිස්සමානෙන පි[2] හෙට්ඨිමෙන උපඩ්ඪකායෙන ධම්මං දෙසෙසි.

තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා ච බ්‍රහ්මපරිසා ච බ්‍රහ්මපාරිසජ්ජා ච අච්ඡරියබ්භුතචිත්තජාතා අහෙසුං: අච්ඡරියං වත භො අබ්භුතං වත භො, සමණස්ස මහිද්ධිකතා මහානුභාවතාති.

අථ ඛො භික්ඛවෙ අභිභූ භික්ඛු සිඛිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: අභිජානාමි ඛ්වාහං භන්තෙ භික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ එවරූපං වාචං භාසිතා, පහොමි ඛ්වාහං ආවුසො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සිලොකධාතුං[3] සරෙන විඤ්ඤාපෙතුන්ති.

එතස්ස බ්‍රාහ්මණ කාලො එතස්ස බ්‍රාහ්මණ කාලො යං ත්වං බ්‍රාහ්මණ බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙය්‍යාසි.

එවං භන්තෙති ඛො භික්ඛවෙ අභිභූ භික්ඛු සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පටිස්සුත්වා බ්‍රහ්මලොකෙ ඨිතො ඉමා ගාථායො අභාසි:

ආරභථ[4] නික්ඛමථ[5] යුඤ්ජථ බුද්ධසාසනෙ,
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො.

1. ඛිය්‍යන්ති - මජසං. 2. අදිස්සමානෙන - මජසං. 3 සහස්සි - මජසං. 4 ආරබ්භථ - මජසං, ස්‍යා, PTS. 5. නික්කමථ - මජසං

මහණෙනි, ඉක්බිති භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාණන් වහන්සේ අභිභූ මහණ ඇමතූ සේක: බමුණ, බඹහට ද බඹපිරිසට ද අනැවැසි බමුන්ට ද දැහැමි කථාවෙක් තොපට වැටහේවා"යි. මහණෙනි, අභිභූ මහණ තෙමේ වහන්ස එසේ යයි භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාණන් වහන්සේට පිළිවදන් අස්වා බඹු ද බඹ පිරිස ද අනැවැසි බමුන් ද දැහැමි-කථායෙන් කරුණු දක්වී ය සමාදන් කරවී ය. උත්සාහවත් කරවී ය සතුටු කරවී ය.

මහණෙනි, එහි දී බඹු ද බඹපිරිස ද අනැවැසි බඹහු ද "පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයෙකි! පින්වත්නි, ඒකාන්තයෙන් අද්භූතයෙකි. ශාස්තෲන් වහන්සේ ඉදිරියෙහි ඇති කල්හි කෙසේ නම් සව්වෙක් දහම් දෙසා දැ යි අවමන් කෙරෙත්, ගරහත්, දොස් පහළ කෙරෙත්.

මහණෙනි, ඉක්බිති භාග්‍යවත් අර්හත් සිඛී සම්මාසම්බුදුරජාණන් වහන්සේ අභිභූ මහණ ඇමතූ සේක. බමුණ, බඹු ද බඹපිරිස ද අනැවැසි බඹහු ද "පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයෙකි පින්වත්කි, ඒකාන්තයෙන් අද්භූතයෙකි. ශාස්තෲන් වහන්සේ ඉදිරියෙහි ඇති කල්හි කෙසේ නම් සව්වෙක් දහම් දෙසා දැ"යි තොපට අවමන් කෙරෙත්. බමුණ, එසේ වී නම් තෙපි බඹු ද බඹපිරිස ද අනැවැසි බමුන් ද බොහෝ සෙයින් සංවේගයට පමුණුවව්"යි.

මහණෙනි, අභිභූ මහණ තෙමේ වහන්ස, එසේ යයි භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට පිළිවදන් අස්වා පෙණෙන කයින් යුක්තව ද දහම් දෙසී ය. නොපෙණෙන කයින් යුක්තව ද දහම් දෙසී ය. පෙණෙන යටිඅඩකයින් යුක්තව ද නොපෙණෙන උඩ අඩකයින් යුක්තව ද දහම් දෙසී ය. පෙණෙන උඩ කයින් යුක්තව ද නොපෙණෙන යට අඩකයින් යුක්තව ද දහම් දෙසී ය.

මහණෙනි, එහි දී බඹු ද බඹපිරිස ද අනැවැසි බඹහු ද මහණහුගේ මහත් ඍද්ධි ඇතිබව මහත් අනුභාව ඇති බව පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයෙකි පින්වත්නි, ඒකාන්තයෙන් අද්භූතයෙකි"යි ආශ්චර්යාද්භූත සිත් ඇත්තෝ වූහ.

මහණෙනි, ඉක්බිති අභිභූ මහණ තෙමේ භාග්‍යවත් අර්හත් සම්මා-සම්බුදුරජාණන් වහන්සේට වහන්ස, මම භික්ෂුසඟන මැද ඇවැත්නි, මම බඹලොව සිටියෙම් සහස්‍රීලෝකධාතුව සරයෙන් හඟවන්නට (සටහඬ පතුරු වන්නට සමර්ත්මි"යි මෙබඳු වචනයක් කීයෙම් දනිම් ම යයි මෙය කී ය.

බමුණ, තෙපි යම් හෙයෙකින් බඹලොව සිටියාහු සහස්‍රීලෝකධාතුව සරයෙන් හඟවන්නහු නම් බමුණ, මෙයට කාලය යි. බමුණ, මෙයට කාලය යි.

මහණෙනි, අභිභූ මහණ තෙමේ වහන්ස, එසේ යයි භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට පිළිවදන් අස්වා බඹලොව සිටියේ මේ ගාථා කී ය.

ආරම්භවීර්යය කරවූ, නිෂ්ක්‍රමණවීර්යය කරවූ, බුදුසසුනෙහි යෙදෙවූ, ඇතෙක් බටදඹුයෙන් කළ ගෙයක් වනසන්නාක් මෙන් මරසෙනඟ නසවූ

යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති[1]
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සතීති.

අථ ඛො භික්ඛවෙ සිඛී ච භගවා අරහං සම්මාසම්බුද්ධො අභිභූ ච භික්ඛු බ්‍රහ්මානඤ්ච බ්‍රහ්මපරිසඤ්ච බ්‍රහ්මපාරිසජ්ජෙ ච සංවෙජෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව තස්මිං බ්‍රහ්මලොකෙ අන්තරහිතා අරුණවතියා රාජධානියා පාතුරහෙසුං.

අථ ඛො භික්ඛවෙ සිඛී භගවා අරහං සම්මාසම්බුද්ධො භික්ඛූ ආමන්තෙසි: අස්සුත්ථ නො තුම්හෙ භික්ඛවෙ අභිභුස්ස භික්ඛුනො බ්‍රහ්මලොකෙ ඨිතස්ස ගාථායො භාසමානස්සාති. අස්සුම්හ ඛො මයං භන්තෙ අභිභුස්ස භික්ඛුනො බ්‍රහ්මලොකෙ ඨිතස්ස ගාථායො භාසමානස්සාති. යථා කථං පන තුම්හෙ භික්ඛවෙ අස්සුත්ථ අභිභුස්ස භික්ඛුනො බ්‍රහ්මලොකෙ ඨිතස්ස ගාථායො භාසමානස්සාති. එවං ඛො මයං භන්තෙ අස්සුම්හ[2] අභිභුස්ස භික්ඛුනො බ්‍රහ්මලොකෙ ඨිතස්ස ගාථායො භාසමානස්ස.

"ආරභථ නික්කමථ යුඤ්ජථ බුද්ධසාසනෙ,
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො.

යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති,
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සතී"ති.

එවං ඛො මයං භන්තෙ අස්සුම්හ[2] අභිභුස්ස භික්ඛුනො, බ්‍රහ්මලොකෙ ඨිතස්ස ගාථායො භාසමානස්සාති.

සාධු සාධු භික්ඛවෙ. සාධු ඛො තුම්හෙ භික්ඛවෙ අස්සුත්ථ අභිභුස්ස භික්ඛුනො බ්‍රහ්මලොකෙ ඨිතස්ස ගාථායො භාසමානස්සාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

6. 2. 5.

පරිනිබ්බාණසුත්තං.

186. එවං මෙ සුතං: එකං සමයං භගවා කුසිනාරායං විහරති උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං පරිනිබ්බාණසමයෙ. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: හන්ද දානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථාති. අයං තථාගතස්ස පච්ඡිමා වාචා.

අථ ඛො භගවා පඨමජ්ඣානං[3] සමාපජ්ජි. පඨමජ්ඣානා වුට්ඨහිත්වා දුතිය[4]ජ්ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා තතිය[5]ජ්ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථ[6]ජ්ඣානං සමාපජ්ජි.

චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා ආකාසානඤ්චායතනං සමාපජ්ජි. ආකාසානඤ්චායතනා වුට්ඨහිත්වා විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජි. විඤ්ඤාණඤ්චායතනා වුට්ඨහිත්වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජි. ආකිඤ්චඤ්ඤායතනා වුට්ඨහිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනා වුට්ඨහිත්වා සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජි.

---

1. විහෙස්සති - මජසං. 2. අස්සුමහා සයා. 3. පඨමං ඣානං - මජසං. PTS.
4 දුතියං - මජසං. PTS. 5, තතියං - මජසං. PTS 6. චතුත්ථං - මජසං. PTS.

යමෙක් මේ සස්නෙහි අප්‍රමත්ත ව වෙසෙත්තේ ද (හෙ තෙමේ) ජාතිය හා සංසාරය දුරු කොට දුක් කෙළවර කරන්නේ ය.

මහණෙනි, ඉක්බිති භාග්‍යවත් අභිභූ සිඛී සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ ද, අභිභූ මහණ තෙමේ ද බඹුන් බඹපිරිසත් අකැමැතිබඹුනුත් සංවෙගයට පමුණුවා යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම ඒ බඹලොව අතුරුදන් වූවාහු අරුණවතී රාජධානියෙහි පහළ වූහ.

මහණෙනි, ඉක්බිති භාග්‍යවත් අභිභූ සිඛී සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ භික්ෂූන් ඇමතු සේක. මහණෙනි, තෙපි බඹලොව සිට අභිභූ මහණ ගාථා කියද්දී නොඇසුහු ද? වහන්ස, අපි අභිභූ මහණ බඹලොව සිට ගාථා කියද්දී ඇසුම්හ. මහණෙනි, තෙපි අභිභූ මහණ බඹලොව සිට ගාථා කියද්දී ඒ කෙසේ නම් ඇසුහු ද? වහන්ස, අපි අභිභූ මහණ බඹලොව සිට ගාථා කියද්දී මෙසේ ඇසුම්හ.

ආරම්භවීර්‍යය කරව්, නිෂ්ක්‍රමණවීර්‍යය කරව්. බුද්ධසසුන්හි යෙදෙව්. ඇතකු බටදඬුගෙයක් වනසන්නාක් මෙන් මරසෙනග නසව්.

යමෙක් මෙසස්නෙහි අප්‍රමත්තව වෙසෙන්නේ ද (හෙ තෙමේ) ජාතිය හා සංසාරය දුරු කොට දුක් කෙළවර කරන්නේ ය.

වහන්ස, අපි අභිභූ මහණ බඹලොව සිට ගාථා කියද්දී මෙසේ ඇසුම්හ.

මහණෙනි, මැනවි, මැනවි. මහණෙනි, තෙපි අභිභූ මහණ බඹලොව සිට ගාථා කියද්දී ඇසුහු ය. මැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව පිළිගත්හ.

6. 2. 5.

පරිනිබ්බාණසූත්‍රය.

186, මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් සමයෙහි **කුසිනාරානුවර උපවත්තන** නම් වූ **මල්ල**රජුන්ගේ සල්උයනෙහි සල්රුක්යුවල අතරෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතු සේක: මහණෙනි; දැන් වනාහි තොප අමතමි. සංස්කාරයෝ නැසෙන සුල්ලහ. අප්‍රමාදයෙන් සම්පාදනය .කරව්. මෙය තථාගතයන් වහන්සේගේ අන්තිම වචනයයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමධ්‍යානයට සමවන් සේක. ප්‍රථමධ්‍යානයෙන් නැගිට ද්විතීයධ්‍යානයට සමවන් සේක. ද්විතීයධ්‍යානයෙන් නැගිට තෘතීයධ්‍යානයට සමවන් සේක. තෘතීයධ්‍යානයෙන් නැගිට චතුර්ථධ්‍යානයට සමවන් සේක.

චතුර්ථධ්‍යානයෙන් නැගිට ආකාසානඤ්චායතනයට සමවන් සේක. ආකාසානඤ්චායතනයෙන් නැගිට විඤ්ඤාණඤ්චායතනයට සමවන් සේක. විඤ්ඤාණඤ්චායතනයෙන් නැගිට ආකිඤ්චඤ්ඤායතනයට සමවන් සේක. ආකිඤ්චඤ්ඤායතනයෙන් නැගිට නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන් සේක. නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් නැගිට සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන් සේක.

සඤ්ඤාවෙදයිතනිරොධා වුට්ඨහිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනා වුට්ඨහිත්වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජි. ආකිඤ්චඤ්ඤායතනා වුට්ඨහිත්වා විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජි. විඤ්ඤාණඤ්චායතනා වුට්ඨහිත්වා ආකාසානඤ්චායතනං සමාපජ්ජි. ආකාසානඤ්චායතනා වුට්ඨහිත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා තතියජ්ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා දුතියජ්ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා පඨමජ්ඣානං සමාපජ්ජි.

පඨමජ්ඣානා වුට්ඨහිත්වා දුතියජ්ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා තතියජ්ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා සමනන්තරා භගවා පරිනිබ්බායි.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා බ්‍රහ්මා සහම්පති ඉමං[1] ගාථං අභාසි:

සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං,
යත්ථ[2] එතාදිසො සත්ථා ලොකෙ අප්පටිපුග්ගලො,
තථාගතො බලප්පත්තො සම්බුද්ධො පරිනිබ්බුතොති.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා සක්කො දෙවානමින්දො ඉමං ගාථං අභාසි:

අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛොති

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා ආයස්මා ආනන්දො ඉමං ගාථං අභාසි:

තදාසි යං භිංසනකං තදාසි ලොමහංසනං,
සබ්බාකාරවරූපෙතෙ සම්බුද්ධෙ පරිනිබ්බුතෙති.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා ආයස්මා අනුරුද්ධො ඉමා ගාථායො අභාසි:

නාහු අස්සාසපස්සාසො ඨිතචිත්තස්ස තාදිනො,
අනෙජො සන්තිමාරබ්භ චක්ඛුමා පරිනිබ්බුතො.

අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි,
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහූති.

පරිනිබ්බාණ වග්ගො දුතියො

තත්‍රුද්දානං:

බ්‍රහ්මාසනං[3] දෙවදත්තො අන්ධකවින්දො අරුණවතී,
පරිනිබ්බාණෙන ච දෙසිතං ඉදං බ්‍රහ්මපඤ්චකන්ති.*

බ්‍රහ්මසංයුත්තං සමත්තං.

---

1. සමනන්තරං - මජ්ඣං. ස්‍යා. 2. යථ - මජ්ඣං - සතා 3. බ්‍රහ්මායාචනං - සීමු 2

* බ්‍රහ්මායාචනං අගාරවඤ්ච බ්‍රහ්මදෙවො බකො ච බ්‍රහ්මා,
අඤ්ඤතරො ච බ්‍රහ්මා කොකාලිකඤ්ච තිස්සකඤ්ච තුරූ ච,
බ්‍රහ්මා කොකාලිකභික්ඛු සනඞ්කුමාරෙන දෙවදත්තං,
අන්ධකවින්දං අරුණවතී පරිනිබ්බානෙන පණ්ණරසානි
අත්‍ර ඉමා ගාථායො දිස්සන්ති - මජ්ඣං.

සඤ්ඤාවේදයිත නිරෝධයෙන් නැගිට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත් සේක. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් නැගිට ආකිඤ්චඤ්ඤායතනයට සමවත් සේක. ආකිඤ්චඤ්ඤායතනයෙන් නැගිට විඤ්ඤාණඤ්චායතනයට සමවත් සේක. විඤ්ඤාණඤ්චායතනයෙන් නැගිට ආකාසානඤ්චායතනයට සමවත් සේක. ආකාසානඤ්චායතනයෙන් නැගිට චතුර්ථධ්‍යානයට සමවත් සේක. චතුර්ථධ්‍යානයෙන් නැගිට තෘතීයධ්‍යානයට සමවත් සේක. තෘතීයධ්‍යානයෙන් නැගිට ද්විතීයධ්‍යානයට සමවත් සේක. ද්විතීයධ්‍යානයෙන් නැගිට ප්‍රථමධ්‍යානයට සමවත් සේක.

ප්‍රථමධ්‍යානයෙන් නැගිට ද්විතීයධ්‍යානයට සමවත් සේක. ද්විතීයධ්‍යානයෙන් නැගිට තෘතීයධ්‍යානයට සමවත් සේක. තෘතීයධ්‍යානයෙන් නැගිට චතුර්ථධ්‍යානයට සමවත් සේක. චතුර්ථධ්‍යානයෙන් නැගිට ධ්‍යානයෙන් නැගිටීම සමග ම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි පිරිනිවණ සමග ම සහම්පති බ්‍රහ්ම තෙමේ මේ ගාථාව කී ය.

ලෝකයෙහි අප්‍රතිපුද්ගල වූ තථාගත වූ බලයට පැමිණියා වූ සියලු ධර්මයන් අවබෝධ කළා වූ මෙබඳු වූ ශාස්තෲන් වහන්සේ (පවා) යම් සේ පිරිනිවීසේක් ද (එසෙයින්) ලොකයෙහි සියලු සත්ත්වයෝ සිරුර බැහැර දමන්නාහු ය.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි පිරිනිවණ සමග ම සක්දෙව්රජ මේ ගාථාව කී ය.

සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යය හ. ඉපදීම හා නැසීම ස්වභාව කොට ඇත්තාහ. ඉපද නිරුද්ධ වෙත්. ඔවුන්ගේ සංසිඳීම සුව ය.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි පිරිනිවණ සමග ම ආයුෂ්මත් ආනන්ද තෙරනුවෝ මේ ගාථාව කීහ:

සියලු ආකාර උතුම් කරුණුවලින් සමන්විත වූ බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි ඒකෙණෙහි බිහිසුණු සිදුවීමෙක් විය. එකෙණෙහි ලොමුදහගැණුමෙක් විය.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි පිරිනිවණ සමග ම ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ මේ ගාථා කීහ:

සමාහිතසිත් ඇති තාදී ගුණවත් බුදුරජාණන් වහන්සේගේ ආශ්වාස-ප්‍රශ්වාසය නො වූයේ ය. අනෙජ (තෘෂ්ණා රහිත) වූ පසැස් ඇති බුදුරජාණන් වහන්සේ නිවණ ඇරබ පිරිනිවි සේක.

නොහැකුළුනු සිතින් වේදනාව ඉවසූ සේක. සිත පිළිබඳ මිදීම පහන නිවීම මෙන් විය.

පරිනිබ්බාණ වර්ගය දෙවෙනි යි.

එහි උද්දානය:

සනඞකුමාර, දෙවදත්ත, අන්ධකවින්ද, අරුණවතී, පරිනිබ්බාණ යයි මේ බ්‍රහ්මපඤ්චකය දෙශනා කරණ ලදී.

බ්‍රහ්මසංයුත්තය නිමියේය.

7. බ්‍රාහ්මණසංයුත්තං.

1. අරහන්තවග්ගො.

7. 1. 1.

ධනඤ්ජානීසුත්තං.

187. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස **ධනඤ්ජානී** නාම බ්‍රාහ්මණී අභිප්පසන්නා හොති බුද්ධෙ ච ධම්මෙ ච සඞ්ඝෙ ච.

අථ ඛො ධනඤ්ජානී බ්‍රාහ්මණී භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස භත්තං උපසංහරන්තී උපක්ඛලිත්වා[1] තික්ඛත්තුං උදානං උදානෙසි: 'නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස. නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස. නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්සා'ති.

එවං වුත්තෙ භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො ධනඤ්ජානිං බ්‍රාහ්මණිං එතදවොච: 'එවමෙවං පනායං වසලී යස්මිං වා තස්මිං වා තස්ස මුණ්ඩකස්ස සමණස්ස වණ්ණං භාසති. ඉදානි ත්‍යාහං වසලි තස්ස සත්ථුනො වාදං ආරොපෙස්සාමී'ති.

න ඛ්වාහං තං බ්‍රාහ්මණ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො තස්ස භගවතො වාදං ආරොපෙය්‍ය අරහතො සම්මාසම්බුද්ධස්ස. අපි ච ත්වං බ්‍රාහ්මණ ගච්ඡ ගන්ත්වා විජානිස්සසී'ති[2]

අථ ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො කුපිතො අනත්තමනො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කිං සු ඣත්වා[3] සුඛං සෙති කිං සු ඣත්වා න සොචති,
කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතමා'ති.

කොධං ඣත්වා සුඛං සෙති කොධං ඣත්වා න සොචති,
කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස බ්‍රාහ්මණ,
වධං අරියා පසංසන්ති තං හි ඣත්වා න සොචතී'ති.

---

1. උපක්කමිත්වා - සීමු. ස්‍යා. PTS. 2 ගන්ත්වාපි ජානිස්සසීති - ස්‍යා. 3. ජෙත්වා - මජසං, ස්‍යා, PIP.

7. බ්‍රාහ්මණසංයුත්තය.

1. අරහන්තවර්ගය.

7. 1. 1.

ධනඤ්ජානිසූත්‍රය.

187. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ-වසන සේක. එකල්හි භාරද්වාජ ගෝත්‍රයෙහි උපන් එක්තරා බමුණකුගේ ධනඤ්ජානී නම් බැමිණිය බුදුන් කෙරෙහි ද දහම් කෙරෙහි ද සඟුන් කෙරෙහි ද බෙහෙවින් පහන් වූවා වෙ යි.

ඉක්බිති ධනඤ්ජානී බැමිණිය භාරද්වාජගෝත්‍රබමුණාට බත් එළවන්නී පැකිළී "ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාතන් වහන්සේට නමස්කාර වේවා! ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාතන් වහන්සේට නමස්කාර වේවා! ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාතන් වහන්සේට නමස්කාර වේවා!"යි තෙවරක් උදන් ඇනී ය.

මෙසේ කී කල්හි භාරද්වාජගෝත්‍ර බමුණු ධනඤ්ජානී බැමිණියට මෙසේ ම මේ සැඩොලිය යම් ඒ තැනක දී හෝ යම් ඒ මුඩුමහණහුගේ ගුණ කියයි. සැඩොලිය, දැන් මම තිගේ ඒ ශාස්තෘහට වාද නගන්නෙමි යි මෙය කී ය.

බමුණ, යමෙක් භාග්‍යවත් අර්හත් ඒ සම්මාසම්බුද්ධරජාතන් වහන්සේට වාද නගන්නේ නම් මම එබන්දකු දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොව්හි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි නො ම දකිමි. එහෙත් බමුණ තෙපි යවු. ගොස් දැනගන්නහු යයි.

ඉක්බිති භාරද්වාජගෝත්‍ර බමුණු කිපියේ නොසතුටුසිත් ඇත්තේ භාග්‍ය-වතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් භාරද්වාජගොත්‍ර බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

ගෞතමයෙනි, කුමක් නසා සුවසේ හොවී ද? කුමක් නසා ශෝක නො කෙරේ ද? කිනම් එක් දහමක් නැසීම රුස්නෙහි ද?

බමුණ, ක්‍රෝධය නසා සුවසේ හොවී. ක්‍රෝධය නසා ශෝක නො කෙරෙයි. විෂසඞ්ඛ්‍යාත දුඃඛවිපාකයට මුල් වූ මිහිරි අග ඇති ක්‍රෝධය නැසීම ආර්‍ය්‍යයෝ පසසත්. ඒ ක්‍රෝධය නසා (සිව්යේ) ශෝක නො කෙරේ මැයි.

එවං වුත්තෙ භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං[1] භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

අලත්ථ ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං, අචිරූපසම්පන්නො ඛො පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං. නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

7. 1. 2.

අක්කොසසුත්තං.

188. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අස්සොසි ඛො අක්කොසකභාරද්වාජො බ්‍රාහ්මණො භාරද්වාජගොත්තො කිර බ්‍රාහ්මණො සමණස්ස ගොතමස්ස සන්තිකෙ අගාරස්මා අනගාරියං පබ්බජිතොති. කුපිතො අනත්තමනො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසති පරිභාසති.

එවං වුත්තෙ භගවා අක්කොසකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච: තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ අපි නු තෙ ආගච්ඡන්ති මිත්තාමච්චා ඤාතිසාලොහිතා අතිථියොති[2]. අප්පෙකදා මෙ භො ගොතම ආගච්ඡන්ති මිත්තාමච්චා ඤාතිසාලොහිතා අතිථියොති.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, අපි නු තෙසං අනුප්පදෙසි ඛාදනීයං වා භොජනීයං වා සායනීයං වාති?

අප්පෙකදා තෙසාහං භො ගොතම අනුප්පදෙමි ඛාදනීයං වා භොජනීයං වා සායනීයං වාති.

සචෙ ඛො පන තෙ බ්‍රාහ්මණ නප්පටිග්ගණ්හන්ති කස්ස තං හොතීති.

සචෙ තෙ භො ගොතම නප්පටිග්ගණ්හන්ති අම්හාකමෙව තං හොතීති

1. එවමෙව - ස්‍යා, සීමු. 2. අතිථයො - මජ්සං. ස්‍යා. PTS.

මෙසේ වදාළ කල්හි භාරද්වාජගෝත්‍රබමුණා භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිහුරු වූවක් උඩුහුරු කරන්නේ හෝ වේ ද? වැසුනු දෙයක් වැසුම් හරින්නේ හෝ වේ ද? මං මුළා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද? ඇස් ඇත්තෝ රූප දක්නාහු යයි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ වේ ද? එසෙයින් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් නියායෙන් දහම් පවසන ලදී. මේ මම භවත් ගෞතමයන් වහන්සේ ද, දහම ද බික්සඟන ද සරණ යෙමි. මම භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබම්වා උපසපුව ලබම්වා යි.

භාරද්වාජගෝත්‍රබමුණා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලද්දේ ය, උපසපුව ලද්දේ ය. උපසපන් වූ නොබෝකල් ඇති ආයුෂමත් භාරද්වාජ තෙමේ එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයේ නොපමාව කෙලෙස් තවන වෙර ඇතිව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව වෙසෙමින් යමක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ම ගිහිගෙන් නික්ම සස්නට පැමිණෙද් ද, මඟබඹසර කෙළවර කොට ඇති ඒ අභීත්‍ථය නොබෝ කලෙකින් ම මේ අත්බැව්හි ම තෙමේ ම මැනවින් දැන සාක්‍ෂාත් කොට ඊට පැමිණ විසී ය. ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී. සිවුමග කටයුතු කරණ ලදී. මේ රහත්බව පිණිස අනෙකෙක් නැතැයි දැනගත්තේ ය. ආයුෂමත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරු කෙනෙක් වූහ.

7. 1. 2.

අක්කොාස සූත්‍රය.

188. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. අක්කොාසක භාරද්වාජබමුණු තෙමේ භාරද්වාජගෝත්‍රබමුණා ගිහිගෙන් නික්ම ශ්‍රමණ ගෞතමයන් සමීපයෙහි සස්නෙහි පැවිදි වී යයි ඇසී ය. කිපියේ නොසතුටු සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට අසභ්‍ය වූ පරුෂ වචනයෙන් ආක්‍රොශ කෙරෙයි. පරිභව කෙරෙයි.

මෙසේ ආක්‍රොශ පරිභව කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ අක්කොාසක-භාරද්වාජබමුණාහට මෙය වදාළ සේක. බමුණ, ඒ කුමැයි හඟිහි ද? ආගන්තුක වූ තාගේ මිත්‍රාමාත්‍යයෝ සහලේ නෑයෝ (තා නිවසට) පැමිණෙද්ද? භවත් ගෞතමයෙනි, ආගන්තුක වූ මාගේ මිත්‍රාමාත්‍යයෝ සහලේ නෑයෝ ඇතැම් දිනෙක පැමිණෙති.

බමුණ, ඒ කුමැයි හඟිහි ද? ඔවුන්ට කැයුත්තක් හෝ බුදියයුත්තක් හෝ රස විඳියයුත්තක් හෝ දෙන්නෙහි ද?

භවත් ගෞතමයෙනි, මම ඔවුන්ට කැයුත්තක් හෝ බුදියයුත්තක් හෝ රස විඳියයුත්තක් හෝ ඇතැම් දිනෙක දෙමි.

බමුණ, ඉදින් ඔහු නො පිළිගණිත් තම් එය කාට වේ ද?

භවත් ගෞතමයෙනි ඉදින්, ඔහු නො පිළිගණිත් තම් එය අපට ම වෙයි.

එවමෙව ඛො බ්‍රාහ්මණ යං ත්වං අම්හෙ අනක්කොසන්තෙ අක්කොසසි, අරොසෙන්තෙ[1] රොසෙසි, අභණ්ඩන්තෙ භණ්ඩසි, තං තෙ මයං නප්පටිග්ගණ්හාම. තවෙවෙතං බ්‍රාහ්මණ හොතීති. යො ඛො බ්‍රාහ්මණ අක්කොසන්තං පච්චක්කොසති, රොසෙන්තං පටිරොසෙති, භණ්ඩන්තං පටිභණ්ඩති, අයං වුච්චති බ්‍රාහ්මණ සම්භුඤ්ජති වීතිහරති. තෙ මයං තයා නෙව සම්භුඤ්ජාම න වීතිහරාම. තවෙවෙතං බ්‍රාහ්මණ හොති, තවෙවෙතං බ්‍රාහ්මණ හොතීති.

[බ්‍රාහ්මණො:]

භවන්තං ඛො ගොතමං සරාජිකා පරිසා එවං ජානාති: අරහං සමණො ගොතමොති. අථ ච පන භවං ගොතමො කුජ්ඣතීති.

[භගවා:]

අක්කොධස්ස කුතො කොධො දන්තස්ස සමජීවිනො,
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො.

තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සඞ්කුපිතං ඤත්වා යො සතො උපසම්මති.

උභින්නං තිකිච්ඡන්තානං[2] අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදාති.

එවං වුත්තෙ අක්කොසකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, -පෙ- එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

අලත්ථ ඛො අක්කොසකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා අක්කොසකභාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

---

1. ආරොසෙන්තෙ - මජසං, සතා. 2. තිකිච්ඡන්තානං - සිමු.

බමුණ, එහෙයින් ම යම් හෙයෙකින් තෝ ආක්‍රෝශ නොකරණ අපට ආක්‍රෝශ කෙරෙහි ද? නොකිපෙන අපට කිපෙහි ද? භණ්ඩන නොතනන අපට භණ්ඩන තනහි ද? තාගේ ඒ ආක්‍රොශාදිය අපි නො පිළිගණිමු. බමුණ තෙල තට ම වෙයි. බමුණ, යමෙක් ආක්‍රොශ කරන්නහුට පෙරළා ආක්‍රොශ කෙරේ ද, කිපෙන්නහුට පෙරළා කිපේ ද, භණ්ඩන තනන්නහුට පෙරළා භණ්ඩන තනා ද, බමුණ, මේ තෙමේ එකතු ව අනුභව කෙරේ. උනුනට සමවලා කරතියි කියනු ලැබේ. ඒ අපි තා සමග එකතුව නො වළඳමු. උනුනට සමවලා නොකරමු. බමුණ, තෙල තට ම වෙයි. බමුණ තෙල තට ම වෙයි.

[බමුණු:]

රජු සහිත පිරිස මහණගොයුම්හු රහත්හ යි මෙසේ භවත් ගෞතමයන් දනී. එහෙත් භවත් ගොයුම්හු. කිපෙති.

[භගවත්හු:]

දැමුනු සමදිවි පැවතුම් ඇති මොනවට දැන මිදුනු සන්හුන් වූ තාදී ගුණ ඇති නොකිපෙන රහත්හට ක්‍රොධයෙක් කොයින් ද,

යමෙක් කිපුනහුට පෙරළා කිපේ ද, එයින් ඒ පුගුලුටාම පව වේ. කිපියහුට පෙරළා නොකිපෙන්නේ දිනීමට දුෂ්කර වූ (ක්‍රොධ) සඞ්ග්‍රාමය දිනයි.

යමෙක් මෙරමා කිපියහු දැන සිහි ඇතිව ඉවසා ද, (හෙ තෙමේ) තම්හට ද මෙරමාහට ද (යන) දෙදෙනාහට ම වැඩ සාදයි.

තම්හට ද මෙරමාහට ද (යන) දෙදෙනාට ම පිළියම් කරනුවහු බාලයහ යි ධම්යෙහි අදක්‍ෂ වූ ඒ ජනයෝ හඟිත්.

මෙසේ වදාළ කල්හි අක්කොසකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. මේ මම භවත් ගෞතමයන් වහන්සේ ද දහම ද භික්සඝන ද සරණ යෙමි. මම භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබම් වා. උපසපුව ලබම් වා. අක්කොසකභාරද්වාජ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදි ද ලැබී ය. උපසපුව ලැබිය. උපසපන් නොබෝ කල් ඇති ආයුෂමත් අක්කොසකභාරද්වාජ තෙමේ එකලාව ගණයා කෙරෙන් වෙන්ව නොපමාව කෙලෙස් තවන වෙර ඇතිව නිවණෙහි මෙහෙයූ සිත් ඇතිව වෙසෙමින් කුලපුත්‍රයෝ යමක් පිණිස මැනැවින් ම ගිහිගෙන් නික්ම පැවිද්දට යෙත් ද, මගබඹසර කෙළවර කොට ඇති ඒ නිරුත්තර වූ රහත් බව නොබෝකලෙකින් දුටුදැම්යෙහි ම තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ විසී ය. ජාතිය ක්‍ෂය වූවාය. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී. මේ බැව් පිණිස අනෙකෙක් නැතැයි දැන ගත්තේ ය. ආයුෂමත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 3.

අසුරින්දකසුත්තං.

189. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අස්සොසි ඛො අසුරින්දකභාරද්වාජො බ්‍රාහ්මණො භාරද්වාජගොත්තො කිර[1] බ්‍රාහ්මණො සමණස්ස ගොතමස්ස සන්තිකෙ අගාරස්මා අනගාරියං පබ්බජිතොති. කුපිතො අනත්තමනො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසති පරිභාසති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි.

අථ ඛො අසුරින්දකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: ජිතො'සි සමණ, ජිතො'සි සමණාති.

[භගවා:]

ජයං වෙ මඤ්ඤති බාලො වාචාය ඵරුසං භණං,
ජයං වෙ තස්ස තං හොති යා තිතික්ඛා විජානතො.

තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මති.

උභින්නං තිකිච්ඡන්තං[2] අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදාති.

එවං වුත්තෙ අසුරින්දකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, -පෙ- අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

7. 1. 4.

බිලඞ්ගිකසුත්තං.

190. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අස්සොසි ඛො බිලඞ්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භාරද්වාජගොත්තො කිර බ්‍රාහ්මණො සමණස්ස ගොතමස්ස සන්තිකෙ අගාරස්මා අනගාරියං පබ්බජිතොති. කුපිතො අනත්තමනො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තුණ්හීභූතො එකමන්තං අට්ඨාසි.

අථ ඛො භගවා බිලඞ්ගිකභාරද්වාජස්ස[3] බ්‍රාහ්මණස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය බිලඞ්ගිකභාරද්වාජං[4] බ්‍රාහ්මණං ගාථාය අජ්ඣභාසි:

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං සුඛුමො රජො පටිවාතංව ඛිත්තොති.

---

1. බ්‍රාහ්මණො කිර - මජ්ස•. PTS. 2. 3. බිලඞ්ගිකස්ස භාරද්වාජස්ස - මජ්ස. PTS. බිලඞ්ගිකභාරද්වාජගොත්තස්ස - සිමු. 1. 2. තිකිච්ඡන්තානං - සිමු 1. 2. 4. බිලඞ්ගිකං භාරද්වාජං - මජ්ස•, PTS.

7. 1. 3.

අසුරින්දකසූත්‍රය.

189. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. අසුරින්දක-භාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ භාරද්වාජගෝත්‍ර බමුණා ගිහිගෙන් නික්ම ශ්‍රමණ ගෞතමයන් සමීපයෙහි පැවිද්දට ගියේ ය යි ඇසීය. කිපියේ නො සතුටු සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍ය-වතුන් වහන්සේට අසභ්‍ය පරුෂ වචනයෙන් ආක්‍රොශ කෙරෙයි. පරිභව කෙරෙයි. එසේ ආක්‍රොශ පරිභව කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූ සේක.

ඉක්බිති අසුන්දරිකභාරද්වාජ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. මහණ, දිනුයෙහි ද, මහණ දිනුයෙහි ද.

[භගවත්හු:]

අඥාන තෙමේ වචනයෙන් පරුෂ බෙණෙමින් ඒකාන්තයෙන් තමන්ට ජයෙකැයි හඟී. (ඉවසීමෙහි ගුණ) දන්නහුගේ යම් ඉවසීමෙක් වේ ද, ඒ ඔහුට ජයෙක් ම වේ.

යමෙක් කිපියහුට පෙරළා කිපේ ද, එයින් ඔහුට ම පව වේ. කිපියහුට පෙරළා නො කිපෙන්නේ දුකසේ දිනියහැකි ක්‍රෝධ සඞ්ග්‍රාමය දිනයි.

යමෙක් මෙරමා කිපියහු දැන සිහි ඇතිව ඉවසා ද, (හෙතෙමේ) තමහට ද මෙරමාහට ද (යන) දෙදෙනාහට ම වැඩ සාදයි.

තමහට ද මෙරමාහට ද යන දෙදෙනාහට ම පිළියම් කරනුවහු බාල-යහයි ධර්මයෙහි අදක්‍ෂ වූ ඒ ජනයෝ හඟිත්.

මෙසේ වදළ කල්හි අසුන්දරිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ... දැනගත්තේ ය. ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 4.

බිලඞ්ගිකසූත්‍රය.

190. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. බිලඞ්ගික-භාරද්වාජ බමුණු තෙමේ භාරද්වාජගෝත්‍ර බමුණා ගිහිගෙන් නික්ම ශ්‍රමණ ගෞතමයන් වෙත පැවිද්දට ගියේ ය යි ඇසී ය. කිපියේ නොසතුටුසිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ නිහඬ ව එකත් පසෙක සිටියේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමසිතින් බිලඞ්ගිකභාරද්වාජ බමුණාගේ චිත්තපරිවිතර්කය දැන බිලඞ්ගිකභාරද්වාජ බමුණාට ගාථායෙන් වදළ සේක:

යමෙක් නිරපරාධ වූ පිරිසිදු වූ නිකෙලෙස් වූ පුරුෂපුද්ගලයකුට අපරාධ කෙරේ ද, ඒ පව උඩුසුලඟට දමන ලද සියුම් රජසක් මෙන් ඒ අඥානයා කරා ම පෙරළා එයි.

එවං වුත්තෙ බිලඞ්ගිකභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජෝ අරහතං අහොසීති

7. 1. 5.

අහිංසකසුත්තං.

191. **සාවත්ථියං**[1]—

අථ ඛො **අහිංසකභාරද්වාජෝ** බ්‍රාහ්මණෝ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සමෙමාදි. සමෙමාදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අහිංසක-භාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවොච: අහිංසකාහං භො ගොතම අහිංසකාහං භො ගොතමාති.

[භගවා:]

යථා නාමං තථා චස්ස සියා ඛො ත්වං අහිංසකො,
යො ච කායෙන වාචාය මනසා ච න හිංසති,
ස වෙ අහිංසකො හොති යො පරං න විහිංසතීති.

එවං වුත්තෙ අහිංසකභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජෝ අරහතං අහොසීති.

7. 1. 6.

ජටාසුත්තං.

192. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථ-**පිණ්ඩිකස්ස** ආරාමෙ, අථ ඛො **ජටාභාරද්වාජෝ** බ්‍රාහ්මණෝ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සමෙමාදි. සමෙමාදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජටාභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං ගාථාය අජ්ඣභාසි:

අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා,
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටන්ති.

[භගවා:]

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං,
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං.

යෙසං රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා,
ඛීණාසවා අරහන්තො තෙසං විජටිතා ජටා.

---

1. එකං සමයං -පෙ- අනාථපිණ්ඩිකස්ස ආරාමෙ - සීමු. 1. 2.

මෙසේ වදාළ කල්හි බිලඞ්ගිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 5.

අහිංසකසූත්‍රය.

191. සැවැත්නුවර—

එකල්හි අහිංසකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් අහිංසකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයෙනි, මම අහිංසක වෙමි. භවත් ගෞතමයෙනි, මම අහිංසක වෙමි"යි මෙය කීයේ ය.

[භගවත්හු:]

නාමය යම්සේ ද, ඉදින් එසේ වන්නෙහි නම් තෝ අහිංසක ම වෙහි. යමෙක් කයින් වචනයෙන් හා සිතින් ද, හිංසා නො කෙරේ ද, යමෙක් මෙරමා නො වෙහෙසා ද, හෙ තෙමේ ඒකාන්තයෙන් අහිංසකයෙක් වේ යි.

මෙසේ වදාළ කල්හි, අහිංසකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 6.

ජටාසූත්‍රය.

192. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඬු මහසිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි ජටාභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ජටාභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

ඇතුළත අවුල් ය, පිටත අවුල් ය. ප්‍රජාව අවුලෙන් වෙළදනා ලද්දී ය. ගෞතමයන් වහන්ස, එය මුබ විචාරමි: කවරෙක් මේ අවුල නිරවුල් කරන්නේ දැයි.

[භගවත්හු:]

ප්‍රතිසන්ධිප්‍රඥා ඇති කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇති පාරිහාරිය නුවණ ඇති (සසර) බිය දක්නාසුලු ඒ සත්ත්‍ව තෙමේ ශීලයෙහි පිහිටා, සමාධිය හා ප්‍රඥාව ද වඩමින් මේ (තෘෂ්ණා) අවුල නිරවුල් කරන්නේ ය.

යම් කෙනකුන් විසින් රාගයත් ද්වේෂයත් අවිද්‍යාවත් දුරු කරණ ලද්දාහු ද, (ඔහු) ක්ෂීණාස්‍රව රහත්හුය. ඔවුන් විසින් (තෘෂ්ණා) අවුල නිරවුල් කරණ ලදී.

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
පටිඝං රූපසඤ්ඤා ච එත්ථෙසා[1] ඡිජ්ජතෙ ජටාති.

එවං වුත්තෙ ජටාභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

7. 1. 7.

සුද්ධිකසුත්තං.

193. සාවත්ථියං:—

අථ ඛො සුද්ධිකභාරද්වාජො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුද්ධිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:[2]

න බ්‍රාහ්මණො සුජ්ඣති කොචි ලොකෙ සීලවාපි තපොකරං,
විජ්ජාචරණසම්පන්නො සො සුජ්ඣති න අඤ්ඤා ඉතරා පජාති.

[භගවා:]

බහුම්පි පලපං ජප්පං න ජච්චා හොති බ්‍රාහ්මණො,
අන්තො කසම්බුසංකිලිට්ඨො කුහනං උපනිස්සිතො.

ඛත්තියො බ්‍රාහ්මණො වෙස්සො සුද්දො චණ්ඩාලපුක්කුසො,
ආරද්ධවිරියො පහිතත්තො නිච්චං දළ්හපරක්කමො,
පප්පොති පරමං සුද්ධිං එවං ජානාහි බ්‍රාහ්මණාති.

එවං වුත්තෙ සුද්ධිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම. -පෙ- අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

7. 1. 8.

අග්ගිකසුත්තං.

194. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස සප්පිනා පායාසො සන්නිහිතො හොති අග්ගිං ජුහිස්සාමි. අග්ගිහුත්තං පරිචරිස්සාමීති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. රාජගහෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි.

1. එත්ථ සා – PTS. 2. අජ්ඣභාසි - මජ්ඣං. PTS.

යම් තැනෙක කාමය ද රූපය ද ප්‍රතිඝය ද රූපසංඥාව ද (යන මොහු) නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් ද, එහි මේ තෘෂ්ණා අවුල සිඳෙයි.

මෙසේ වදාළ කල්හි ජටාභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ... ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 7.

සුද්ධිකසූත්‍රය.

193. සැවැත්නුවර—

එකල්හි සුද්ධිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් සුද්ධිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කී ය.

ලෝකයෙහි කිසි බමුණෙක් සිල්වත් ද, තපස්කම් කරන්නේ ද, (එපමණින්) පිරිසිදු නො වේ. ඒ බමුණු තෙමේ විද්‍යායෙන් හා චරණධර්මයන්ගෙන් යුක්ත වූයේ පිරිසිදු වේ. මෙයින් අන්‍ය වූ සෙසු ප්‍රජාව පිරිසිදු නො වේ.

[භගවත්හු:]

බොහෝ ප්‍රලාප බෙණෙන්නේ ඇතුළත (කෙලෙසින්) කුණු වූයේ කිලිටි වූයේ කොහොන් බැව් ඇසුරු කෙළේ ජාතිමාත්‍රයෙන් බමුණෙක් නො වේ.

පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇති නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති නිති දැඩි පැරකුම් ඇති ක්ෂත්‍රියයා ද බ්‍රාහ්මණයා ද වෛශ්‍යයා ද ශූද්‍රයා ද සැඬොලා ද පුප්සඩුවා ද උත්තම ශුද්ධි සඞ්ඛ්‍යාත නිවණට පැමිණෙත්. බමුණ, මෙසේ දනුව සි.

මෙසේ වදාළ කල්හි සුද්ධිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, ... ආයුෂ්මත් සුද්ධිකභාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 8.

අග්ගිකසූත්‍රය.

194. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි අග්ගිකභාරද්වාජ බමුණා විසින් ගිනි පුදන්නෙමි යි අග්ගිහොමය කරන්නෙමියි ගිතෙලින් මුසු කිරිබතක් පිළියෙල කරණ ලද්දේ වෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ රජගහනුවරට පිඬු පිණිස පිවිසි සේක. රජගහනුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙණ සේක් අග්ගිකභාරද්වාජ බමුණාගේ නිවෙස්න වෙත එළඹි සේක. එළඹ එකත්පසෙක වැඩ සිටි සේක.

අද්දසා ඛො අග්ගිකභාරද්වාජෝ බ්‍රාහ්මණො භගවන්තං පිණ්ඩාය ඨිතං[1] දිස්වාන භගවන්තං ගාථාය අජ්ඣභාසි:

තීහි විජ්ජාහි සම්පන්නො ජාතිමා සුතවා බහු,
විජ්ජාචරණසම්පන්නො සො මං භුඤ්ජෙය්‍ය පායසන්ති[2].

[භගවා:]

බහුම්පි පලපං ජප්පං න ජච්චා හොති බ්‍රාහ්මණො,
අන්තො කසම්බුසංකිලිට්ඨො කුහනා පරිවාරිතො.

පුබ්බෙ නිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි.

එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
විජ්ජාචරණසම්පන්නො සො මං භුඤ්ජෙය්‍ය පායසන්ති[2].

[බ්‍රාහ්මණො:]

භුඤ්ජතු භවං[3] ගොතමො. බ්‍රාහ්මණො භවන්ති.

[භගවා:]

ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං[4] සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මො,
ගාථාභිගීතං පනුදන්ති බුද්ධා ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා.

අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං ඛීණාසවං කුක්කුච්චවූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු ඛෙත්තං හි තං පුඤ්ඤපෙක්ඛස්ස හොතීති.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජෝ බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජෝ අරහතං අහොසීති.

7. 1. 9.

සුන්දරිකසුත්තං.

195. එකං සමයං භගවා කොසලෙසු විහරති සුන්දරිකාය නදියා තීරෙ. තෙන ඛො පන සමයෙන සුන්දරිකභාරද්වාජෝ බ්‍රාහ්මණො සුන්දරිකාය නදියා තීරෙ අග්ගිං ජුහති. අග්ගිහුත්තං පරිචරති. අථ ඛො සුන්දරිකභාරද්වාජෝ බ්‍රාහ්මණො අග්ගිං ජුහිත්වා අග්ගිහුත්තං පරිචරිත්වා උට්ඨායාසනා සමන්තා චතුද්දිසා අනුවිලොකෙසි: කො නු ඛො ඉමං හබ්‍යසෙසං භුඤ්ජෙය්‍යාති. අද්දසා ඛො සුන්දරිකභාරද්වාජෝ බ්‍රාහ්මණො භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ සසීසං[5] පාරුතං නිසින්නං. දිස්වාන වාමෙන හත්ථෙන හබ්‍යසෙසං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන කමණ්ඩලුං ගහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි.

---
1. චරන්තං - PTS. 2. පායාසභත්ති - PTS. 3. භවං නො ගොතමො - PTS.
4. අභොජනීයං - PTS. 5. සීසං - PTS.

අග්ගිකභාරද්වාජ බමුණා පිඩු පිණිස වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දුක භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

(යම් බමුණෙක්) ත්‍රිවිද්‍යායෙන් සමන්විත ද (හත්වන පිතාමහ යුගය දක්වා පිවිතුරු) ජාති ඇත්තේ ද, බොහෝ ග්‍රන්ථයන් හදාළේ ද, ත්‍රිවෙද සඞ්ඛ්‍යාත විද්‍යායෙන් හා ගෝත්‍රසඞ්ඛ්‍යාත චරණයෙන් යුක්ත ද, ඒ බමුණු තෙමේ ම මේ පායාසය වළඳන්නේ ය. (ඒ මිස මොබට මෙය නුසුදුසු යයි කී නියායි)

[භගවත්හු:]

බොහෝ ප්‍රලාප බෙණෙන්නේ ඇතුළත (කෙලෙසින්) කුණු වූයේ කිලිටි වූයේ කොහොත් බැවින් පිරිවරණ ලද්දේ ජාතිමාත්‍රයෙන් බමුණෙක් නො වේ.

යමෙක් පෙර විසූ කඳපිළිවෙළ දනී ද, සවර්ගය හා අපායන් දකී ද, වැලි ජාතික්ෂය සඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පැමිණියේ ද, (මාර්ගඥානයෙන් චතුසත්‍යය) දැන නිමවන ලද (සොළොස්) කිස ඇත්තේ ද, (කායාදී) මෞනගුණ යුක්ත ද,

මේ ත්‍රිවිද්‍යායෙන් බමුණු තෙමේ තෙවිජ්ජ වෙයි. විද්‍යායෙන් හා චරණධර්මයෙන් යුක්ත වූ හෙ තෙමේ මේ පයාසය වළඳන්නේ ය. (වැළඳීමට සුදුසු යයි වදාළ නියායි.)

[බමුණු:]

භවත් ගෞතම තෙමේ වළඳුවා. භවත් තෙමේ බමුණෙකි.

[භගවත්හු:]

බමුණ, මා විසින් ගාථාභිගීත මේ පායාසය වැළඳීම සුදුසු නො වේ. ආජීවශුද්ධිය දක්නවුන්ගේ මේ සවභාවයෙක් නොවේ. බුදුවරයෝ ගාථාභිගීත බොජුන බැහැර කෙරෙත්. බමුණ, ආර්‍යධර්මය ඇති කල්හි මේ පැවැත්මයි. (අකැප දෙය දුර ලා කැප දෙය ම වැළඳීම ආර්‍යයන්ගේ සවභාව යයි.)

සියලු ගුණයෙන් යුත් මහර්ෂි වූ සන්හුන් කුකුස් ඇති රහත්හු මෙයින් අන්‍ය වූ ආහාරයෙන් ද, පානයෙන් ද උවටන් කරව. පින් කැමැත්තහුට ඒ කෙත වේ.

මෙසේ වදාළ කල්හි අග්ගිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ.

7. 1. 9.

සුන්දරිකසූත්‍රය.

195. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි සුන්දරිකා ගංතෙර වැඩවසන සේක. එකල්හි සුන්දරිකභාරද්වාජ බමුණු සුන්දරිකා ගංතෙර ගිනි පුදයි. අග්නිහෝමය කෙරෙයි. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණු ගිනි පුද, අග්නිහෝමය කොට හුනස්නෙන් නැගිට "කවරෙක් මේ යාගද්‍රව්‍යශේෂය වළඳන්නේ වේ දැ"යි හාත්පස සිවුදිගුත් බැලී ය. සුන්දරිකභාරද්වාජ බමුණු එක්තරා රුක්මුලෙක හිස වටා පෙරෙවි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දුක වමතින් යාගද්‍රව්‍යශේෂය ගෙණ දකුණතින් කෙණ්ඩිය ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය.

අථ ඛො භගවා සුන්දරිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පදසද්දෙන සීසං විවරි.

අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො මුණ්ඩො අයං භවං මුණ්ඩකො අයං භවන්ති තතොව පුන නිවත්තිතුකාමො අහොසි. අථ ඛො සුන්දරිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: මුණ්ඩාපි හි ඉධෙකච්චෙ බ්‍රාහ්මණා භවන්ති. යන්නූනාහං තං උපසඞ්කමිත්වා ජාතිං පුච්ඡෙය්‍යන්ති. අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: කිංජච්චො භවන්ති.

[භගවා:]

මා ජාතිං පුච්ඡ චරණඤ්ච පුච්ඡ කට්ඨා හවෙ ජායති ජාතවෙදො,
නීචා කුලීනොපි මුනී ධිතීමා ආජානියො හොති හිරීනිසෙධො.

සච්චෙන දන්තො දමසා උපෙතො වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
යඤ්ඤූපනීතො තමුපව්හයෙථ කාලෙන සො ජුහති දක්ඛිණෙය්‍යොති.

[බ්‍රාහ්මණො:]

අද්ධා සුයිට්ඨං සුහුතං මමයිදං යං තාදිසං වෙදගුමද්දසාමි,
තුම්හාදිසානං හි අදස්සනෙන අඤ්ඤො ජනො භුඤ්ජති හව්‍යසෙසන්ති.

[බ්‍රාහ්මණො:]

භුඤ්ජතු භවං ගොතමො. බ්‍රාහ්මණො භවන්ති.

[භගවා:]

ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං සම්පස්සතං බ්‍රාහ්මණ නෙසධම්මො,
ගාථාභිගීතං පනුදන්ති බුද්ධා ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා.

අඤ්ඤෙන ච[1] කෙවලිනං මහෙසිං ඛීණාසවං කුක්කුච්චවූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු ඛෙත්තං හි තං පුඤ්ඤපෙක්ඛස්ස හොතීති.

[බ්‍රාහ්මණො:]

අථ කස්ස චාහං භො ගොතම ඉමං හව්‍යසෙසං[2] දම්මීති.

[භගවා:]

න ඛ්වාහන්තං[3] බ්‍රාහ්මණ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යස්සසො හව්‍යසෙසො[2] භුත්තො සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර බ්‍රාහ්මණ[4] තථාගතස්ස වා තථාගතසාවකස්ස වා. තෙන හි ත්වං බ්‍රාහ්මණ තං හව්‍යසෙසං[2] අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙහීති.

---

1. වෙ - PTS. 2. හබ්‍යසෙසං - මජසං. සයා. 3. න ඛ්වාහං - මජසං, PTS.
4. බ්‍රාහ්මණාති - නාණී. සයා.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සුන්දරිකභාරද්වාජ බමුණාගේ පියහඬින් හිස විවර කළ සේක.

ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණු මේ භවත් මුඩු වූවෙක. මේ භවත් මුණ්ඩකයෙකැ යි. එතැනින් ම පෙරළා යනු කැමැති විය. එකල්හි සුන්දරික-භාරද්වාජ බමුණාහට "මෙහි මුඩු වූ ද ඇතැම්හු බමුණු වෙති. මම ඔහු වෙත එළඹ ජාතිය විචාරත්තෙම් නම් මැනවැ"යි මේ සිත විය. ඉක්බිති සුන්දරික-භාරද්වාජ බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට "භවත් කිනම් ජාති ඇත්තෙක් වේ ද"යි තෙල කී ය.

[භගවත්හු:]

ජාතිය නහමක් විචාරව (ශීලාදි) චරණය ම විචාරව. කාෂ්ටයෙන් ඒකාන්තයෙන් ගිනි හටගණී. එමෙන් ම පහත් කුලයෙහි උපන්නේ ද, උසස්කුලයෙහි උපන්නේ ද, වීර්‍ය්‍යවත් වූයේ කරුණු නො කරුණු දන්නේ ලජ්ජායෙන් පව් වළකා සිටියේ (ක්ෂීණාස්‍රව) මුනි වෙයි.

යමෙක් (පරමාර්ථ) සත්‍යයෙන් දමුනේ ද, ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත ද, චතුර්මාර්ගී සඞ්ඛ්‍යාත වේදයෙහි පරතෙරට ගියේ ද, වැස නිම වූ බඹසර ඇත්තේ ද, යුතු කළ දන් ඇතියේ සුදුසු කල්හි ඔහු කැඳවන්නේ ය. හෙ තෙමේ (ඔහු කැඳවා දන් දෙන තැනැත්තේ) දක්ෂිණාර්හයා කෙරෙහි යාග කෙරෙයි.

[බමුණු:]

වෙදයෙහි පරතෙරට පැමිණි එබන්දකු යම් හෙයෙකින් දකිම් ද, මා විසින් ඒකාන්තයෙන් මෙය මොනවට පුදන ලද්දේ වෙයි. මනා කොට (එහෙයින්) හෝම කරණ ලද්දේ වෙයි. මුබ වහන්සේ වැන්නවුන් නො දුක්මෙන් අන්දන හුතාවශේෂය වළඳයි.

භවත් ගෞතම තෙමේ වළඳුවා. භවත් තෙමේ බ්‍රාහමණයෙකි.

[භගවත්හු:]

බමුණ, මා විසින් ගාථාභිගීත පායාසය වැළදීම නිසි නො වේ. ආජීවශුද්ධිය දක්නවුන්ගේ මේ සවභාවයෙක් නො වේ. බුදුවරයෝ ගාථාභිගීතය බැහැර කෙරෙත්. බමුණ, ආර්‍ය්‍යධර්මය ඇතිකල්හි මේ පැවත්ම යි.

සියලු ගුණයෙන් යුත් මහර්ෂි වූ සත්හුන් කුකුස් ඇති රහත්හු මෙහින් අන්‍ය ආහාරයෙන් ද පානයෙන් ද උවටන් කරව. පින් කැමැත්තහුට ඒ කෙත වේ.

[බමුණු:]

භවත් ගෞතමයෙනි, එසේ නම් මම කවරකුට මේ හුතාවශේෂය දෙම් ද?

[භගවත්හු:]

බමුණ, තථාගතයන්ගේ හෝ තථාගතශ්‍රාවකයකුගේ හෝ පරිණාමය හැරපියා අන් යමකු විසින් මේ හුතාවශේෂය වළඳන ලද්දේ මැනවින් පැසීමට යන්නේ නම්, බමුණ, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොව්හි මහණ බමුණන්සියෝ දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි එබන්දකු මම නො ම දකිමි. බමුණ, එසේ වී නම් තෙපි ඒ හුතාවශෙෂය තණ නැති බිමෙක හෝ දමව. පණුවන් නැති දියෙක හෝ පා කොට හරුව.

අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො තං හව්‍යසෙසං[1] අප්පාණකෙ උදකෙ ඔපිලාපෙසි. අථ ඛො සො හව්‍යසෙසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති, චිටිචිටායති, සන්ධූපායති, පම්පධූපායති. සෙය්‍යථාපි නාම ඵාලො දිවස[1]සන්තත්තො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති, චිටිචිටායති, සන්ධූපායති, සම්පධූපායති, එවමෙව සො හව්‍යසෙසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති, චිටිචිටායති, සන්ධූපායති, සම්පධූපායති.

අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සුන්දරිකභාරද්වාජං බ්‍රාහ්මණං භගවා ගාථාහි අජ්ඣභාසි:

මා බ්‍රාහ්මණ දාරුසමාදහානො සුද්ධිං අමඤ්ඤි බහිද්ධා හි එතං,
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති යො බාහිරෙන පරිසුද්ධිමිච්ඡෙ.

හිත්වා අහං බ්‍රාහ්මණ දාරුදාහං අජ්ඣත්තමෙව ජලයාමි[2] ජොතිං,
නිච්චග්ගිනී[3] නිච්චසමාහිතත්තො අරහං අහං බ්‍රහ්මචරියං චරාමි.

මානො හි තෙ බ්‍රාහ්මණ ඛාරිභාරො කොධො ධූමො භස්මනි මොසවජ්ජං,[4]
ජිව්හා සුජා හදයං ජොතිට්ඨානං අත්තා සුදන්තො පුරිසස්ස ජොති.

ධම්මො රහදො බ්‍රාහ්මණ සීලතිත්ථො අනාවිලො සබ්භි සතං පසත්ථො,
යත්ථ හවෙ වෙදගුනො සිනාතා අනල්ලගත්තා[5]ව තරන්ති පාරං.

සච්චං ධම්මො සංයමො බ්‍රහ්මචරියං මජ්ඣෙසිතා බ්‍රාහ්මණ බ්‍රහ්මපත්ති,
සතුජ්ජුභූතෙසු නමො කරොහි තමහං නරං ධම්මසාරීති බ්‍රූමීති.

එවං වුත්තෙ සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

7. 1. 10

බහුධීතුසුත්තං.*

196. එකං සමයං භගවා **කොසලෙසු** විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස **භාරද්වාජගොත්තස්ස** බ්‍රාහ්මණස්ස චතුද්දස බලිවද්දා[6] නට්ඨා හොන්ති. අථ ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො තෙ බලිවද්දෙ[5] ගවෙසන්තො යෙන සො වනසණ්ඩො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අද්දස භගවන්තං තස්මිං වනසණ්ඩෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි:

---

1. දිවසං - මජසං ගාථාය, සීමු. PTS. 2. අජ්ඣත්තමෙවුජ්ජලයාමි - මජසං. 3. නිච්චග්ගිනී සාත්වි, 4. භස්මනිමොසවජ්ජං - ස්‍යා. 5. අනල්ලීන ගත්තාව - PTS. 6. බලිවද්දා - මජසං.

* බහුධීති සුත්තං - සීමු 1. 2.

ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණු ඒ හුතාවශේෂය පණුවන් නැති දියෙහි පා කොට හැරියේ ය. එකල්හි ඒ හුතාවශේෂය දියෙහි බහා ලන ලද්දේ චිච්චිට යන අනුකරණ ශබ්දය පවත්වයි. චිට චිට යන අනුකරණශබ්ද පවත්වයි. දුමයි. බෙහෙවින් දුමයි. යම්සේ දහවල් තැවුන හිවැල දියෙහි බහාලන ලද්දේ චිච්චිට යන අනුකරණශබ්ද පවත්වා ද, චිට චිට යන අනුකරණ ශබ්ද පවත්වා ද, දුමා ද, බෙහෙවින් දුමා ද, එසෙයින් ම ඒ හුතාවශේෂය දියෙහි බහා ලන ලද්දේ චිච්චිට යන අනුකරණශබ්ද පවත්වයි. චිට චිට යන අනුකරණශබ්ද පවත්වයි. දුමයි. බෙහෙවින් දුමයි. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණු තෙමේ සංවේගයට පැමිණියේ හටගත් ලොමුදහගැනුම් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සුන්දරිකභාරද්වාජ බමුණාට භාග්‍යවතුන් වහන්සේ ගාථායෙන් වදාළ සේක:

බමුණ, දර දවමින් ශුද්ධියක් තහමක් නගුව. යම් හෙයෙකින් මේ දර දැවීම ආර්‍යධර්මයෙන් බැහැර ද (එහෙයිනි). බාහිර වූ දර දැවීමෙකින් පිරිසිදුබව යමෙක් කැමැති වන්නේ නම් ඒ දර දැවීමෙන් පිරිසිදු බවක් දක්‍ෂ වූ ආර්‍යයෝ නොම කියත්.

බමුණ, මම දර දැවීම අත්හැර සවසන්තානයෙහි ම ඥානාග්නිය දල්වමි. අභීත් වූ මම නිති (දැල් වූ) ගිනි ඇත්තෙම් නිති සංයතසිත් ඇත්තෙම් බඹසර කෙරෙමි.

බමුණ, තාගේ මානය තවුස්පිරිකරබර වේ. ක්‍රෝධය දුම වේ. මුසා බිණීම හලු වේ. දිව හැන්ද ය. හෘදය ගිනි දල්වෙන තැන ය. පුරුෂයාගේ මොනවට දැමුණු සිත ගින්න වේ.

වේදයෙහි පරතෙරට ගිය ආර්‍යයෝ යම් තැනෙක ස්නානය කළාහු නොතෙත් සිරුරු ඇත්තෝ නිවන් නමැති පරතෙරට එකාන්තයෙන් යෙද්ද, බමුණ, ධර්මය තෙමේ සිල් නමැති තොටු ඇති වෙසෙසින් පහන් වූ උතුම් සත්පුරුෂයන් විසින් පසස්නා ලද (එබඳු) ජලාසයෙකි.

බමුණ, වාක්සත්‍යය ද, (දිට්ඨි, සඞ්කප්ප, වායාම, සති, සමාධි සඞ්ඛ්‍යාත) ධර්මය ද, (කම්මන්ත ආජීව සඞ්ඛ්‍යාත) සංයමය ද (යන මේ) බඹසර නම් වේ. මැද ඇසුරු කළා ශ්‍රෙෂ්ඨ ප්‍රතිපත්ති ය යි. ඒ (තෙපි) ඍජු වූ රහතුන්ට නමස්කාර කරව. මම ඒ මිනිසා දහම්හි හැසිරෙන්නෙකැ යි කියමි.

මෙසේ වදාළ කල්හි සුන්දරිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි.... ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

7. 1. 10.

බහුධීතුසූත්‍රය.

196. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වැඩ වසන සේක. එකල්හි එක්තරා භාරද්වාජ ගෝත්‍ර බමුණු කෙනකුන්ගේ ගොන්හු තුදුස් දෙනෙක් නටුවාහු වෙත්. ඉක්බිති ඒ භාරද්වාජ ගෝත්‍ර බමුණු තෙමේ ඒ ගොණුන් සොයමින් ඒ වනලැහැබට පැමිණියේ ය. එළඹ ඒ වනලැහැබෙහි උඩු කය කෙළින් තබා (කමටහන්=) අභිමුඛ කොට සිහි එළවා පලක් බැඳ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍ය-වතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීය

න හි[1] නූනිමස්ස සමණස්ස බලිවද්දා චතුද්දස,
අජ්ජ සට්ඨී න දිස්සන්ති තෙනායං සමණො සුඛී.

න හි නූනිමස්ස සමණස්ස තිලා ඛෙත්තස්මිං[2] පාපකා[3],
එකපණ්ණා දුපණ්ණා[4] ච තෙනායං සමණො සුඛී.

න හි නූනිමස්ස සමණස්ස තුච්ඡකොට්ඨස්මිං[5] මූසිකා,
උස්සොළ්හිකාය නච්චන්ති තෙනායං සමණො සුඛී.

න හි නූනිමස්ස සමණස්ස සන්ථාරො සත්තමාසිකො,
උප්පාටකෙහි[6] සංඡන්නො තෙනායං සමණො සුඛී.

න හි නූනිමස්ස සමණස්ස විධවා සත්ත[7]ධීතරො,
එකපුත්තා දුපුත්තා ච තෙනායං සමණො සුඛී.

න හි නූනිමස්ස සමණස්ස පිඞ්ගලා තිලකාහතා,
සොත්තං පාදෙන බොධෙති[8] තෙනායං සමණො සුඛී.

න හි නූනිමස්ස සමණස්ස පච්චූසම්හි ඉණායිකා,
දෙථ දෙථාති චොදෙන්ති තෙනායං සමණො සුඛීති.

[භගවා:]

න හි මය්හං බ්‍රාහ්මණ බලිවද්දා චතුද්දස,
අජ්ජ සට්ඨී න දිස්සන්ති තෙනාහං බ්‍රාහ්මණ සුඛී.

න හි මය්හං බ්‍රාහ්මණ තිලා ඛෙත්තම්හි පාපකා
එකපණ්ණා දුපණ්ණා ච තෙනාහං බ්‍රාහ්මණා[9] සුඛී.

න හි මය්හං බ්‍රාහ්මණ තුච්ඡකොට්ඨස්මිං මූසිකා,
උස්සොළ්හිකාය නච්චන්ති තෙනාහං බ්‍රාහ්මණා[9] සුඛී.

න හි මය්හං බ්‍රාහ්මණ සන්ථාරො සත්තමාසිකො,
උප්පාටකෙහි සඤ්ඡන්නො තෙනාහං බ්‍රාහ්මණා[9] සුඛී.

න හි මය්හං බ්‍රාහ්මණ විධවා සත්තධීතරො,
එකපුත්තා දුපුත්තා ච තෙනාහං බ්‍රාහ්මණා[9] සුඛී.

න හි මය්හං බ්‍රාහ්මණ පිඞ්ගලා තිලකාහතා,
සොත්තං පාදෙන බොධෙති[8] තෙනාහං බ්‍රාහ්මණා[9] සුඛී.

---

1. නහ - සබ්බත්ථ සීමු. ස්‍යා සී 2. 2. ඛෙත්තස්මිං - මජ්සං. ස්‍යා 3. පාපිකා - සීමු. PTS, ස්‍යා. සී 2 4. ද්විපණ්ණා - සීමු. PTS. 5 තුච්ඡකොට්ඨස්මිං - මජ්සං. ස්‍යා. 6 උප්පාදකෙහි - සීමු ස්‍යා. 7. පුත්ත - සීමු ස්‍යා 8. පොථෙති - ස්‍යා. 9. බ්‍රාහ්මණ - ස්‍යා, PTS.

(මාගේ) ගොන්හු තුදුස්දෙනෙක් අදට සදවසක් මුළුල්ලෙහි නො දක්නා ලැබෙත්. මේ මහණහුට ඒකාන්තයෙන් (එබන්දෙක්) නැත. එහෙයින් මේ මහණ තෙමේ සුව ඇත්තෙකි.

යම් හෙයෙකින් මේ මහණහට ලාමකවූ තල ද කොළ එකක් දෙකක් පමණ ඉතිරි වූ තල ද ඒකාන්තයෙන් නැත් ද, එහෙයින් මේ මහණ තෙමේ සුව ඇත්තෙකි.

(මාගේ) හිස් වූ ධාන්‍යාගාරයෙහි මීයෝ අධිකෝත්සාහයෙන් නටත්. මේ මහණහට ඒකාන්තයෙන් (එබන්දෙක්) නො ම ඇත. එහෙයින් මේ මහණ තෙමේ සුව ඇත්තෙකි.

සත්මසක් පමණ වූ (මාගේ) තණ ඇතිරිය එහි ම හටගත් ප්‍රාණීන්ගෙන් ගැවසී ගත්තේ ය මේ මහණහට ඒකාන්තයෙන් (එබන්දෙක්) නො ම ඇත. එහෙයින් මේ මහණ තෙමේ සැප ඇත්තෙකි.

එක පුතකු ඇත්තාවූ ද පුතුන් දෙදෙනකුන් ඇත්තාවූ ද, වැන්දඹු වූ දූහු සත් දෙනෙක් (මට මෙන්) මේ මහණහට ඒකාන්තයෙන් නො ම ඇත. එහෙයින් මේ මහණ තෙමේ සුව ඇත්තෙකි.

පිඟුවන් වූ තලකැලලින් ගැවසී ගත් සිරුරු ඇති (මාගේ බැමිණී තොමෝ) නිදිගත් මා පයින් ගසා පුබුදුවයි. මේ මහණහට ඒකාන්තයෙන් එබන්දෙක් නො ම ඇත. එහෙයින් මේ මහණ තෙමේ සුව ඇත්තෙකි.

අලුයම්හි නය හිමියෝ දෙවු, දෙවු යයි මේ මහණහට (මට මෙන්) ඒකාන්තයෙන් චොදනා නො ම කෙරෙත්. එහෙයින් මේ මහණ තෙමේ සුව ඇත්තෙකි.

[භගවත්හු:]

බමුණ, (තාගේ) ගොන්හු තුදුස් දෙනෙක් අදට සදවසක් මුළුල්ලෙහි නො දක්නා ලැබෙත්. මට (එබන්දෙක්) නො ම ඇත. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

බමුණ, කෙනෙහි ලාමක වූ තල ද එකක් දෙකක් කොළ ඉතිරි වූ තල ද මට නොම ඇත. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

බමුණ, (තාගේ) හිස් වූ ධාන්‍යාගාරයෙහි මීයෝ මහත් උත්සාහයෙන් නටත්. මට එබන්දෙක් නො ම ඇත. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

බමුණ, සත්මසක් වූ (තාගේ) තණඇතිරිය එහි ම උපන් ප්‍රාණීන්ගෙන් ගැවසී ගත්තේ ය. මට (එබන්දෙක්) නො ම ඇත්තේ ය. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

බමුණ, එක් පුතකු ඇත්තාවූ ද, දෙපුතු කෙනකුන් ඇත්තාවූ ද වැන්දඹු වූ දූහු සත්දෙනෙක් (තට මෙන්) මට නොම ඇත. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

පිඟුවන් වූ තලකැලලින් ගැවසී ගත් සිරුරු ඇති (තාගේ බැමිණිය) නිදි ගත් තා පයින් ගසා පුබුදුවයි. මට එබන්දෙක් නො ම ඇත. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

න හි මය්හං බ්‍රාහ්මණ පච්චූසම්හි ඉණායිකා,
දෙහි දෙහීති චොදෙන්ති තෙනාහං බ්‍රාහ්මණා සුඛීති.

එවං වුත්තෙ භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති, එවමෙවං භොතා ගොතමෙන අනෙක-පරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

අලත්ථ ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

අරහන්තවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

ධනඤ්ජානී[1] ච අක්කොසං අසුරින්දං බිලඞ්ගිකං,
අහිංසකං ජටා චෙව සුද්ධිකඤ්ච ච අග්ගිකා,
සුන්දරිකං බහුධීතුකෙන[2] ච තෙ දසාති.

---

2. උපාසකවග්ගො.

7. 2. 1.

කසිසුත්තං.

197. එවං මෙ සුතං: එකං සමයං භගවා මගධෙසු විහරති දක්ඛිණාගිරිස්මිං එකනාළායං බ්‍රාහ්මණගාමෙ. තෙන ඛො පන සමයෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නඞ්ගලසතානි පයුත්තානි හොන්ති වප්පකාලෙ.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පරිවෙසනා වත්තති. අථ ඛො භගවා යෙන පරිවෙසනා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි.

1. ධානඤ්ජානි - සීමු. 2. ධීතියෙන - සයා, PTS. ධීතරෙන - මජසං

බමුණ, අලුයම තයහිමියෝ දෙවු දෙවු යයි (තට) චෝදනා කෙරෙත්. මට එබන්දෙක් නො ම ඇත. බමුණ, එහෙයින් මම සුව ඇත්තෙමි.

මෙසේ වදාළ කල්හි භාරද්වාජගොත්‍ර බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු වූවක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුනු දෙයක් විවර කරන්නේ හෝ වේ ද, මං මුළාවූවකුට මඟ කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූප දකින්නාහ යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් නියායෙන් දහම් පවසන ලදී. මේ මම භවත් ගොයුම්හු ද දහම ද භික්සඟන ද සරණ යෙමි. මම භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබම් වා. උපසපුව ලබම්වා.

භාරද්වාජගොත්‍ර බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබීය. උපසපුව ලැබීය. උපසපන් වූ නොබෝ කල් ඇති ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ එකලාව ගණයා කෙරෙන් වෙන් ව නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙමින් කුලපුත්‍රයෝ යමක් පිණිස මැනවින් ම ගිහිගෙන් නික්ම පැවිද්දට යෙත් ද, මඟබඹසර කෙළවර කොට ඇති ඒ නිරුත්තර වූ රහත්බව නොබෝ කලෙකින් ම දුටුදූම්යෙහි තමා විසින් ම විසිතුරු නුවණින් පසක් කොට එයට පැමිණ විසූහ. ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී. මේ බැව් පිණිස අනෙකෙක් නැතැයි දැන ගත්තේ ය. ආයුෂ්මත් භාරද්වාජ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූ හ.

අරහන්තවග්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

ධනඤ්ජානි, අක්කොස, අසුරින්දරි, බිලඞ්ගික, අහිංසක, ජටා, සුද්ධික, අග්ගික, සුන්දරික, බහුධීතු සූත්‍රය යි ඒ දසයෙකි.

---

2. උපාසකවග්ගය.

7. 2. 1.

කසිසූත්‍රය.

197. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධ දනව්වෙහි දක්ඛිණාගිරියෙහි ඒකනාලා නම් බමුණුගම්හි වැඩ වසන සේක. එකල්හි කසිභාරද්වාජ බමුණා විසින් වපුරණ කාලයෙහි පන්සියක් පමණ නගුල්හු යොදන ලද්දාහු වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ කසිභාරද්වාජ බමුණාගේ කර්මාන්තස්ථානය වෙත එළඹිසේක. එකල්හි කසිභාරද්වාජ බමුණාගේ බොජුන් දීම පවතී. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොජුන් දෙන තැනට එළඹි සේක. එළඹ එකත්පසෙක වැඩසිටි සේක.

අද්දසා ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං පිණ්ඩාය ඨිතං. දිස්වාන භගවන්තං එතදවොච: අහං ඛො සමණ කසාමි ච වපාමි ච. කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි. ත්වම්පි සමණ කසස්සු ච, වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සූති.

[භගවා:]

අහම්පි ඛො බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති

[බ්‍රාහ්මණො:]

න ඛො පන මයං[1] පස්සාම භොතො ගොතමස්ස යුගං වා නඞ්ගලං වා ඵාලං වා පාචනං වා බලිවද්දෙ වා. අථ ච පන භවං ගොතමො එවමාහ: අහම්පි ඛො බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති.

අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කස්සකො පටිජානාසි න ච පස්සාම තෙ කසිං,
කස්සකො පුච්ඡිතො බ්‍රූහි කථං ජානෙමු තං කසින්ති?.

[භගවා:]

සද්ධා බීජං තපො වුට්ඨි පඤ්ඤා මෙ යුගනඞ්ගලං,
හිරි[2] ඊසා මනො යොත්තං සති මෙ ඵාලපාචනං.

කායගුත්තො වචීගුත්තො ආහාරෙ උදරෙ යතො,
සච්චං කරොමි නිද්දානං සොරච්චං මෙ පමොචනං.

විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
ගච්ඡති අනිවත්තන්තං යත්ථ ගන්ත්වා න සොචති.

එවමෙසා කසී කට්ඨා සා හොති අමතප්ඵලා,
එතං කසිං කසිත්වාන සබ්බදුක්ඛා පමුච්චතීති.

[බ්‍රාහ්මණො:]

භුඤ්ජතු භවං ගොතමො. කස්සකො භවං[3], යඤ්හි[4] භවං ගොතමො අමතප්ඵලං කසිං[5] කසතීති.

[භගවා:]

ගාථාභිගීතම්මෙ අභොජනෙය්‍යං සම්පස්සතං බ්‍රාහ්මණ නෙසධම්මො,
ගාථාභිගීතං පනුදන්ති බුද්ධා ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා.

අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං ඛීණාසවං කුක්කුච්චවූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු ඛෙත්තං හි තං
පුඤ්ඤපෙක්ඛස්ස[6] හොතීති.

1. නඛොමයං - මජසං. PTS. 2. හිරී - මජසං. PTS. 3. භවංගොතමො - PTS.
4. යංහි - මජසං, PTS. 5. කසින්ති කසි - සතා. 6. පුඤ්ඤපෙඛස්ස - සිමු 1. 2.

කසිභාරද්වාජ බමුණු තෙමේ පිඬු පිණිස වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. මහණ, මම වනාහි සෑම ද කරමි. වැපිරීම ද කරමි. සෑම ද කොට වැපිරීම ද කොට වළඳමි. මහණ, තෙපි ද සෑම ද කරව. වැපිරීම ද කරව. සෑම ද කොට වැපිරීම ද කොට වළඳව.

[භගවත්හු:]

බමුණ, මමත් සෑම ද කරමි. වැපිරීම ද කරමි. සෑම ද කොට වැපිරීම ද කොට වළඳමි.

[බමුණු:]

අපි භවත් ගොයුම්හුගේ වියදණ්ඩ හෝ නඟුල හෝ හිවැල හෝ කෙවිට හෝ ගොනුන් හෝ නො ම දකුම්හ. එහෙත් භවත් ගොයුම් තෙමේ "බමුණ, මමත් සෑම ද කරමි. වැපිරීම ද කරමි. සෑම ද කොට වැපිරීම ද කොට වළඳමි" යි මෙසේ කියයි.

ඉක්බිති කසිභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය:

ගොවියෙකැ යි පිළිත කෙරෙහි. මුබගේ සීසෑමක් නොම දකිමි. ගොවියෙක් ද යි (අප විසින්) විචාරණ ලද (මොබ) කියනු මැනව. ඒ සීසෑම කෙසේ දනුමෝ ද?

[භගවත්හු:]

සැදහැ බිජුවට ය. තපස වැස්ස ය. නුවණ මාගේ වියදණ්ඩ හා නඟුලය. ලජ්ජාව නඟුලිසය. සිත යොත ය. සිහිය මාගේ හිවැල හා කෙවිට ය.

කායසුචරිතයෙන් ගෝපිත වූයෙමි වාක්සුචරිතයෙන් ගෝපිත වූයෙමි ආහාරයෙහි ද උදරයෙහි ද සංයත වූයෙමි සත්‍යයෙන් නෙළීම කරමි. අර්හත්ඵල විමුක්තිය මාගේ මිදීම යි.

ධුර ඉසිලීමෙහි සමත් වූ මාගේ ඒ වීර්‍ය්‍යය යම් තැනකට ගොස් ශෝක නො කෙරේ නම් ඒ නිවණට අභිමුඛ කොට පමුණුවනු ලබන්නේ නො නවතිමින් යෙයි.

මෙසේ මේ සීය සෑන ලදී. ඒ සීය අමාපල ඇති වෙයි. මේ සීය සෑ සියලු දුකින් මිදෙයි.

[බමුණු:]

භවත් ගොයුම් තෙමේ වළඳුවා. යම් හෙයෙකින් භවත් ගොයුම් තෙමේ අමාපල ඇති සීයත් සෑ ද, එහෙයින් භවත් තෙමේ ගොවියෙකි.

[භගවත්හු:]

බමුණ, මා විසින් ගාථාභිගීත ආහාරය වැළඳීම නිසි නොවේ. ආජීවසුද්ධිය දක්නවුන්ගේ මේ ස්වභාවයෙක් නො වේ. බුදුවරයෝ ගාථාභිගීත බොජුන බැහැර කෙරෙත්. බමුණ, ආජීවධර්මය ඇති කල්හි මේ පැවැත්ම යි.

සියලු ගුණයෙන් යුත් මහර්ෂි වූ සන්හුන් කුකුස් ඇති රහත්හු මෙයින් අන්‍ය වූ ආහාරයෙන් ද පානයෙන් ද උවටැන් කරව. පින් කැමැත්තහුට ඒ කෙත වේ.

එවං වුත්තෙ කසිභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 2.

උදයසුත්තං.

198. **සාවත්ථියං**—

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන **උදයස්ස** බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. අථ ඛො උදයො බ්‍රාහ්මණො භගවතො පත්තං ඔදනෙන පූරෙසි. දුතියම්පි ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන උදයස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. දුතියම්පි ඛො උදයො බ්‍රාහ්මණො භගවතො පත්තං ඔදනෙන පූරෙසි. තතියම්පි ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන උදයස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. තතියම්පි ඛො උදයො බ්‍රාහ්මණො භගවතො පත්තං ඔදනෙන පූරෙත්වා භගවන්තං එතදවොච: පකට්ඨකොයං[1] සමණො ගොතමො පුනප්පුනං ආගච්ඡතීති.

[භගවා:]

පුනප්පුනං චෙව වපන්ති බීජං පුනප්පුනං වස්සති දෙවරාජා,
පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා පුනප්පුනං ධඤ්ඤමුපෙති රට්ඨං.

පුනප්පුනං යාචකා[2] යාචයන්ති පුනප්පුනං දානපතී දදන්ති,
පුනප්පුනං දානපතී දදිත්වා පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං.

පුනප්පුනං ඛීරිකා[3] දුහන්ති පුනප්පුනං වච්ඡො උපෙති[4] මාතරං,
පුනප්පුනං කිලමති ඵන්දති ච පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.

පුනප්පුනං ජායති මීයති ච පුනප්පුනං සීවථිකං හරන්ති,
මග්ගඤ්ච ලද්ධා අපුනබ්භවාය න පුනප්පුනං ජායති භූරිපඤ්ඤො.

එවං වුත්තෙ උදයො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

1. පකට්ඨකං - සෑ. පගබ්භොයං. - සී. 2 2. යාචනකා - සීමු 1, 2 අ. 3. ඛීරණිකා - සීමු. 1. 2. අ. 4. වච්ඡා උපෙන්ති - සී 1, 2.

මෙසේ වදාළ කල්හි කසීභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු වූවක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුනු දෙයක් විවර කරන්නේ හෝ වේ ද, මං මුළාවූවකුට මග කියා දෙන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූ දක්නාහ යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ වේ ද, එසෙයින් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් නියායෙන් දහම් පවසන ලදී. මේ මම භවත් ගොයුම්හු ද දහම ද බික්සඟණ ද සරණ යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා යි.

7. 2. 2.

උදයසූත්‍රය.

198. සැවැත්නුවර—

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙව පා සිවුරු ගෙණ උදය බමුණාගේ නිවෙස්න වෙත එළඹි සේක. එකල්හි උදය බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය බතින් පුරාලීය. දෙවන දිනෙහි ද භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙව පා සිවුරු ගෙණ උදය බමුණාගේ නිවෙස්න වෙත එළඹි සේක. දෙවන දිනෙහි ද උදය බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය බතින් පුරාලීය. තෙවන දිනෙහි ද භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ උදය බමුණාගේ නිවෙස්න වෙත එළඹි සේක. තෙවන දිනෙහි ද උදය බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය බතින් පුරවා භාග්‍යවතුන් වහන්සේට "රසයෙහි ගිජු වූ මේ මහණ ගොයුම් තෙමේ පුනපුනා ඒ ය"යි මෙය කීය.

[භගවත්හු:]

(ගොවියෝ) පුනපුනා බිජුවට වපුරත් ම ය. වැස්ස පුනපුනා වසී. ගොවියෝ පුනපුනා කෙත සාත්. ධාන්‍ය පුනපුනා රටට පැමිණේ.

යදියෝ පුනපුනා ඉල්ලත්. දනපතීහු පුනපුනා දන් දෙත්. දනපතීහු පුනපුනා දන් දී පුනපුනා සවගීස්ථානයට පැමිණෙත්.

කිරි දෙවන්නෝ පුනපුනා දෙවත්. වස්සා මව සාරා පුනපුනා එළඹේ. (සත්ත්ව තෙමේ) පුනපුනා ක්ලාන්ත ද, කම්පිත ද වෙයි. බාල තෙමේ පුනපුනා ගැබට පැමිණේ.

පුනපුනා උපදියි. මියෙයි. පුනපුනා සොහොනට ගෙණ යෙත්. නුවණැත්තේ නිවණ ලැබ පුනපුනා නූපදී.

මෙසේ වදාළ කල්හි උදය බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා යි.

7. 2. 3.

දෙවහිතසුත්තං.

199. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන භගවා වාතෙහි ආබාධිකො හොති. ආයස්මා ච **උපවාණො** භගවතො උපට්ඨාකො හොති.

අථ ඛො භගවා ආයස්මන්තං උපවාණං ආමන්තෙසි: ඉඞ්ඝ මෙ ත්වං උපවාණ උණ්හොදකං ජානාහී ති.

එවං භන්තෙති ඛො ආයස්මා උපවාණො භගවතො පටිස්සුත්වා නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන **දෙවහිතස්ස** බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තුණ්හීභූතො එකමන්තං අට්ඨාසි.

අද්දසා ඛො දෙවහිතො බ්‍රාහ්මණො ආයස්මන්තං උපවාණං තුණ්හීභූතං එකමන්තං ඨිතං. දිස්වාන ආයස්මන්තං උපවාණං ගාථාය අජ්ඣභාසි:

තුණ්හීභූතො භවං තිට්ඨං මුණ්ඩො සඞ්ඝාටිපාරුතො,
කිං පත්ථයානො කිං එසං කිං නු යාචිතුමාගතොති?.

[උපවාණො:]

අරහං සුගතො ලොකෙ වාතෙහාබාධිකො මුනි,
සචෙ උණ්හොදකං අත්ථි මුනිනො දෙහි බ්‍රාහ්මණ.

පූජිතො පූජනෙය්‍යානං සක්කරෙය්‍යාන[1] සක්කතො,
අපචිතො අපචෙය්‍යානං[2] තස්ස ඉච්ඡාමි හාතවෙති.

අථ ඛො දෙවහිතො බ්‍රාහ්මණො උණ්හොදකස්ස කාජං පුරිසෙන ගාහාපෙත්වා[3] ඵාණිතස්ස ච පුටං ආයස්මතො උපවාණස්ස පාදාසි.

අථ ඛො ආයස්මා උපවාණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං උණ්හොදකෙන න්හාපෙත්වා උණ්හොදකෙන ඵාණිතං ආලොලෙත්වා භගවතො පාදාසි. අථ ඛො භගවතො සො[4] ආබාධො පටිප්පස්සම්භි.

අථ ඛො දෙවහිතො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

එකමන්තං නිසින්නො ඛො දෙවහිතො බ්‍රාහ්මණො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

කත්ථ දජ්ජා දෙය්‍යධම්මං කත්ථ දින්නං මහප්ඵලං,
කථං හි යජමානස්ස කත්ථ[5] ඉජ්ඣති දක්ඛිණාති?

[භගවා:]

පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි.

---

1. සක්කරෙය්‍යානං - සීමු. PTS සක්කාතෙය්‍යානං සී 1, 2. 2. අපචෙතය්‍යානං - සීමු. අපචිතෙය්‍යානං ස්‍යා. 3. ගහාපෙත්වා - මජ්ඣං. ස්‍යා. 4. "සො" ඉති නත්ථි, මජ්ඣං. 5. කථං - මජ්ඣං. PTS.

7. 2. 3.

දේවහිත සූත්‍රය.

199. **සැවැත්නුවර—**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ වාතයෙන් හටගත් ආබාධ ඇති සේක. ආයුෂමත් **උපවාන** තෙමේ ද භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් උපවාන ඇමතූ සේක. උපවාන, බලව, තෙපි මට උණුදිය (ලැබෙන සැටියක්) දනිවු සි.

වහන්ස, එසේ ය යි කියා ආයුෂමත් උපවාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා හැඳ පෙරෙව පා සිවුරු ගෙණ දේවහිත බමුණාගේ නිවෙස්න වෙත එළඹියේ ය. එළඹ නිශ්‍ශබ්ද ව එකත්පසෙක සිටියේ ය.

දේවහිත බමුණු තෙමේ නිශ්‍ශබ්ද ව එකත්පසෙක සිටි ආයුෂමත් උපවාන තෙරුන් දුක්කේ ය. දුක ආයුෂමත් උපවාන තෙරුන්ට ගාථායෙන් කීය:

හිස මුඩු කළ සඟල සිවුරු පෙර වූ භවත් තෙමේ කුමක් පතමින් කුමක් සොයමින් නිශ්‍ශබ්ද ව සිටිතෙහි ද, කුමක් ඉල්ලන්නට ආයෙහි ද?

[උපවාන:]

බමුණ, ලොව අහීත් වූ සුගත වූ මුනීන්ද්‍රයන් වහන්සේ වාතයෙන් වූ ආබාධ ඇති සේක. ඉදින් උණුදිය ඇත් නම් මුනීන්ද්‍රයන් වහන්සේට දෙව.

පිදිය යුත්තන් විසින් පුදන ලද සත්කාර කටයුත්තන් විසින් සත්කාර කරණ ලද අපචිති (අපචායන) කටයුත්තන් විසින් අපචිති කරණ ලද ඒ බුදුරජානන් වහන්සේට ගෙණ යන්නට (උණුදිය) කැමැත්තෙමි.

ඉක්බිති දේවහිත බමුණු තෙමේ උණුදිය කදක් පුරුෂයකු ලවා ගත්වා සකුරුපිඩක් ද ආයුෂමත් උපවාන තෙරුන්ට පිදී ය.

ඉක්බිති ආයුෂමත් උපවාන තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ උණුදියෙන් නාවා උණුදියෙන් සකුරු දිය කොට භාග්‍යවතුන් වහන්සේට පිදී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය සංසිඳුනේ ය.

එකල්හි දේවහිත බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් දේවහිත බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

දෙයධර්මය කවරකුට දෙන්නේ ද? කවරකුට දෙන ලද්දේ මහත්ඵල වේ ද? කෙබඳු අයුරකින් කවරකුට දෙන්නහුගේ දක්ෂිණාව සමෘද්ධ වේ ද?

[භගවත්හු:]

යමෙක් පෙර විසූ කඳපිළිවෙළ දනී ද, ස්වර්ගය හා අපායන් දකී ද, වැලි ජාතික්‍ෂයසඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පැමිණියේ ද, මාර්ගඥානයෙන් (චතුස්සත්‍යය) දුන නිම වූ කිස ඇත්තේ ද, කායමෞනත්වාදි මෞනගුණ යුක්ත ද,

එත්ථ දජ්ජා දෙය්‍යධම්මං එත්ථ දින්නං මහප්ඵලං,
එවං හි යජමානස්ස එවං ඉජ්ඣති දක්ඛිණාති.

එවං වුත්තෙ දෙවහිතො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 4.

මහාසාලසුත්තං.

200. සාවත්ථියං—

අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණමහාසාලො ලූඛො[1] ලූඛපාපුරණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං බ්‍රාහ්මණමහාසාලං භගවා එතදවොච. කින්නු ත්වං බ්‍රාහ්මණ ලූඛො[1] ලූඛපාපුරණොති.

[බ්‍රාහ්මණො:]

ඉධ මෙ භො ගොතම චත්තාරො පුත්තා. තෙ මං දාරෙහි සම්පුච්ඡ ඝරා නික්ඛාමෙන්තීති.

[භගවා:]

තෙන හි ත්වං බ්‍රාහ්මණ ඉමා ගාථායො පරියාපුණිත්වා සභායං මහාජනකායෙ සන්නිපතිතෙ පුත්තෙසු ච සන්නිසින්නෙසු භාසස්සු:

යෙහි ජාතෙහි නන්දිස්සං යෙසඤ්ච භවමිච්ඡිසං,
තෙ මං දාරෙහි සම්පුච්ඡ සාව වාරෙන්ති සූකරං.

අසන්තා කිර මං ජම්මා තාත තාතාති භාසරෙ,
රක්ඛසා පුත්තරූපෙන පජහන්ති[2] වයොගතං.

අස්සාව ජිණ්ණො නිබ්භොගො ඛාදනා අපනීයති,
බාලකානං[3] පිතා ථෙරො පරාගාරෙසු භික්ඛති.

දණ්ඩොව කිර මෙ සෙය්‍යො යඤ්චෙ පුත්තා අනස්සවා,
චණ්ඩම්පි ගොණං වාරෙති අථො චණ්ඩම්පි කුක්කුරං.

අන්ධකාරෙ පුරෙ හොති ගම්භීරෙ ගාධ මෙධති,
දණ්ඩස්ස අනුභාවෙන බලිත්වා පටිතිට්ඨතීති[4].

අථ ඛො සො බ්‍රාහ්මණමහාසාලො භගවතො සන්තිකෙ ඉමා ගාථායො පරියාපුණිත්වා සභායං මහාජනකායෙ සන්නිපතිතෙ පුත්තෙසු ච සන්නිසින්නෙසු අභාසි.

---

1 'ලූඛො,' ඌනං - මජසං. 2. තෙ ජහන්ති - මජසං සහ. PTS 3. බාලානං - සී 1, 2.
4. පතිතිට්ඨතීති - මජසං.

මොහුට දේයධර්මය දෙන්නේ ය. මොහුට දෙන ලද්ද මහත්ඵල වේ. මෙසේ දෙන්නහුගේ දක්ෂිණාව මෙසේ සමෘද්ධ වේ.

මෙසේ වදාළ කල්හි දේවහිත බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවියෙන් ගත් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා යි.

7. 2. 4.

මහාසාල සූත්‍රය.

200. **සැවැත්නුවර—**

ඉක්බිති ජරාවට පත් වූ දිරා ගිය වසනු ඇති **එක්තරා බමුණු-මහසලෙක්** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත් පසෙක හිඳගත්තේ ය. එකත්පසෙක හුන් ඒ බමුණු මහසළුට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: බමුණ, කුමක් හෙයින් තෝ ජරාවට පත්වූයෙහි දිරා ගිය වසනු ඇත්තෙහි ද?

[බමුණු:]

භවත් ගෞතමයෙනි, මෙහි මාගේ පුත්තු සතර දෙනෙකි. ඔහු අඹුවන් හා සාකච්ඡා කොට ගෙණ මා ගෙයින් නෙරති යි.

[භගවත්හු:]

බමුණ, එසේ වී නම් තෝ මේ ගාථා ඉගෙණ සභාවක මහජනසමූහයා රැස්වූ කල්හි පුතුන් ද හිඳගත් කල්හි කියව:

(මට දුව) උපන්නා වූ යම් කෙනකුන් කරණ කොට ගෙණ සතුටු වූයෙම් ද, යම් කෙනකුන්ගේ අභිවෘද්ධිය පැතුයෙම් ද, ඔහු අඹුවන් හා සාකච්ඡා කොට ගෙණ බල්ලෝ හූරකු (වළකන්නාක්) මෙන් මා වළකති.

අසත්පුරුෂ වූ ලාමක වූ රකුසෝ පුත්‍රයන් මෙන් (පෙණී සිටිමින්) මට පියානෙනි පියානෙනි යි කියත්. ඔහු ඉක්ම ගිය වයස් ඇති මා දුරු කෙරෙත්.

පරිභෝගයට නුසුදුසු වූ ජරපත් අසකු මෙන් දිරා ගියා වූ පරිභෝග ධනය නැත්තා වූ බාලයන්ගේ පියා වූ මහල්ලා කෑමෙන් පහ කරණු ලැබේ. (එහෙයින් හෙ තෙමේ) පරගෙවල සිඟයි.

මාගේ යම් ඒ පුත්‍රයෝ තොඃකීකාරු ද, (ඔවුන්ට වඩා) මට මේ සැරයටිය ම ශ්‍රෙෂ්ඨ ය. (මේ සැරයටිය) සැඩගොණකුදු වළකයි. වැලි සැඩබල්ලකුත් (වළකයි.)

අඳුරෙහි පෙරටු වෙයි. ගැඹුරෙහි (ගැඹුරැදියෙහි) පිහිට ලබයි. පැකිලී දණ්ඩෙහි අනුභාවයෙන් නැවත පිහිටා සිටියි. (එහෙයිනි.)

ඉක්බිති ඒ බමුණු මහසල් තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා ඉගෙණ සභාවෙහි මහාජනයා රැස් වූ කල්හි පුතුන් ද හිඳගත් කල්හි කී ය.

"යෙහි ජාතෙහි නන්දිස්සං යෙසඤ්ච භවමිච්ඡිසං,
තෙ මං දාරෙහි සම්පුච්ඡ සාව වාරෙන්ති සූකරං.

අසන්තා කිර මං ජම්මා තාත තාතාති භාසරෙ,
රක්ඛසා පුත්තරූපෙන පජහන්ති වයොගතං.

අස්සොව ජිණ්ණො නිබ්භොගො ඛාදනා අපනීයති,
බාලකානං පිතා ථෙරො පරාගාරෙසු භික්ඛති.

දණ්ඩොව කිර මෙ සෙය්‍යො යඤ්චෙ පුත්තා අනස්සවා,
චණ්ඩම්පි ගොණං වාරෙති අථො චණ්ඩම්පි කුක්කුරං.

අන්ධකාරෙ පුරෙ හොති ගම්භීරෙ ගාධ මෙධති,
දණ්ඩස්ස අනුභාවෙන ඛලිත්වා පතිට්ඨතී"ති.

අථ ඛො තං බ්‍රාහ්මණමහාසාලං පුත්තා ඝරං නෙත්වා න්හාපෙත්වා පච්චෙකං දුස්සයුගෙන අච්ඡාදෙසුං.

අථ ඛො සො බ්‍රාහ්මණමහාසාලො එකං දුස්සයුගං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණමහාසාලො භගවන්තං එතදවොච: මයං භො ගොතම බ්‍රාහ්මණා නාම ආචරියස්ස ආචරියධනං පරියෙසාම. පටිගණ්හාතු මෙ භවං ගොතමො ආචරියො ආචරියධනන්ති.[1] පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

අථ ඛො සො බ්‍රාහ්මණමහාසාලො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම. -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 5.

මානත්ථද්ධසුත්තං.

201. සාවත්ථියං—

තෙන ඛො පන සමයෙන මානත්ථද්ධො නාම බ්‍රාහ්මණො සාවත්ථියං පටිවසති. සො නෙව මාතරං අභිවාදෙති. න පිතරං අභිවාදෙති. න ආචරියං අභිවාදෙති. න ජෙට්ඨභාතරං අභිවාදෙති.

තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙති. අථ ඛො මානත්ථද්ධස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: අයං ඛො සමණො ගොතමො මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙති. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං. සචෙ මං සමණො ගොතමො ආලපිස්සති, අහම්පි තං ආලපිස්සාමි. නො චෙ මං සමණො ගොතමො ආලපිස්සති අහම්පි තං නාලපිස්සාමීති.

1. ආචරියභාගන්ති - සීමු. 1.2.

(මට දු ව) උපන්නාවූ යම් කෙනකුන් කරණ කොට ගෙණ සතුටු වූයෙම් ද, යම් කෙනකුන් ගේ අභිවෘද්ධිය පැතුයෙම් ද, ඔහු ද අඹුවන් හා සාකච්ඡා කොට ගෙණ බල්ලෝ හූරකු (වලකන්නාක්) මෙන් මා වලකති.

අසත්පුරුෂ වූ ලාමක වූ රකුසෝ පුත්‍රයන් මෙන් (පෙණී සිටිමින්) මට පියාතෙනි, පියාතෙනි යි කියත්. ඔහු ඉක්ම ගිය වයස් ඇති මා දුරු කෙරෙත්.

පරිභෝගයට නුසුදුසු වූ ජරපත් අසකු මෙන් දිරා ගියා වූ පරිභෝග ධනය නැත්තා වූ බාලයන්ගේ පියා වූ මහල්ලා කැමෙන් පහ කරණු ලැබේ. (එහෙයින් හෙ තෙමේ) පරගෙහි සිඟයි

මාගේ යම් ඒ පුත්‍රයෝ නොකීකරු ද, (ඔවුන්ට වඩා) මට මේ සැරයටිය ම ශ්‍රේෂ්ඨ ය. (මේ සැරයටිය) සැඩගොණකුදු වලකයි. වැලි සැඩබල්ලකුත් (වලකයි.)

අඳුරෙහි පෙරටු වෙයි. ගැඹුරෙහි පිහිට ලබයි. පැකිලී දණ්ඩෙහි අනුභාවයෙන් නැවත පිහිටා සිටියි. (එහෙයිනි.)

ඉක්බිති පුත්‍රයෝ ඒ බමුණු මහසල්හු ගෙට පමුණුවා නාවා වෙන වෙන වස්ත්‍රයුගමයෙන් පිදූහ. එකල ඒ බමුණු මහසල් තෙමේ එක් වස්ත්‍රයුගමයක් රැගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ බමුණු මහසල් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය:

භවත් ගෞතමයෙනි, අපි බමුණෝ වෙමු. ඇදුරහුට ඇදුරුධනය සොයම්හ. මාගේ ඇදුරු වූ භවත් ගෞතමයන් වහන්සේ ඇදුරුධනය පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාව නිසා පිළිගෙණ වදාළ සේක.

ඉක්බිති ඒ බමුණු මහසල් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්ස, මා අද පටන් දිවි යෙන් ගත් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා යි.

7. 2. 5.

මානත්ථද්ධසූත්‍රය.

201. **සැවැත්නුවර—**

එකල්හි මානත්ථද්ධ නම් බමුණෙක් සැවැත්නුවර වෙසෙයි. හෙතෙම මව නො ම වඳී. පියා නො ම වඳී. ඇදුරහු නො ම වඳී. දෙටු බෑයා නො ම වඳී.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිස විසින් පිරිවරණ ලද්දනු දහම් දෙසන සේක. ඉක්බිති මානත්ථද්ධ බමුණාහට මේ මහණගොයුම් තෙමේ මහත් පිරිස විසින් පිරිවරණ ලදු ව දහම් දෙසයි. මම මහණගොයුම් වෙත එළඹෙන්නෙම් නම් මැනැව. ඉදින් මහණගොයුම් තෙමේ මට කථා කරන්නේ නම් මමත් ඔහුට කථා කරන්නෙමි. ඉදින් මහණගොයුම් තෙමේ මට කථා නො කරන්නේ නම් මමත් ඔහුට කථා නො කරන්නෙමි.

අථ ඛො මානත්ථද්ධො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තුණ්හීභූතො[1] එකමන්තං අට්ඨාසි අථ ඛො භගවා තං නාලපි[2]. අථ ඛො මානත්ථද්ධො බ්‍රාහ්මණො නායං සමණො ගොතමො කිඤ්චි ජානාතීති තතොව පුන නිවත්තිතුකාමො අහොසි.

අථ ඛො භගවා මානත්ථද්ධස්ස බ්‍රාහ්මණස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය මානත්ථද්ධං බ්‍රාහ්මණං ගාථාය අජ්ඣභාසි:

න මාන බ්‍රූහණා සාධු* අත්ථිකස්සීධ බ්‍රාහ්මණ,
යෙන අත්ථෙන ආගඤ්ඡි[3] තමෙවමනුබ්‍රූහයෙති†.

අථ ඛො මානත්ථද්ධො බ්‍රාහ්මණො චිත්තං මෙ සමණො ගොතමො ජානාතීති තත්ථෙව භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන[4] පරිචුම්බති, පාණීහි ච පරිසම්බාහති, නාමඤ්ච සාවෙති: 'මානත්ථද්ධාහං භො ගොතම මානත්ථද්ධාහං භො ගොතමා'ති.

අථ ඛො සා පරිසා අබ්භුතචිත්තජාතා අහොසි. අච්ඡරියං වත භො අබ්භුතං වත භො අයං හි මානත්ථද්ධො බ්‍රාහ්මණො නෙව මාතරං අභිවාදෙති. න පිතරං අභිවාදෙති න ආචරියං අභිවාදෙති න ජෙට්ඨභාතරං අභිවාදෙති අථ ච පන සමණෙ ගොතමෙ එවරූපං පරමනිපච්චාකාරං[5] කරොතීති.

අථ ඛො භගවා මානත්ථද්ධං බ්‍රාහ්මණං එතදවොච: අලං බ්‍රාහ්මණ උට්ඨෙහි, සකෙ ආසනෙ නිසීද, යතො තෙ මයි චිත්තං පසන්නන්ති.

අථ ඛො මානත්ථද්ධො බ්‍රාහ්මණො සකෙ ආසනෙ නිසීදිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

කෙසු න මානං කයිරාථ[6] කෙසු චස්ස[7] සගාරවො,
ක්‍යස්ස අපචිතා අස්සු ක්‍යස්සු[8] සාධු සුපූජිතා.

[භගවා:]

මාතරි පිතරි චාපි[9] අථො ජෙට්ඨම්හි භාතරි,
ආචරියෙ චතුත්ථම්හි‡ තෙසු න මානං කයිරාථ.
තෙසු අස්ස සගාරවො ත්‍යස්සු[10] අපචිතා අස්සු තෙවස්සු සාධු පූජිතා[11].

අරහන්තෙ සීතිභූතෙ[12] කතකිච්චෙ අනාසවෙ,
නිහච්ච මානං අත්ථද්ධො තෙ නමස්ස[13] අනුත්තරෙ.

එවං වුත්තෙ මානත්ථද්ධො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච අභික්කන්තං භො ගොතම, – පෙ – උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

---

1. 'තුණ්හීභූතො' ඉති නත්ථි, ස්‍යා 2. නාලපති - සීමු, ස්‍යා. 3 ආගච්ඡි - මජ්ඣං. PTS.
4. මුඛෙන ච - මජ්ඣං. PTS. 5. නිපච්චකාරං - මජ්ඣං. ස්‍යා. 6. මානං න - සීමු. 1.
7. චෙසු අස්ස - PTS. කථංසචස්ස - ස්‍යා 8. ක්‍යස්සු - මජ්ඣං. PTS. 9. ච්‍යාපි – මජ්ඣං,
10. ත්‍යස්ස - සීමු 2 11. ත්‍යස්සු සාධු සුපූජිතා - මජ්ඣං. PTS. 12. සීතිංභූතෙ - ස්‍යා.
13. නමස්සෙ - මජ්ඣං.

* න මානං බ්‍රාහ්මණ සාධු - සීමු 2. මජ්ඣං. ස්‍යා PTS. න මානං බ්‍රූහණං සාධු - සී 1, 2.
† අනුබ්‍රූහයි - සී 1, 2. ‡ චතුත්ථම්හි. - සබ්බත්ථ.

ඉක්බිති මානත්ථද්ධ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ නිශ්ශබ්ද ව එකත්පසෙක සිටියේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහුට කථා නොකළ සේක. ඉක්බිති මානත්ථද්ධ බමුණු තෙමේ මේ මහණගොයුම් තෙමේ කිසිත් නො දනීයයි එතැනින් ම නැවත පෙරළා එනු කැමැත්තේ වි ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ තම සිතින් මානත්ථද්ධ බමුණාගේ චිත්තපරිවිතර්කය දැන මානත්ථද්ධ බමුණාට ගාථායෙන් වදාළ සේක:

බමුණ, මෙහි ප්‍රයෝජනයක් අපේක්‍ෂා කරන්නහුට මානය වැඩීම නො මැනවි. යම් ප්‍රයෝජනයක් හේතු කොට ගෙණ පැමිණියේ නම් එය ම සිදුකර ගන්නේ ය.

ඉක්බිති මානත්ථද්ධ බමුණු තෙමේ මහණගොයුම් තෙමේ මාගේ සිත දනී යයි එහි ම භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේගේ පා මුවෙන් සිඹී. අතින් ද පිරිමදී. "භවත් ගෞතමයෙනි, මම මානත්ථද්ධ යෙමි. භවත් ගෞතමයෙනි, මම මානත්ථද්ධ යෙමි" යි තම ද අස්වයි.

ඉක්බිති ඒ පිරිස "පින්වත්නි, ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත්නි, අද්භූතයෙකි. මේ මානත්ථද්ධ බමුණු තෙමේ මව නො ම වඳී. පියා නො ම වඳී. ඇදුරහු නො ම වඳී. දෙටුබෑයා නොම වඳී. එහෙත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි මෙබඳු ඉතා ම යටත් පහත් පැවැතුම් ඇති බවක් කෙරේ ය යි අද්භූත සිත් ඇති වූවා ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මානත්ථද්ධ බමුණාට මෙය වදාළ සේක: බමුණ, පමණී. නැගිටුව. සිය අසුනෙහි හිඳ ගණුව. යම් හෙයෙකින් තාගේ සිත මා කෙරෙහි පහන් ද, (එහෙයිනි).

ඉක්බිති මානත්ථද්ධ බමුණු තෙමේ සිය අසුනෙහි හිඳ භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් කී ය:

කවර කෙනකුත් කෙරෙහි මානය නො කරන්නේ කවරකෙනකුත් කෙරෙහි ගෞරව සහිත වන්නේ ද? ඔහු විසින් කවර කෙනෙක් අපචිති කටයුත්තෝ වන්නාහු ද? ඔහු විසින් කවර කෙනෙක් මැනවින් පිදියයුත්තෝ වන්නාහු ද?

[භගවත්හු:]

මව කෙරෙහි ද, පියා කෙරෙහි ද, වැලි දෙටුබෑයා කෙරෙහි ද, සිවුවැනි ව ඇදුරා කෙරෙහි ද යි යන මොවුන් කෙරෙහි මානය නො කරන්නේ ය. මොවුන් කෙරෙහි ගෞරව සහිත වන්නේ ය. ඔහු විසින් මොහු අපචිති කටයුත්තෝ වන්නාහ. ඔහු විසින් මොහු මැනවින් පිදියයුත්තෝ වන්නාහ.

සිහිල් වූ කළකිස ඇති ආස්‍රව රහිත වූ නිරුත්තර වූ ඒ රහතුන් (මානයෙන්) තද නො වී මානය නසා වඳුව.

මෙසේ වදාළ කල්හි මානත්ථද්ධ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවියෙන් ගත් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා.

7. 2. 6.

පච්චනීකසුත්තං.

202. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන **පච්චනීකසාතො** නාම බ්‍රාහ්මණො සාවත්ථියං පටිවසති. අථ ඛො පච්චනීකසාතස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. යන්නූනාහං යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමෙය්‍යං යං යදෙව සමණො ගොතමො භාසිස්සති, තං තදෙවස්සාහං පච්චනීකාස්සන්ති.

තෙන ඛො පන සමයෙන භගවා අබ්භොකාසෙ චඞ්කමති. අථ ඛො පච්චනීකසාතො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං චඞ්කමන්තං අනුචඞ්කමමානො[1] භගවන්තං එතදවොච: භණ සමණ ධම්මන්ති

[භගවා:]

න පච්චනීකසාතෙන සුවිජානං සුභාසිතං,
උපක්කිලිට්ඨචිත්තෙන සාරම්භබහුලෙන ච.

යො ච විනෙය්‍ය සාරම්භං අප්පසාදඤ්ච චෙතසො,
ආඝාතං පටිනිස්සජ්ජ ස වෙ[2] ජඤ්ඤා සුභාසිතන්ති.

එවං වුත්තෙ පච්චනීකසාතො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 7.

නවකම්මිකසුත්තං.

203. එකං සමයං භගවා **කොසලෙසු** විහරති **අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ**.

තෙන ඛො පන සමයෙන **නවකම්මිකභාරද්වාජො** බ්‍රාහ්මණො තස්මිං වනසණ්ඩෙ කම්මන්තං කාරාපෙති. අද්දසා ඛො නවකම්මිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං අඤ්ඤතරස්මිං සාලරුක්ඛමූලෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. දිස්වානස්ස එතදහොසි: අහං ඛො පන[3] ඉමස්මිං වනසණ්ඩෙ කම්මන්තං කාරාපෙන්තො රමාමි. අයං සමණො ගොතමො කිං කාරාපෙන්තො රමතීති.

අථ ඛො නවකම්මිකභාරද්වාජො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

කෙ නු කම්මන්තා කයිරන්ති[4] භික්ඛු සාලවනෙ තව,
යදෙකකො අරඤ්ඤස්මිං රතිං වින්දසි ගොතමාති.[5]

---

1 අනුචඞ්කමමානොති නත්ථි - මජසං. PTS 2. සචෙ - සයා. 3. "පන" ඉති නත්ථි - මජසං. සයා, PTS, 4. කරියන්ති - මජසං. 5. වින්දති ගොතමොති - මජසං. සයා. PTS.

7. 2. 6.

පච්චනීක සූත්‍රය.

202. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් වූ **අනේපිඩු සිටුහුගේ** අරමෙහි වැඩ වසන සේක.

එකල්හි **පච්චනීකසාත** නම් බමුණෙක් සැවැත්නුවර වෙසෙයි. ඉක්බිති පච්චනීකසාත බමුණාහට "මම මහණ ගොයුම්හු වෙත එළඹෙන්නෙම් නම් මැනවි. මහණ ගොයුම් යමක් යමක් ම කියන්නේ ද, මම ඔහුගේ ඒ ඒ වදනට ම විරුද්ධ වන්නෙමි"යි මේ අදහස විය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ අබවස සක්මන් කරණ සේක. එවිට පච්චනීකසාත බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ සක්මන් කරණ භාග්‍යවතුන් වහන්සේ අනුව සක්මන් කරමින් භාග්‍යවතුන් වහන්සේට "ශ්‍රමණයෙනි දහම් දෙසනු මැනවැ"යි මෙය කීය.

[භගවත්හු.]

පච්චනීකසාත වූ කිලිටිසිත් ඇති කරණුත්තාරියකරණය බහුල කොට ඇති පුද්ගලයා විසින් සුබැසි දහම මොනවට නො දතහැක්කේ ය.

යමෙක් සිතේ අප්‍රසාදය ද බද්ධවෛරය ද දුරු කොට සාරම්භය බැහැර කොට (සිටියේ ද) හෙ තෙමේ ඒකාන්තයෙන් සුබැසි දහම දැන ගන්නේ ය.

මෙසේ වදාළ කල්හි පච්චනීකසාත බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා!

7. 2. 7.

නවකම්මික සූත්‍රය.

203. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක** වැඩවසන සේක.

එකල්හි **නවකම්මිකභාරද්වාජ** බමුණු තෙමේ ඒ වනලැහැබෙහි කර්මාන්ත කරවයි. නවකම්මිකභාරද්වාජ බමුණු තෙමේ එක්තරා සල්රුකක්-මුල උඩුකය කෙළින් තබා (කමටහනට) අභිමුඛ කොට සිහි එළවා පලක් බැඳ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක ඔහුට "මම වනාහි කර්මාන්ත කරවමින් මේ වනලැහැබෙහි සිත් අලවමි. මේ මහණගොයුම් තෙමේ කුමක් කරවමින් සිත් අලවා දැ"යි මේ අදහස වි ය.

ඉක්බිති නවකම්මිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය:

මහණ, ඔබවහන්සේ විසින් මේ සල්වෙනෙහි කිනම් කර්මාන්තයෝ කරණු ලැබෙද්ද? ගෞතමයෙනි, යම් හෙයෙකින් මේ වෙනෙහි හුදෙකලා ව ඇල්ම විඳිති ද? (එහෙයින්) මෙසේ විචාරමි.

න[1] මෙ වනස්මිං කරණීයමත්ථි උච්ඡින්නමූලං මෙ වනං විසූකං,
ස්වාහං[2] වනෙ නිබ්බනථො විසල්ලො එකො රමෙ අරතිං විප්පහායාති.

එවං වුත්තෙ නවකම්මිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 8.

කට්ඨහාරසුත්තං

204. එකං සමයං භගවා **කොසලෙසු** විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස **භාරද්වාජගොත්තස්ස** බ්‍රාහ්මණස්ස සම්බහුලා අන්තෙවාසිකා කට්ඨහාරකා[3] මාණවකා යෙන සො[4] වනසණ්ඩො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අද්දසංසු භගවන්තං තස්මිං වනසණ්ඩෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

දිස්වාන යෙන භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භාරද්වාජගොත්තං බ්‍රාහ්මණං එතදවොචුං: යග්ඝෙ භවං ජානෙය්‍ය[5] අසුකස්මිං වනසණ්ඩෙ සමණො[6] නිසින්නො පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වාති.

අථ ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො තෙහි මාණවකෙහි සද්ධිං යෙන සො වනසණ්ඩො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අද්දසා ඛො භගවන්තං තස්මිං වනසණ්ඩෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාහි අජ්ඣභාසි:

ගම්භීරරූපෙ බහුභෙරවෙ වනෙ සුඤ්ඤං අරඤ්ඤං විජනං විගාහිය,
අනිඤ්ජමානෙන ඨිතෙන[7] වග්ගුනා සුචාරුරූපං[8] වත භික්ඛු ඣායසි.

න යත්ථ ගීතං න පි යත්ථ වාදිතං එකො අරඤ්ඤෙ වනමස්සිතො මුනි,
අච්ඡෙරරූපං පටිභාති මං ඉදං යදෙකකො පීතිමනො වනෙ වසෙ.

මඤ්ඤාමහං[9] ලොකාධිපතී සහව්‍යතං[10] ආකඞ්ඛමානො තිදිවං අනුත්තරං,
කස්මා භවං විජනමරඤ්ඤමස්සිතො තපො ඉධ කුබ්බසි[11] බ්‍රහ්මපත්තියාති.

---

1. න ච මෙ - සීමු 1. සභා. 2. සොහං - PTS. 3. කට්ඨහාරකා නාම - සීමු 1. 2. 4 සොති නත්ථි - මජසං. 5. ජානෙය්‍යාසි - මජසං. 6. සමණො ගොතමො - සභා. 7. ඨිතෙන - සභා. 8. සුචරරූපං - අට්ඨ: 9. මඤ්ඤෙහං - PTS. 10. ලොකාධිපතිං සහව්‍යතං - සීමු 1. ලොකාධිපති සහව්‍යතං - PTS. මජසං, සභා. 11. කුබ්බසී - මජසං.

මට මේ වෙනෙහි කටයුත්තෙක් නැත. මාගේ කෙලෙස්වනය මුලුසුන් කරණ ලද්දේ ය. පහව ගිය (කෙලෙස්) කටු ඇත්තේ ය. ඒ මම නිකෙලෙයි ව පහ ව ගිය (රාගාදි) හුල් ඇති ව (ප්‍රාන්තසේනාසනයන්හි හා භාවනාවෙහි) නොඇල්ම වෙසෙසින් පහ කොට මේ වෙනෙහි එකලාව සිත් අලවා වෙසෙමි.

මෙසේ වදාළ කල්හි නවකම්මිකභාරද්වාජ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ යː භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිමියෙන් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා.

7. 2. 8.

කට්ඨහාරසූත්‍රය

204. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **කොසොල්දනව්වෙහි** එක්තරා වනලැහැබෙක වැඩවසන සේක.

එකල්හි එක්තරා **භාරද්වාජගෝත්‍ර** බමුණකුගේ අතැවැසි වූ දර ගෙණෙන බොහෝ මාණවකයෝ ඒ වනලැහැබ වෙත එළඹියහ. එළඹ ඒ වනලැහැබෙහි පලක් බැඳ උඩුකය කෙළින් තබා අභිමුඛ කොට සිහි එළවා වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටහ. දැක භාරද්වාජගෝත්‍ර බමුණා වෙත එළඹියහ. එළඹ භාරද්වාජගොත්‍ර බමුණාහට "භවත් තෙමේ දන්නේ ද? අසවල් වනලැහැබෙහි මහණෙක් පලක් බැඳ උඩුකය කෙළින් තබා සිහිය අභිමුඛ කොට එළවා හුන්නේ ය"යි මෙය කීහ.

ඉක්බිති භාරද්වාජගෝත්‍ර බමුණු ඒ මණෙවුන් සමග ඒ වනලැහැබ වෙත එළඹියේ ය. එළඹ ඒ වනලැහැබෙහි පලක් බැඳ උඩුකය කෙළින් තබා අභිමුඛ කොට සිහි එළවා වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය;

ශ්‍රමණයෙනි, හිස් වූ, ජනයාගෙන් තොර වූ, අරණ්‍යයට පිවිස ගැඹුරු සවභාවය ඇති බොහෝ සෙයින් බිය එළවන මේ වෙනෙහි නොසැලෙන සථිර වූ මනහර සිරුරෙන් යුක්ත ව ඒකාන්තයෙන් සොඳුරු සවභාවය ඇති ධ්‍යාන කෙරෙහි.

යම් තැනෙක ගී ගැයුම් නැද්ද, යම් තැනෙක වැයුමෙකුත් නැද්ද, (එබඳු වූ මේ) වෙනෙහි සඞ්ඥමුනි තෙමේ හුදෙකලා ව වනසෙනසුන් ඇසුරු කෙළේ ය. යම් හෙයෙකින් එකලා ව ම තුටුසිත් ඇති ව වෙනෙහි වෙසෙන්නේ ද, (එහෙයින්) මෙකරුණ පුදුමයක් සේ මට වැටහෙයි.

ලොකාධිපති බ්‍රහමයා හා සහභාවය වූ නිරුත්තර බඹලොව පතමින් (වෙනෙහි වෙසෙහි යයි) මම හඟිමි. (තැනහොත්) භවත් කුමක් හෙයින් ජනයා කෙරෙන් තොර වූ වනය ඇසුරු කෙළේ ද? බ්‍රහමලෝකෝත්පත්තිය පිණිස මෙහි තපස් කෙරෙහි ද?

[භගවා:]

යා කාචි කඞ්ඛා අභිනන්දිතා වා අනෙකධාතූසු පුථූ සදාසිතා,
අඤ්ඤාණමූලප්පභවා පජප්පිතා සබ්බා මයා ව්‍යන්තිකතා[1] සමූලිකා.

ස්වාහං අකඞ්ඛො අසිතො අනූපයො සබ්බෙසු ධම්මෙසු විසුද්ධදස්සනො,
පප්පුය්‍ය සම්බොධිමනුත්තරං සිවං ඣායාමහං බ්‍රාහ්මණ[2] රහො විසාරදෙති.

එවං වුත්තෙ භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 9.

මාතුපොසකසුත්තං

205. සාවත්ථියං—

අථ ඛො මාතුපොසකො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මාතුපොසකො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අහං හි භො ගොතම ධම්මෙන භික්ඛං පරියෙසාමි. ධම්මෙන භික්ඛං පරියෙසිත්වා මාතාපිතරො පොසෙමි. කච්චාහං භො ගොතම එවංකාරී කිච්චකාරී හොමීති?

තග්ඝ ත්වං බ්‍රාහ්මණ එවංකාරී කිච්චකාරී හොසි[3]. යො ඛො බ්‍රාහ්මණ ධම්මෙන භික්ඛං පරියෙසති. ධම්මෙන භික්ඛං පරියෙසිත්වා මාතාපිතරො පොසෙති. බහුං[4] සො පුඤ්ඤං පසවතීති.

[භගවා:]

යො මාතරං වා[5] පිතරං වා මච්චො ධම්මෙන පොසති,
තාය නං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති.

එවං වුත්තෙ මාතුපොසකො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

1 ව්‍යන්තීකතා - සයා. 2. බ්‍රහ්ම - මජසං. සයා 3. අහොසි - සීමු 1.2. සයා. 4 බහු - PTS. 5. මාතරං - මජසං. සයා. PTS

[භගවත්හු:]

යම්කිසි අභිනන්‍දනස්වරූප තෘෂ්ණායෙක් හෝ අනේකස්වභාවාලම්බණයන්හි වූ නිරන්තර ඇසුරු කළ නානාප්‍රකාර සෙසු කෙලෙස් හෝ ඇද්ද, අවිද්‍යාව මූලප්‍රභවය කොට ඇති අවිද්‍යාමූල සහිත වූ ඒ සියලු තෘෂ්ණාවෝ මා විසින් නසන ලදහ.

බමුණ, ඒ මම තෘෂ්ණා රහිත වූයෙම් තෘෂ්ණාව ඇසුරු නො කෙළෙම් උපගමන රහිත වූයෙම් සියලු ධර්මයන්හි විශුද්ධදර්ශන ඇත්තෙම් වෙමි. ඒ මම නිරුත්තර වූ ශ්‍රේෂ්ඨ වූ සම්බෝධියට පැමිණ විශාරද ව රහසිගතව ධ්‍යාන කෙරෙමි.

මෙසේ වදාළ කල්හි භාරද්වාජගෝත්‍ර බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා.

7. 2. 9.

මාතුපොසක සූත්‍රය

205. **සැවැත්නුවර—**

එකල්හි **මාතුපොසක** බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් මාතුපොසක බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. භවත් ගෞතමයෙනි, මම වනාහි දැහැමින් භික්ෂාව සොයමි. දැහැමින් භික්ෂාව සොයා මවුපියන් පුසිමි. භවත් ගෞතමයෙනි, කිම? මම මෙසේ කරන්නෙම් කිස කරන්නෙකිම් වෙම් ද?

[භගවත්හු:]

බමුණ, මෙසේ කරණ තෝ ඒකාන්තයෙන් කිස කරන්නෙහි. බමුණ, යමෙක් දැහැමින් භික්ෂාව සොයා ද, දැහැමින් භික්ෂාව සොයා මවුපියන් පුසී ද, හෙ තෙමේ බොහෝ පින් රැස් කෙරෙයි.

යම් මිනිසෙක් මවත් පියාත් දැහැමින් පුසී ද, මවුපියන් කෙරෙහි වූ ඒ මෙහෙ කිරීම හේතු කොට ගෙණ පණ්ඩිතයෝ මේ ලොව්හි ම ඔහු පසසත්. පරලොව ස්වර්ගයෙහි සතුටු වෙයි.

මෙසේ වදාළ කල්හි මාතුපෝසක බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා.

7. 2. 10.

භික්ඛකසුත්තං

206. **සාවත්ථියං**—

අථ ඛො **භික්ඛකො** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භික්ඛකො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අහම්පි ඛො[1] භො ගොතම භික්ඛකො භවම්පි භික්ඛකො ඉධ නො කිං නානාකරණන්ති?

[භගවා:]

න තෙන භික්ඛකො හොති යාවතා භික්ඛතෙ පරෙ,
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා.

යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහිත්වා[2] බ්‍රහ්මචරියවා[3],
සඞ්ඛාය ලොකෙ චරති ස වෙ භික්ඛූති වුච්චති.

එවං වුත්තෙ භික්ඛකො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 11.

සඞ්ගාරවසුත්තං

207. **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන **සඞ්ගාරවො**[4] නාම බ්‍රාහ්මණො **සාවත්ථියං** පටිවසති. උදකසුද්ධිකො උදකෙන පරිසුද්ධිං[5] පච්චෙති. සායපාතං[6] උදකොරොහණානුයොගමනුයුත්තො විහරති.

අථ ඛො ආයස්මා **ආනන්දො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ඉධ භන්තෙ සඞ්ගාරවො[4] නාම බ්‍රාහ්මණො සාවත්ථියං පටිවසති, උදකසුද්ධිකො උදකෙන පරිසුද්ධිං[5] පච්චෙති සායපාතං[6] උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. සාධු භන්තෙ භගවා යෙන සඞ්ගාරවස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සඞ්ගාරවස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

---

1. අහමස්මි - සීමු. 1, 2 සයා. 2. පවාහෙත්වා - සයා. 3. බ්‍රහ්මචරියං - මජසං. සීමු. 1. PTS. සයා. 4 සඞ්ගරවො - සයා. 5. සුද්ධිං - සීමු. 1. 2. PTS. සී 1, 2. 6. සායංපාතං - සීමු. 1.

7. 2. 10.

භික්ඛක සූත්‍රය

206. **සැවැත්නුවර—**

එකල්හි **භික්ඛක** බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා **එකත්පසෙක** හුන්නේ ය. **එකත්පසෙක** හුන් භික්ඛක බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේය. භවත් ගෞතමයෙනි, මමත් භික්ෂුකයෙක්මි. භවත් තෙමේත් භික්ෂුකයෙකි. මෙහි ලා අප දෙදෙ-නාගේ කිනම් වෙනසෙක් ද?

[භගවත්හු:]

මෙරමා සිඟා යන මෙතෙක් වේ ද, එපමණෙකින් භික්ෂුකයෙක් නො වේ. දුර්ගන්ධය වූ අකුශලධර්මය සමාදන් ව (සිටියේ) ඒ තාක් භික්ෂු නම් නො වේ.

මේ සස්නෙහි යමෙක් පිණ ද පව ද බැහැර කොට වුසු බඹසර ඇත්තේ නුවණින් දැන ලොව්හි හැසිරේ ද, හෙ තෙමේ ඒකාන්තයෙන් භික්ෂු යයි කියනු ලැබේ.

මෙසේ වදාළ කල්හි භික්ෂක බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා.

7. 2. 11.

සඞ්ගාරව සූත්‍රය

207. **සැවැත්නුවර—**

එකල්හි **සඞ්ගාරව** නම් බමුණෙක් **සැවැත්නුවර** වෙසෙයි. ජලයෙන් ශුද්ධිය වේ යයි අදහන්නේ ජලයෙන් පිරිසිදු බව පතයි. උදය සවස දියට බැසීම් ව්‍රතයෙහි යෙදුනේ වෙසෙයි.

ඉක්බිති ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ: "වහන්ස, මෙහි සඞ්ගාරව නම් බමුණෙක් සැවැත්නුවර වෙසෙයි. ජලයෙන් ශුද්ධිය වේ යයි අදහන්නේ ජලයෙන් පිරිසිදු බව පතයි. උදය සවස දියට බැසීම් ව්‍රතයෙහි යෙදුනේ වෙසෙයි. වහන්ස, භාග්‍යවත්හු අනුකම්පා පිණිස සඞ්ගාරව බමුණාගේ නිවෙස්න වෙත එළඹෙන සේක්වා. ඒ මැනවි"යි. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසා වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ සඞ්ගාරව බමුණාගේ නිවෙස්න වෙත එළඹි සේක. එළඹ පණවන ලද අස්නෙහි වැඩහුන් සේක.

අථ ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සඞ්ගාරවං බ්‍රාහ්මණං භගවා එතදවොච: සච්චං කිර ත්වං බ්‍රාහ්මණ උදකසුද්ධිකො උදකෙන පරිසුද්ධිං පච්චෙසි. සායපාතං උදකොරොහණානුයොගමනුයුත්තො විහරසීති.

එවං භො ගොතමාති[1]

කිමත්ථං ත්වං බ්‍රාහ්මණ අත්ථවසං සම්පස්සමානො උදකසුද්ධිකො උදකෙන පරිසුද්ධිං[2] පච්චෙසි. සායපාතං උදකොරොහණානුයොගමනුයුත්තො විහරසීති?

ඉධ මෙ භො ගොතම යං දිවා පාපකම්මං කතං හොති, තං සාය න්හානෙන[3] පවාහෙමි. යං රත්තිං පාපකම්මං කතං හොති, තං පාත[4] න්හානෙන පවාහෙමි. ඉමං ඛ්වාහං භො ගොතම අත්ථවසං සම්පස්සමානො උදකසුද්ධිකො උදකෙන පරිසුද්ධිං පච්චෙමි. සායපාතං උදකොරොහණානුයොගමනුයුත්තො විහරාමීති.

[භගවා:]

ධම්මො රහදො බ්‍රාහ්මණ සීලතිත්ථො
අනාවිලො සබ්භි සතං පසත්ථො,
යත්ථ හවෙ වෙදගුනො සිනාතා
අනල්ලගත්තා'ව තරන්ති පාරන්ති.

එවං වුත්තෙ සඞ්ගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

7. 2. 12.

ඛොමදුස්සසුත්තං

208. එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති ඛොමදුස්සං නාම සක්‍යානං නිගමො. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ඛොමදුස්සං නිගමං[5] පිණ්ඩාය පාවිසි.

තෙන ඛො පන සමයෙන ඛොමදුස්සකා බ්‍රාහ්මණගහපතිකා සභායං සන්නිපතිතා හොන්ති කෙනචිදෙව කරණීයෙන. දෙවො ච එකමෙකං ඵුසායති.

අථ ඛො භගවා යෙන සා සභා තෙනුපසඞ්කමි. අද්දසංසු ඛො ඛොමදුස්සකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොචුං: කෙ ච මුණ්ඩකා සමණකා කෙ ච සභාධම්මං ජානිස්සන්තීති?

අථ ඛො භගවා ඛොමදුස්සකෙ බ්‍රාහ්මණගහපතිකෙ ගාථාය අජ්ඣභාසි.

1. ගොතම - මජසං. PTS. 2. උදකසුද්ධිං - මජසං. PTS. 3. සායංන්හානෙන - මජසං. සයා. 4. පාතං - මජසං. සයා. PTS. 5. නාම නිගමං - සිමු. 1.

එකල්හි සඞගාරව බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් සඞගාරව බමුණාට භාග්‍යවතුන් වහන්සේ මේය වදාළ සේක. බමුණ, සැබෑව? තෝ ජලයෙන් ශුද්ධිය වේ යයි අදහන්නෙහි ජලයෙන් පිරිසිදු බව පතයි ද? උදය සවස දියට බැසීම් ව්‍රතයෙහි යෙදුනෙහි වෙසෙයි ද?

භවත් ගෞතමයෙනි, එසේ ය.

බමුණ, තෝ කිනම් ආනිසංසයක් දක්මින් ජලයෙන් පිරිසිදු වේ යයි අදහන්නෙහි ජලයෙන් පිරිසිදු බව පතයි ද? උදය සවස දියට බැසීම් ව්‍රතයෙහි යෙදුනෙහි වෙසෙයි ද?

භවත් ගෞතමයෙනි, මෙහි මා විසින් දහවල් යම් පව්කමෙක් කරණ ලද්දේ වේ ද, සවස නෑමෙන් එය පා කොට හරිමි. රෑ යම් පව්කමෙක් කරණ ලද්දේ වේ ද, උදය නෑමෙන් එය පා කොට හරිමි. භවත් ගෞතමයෙනි, මම මේ ආනිසංසය දක්නෙම් ජලයෙන් ශුද්ධිය වේ යයි අදහන්නෙම් ජලයෙන් පිරිසිදු බව පතමි. උදය සවස දියට බැසීම් ව්‍රතයෙහි යෙදුනෙම් වෙසෙමි යි.

[භගවත්හු:]

වේදයෙහි පරතෙරට ගිය ආර්‍යයෝ යම් තැනෙක ස්නානය කළාහු නොතෙත් සිරුරු ඇතිව ම නිවන් නමැති පරතෙරට ඒකාන්තයෙන් යෙද් ද, බමුණ, ධර්මය තෙමේ සිල් නමැති තොට ඇති වෙසෙසින් පහන් වූ උතුම් සත්පුරුෂයන් විසින් පසස්නා ලද (එබඳු) ජලාසයෙකි.

මෙසේ වදාළ කල්හි සඞගාරව බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය මා උපාසකයකු කොට දරණ සේක්වා යි.

7. 2. 12.

ඛොමදුස්ස සූත්‍රය

208: මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි ශාක්‍යයන්ගේ ඛොමදුස්ස නම් නියම්ගම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ ඛොමදුස්ස නියම්ගමට පිඩු පිණිස පිවිසි සේක.

එකල ඛොමදුස්ස නියම්ගම්වැසි බමුණුගැහැවියෝ කිසියම් කටයුත්තක් සඳහා සභායෙහි රැස්වූවාහු වෙති. වැස්ස ද එකිඑකී පොද හෙළයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ සභාව වෙත එළඹි සේක. ඛොමදුස්සක බමුණුගැහැවියෝ වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටහ. දැක නින්දිත මුඩුමහණහු කවරහු ද, කවර කෙනෙක් සභාධර්මය දන්නාහු දැ යි මේය කීහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඛොමදුස්සක බමුණුගැහැවියන්ට ගාථායෙන් වදාළ සේක:

නෙසා සභා යත්ථ න සන්ති සන්තො සන්තො න තෙ යෙ න වදන්ති ධම්මං,
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං ධම්මං වදන්තාව[1] භවන්ති සන්තොති.

එවං වුත්තෙ ඛොමදුස්සකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙති.

උපාසකවග්ගො දුතියො.

තස්සුද්දානං:

කසි උදයො දෙවහිතො අඤ්ඤතර මහාසාලං
මානත්ථද්ධඤ්ච පච්චනීකඤ්ච නවකම්මකට්ඨහාරකං[2]
මාතුපොසකො[3] භික්ඛකො සඞ්ගාරවො ඛොමදුස්සෙන ද්වාදසාති.

බ්‍රාහ්මණසංයුත්තං සමත්තං.

---

8. වඞ්ගීසසංයුත්තං

1. වඞ්ගීසවග්ගො

8. 1. 1.

නික්ඛන්තසුත්තං

209. එවං මෙ සුතං: එකං සමයං ආයස්මා **වඞ්ගීසො ආළවියං** විහරති **අග්ගාළවෙ චෙතියෙ** ආයස්මතා **නිග්‍රොධකප්පෙන** උපජ්ඣායෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන ආයස්මා වඞ්ගීසො නවො හොති අචිරපබ්බජිතො ඔහියකො විහාරපාලො.

අථ ඛො සම්බහුලා ඉත්ථියො සමලඞ්කරිත්වා යෙන අග්ගාළවකො ආරාමො[4] තෙනුපසඞ්කමිංසු, විහාරපෙක්ඛිකායො. අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස තා ඉත්ථියො දිස්වා අනභිරති උප්පජ්ජති, රාගො චිත්තං අනුද්ධංසෙති.

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි. අලාභා වත මෙ, න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං. යස්ස මෙ අනභිරති උප්පන්නා, රාගො චිත්තං අනුද්ධංසෙති. තං කුතෙත්ථ ලබ්භා යං මෙ පරො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍ය. යන්නූනාහං අත්තනාව අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍යන්ති.

---

1. වදන්තා ච - මජ්ඣං. ස්‍යා. සීමු 1 2. නවකම්මිකට්ඨහාරං - මජ්ඣං. 3 මාතුපොසකං - මජ්ඣං. 4. යෙනාරාමො - සීමු. 1.2. ස්‍යා, PTS

යම් තැනෙක සත්පුරුෂයෝ නැද්ද, තෙල සභායෙක් නොවේ. යම් කෙනෙක් ධර්මය නො කියද් ද, ඔහු සත්පුරුෂ නොවෙති. රාගය ද, ද්වේෂය ද, මෝහය ද දුරු කොට ධර්මය දේශනා කරන්නෝ ම සත්පුරුෂ වෙති.

මෙසේ වදාළ කල්හි බොමදුස්සක බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිහුරු වූවක් උඩුහුරු කරන්නේ හෝ වේ ද, වැසුනු දෙයක් විවර කරන්නේ හෝ වේ ද, මංමුළා වූවකුට මග කියා දෙන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූප දක්නාහයි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් නියරින් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේ ය. මේ අපි භවත් ගොයුම්හු ද, දහම් ද, භික්සඟන ද සරණ යමු. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය අප උපාසකයන් කොට දරණ සේක්වා යි.

උපාසක වර්ගය දෙවෙනි යි.

එහි උද්දානය:

කසී, උදය, දේවහිත, අඤ්ඤතරමහාසාළ, මානත්ථද්ධ, පච්චනීක, නවකම්ම, කට්ඨහාරක, මාතුපොසක, භික්ඛක, සඞ්ගාරව, ඛොමදුස්ස සූත්‍රය යි සූත්‍ර දොළොසෙකි.

බ්‍රාහ්මණ සංයුත්තය නිමියේ ය.

---

8. වඞ්ගීසසංයුත්තය

1. වඞ්ගීසවර්ගය

8. 1. 1.

නික්ඛන්තසූත්‍රය

209. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක ආයුෂ්මත් **වඞ්ගීස** තෙමේ **අළවිනුවර අග්ගාලවචෛත්‍යය** විහාරයෙහි උපාධ්‍යාය වූ ආයුෂ්මත් **නිග්‍රොධකප්ප** තෙරුන් සමග වැඩ වෙසෙයි. එකල්හි ආයුෂ්මත් වඞ්ගීස තෙමේ අලුත පැවිදි වූ වෙහෙර නවතින වෙහෙර රක්නා නවකයෙක් වෙයි.

ඉක්බිති බොහෝ ස්ත්‍රීහු සැරසී වෙහෙර දක්නා කැමැත්තාහු අග්ගාලවකාරාමය කරා පැමිණියහ. එකල්හි ආයුෂ්මත් වඞ්ගීසහට ඒ ස්ත්‍රීන් දැක අනභිරතිය උපදියි. රාගය (කුසල්) සිත වනසයි.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසහට "යම්බඳු මට අනභිරතිය උපන්නී ද, රාගය සිත වනසා ද, ඒකාන්තයෙන් (එය) මට අලාභයෙක. ඒකාන්තයෙන් එය මට ලාභයෙක් නො වේ. මට ඒකාන්තයෙන් දුර්භාග්‍යයෙකි. ඒකාන්තයෙන් මට යහපත් භාග්‍යයෙක් නොවේ. යම් හෙයෙකින් මෙරමා මාගේ අනභිරතිය දුරු කොට අභිරතිය උපදවන්නේ නම් එය මෙහි කොයින් ලැබිය හැකි ද, මම තෙමේ ම තමාගේ අනභිරතිය දුරු කොට අභිරතිය උපදවන්නෙම් නම් මැනැවැ"යි මේ සිත විය.

අථ ඛො ආයස්මා වඞ්ගීසො අත්තනාව අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

නික්ඛන්තං වත මං සන්තං අගාරස්මානගාරියං,
විතක්කා උපධාවන්ති පගබ්භා කණ්හතො ඉමෙ.

උග්ගපුත්තා මහිස්සාසා සික්ඛිතා දළ්හධම්මිනො,
සමන්තා පරිකිරෙය්‍යුං සහස්සං අපලායිනං.

සචෙපි එත්තතො[1] භීය්‍යො ආගමිස්සන්ති ඉත්ථියො,
නෙව මං බ්‍යාධයිස්සන්ති ධම්මෙ සම්හි පතිට්ඨිතං.[2]

සක්ඛීහි මෙ සුතං එතං බුද්ධස්සාදිච්චබන්ධුනො,
නිබ්බාණගමනං මග්ගං තත්ථ මෙ නිරතො මනො.

එවඤ්චෙ මං විහරන්තං පාපිම[3] උපගච්ඡසි,
තථා මච්චු කරිස්සාමි න මෙ මග්ගම්පි දක්ඛසීති.

8. 1. 2.

අරති සුත්තං

210. එකං සමයං[4] ආයස්මා **වඞ්ගීසො ආළවියං** විහරති **අග්ගාළවෙ චෙතියෙ** ආයස්මතා **නිග්‍රොධකප්පෙන** උපජ්ඣායෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන ආයස්මා නිග්‍රොධකප්පො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො විහාරං පවිසති සායං වා නික්ඛමති අපරජ්ජු වා කාලෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො වඞ්ගීසස්ස අනභිරති උප්පන්නා හොති, රාගො චිත්තං අනුද්ධංසෙති.

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි. අලාභා වත මෙ, න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං. යස්ස මෙ අනභිරති උප්පන්නා, රාගො චිත්තං අනුද්ධංසෙති. තං කුතෙත්ථ ලබ්භා යං මෙ පරො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍ය. යන්නූනාහං අත්තනාව අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍යන්ති. අථ ඛො ආයස්මා වඞ්ගීසො අත්තනාව අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

අරතිඤ්ච රතිඤ්ච පහාය සබ්බසො ගෙහසිතඤ්ච විතක්කං,
වනථං න කරෙය්‍ය කුහිඤ්චි නිබ්බනථො අරතො[5] ස හි භික්ඛු.

යමිධ පුථුවිඤ්ච වෙහාසං රූපගතඤ්ච ජගතොගධං,
කිඤ්චි පරිජීයති[6] සබ්බමනිච්චං එවං සමෙච්ච චරන්ති මුතත්තා.

1. එත්තකො - සීමු. 1 එත්තකා - ස්‍යා. එතතො - PTS. 2. පතිට්ඨිතො - සීමු. 1. PTS. සී 1, 2 3 පාපිම - මජසං. PTS. 4. එකං සමයං -පෙ- මජසං. PTS. 5. අතතො - ස්‍යා. PTS 6 පරිජීයති - ස්‍යා, සීමු. 1.2.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙමේ තෙමේ ම තමාගේ අනභිරතිය දුරු කොට අභිරතිය උපදවා ඒ වේලාවෙහි මේ ගාථා කීය.

ගිහිගෙයින් නික්මුනාවූ ම සස්නට පැමිණියා වූ මා කරා බුහුටි වූ මේ විතර්කයෝ මාරයා කෙරෙන් ඒකාන්තයෙන් දිව එත්.

උග්‍රපුත්‍ර(රාජන්‍ය) වූ මහත්දුනු ඇති (ධනුශිල්පයෙහි) මොනවට හික්මුනු දැඩි ඇදුරු දුනු දරන්නාවූ පලා නොයන ඔවුන් දහස්හුදු හාත්පස ඊතල විසුරුවන්නාහු ද. (දක්‍ෂ පුරුෂයාට ඒ සියල්ල වැලකිය හැකිය.)

ඉදිනුදු මේ පමණ (දහස) වත් වඩා ස්ත්‍රීහු එන්නාහු ද, ස්වකීය (ශාසන) ධර්මයෙහි පිහිටි මා නො පෙළන්නාහු ය.*

සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජාණන් වහන්සේ සම්මුඛයෙන් ම මේ නිවන් යන මග මා විසින් අසන ලද්දේ ය. එහි මාගේ සිත ඇලුනේ ය.

පවිට, ඉදින් මෙසේ වසන්නා වූ මා කරා පැමිණෙහි ද, මරුව, (තෝ යම්සේ) මා ගිය මගක් නො දක්නෙහි ද, එසේ කරන්නෙමි.

8. 1. 2.

අරති සූත්‍රය

210. එක්කලෙක ආයුෂ්මත් වඞ්ගීස තෙමේ අළුවිනුවර අග්ගාලව-චෛත්‍ය විහාරයෙහි උපාධ්‍යාය වූ ආයුෂ්මත් නිග්‍රොධකප්ප තෙරුන් සමග වෙසෙයි. එකල්හි ආයුෂ්මත් නිග්‍රොධකප්ප තෙරණුවෝ පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනාහු වෙහෙරට පිවිසෙති. සවස හෝ පසුදින පිඩු සිඟන වේලෙහි හෝ නික්මෙති. එකල්හි ආයුෂ්මත් වඞ්ගීසහට අනභිරතියෙක් උපන්නේ වෙයි. රාගය සිත වනසයි.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසහට "යම්බඳු මට අනභිරතියෙක් උපන්නේ ද, රාගය සිත වනසා ද, ඒ මට ඒකාන්තයෙන් අලාභයෙකි. ඒකාන්තයෙන් මට ලාභයෙක් නො වේ. ඒකාන්තයෙන් මට නපුරු ලැබීමෙකි. ඒකාන්ත-යෙන් මට මනා ලැබීමෙක් නොවේ. යම් හෙයෙකින් මෙරමා අනභිරතිය දුරු කොට අභිරතිය උපද වන්නේ නම් එය මෙහිලා කොයින් ලැබිය හැකි ද, මම තමාගේ අනභිරතිය තෙමේ ම දුරු කොට අභිරතිය උපදවන්නෙම් නම් මැනැවැ"යි මේ අදහස විය. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙමේ තෙමේ ම තමා ගේ අනභිරතිය දුරු කොට අභිරතිය උපදවා ඒ වෙලාවෙහි මේ ගාථා කී ය.

යමෙක් (සස්නෙහි) නො ඇල්ම ද (පස්කම් ගුණයෙහි) ඇල්ම ද ගෙහනිඃශ්‍රිත වූ පාපවිතර්ක ද සර්වප්‍රකාරයෙන් දුරු කොට කිසි අරමුණෙක්හි කෙලෙස් නමැති මහවනය නො කරන්නේ ද, කෙලෙස්වන නැති තෘෂ්ණාරති නැති හෙ තෙමේ භික්ෂු නම් වේ.

මේ ලෝකයෙහි පොළොව ඇසුරු කළා වූ ද, අහස ඇසුරු කළා වූ ද, ලෝකයෙහි ඇතුළත් වූ යම්කිසි රූපයෙක් වේ ද, ඒ සියල්ල සහමුලින් දිරයි. අනිත්‍ය යි. මෙසේ දැන දන්නා ලද අත්බැව් ඇත්තෝ වෙසෙත්.

---

*දුනුවායෝ වරකට එක්සැරයක් ම විදිති. ස්ත්‍රීහු වූ කලී වරකට රූපාරම්මණාදි සැර-පසක්ම විදිති. එහෙත් ඔවුන් දහසකටත් මා පෙළීය නො හැකිය යි යුහස් යි.

උපධීසු ජනා ගධිතාසෙ දිට්ඨසුතෙ පටිඝෙ ච මුතෙ ච,
එත්ථ විනොදය ඡන්දමනෙජො යො එත්ථ න ලිම්පති තං මුනිමාහු.

අථ සට්ඨිනිස්සිතා[1] සවිතක්කා* පුථුජ්ජනතාය[2] අධම්මා නිවිට්ඨා,
න ච වග්ගගතස්ස[3] කුහිඤ්චි නො පන දුට්ඨුල්ලභාණී ස භික්ඛු.

දබ්බො චිරරත්තසමාහිතො අකුහකො නිපකො අපිහාලු,
සන්තං පදං අජ්ඣගමා මුනි පටිච්ච පරිනිබ්බුතො කඞ්ඛති කාලන්ති.

8. 1. 3.

පෙසලඅතිමඤ්ඤනාසුත්තං

211. එකං සමයං ආයස්මා **වඞ්ගීසො ආළවියං** විහරති **අග්ගාළවෙ චෙතියෙ** ආයස්මතා **නිග්‍රොධකප්පෙන** උපජ්ඣායෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන ආයස්මා වඞ්ගීසො අත්තනො පටිභාණෙන අඤ්ඤෙ පෙසලෙ භික්ඛූ අතිමඤ්ඤති.

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි. අලාභා වත මෙ න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ න වත මෙ සුලද්ධං. යොහං අත්තනො පටිභාණෙන අඤ්ඤෙ පෙසලෙ භික්ඛූ අතිමඤ්ඤාමීති. අථ ඛො ආයස්මා වඞ්ගීසො අත්තනාව අත්තනො විප්පටිසාරං උප්පාදෙත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

මානං[4] පජහස්සු ගොතම, මානපථඤ්ච ජහස්සු,
අසෙසං මානපථස්මිං සමුච්ඡිතො[5] විප්පටිසාරහුවා[6] චිරරත්තං.

මක්ඛෙන මක්ඛිතා පජා මානහතා[7] නිරයං පපතන්ති,
සොචන්ති ජනා චිරරත්තං මානහතා[7] නිරයං උප්පන්නා.

න හි සොචති භික්ඛු කදාචි මග්ගජිනො සම්මාපටිපන්නො,
කිත්තිඤ්ච සුඛඤ්ච අනුභොති ධම්මදසොති තමාහු තථත්තං[8].

තස්මා අඛිලොධ පධානවා නීවරණානි පහාය විසුද්ධො,
මානඤ්ච පහාය අසෙසං විජ්ජායන්තකරො සමිතාවීති.

1. සට්ඨිකසිතං - PTS. සට්ඨිසිතා - ස්‍යා. සී 1. 2. 2. පුථුජ්ජනතාය - ස්‍යා.
3. වට්ටගතස්ස - ස්‍යා. 4. මානසං - සීමු. 1. සං, සී, 2. 5. මානපථම්හි මුච්ඡිතො - ස්‍යා.
6. විප්පටිසාරීහුවා - මජසං, ස්‍යා 7. මානගතා - PTS. 8 පහිතත්තං - මජසං.
* පවිතක්කා - සී 1, 2.

ජනයෝ උපධීන්හි ද ඇසින් දුටු රූපයෙහි හා කණින් ඇසූ ශබ්දයෙහි ද ප්‍රතිඝසඞ්ඛ්‍යාත ගන්ධ රස දෙක්හි ද ස්පෘෂ්ටබ්බාරම්මණයෙහි ද ගිජු වූවාහු වෙත්. යමෙක් මේ පඤ්චකාමයෙහි ආශාව දුරු කොට ආශා නැත්තේ මෙහි නො ඇලේ ද, ඔහු මුනි යයි කියත්.

වැලි සාරමුණු ඇසුරු කළ බොහෝ වූ අටමිච්ඡාවිතර්කයෝ ප්‍රජාව කෙරෙහි බැදගත්තාහු වෙත්. කිසිතැනෙක කෙලෙස්වශයට පැමිණියෙක් නො වන්නේ ද, දුෂ්ට තෙපුල් බණන්නෙක් නොවන්නේ ද, හෙ තෙමේ භික්ෂු නම් වේ.

පණ්ඩිත වූ දිගුකලක් මුළුල්ලෙහි සමාහිත සිත් ඇති කුහක නො වූ පරිණතප්‍රඥාවත් වූ තෘෂ්ණා රහිත වූ භික්ෂු තෙමේ නිවණට පැමිණියේ ය. නිවන් නිසා කෙලෙස් පිරිනිවනින් පිරිනිවියේ ස්කන්ධපරිනිර්වාණ කාලය අපේක්ෂා කෙරෙයි.

8. 1. 3.

පෙසලඅතිමඤ්ඤනා සූත්‍රය

211. එක්කලෙක ආයුෂ්මත් වඞ්ගීස තෙමේ අලව්නුවර අග්ගාලව-චෛත්‍ය විහාරයෙහි උපාධ්‍යාය වූ ආයුෂ්මත් නිග්‍රෝධකප්පතෙරුන් සමග වැඩ වෙසෙයි. එකල්හි ආයුෂ්මත් වඞ්ගීස තෙමේ තමාගේ ප්‍රතිභානයෙන් අනෙක් ප්‍රියශීල භික්ෂූන් හෙළා දකියි.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස හට "යම්බඳු මම තමාගේ ප්‍රතිභානයෙන් අනෙක් ප්‍රියශීල භික්ෂූන් අවමන් කෙරෙම් ද, ඒ මට ඒකාන්තයෙන් අලාභයෙකි. ඒ මට ඒකාන්තයෙන් ලාභයෙක් නො වෙයි. ඒකාන්තයෙන් මා විසින් නපුරක් ලබන ලද්දේ ය. මා විසින් ඒකාන්තයෙන් යහපතෙක් නො ලබන ලද්දේ ය"යි මේ අදහස වි ය. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙමේ තෙමේ ම තමාට විපිළිසර උපදවා ඒ වේලාවෙහි මේ ගාථා කී ය.

ගෞතමය, මානය දුරු කොට, මානාරම්මණය ද බැහැර කරව. මානාරම්මණයෙහි නිරවශේෂයෙන් මුසපත් වූයේ බොහෝ කලක් විපිළිසර ඇත්තෙක් විය.

ගුණමකුබැවින් වැකුනා වූ සත්ත්වයෝ මානයෙන් නැසුනාහු නිරයට වැටෙත්. මානයෙන් විනෂ්ට ව නිරයට පැමිණි ඒ සත්ත්වයෝ බොහෝ කලක් ශෝක කෙරෙත්.

(මාර්ගයෙන් දිනූ කෙලෙස් ඇති බැවින්) මාර්ගජිත නම් වූ මෝනවට පිළිපන් මහණ තෙමේ කිසි කලෙකත් ශෝක නො ම කෙරෙයි. කීර්තිය ද සුවය ද අනුභව කෙරෙයි. සම්‍යක්දෘෂ්ටි ඇති උත්තමයන්සේ ධම්මදසයයි කියත්.

එහෙයින් මේ ශාසනයෙහි චේතෝඛිල නැති ප්‍රධන්වීර්‍යය ඇති (භික්ෂු තෙමේ) නීවරණයන් දුරු කොට පිරිසිදු වූයේ වෙයි. සියලු මානය පහ කොට (අග්‍රමාර්ගී) විද්‍යාවෙන් (කෙලෙස්) කෙළවර කරන්නෙක් වෙයි. සන්හුන්නෙක් ද වෙයි.

8. 1. 4.

ආනන්දසුත්තං

212. එකං සමයං ආයස්මා **ආනන්දො** **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.** අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි ආයස්මතා **වඞ්ගීසෙන** පච්ඡාසමණෙන.

තෙන ඛො පන සමයෙන ආයස්මතො වඞ්ගීසස්ස අනභිරති උප්පන්නා හොති, රාගො චිත්තං අනුද්ධංසෙති. අථ ඛො ආයස්මා වඞ්ගීසො ආයස්මන්තං ආනන්දං ගාථාය අජ්ඣභාසි:

කාමරාගෙන ඩය්හාමි චිත්තං මෙ පරිඩය්හති,
සාධු නිබ්බාපනං බ්‍රෑහි අනුකම්පාය ගොතමාති.

[ආනන්දො:]

සඤ්ඤාය විපරියෙසා චිත්තං තෙ පරිඩය්හති,
නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූපසංහිතං.[1]

සඞ්ඛාරෙ පරතො පස්ස දුක්ඛතො මා ච අත්තතො,
නිබ්බාපෙහි මහාරාගං මා ඩය්හිත්ථො පුනප්පුනං.

අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං,
සති කායගතා ත්‍යත්ථු නිබ්බිදාබහුලො භව.

අනිමිත්තඤ්ච භාවෙහි මානානුසයමුජ්ජහ,
තතො මානාභිසමයා උපසන්තො චරිස්සසීති.

8. 1. 5.

සුභාසිතසුත්තං

213. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.** තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති නො දුබ්භාසිතා අනවජ්ජා ච, අනනුවජ්ජා ච විඤ්ඤූනං. කතමෙහි චතූහි? ඉධ භික්ඛවෙ භික්ඛු සුභාසිතං යෙව භාසති නො දුබ්භාසිතං. ධම්මං යෙව භාසති නො අධම්මං. පියං යෙව භාසති නො අප්පියං. සච්චං යෙව භාසති නො අලිකං. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති නො දුබ්භාසිතා අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනන්ති.

ඉදමවොච භගවා ඉදං වත්වා[2] සුගතො අථාපරං එතදවොච සත්ථා:

1. සඤ්හිතං - ස්‍යා, සීමු. 1. 2. වත්වාන - සබ්බත්ථ.

8. 1. 4.

ආනන්ද සූත්‍රය

212. එක්කලෙක ආයුෂ්මත් ආනන්දතෙරණුවෝ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩුසිටුහුගේ අරමෙහි වැඩ වෙසෙති. ඉක්බිති ආයුෂ්මත් ආනන්දතෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ ආයුෂ්මත් වඞ්ගීස නම් පසු මහණහු සමග සැවැත්නුවරට පිඩු පිණිස පිවිසියහ.

එකල්හි ආයුෂ්මත් වඞ්ගීසහට අනභිරතියෙක් උපන්නේ වේ: රාගය සිත වනසයි. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙමේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට ගාථායෙන් කී ය:

කාමරාගයෙන් දැවෙමි. මාගේ සිත හාත්පසින් දැවේ. ගෞතමයන් වහන්ස, අනුකම්පා පිණිස (ඒ රාගගින්න) නිවීමේ උපායක් වදාළ මැනව.

[ආනන්දතෙරහු:]

සංඥා විපර්‍යාස හේතුවෙන් තොපගේ සිත දැවෙයි. රාගොත්පත්තියට හේතු වූ සුභාරම්මණය දුරු කරව.

සංස්කාරයන් අනිත්‍යවශයෙන් ද දුක්වශයෙන් ද දකුව, ආත්මවශයෙන් නො දකුව. මහාරාගය නිවව. (එවිට) නැවත නැවත නහමක් දැවෙහි.

අසුභභාවනාවෙහි එකඟ කොට සමාධි ගත කොට සිත වඩව, තට කායගතා සිහිය ඇති වේවා, නිර්වේදය බහුල කොට ඇත්තෙක් වෙව.

විදර්ශනාව ද වඩව, මානානුසයය උපුටා හරුව. ඒ මානය දුරු කිරීම් හේතුවෙන් උපශාන්තයෙක් ව හැසිරෙන්නෙහි ය.

8. 1. 5.

සුභාසිත සූත්‍රය

213. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි සි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්සැයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මහණෙනි, සිවුඅඟෙකින් සමන්විත වදන සුභාෂිත වෙයි. දුර්භාෂිත නො වෙයි. නිරවද්‍ය ද වෙයි. නුවණැත්තන් විසින් උපවාද නො කරණ ලද්දේ ද වෙයි. කවර සිවුඅඟෙකින? යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ සුබැසි තෙපුල් ම බෙණේ ද, දුබැසි තෙපුල් නො බෙණේ ද, දැහැමි තෙපුල් ම බෙණේ ද, නො දැහැමි තෙපුල් නො බෙණේ ද, ප්‍රිය තෙපුල් ම බෙණේ ද, අප්‍රිය තෙපුල් නො බෙණේ ද, සැබෑ තෙපුල් ම බෙණේ ද, නො සැබෑ තෙපුල් නො බෙණේ ද, මහණෙනි, මේ සිවු අඟින් යුත් වදන සුභාෂිත වෙයි. දුර්භාෂිත නොවෙයි. නිරවද්‍ය ද වෙයි. නුවණැත්තන් විසින් උපවාද නො කරණ ලද්දේ ද වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදාරා නැවත අන්ලෙසකින් ද මෙය වදාළ සේක:

සුභාසිතං උත්තමමාහු සන්තො ධම්මං භණෙ නාධම්මං තං දුතියං,
පියං භණෙ නාප්පියං තං තතියං සච්චං භණෙ නාලිකං තං චතුත්ථන්ති.

අථ ඛො ආයස්මා **වඞ්ගීසො** උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා පටිභාති මං සුගතාති.

පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච.

අථ ඛො ආයස්මා වඞ්ගීසො භගවන්තං සම්මුඛා සරූපාහි[1] ගාථාහි අභිත්ථවි.

තමෙව වාචං භාසෙය්‍ය යායත්තානං න තාපයෙ,
පරෙ ච න විහිංසෙය්‍ය සා වෙ වාචා සුභාසිතා.

පියවාචමෙව[2] භාසෙය්‍ය යා වාචා පටිනන්දිතා,
යං අනාදාය පාපානි පරෙසං භාසතෙ පියං.

සච්චං වෙ අමතා වාචා එස ධම්මො සනන්තනො,
සච්චෙ අත්ථෙ ච ධම්මෙ ච ආහු සන්තො පතිට්ඨිතා.

යං බුද්ධො භාසතෙ වාචං ඛෙමං නිබ්බාණපත්තියා,
දුක්ඛස්සන්තකිරියාය සා වෙ වාචානමුත්තමාති.

8. 1. 6.

සාරිපුත්තසුත්තං

214. එකං සමයං ආයස්මා **සාරිපුත්තො** **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.** තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය[3] අත්ථස්ස විඤ්ඤාපනියා. තෙ ච භික්ඛූ අට්ඨිකත්වා[4] මනසිකත්වා සබ්බචෙතසො[5] සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි. අයං ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය[3] අත්ථස්ස විඤ්ඤාපනියා. තෙ ච භික්ඛූ අට්ඨිකත්වා[4] මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති. යන්නූනාහං ආයස්මන්තං සාරිපුත්තං සම්මුඛා සරූපාහි ගාථාහි අභිත්ථවෙය්‍යන්ති.

---

1. සාරුප්පාහි - මජසං. 2. පියවාචං ච - මජසං, PTS. 3. අනෙලගලාය - මජසං, අනෙලගලස්ස - ස්‍යා, PTS. 4. අට්ඨිංකත්වා - මජසං, 5. සබ්බචෙතසං - මජසං.

බුද්ධාදි සත්පුරුෂයෝ උතුම් වූ සුබැසි තෙපුල් ම කියත්. දැහැමි තෙපුල් ම බණන්නේ ය. නො දැහැමි තෙපුල් නො බණන්නේ ය. ඒ දෙවැන්න ය. ප්‍රිය තෙපුල් ම බණන්නේ ය. අප්‍රිය තෙපුල් නො බණන්නේ ය. එය තෙවැන්න ය. සැබෑ තෙපුල් ම බණන්නේ ය. නො සැබෑ තෙපුල් නො බණන්නේ ය. එය සිවුවැන්න ය.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙමේ හුනස්නෙන් නැගිට උතුරුසඟ සිවුර එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්ස, මට වැටහේ. සුගතයන් වහන්ස, මට වැටහෙයි. මෙය භාග්‍යවතුන් වහන්සේට සැල කෙළේ ය.

වඞ්ගීස, තට වැටහේවා යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එකල්හි ආයුෂ්මත් වඞ්ගීස තෙමේ සුදුසු ගාථායෙන් ඉදිරියෙහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රශංසා කෙළේ ය:

යම් වදනක් කරණ කොට ගෙණ තමාත් නො තවන්නේ ද, මෙරමාත් නො වෙහෙසන්නේ ද, ඒ වදන ඒකාන්තයෙන් සුභාෂිත නම් වේ. ඒ වදන ම බෙණෙන්නේ ය.

යම් වදනෙක් ප්‍රිය කරණ ලද ද, යම් වදනක් බණන්නේ අනුන්ට අප්‍රිය පරෙස් බස් නො ගෙණ ප්‍රියවදන් ම බෙණේ ද, (එබඳු) ප්‍රියවදන් ම බෙණෙන්නේ ය.

සැබෑ වදන ඒකාන්තයෙන් අමා වදන ය. මේ දහම පැරණි ය. සජ්ජනයෝ සත්‍යයෙහි ද අර්ථයෙහි ද ධර්මයෙහි ද පිහිටියෝ යයි කියත්.

බුදුරජාතන් වහන්සේ නිවණට පැමිණීම පිණිස ද දුක් කෙළවර කිරීම පිණිස ද නිර්භය වූ යම් වදනක් වදුරණ සේක් ද, ඒ වදන වදන් අතුරෙන් ඒකාන්තයෙන් උතුම්.

8. 1. 6.

සාරිපුත්ත සූත්‍රය

214. එක්කලෙක ආයුෂ්මත් **ශාරිපුත්‍ර** තෙරණුවෝ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ පරිපූර්ණ වූ පළිබෝධ රහිත වූ නිදෙස් වූ නොගිලිහුනු පදව්‍යඤ්ජන ඇති අර්ථය හැඟවීමට සමර්ථ වූ දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වත්, (ඔවුන්) සමාදන් කරවත්, තෙද ගන්වත්, සතුටු කෙරෙත්. ඒ භික්ෂූහු ද අර්ථවත් කොට මෙනෙහි කොට මුළුසිතින් ඇතුළත් කොට යොමු කළ කන් ඇත්තෝ දහම් අසත්.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසහට "මේ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ පරිපූර්ණ වූ වචන ඇති පළිබෝධ රහිත වූ නිදෙස් වූ නොගිලිහුනු පදව්‍යඤ්ජන ඇති අරුත් හැඟවීමට සමත් වූ දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වත්, සමාදන් කරවත්, තෙද ගන්වත්, සතුටු කරවත්, ඒ භික්ෂූහු ද අර්ථවත් කොට මෙනෙහි කොට මුළුසිතින් සමන්‍වා කොට ගෙණ යොමු කළ කන් ඇති ව දහම් අසත්. මම ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්ට සුදුසු ගාථායෙන් ඉදිරියෙහි ප්‍රශංසා කරන්නෙම් නම් ඉතා මැනවැ"යි මේ අදහස වි ය.

අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනඤ්ජලිම්පණාමෙත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච. පටිභාති මං ආවුසො සාරිපුත්ත, පටිභාති මං ආවුසො සාරිපුත්තාති. පටිභාතු තං ආවුසො වඞ්ගීසාති. අථ ඛො ආයස්මා වඞ්ගීසො ආයස්මන්තං සාරිපුත්තං සම්මුඛා සරූපාහි ගාථාහි අභිත්ථවි:

ගම්භීරපඤ්ඤො මෙධාවී මග්ගාමග්ගස්ස කොවිදො,
සාරිපුත්තො මහාපඤ්ඤො ධම්මං දෙසෙති භික්ඛුනං.

සඞ්ඛිත්තෙන'පි දෙසෙති විත්ථාරෙන'පි භාසති,
සාලිකායිව නිග්ඝොසො පටිභානං උදීරයි[1].

තස්ස තං දෙසයන්තස්ස සුණන්ති මධුරං ගිරං,
සරෙන රජනීයෙන සවණීයෙන වග්ගුනා,
උදග්ගචිත්තා මුදිතා සොතං ඔධෙන්ති භික්ඛවොති:

8. 1. 7.

පවාරණාසුත්තං

215. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **පුබ්බාරාමෙ මිගාරමාතු-පාසාදෙ** මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පණ්ණරසෙ පවාරණාය භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති.

අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං[2] භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි. හන්දදානි භික්ඛවෙ, පවාරයාමි[3] වො. න ච මෙ කිඤ්චි ගරහථ කායිකං වා වාචසිකං වා 'ති.

එවං වුත්තෙ ආයස්මා **සාරිපුත්තො** උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: න ඛො මයං භන්තෙ, භගවතො කිඤ්චි ගරහාම කායිකං වා වාචසිකං වා. භගවා හි භන්තෙ, අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච භන්තෙ, එතරහි සාවකා විහරන්ති පච්ඡා-සමන්නාගතා. අහං ච ඛො භන්තෙ, භගවන්තං පවාරෙමි. න ච මෙ භගවා කිඤ්චි ගරහති කායිකං වා වාචසිකං වා 'ති.

---

1. පටිභාණමුදීරයි - සයා 2. තුණ්හීභූතං - මජසං. සයා PTS. 3. පවාරෙමි - මජසං.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙමේ හුනස්නෙන් නැගිට උත්තරාසඞ්ගය එකස් කොට ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන් වෙත ඇඳිලි බැඳ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ට මෙය කී ය. ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, මට වැටහෙයි. ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, මට වැටහෙයි. "ඇවැත්නි, වඞ්ගීසයෙනි, තොපට වැටහේවා!"යි. එකල්හි ආයුෂ්මත් වඞ්ගීස තෙමේ සුදුසු ගාථායෙන් ඉදිරියෙහි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්ට ප්‍රශංසා කෙළේ ය.

ගැඹුරු පැණැති නුවණැත්තා වූ මග නොමග දැනීමෙහි දක්ෂ මහත් ප්‍රඥ ඇති ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට දහම් දෙසත්.

සැකෙවින් ද දේශනා කෙරෙත්, විතරවිසින් ද දේශනා කෙරෙත්. (උන්වහන්සේගේ) මධුර ස්වරය සැළලිහිණියකගේ මෙනි. වැටහීම (මුහුදුරල මෙන්) පැන නඟී.

ඇලුම් කටයුතු වූ ඇසියයුතු වූ සිත්කලු ස්වරයෙන් දහම් දෙසන උන්වහන්සේගේ ඒ මිහිරි තෙපුල් භික්ෂූහු අසත්. ඔදවැඩි සිත් ඇත්තාහු ප්‍රමුදිත සිත් ඇත්තාහු කන් යොමු කෙරෙත්.

8. 1. 7.

පවාරණ සූත්‍රය

215. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පූර්වාරාම නම් මිගාරමාතුපහයෙහි හැම රහත් වූ පන්සියක් පමණ වූ මහත් භික්සඟන සමග වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ පුණුරුසි පොහොය වූ එදින (වස් විශුද්ධි) පවුරුණු පිණිස භික්සඟන විසින් පිරිවරණ ලද්දාහු අබවස වැඩහුන් සේක් වෙති.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ භාත්පසින් නිහඬ වූ භික්සඟන බලා භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, මම දැන් තොප පවරමි. මාගේ කායික වූ හෝ වාචසික වූ හෝ කිසිවකට තෙපි නො ගරහවු ද?

මෙසේ වදාළ කල්හි දම්සෙනෙවි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ හුනස්නෙන් නැගිට උත්තරාසඞ්ගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. වහන්ස, අපි (පිරිසිදුම් වූ ආචාර ආජීව ඇති) භාග්‍යවතුන් වහන්සේගේ කායික වූ හෝ වාචසික වූ හෝ කිසිවකට නො ම ගරහමු. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වනාහි (කසුප් සම්බුදුහුගෙන් පසු) නූපන් මග උපදවන සේක. නො හටගත් මග දනවන සේක. නො දෙසූ මග දෙසන සේක. මාර්ගය දන්නා සේක. මාර්ගය දත් සේක. මාර්ගයෙහි දක්ෂ සේක. වහන්ස, මාර්ගය අනුව ගිය ශ්‍රාවකයෝ (බුදුරජාණන් වහන්සේට) පසුව (මාර්ගඥනයෙන්) සමන්විත වූවෝ දැන් වෙසෙත්. වහන්ස, මම ද භාග්‍යවතුන් වහන්සේ පවරමි. භාග්‍යවතුන් වහන්සේ මාගේ කායික වූ හෝ වාචසික වූ හෝ කිසි වරදකට ගරහන සේක් ද?

න ඛ්වාහං තෙ සාරිපුත්ත කිඤ්චි ගරහාමි කායිකං වා වාචසිකං වා. පණ්ඩිතො ත්වං සාරිපුත්ත, මහාපඤ්ඤො ත්වං සාරිපුත්ත, පුථුපඤ්ඤො ත්වං සාරිපුත්ත, හාසපඤ්ඤො[1] ත්වං සාරිපුත්ත, ජවනපඤ්ඤො ත්වං සාරිපුත්ත, තික්ඛපඤ්ඤො ත්වං සාරිපුත්ත, නිබ්බෙධිකපඤ්ඤො ත්වං සාරිපුත්ත. සෙය්‍යථාපි සාරිපුත්ත, රඤ්ඤො චක්කවත්තිස්ස ජෙට්ඨපුත්තො පිතරා පවත්තිතං චක්කං සම්මදෙව අනුප්පවත්තෙති. එවමෙව ඛො ත්වං සාරිපුත්ත මයා අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙසීති.

නො චෙ කිර මෙ භන්තෙ භගවා කිඤ්චි ගරහති කායිකං වා වාචසිකං වා. ඉමෙසම්පි භන්තෙ භගවා පඤ්චන්නං භික්ඛුසතානං න කිඤ්චි ගරහති කායිකං වා වාචසිකං වා ති.

ඉමෙසම්පි ඛ්වාහං සාරිපුත්ත පඤ්චන්නං භික්ඛුසතානං න කිඤ්චි ගරහාමි කායිකං වා වාචසිකං වා. ඉමෙසං[2] හි සාරිපුත්ත පඤ්චන්නං භික්ඛුසතානං සට්ඨි භික්ඛූ තෙවිජ්ජා, සට්ඨි භික්ඛූ ඡළභිඤ්ඤා, සට්ඨි භික්ඛූ උභතොභාග-විමුත්තා. අථ ඉතරෙ පඤ්ඤාවිමුත්තාති.

අථ ඛො ආයස්මා **වඞ්ගීසො** උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා පටිභාති මං සුගතාති. පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච. අථ ඛො ආයස්මා වඞ්ගීසො භගවන්තං සම්මුඛා සරූපාහි ගාථාහි අභිත්ථවි:

අජ්ජ පණ්ණරසෙ විසුද්ධියා භික්ඛූ පඤ්චසතා සමාගතා,
සඤ්ඤොජනබන්ධනච්ඡිදා අනීඝා ඛීණපුනබ්භවා ඉසී.

චක්කවත්තී යථා රාජා අමච්චපරිවාරිතො,
සමන්තා අනුපරියෙති සාගරන්තං මහිං ඉමං.

එවං විජිතසඞ්ගාමං සත්ථවාහං අනුත්තරං,
සාවකා පයිරුපාසන්ති තෙවිජ්ජා මච්චුහාසිනො.

සබ්බෙ භගවතො පුත්තා පලාපෙත්ථ න විජ්ජති,
තණ්හාසල්ලස්ස හන්තාරං වන්දෙ ආදිච්චබන්ධුනන්ති.

8. 1. 8.

පරොසහස්සසුත්තං

216. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ** මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ නිබ්බාණපටිසංයුත්තාය[2] ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිකත්වා මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

---

1. හාසුපඤ්ඤො - සීමු. සී 1, 2. 2. නිබ්බානසංයුත්තාය, මජසං.

සාරිපුත්ත, තොපගේ කායික වූ හෝ වාචසික වූ හෝ කිසිවකට මම තො ම ගරහමි. සාරිපුත්ත, තෙපි පණ්ඩිතයහු. සාරිපුත්ත, තෙපි මහාපඤ්ඤයහු. සාරිපුත්ත, තෙපි පුථුපඤ්ඤයහු. සාරිපුත්ත තෙපි හාසපඤ්ඤයහු. සාරිපුත්ත තෙපි ජවනපඤ්ඤයහු. සාරිපුත්ත, තෙපි තික්ඛපඤ්ඤයහු. සාරිපුත්ත තෙපි නිබ්බේධිකපඤ්ඤයහු. සාරිපුත්ත, යම්සේ සක්විතිරජුගේ දෙටුපුත් තෙමේ පියා විසින් පවත්වන ලද අණසක මැනවින් අනුව පවත්වා ද, සාරිපුත්ත, එසෙයින් ම මවිසින් පවත්වන ලද අනුත්තර වූ දහම්සක තෙපි මැනවින් ම පවත්වහු ය.

වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මාගේ කායික වූ හෝ වාචසික වූ හෝ කිසිවකට නො ගරහන සේක් නම් වහන්ස, මේ පන්සියක් භික්ෂූන්ගේත් කායික වූ හෝ වාචසික වූ හෝ කිසිවකට භාග්‍යවතුන් වහන්සේ ගරහන සේක් ද?

සාරිපුත්ත, මේ පන්සියක් භික්ෂූන්ගේත් කායික වූ හෝ වාචසික වූ හෝ කිසිවකට මම නො ගරහමි. සාරිපුත්ත, මේ භික්ෂූන් පන්සියය අතුරෙන් භික්ෂුහු සැටනමක් ත්‍රිවිද්‍ය ඇත්තෝ ය. භික්ෂුහු සැටනමක් ෂඩභිඥ ඇත්තෝ ය. භික්ෂුහු සැටනමක් උභතොභාග (අරූපාවචර සමාපත්තියෙන් රූපකයින් හා අග්‍රමාර්ගයෙන් නාමකයින් හා) විමුක්ත ය හ. වැලි සෙස්සෝ ප්‍රඥාවිමුක්ත ය හ. (තෙවිජ්ජාදිභාවයට නො පැමිණි රහත්හ.)

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීශ තෙමේ හුනස්නෙන් නැගිට උත්තරාසඞ්ගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මට වැටහේ. සුගතයන් වහන්ස, මට වැටහේ ය"යි මෙය සැල කෙළේ ය. වඞ්ගීස, තට වැටහේවා යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ සුදුසු ගාථායෙන් ඉදිරියෙහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රශංසා කෙළේ ය:

සංයෝජන නම් වූ ද බන්ධන නම් වූ ද කෙලෙස් සිඳලූ දුක් රහිත වූ ක්‍ෂය කළ පුනර්භව ඇති සෘෂි වූ පන්සියක් භික්ෂුහු අද පුණුරැසි පොහෝ දිනෙහි විශුද්ධිපවාරණය පිණිස රැස් වූහ.

සක්විතිරජ තෙමේ ඇමැති සමූහයා විසින් පිරිවරණ ලදුව සතර සයුරු හිම් කොට ඇති මේ පොළොව හාත්පස යම්සේ පිළිවෙළින් පරිගමනය කෙරේ ද–

එසේ ම ත්‍රිවිද්‍ය ඇති මරු නැසුවා වූ ශ්‍රාවකයෝ දිනූ සඞ්ග්‍රාම ඇති නිරුත්තර වූ සත්ථවාහ නම් බුදුරජානන් වහන්සේ පයිරුපාසනය කෙරෙත්.

සියල්ලෝ ම භාග්‍යවතුන් වහන්සේගේ පුත්තු ය. මෙහි හිස් පුහුලෙක් නැත. තෘෂ්ණාශල්‍යය නසන සූර්‍ය්‍යබන්ධු වූ සර්වඥයන් වහන්සේ වඳිමි.

8. 1. 8.

පරොසහස්ස සූත්‍රය

216. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ අරම්හි මහත් බික් සඟන අඩතෙළෙස් භික්ෂූන් දහස සමඟ වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නිවණ පිළිබඳ දැහැමිකථාවෙන් භික්ෂූන්ට කරුණු දක්වන සේක. (ඔවුන්) සමාදන් කරවන සේක. තෙද ගන්වන සේක. සතුටු කරණ සේක. ඒ භික්ෂුහු ද අර්ථවත් කොට මෙනෙහි කොට මුළුසිතින් මනා කොට ගෙණ යොමු කළ කන් ඇති ව දහම් අසත්.

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි: අයං ඛො භගවා භික්ඛූ නිබ්බාණපටිසංයුත්තාය ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිකත්වා මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති. යන්නූනාහං භගවන්තං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවෙය්‍යන්ති. අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා, පටිභාති මං සුගතාති. පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච. අථ ඛො ආයස්මා වඞ්ගීසො භගවන්තං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි:

පරොසහස්සං භික්ඛූනං සුගතං පයිරුපාසති,
දෙසෙන්තං විරජං ධම්මං නිබ්බාණං අකුතොභයං.

සුණන්ති ධම්මං විමලං සම්මාසම්බුද්ධදෙසිතං,
සොභති වත සම්බුද්ධො භික්ඛුසඞ්ඝපුරක්ඛතො.

නාගනාමොසි භගවා ඉසීනං ඉසිසත්තමො,
මහාමෙඝොව හුත්වාන සාවකෙ අභිවස්සති.

දිවාවිහාරා නික්ඛම්ම සත්ථුදස්සනකම්‍යතා[1],
සාවකො තෙ මහාවීර පාදෙ වන්දති වඞ්ගීසොති.

කින්නු තෙ වඞ්ගීස ඉමා ගාථායො පුබ්බෙ පරිවිතක්කිතා උදාහු ඨානසොව තං පටිභන්තීති?

න ඛො මෙ භන්තෙ ඉමා ගාථායො පුබ්බෙ පරිවිතක්කිතා. අථ ඛො ඨානසොව මං පටිභන්තීති.

තෙන හි තං වඞ්ගීස භිය්‍යොසොමත්තාය පුබ්බෙ අපරිවිතක්කිතා ගාථායො පටිභන්තූති.

එවං භන්තෙති ඛො ආයස්මා වඞ්ගීසො භගවතො පටිස්සුත්වා භිය්‍යො-සොමත්තාය භගවන්තං පුබ්බෙ අපරිවිතක්කාහි ගාථාහි අභිත්ථවි:

උම්මග්ගපථං[2] මාරස්ස අභිභුය්‍ය චරසි පභිජ්ජ ඛිලානි[3],
තං පස්සථ බන්ධපමුඤ්චකරං අසිතං භාගසො පවිභජ්ජං.

---

1. සත්ථුදස්සනකාමිනා - සං. 2. උම්මග්ගසතං - සී 1, 2. 3. ඛිලානි - සං.

ඉක්බිති වඞ්ගීස තෙරුන්ට "මේ භාග්‍යවතුන් වහන්සේ නිවන් පිළිබඳ දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වන සේක. (ඔවුන්) සමාදන් කරවන සේක. තෙද ගන්වන සේක. සතුටු කරණ සේක. ඒ භික්ෂූහු ද අර්ථවත් කොට මෙනෙහි කොට මුළුසිතින් සමන්නාකොටගෙණ යොමු කළ කන් ඇති ව දහම් අසත්. මම සුදුසු ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේට හමුවෙහි ප්‍රශංසා කරන්නෙම් නම් මැනැවැ"යි මේ අදහස වි ය. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ හුනස්නෙන් නැඟිට උත්තරාසඞ්ගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මට වැටහේ. සුගතයන් වහන්ස, මට වැටහේ" යි මෙය සැළ කෙළේ ය. වඞ්ගීස, තට වැටහේවා! යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ සුදුසු ගාථායෙන් හමුවෙහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රශංසා කෙළේ ය:

අද පසළොස්වක් දවසෙහි පිරිසිදු වූ පිණිස එක් රැස් වූ පන්සියයක් පමණ භික්ෂුහු (කොයිතුන් බියක් නැති බැවින්) අකුතොභය වූ නිර්මල වූ නිර්වාණ ධර්මය දේශනා කරණ බුදුරජාතන් වහන්සේ පයිරුපාසනය කෙරෙත්.

සම්මාසම්බුදුරජාතන් වහන්සේ විසින් දෙසෙන නිර්මල වූ ධර්මය අසත්. භික්ෂුසඝයා විසින් පෙරටු කරණ ලද සම්බුදුරජාතන් වහන්සේ ඒකාන්තයෙන් හොබනා සේක.

භාග්‍යවතුන් වහන්ස, (මුඹවහන්සේ) නාග නම් වන සේක. (විපස්සී ආදි බුද්ධ) සෘෂින් අතුරෙන් සත් වැනි සෘෂි වන සේක. නොහොත් (ප්‍රත්‍යෙකබුද්ධාදි) සෘෂින්ට අතිශ්‍රේෂ්ඨ සෘෂි වන සේක. මහාමෙඝයක් මෙන් වී සව්වන් (සදහම් වැස්සෙන්) තෙමන සේක.

මහාවීරයන් වහන්ස, මුඹවහන්සේගේ ශ්‍රාවක වූ වඞ්ගීස තෙමේ ශාස්තෘන් වහන්සේ දකිනු කැමැත්තෙන් දිවා විහරණයෙන් නික්ම අවුත් (මුඹවහන්සේගේ) සිරිපා වඳියි.

කිමෙක් ද? වඞ්ගීස, මේ ගාථාවෝ තා විසින් පෙර සිතන ලද්දාහු ද? නැත හොත් තට (අවස්ථාවශයෙන්) එකෙණෙහි ම (වැටහෙද්ද?)

වහන්ස, මේ ගාථාවෝ මා විසින් පෙර සිතන ලද්දාහු නො ම වෙති. වැලි (අවස්ථාවශයෙන්) එකෙණෙහි ම (මට වැටහෙත්.)

වඞ්ගීස, එසේ වී නම් පෙර කල්පනා නොකරණ ලද ගාථාවෝ බෙහෙවින් ම තට වැටහෙත්වා.

ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ වහන්ස, එසේ යයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා පෙර කල්පනා නොකරණ ලද ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේට බෙහෙවින් ප්‍රශංසා කෙළේ ය:

මාරයාගේ කෙලෙස් පීඩා නමැති උමං මඟ (රාගාදි පසළොස්) බිලයන් බිඳ හැසිරෙන සේක. කෙලෙස් බැඳුම් මුදා ලන රාගාදියෙන් අනිඃශ්‍රිත වූ ධර්මය කොටස් වශයෙන් බෙදන්නා වූ ඒ තථාගතයන් වහන්සේ දකිවු.

ඔඝස්ස හි[1] නිත්ථරණත්ථං අනෙකවිහිතං මග්ගං අක්ඛාසි,
තස්මිං තෙ[2] අමතෙ අක්ඛාතෙ ධම්මද්දසා ඨිතා අසංහීරා.

පජ්ජෝතකරො අතිවිජ්ඣ ධම්මං[3] සබ්බට්ඨිතීනං[4] අතික්කමමද්දස,
ඤත්වා ච සච්ඡිකත්වා ච අග්ගං සො දෙසයි දසද්ධානං[5].

එවං සුදෙසිතෙ ධම්මෙ කො පමාදෙ විජානතං[6],
තස්මා හි තස්ස භගවතො සාසනෙ අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති.

8. 1. 9.

කොණ්ඩඤ්ඤසුත්තං

217. එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දක-නිවාපෙ**. අථ ඛො ආයස්මා **අඤ්ඤාකොණ්ඩඤ්ඤො**[7] සුචිරස්සෙව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති. පාණීහි ච පරිසම්බාහති. නාමඤ්ච සාවෙති "කොණ්ඩඤ්ඤාහං භගවා කොණ්ඩඤ්ඤාහං සුගතා"ති.

අථ ඛො ආයස්මතො **වඞ්ගීසස්ස** එතදහොසි. අයං ඛො ආයස්මා අඤ්ඤා-කොණ්ඩඤ්ඤො සුචිරස්සෙව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති. පාණීහි ච පරිසම්බාහති. නාමඤ්ච සාවෙති "කොණ්ඩඤ්ඤාහං භගවා කොණ්ඩඤ්ඤාහං සුගතා"ති. යන්නූනාහං ආයස්මන්තං අඤ්ඤාකොණ්ඩඤ්ඤං භගවතො සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවෙය්‍යන්ති.

අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා පටිභාති මං සුගතාති. පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච.

අථ ඛො ආයස්මා වඞ්ගීසො ආයස්මන්තං අඤ්ඤාකොණ්ඩඤ්ඤං භගවතො සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි.

බුද්ධානුබුද්ධො සො ථෙරො කොණ්ඩඤ්ඤො තිබ්බනික්කමො,
ලාභී සුඛවිහාරානං විවෙකානං අභිණ්හසො.

1. 'හි' ඉති නත්ථි - මජ්ඣසං. 2. තස්මිං වෙ - මජ්ඣසං, සයා. 3. ධම්මං ඉති නත්ථි - මජ්ඣසං, PTS. 4. සබ්බදිට්ඨීනං - සයා. 5. දසට්ඨානං සයා, PTS. 6. විජානතං ධම්මං - මජ්ඣසං, PTS. 7. අඤ්ඤාසි_කොණ්ඩඤ්ඤො - මජ්ඣසං, PTS.

චතුරොඝ නිස්තරණය පිණිස අනේකවිධ වූ මාර්ගය වදාළ සේක. උන්වහන්සේ විසින් වදාරණ ලද ඒ අමෘතයෙහි උන්වහන්සේගේ ශ්‍රාවකයෝ අසංහාරිය ව (රාගාදියෙන් හැකිළිය නො හැකිසේ තහවුරුව) පිහිටි යෝ ය.

ඥානාලෝකය පහළ කළ බුදුරජාණන් වහන්සේ ධර්මය අවබෝධ කොට සියලු දෘෂ්ටිස්ථානයන්ගේ හෝ විඥානස්ථිතීන්ගේ ඉක්මීම දුටු සේක. දැන ප්‍රත්‍යක්ෂ කොට උන්වහන්සේ උතුම් ධර්මය දශාර්ධයන්ට හෙවත් පස්වග මහණුන්ට දෙසූ සේක.

මෙසේ ධර්මය මොනොවට දේශනා කොට ඇතිකල්හි ධර්මය දැන ගන්නවුන්ගේ කවර ප්‍රමාදයෙක් ද, එහෙයින් (තථාගතයන් වහන්සේට) නමස්කාර කරමින් ඒ භාග්‍යවතුන් වහන්සේගේ සස්නෙහි අප්‍රමාදී ව හැම කල්හි පිළිවෙළින් හික්මෙන්නේ ය.

8. 1. 9.

කොණ්ඩඤ්ඤසූත්‍රය

217. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක, එකල්හි ආයුෂ්මත් **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** තෙරණුවෝ බොහෝ කලෙකින් ම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේගේ පා මුවෙන් සිඹිත්. අතින් ද පිරිමදිත්. "භාග්‍යවතුන් වහන්ස, මම කොණ්ඩඤ්ඤ යෙමි. සුගතයන් වහන්ස, මම කොණ්ඩඤ්ඤයෙමි"යි නම ද අස්වත්.

එකල්හි ආයුෂ්මත් **වඞ්ගීස** තෙරුන්ට "මේ ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරණුවෝ බොහෝ කලෙකින් ම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේගේ පා මුවෙන් සිඹිත්. අතින් ද පිරිමදිත්. "භාග්‍යවතුන් වහන්ස, මම කොණ්ඩඤ්ඤයෙමි. සුගතයන් වහන්ස, මම කොණ්ඩඤ්ඤයෙමි"යි නම ද අස්වත්. මම භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සුදුසු ගාථායෙන් ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරිඳුන් පසසන්නෙම් නම් ඉතා යෙහෙකැ"යි මේ අදහස විය.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ හුනස්නෙන් නැගිට උත්තරාසඞ්ගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මට වැටහේ. සුගතයන් වහන්ස, මට වැටහේ"යි මෙය සැළ කෙළේ ය. වඞ්ගීස, තට වැටහේවා!යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ සුදුසු ගාථාවලින් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරණුවන් පැසසී ය.

(බුදුනුට පසුව චතුරාර්‍යසත්‍යය අවබෝධ කළ බැවින්) බුද්ධානුබුද්ධ වූ බහල වීර්‍යය ඇති ඒ කොණ්ඩඤ්ඤ තෙරණුවෝ සුඛවිහරණ ඇති චිත්තවිවේකයන් නිතර ලබනසුල්ලහ.

යං සාවකෙන පත්තබ්බං සත්ථුසාසනකාරිනා,
සබ්බස්ස තං අනුප්පත්තං අප්පමත්තස්ස සික්ඛතො.

මහානුභාවො තෙවිජ්ජො චෙතොපරියායකොවිදො,
කොණ්ඩඤ්ඤො බුද්ධදායාදො[1] පාදෙ වන්දති සත්ථුනොති.

8. 1. .10

මොග්ගල්ලානසුත්තං

218. එකං සමයං භගවා රාජගහෙ විහරති ඉසිගිලිපස්සෙ කාළසිලායං මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. තෙසං සුදං ආයස්මා මහාමොග්ගල්ලානො චෙතසා චිත්තං සමන්නෙසති විප්පමුත්තං නිරූපධිං[2].

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි: අයං ඛො භගවා රාජගහෙ විහරති ඉසිගිලිපස්සෙ කාළසිලායං මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. තෙසං සුදං ආයස්මා මහාමොග්ගල්ලානො චෙතසා චිත්තං සමන්නෙසති විප්පමුත්තං නිරූපධිං[2]. යන්නූනාහං ආයස්මන්තං මහාමොග්ගල්ලානං භගවතො සම්මුඛා සරූපාහි ගාථාහි අභිත්ථවෙය්‍යන්ති.

අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා පටිභාති මං සුගතාති. පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච. අථ ඛො ආයස්මා වඞ්ගීසො ආයස්මන්තං මහාමොග්ගල්ලානං භගවතො සම්මුඛා සරූපාහි ගාථාහි අභිත්ථවි:

නගස්ස පස්සෙ ආසීනං මුනිං දුක්ඛස්ස පාරගුං,
සාවකා පයිරුපාසන්ති තෙවිජ්ජා මච්චුහායිනො.

තෙ චෙතසා අනුපරියෙති[3] මොග්ගල්ලානො මහිද්ධිකො,
චිත්තං තෙසං සමන්නෙසං විප්පමුත්තං නිරූපධිං.

එවං සබ්බඞ්ගසම්පන්නං මුනිං දුක්ඛස්ස පාරගුං,
අනෙකාකාරසම්පන්නං පයිරුපාසන්ති ගොතමන්ති.

8. 1. 11.

ගග්ගරාසුත්තං

219. එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සත්තහි ච උපාසකසතෙහි[4] අනෙකෙහි ච දෙවතාසහස්සෙහි. ත්‍යාස්සුදං භගවා අතිරොචති වණ්ණෙන චෙව යසසා ච[5].

---

1 බුද්ධසාවකො, PTS. 2. නිරූපධිං - සීමු. 1.2. 3. අනුපරියෙසති - සයා. 4. සත්තහි ච උපාසිකාසතෙහි ඉති දිස්සති - මජසං PTS. 5. යසෙන - සීමු. 1.

ශාස්තෘශාසනකාරී වූ ශ්‍රාවකයකු විසින් යමක් ලැබියයුතු ද අප්‍රමාදී ව හික්මෙන්නා වූ උන්වහන්සේ විසින් ඒ සියල්ල ලබන ලදී.

මහත් අනුභාව ඇති ත්‍රිවිද්‍යා ඇති චේතෝපරියඥාණයෙහි දක්‍ෂ වූ බුද්ධපුත්‍ර වූ කොණ්ඩඤ්ඤ තෙරණුවෝ ශාස්තෲන් වහන්සේගේ සිරිපා වඳිත්.

8. 1. 10.

මොග්ගල්ලානසූත්‍රය

218. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **ඉසිගිලිපවුපස කළුගල්තලාවෙහි** හැම රහත් වූ භික්‍ෂූන් පන්සියයක් පමණ වූ, මහත් බික්සඟන සමග වැඩ වසන සේක. ආයුෂ්මත් **මහමුගලන්** තෙරණුවෝ තමසිතින් ඒ භික්‍ෂූන්ගේ සිත වෙසෙසින් මිදුනේ ද උපධි රහිතදැයි සොයත්.

ඉක්බිති ආයුෂ්මත් **වඞ්ගීස**තෙරුන්ට "මේ භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ඉසිගිලිපවුපස කළුගල්තලාවෙහි හැම රහත් වූ භික්‍ෂූන් පන්සියයක් පමණ වූ මහත් බික්සඟන සමග වැඩවසන සේක. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ තමසිතින් ඒ භික්‍ෂූන්ගේ සිත වෙසෙසින් මිදුනේ ද උපධි රහිතදැයි සොයත්. මම සුදුසු ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරුන් පසසන්නෙම් නම් මැනවැ"යි මේ අදහස වි ය.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ හුනස්නෙන් නැගිට උත්තරාසඞ්ගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මට වැටහේ. සුගතයන් වහන්ස, මට වැටහේ"යි මෙය සැළ කෙළේ ය. වඞ්ගීස, තට වැටහේවා!යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ සුදුසු ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරුන් පැසසී ය.

ත්‍රිවිද්‍යා ඇත්තා වූ කෙලෙස් මරු නැසූ ශ්‍රාවකයෝ පවුපස වැඩහුන් දුක් කෙළවරට පැමිණි සම්බුදු මුනිහු පයඞ්පාසනය කෙරෙත්.

මහත් සෘද්ධි ඇති මුගලන් තෙරණුවෝ සව්වන්ගේ සිත (කෙලෙසුන්ගෙන්) මිදුනේ ද, උපධි රහිත දැයි සොයමින් තම සිතින් ඔවුන් ලුහුබැඳ යෙත්.

මෙසේ සියලු ගුණාඞ්ගයන්ගෙන් යුත් දුක් කෙළවරට පැමිණි නොයෙක් අයුරෙන් පිරිපුන් සම්බුදු මුනි වූ ගෞතමයන් වහන්සේ පයඞ්පාසනය කෙරෙත්.

8. 1. 11.

ගග්ගරාසූත්‍රය

219. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **චම්පානුවර** සමීපයෙහි **ගග්ගරා** පොකුණුතෙර පන්සියයක් පමණ වූ බික්සඟන ද සත්සියයක් උවසුවන් ද නොයෙක් දහස්ගණන් දෙවියන් ද සමග වැඩවසන සේක. භාග්‍යවතුන් වහන්සේ ශරීර වර්ණයෙන් ද, යශසින් ද, ඔවුන් අබිබවා බබලන සේක.

අථ ඛො ආයස්මතො **වඞ්ගීසස්ස** එතදහොසි: අයං ඛො භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සත්තහි ච උපාසකසතෙහි අනෙකෙහි දෙවතාසහස්සෙහි. ත්‍යාස්සුදං භගවා අතිරොචති වණ්ණෙන චෙව යසසා ච යන්නූනාහං භගවන්තං[1] සම්මුඛා සරූපාය ගාථාය අභිත්ථවෙය්‍යන්ති.

අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා පටිභාති මං සුගතාති. පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච.

අථ ඛො ආයස්මා වඞ්ගීසො භගවන්තං[1] සම්මුඛා සරූපාය ගාථාය අභිත්ථවි:

චන්දො යථා විගතවලාහකෙ නභෙ
විරොචති වීතමලො[2] ච භාණුමා,
එවම්පි අඞ්ගීරස ත්වං මහාමුනි
අතිරොචසි යසසා සබ්බලොකන්ති.

8. 1. 12.

වඞ්ගීසසුත්තං

220. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **වඞ්ගීසො** අචිරඅරහත්තප්පත්තො හොති[3] විමුත්තිසුඛ[4] පටිසංවෙදී. තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

කාවෙය්‍යමත්තා විචරිම්හ පුබ්බෙ ගාමා ගාමං පුරාපුරං,
අථද්දසාම සම්බුද්ධං සද්ධා නො උදපජ්ජථ*.

සො මෙ ධම්මමදෙසෙසි ඛන්ධායතනධාතුයො[5],
තස්සාහං ධම්මං සුත්වාන පබ්බජිං අනගාරියං.

බහුන්නං වත අත්ථාය බොධිං අජ්ඣගමා මුනි,
භික්ඛූනං භික්ඛුනීනඤ්ච යෙ නියාමගතද්දසා.

ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛුං විසොධිතං,
තෙවිජ්ජො ඉද්ධිප්පත්තොම්හි චෙතොපරියාය කොවිදොති

වඞ්ගීසවග්ගො පඨමො.

1. භගවතො - PTS. 2. විගතමලො - මජසං. 3. හුත්වා - මජසං, PTS.
4. විමුත්තිසුඛං - මජසං, සීමු, 1.2. ස්‍යා. 5. ඛන්ධෙ ආයතනානි ධාතුයො ච - PTS, ස්‍යා.
* උපපජ්ජථ - මජසං, ස්‍යා, සීමු. 1.2.

එකල්හි ආයුෂ්මත් **වඞ්ගීස** තෙරුන්ට "මේ භාග්‍යවතුන් වහන්සේ චම්පානුවර සමීපයෙහි ගග්ගරා පොකුණුතෙර පන්සියක් පමණ වූ භික්සඝන ද සත්සියක් උවසුවන් ද නොයෙක් දහස්ගණන් දෙවියන් ද සමග වැඩවසන සේක භාග්‍යවතුන් වහන්සේ ශරීර වර්ණයෙන් ද යශසින් ද ඔවුන් අභිබවා බබලන සේක. මම සුදුසු ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේට හමුවෙහි ප්‍රශංසා කරන්නෙම් නම් මැනවැයි මේ අදහස විය.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ හුනස්නෙන් නැගිට උත්තරාසඞ්ගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මට වැටහේ, සුගතයන් වහන්ස මට වැටහේ" යි මෙය සැළ කෙළේ ය. වඞ්ගීස, තට වැටහේවා! යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙමේ සුදුසු ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේට ඉදිරියෙහි පැසසී ය:

පහ ව ගිය වලාකුළු ඇති අහස්හි සඳුත් නිර්මල වූ හිරුත් යම්සේ බබලද්ද, මහාමුනි වූ බුදුරජානන් වහන්ස, මුබවහන්සේ ද, එසේ ම යශසින් සියලු ලොකයා අභිබවා බබලන සේක.

8. 1. 12.

වඞ්ගීසසූත්‍රය

220. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඩුසිටුහුගේ අරම්හි** වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **වඞ්ගීස**ස්ථවිර තෙමේ රහත්බවට පැමිණි නොබෝකල් ඇත්තේ වේ. විමුක්තිසුවය විඳිනේ ඒ වේලාවෙහි මේ ගාථා කී ය.

පෙර කවිකිරීමෙන් මත් ව ගමින් ගම ද නුවරින් නුවර ද හැසුරුනෙමු. ඉක්බිති බුදුරජානන් වහන්සේ දුටු වෙමු. (එයින්) අපට ශ්‍රද්ධාව උපනි.

ඒ බුදුරජානන් වහන්සේ ස්කන්ධායතනධාතූන් ප්‍රකාශ කෙරෙමින් මට දහම් දෙසූ සේක. මම උන්වහන්සේගේ ධර්මය අසා සස්නෙහි පැවිදි වීමි.

යම් කෙනෙක් නියාමධර්මයට පැමිණියෝ ද, නියාමධර්මය දක්නෝ ද බොහෝ වූ ඒ භික්ෂූන්ට ද භික්ෂුණීන්ට ද වැඩ පිණිස මුනීන්ද්‍රයන් වහන්සේ බුද්ධත්වයට පැමිණි සේක.

මට ඒකාන්තයෙන් යහපත් ඊමෙක් විය. මා විසින් බුදුරජානන් වහන්සේ සමීපයෙහි ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. සර්වඥයන් වහන්සේගේ ශාසනය කරණ ලද්දේ ය.

පෙර විසූ කඳපිළිවෙළ දනිමි. දිවැස වෙසෙසින් පිරිසිදු කරණ ලද්දේ ය. ත්‍රිවිද්‍යා ඇත්තෙම් සෘද්ධිවිධඥානයට පැමිණියෙම් චේතෝපරියඥානයෙහි දක්ෂ වූයෙම් වෙමි.

වඞ්ගීස වර්ගය පළමුවැනි යි.

තස්සුද්දානං:

නික්ඛන්තං අරති චෙව පෙසලං අතිමඤ්ඤනා,
ආනන්දෙන සුභාසිතා සාරිපුත්ත පවාරණා,
පරොසහස්සං කොණ්ඩඤ්ඤො මොග්ගල්ලානෙන ගග්ගරා
වඞ්ගීසෙන ද්වාදසාති.

වඞ්ගීසසංයුත්තං සමත්තං.

---

9. වනසංයුත්තං

1. වනවග්ගො

9. 1. 1.

විවෙකසුත්තං

221. එවං මෙ සුතං: එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු දිවාවිහාරගතො පාපකෙ අකුසලෙ විතක්කෙ විතක්කෙති ගෙහනිස්සිතෙ.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි:

විවෙකකාමොසි වනං පවිට්ඨො අථ තෙ මනො නිච්ඡරති බහිද්ධා,
ජනො[1] ජනස්මිං විනයස්සු ඡන්දං තතො සුඛී හොහිසි වීතරාගො.

අරතිං පජහාසි සතො[2] භවාසි සතං තං සාදයාමසෙ[3],
පාතාලරජො හි දුත්තරො[4] මා තං කාමරජො අවාහරි.

සකුණො යථා පංසුකුණ්ඩිතො[5] විධූනං[6] පාතයති සිතං රජං,
එවං භික්ඛු පධානවා සතිමා විධූනං පාතයති සිතං රජන්ති.

අථ ඛො සො භික්ඛු තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

9. 1. 2.

උපට්ඨානසුත්තං

222. එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු දිවාවිහාරගතො සුපති. අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යෙන සො භික්ඛු තෙනුපසඞ්කාමි.

---

1. සං. ජනො. ස්‍යා 2. සො සතො - PTS. 3. සාරයාමසෙ - මජසං, ස්‍යා, PTS. සී. 1, 2. 4 දුරුත්තමො - PTS. 5. පංසුකුන්ථිතො - මජසං, 6. විධූනං - PTS.

එහි උද්දානය:

නික්ඛන්ත, අරති, පෙසල, අතිමඤ්ඤනා, ආනන්ද, සුභාසිත, සාරිපුත්ත, පවාරණ, පරොසහස්ස, කොණ්ඩඤ්ඤ, මොග්ගල්ලාන, ගග්ගර, වඞ්ගීස යයි සූත්‍ර දොළසෙකි.

වඞ්ගීස සංයුත්තය නිමියේ ය.

---

9. වනසංයුත්තය

1. වනවර්ගය

9. 1. 1.

විවෙකසූත්‍රය.

221. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක එක්තරා මහණෙක් **කොසොල්** දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ඒ මහණ තෙමේ පස්කම්සුව ඇසුරු කළ ලාමක අකුසල් සිතිවිලි සිතයි.

ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ, ඒ මහණහට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙවි තෙමේ ඒ මහණහට සංවේග දනවනු කැමැත්තේ ඒ මහණහු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට ගාථායෙන් කී ය:

විවේකය කැමැති ව වනයට පිවිසියේ වෙහි ය. එහෙත් ඔබගේ සිත පිටත හැසිරෙයි. ජනයෙක් වූ ඔබ අන්‍යජනයා කෙරෙහි ඡන්දරාගය දුරු කරව. එහෙයින් පහ ව ගිය රාග ඇත්තේ සැප ඇත්තෙක් වන්නෙහි ය.

අනභිරතිය දුරු කරව. සිහි ඇත්තෙක් වෙව. ඔබ සිහි ඇත්තෙකැ යි, නොහොත් ඒ සත්පුරුෂධර්මය යයි අදහමු. පාතාලසඞ්ඛ්‍යාත කෙලෙස්-රජස තරණය කිරීමට දුෂ්කර ම ය. කාමරාගරජස ඔබ (අපායට) නො හෙළාවා.

පස් තැවරුණා වූ පක්ෂියෙක් (පියාපත්) සලමින් (ශරීරයෙහි) ඇලුනු දූවිලි යම් සේ හෙළා ද, එසේ ම ප්‍රධන් වීර්‍ය්‍ය ඇති සමෘතිමත් වූ මහණ තෙමේ (ස්වසන්තානය) ඇසුරු කළ (කෙලෙස්) රජස් සලමින් හෙළයි.

ඉක්බිති ඒ මහණ තෙමේ ඒ දේවතාවා විසින් සංවෙගයට පමුණුවන ලද්දේ සංවේගයට (ඔතප්ඛියට) පැමිණියේ ය.

9. 1. 2.

උපට්ඨාන සූත්‍රය

222. එක්කලෙක එක්තරා මහණෙක් **කොසොල්** දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ඒ මහණ තෙමේ දිවාවිහාරයට ගියේ නිදයි. ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහිත වූ ඒ මහණහට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙවි තෙමේ, ඒ මහණහට සංවේග දනවනු කැමැත්තේ ඒ මහණහු වෙත එළඹියේ ය.

උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි:

උට්ඨෙහි භික්ඛු කිං සෙසි[1] කො අත්ථො සුපිතෙන[2] තෙ,
ආතුරස්ස හි කා[3] නිද්දා සල්ලවිද්ධස්ස රුප්පතො.

යාය සද්ධා[4] පබ්බජිතො අගාරස්මානගාරියං,
තමෙව සද්ධං බ්‍රූහෙහි මා නිද්දාය වසඞ්ගමීති.

අනිච්චා අද්ධුවා කාමා යෙසු මන්දො'ව මුච්ඡිතො,
බන්ධෙසු[5] මුත්තං අසිතං කස්මා පබ්බජිතං තපෙ.

ඡන්දරාගස්ස විනයා අවිජ්ජාසමතික්කමා,
තඤ්ඤාණං පරමවොදතං[6] කස්මා පබ්බජිතං තපෙ.

හෙත්වා[7] අවිජ්ජං විජ්ජාය ආසවානං පරික්ඛයා,
අසොකං අනුපායාසං කස්මා පබ්බජිතං තපෙ.

ආරද්ධවිරියං පහිතත්තං නිච්චං දළ්හපරක්කමං,
නිබ්බාණං අභිකඞ්ඛන්තං කස්මා පබ්බජිතං තපෙති.

9. 1. 3.

කස්සපගොත්තසුත්තං.

223 එකං සමයං ආයස්මා කස්සපගොත්තො කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා කස්සපගොත්තො දිවාවිහාරගතො අඤ්ඤතරං චෙතං[8] ඔවදති.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා ආයස්මතො කස්සපගොත්තස්ස අනුකම්පිකා අත්ථකාමා ආයස්මන්තං කස්සපගොත්තං සංවෙජෙතුකාමා යෙනායස්මා කස්සපගොත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං කස්සපගොත්තං ගාථාහි අජ්ඣභාසි:

ගිරිදුග්ගචරං චෙතං අප්පපඤ්ඤං අචෙතසං,
අකාලෙ ඔවදං භික්ඛු මන්දො'ව පටිභාති මං.

සුණාති[9] න විජානාති ආලොකෙති න පස්සති,
ධම්මස්මිං භඤ්ඤමානස්මිං අත්ථං බාලො න බුජ්ඣති.

සචෙපි දස පජ්ජොතෙ ධාරයිස්සසි කස්සප,
නෙව දක්ඛිති[10] රූපානි චක්ඛු හි'ස්ස න විජ්ජතීති.

අථ ඛො ආයස්මා කස්සපගොත්තො තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

---

1 සොපි - සං. 2. සුපිතෙන - PTS. 3. තෙ - සීමු සං. 4. සද්ධාය - මජසං. PTS. 5. බන්ධසු - මජසං. සං. PTS. 6. පරමොදතං - මජසං. සං. පරියොදතං - PTS. සී 2. 7. ඡෙත්වා - මජසං. 8 ඡෙතං - සං. PTS මජසං. 9. සුණොති - PTS 10. දක්ඛති - සීමු

එලඹ ඒ මහණහට ගාථායෙන් කීය.

මහණ, නැගිටුව, කිම, නිදහි ද? නිදීමෙන් තොපට කිනම් වැඩෙක් ද? කෙලශාතුර වූ (අවිද්‍යා විෂ පෙවූ තෘෂ්ණා) ශල්‍යයෙන් විදින ලද ගැටෙන්නාවූ තොපට කවර නින්දෙක් ද?

යම් ශ්‍රද්ධාවෙකින් ගිහිගෙන් නික්ම පැවිදි වූයෙහි ද, ඒ ශ්‍රද්ධාව ම වඩව. නින්දට වසඟ නො වව.

නුවණ මඳ වූ පෘථග්ජන තෙමේ යම් කාමයන්හි මුසපත් වූයේ ද, ඒ කාමයෝ අනිත්‍යයහ. අධ්‍රැවයහ. සකන්ධයන්හි මිදුනාවූ තෘෂ්ණාදෘෂ්ටීන් අනිඃශ්‍රිත වූ පැවිද්දකු කුමක් හෙයින් (දිවාස්වප්නය තෙමේ) තවන්නේ ද,

ඡන්දරාගය ‍වැනසීමෙන් ද, අවිද්‍යාව ඉක්ම වීමෙන් ද ඒ චතුස්සත්‍යඥානය පරම පවිත්‍ර වූයේ වෙයි. (එබඳු) පැවිද්දකු කුමක් හෙයින් තවන්නේ ද,

මාර්ගඥාන විද්‍යාවෙන් අවිද්‍යාව බිඳ ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් නිශෝකී වූ උපායාස රහිත වූ පැවිද්දකු කුමක් හෙයින් තවන්නේ ද,

සම්පූර්ණ වීර්‍ය්‍යය ඇති නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති නිතර දෘඪ පැරකුම් ඇති නිවණ පතන පැවිද්දකු කුමක් හෙයින් තවන්නේ ද.

9. 1. 3.

කාශ්‍යපගොත්‍ර සූත්‍රය.

223. එක්කලෙක ආයුෂ්මත් කාශ්‍යපගොත්‍ර ස්ථවිර තෙමේ කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ආයුෂ්මත් කාශ්‍යපගොත්‍ර ස්ථවිර තෙමේ එක්තරා මුවවැද්දකුට අවවාද කෙරෙයි.

ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ ආයුෂ්මත් කාශ්‍යපගොත්‍ර තෙරුන්ට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙවි තෙමේ ආයුෂ්මත් කාශ්‍යපගොත්‍ර තෙරුන්ට සංවේග දනවනු කැමැත්තේ ආයුෂ්මත් කාශ්‍යප-ගොත්‍ර තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් කාශ්‍යපගොත්‍ර තෙරුන්ට ගාථායෙන් කී ය:

පර්වත දුර්ගයෙහි හැසිරෙණ නුවණ නැති (කරුණු නොකරුණු
1 දූනීමෙහි සමත්) සිත් නැති මුවවැද්දකුට නොකල්හි අවවාද කරණ මහණ තෙමේ අඥබාලයකු මෙන් මට වැටහේ.

(තොපගේ බණ) අසයි. (එහෙත් අරුත්) නො දනී. (පුහුදුන් ඉඳුහයෙන් දිලෙන පටඇඟිලි) බලයි. (එහි කරුණු) නො දකී. බණ කියන කල්හි අඥාන තෙමේ අරුත් අවබෝධ නො කෙරෙයි.

පින්වත් කාශ්‍යප, ඉදින් ඇඟිලි පහන් දශයක් දරන්නෙහි නමුත් (හෙතු) රූපයන් නොම දක්නේ ය. යම් හෙයෙකින් ඔහට පැණැස නැද්ද (එහෙයිනි).

ඉක්බිති ආයුෂ්මත් කාශ්‍යපගොත්‍ර ස්ථවිර තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට (ඔතප්පියට) පමුණුවන ලද්දේ සංවිග්න වී ය.

9. 1. 4.

සම්බහුලාසුත්තං.

224. එකං සමයං සම්බහුලා භික්ඛූ කොසලෙසු විහරන්ති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා[1] තෙමාසච්චයෙන චාරිකං පක්කමිංසු. අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තෙ භික්ඛූ අපස්සන්තී පරිදෙවමානා තායං වෙලායං ඉමං ගාථං අභාසි:

අරති විය මෝ'ජ්ජ[2] ඛායති බහුකෙ දිස්වාන විවිත්තෙ ආසනෙ,
තෙ චිත්තකථා බහුස්සුතා කො'මෙ ගොතමසාවකා ගතාති.

එවං වුත්තෙ අඤ්ඤතරා දෙවතා තං දෙවතං ගාථාය අජ්ඣභාසි:

මගධං ගතා කොසලං ගතා එකච්චියා පන වජ්ජිභූමියා,
මගා[3] විය අසඞ්ගචාරිනො අනිකෙතා විහරන්ති භික්ඛවොති.

9. 1. 5.

ආනන්දසුත්තං.

225. එකං සමයං ආයස්මා ආනන්දො කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ.

තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො අතිවෙලං ගිහිසඤ්ඤත්තිබහුලො විහරති.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා ආයස්මතො ආනන්දස්ස අනුකම්පිකා අත්ථකාමා ආයස්මන්තං ආනන්දං සංවෙජෙතුකාමා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ගාථාය අජ්ඣභාසි:

රුක්ඛමූලගහණං පසක්කිය නිබ්බාණං හදයස්මිං ඔපිය,
ඣාය[4] ගොතම මා ච[5] පමාදො කිං තෙ බිළිබිළිකා කරිස්සතීති.

අථ ඛො ආයස්මා ආනන්දො තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති,

7 1. 6..

අනුරුද්ධසුත්තං.

226. එකං සමයං ආයස්මා අනුරුද්ධො කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ.

අථ ඛො අඤ්ඤතරා තාවතිංසකායිකා දෙවතා ජාලිනී නාම ආයස්මතො අනුරුද්ධස්ස පුරාණදුතියිකා යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං ගාථාහි අජ්ඣභාසි:

තත්ථ චිත්තං පණිධෙහි යත්ථ තෙ වුසිතං පුරෙ,
තාවතිංසෙසු දෙවෙසු සබ්බකාමසමිද්ධිසු,
පුරක්ඛතො පරිවුතො දෙවකඤ්ඤාහි[6] සොභසීති.

---

1. වුට්ඨා - මජ්සං. 2. මොජ්ජං - සයා. 3. මිගා - සීමු, මකසා - සයා.
4. ඣායී - සීමු. 5 මා - මජ්සං සයා. 6. දෙවගණෙහි - සයා.

9. 1. 4.

සම්බහුලා සූත්‍රය.

224. එක්කලෙක බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙත්. ඉක්බිති ඒ භික්ෂූහු වස් එළඹුනාහු තෙමස ඇවෑමෙන් චාරිකාවට ගියහ. එකල්හි ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ ඒ දෙව් තෙමේ ඒ භික්ෂූන් නො දක්නේ හඬමින් ඒ වේලාවෙහි මේ ගාථාව කී ය:

භික් වූ බොහෝ අසුන් දක මට අද අරතියක් මෙන් වැටහෙයි. විසිතුරු කථා ඇති බහුශ්‍රුත වූ ඒ මේ ගොයුම් සව්වෝ කොහි වැඩියාහු ද.

මෙසේ කී කල්හි එක්තරා දෙවියෙක් ඒ දේවතාවාට මේ ගාථාව කී ය:

ඇතැම් කෙනෙක් මගධ දනව්වට වැඩියහ. (ඇතැම් කෙනෙක්) කොසොල් දනව්වට වැඩියහ. (ඇතැම් කෙනෙක්) වැදූරටට අභිමුඛ ව (වැඩියහ.) භික්ෂූහු ඇල්මක් නැති ව හැසිරෙන්නාහු ගෙයක් නැති ව මුවන් මෙන් වෙසෙත්.

9. 1. 5.

ආනන්ද සූත්‍රය.

225. එක්කලෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ අතිමාත්‍ර කාලයක් ගිහියන් කෙරෙහි හැඟවිලි (ඇවැත්ති නොහඬව යනාදි තැලවිලි) බහුල කොට ඇති ව වෙසෙයි. ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ අනද තෙරුන්ට අනුකම්පා කරණු වැඩ කැමැති දෙව් අනද තෙරුන් සංවිග්න කරවනු කැමැත්තේ අනද තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් අනද තෙරුන්ට ගාථායෙන් කී ය.

රුක්මුල් සෙනසුන්හි විසීමට පිවිස නිවණ ලෙහි බහා ගෙණ (වෙසෙන) නුඹවහන්සේට (ගිහියන් සමග කරණ මේ) බිලිබිලි කථාව කුමක් කෙරේ ද? ගෞතමයන් වහන්ස, පමා නොවනු මැනව. ධ්‍යාන කරණු මැනව.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට පමුණුවන ලද්දේ සංවිග්න වී ය.

9. 1. 6.

අනුරුද්ධ සූත්‍රය.

226. එක්කලෙක අනුරුද්ධ ස්ථවිර තෙමේ කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ පෙරඅත්බව්හි බිරියක් වූ තව්තිසාවැසි ජාලිනී නම් එක්තරා දෙව්දුවක් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වෙත එළඹියා. එළඹ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට ගාථායෙන් කිවු ය.

පෙර යම් දෙව්ලොවෙක නුඹවහන්සේගේ විසීම වී ද, එහි සිත පිහිටුවනු මැනව. සියලු කාමයෙන් සමෘද්ධ වූ තව්තිසා දෙවියන් කෙරෙහි දෙවඟනන් විසින් පෙරටු කරණ ලදු ව, පිරිවරණ ලදු ව බැබළෙනුහු,

දුග්ගතා දෙවකඤ්ඤායො සක්කායස්මිං පතිට්ඨිතා,
තෙ චාපි දුග්ගතා සත්තා දෙවකඤ්ඤාහි පත්ථිතාති.

න තෙ සුඛං පජානන්ති යෙ න පස්සන්ති නන්දනං,
ආවාසං නරදෙවානං තිදසානං යසස්සිනන්ති.

[අනුරුද්ධො:]

න ත්වං බාලෙ විජානාසි යථා අරහතං වචො,
අනිච්චා සබ්බෙ සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.

නත්ථිදානි පුනාවාසො දෙවකායස්මිං[1] ජාලිනී,
වික්ඛීණො ජාතිසංසාරො නත්ථිදානි පුනබ්භවොති.

9. 1. 7.

නාගදත්තසුත්තං.

227. එකං සමයං ආයස්මා නාගදත්තො කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා නාගදත්තො අතිකාලෙන ගාමං පවිසති, අතිදිවා පටික්කමති. අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා ආයස්මතො නාගදත්තස්ස අනුකම්පිකා අත්ථකාමා ආයස්මන්තං නාගදත්තං සංවෙජෙතුකාමා යෙනායස්මා නාගදත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගදත්තං ගාථාහි අජ්ඣභාසි:

කාලෙ පවිස්ස[2] නාගදත්ත දිවා ච ආගන්ත්වා අතිවෙලචාරී,
සංසට්ඨො ගහට්ඨෙහි සමානසුඛදුක්ඛො.

භායාමි නාගදත්තං සුප්පගබ්භං කුලෙසු විනිබද්ධං,[3]
මා හෙව මච්චුරඤ්ඤො බලවතො අන්තකස්ස වසමෙසීති.[4]

අථ ඛො ආයස්මා නාගදත්තො තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

9. 1. 8.

කුලඝරණීසුත්තං.

228. එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු අඤ්ඤතරස්මිං කුලෙ අතිවෙලං අජ්ඣොගාළ්හප්පත්තො විහරති.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යා තස්මිං කුලෙ කුලඝරණී තස්සා වණ්ණං අභිනිම්මිනිත්වා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි:

නදීතීරෙසු සණ්ඨානෙ සභාසු රථියාසු ච,
ජනා සඞ්ගම්ම මන්තෙන්ති මඤ්ච තඤ්ච කිමන්තරන්ති.

1. දෙවකායස්මි - මජසං. සභා. 2. පවිස - මජසං. 3. විනිබන්ධං - PTS.
4. වසං උපෙසීති - මජසං.

දෙවඟනෝ (ප්‍රතිපත්ති දුර්ගතියෙන්) දුර්ගතයහ. සත්කායයෙහි පිහිටියෝ ය. දෙවඟනන් විසින් පතන ලද ඒ සත්ත්වයෝ ද දුර්ගතයහ.

යම් කෙනෙක් පිරිවර - යශස් ඇති තිදස්වැසි දේවපුරුෂයන්ගේ නඳුනුයන නො දකිද්ද ඔහු සුවය නො දනිත්.

[අනුරුද්ධ:]

බාලතැනැත්තිය, "සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. ඉපදීම හා නැසීම ස්වභාව කොට ඇත්තාහ. ඉපිද නිරුද්ධ වෙත්. ඔවුන්ගේ සංසිඳීම සුව ය" යන රහතුන්ගේ වදන පරිදි තෝ නො දන්නහු.

එම්බා **ජාලිනී,** දූන් දේවකායෙහි නැවත විසීමෙක් (මට) නැත. ඉපදීම යයි කියන ලද සංසාරය **ක්ෂීණ** වූයේ ය. දූන් පුනර්භවයෙක් (මට) නැත.

9. 1. 7.

නාගදත්ත සූත්‍රය.

227. **එක්කලෙක** ආයුෂ්මත් **නාගදත්ත** ස්ථවිර තෙමේ **කොසොල් දනව්වෙහි** එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ආයුෂ්මත් නාගදත්ත ස්ථවිර තෙමේ ඉතා කලින් ගමට පිවිසෙයි. ඉතා දවල් පෙරළා එයි. ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ ආයුෂ්මත් නාගදත්ත තෙරුන්ට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙවි ආයුෂ්මත් නාගදත්ත තෙරුන් සංවිග්න කරවනු කැමැත්තී ආයුෂ්මත් නාගදත්ත තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් නාගදත්ත තෙරුන්ට ගාථායෙන් කී ය:

නාගදත්ත, අලුයම් කාලයෙහි (පිඩු පිණිස) පිවිස වේලාව ඉක්මවා හැසිරෙන සුලු වූයෙහි ගිහියන් හා හැනුනෙහි ඉතා දවල් පෙරළා අවුත් (ගිහියන් හා) සමාන සුවදුක් ඇත්තෙහිය.

ඉතා බුහුටි වූ කුලයන්හි බැඳුනා වූ නාගදත්ත (මහණහු ගැණ) බිම්. බලවත් වූ මෘත්‍යුරජ වූ මරුගේ වශයට නො ම පැමිණෙව.

ඉක්බිති ආයුෂ්මත් නාගදත්ත ස්ථවිර තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට පමුණුවන ලද්දේ සංවිග්න වි ය.

9. 1 8.

කුලඝරණී සූත්‍රය.

228. එක්කලෙක එක්තරා මහණෙක් **කොසොල් දනව්වෙහි** එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ඒ මහණ තෙමේ එක්තරු කුලයක් කෙරෙහි අතිශය ඇතුළත් බවට පැමිණියේ අතිමාත්‍රකාලයක් වැඩ වෙසෙයි.

ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ ඒ මහණහට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙවි ඒ මහණ සංවිග්න කරවනු කැමැත්තී ඒ කුලයෙහි ඒ කුලගෙහබු වෙස් ගෙණ ඒ මහණ වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට ගාථායෙන් කී ය:

ගං තෙර ද, විඩා සංසිඳුවන තැන ද, සභායෙහි ද, වීථියෙහි ද ජනයෝ මුළු දී මා ගැණ ද, නුඹ වහන්සේ ගැණ ද කථා කෙරෙත්. කුමන හේතු ද?

බහූ හි සද්දා පච්චූහා ඛමිතබ්බා තපස්සිනා,
න තෙන මඞ්කු හොතබ්බං න හි තෙන කිලිස්සති.

යො ච සද්දපරිත්තාසී වනෙ වාතමිගො යථා,
ලහුචිත්තොති තං ආහු නාස්ස සම්පජ්ජතෙ වතන්ති.

9. 1. 9.

වජ්ජිපුත්තසුත්තං.

229 එකං සමයං අඤ්ඤතරො වජ්ජිපුත්තකො භික්ඛු වෙසාලියං විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන වෙසාලියං[1] සබ්බරත්තිවාරො[2] හොති. අථ ඛො සො භික්ඛු වෙසාලියං තුරියතාළිත-වාදිතනිග්ඝොසසද්දං සුත්වා පරිදෙවමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි:

එකකා මයං අරඤ්ඤෙ විහරාම අපවිද්ධංව[3] වනස්මිං දාරුකං,
එතාදිසිකාය රත්තියා කො සු නාම අම්හෙහි[4] පාපියොති.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාය අජ්ඣභාසි:

එකකො[5] ත්වං අරඤ්ඤෙ විහරසි අපවිද්ධංව වනස්මිං දාරුකං,
තස්ස තෙ බහුකා පිහයන්ති නෙරයිකා විය සග්ගගාමිනන්ති.

අථ ඛො සො භික්ඛු තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

9. 1. 10.

සජ්ඣායසුත්තං.

230. එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු යං සුදං පුබ්බෙ අතිවෙලං සජ්ඣායබහුලො විහරති. සො අපරෙන සමයෙන අප්පොස්සුක්කො තුණ්හීභූතො සංකසායති[6].

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො ධම්මං අසුණන්තී යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි:

කස්මා තුවං ධම්මපදානි භික්ඛු නාධීයසි භික්ඛුහි සංවසන්තො,
සුත්වාන ධම්මං ලභතිප්පසාදං දිට්ඨෙව ධම්මෙ ලභතිප්පසංසන්ති.

අහු පුරෙ ධම්මපදෙසු ඡන්දො යාව විරාගෙන සමාගමිම්හ,
යතො විරාගෙන සමාගමිම්හ යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා[7],
අඤ්ඤාය නික්ඛෙපනමාහු සන්තොති.

1. වෙසාලියං වජ්ජිපුත්තකො - මජ්සං. 2. සබ්බරත්තිචාරො - සාළුවි 3 අපවිද්ධංව - සසා. 4 නාමම්හෙහි - මජ්සං. 5 එකකොව - සසා, මජ්සං. 6 සඞ්කසායති - සසා.
7. සුතං ව මුතං. PTS

තපස්වීහු විසින් ඉවසියයුතු වූ ප්‍රතිලෝමශබ්දයෝ බොහෝහ. ඒ තපස්වීහු විසින් නිතෙද නො වියයුතුහුයි. එයින් තො ම කිලිටි වේ.

යමෙක් වෙනෙහි වාතමෘගයකු මෙන් ශබ්දයෙන් තැති ගන්නාසුළු වේ ද, ඔහු ලුහු සිත් ඇතියෙක යි කියත්. ඔහුගේ ව්‍රතය නොසැපයේ.

9. 1. 9.

වජ්ජිපුත්තසුත්‍රය.

229. එක්කලෙක එක්තරා වජ්ජිපුත්තක මහණෙක් විසල්පුර සමීපයෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි විසල්පුරයෙහි සව්රැකෙළියෙක් වෙයි. ඉක්බිති ඒ මහණ තෙමේ විසල්පුරයෙහි තූර්‍යයෙහි හා වැයූ වෙණෙහි හා ගොස හා හඩ අසා හඬමින් ඒ වේලායෙහි මේගාථාව කී ය :

අපි වෙනෙහි පියන ලද දරකඩක් මෙන් මෙබඳු රැයෙහි එකලාවමෝ අරණෙහි වසම්හ. කවරෙක් නම් අප වරා අතිශය පාපඇතියෙක් වේ ද?

ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ ඒ මහණහට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙවි ඒ මහණහට සංවෙග දනවනු කැමැත්තේ ඒ මහණහු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට ගාථායෙන් කී ය:

තෙපි වෙනෙහි ලූ දරකඩක් මෙන් අරණෙහි එකලා ව වසව. ඒ තොපට දෙව්ලොව යන්තවුන් ට (කැමති වන්නා වූ) නිරිසතුන් මෙන් බොහෝ දෙනෙක් කැමැති වෙති.

ඉක්බිති ඒ මහණ තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට (ඔතප් බියට) පමුණුවන ලද්දේ සංවිග්න වූයේ ය.

9. 1. 10.

සජ්ඣායසුත්‍රය.

230. එක්කලෙක එක්තරා මහණෙක් කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ඒ මහණ තෙමේ පෙර අතිමාත්‍රකාලයක් හැදෑරීම් බහුල කොට ඇත්තේ වෙසෙයි. (එහෙත්) හෙ තෙමේ පසුකලෙක උත්සාහ රහිත වූයේ කල් ගෙවයි.

එකල්හි ඒ වනලැහැබෙහි අධිගෘහීත වූ ඒ දෙවි ඒ මහණහුගේ ධර්මය නො අසන්නේ ඒ මහණහු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට ගාථායෙන් කී ය.

මහණ, නුඹ වහන්සේ භික්ෂූන් සමග වෙසෙමින් කුමක් හෙයින් ධර්මපදයන් නොහදාරන්නහු ද? ධර්මය අසා පැහැදීම ලබ යි. ඉහාත්මයෙහි ම පැසැසීම ද ලබයි.

යම්තාක් ආර්‍ය්‍යමාර්ගීය හා එක් වූවමෝ ද, (ඊට) පෙර ධර්මපදයන්හි ඡන්දරාගය වී ය. යම් හෙයෙකින් ආර්‍ය්‍යමාර්ගීය හා එක් වූවමෝ ද (එහෙයින්) යම් කිසි ඇසින් දුටු රූපයෙක් හෝ කණින් ඇසූ ශබ්දයෙක් හෝ නුසිත් පහස්නා ලද ස්ප්‍රෂ්ටව්‍යයෙක් හෝ වේ ද, (ඒ සියල්ල අනිත්‍යාදි වශයෙන්) දැන දුර ලීම කළම්හ. ආර්‍ය්‍යයෝ එය කියත්.

9. 1. 11.

අයොනිසොසුත්තං.

231. එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු දිවාවිහාරගතො පාපකෙ අකුසලෙ විතක්කෙ විතක්කෙති. සෙය්‍යථීදං: කාමවිතක්කං බ්‍යාපාදවිතක්කං විහිංසාවිතක්කං.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි:

අයොනිසො මනසිකාරා සො විතක්කෙහි ඛජ්ජසි,
අයොනිසො[1] පටිනිස්සජ්ජ යොනිසො අනුවිචින්තය[2].

සත්ථාරං ධම්මමාරබ්භ[3] සඞ්ඝං සීලානි අත්තනො[4],
අධිගච්ඡසි පාමොජ්ජං පීතිසුඛමසංසයං,
තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සසීති.

අථ ඛො සො භික්ඛු තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

9. 1. 12.

මජ්ඣන්තිකසුත්තං.

232. එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. අථ ඛො තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තස්ස භික්ඛුනො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

ඨිතෙ මජ්ඣන්තිකෙ කාලෙ සන්නිසීවෙසු[5] පක්ඛිසු,
සණතෙව බ්‍රහාරඤ්ඤං[6] තං භයං පටිභාති මන්ති.

[භික්ඛු:]

ඨිතෙ මජ්ඣන්තිකෙ කාලෙ සන්නිසීවෙසු[5] පක්ඛිසු,
සණතෙව බ්‍රහාරඤ්ඤං[6] 'සා රතී පටිභාති මන්ති.

9. 1. 13.

පාකතින්ද්‍රියසුත්තං.

233. එකං සමයං සම්බහුලා භික්ඛූ කොසලෙසු විහරන්ති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ, උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තෙසං භික්ඛූනං අනුකම්පිකා අත්ථකාමා තෙ භික්ඛූ සංවෙජෙතුකාමා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ ගාථාහි අජ්ඣභාසි:

---

1. අයොනිං. - PTS. 2. අනුවිචින්තිය - මජසං. 3. ධම්මං ආරබ්භ - සීමු. සතා. 4 සීලානි- චත්තනො. - සීමු 5. සන්නිසින්නෙසු - සීමු. 6 මහාරඤ්ඤං - සී 1, 2.

9. 1. 11.

අයොනිසො සූත්‍රය.

231. එක්කලෙක එක්තරා මහණෙක් කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ඒ මහණ තෙමේ දිවා විහාරයට ගියේ ලාමක අකුසල විතර්කයන් (කාමවිතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය) විතර්කනය කෙරෙයි.

ඉක්බිති ඒ වනලැහැබෙහි අධිගෘහිත වූ ඒ මහණහට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙව් ඒ මහණහට සංවෙග දනවනු කැමැත්තේ ඒ මහණහු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට ගාථායෙන් කී ය:

නුනුවණින් මෙනෙහි කිරීමෙන් ඒ තෙපි පාපවිතර්කයන් විසින් කනු ලැබහු. නුනුවණින් මෙනෙහි කිරීම බැහැර කොට නුවණින් මෙනෙහි කරව.

ශාස්තෘන් වහන්සේ ද ධර්මය ද සඞ්ඝයා ද තමාගේ සිල් ද ඇරබ ඒකාන්තයෙන් ප්‍රමෝද්‍යයත් ප්‍රීතිය හා සුවත් ලබව. එයින් ප්‍රමෝදය බහුල කොට ඇතිව දුක් කෙළවර කරන්නහු ය.

ඉක්බිති ඒ මහණ තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට පමුණුවන ලද්දේ සංවිග්න වූයේ ය.

9. 1. 12.

මජ්ඣන්තිකසූත්‍රය.

232. එක්කලෙක එක්තරා මහණෙක් කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල්හි ඒ වනලැහැබෙහි අධිගෘහිත වූ ඒ දෙව් ඒ මහණ වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහුගේ සමීපයෙහි මේ ගාථාව කී ය:

සිටිමද්දහනෙහි පක්ෂීන් ඉසඹු ලනකල්හි මහවනය. (මහත්සේ) හඬ නගන්නාක් මෙනි. එය මට බියක් ව වැටහේ.

[භික්ෂු:]

සිටිමද්දහනෙහි පක්ෂීන් ඉසඹු ලනකල්හි මහවනය මහත් සේ හඬ නගන්නාක් මෙනි. එය මට සිත් පිණවන්නක් ව වැටහේ.

9. 1. 13.

පාකතින්ද්‍රියසූත්‍රය.

233. එක්කලෙක උඩඟු වූ නැඟූ මානනල ඇති චපල වූ රළු වචන ඇති දොඩමලු වූ මුළා සිහි ඇති මනා නුවණ නැති නො එකඟ සිත් ඇති නො සන්සුන් සිත් ඇති පියවි ඉඳුරන් ඇති බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙත්.

එකල ඒ වනලැහැබ අරක් ගත් ඒ භික්ෂූන්ට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙව් ඒ භික්ෂූන්ට සංවේග දනවනු කැමැත්තේ ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන්ට ගාථායෙන් කී ය:

සුඛජීවිනො පුරෙ ආසුං භික්ඛූ ගොතමසාවකා,
අනිච්ඡා පිණ්ඩමෙසනා අනිච්ඡා සයනාසනං,
ලොකෙ අනිච්චතං ඤත්වා දුක්ඛස්සන්තං අකංසු තෙ.

දුප්පොසං කත්වා අත්තානං ගාමෙ ගාමණිකා විය,
භුත්වා භුත්වා නිපජ්ජන්ති පරාගාරෙසු මුච්ඡිතා.

සඞ්ඝස්ස අඤ්ජලිං කත්වා ඉධෙකච්චෙ වදාමහං,
අප්පවිද්ධා[1] අනාථා තෙ යථා පෙතා තථෙව තෙ.

යෙ ඛො පමත්තා විහරන්ති තෙ මෙ සන්ධාය භාසිතං,
යෙ අප්පමත්තා විහරන්ති නමො තෙසං කරොමහන්ති.

අථ ඛො තෙ භික්ඛූ තාය දෙවතාය සංවෙජිතා සංවෙගමාපාදුන්ති.

9. 1. 14.

පදුමපුප්ඵසුත්තං.

234. එවං මෙ සුතං: එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො පොක්ඛරණිං ඔගාහෙත්වා පදුමං උපසිඞ්ඝති.

අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාය අජ්ඣභාසි:

යමෙතං වාරිජං පුප්ඵං අදින්නං උපසිඞ්ඝසි,
එකඞ්ගමෙතං ථෙය්‍යානං ගන්ධත්ථෙනො'සි මාරිසාති.

[භික්ඛු:]

න හරාමි න භඤ්ජාමි ආරා සිඞ්ඝාමි වාරිජං,
අථ කෙන නු වණ්ණෙන ගන්ධත්ථෙනො'ති වුච්චති.

[දෙවතා:]

ය්වායං භිසානි[2] ඛණති පුණ්ඩරීකානි භඤ්ජති,[3]
එවං ආකිණ්ණකම්මන්තො කස්මා එසො න වුච්චතීති.

ආකිණ්ණලුද්දො පුරිසො ධාතිචෙලං'ව මක්ඛිතො,
තස්මිං මෙ වචනං නත්ථි තඤ්ච අරහාමි[4] වත්තවෙ.

අනඞ්ගණස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො,
වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තං'ව[5] ඛායතීති.

1. අපවිද්ධා. - සයා. 2. සිංඝානි - සයා. 3. ලුඤ්ජති - PTS. 4 තඤ්චාරහාමි - මජසං. 5. වා - PTS.

පෙර ආශා රහිත ව පිඩු සොයන ආශා රහිත ව සෙනසුන් සොයන ගොයුම්සවු වූ මහණහු සුවදිවි ඇති වූහ. ඔහු ලොව අනිස් බැව් දැන දුක් කෙළවර කළහ.

මම සඞ්ඝයාට ඇඳිලි බැඳ කියමි. මෙහි ඇතැම්හු ගම්හි නිඳිත ගම් දෙටුවන් මෙන් තමන් දූකයේ පෝෂණය කළ හැක්කවුන් කොට අන්ගෙවල පුතපුතා බුදිමින් මුසපත් ව හොවිත්. ඝස්තෙන් බැහැර වූ ඔහු අසරණයෝ ය. සොහොනෙහි දමන ලද මළසිරුරු බඳු වෙත්.

යම් කෙනෙක් ප්‍රමත්ත ව වෙසෙත් නම් මා විසින් ඔවුන් සඳහා කියන ලදී. යම් කෙනෙක් අප්‍රමත්ත ව වෙසෙත් නම් මම ඔවුන්ට නමස්කාර කරමි.

ඉක්බිති ඒ භික්ෂූහු ඒ දේවතාවා විසින් සංවේගයට පමුණුවන ලද්දාහු සංවේගයට පැමිණියහ.

9. 1. 14.

පදුමපුප්ඵ සූත්‍රය.

234. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක එක්තරා මහණෙක් **කොසොල් දනව්වෙහි** එක්තරා වනලැහැබෙක වැඩ වෙසෙයි. එකල්හි ඒ මහණ පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනේ පොකුණට බැස පියුමක් සිඹී.

ඉක්බිති ඒ වනලැහැබ අරක්ගත් ඒ මහණහට අනුකම්පා කරණ වැඩ කැමැති ඒ දෙව් ඒ මහණහට සංවේග දනවනු කැමැත්තේ ඒ මහණහු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට ගාථායෙන් කී ය.

නො දෙන ලද යම් ඒ පියුමක් සිඹිහි ද, මෙය සොරකම් අතුරෙන් එක් කොටසෙකි. නිදුකාතන් වහන්ස, (එහෙයින්) ගන්‍ධත්‍ථෙන (සුවඳ සොරෙක්) වෙහි ය.

[භික්ෂු:]

මේ පියුම ගෙණ නො යෙමි. නො කඩමි. දුර සිට සිඹිමි. එසේ ඇති කල කිනම් කරුණෙකින් ගන්‍ධත්‍ථෙන යයි කියනු ලැබේ ද,

[දෙව්:]

යම් ඒ තවුසෙක් නෙලුම්බල කණී ද, පියුම් නෙළා ද, මෙසේ අපිරිසිදු කර්මාන්ත ඇති මේ තවුස් කුමක් හෙයින් ගන්‍ධත්‍ථෙන යයි නො කියනු ලැබේ ද.

ඒ පුරුෂ තෙමේ බොහෝ පව් ඇත්තෙකි. කිරි මව හැඳිවන උච්චාරපස්සාවා(මලමූත්‍රා) දියෙන් ගැවසී ගත්තාක් මෙන් (රාගදෙෂාදියෙන්) වැකුණෙකි. ඔහු කෙරෙහි මාගේ බසෙක් නැත. ඔබට නම් කියන්නට නිසි වෙමි.

කෙලෙස් නැති නිතර පවිත්‍ර වූ ශීලසමාධි ආදී ගුණයන් සොයන්නා වූ පුද්ගලයාට පාපය පිළිබඳ වලග පමණ වූ (ඉතා මඳ) දෙෂය පවා වලා පටලයක් පමණ වූවක් මෙන් වැටහේ.

[භික්ඛු:]

අද්ධා මං යක්ඛ ජානාසි අථො මං[1] අනුකම්පසි,
පුනපි යක්ඛ වජ්ජාසි යදා පස්සසි එදිසන්ති.[2]

[දෙවතා:]

නෙව තං උපජීවාම[3] න පි තෙ භතකාම්හසෙ[4],
ත්වමෙව භික්ඛු ජානෙය්‍ය යෙන ගච්ඡෙය්‍ය සුග්ගතින්ති.

අථ ඛො සො භික්ඛු තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

වනවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

විවෙකං[5] උපට්ඨානඤ්ච කස්සපගොත්තෙන[6] සම්බහුලා
ආනන්දො අනුරුද්ධඤ්ච නාගදත්තඤ්ච කුලඝරණී

වජ්ජිපුත්තො ච[7] වෙසාලී සජ්ඣායෙන[8] අයොනිසො
මජ්ඣන්තිකාලම්හි පාකතින්ද්‍රියා පදුමපුප්ඵෙන චුද්දස භවෙති.

වනසංයුත්තං සමත්තං.

---

10. යක්ඛසංයුත්තං

1. ඉන්දකවග්ගො

10. 1 1

ඉන්දකසුත්තං.

235. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ඉන්දකූටෙ** පබ්බතෙ **ඉන්දකස්ස** යක්ඛස්ස භවනෙ. අථ ඛො ඉන්දකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

රූපං න ජීවන්ති වදන්ති බුද්ධා කථං න්වයං වින්දති'මං සරීරං,
කුතස්ස අට්ඨී යකපිණ්ඩමෙති කථං න්වයං සජ්ජති ගබ්භරස්මින්ති.

[භගවා:]

පඨමං කලලං හොති කලලා හොති අබ්බුදං,
අබ්බුදා ජායතෙ පෙසී පෙසී නිබ්බත්තතී ඝනො,
ඝනා පසාඛා ජායන්ති කෙසා ලොමා නඛා'පි ච.

යඤ්චස්ස භුඤ්ජතෙ[9] මාතා අන්නං පානඤ්ච භොජනං,
තෙන සො තත්ථ යාපෙති මාතුකුච්ඡිගතො නරොති.

---

1. මෙ - මජ්සං. 2 එදිසං - සීමු. PTS 3. උපජීවාමි - සීමු. PTS. 4. භතකාම්හසෙ - සීමු - භදඤ්ඤාම්හසෙ - ස්‍යා, ඝතකාම්හසෙ - PTS 5. විවෙකඋපට්ඨානඤ්ච - PTS, ස්‍යා. 6. ගොත්තො ච - PTS 7. ච ඉති නත්ථි, PTS. 8. සජ්ඣායෙන ච - PTS. 9. භුඤ්ජති - මජ්සං, ස්‍යා.

[භික්ෂු:]

යක්ෂය, මා ඒකාන්තයෙන් පිරිසිදු ය යි දන්නෙහි ය. මට අනුකම්පා කෙරෙහි. යම් කලෙක මෙබන්දක් දක්නෙහි නම් යක්ෂය, නැවතත් කියන්නෙහි ය.

[දෙවි:]

මහණ, තොප නිසා නො ම ජීවත් වම්හ. තොපගේ බැළයමෝ නො ද වම්හ. යම් කර්මයෙකින් සුගතියට යන්නේ ද, (එය) තො ම දන්නෙහි ය.

ඉක්බිති ඒ මහණ තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට පමුණුවන ලද්දේ සංවේගයට පැමිණියේ ය.

වනවර්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

විවේක, උපට්ඨාන, කස්සපගොත්ත, සම්බහුලා, ආනන්ද, අනුරුද්ධ, නාගදත්ත, කුලඝරණී, වජ්ජිපුත්ත, සජ්ඣාය, අයොනිසො, මජ්ඣන්තික, පාකතින්ද්‍රිය, පදුමපුප්ඵ යන සූත්‍ර තුදුසෙකි.

වනසංයුත්තය නිමියේ ය.

---

10. යක්ඛසංයුත්තය

1. ඉන්දක වර්ගය

10. 1. 1.

ඉන්දකසූත්‍රය.

235. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර සමීපයෙහි ඉන්දකූට පර්වතයෙහි ඉන්දක** යක්ෂයාගේ භවනයෙහි වැඩ වසන සේක. එකල ඉන්දක යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

බුදුවරයෝ රූපය ජීවය යි නොකියත්. (එසේ නම්) මේ සත්ත්ව තෙමේ මේ සිරුර කෙසේ නම් ලබා ද? මොහුගේ ඇට හා අක්මාපිඩ කොයින් ඒ ද? මේ තෙමේ කෙසේ නම් මවුකුස ලැගේ ද?

[භගවත්හු:]

පළමු කොට කලලරූපය වේ. කලලයෙන් අබ්බුදය වේ. අබ්බුදයෙන් පේසිය හට ගණී. පේසියෙන් ඝන නම් මස්පිඩෙක් හට ගණී. ඒ ඝනයෙන් පිළක පසෙක් හට ගණී. ඉන් පසු කෙස් ද ලොම් ද නිය ද හට ගණිත්.

ඔහුගේ මව යම් අහරකුත්, බොන දියකුත්, බොජුනකුත් වළඳා ද, මවුකුසට පැමිණි ඒ සත්ත්ව තෙමේ ඒ ආහාර පානාදියෙන් එහි දී යැපේ.

10. 1. 2.

සක්කසුත්තං.

236. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. අථ ඛො **සක්ක**නාමකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

සබ්බගන්ථ*ප්පහීනස්ස විප්පමුත්තස්ස තෙ සතො
සමණස්ස න තං සාධු යදඤ්ඤමනුසාසතීති.

[භගවා:]

යෙන කෙනචි වණ්ණෙන සංවාසො සක්ක ජායති,
න තං අරහති සප්පඤ්ඤො මනසා අනුකම්පිතුං.

මනසා චෙ පසන්නෙන යදඤ්ඤමනුසාසති,
න තෙන හොති සංයුත්තො සානුකම්පා[1] අනුද්දයාති.

10. 1. 3.

සූචිලොම සුත්තං.

237. එකං සමයං භගවා **ගයායං** විහරති **ටඞ්කිතමඤ්චෙ සූචිලොමස්ස**[2] **යක්ඛස්ස** භවනෙ. තෙන ඛො පන සමයෙන ඛරො ච යක්ඛො **සූචිලොමො** ච යක්ඛො භගවතො අවිදූරෙ අතික්කමන්ති.

අථ ඛො ඛරො යක්ඛො සූචිලොමං යක්ඛං එතදවොච: එසො සමණොති.

නෙසො සමණො, සමණකො එසො. යාව ජානාමි යදි වා සො සමණො යදි වා පන සො සමණකොති. අථ ඛො සූචිලොමො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො කායං උපනාමෙසි.

අථ ඛො භගවා කායං අපනාමෙසි.

අථ ඛො සූචිලොමො යක්ඛො භගවන්තං එතදවොච: භායසි මං සමණාති.

[භගවා:]

න ඛ්වාහන්තං ආවුසො භායාමි. අපි ච තෙ සම්ඵස්සො පාපකොති.

[සූචිලොමො:]

පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි. සචෙ මෙ සමණ[3] න බ්‍යාකරිස්සසි චිත්තං වා තෙ ඛිපිස්සාමි. හදයං වා තෙ ඵාලෙස්සාමි. පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමීති.

[භගවා:]

න ඛ්වාහන්තං ආවුසො පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය, හදයං වා ඵාලෙය්‍ය. පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය. අපි ච ත්වං ආවුසො පුච්ඡ යදාකඞ්ඛසීති.

1. සානුකම්පා-මජසං. සයා. 2 සූචිලොමස්ස - PTS. 3. සමණ ඉති නත්ථි-මජසං. PTS
* ගන්ථ - සී 1, 2

10. 1. 2.

සක්කසුත්‍රය.

236. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **ගිජ්ඣකූටපර්වතයෙහි** වැඩ වසන සේක. එකල **සක්ක** නම් යක්ෂයෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

අනුන්ට අනුශාසනා කෙරෙයි යන යමෙක් වේ ද, සියලු තන්හි ප්‍රහීණ වූ කෙලෙස්ගැට ඇති වෙසෙසින් මිදුනු ශ්‍රමණ වූ ම තොපට එය නො මැනවි.

[භගවත්හු:]

එම්බා සක්ක, යම්කිසි කාරණයෙකින් සංවාසය හෙවත් මිත්‍රධර්මය හට ගණී ද, සුප්‍රාඥ තෙමේ එයට සිතින් අනුකම්පා කරන්නට නොතිසි සි.

එහෙත් පහන් සිතින් අනුන්ට අනුශාසනා කෙරෙයි යන යමෙක් වේ ද, එයින් බැඳීමෙක් නො වේ. එය අනුකම්පාව යි. කරුණාව යි.

10. 1. 3.

සූචිලොම සූත්‍රය.

237. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **ගයාවට තුදුරෙහි සූචිලොම යක්ෂයාගේ භවනයෙහි ටංකිතමඤ්චයෙහි** වැඩ වසන සේක. එකල්හි **ඛර**-**යක්ෂ** තෙමේ ද, **සූචිලොම යක්ෂ** තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ තුදුරෙහි ගමන් කෙරෙත්.

ඉක්බිති ඛරලොම යක්ෂ තෙමේ "මේ ශ්‍රමණයෙකැ"යි සූචිලොම යක්ෂයාට මෙය කී ය.

මේ ශ්‍රමණයෙක් නො වේ. මේ ශ්‍රමණකයෙකි, හෙ ශ්‍රමණයෙක් දෝ නොහොත් ශ්‍රමණකයෙක් දෝ යි දැන ගණිමි. ඉක්බිති සූචිලොම යක්ෂ-තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට කය එළවීය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ කය (මදක්) ඉවත් කළ සේක.

ඉක්බිති සූචිලොම යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. මහණ, මා කෙරෙන් බියවෙහි ද?

[භගවත්හු:]

ඇවැත්නි, මම් තා කෙරෙන් නො බිමි. එහෙත් තගේ පහස ලාමකය.

[සූචිලොම:]

මහණ, තා ප්‍රශ්නයක් විචාරන්නෙමි. මහණ, ඉදින් මට නොවිස-ඳන්නෙහි නම් තාගේ සිත හෝ වික්ෂෙප කරන්නෙමි. තාගේ හෘදය හෝ පලන්නෙමි. දෙපා ගෙණ හෝ ගඟ පරතෙර දමන්නෙමි යි.

[භගවත්හු:]

ඇවැත්නි, යමෙක් මාගේ සිත හෝ වික්ෂෙප කරන්නේ ද, හෘදය හෝ පලන්නේ ද, දෙපා ගෙණ හෝ ගඟපරතෙර දමන්නේ ද, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොව්හි මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි එබන්දකු මම නොම දකිමි. ඇවැත්නි එහෙත් තෝ යමක් කැමැත්තෙහි නම් අස.

"අථ ඛො සූචිලොමො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි:"[1]

රාගො ච දොසො ච කුතො නිදානා අරතී රතී ලොමහංසො කුතොජා,
කුතො සමුට්ඨාය මනොවිතක්කා කුමාරකා ධඞ්කමිවොස්සජන්තීති.

[භගවා:]

රාගො ච දොසො ච ඉතො නිදානා අරතී රතී ලොමහංසො ඉතොජා,
ඉතො සමුට්ඨාය මනොවිතක්කා කුමාරකා ධඞ්කමිවොස්සජන්ති.

සෙනහජා අත්තසම්භූතා නිග්‍රොධස්සෙව ඛන්ධජා,
පුථූ විසත්තා කාමෙසු මාලුවා'ව[2] විතතා[3] වනෙ.

යෙ නං පජානන්ති යතො නිදානං තෙ නං විනොදෙන්ති සුණොහි යක්ඛ,
තෙ දුත්තරං ඕඝමිමං තරන්ති අතිණ්ණපුබ්බං අපුනබ්භවායාති.

10. 1. 4.

මණිභද්දසුත්තං.

238. එකං සමයං භගවා **මගධෙසු** විහරති **මණිමාලකෙ**[4] චෙතියෙ **මණිභද්දස්ස** යක්ඛස්ස භවනෙ. අථ ඛො **මණිභද්දො** යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

සතීමතො සදා භද්දං සතිමා සුඛමෙධති,
සතීමතො සුවෙ සෙය්‍යො වෙරා ච පරිමුච්චතීති.

[භගවා:]

සතීමතො සදා භද්දං සතිමා සුඛමෙධති,
සතීමතො සුවෙ සෙය්‍යො වෙරා න පරිමුච්චති.

යස්ස සබ්බමහොරත්තං අහිංසාය රතො මනො,
මෙත්තං සො සබ්බභූතෙසු වෙරං තස්ස න කෙනචීති.

10. 1. 5.

සානුසුත්තං.

239. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරිස්සා උපාසිකාය **සානු**[5] නාම පුත්තො යක්ඛෙන ගහිතො හොති. අථ ඛො සා උපාසිකා පරිදෙවමානා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

චාතුද්දසිං පඤ්චදසිං යා ච[6] පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං[7],
උපොසථං උපවසන්ති බ්‍රහ්මචරියං චරන්ති යෙ.

1. " " අන්තරිතපාඨො න දිස්සතෙ - මජසං, සයා PTS. 2. ච ඉති නත්ථි - සයා. 3. විතථා - සයා 4. මණිමාලිකෙ - මජසං. 5 සානු - සීමු. 1. 6. යාව - සීමු. 1. 7.. අට්ඨඞ්ගසුසමාහිතං - PTS, සී2.

ඉක්බිති **සූචිලෝම** යක්ෂ තෙමේ ගාථායෙන් කී ය:

රාගයත් ද්වේෂයත් කුමක් මූලහේතු කොට ඇත්ද? (කුසල් ධර්මයෙහි) නො ඇල්මත් (පස්කමෙහි) ඇල්මත් ලොමුදහ ගැණුමත් කුමකින් හට ගත්තෝ ද? ගම් දරුවන් (අල්ලා ගත්) කවුඩකු (බැහැර කරන්නාක්) මෙන් විතර්කයෝ කොතැනින් ඉපිද කුසල් සිත බැහැර කෙරෙත් ද,

[භගවත්හු:]

රාගයත් ද්වේෂයත් මේ අත්බව මූලහෙතු කොට ඇත. අරතියත් රතියත් ලොමුදහ ගැණුමත් මෙයින් ම හට ගත්තේය. විතර්කයෝ මෙයින් හට ගෙණ ගම් දරුවන් කවුඩකු (බැහැර කරන්නාක්) මෙන් කුසල් සිත බැහැර කෙරෙත්.

අත්බැවින් හට ගත් විතර්කයෝ තෘෂ්ණායෙන් හට ගත්තෝ ය. නුගරුක්හි අරළු මෙනි. බොහෝ වූ විතර්කයෝ කාමවස්තූන්හි වෙසෙසින් ඇලුනාහු ය. වෙනෙහි ගැවසී ගත් මාලුවා වැලක් මෙනි.

යක්ෂය, අසව යම් කෙනෙක් ඒ අත්බවත් ඊට යමක් මූලහේතු වේ නම් එයත් දනිද්ද, ඔහු එය දුරු කෙරෙත්. ඔහු තරණය කිරීමට දුෂ්කර වූ තරණය නො කළ්විරූ මේ චතුරෝඝය නැවත නූපදීම සඳහා තරණය කෙරෙත්.

10. 1. 4.

මණිභද්‍රසූත්‍රය.

238 එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **මගධ** දනව්වෙහි **මණිමාළක** චෛත්‍යයෙහි **මණිභද්‍ද** යකුගේ භවනයෙහි වැඩ වසන සේක. එකල **මණිභද්‍දයක්ෂ** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගය කී ය:

සිහි ඇත්තාහට හැමකල්හි යහපත වේ. සිහි ඇත්තේ සුවය වඩයි. සිහි ඇත්තහුගේ (ස්වභාවය) හැමකල්හි ශ්‍රේෂ්ඨ ය. වෛරයෙන් ද මිදෙයි.

[භගවත්හු:]

සිහි ඇත්තාහට හැමකල්හි යහපත වේ. සිහි ඇත්තේ සුවය වඩයි: සිහි ඇත්තාගේ (ස්වභාවය) හැමකල්හි ශ්‍රේෂ්ඨ ය. (එහෙත් එපමණකින්) වෛරයෙන් නො මිදේ.

යමකුගේ සිත මුළු රෑදෙවෙහි අහිංසාවෙහි ඇලුනේ ද, හෙ තෙමේ සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය වඩයි. ඔහට කිසිවකු හා වෛරයෙක් නැත.

10. 1. 5.

සානුසූත්‍රය.

239. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඩුසිටුහුගේ** අරමෙහි වැඩ වසන සේක. එකල්හි එක්තරා උවැසියකගේ **සානු** නම් පුතෙක් යකකු විසින් ගන්නා ලද්දේ වෙයි. ඉක්බිති ඒ උවැසිය හඬන්නී ඒ වේලායෙහි මේ ගාථා කිවුය:

තුදුස්වක්හි ද පසළොස්වක්හි ද අඩමසක් පිළිබඳ වූ යම් අටවකෙකුදු වේ නම් එවක්හි ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද යම් කෙනෙක් අෂ්ටාඞ්ගයෙන් සමන්‍වාගත වූ පෙහෙවස් වෙසෙද්ද, බඹසර හැසිරෙද්ද,

න තෙහි යක්ඛා කීළන්ති ඉති මෙ අරහතං සුතං,
සාදානි අජ්ජ පස්සාමි යක්ඛා කීළන්ති සානුනාති.

[යක්ඛො:]

චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,
උපොසථං උපවසන්ති බ්‍රහ්මචරියං චරන්ති යෙ.

න තෙහි යක්ඛා කීළන්ති සාහු තෙ අරහතං සුතං,
සානුං පබුද්ධං වජ්ජාසි යක්ඛානං වචනං ඉදං:

“මාකාසි පාපකං කම්මං ආවි[1] වා යදි වා රහො,
සචෙ ච[2] පාපකං කම්මං කරිස්සසි කරොසි වා,
න තෙ දුක්ඛා පමුත්‍යත්ථි උප්පච්චාපි පලායතො”ති.

[සානු:]

මතං වා අම්ම රොදන්ති යො වා ජීවං න දිස්සති,
ජීවන්තං අම්ම පස්සන්තී කස්මා මං අම්ම රොදසීති?.

[උපාසිකා:]

මතං වා පුත්ත[3] රොදන්ති[4] යො වා[5] ජීවං න දිස්සති,
යො ච කාමෙ චජිත්වාන[6] පුනරාගච්ඡතෙ ඉධ,
තං වාපි පුත්ත රොදන්ති පුන ජීවං මතො හි සො.

කුක්කුළා[7] උබ්භතො තාත කුක්කුළං[8] පතිතුමිච්ඡසි,
නරකා උබ්භතො තාත නරකං පතිතුමිච්ඡසි.

අභිධාවථ භද්දං තෙ කස්ස උජ්ඣාපයාමසෙ,
ආදිත්තා නීහටං[9] භණ්ඩං පුන ඩය්හිතුමිච්ඡසීති.

10. 1. 6.

පියඞ්කරසුත්තං.

240. එකං සමයං ආයස්මා **අනුරුද්ධො සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා අනුරුද්ධො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය ධම්මපදානි භාසති. අථ ඛො **පියඞ්කරමාතා** යක්ඛිනී පුත්තකං එවං තොසෙසි:

මා සද්දං කරි **පියඞ්කර** භික්ඛු ධම්මපදානි භාසති,
අපි ච ධම්මපදං විජානිය පටිපජ්ජෙම හිතාය නො සියා.

පාණෙසු ච සංයමාමසෙ සම්පජානමුසා න භණාමසෙ,
සික්ඛෙම සුසීලමත්තනො[10] අපි මුච්චෙම පිසාචයොනියාති.

10. 1. 7.

පුනබ්බසුසුත්තං.

241. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

1. ආවිං - PTS. 2. සචෙ ච - මජසං, සචෙ ච - සනා, PTS. 3. පුත්තං - PTS
4 රොදන්තී - මජසං. සනා PTS. 5 සොච. සිමු. සොවා - PTS. 6. චජිත්වාන - PTS.
7. කුකාකුළො - සිමු. 8. කුකුකුලා - සිමු. 9. නීහතං - මජසං. නිබ්භතං - සනා. PTS.
10. සුසීලවත්තනො - මජසං. සනා. PTS.

යක්ෂයෝ ඔවුන් හා නො කෙළිති යන රහතුන්ගේ බස මා විසින් අසන ලදී. ඒ මම දූන් දකිමි. සානු සමග යක්ෂයෝ කෙළිත්.

[යක්ෂයා:]

තුදුස්වක්හි ද පසළොස්වක්හි ද අඩමසක් පිළිබඳ යම් අටවකෙක් වේ නම් එදින ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද, යම් කෙනෙක් අෂ්ටාඞ්ගයෙන් සමන්‍වාගත වූ පෙහෙවස් වෙසෙද්ද බඹසර හැසිරෙද්ද,

ඔවුන් හා යක්ෂයෝ නො කෙළිති යන රහතුන්ගේ වදන ති විසින් අසන ලදී. මෑනවි.

"හමුවෙහි හෝ ඉදින් රහසෙහි හෝ පව්කම් නො කරව. යම් පව්කමක් කරන්නෙහි ද, (යම් පව් කම්කුත්) කෙරෙහි ද, අහසට පැන නැගී පලායන්නා වූ ද, තට ඒ දුකින් මිදීමෙක් නැත". මේ යකුන්ගේ වදනැයි පිබිදියා වූ සානුහට කියව.

[සානු:]

මෑනියනි, (මිනිස්සු) මළ එකකු නිසා හෝ හඬති. මෑනියනි, යමෙක් ජීවත්වන්නේ නො පැණේ නම් (ඔහු නිසා ද හඬති.) මෑනියනි, ජීවත් වන්නා වූ මා දකිමින් කුමක් හෙයින් හඬව?

[උවැසි:]

පුත, මළ එකකු නිසා හෝ (මිනිස්සු) හඬති. යමෙක් ජීවත් වන්නේ (නමුත්) නො පෙණේ නම් (ඔහු නිසා ද හඬති) පුත, යමෙක් කාමයන් දුරු කොට (පැවිදි ව) නැවත මෙහි පැමිණේ නම් ඔහු නිසා ද හඬති. හෙ තෙමේ ජීවත් වන්නේ නමුත් මළේ ම ය.

පුත, හුණුඅළුනිරයෙන් ගොඩනගන ලද්දේ (නැවතත්) හුණුඅළු නිරයට වැටෙන්නට කැමැත්තෙහි ද? පුත, නිරයෙන් ගොඩ නගන ලද්දේ (නැවතත්) නිරයට වැටෙන්නට කැමැත්තෙහි ද?

යන්නේ මැනව. තොපට වැඩෙක් වේවා. කහට දෙස් නගවමො ද? දැවෙන ගෙයින් නෙරපූ බඩු නැවත දවන්නට කැමැත්තෙහි ද?

10. 1 6.

පියඞ්කර සූත්‍රය.

240. එක්කලෙක ආයුෂ්මත් **අනුරුද්ධ** තෙරණුවෝ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එකල ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ රෑ අලුයම් වේලෙහි නැගිට දහම්පද බෙණෙති. ඉක්බිති **පියඞ්කරමව** වූ යකින්න කුඩාපුතු මෙසේ නැළවූවා ය.

පියඞ්කර, ශබ්ද නොකර, මහණ තෙමේ දහම්පද බෙණෙයි. ඉදින් දහම්පදයක් දැන පිළිපදිමු නම් (එය) අපට හිත පිණිස වන්නේ ය.

ප්‍රාණීන් කෙරෙහි සංයත වමු. දැන දැන මුසාබස් නො බෙණෙමු. තමන්ගේ පවිත්‍ර ශීලයෙහි හික්මෙමු. (එසේ කල්හි) යෙහෙක, පිසාචයෝනියෙන් මිදෙන්නමෝ වමු.

10 1 7.

පුනබ්බසු සූත්‍රය.

241. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක.

තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ **නිබ්බාණපටිසංයුත්තාය** ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිකත්වා[1] මනසි කත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

අථ ඛො **පුනබ්බසුමාතා** යක්ඛිනී පුත්තකෙ එවං තොසෙසි:

තුණ්හී උත්තරිකෙ හොහි තුණ්හී හොහි පුනබ්බසු,
යාවාහං බුද්ධසෙට්ඨස්ස ධම්මං සොස්සාමි සත්ථුනො.

නිබ්බාණං භගවා ආහ සබ්බගන්ථප්පමොචනං,
අතිවෙලා ච මෙ හොති අස්මිං ධම්මෙ පියායනා.

පියො ලොකෙ සකො පුත්තො පියො ලොකෙ සකො පති,
තතො පියතරා[2] මය්හං අස්ස ධම්මස්ස මග්ගනා.

න හි පුත්තො පති වාපි පියො දුක්ඛා පමොචයෙ,
යථා සද්ධම්මසවණං[3] දුක්ඛා මොචෙති පාණිනං.

ලොකෙ දුක්ඛපරෙතස්මිං ජරාමරණසංයුතෙ[4],
ජරාමරණමොක්ඛාය යං ධම්මං අභිසම්බුද්ධං[5],
තං ධම්මං සොතුමිච්ඡාමි තුණ්හී හොහි පුනබ්බසූති.

[පුනබ්බසු:]
අම්ම[6] න බ්‍යාහරිස්සාමි තුණ්හීභූතායමුත්තරා,
ධම්මමෙව නිසාමෙහි සද්ධම්මසවණං[2] සුඛං.

සද්ධම්මස්ස අනඤ්ඤාය අම්ම දුක්ඛං චරාමසෙ,
එස දෙවමනුස්සානං සම්මූළ්හානං පභඞ්කරො,
බුද්ධො අන්තිමසාරීරො ධම්මං දෙසෙති චක්ඛුමාති.

[පුනබ්බසුමාතා:]
සාධු ඛො පණ්ඩිතො නාම පුත්තො ජාතො උරෙසයො,
පුත්තො මෙ බුද්ධසෙට්ඨස්ස ධම්මං සුද්ධං පියායති.

පුනබ්බසු සුඛී හොහි අජ්ජාහමහි සමුග්ගතා,
දිට්ඨානි අරියසච්චානි උත්තරා පි සුණාතු මෙති.

10. 1. 8.

සුදත්තසුත්තං.

242. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **සීතවනෙ.** තෙන ඛො පන සමයෙන **අනාථපිණ්ඩිකො** ගහපති රාජගහං අනුප්පත්තො හොති. කෙනචිදෙව කරණීයෙන. අස්සොසි ඛො අනාථපිණ්ඩිකො ගහපති බුද්ධො කිර ලොකෙ උප්පන්නොති. තාවදෙව ච[7] පන භගවන්තං දස්සනාය උපසඞ්කමිතුකාමො අහොසි[8].

1. අට්ඨිං කත්වා - මජ්සං. 2. පියතරං, සීමු, සයා. 3. සද්ධම්මස්සවණං - මජ්සං, සයා, සීමු. 4. ජරාමරණසංයුත්තෙ - සීමු, PTS. 5. අභිසම්බුද්ධං - මජ්සං - සයා. 6. අම්මා - මජ්සං, 7. ච ඉති නත්ථි - PTS. 8. අහොති - මජ්සං.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ නිවණ පිළිබඳ දැහැමි කථාවෙන් භික්ෂූන්ට (කරුණු) දක්වා වදාරණ සේක. (කරුණු) ගන්වන සේක. තෙද ගන්වන සේක. සතුටු කරවන සේක. ඒ භික්ෂූහු ද අර්ථවත් කොට මෙනෙහි කොට මුළුසිතින් මොනොවට ගෙණ යොමු කළ කන් ඇති ව දහම් අසත්.

ඉක්බිති පුනබ්බසුමවු යැකිනි කුඩාපුතුන් මෙසේ නැළවූ:

බුද්ධශ්‍රේෂ්ඨ වූ ශාස්තෘන් වහන්සේගේ ධර්මය මම යම්තාක් අසන්නෙම් ද, උත්තරිකාවෙනි, ඒතාක් නිශ්ශබ්ද වව. පුනබ්බසුව, නිශ්ශබ්ද වව.

භාග්‍යවතුන් වහන්සේ හැම ගැටෙන් මිදීම නම් වූ නිවණ වදාරණ සේක. මේ දහම්හි මාගේ පැතීම ප්‍රමාණාතික්‍රාන්ත වෙයි.

ලොව්හි සියපුත් තෙමේ ප්‍රිය වෙයි. ලොව්හි සිය හිමි තෙමේ ද ප්‍රිය වෙයි. මේ දහම සෙවීම එයටත් වඩා මට ඉතා ප්‍රිය වෙයි.

සදහම් ඇසීම යම් සේ සත්ත්වයා දුකින් මුදා ද, ප්‍රියපුත්‍රයා ද ප්‍රියහිමියා ද (එසේ) දුකින් නො ම මුදයි.

දුකින් පීඩිත වූ ජරාමරණයෙන් යුක්ත වූ ලොව්හි ජරාමරණයෙන් මිදීම පිණිස යම් ධර්මයක් අවබෝධ කරණ ලද්දේ ද, ඒ ධර්මය අසන්නට කැමැත්තෙමි. එම්බා පුනබ්බසු, නිශ්ශබ්ද වව.

[පුනබ්බසු:]

මෑනියෙනි, (මම) නිහඬ වෙමි. මේ උත්තරාව ද නිහඬ ය. දහම ම අසනු මැනවි. සදහම් ඇසීම සුව ය.

මෑනියෙනි, සදහම නො දැන්මෙන් දුකසේ හැසිරෙමු. ප්‍රභාකර වූ පසැස් ඇති පැසුලු අත්බැව් දරණ මේ බුදුරජාණන් වහන්සේ අතිශයින් මුළා වූ දෙව්මිනිසුන්ට දහම් දෙසන සේක.

[පුනබ්බසුමවු:]

උපන්නා වූ උරහොවින පුත් තෙමේ පණ්ඩිත වූයේ ම මැනවි. මාගේ පුත් තෙමේ ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේගේ පිරිසිදු දහම පතයි.

එම්බා පුනබ්බසු, සුවපත් වව. මම අද (සසරින්) ගොඩ නැගුනෙම් වෙමි. ආර්‍යසත්‍යයෝ දක්නා ලදහ. මාගේ උත්තරාව ද අසාවා.

10. 1. 8.

සුදත්ත සූත්‍රය.

242. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි වූ ශීතවනයෙහි වැඩවසන සේක. එකල්හි අනාථපිණ්ඩික ගෘහපති තෙමේ කිසියම් කටයුත්තක් සඳහා රජගහනුවරට පැමිණියේ වෙයි. අනාථපිණ්ඩික ගැහැවි තෙමේ බුදුරජාණන් වහන්සේ ලෝපහළ වූ සේකැයි ඇසී ය. භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස එකෙණෙහි ම එළඹෙනු කැමැත්තේ ද විය.

අථ ඛො[1] අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස එතදහොසි: අකාලො ඛො අජ්ජ භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං. ස්වෙදනාහං කාලෙන භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සාමීති, බුද්ධගතාය සතියා නිපජ්ජි රත්තියා සුදං තික්ඛත්තුං උට්ඨාසි පභාතන්ති මඤ්ඤමානො. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන සීවථිකද්වාරං[2] තෙනුපසඞ්කමි. අමනුස්සා ද්වාරං විවරිංසු.

අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නගරම්හා නික්ඛමන්තස්ස ආලොකො අන්තරධායි. අන්ධකාරො පාතුරහොසි. භයං ඡම්භිතත්තං ලොමහංසො උදපාදි. තතොව[3] පුන නිවත්තිතුකාමො අහොසි. අථ ඛො සීවකො[4] යක්ඛො අන්තරහිතො සද්දමනුස්සාවෙසි:

සතං හත්ථී සතං අස්සා සතං අස්සතරී[5] රථා,
සතං කඤ්ඤාසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසිං.

අභික්කම ගහපති, අභික්කම ගහපති, අභික්කන්තං තෙ සෙය්‍යො නො[6] පටික්කමනන්ති.

අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස අන්ධකාරො අන්තරධායි, ආලොකො පාතුරහොසි. යං අහොසි භයං ඡම්භිතත්තං ලොමහංසො සො පටිප්පස්සම්භි.

දුතියම්පි ඛො -පෙ-

තතියම්පි ඛො[7] අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස[8] ආලොකො අන්තරධායි, අන්ධකාරො පාතුරහොසි, භයං ඡම්භිතත්තං ලොමහංසො උදපාදි. තතොව පුන නිවත්තිතුකාමො අහොසි තතියම්පි ඛො සීවකො යක්ඛො අන්තරහිතො සද්දමනුස්සාවෙසි:

සතං හත්ථී සතං අස්සා සතං අස්සතරී රථා,
සතං කඤ්ඤාසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසිං.

අභික්කම ගහපති, අභික්කමම ගහපති, අභික්කන්තං තෙ සෙය්‍යො නො පටික්කමනන්ති.

අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස අන්ධකාරො අන්තරධායි, ආලොකො පාතුරහොසි. යං අහොසි භයං ඡම්භිතත්තං ලොමහංසො සො පටිප්පස්සම්භි. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන සීතවනං[9] තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය අබ්භොකාසෙ චඞ්කමති. අද්දසා ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන චඞ්කමා ඔරොහිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: එහි සුදත්තාති.

1. අථස්ස - මජ්ඣං, PTS. 2. සීතවනද්වාරං - සී 1, 2. 3. තතොච- ස්‍යා, PTS. 4. සිවකො. 5. අස්සසරී - PTS. 6. න - PTS. 7. ඛොති නත්ථි - PTS. 8. ගහපතිස්ස ඉති නත්ථි – PTS. 9. සීතවනං යෙන භගවා - මජ්ඣං.

ඉක්බිති අනේපිඬු ගැහැවිහට මේ අදහස විය: භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස එළඹෙන්නට අද නොකල් ය. දැන් මම හෙට කල් ඇතිව භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස එළඹෙන්නෙමියි බුදුන් කෙරෙහි ගිය සිහි ඇතිව හොත්තේ ය. අලුයම යයි හඟිමින් රෑ තුන්යලක් නැගී සිටියේ ය. එකල්හි අනාථපිණ්ඩික ගැහැවි තෙමේ සොහොන්දෙර වෙත පැමිණියේ ය. අමනුෂ්‍යයෝ දොර විවර කළහ.

ඉක්බිති අනේපිඬු ගැහැවියහු නුවරින් නික්මෙද්දී එළිය අතුරුදන් විය. අඳුර පහළ විය. බිය තැති ගැණුම් ලොමුදහ ගැණුම් පහළ විය. එයින් ම පෙරළා යනු කැමැත්තේ ද විය. එකල්හි සිවක යක්‍ෂ තෙමේ අතුරුදන් වූයේ (මතු දැක්වෙන) ශබ්දය ඇස්වී ය:

සියක්දහසක් ඇත්තු ද, සියක්දහසක් අස්හු ද, සියක්දහසක් අශ්වතරියෝ ද, සියක්දහසක් රිය ද, මිණිකොඬොල් අබරණින් සරසන ලද සියක්දහසක් කන්‍යාවෝ ද (යමකුට ලැබුනාහු ද, ඒ ලාභයෝ බුදුන් දක්නට යන්නහුගේ) එක්පියවරක සොළොස්වැනි කලාවෙන් කලාවටත් නො අගිත්.

ගැහැවියෙනි, ඉදිරියට යව. ගැහැවියෙනි, ඉදිරියට යව. තොපගේ ඉදිරියට යෑම මැනැවි. ආපසු යෑම නො මැනැවි.

ඉක්බිති අනේපිඬු ගැහැවිහට අඳුර අතුරුදන් විය. එළිය පහළ විය. යම් බියෙක් තැති ගැන්මෙක් ලොමුදහ ගැන්මෙක් වී නම් එය සන්සිඳිනි.

දෙවන වට දු ...

තෙවන වට දු අනේපිඬු ගැහැවිහට එළිය අතුරුදන් වි ය. අඳුර පහළ වි ය. බිය තැති ගැණුම් ලොමුදහ ගැණුම් පහළ වි ය. එයින් ම පෙරළා යනු කැමැත්තේ ද වි ය. තෙවන වට දු සීවක යක්‍ෂ තෙමේ අතුරුදන් වූයේ (මතු දැක්වෙන) ශබ්දය ඇස්වී ය:

සියක්දහසක් ඇත්තු ද, සියක්දහසක් අස්හු ද, සියක්දහසක් අශ්ව-තරියෝ ද, මිණිකොඬොල් අබරණින් සරසන ලද සියක්දහසක් කන්‍යාවෝ ද, (බුදුන් දක්නට යන්නහුගේ) එක් පියවරක් පිළිබඳ සොළොස්වැනි කලාවෙන් කලාවකුදු නො අගිත්.

ගැහැවියෙනි, ඉදිරියට යව. ගැහැවියෙනි, ඉදිරියට යව. තොපගේ ඉදිරියට යෑම මැනැව. ආපසු යෑම නො මැනැව.

ඉක්බිති අනේපිඬු ගැහැවිහට අඳුර අතුරුදන් වි ය. එළිය පහළ වි ය. යම් බියෙක් තැති ගැන්මෙක් ලොමුදහ ගැන්මෙක් වී නම් එය සන්සිඳිනි. ඉක්බිති අනේපිඬු ගැහැවි තෙමේ ශීතවනය වෙත එළඹියේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම නැගිට අබවස සක්මන් කරණ සේක. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ අනේපිඬු ගැහැවිහු දුර දී ම දුටු සේක. දැක සක්මනින් බැස පැනවූ අසුනෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ අනේපිඬු ගැහැවිහට "සුදත්ත, (මෙහි) එව"යි මෙය වදාළ සේක.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති නාමේන මං භගවා ආලපතීති[1] තත්ථෙව භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: කච්චි භන්තෙ භගවා සුඛමසයිත්ථාති[2]?

[භගවා:]

සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො,
යො න ලිම්පති කාමෙසු සීතිභූතො නිරූපධි.

සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං,
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසොති.[3]

10. 1. 9.

පඨමසුක්කා සුත්තං.

243. එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දක-නිවාපෙ.** තෙන ඛො පන සමයෙන **සුක්කා** භික්ඛුනී මහතියා පරිසාය පරිවුතා ධම්මං දෙසෙති.

අථ ඛො සුක්කාය භික්ඛුනියා අභිප්පසන්නො යක්ඛො රාජගහෙ රථිකාය රථිකං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

කිමෙම කතා රාජගහෙ මනුස්සා මධුපීතාව සෙය්‍යරෙ[4],
යෙ සුක්කං න පයිරුපාසන්ති දෙසෙන්තිං අමතං පදං.

තඤ්ච පන අප්පටිවානීයං අසෙචනකමොජවං,
පිවන්ති මඤ්ඤෙ සප්පඤ්ඤා වලාහකමිවද්ධගූති.[5]

10. 1. 10.

දුතියසුක්කා සුත්තං.

244. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දක-නිවාපෙ.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො **සුක්කාය** භික්ඛුනියා භොජනං අදාසි. අථ ඛො සුක්කාය භික්ඛුනියා අභිප්පසන්නො යක්ඛො රාජගහෙ රථිකාය රථිකං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා තායං වෙලායං ඉමං ගාථං අභාසි:

පුඤ්ඤං වත පසවි බහුං සප්පඤ්ඤො වතායමුපාසකො,
යො සුක්කාය අදාසි භොජනං සබ්බගන්ථෙහි විප්පමුත්තායාති[6].

---

1. ආලපතීති හට්ඨො උදග්ගොති - මජසං. 2. සුඛං වසිත්ථාති - සතා 3. චෙතසා - මජසං.
4 සෙය්‍යරෙ - මජසං, අච්චරෙ යෙ - PTS 5. වලාහකම්ව පන්ථගූති - මජසං, සතා,
6. විප්පමුත්තියං - මජසං, සිමු, 1. 2. PTS.

එකල්හි අනේපිඬු ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ තමින් මෑ අමතන සේක යි එහි ම භාග්‍යවතුන් වහන්සේගේ පා ලඟ හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, කිම? භාග්‍යවතුන් වහන්සේ සුවසේ සැතපුනු සේක් දැ"යි මෙය සැළ කෙළේ ය.

[භගවත්හු:]

යමෙක් කාමයන්හි නොතැවරේ ද, (කෙලෙස්ගිනි නැති බැවින්) සිහිල් වූයේ ද, උපධි රහිත ද පිරිනිවියා වූ (ඒ ක්ෂීණාශ්‍රව) බමුණු තෙමේ හැමකල්හි ඒකාන්තයෙන් සුවසේ හොවී.

සියලු තෘෂ්ණාවන් සිඳ හෘදය ඇසුරු කළ විඩාව දුරු කොට සිත්හි සන්සිඳීමට පැමිණ උපශාන්ත වූයේ සුවසේ හොවී.

10. 1. 9.

පඨමසුක්කා සූත්‍රය.

243. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි **සුක්කා** මෙහෙණ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දී දහම් දෙසයි. ඉක්බිති සුක්කා මෙහෙණ කෙරෙහි බෙහෙවින් පහන් යක්ෂයෙක් රජගහනුවර වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට එළඹ ඒ වේලාවෙහි මේ ගාථා කී ය:

යම් කෙනෙක් නිවන්පදය දෙසන්නා වූ සුක්කා මෙහෙණ වෙත නො එළඹෙද්ද, රජගහනුවර (වෙසෙන) මේ මිනිස්සු කුමක් කෙරෙද්ද? සුරාපානය කළවුන්සේ හොවිත්.

ඇසීමෙන් තෘප්තියට නො පැමිණෙන සවභාවයෙන් ම මිහිරි වූ ඕජෝ-ගුණවත් වූ ඒ දහම වලාකුළු අතරෙන් නික්මෙන දිය බොන මගියන් මෙන් නුවණැත්තන් බොන්නාක් මෙනි.

10. 1. 10.

ද්‍විතියසුක්කා සූත්‍රය.

244. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි එක්තරා උවසුවෙක් **සුක්කා** මෙහෙණහට බොජුනක් දිනී. ඉක්බිති සුක්කා මෙහෙණ කෙරෙහි බෙහෙවින් පහන් යකෙක් රජගහනුවර වීදියෙන් වීදියට මංසන්ධියෙන් මංසන්ධියට එළඹ ඒ වේලාවෙහි මේ ගාථාව කී ය:

යමෙක් සියලු කෙලෙස් ගැටෙන් මිදුනු සුක්කා මෙහෙණහට බොජුනක් දුන්නේ ද, ඒකාන්තයෙන් නුවණැති මේ උවසු තෙමේ බොහෝ වූ ම පින් රැස් කෙළේ ය.

10. 1. 11.

චීරාසුත්තං.

245. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දක-නිවාපෙ.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො චීරාය භික්ඛුනියා චීවරං අදාසි. අථ ඛො චීරාය භික්ඛුනියා අභිප්පසන්නො යක්ඛො රාජගහෙ රථිකාය රථිකං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා තායං වෙලායං ඉමං ගාථං අභාසි:

පුඤ්ඤං වත පසවි බහුං සප්පඤ්ඤො වතායමුපාසකො,
යො චීරාය අදාසි චීවරං සබ්බයොගෙහි විප්පමුත්තායාති.

10. 1. 12.

ආළවකසුත්තං.

246. එවං මෙ සුතං: එකං සමයං භගවා **ආළවියං** විහරති ආළවකස්ස යක්ඛස්ස භවනෙ. අථ ඛො **ආළවකො** යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි.

දුතියම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච: නික්ඛම සමණාති. සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති. සාධාවුසොති භගවා පාවිසි. තතියම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච: නික්ඛම සමණාති. සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති. සාධාවුසොති භගවා පාවිසි. චතුත්ථම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච: නික්ඛම සමණාති. න ඛ්වාහං ආවුසො නික්ඛමිස්සාමි. යං තෙ කරණීයං තං කරොහීති.

[ආළවකො:]

පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි. සචෙ මෙ න බ්‍යාකරිස්සසි, චිත්තං වා තෙ ඛිපිස්සාමි. හදයං වා තෙ ඵාලෙස්සාමි. පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමීති.

[භගවා:]

න ඛ්වාහං තං ආවුසො පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය හදයං වා ඵාලෙය්‍ය පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය. අපි ච ත්වං ආවුසො පුච්ඡ යදාකඞ්ඛසීති.

අථ ඛො ආළවකො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි[1]:

කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං කිංසු සුචිණ්ණං සුඛමාවහාති,
කිංසු හවෙ සාදුතරං[2] රසානං කථං ජීවි ජීවිතමාහු සෙට්ඨන්ති?

1 අථ -පෙ- අජ්ඣභාසි ඉති නත්ථි - මජ්ඣං. ස්‍යා PTS. 2. සාධුතරං - සං.

10. 1. 11.

වීරාසූත්‍රය.

245. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි එක්තරා උවසුවෙක් වීරා මෙහෙණහට සිවුරක් දිනි. ඉක්බිති වීරා මෙහෙණ කෙරෙහි බෙහෙවින් පහන් යකෙක් රජගහනුවර වීදියෙන් වීදියට මංසන්ධියෙන් මංසන්ධියට එළඹ ඒ වේලාවෙහි මේ ගාථාව කී ය

යමෙක් සියලු යෝගවලින් මිදුනු වීරා මෙහෙණහට සිවුරක් දුන්නේ ද, ඒකාන්තයෙන් නුවණැති මේ උවසු තෙමේ බොහෝ වූ ම පින් රැස් කෙළේ ය.

10. 1. 12.

ආලවක සූත්‍රය.

246. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **අළව්නුවර** සමීපයෙහි **ආලවක** යකුගේ භවනයෙහි වැඩවසන සේක. එකල්හි ආලවක යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. මහණ, නික්මෙව යි. ඇවැත්නි මැනවැ යි භාග්‍යවතුන් වහන්සේ නික්මුනු සේක. මහණ, පිවිසෙව යි. ඇවැත්නි, මැනවැ යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක.

දෙවන වට දු ආලවක යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. මහණ, නික්මෙව යි. ඇවැත්නි, මැනවැ යි භාග්‍යවතුන් වහන්සේ නික්මුනු සේක. මහණ, පිවිසෙව යි. ඇවැත්නි, මැනවැ යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක. තෙවන වටදු ආලවක යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. මහණ නික්මෙව යි. ඇවැත්නි, මැනවැ යි භාග්‍යවතුන් වහන්සේ නික්මුනු සේක. මහණ පිවිසෙව යි. ඇවැත්නි, මැනවැ යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක. සිවුවන වට දු ආලවක යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. මහණ නික්මෙව යි. ඇවැත්නි, මම නො නික්මෙන්නෙමි. තා විසින් යමක් කටයුතු නම් එය කරව යි.

[අළව්:]

මහණ, තොපගෙන් පැණයක් විචාරන්නෙමි. ඉදින් මට (එය) නො විසඳන්නෙහි නම් තාගේ සිත හෝ වික්ෂෙප කරන්නෙමි. තාගේ හෘදය හෝ පලන්නෙමි. පා ගෙණ ගඟපරතෙර හෝ දමන්නෙමි.

[භගවත්හු:]

ඇවැත්නි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොව මහණ-බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාවෙහි යමෙක් මාගේ සිත හෝ වික්ෂෙප කරන්නේ ද, හෘදය හෝ පලන්නේ ද, පා ගෙණ ගඟපරතෙර හෝ දමන්නේ ද, එබන්දකු මම නො දකිමි. වැලි දු ඇවැත්නි, තෝ යමක් කැමැත්තෙහි ද (එය) විචාරව යි. ඉක්බිති ආලවක යක්ෂ තෙමේ භාග්‍ය-වතුන් වහන්සේට ගාථාවකින් කී ය:

මෙ ලොව සත්ත්වයාට කිමෙක් ශ්‍රෙෂ්ඨ ධනය වේ ද? කිමෙක් මැනවින් පුරුදු කරණ ලද්දේ සුව එළවා ද? රසයන් අතුරෙන් කුමක් ඉතා මිහිරි ද? කෙසේ ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යයි කියද්ද?

[භගවා:]

සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
සච්චං හවෙ සාදුතරං රසානං පඤ්ඤාජීවිං[1] ජීවිතමාහු සෙට්ඨන්ති.

[ආළවකො:]

කථං සු තරති ඔඝං කථං සු තරති අණ්ණවං,
කථං සු දුක්ඛං අච්චෙති කථං සු පරිසුජ්ඣතීති.

[භගවා:]

සද්ධාය තරති ඔඝං අප්පමාදෙන අණ්ණවං,
විරියෙන දුක්ඛං අච්චෙති පඤ්ඤාය පරිසුජ්ඣතීති.[2]

[ආළවකො:]

කථං සු ලභතෙ පඤ්ඤං කථං සු වින්දතෙ ධනං,
කථං සු කිත්තිං පප්පොති කථං මිත්තානි ගන්ථති,
අස්මා ලොකා පරං ලොකං කථං පෙච්ච න සොචතීති?

[භගවා:]

සද්දහානො අරහතං ධම්මං නිබ්බාණපත්තියා,
සුස්සූසා[3] ලභතෙ පඤ්ඤං අප්පමත්තො විචක්ඛණො.

පතිරූපකාරී[4] ධුරවා උට්ඨාතා වින්දතෙ ධනං,
සච්චෙන කිත්තිං පප්පොති දදං මිත්තානි ගන්ථති.

යස්සෙතෙ චතුරො ධම්මා සද්ධස්ස ඝරමෙසිනො,
සච්චං ධම්මො[5] ධිති චාගො ස වෙ පෙච්ච න සොචති,
අස්මා ලොකා පරං ලොකං එවං පෙච්ච න සොචතීති.

ඉඞ්ඝ අඤ්ඤෙපි පුච්ඡස්සු පුථූ සමණබ්‍රාහ්මණෙ,
යදි සච්චා දමා[6] චාගා ඛන්ත්‍යා භිය්‍යොධ විජ්ජතීති.

[ආළවකො:]

කථං නු දානි පුච්ඡෙය්‍යං පුථූ සමණබ්‍රාහ්මණෙ,
සො'හං[7] අජ්ජ පජානාමි යො අත්ථො සම්පරායිකො.

අත්ථාය වත මෙ බුද්ධො වාසායාළවිමාගමා[8],
සො'හං[7] අජ්ජ පජානාමි යත්ථ දින්නං මහප්ඵලං.

1 ජීවිං - මජ්සං. සිමු. 1. 2. 2. පරිසුජ්ඣති - සී. 1. 3. සුස්සුසං - මජ්සං. ස්‍යා. 4. පටිරූපකාරී - ස්‍යා. PTS. 5. දම්මො - PTS. 6. ධම්මො - මජ්සං. 7. සොහං - මජ්සං. ස්‍යා. PTS. 8. වාගතො - PTS.

[භගවත්හු:]

මෙලොව සත්ත්වයාට ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨ ධනය වේ. දහම මැනවින් පුරුදු කරණ ලද්දේ සුව එලවයි. රසයන් අතුරෙන් සත්‍යය ඒකාන්තයෙන් ඉතා මිහිරි ය. නුවණින් ජිවත්වන්නහුගේ ජිවිතය ශ්‍රේෂ්ඨ යයි කියත්.

[අළවී:]

ඕඝය කෙසේ තරණය කෙරේ ද? අණීවය කෙසේ තරණය කෙරේ ද? දුක කෙසේ ඉක්මවා ද? කෙසේ පිරිසිදු වේ ද?

[භගවත්හු:]

ශ්‍රද්ධාවෙන් ඕඝය තරණය කෙරේ. අප්‍රමාදයෙන් අණීවය තරණය කෙරේ. වීය්‍ර්‍යීයෙන් දුක ඉක්මවයි. ප්‍රඥාවෙන් පිරිසිදු වේ.

[අළවී:]

නුවණ කෙසේ ලබා ද? ධනය කෙසේ ලබා ද? කෙසේ කීර්තියට පැමිණේ ද? කෙසේ මිත්‍රයන් සපයා ගණී ද? මෙලොවින් පරලොවට පැමිණ කෙසේ ශෝක නො කෙරේ ද?

[භගවත්හු:]

නො පමා වූ නුවණැත්තේ රහතුන්ගේ ධම්ය අදහන්නේ අසනු කැමැත්ත හේතු කොට ගෙණ නිවණට පැමිණීම පිණිස ප්‍රඥාව ලබයි.

සුදුසු කටයුතු කරණ බහා නො තැබූ ධුර ඇති උත්සාහවීය්‍ර්‍ය ඇත්තේ ධනය ලබයි. සත්‍යවචනය කරණකොට ගෙණ කීර්තියට පැමිණේ. දන් දෙන්නේ මිත්‍රයන් බැඳ ගණී.

ගිහිගෙයි වෙසෙන ශ්‍රද්ධා ඇති යම්කුහට සත්‍යයත්, ධම්යත්, ධෘතියත්, ත්‍යාගයත් යන මේ සිවු දහම්හු වෙත් නම් හෙ තෙමේ පරලොවට පැමිණ ඒකාන්තයෙන් ශෝක නො කෙරෙයි. මෙලොවින් පරලොවට පැමිණ මෙසේ ශෝක නො කෙරෙයි.

සත්‍යයටත්, ඉන්ද්‍රියදමනයටත්, ත්‍යාගයටත්, ක්ෂාන්තියටත් අධික වූ යමක් මෙලොව ඉදින් ඇත් නම් (ඒ කුමැයි) බොහෝ වූ අනෙක් මහණබමුණන් ද විචාරව යි.

[අළවී:]

සාම්පරායික වූ ද (දෘෂ්ටධාර්මිකවූ ද) යම් අර්ථයෙක් වේ නම් (එය) ඒ මම අද දනිමි. (එහෙයින්) දැන් බොහෝ වූ මහණබමුණන් කුමකට විචාරන්-නෙම් ද,

ඒකාන්තයෙන් මට වැඩ පිණිස බුදුරජාතන් වහන්සේ විසීම පිණිස අළවි නුවරට වැඩිසේක. යමකුට දෙන ලද්ද මහත්ඵල වේ නම් එය මම අද දනිමි.

සො අහං විචරිස්සාමි ගාමා ගාමං පුරා පුරං,
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතන්ති.

ඉන්දකවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

ඉන්දකො සක්ක සූචි ච මණිභද්දො ච සානු[1] ච,
පියඞ්කර පුනබ්බසු සුදත්තො ච ද්වෙ සුක්කා චීරා ආළවකෙන[2] ද්වාදසාති.

යක්ඛසංයුත්තං සමත්තං.

---

11. සක්කසංයුත්තං

1. සුවීරවග්ගො

11. 1. 1.

සුවීරසුත්තං.

247. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ අසුරා දෙවෙ අභියංසු. අථ ඛො භික්ඛවෙ **සක්කො** දෙවානමින්දො **සුවීරං** දෙවපුත්තං ආමන්තෙසි. එතෙ තාත සුවීර, අසුරා දෙවෙ අභියන්ති. ගච්ඡ, තාත සුවීර, අසුරෙ පච්චුය්‍යාහීති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ සුවීරො දෙවපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා පමාදං ආපාදෙසි.

දුතියම්පි ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො සුවීරං දෙවපුත්තං ආමන්තෙසි: එතෙ තාත සුවීර, අසුරා දෙවෙ අභියන්ති. ගච්ඡ තාත සුවීර, අසුරෙ පච්චුය්‍යාහීති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ සුවීරො දෙවපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා දුතියම්පි[3] පමාදං ආපාදෙසි.

තතියම්පි ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො සුවීරං දෙවපුත්තං ආමන්තෙසි: එතෙ තාත සුවීර, අසුරා දෙවෙ අභියන්ති. ගච්ඡ තාත සුවීර, අසුරෙ පච්චුය්‍යාහීති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ සුවීරො දෙවපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා තතියම්පි[4] පමාදං ආපාදෙසි.

අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො සුවීරං දෙවපුත්තං ගාථාය අජ්ඣභාසි:

---

1. සාණු - සීමු. 2. චීර ආළවීති - මජසං. 3. දුතියම්පීති නත්ථි PTS, 4. තතියම්පීති නත්ථි. PTS.

ඒ මම (බුද්ධසුබුද්ධතාව කියා) බුදුරජාතන් වහන්සේ ද, (ධම්මසුධම්මතාව කියා) ධර්මය ද (සඞ්ඝසුසඞ්ඝතාව කියා) සඞ්ඝයා ද වදිමින් ගමින් ගම නුවරින් නුවර හැසිරෙන්නෙමි.

ඉන්දක වර්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

ඉන්දක, සක්ක, සූචි, මණිභද්ද, සානු, පියඞ්කර, පුනබ්බසු, සුදත්ත ය, සුක්කාසූත්‍ර දෙක ය, චීරා සූත්‍රය, ආළවක සූත්‍ර යයි දොළොසෙකි.

යක්ඛ සංයුත්තය නිමියේ ය.

---

11. සක්කසංයුත්තය

1. සුවීර වර්ගය

11. 1. 1.

සුවීර සූත්‍රය.

247. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු සිටුහුගේ අරමෙහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, පෙර වූවක් කියමි. **අසුරයෝ** **දෙවියන්** ඉදිරියට පැමිණි-යාහු ය. මහණෙනි, **එකල්හි** ශක්‍රදේවේන්ද්‍ර තෙමේ **සුවීර** දෙව්පුතු ඇමතී ය:- "පුත, සුවීර, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. පුත සුවීර, යා. අසුරයන් පෙරළා ඉදිරියට යව" යි. මහණෙනි, සුවීර දෙව්පුත් තෙමේ "එසේ ය, මුඹට වැඩෙක් වේව" යි සක්දෙවිඳුට පිළිවදන් දී (ගමන) පමා කෙළේ ය.

මහණෙනි, දෙවන වට දු සක්දෙවිඳු තෙමේ සුවීර දෙව්පුතු ඇමතී ය: "පුත, සුවීර, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති, පුත, සුවීර, යා. අසුරයන් පෙරළා ඉදිරියට යව" යි. මහණෙනි, සුවීර දෙව්පුත් තෙමේ "එසේ ය, මුඹට වැඩෙක් වේව" යි සක්දෙවිඳුට පිළිවදන් අස්වා දෙවන වට දු (ගමන) පමා කෙළේ ය.

මහණෙනි, තෙවන වට දු ශක්‍රදේවේන්ද්‍ර තෙමේ සුවීර දෙව්පුතු ඇමතී ය: "පුත, සුවීර, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. පුත සුවීර, යා. අසුරයන් පෙරළා ඉදිරියට යව" යි. මහණෙනි, සුවීර දෙව්පුත් තෙමේ "එසේ ය මුඹට වැඩෙක් වේව" යි සක්දෙවිඳුට පිළිවදන් අස්වා තෙවන වට දු (ගමන) පමා කෙළේ ය.

මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙමේ සුවීර දෙව්පුත්හට ගාථායෙන් කී ය:

අනුට්ඨහං අවායාමං[1] සුඛං යත්‍රාධිගච්ඡති,
සුවීර තත්ථ ගච්ඡාහි මඤ්ච තත්ථෙව පාපයාති.

[සුවීරො:]

අලසස්ස[2] අනුට්ඨාතා න ච කිච්චානි කාරයෙ,
සබ්බකාමසමිද්ධස්ස තමෙම සක්ක වරං දිසාහි[3].

[සක්කො:]

යත්ථාලසො අනුට්ඨාතා අච්චන්තං[4] සුඛමෙධති,
සුවීර තත්ථ ගච්ඡාහි මඤ්ච තත්ථෙව පාපයාති.

[සුවීරො:]

අකම්මුනා[5] දෙවසෙට්ඨ සක්ක වින්දෙමු යං සුඛං,
අසොකං අනුපායාසං තමෙම සක්ක වරං දිසාහි.

[සක්කො:]

සචෙ අත්ථි අකම්මෙන කොචි ක්වචි න ජීවති,
නිබ්බාණස්ස හි සො මග්ගො සුවීර තත්ථ ගච්ඡාහි
මඤ්ච තත්ථෙව පාපයාති.

සො හි නාම භික්ඛවෙ, සක්කො දෙවානමින්දො සකං පුඤ්ඤඵලං උපජීවමානො දෙවානං තාවතිංසානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙන්තො[6] උට්ඨානවිරියස්ස වණ්ණවාදී භවිස්සති. ඉධ ඛො තං භික්ඛවෙ සොභෙථ, යං තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා උට්ඨහෙය්‍යාථ ඝටෙය්‍යාථ වායමෙය්‍යාථ අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායාති.

11. 1. 2.

සුසිමසුත්තං.

248. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ අසුරා දෙවෙ අභියංසු. අථ ඛො භික්ඛවෙ **සක්කො** දෙවානමින්දො සුසීමං[7] දෙවපුත්තං ආමන්තෙසි: එතෙ තාත සුසීම, අසුරා දෙවෙ අභියන්ති. ගච්ඡ තාත සුසීම, අසුරෙ පච්චුය්‍යාහීති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ සුසීමො දෙවපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා පමාදං ආපාදෙසි.

1. අවායාමං - සාස්වි. 2. අලසවායස්ස - මජසං, අලසවායං - සයා. 3 දිසන්ති - PTS.
4 අච්චන්තසුඛමෙධති - සයා. 5 අකාමිතා - PTS. 6. කාරෙන්තො - PTS.
7. සුසිමං - සයා.

(කායිකවීර්‍ය්‍ය වශයෙන්) නො නැඟී සිටුනේ (චෛතසික වීර්‍ය්‍ය වශයෙන්) වෑයම් නො කරණුයේ යම් තැනෙක්හි සුඛයට පැමිණේ ද, සුවීර, එහි යා. මා ද එහි ම පමුණුව යි.

[සුවීරදෙව්පුත්:]

උත්‍ථානවීර්‍ය්‍ය නැත්තේ අලස වන්නේ ය. කිසි කිසක් නො ද කරන්නේ ය. (එබන්දෙක්) සියලු කාමයෙන් සමෘද්ධයෙක් වන්නේ නම් සක්දෙව්දුනි, ඒ උත්තමස්ථානය මට කියනු මැනවි යි.

[සක්දෙව්දු:]

උත්‍ථානවීර්‍ය්‍ය නැත්තා වූ අලසපුද්ගලයෙක් යම් තැනෙක අත්‍යන්තයෙන් සුඛයට පැමිණේ ද, නොහොත් අතිශයින් සැපසේ වැඩේ ද, සුවීර, එහි යා. මා ද එහි ම පමුණුව යි.

[සුවීර:]

ශක්‍රදේවේන්‍ද්‍රය, කම් නො කිරීමෙන් යම් සැපතක් ලබමෝ ද, ශක්‍රදේ- වේන්‍ද්‍රය, ශෝක නැති දුක් ආයාස නැති ඒ උතුම් මග කියනු මැනවි.

[සක්දෙව්දු:]

කිසි පුද්ගලයෙක් කිසි තැනෙක්හි ජීවත් නොවේ ද, (කෘෂි වණික් ආදි) කම් නො කිරීමෙන් පැමිණිය යුතු එබඳු තැනෙක් ඉදින් ඇත් ද, ඒ මග නිර්වාණයාගේ (මග) ම ය. සුවීර, එහි යා. මා ද එහි ම පමුණුව යි.

මහණෙනි, ඒ සක්දෙව්රජ තෙමේ තම සිය පින්පල නිසා ජීවත්- වන්නේ තව්තිසා වැසි දෙවියන් පිළිබඳ ඉසුරු බව හා අධිපති බව ඇති රජය කරන්නේ උත්‍ථානවීර්‍ය්‍ය පිළිබඳ ගුණ කියන්නෙක් වෙයි. මහණෙනි, තෙපි මෙසේ ස්වාක්ඛාත ශාසනයෙහි පැවිදි වූවහු ම මේ සස්නෙහි නො පැමිණි ගුණයකට පැමිණීම පිණිස ද, අවබෝධ නොකළ දහමක් අවබෝධ කිරීම පිණිස ද, පසක් නො කළ දහමක් පසක් කිරීම පිණිස ද යම් වීර්‍ය්‍යයෙකින් උත්සාහ කරන්නහු ද, ඝටනය කරන්නහු ද, වෑයම් කරන්නහු ද, මෙ සස්නෙහි ලා ඒ වීර්‍ය්‍ය හොබනේ ය.

11. 1. 2.

සුසිම සූත්‍රය.

248. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ ආරම්හි වැඩවසන සේක. එහි දී භාග්‍ය- වතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, පෙර වූවක් කියමි: අසුරයෝ දෙවියන් අභිමුඛවැ ගියහ. මහණෙනි, ඉක්බිති සක්දෙව්රජ සුසීම දෙව්පුතු ඇමති යැ: "පුත, සුසීම, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. පුත, සුසීම යා. අසුරයන් බලා නැඟ යා" යි. මහණෙනි, සුසීම දෙව්පුත් තෙමේ 'එසේ ය. මුඹට මැනැවෙක් වේව'යි සක්දෙව්රජුහට පිළිවදන් දී (ගමන) පමා කෙළේ ය.

දුතියම්පි ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො සුසීමං දෙවපුත්තං ආමන්තෙසි. -පෙ- දුතියම්පි පමාදං ආපාදෙසි.

තතියම්පි ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො සුසීමං දෙවපුත්තං ආමන්තෙසි -පෙ- තතියම්පි පමාදං ආපාදෙසි. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො සුසීමං දෙවපුත්තං ගාථාය අජ්ඣභාසි:

අනුට්ඨහං අවායමං සුඛං යත්‍රාධිගච්ඡති,
සුසීම තත්ථ ගච්ඡාහි මඤ්ච තත්ථෙව පාපයාති.

[සුසීමො:]

අලසස්ස අනුට්ඨාතා න ච කිච්චානි කාරයෙ,
සබ්බකාමසමිද්ධස්ස තම්මෙ සක්ක වරං දිසාති.

[සක්කො:]

යත්ථාලසො අනුට්ඨාතා අච්චන්තං සුඛමෙධති,
සුසීම තත්ථ ගච්ඡාහි මඤ්ච තත්ථෙව පාපයාති.

[සුසීමො:]

අකම්මුනා දෙවසෙට්ඨ සක්ක වින්දෙමු යං සුඛං,
අසොකං අනුපායාසං තම්මෙ සක්ක වරං දිසාති.

[සක්කො:]

සචෙ අත්ථි අකම්මෙන කොචි ක්වචි න ජීවති,
නිබ්බාණස්ස හි සො මග්ගො සුසීම තත්ථ ගච්ඡාහි
මඤ්ච තත්ථෙව පාපයාති.

සො හි නාම භික්ඛවෙ සක්කො දෙවානමින්දො සකං පුඤ්ඤඵලං උපජීවමානො දෙවානං තාවතිංසානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙන්තො උට්ඨානවිරියස්ස වණ්ණවාදී භවිස්සති. ඉධ ඛො තං භික්ඛවෙ සොභෙථ, යං තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා උට්ඨහෙය්‍යාථ ඝටෙය්‍යාථ වායමෙය්‍යාථ අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායාති.

11. 1. 3.

ධජග්ගසුත්තං.

249. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

දෙවන වට ද සක්දෙව්රජ සුසිම දෙව්පුතු ඇමැතීය. ... දෙවන වට ද පමා කෙළේ ය.

මහණෙනි, තෙවන වට ද සක්දෙව්රජ සුසිම දෙව්පුතු ඇමතී ය තෙවන වට ද පමා කෙළේ ය මහණෙනි, ඉක්බිති සක්දෙව්රජ සුසිම දෙව්පුතුහට ගාථායෙන් කී ය.

(කායික වීර්‍ය්‍ය වශයෙන්) නො නැඟී සිටුනේ (චෛතසික වීර්‍ය්‍ය වශයෙන්) වෑයම් නො කරණුයේ යම් තැනෙක්හි සුඛයට පැමිණේ ද, සුවීර, එහි යා. මා ද එහිම පමුණුව යි.

[සුසිම:]

උත්සාහවීර්‍ය්‍ය නැත්තේ අලස වන්නේ ය. කිසි කිසක් නො ද කරන්නේය. (එබන්දෙක්) සියලු කාමයෙන් සමෘද්ධයෙක් වන්නේ නම් ඒ උත්තමස්ථානය මට කියනු මැනවි යි.

[සක්දෙවිඳු:]

උත්සාහවීර්‍ය්‍ය නැත්තා වූ අලස පුද්ගලයෙක් යම් තැනෙක ඒකාන්ත සුඛයට පැමිණේ ද, නොහොත් අතිශයින් සැපසේ වැඩේ ද, සුසිම, එහි යා. මා ද එහි ම පමුණුව යි.

[සුසිම:]

ශක්‍ර දේවේන්ද්‍රය, කම් නොකිරීමෙන් යම් සැපතක් ලබමෝ ද, ශක්‍ර-දේවේන්ද්‍රය, ශෝක නැති දුක් ආයාස නැති ඒ උතුම් මග කියනු මැනවි.

[සක්දෙවිඳු:]

කිසි පුද්ගලයෙක් කිසි තැනෙක්හි ජීවත් නො වේ ද, (කෘෂිවණික් ආදි) කම් නොකිරීමෙන් පැමිණිය යුතු එබඳු තැනෙක් ඉදින් ඇත් ද, ඒ මග නිර්වාණයාගේ (මග) ම ය. සුසිම, එහි යා. මා ද එහි ම පමුණුව යි.

මහණෙනි, ඒ සක්දෙව්රජ තම් සිය පින්පල නිසා ජීවත් වන්නේ තව්තිසාවැසි දෙවියන් පිළිබඳ ඉසුරු බව හා අධිපති බව ඇති රජය කරන්නේ උත්සාහවීර්‍ය්‍යය පිළිබඳ ගුණ කියන්නෙක් වෙයි. මහණෙනි, තෙපි මෙසේ ස්වාඛ්‍යාත වූ ශාසනයෙහි පැවිදි වූවහු ම මේ සස්නෙහි නො පැමිණි ගුණයකට පැමිණීම පිණිස ද, අවබෝධ නො කළ දහමක් අවබෝධ කිරීම පිණිස ද, පසක් නොකළ දහමක් පසක් කිරීම පිණිස ද, යම් වීර්‍ය්‍යයෙකින් උත්සාහ කරන්නහු ද, ඝටනය කරන්නහුද, වෑයම් කරන්නහු ද, මේ සස්නෙහි ලා ඒ වීර්‍ය්‍යය හොබනේ ය.

11. 1. 3.

ධජග්ග සූත්‍රය.

249. එක්කාලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්ස යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්බුළ්හො අහොසි. අථ ඛො භික්ඛවෙ **සක්කො** දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි: සචෙ මාරිසා දෙවානං සඞ්ගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සමයෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ. මමං හි වො ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පහීයිස්සති.

නො චෙ මෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ **පජාපතිස්ස** දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. පජාපතිස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පහීයිස්සති.

නො චෙ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ **වරුණස්ස** දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. වරුණස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා, ලොමහංසො වා, සො පහීයිස්සති.

නො චෙ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ **ඊසානස්ස** දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. ඊසානස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පහීයිස්සති.

තං ඛො පන භික්ඛවෙ සක්කස්ස වා දෙවානමින්දස්ස ධජග්ගං උල්ලොකයතං, පජාපතිස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, ඊසානස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පහීයෙථාපි නොපි පහීයෙථ. තං කිස්ස හෙතු? සක්කො හි භික්ඛවෙ දෙවානමින්දො අවීතරාගො අවීතදොසො අවීතමොහො භීරුඡම්භී[1] උත්‍රාසී පලායීති.

අහං ච ඛො භික්ඛවෙ එවං වදාමි: සචෙ තුම්හාකං භික්ඛවෙ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. මමං හි වො භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පහීයිස්සති.

නො චෙ මං අනුස්සරෙය්‍යාථ, අථ ධම්මං අනුස්සරෙය්‍යාථ: "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[2] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. ධම්මං හි වො භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පහීයිස්සති.

1. භීරුඡම්භි - PTS. ස්‍යා: මජසං. 2. ඕපනෙය්‍යිකො - මජසං.

මහණෙනි, පෙර වූවක් කියමි. දෙවියන්ගේ හා අසුරයන්ගේ යුද්ධයෙක් එක්තැන් වැදගත්තේ ය. මහණෙනි, එකල්හි **සක් දෙව්** රජ තව්තිසා වැසි දෙවියන් ඇමතී ය: භවත්නි, ඉදින් යුද්ධයට ගිය දෙවියන්ට බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ උපදනේ නම්, එකල්හි මාගේ ධ්වජාග්‍රය ම ඇස් තබා බල ව. මාගේ ධ්වජාග්‍රය බලන්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම් එය පහ වන්නේ ය.

ඉදින් මාගේ ධ්වජාග්‍රය නො දක්නහු නම්, එකල්හි **පජාපති** දෙව්රජුගේ ධ්වජාග්‍රය බලව. පජාපති දෙව්රජුගේ ධ්වජාග්‍රය දක්නා තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ වන්නේ ය.

ඉදින් පජාපති දෙව්රජුගේ ධ්වජාග්‍රය නො දක්නහු නම්, එකල්හි **වරුණ** දෙව්රජුගේ ධ්වජාග්‍රය බලව. වරුණ දෙව්රජුගේ ධ්වජාග්‍රය දක්නා තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ වන්නේ ය.

ඉදින් වරුණ දෙව්රජුගේ ධ්වජාග්‍රය නො දක්නහු නම්, එකල්හි **ඊසාන** දෙව්රජුගේ ධ්වජාග්‍රය බලව. ඊසාන දෙව්රජුගේ ධ්වජාග්‍රය දක්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ ව යන්නේ ය.

මහණෙනි, සක්දෙව්රජහුගේ ඒ ධ්වජාග්‍රය බලන්නවුන්ට හෝ, පජාපති දෙව්රජුගේ ධ්වජාග්‍රය බලන්නවුන්ට හෝ, වරුණ දෙව්රජුගේ ධ්වජාග්‍රය බලන්නවුන්ට හෝ, ඊසාන දෙව්රජුගේ ධ්වජාග්‍රය බලන්නවුන්ට හෝ යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ වන්නේ ද, නො ද පහ වන්නේ ය. ඒ කවර හෙයින? යත්: මහණෙනි, සක්දෙව්රජ පහ නොවූ රාග ඇත්තේ ය. පහ නොවූ ද්වේෂ ඇත්තේ ය. පහ නො වූ මෝහ ඇත්තේ ය. බිය වන සුලු ය. තැති ගන්නා සුලු ය. ත්‍රාසා වන සුලු ය. පලායන සුලු සි. (එහෙයිනි).

මහණෙනි, මම ද මෙසේ කියමි. මහණෙනි, ඉදින් අරණ්‍යයකට ගියා වූ හෝ රුක්මුලකට ගියා වූ හෝ ශූන්‍යාගාරයකට ගියා වූ හෝ තොපට බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ උපදනේ නම්, එකල්හි "ඒ භාග්‍යවත් තෙමේ මෙ කාරණෙනුදු අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලොකවිදූ ය, අනුත්තරපුරිසදම්මසාරථි ය, දෙව් මිනිසුන්ට ශාස්තෘ ය, බුද්ධ ය, භාග්‍යවත් ය"යි මා ම සිහි කරව. මහණෙනි, මා සිහි කරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ ව යන්නේ ය.

ඉදින් මා සිහි නො කරන්නහු නම්, එකල්හි "ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාත ය, සන්දිට්ඨික ය, අකාලික ය, එහිපස්සිකය, ඔපනයික ය, නුවණැත්තවුන් විසින් සිය සතන්හි ලා දතයුත්තේය"යි ධර්මය සිහි කරව. මහණෙනි, ධර්මය සිහි කරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ ව යන්නේ ය.

නො චෙ ධම්මං අනුස්සරෙය්‍යාථ, අථ සඞ්ඝං අනුස්සරෙය්‍යාථ: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො. උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො. ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො. සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො. යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨපුරිස පුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති. සඞ්ඝං හි වො භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

තං කිස්ස හෙතු? තථාගතො හි භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො වීතරාගො වීතදෙසො වීතමොහො අභීරු අච්ඡම්භී අනුත්‍රාසී අපලායීති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා සුඤ්ඤාගාරෙව[1] භික්ඛවො,
අනුස්සරෙථ සම්බුද්ධං භයං තුම්හාක[2] නො සියා.

නො චෙ බුද්ධං සරෙය්‍යාථ ලොකජෙට්ඨං නරාසභං,
අථ ධම්මං සරෙය්‍යාථ නිය්‍යානිකං සුදෙසිතං.

නො චෙ ධම්මං සරෙය්‍යාථ නිය්‍යානිකං සුදෙසිතං,
අථ සඞ්ඝං සරෙය්‍යාථ පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

එවං බුද්ධං සරන්තානං ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවො,
භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො න හෙස්සතීති.

11. 1. 4

වෙපචිත්තිසුත්තං.

250. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථ-**පිණ්ඩිකස්ස** ආරාමෙ. -පෙ- භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්බූළ්හො අහොසි. අථ ඛො භික්ඛවෙ **වෙපචිත්ති** අසුරින්දො අසුරෙ ආමන්තෙසි: සචෙ මාරිසා දෙවාසුරසඞ්ගාමෙ[3] සමුපබ්බූළ්හෙ අසුරා ජිනෙය්‍යුං, දෙවා පරාජෙය්‍යුං.[4] යෙන තං[5] සක්කං දෙවානමින්දං කණ්ඨපඤ්චමෙහි[6] බන්ධනෙහි බන්ධිත්වා මම සන්තිකෙ ආනෙය්‍යාථ අසුරපුරන්ති.

සක්කො පි ඛො භික්ඛවෙ දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි:

---

1. වා - PTS. 2. තුම්හාකං - PTS. 3 දෙවානං අසුරසඞ්ගාමෙ - මජසං. PTS: 4. පරාජිනෙය්‍යුං - මජසං සතා 5 නං - සතා. PTS. මජසං. 6. කණ්ඨපඤ්චමෙහි - PTS.

ඉදින් ධර්මය සිහි නො කරන්නහු නම්, එකල්හි "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ උජුපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ ඤායපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සාමීචිපටිපන්න ය. යම් මේ පුරුෂයුග සතරෙක් වේ ද, පුරුෂපුද්ගලයෝ අටදෙනෙක් වෙද්ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ ආහුනෙය්‍ය ය, පාහුනෙය්‍ය ය, දක්ඛිණෙය්‍ය ය, අඤ්ජලිකරණීය ය, ලෝකයාගේ නිරුත්තර පින්කෙතය" යි සඞ්ඝයා සිහි කරව. මහණෙනි, සඞ්ඝයා සිහි කරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ ව යන්නේ ය.

ඒ කවර හෙයිනි? යත්: මහණෙනි, අර්හත් වූ සම්මාසම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ වනාහි පහ වූ රාග ඇත්තාහ. පහ වූ ද්වේෂ ඇත්තාහ. පහවූ මෝහ ඇත්තාහ. නොබානසුල්ල හ. නො තැතිගන්නා සුල්ලහ. ත්‍රාසනොවන සුල්ලහ. පලානොයන සුල්ලහ. (එහෙයිනි.)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා නැවත තෙල අන් ගාථාව ද වදාළ සේක:

මහණෙනි, අරණ්‍යයෙහි දී හෝ රුක්මුල දී හෝ ශූන්‍යාගාරයෙහි දී හෝ බුදුරජාණන් වහන්සේ සිහි කරන්නේ ය. (එවිට) තොපට බියෙක් නො වන්නේ ය.

ඉදින් ලෝකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ සිහි නො කරන්නහු නම්, එකල්හි නෛර්‍යාණික වූ සුදේශිත වූ ධර්මය සිහි කරන්නේ ය.

ඉදින් නෛර්‍යාණික වූ සුදේශිත වූ ධර්මය සිහි නො කරන්නහු නම්, එකල්හි නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ සඞ්ඝයා සිහි කරන්නේ ය.

මහණෙනි, මෙසේ බුදුරජාණන් වහන්සේ ද, ධර්මය ද, සඞ්ඝයා ද සිහි කරන්නවුන්ට බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදහ ගැන්මෙක් හෝ නොවන්නේ ය යි.

11. 1. 4.

වෙපචිත්ති සූත්‍රය.

250. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක ... භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහණෙනි, පෙර වූ වක් කියමි. දෙවියන් හා අසුරයන්ගේ යුද්ධයෙක් එක්තැන් වැද සිටියේ ය. මහණෙනි, එකල්හි වෙපචිත්ති අසුරිඳු අසුරයන් ඇමතී ය: "භවත්නි, ඉදින් දෙවාසුරසඞ්ග්‍රාමයක් එළඹ සිටි කල්හි අසුරයෝ දිනන්නාහු නම්, දෙවියෝ පරදින්නාහු නම්, ඒ සක්දෙවිඳු ගෙල පස් වැනි කොට ඇති බැඳුමෙන් බැඳ අසුරපුර මා වෙත ගෙණ එව" යි.

මහණෙනි, සක්දෙව් රජ ද තව්තිසා වැසි දෙවියන් ඇමතී ය:

සචෙ මාරිසා දෙවාසුරසඞ්ගාමෙ සමුපබ්බූළ්හෙ දෙවා ජිනෙය්‍යුං, අසුරා පරාජෙය්‍යුං. යෙන තං වෙපචිත්තිං අසුරින්දං කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බන්ධිත්වා මම සන්තිකෙ ආනෙය්‍යාථ සුධම්මං සභන්ති[1].

තස්මිං ඛො පන භික්ඛවෙ සඞ්ගාමෙ දෙවා ජිනිංසු. අසුරා පරාජිංසු. අථ ඛො භික්ඛවෙ දෙවා තාවතිංසා වෙපචිත්තිං අසුරින්දං කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බන්ධිත්වා සක්කස්ස දෙවානමින්දස්ස සන්තිකෙ ආනෙසුං සුධම්මං සභං.

තත්‍ර සුදං භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බද්ධො සක්කං දෙවානමින්දං සුධම්මං සභං පවිසන්තඤ්ච නික්ඛමන්තඤ්ච අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසති, පරිභාසති.

අථ ඛො භික්ඛවෙ **මාතලි** සඞ්ගාහකො සක්කං දෙවානමින්දං ගාථාය[2] අජ්ඣභාසි:

භයා නු මඝවා[3] සක්ක දුබ්බල්‍යා[4] නො තිතික්ඛසි,
සුණන්තො ඵරුසං වාචං සම්මුඛා වෙපචිත්තිනොති.

[සක්කො:]

නාහං භයා න දුබ්බල්‍යා ඛමාමි වෙපචිත්තිනො,
කථඤ්හි මාදිසො විඤ්ඤූ බාලෙන පටිසංයුජෙති.

භිය්‍යො බාලා පභිජ්ජෙය්‍යුං[5] නො චස්ස පටිසෙධකො
තස්මා භුසෙන දණ්ඩෙන ධීරො බාලං නිසෙධයෙති.

එතදෙව අහං මඤ්ඤෙ බාලස්ස පටිසෙධනං,
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මතීති.

[මාතලි:]

එතදෙව තිතික්ඛාය වජ්ජං පස්සාමි වාසව,
යදා තං මඤ්ඤති බාලො භයා ම්‍යායං තිතික්ඛති,
අජ්ඣාරුහති[6] දුම්මෙධො ගො'ව භිය්‍යො පලායින්තන්ති.

[සක්කො:]

කාමං මඤ්ඤතු වා මා වා භයා ම්‍යායං තිතික්ඛති,
සදත්ථපරමා අත්ථා ඛන්ත්‍යා භිය්‍යො න විජ්ජති.

යො හවෙ බලවා සන්තො දුබ්බලස්ස තිතික්ඛති,
තමාහු පරමං ඛන්තිං නිච්චං ඛමති දුබ්බලො.

අබලන්තං බලං ආහු යස්ස බාලබලං බලං,
බලස්ස[7] ධම්මගුත්තස්ස පටිවත්තා න විජ්ජති.

තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මති.

---

1. සුධම්මසභන්ති - මජසං. 2. ගාථාහි - මජසං. 3. මඝවා - මජසං. සතා.
4. දුබ්බලෙය්‍යතා - සතා. 5. පකුජ්ඣෙය්‍යුං - PTS. සී. 1, 2. 6. අභිජ්ඣාරුහති - සතා.
7. බලවස්ස - සතා.

පින්වත්නි, ඉදින් දෙවාසුරසංග්‍රාමයක් එළඹ සිටි කල්හි දෙවියෝ දිනන්නාහු නම්, අසුරයෝ පරදින්නාහු නම්, ඒ වෙපචිත්ති අසුරිඳු ගෙල පස් වැනි කොට ඇති බැම්මෙන් බැඳ සුධම්මා සභාවට මා වෙත ගෙණ එව යි.

මහණෙනි, ඒ යුද්ධයෙහි දෙවියෝ දිනූහ. අසුරයෝ පැරදුනහ. මහණෙනි, එකල්හි තව්තිසා වැසි දෙවියෝ වෙපචිත්ති අසුරිඳු ගෙල පස්වැනි කොට ඇති බැඳුමෙන් බැඳ සක්දෙවිඳු සමීපයෙහි සුධම්මා සභාවට ගෙණාහ. මහණෙනි, එහිදී ගෙල පස්වැනි කොට ඇති බැඳුමෙන් බඳනා ලද වෙපචිත්ති අසුරිඳු සුධම්මා සභාවට පිවිසෙන්නා වූ ද නික්මෙන්නා වූ ද සක්දෙවිඳු හට අසභ්‍ය වූ පරුෂ වචනයෙන් ආක්‍රෝශ කෙරෙයි, පරිභව කෙරෙයි.

මහණෙනි, ඉක්බිති මාතලි රියැදුරු තෙමේ සක්දෙව්රජහට ගාථායෙන් කී ය:

සක්දෙවිඳුනි, වෙපචිත්තිහුගේ පරුෂ්බස් ඉදිරියෙහි අසමින් බියෙන් ඉවසහි ද? නොහොත් දුබල බැවින් ඉවසහි ද?

[සක්දෙවිඳු:]

මම වේපචිත්තිහුගේ (පරුෂ්බස්) බියෙන් නො ඉවසමි. දුබලබැවින් ද නො ඉවසමි. මා වැනි නුවණැත්තෙක් (එබඳු) බාලයකු හා කෙසේ නම් ප්‍රතිවිරුද්ධව සටන් කරන්නේ ද?

වළකන්නෙක් ඉදින් නො වන්නේ නම් අඥනයෝ බොහෝ සෙයින් බිඳෙන්නාහු ය. එහෙයින් නුවණැත්තේ දැඩි වූ දණ්ඩනයෙන් අඥනයා වළකන්නේ ය.

සතුරා ඉතා කිපියහු දැන යමෙක් සිහි ඇත්තේ සංසිඳේ ද, මම මේ සංසිඳීම ම අඥනයා වැළැක්වීම ය යි හඟිමි.

[මාතලි:]

මේ තෙමේ මට බියෙන් ඉවසා යයි අඥන තෙමේ යම් කලෙක ඒ ඉවසීම හඟී ද, සක්දෙවිඳුනි, ඉවසීම පිළිබඳ මේ දෝෂය ම දකිමි. පලා යන ගොණකු (යට කර ගෙණ යන) ගවමුළක් මෙන් නුවණ මඳ තැනැත්තේ බොහෝ සෙයින් (ඉවසන්නහු) යට කර ගෙණ යයි.

[සක්දෙවිඳු:]

මේ තෙමේ මට බියෙන් ඉවසා යයි ඒකාන්තයෙන් හඟීවා හෝ, නො හඟීවා හෝ, සත්‍යාර්ථයෝ ස්වාර්ථය පරම කොට ඇත්තාහ. ඉවසීමට වඩා උතුම් අත්‍යාර්ථයෙක් නැත.

යමෙක් ඒකාන්තයෙන් බලවත් වූයේ ම දුබලයාට ඉවසා ද එය උතුම් ඉවසීම යයි කියත්. දුබල තෙමේ නිතර ඉවසයි.

අඥනබලය යමකුගේ බලය වේ ද, බලයක් නො වූ ම එය බල යයි කියත්. ධර්මයෙන් සංවෘත වූ (ක්ෂාන්ති) බලයට ප්‍රතිවක්තෘ වූවෙක් හෙවත් එය අබිබවා කියන්නෙක් නැත.

යමෙක් කිපියකුට පෙරළා කිපේ ද, එයින් ඔහුට ම නො යහපත වේ. කිපියහුට පෙරළා නො කිපෙන්නේ නො දිනිය හැකි වූ සටන දිනයි.

මෙරමා කිපියහු දැන යමෙක් සිහි ඇත්තේ සංසිඳේ ද, (හෙ තෙමේ) තමහට ද මෙරමාහට ද (යන) දෙපසට ම වැඩ සාදයි.

උභින්නං තිකිච්ඡන්තානං[1] අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදාති.

සො හි නාම භික්ඛවෙ සක්කො දෙවානමින්දො සකං පුඤ්ඤඵලං උපජීවමානො දෙවානං තාවතිංසානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙන්තො ඛන්තිසොරච්චස්ස වණ්ණවාදී භවිස්සති "ඉධ ඛො තං භික්ඛවෙ සොභෙථ, යං තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා ඛමා ච භවෙය්‍යාථ සොරතා චා"ති.

11. 1. 5.

සුභාසිතජයසුත්තං.

251. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. -පෙ- භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්‍යූළ්හො අහොසි. අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං එතදවොච: හොතු දෙවානමින්ද, සුභාසිතෙන ජයොති. හොතු වෙපචිත්ති, සුභාසිතෙන ජයොති.

අථ ඛො භික්ඛවෙ දෙවා ච අසුරා ච පාරිසජ්ජෙ ඨපෙසුං: ඉමෙ නො සුභාසිතං දුබ්භාසිතං[2] ආජානිස්සන්තීති.

අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං එතදවොච: භණ දෙවානමින්ද, ගාථන්ති.

එවං වුත්තෙ භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙපචිත්තිං අසුරින්දං එතදවොච: තුම්හෙ ඛ්වෙත්ථ[3] වෙපචිත්ති, පුබ්බදෙවා. භණ වෙපචිත්ති, ගාථන්ති. එවං වුත්තෙ භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො ඉමං ගාථං අභාසි:

භිය්‍යො බාලා පභිජ්ජෙය්‍යුං නො චස්ස පටිසෙධකො,
තස්මා භුසෙන දණ්ඩෙන ධීරො බාලං නිසෙධයෙති.

භාසිතාය ඛො පන භික්ඛවෙ වෙපචිත්තිනා අසුරින්දෙන ගාථාය අසුරා අනුමොදිංසු. දෙවා තුණ්හී අහෙසුං.

අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං එතදවොච: භණ දෙවානමින්ද, ගාථන්ති. එවං වුත්තෙ භික්ඛවෙ සක්කො දෙවානමින්දො ඉමං ගාථං අභාසි:

එතදෙව අහං මඤ්ඤෙ බාලස්ස පටිසෙධනං,
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මතීති.

භාසිතාය ඛො පන භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථාය දෙවා අනුමොදිංසු. අසුරා තුණ්හී අහෙසුං.

1. තිකිච්ඡන්ත. තං - PTS 2. සුභාසිතදුබ්භාසිතං - මජසං. 3. ඛ්වෙත්ථ PTS.

යම් කෙනෙක් ධර්මයෙහි අදක්ෂ වෙද් ද, ඒ ජනයෝ තමහට ද මෙරමාහට ද (යන) දෙපසට ම වැඩ සඳන්නහු අඥාන යයි හඟිත්.

මහණෙනි, ඒ සක්දෙව්රජ තෙමේ වනාහි සිය පින්පල නිසා ජීවත් වන්නේ තව්තිසාවැසි දෙවියන් පිළිබඳ ඉසුරු හා අධිපතිබව ඇති රජය කරන්නේ ඉවසීමේ හා සුරත බැව්හි ගුණ කියන සුල්ලෙක් වෙයි. මහණෙනි, තෙපි මෙසේ ස්වාක්ඛාත වූ ශාසනයෙහි පැවිදි වූවහු ම යම් ක්ෂාන්තියෙකින් ඉවසන්නහු මෘදුබැව් ඇත්තහු වන්නහු නම් මේ ශාසනයෙහි ලා ඒ ගුණය හොබනේ ය.

11. 1. 5.

සුභාසිතජය සූත්‍රය.

251. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. ... භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, පෙර වූවක් කියමි. දෙවාසුරසංග්‍රාමයෙක් එළඹ සිටියේ වි ය. මහණෙනි, එකල්හි වෙපචිත්ති අසුරිඳු සක්දෙවිඳුහට "දෙවිඳුනි, සුභාෂිතයෙන් ජය වේවා" යි මෙය කී ය. "වෙපචිත්ති, සුභාෂිතයෙන් ජය-වේවා" යි (සක්දෙව්රජ කී ය).

මහණෙනි, ඉක්බිති දෙවියෝ ද, අසුරයෝ ද මොහු අපගේ සුබැසි දුබැසි දැන ගන්නාහු යයි පාරිෂද්‍යයන් (විනිසකරුවන්) තැබූ හ.

මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරිඳු සක්දෙවිඳුහට "දෙවිඳුනි, ගාථාවක් කියව"යි මෙය කී ය.

මහණෙනි, මෙසේ කී කල්හි සක්දෙවිඳු වෙපචිත්ති අසුරිඳුහට වෙපචිත්ති, මෙහිලා තෙපි පළමුදෙව් වව. (එහෙයින්) වෙපචිත්ති, ගාථාවක් කියව යි මෙය කී ය. මහණෙනි, මෙසේ කී කල්හි වෙපචිත්ති අසුරිඳු මේ ගාථාව කී ය:

වළකන්නෙක් ඉදින් නොවන්නේ නම් අඥානයෝ බොහෝ සෙයින් බිදෙන්නාහු ය. (වැනසෙන්නාහු ය). එහෙයින් නුවණැත්තේ දැඩි වූ දණ්ඩනයෙන් අඥානයා වළකන්නේ ය.

මහණෙනි, වෙපචිත්ති අසුරිඳු විසින් ගාථාව කියන ලද කල්හි අසුරයෝ සතුටු වූහ. දෙවියෝ නිහඬ වූහ.

මහණෙනි, ඉක්බිති වෙපචිත්ති අසුරිඳු සක්දෙවිඳුහට දෙවිඳුනි, ගාථාවක් කියව යි මෙය කී ය. මහණෙනි, මෙසේ කී කල්හි සක්දෙවිඳු තෙමේ මේ ගය කී ය:

සතුරා ඉතා කිපියහු දැන යමෙක් සිහි ඇත්තේ සංසිදේ ද, මම මේ සංසිදීම ම අඥානයා වැළැක්ම යයි හඟිමි.

මහණෙනි, සක්දෙවිඳු විසින් ගාථාව කියන ලද කල්හි දෙවියෝ සතුටු වූහ. අසුරයෝ නිහඬ වූහ.

අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙපචිත්තිං අසුරින්දං එතද-වොච: භණ වෙපචිත්ති ගාථන්ති. එවං වුත්තෙ භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො ඉමං ගාථං අභාසි:

එතදෙව තිතික්ඛාය වජ්ජං පස්සාමි වාසව,
යදා තං මඤ්ඤති බාලො භයා ම්‍යායං තිතික්ඛති,
අජ්ඣාරුහති දුම්මෙධො ගො'ව භීය්‍යො පලායිනන්ති.

භාසිතාය ඛො පන භික්ඛවෙ වෙපචිත්තිනා අසුරින්දෙන ගාථාය අසුරා අනුමොදිංසු. දෙවා තුණ්හී අහෙසුං.

අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං එතදවොච: භණ දෙවානමින්ද ගාථන්ති.

එවං වුත්තෙ භික්ඛවෙ සක්කො දෙවානමින්දො ඉමා ගාථායො අභාසි:

කාමං මඤ්ඤතු වා මා වා භයා ම්‍යායං තිතික්ඛති,
සදත්ථපරමා අත්ථා ඛන්ත්‍යා භිය්‍යො න විජ්ජති.

යො හවෙ බලවා සන්තො දුබ්බලස්ස තිතික්ඛති,
තමාහු පරමං ඛන්තිං නිච්චං ඛමති දුබ්බලො.

අබලන්තං බලං ආහු යස්ස බාලබලං බලං,
බලස්ස ධම්මගුත්තස්ස පටිවත්තා න විජ්ජති.

තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සඞ්කුපිතං ඤත්වා යො සතො උපසම්මති.

උභින්නං තිකිච්ඡන්තානං අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදාති.

භාසිතාසු ඛො පන භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථාසු දෙවා අනුමොදිංසු. අසුරා තුණ්හී අහෙසුං.

අථ ඛො භික්ඛවෙ දෙවානඤ්ච අසුරානඤ්ච පාරිසජ්ජා එතදවොචුං: භාසිතා ඛො වෙපචිත්තිනා අසුරින්දෙන ගාථායො. තා ච ඛො සදණ්ඩාවචරා සසත්ථාවචරා[1] ඉති භණ්ඩනං ඉති විග්ගහො ඉති කලහො. භාසිතා ඛො පන[2] සක්කෙන දෙවානමින්දෙන ගාථායො. තා ච ඛො අදණ්ඩාවචරා අසත්ථාවචරා ඉති අභණ්ඩනං ඉති අවිග්ගහො ඉති අකලහො. සක්කස්ස දෙවානමින්දස්ස සුභාසිතෙන ජයොති.

ඉති ඛො භික්ඛවෙ සක්කස්ස දෙවානමින්දස්ස සුභාසිතෙන ජයො අහොසීති.

1. සත්ථාවචරා. PTS. 2. 'පන' ඉති න දිස්සතෙ. මජ්සං., සතා, PTS.

මහණෙනි, ඉක්බිති සක්දෙවිඳු වෙපචිත්ති අසුරිඳුහට වෙපචිත්ති, ගාථාවක් කියවයි මෙය කී ය. මහණෙනි, මෙසේ කී කල්හි වෙපචිත්ති අසුරිඳු මේ ගය කී ය:

මේ තෙමේ මට බියෙන් ඉවසා යයි අඥාන තෙමේ යම් කලෙක ඒ ඉවසීම හඟී ද. සක්දෙවිඳුනි, ඉවසීම පිළිබඳ මේ දෝෂය ම දකිමි. පලා යන ගොණකු (යට කර ගෙණ යන) ගව මුළක් මෙන් නුවණ මඳ තැනැත්තේ බොහෝ සෙයින් (ඉවසන්නහු) යට කර ගෙණ යයි.

මහණෙනි, වෙපචිත්ති අසුරිඳු විසින් ගාථාව කියන ලද කල්හි අසුරයෝ සතුටු වූහ. දෙවියෝ නිහඬ වූහ.

මහණෙනි, ඉක්බිති වෙපචිත්ති අසුරිඳු සක්දෙවිඳුහට දෙවිඳුනි, ගාථාවක් කියව යි මෙය කී ය.

මහණෙනි, මෙසේ කී කල්හි සක්දෙවිඳු මේ ගාථා කී ය:

මේ තෙමේ ඒකාන්තයෙන් මට බියෙන් ඉවසා යයි හඟීවා හෝ, නොහඟීවා හෝ, සත්ත්වයෝ ස්වාර්ථය පරම කොට ඇත්තාහ. ඉවසීමට වඩා උතුම් අන් අරුතෙක් නැත.

යමෙක් ඒකාන්තයෙන් බලවත් වූයේ ම දුබලයාට ඉවසා ද, එය උතුම් ඉවසීම යයි කියත්. දුබල තෙමේ නිතර ඉවසයි.

අඥානබලය යමකුගේ බලය වේ ද, බලයක් නොවූ ම එය බලය යි කියත්. ධර්මයෙන් සංවෘත වූ (ක්ෂාන්ති) බලයට ප්‍රතිවක්තෘ වූවෙක් හෙවත් එය අබිබවා කියන්නෙක් නැත.

යමෙක් කිපියකුට පෙරළා කිපේ ද එයින් ඔහුට ම නොයහපත වේ. කිපියහුට පෙරළා නොකිපෙන්නේ නොදිනිය හැකි වූ සටන දිනයි.

මෙරමා කිපියහු දැන යමෙක් සිහි ඇත්තේ සංසිඳේ ද, (හෙ තෙමේ) තමහට ද මෙරමාහට ද යන දෙපසට ම වැඩ සාදයි.

යම් කෙනෙක් ධර්මයෙහි අදක්ෂ වෙද් ද, ඒ ජනයෝ තමහට ද මෙරමාහට ද යන දෙපසට ම වැඩ සදන්නහු අඥාන යයි හඟිත්.

මහණෙනි, සක්දෙවිඳු විසින් ගාථා කියන ලද කල්හි දෙවියෝ සතුටු වූහ. අසුරයෝ නිහඬ වූහ.

මහණෙනි, ඉක්බිති දෙවියන්ගේත් අසුරයන්ගේත් පාරිෂදයෝ (විනිසකරුවෝ) මෙය කීහ. වෙපචිත්ති අසුරිඳු විසින් ගාථාවෝ කියන ලදහ. ඒ ගාථාවෝ වනාහි සදණ්ඩයන් ඇසිරි ඇතියහ. සශස්ත්‍රයන් ඇසිරි ඇතියහ. භණ්ඩන මෙසේය, විග්‍රහ මෙසේය, කලහ මෙසේය කියායි. සක්දෙවිඳු විසින් ද ගාථාවෝ කියන ලදහ. ඒ ගාථාවෝ වනාහි දඬුමුගුරු සහිත පැවතුම් ඇත්තවුන් පිළිබඳ නොවෙත්. අවි සහිත පැවතුම් ඇත්තවුන් පිළිබඳ නො වෙත්. අභණ්ඩන මෙසේය, අවිග්‍රහ මෙසේය, අකලහ මෙසේය කියායි. (එහෙයින්) සක්දෙවිඳුහට සුභාෂිතයෙන් ජය වෙයි.

මහණෙනි, මෙසේ සක්දෙවිඳුහට සුභාෂිතයෙන් ජය වීය.

11. 1. 6.

කුලාවකසුත්තං.

252 **සාවත්ථියං-**

භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්‍යූළ්හො අහොසි. තස්මිං ඛො පන භික්ඛවෙ සඞ්ගාමෙ **අසුරා** ජිනිංසු. **දෙවා** පරාජිංසු.

පරාජිතා ච[1] ඛො භික්ඛවෙ දෙවා අපායංසෙව උත්තරෙන මුඛා, අභියංසෙව තෙ අසුරා. අථ ඛො භික්ඛවෙ **සක්කො** දෙවානමින්දො **මාතලිං**සඞ්ගාහකං ගාථාය අජ්ඣභාසි:

කුලාවකා මාතලි සිම්බලිස්මිං ඊසාමුඛෙන පරිවජ්ජයස්සු,
කාමං චජාම අසුරෙසු පාණං මාසිමෙ දිජා විකුලාවකා[2] අහෙසුන්ති.

එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං පච්චුදාවත්තෙසි.

අථ ඛො භික්ඛවෙ අසුරානං එතදහොසි: පච්චුදාවත්තො ඛො දානි සක්කස්ස දෙවානමින්දස්ස සහස්සයුත්තො ආජඤ්ඤරථො. දුතියම්පි ඛො දෙවා අසුරෙහි සඞ්ගාමෙස්සන්තීති භීතා අසුරපුරමෙව පාවිසිංසු.

ඉති ඛො භික්ඛවෙ සක්කස්ස දෙවානමින්දස්ස ධම්මෙනෙව ජයො අහොසි.

11. 1. 7.

නදුබ්භියසුත්තං.

253 **සාවත්ථියං—**

භූතපුබ්බං භික්ඛවෙ **සක්කස්ස** දෙවානමින්දස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: යොපි මෙ අස්ස පච්චත්ථිකො[3] තස්ස පාහං න දුබ්භෙය්‍යන්ති.

අථ ඛො භික්ඛවෙ **වෙපචිත්ති** අසුරින්දො සක්කස්ස දෙවානමින්දස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය යෙන සක්කො දෙවානමින්දො තෙනුපසඞ්කමි.

අද්දසා ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙපචිත්තිං අසුරින්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන වෙපචිත්තිං අසුරින්දං එතදවොච: තිට්ඨ වෙපචිත්ති ගහිතොසීති.

යදෙව තෙ මාරිස පුබ්බෙ චිත්තං තදෙව ත්වං මාරිස පහාසීති[4]. සපස්සු ච මෙ වෙපචිත්ති අදුබ්භායාති.

1. 'ච' ඉති නත්ථි - PTS 2. විකුලා වා - සයා. 3. සුපච්චත්ථිකො - මජසං. 4. තදෙව ත්වං මා පජහාසීති - මජසං, ත්වං මාරිස ජහාසීති - සයා. තදෙව ත්වං මා පහාසීති - PTS.

11. 1. 6.

කුලාවක සූත්‍රය.

252 සැවැත්නුවර—

මහණෙනි, පෙර වූවක් කියමි. දෙවාසුරසංග්‍රාමයෙක් එළඹ සිටියේ විය. මහණෙනි, ඒ සංග්‍රාමයෙහිදී අසුරයෝ දිනූහ. දෙවියෝ පැරදුනහ.

මහණෙනි, දෙවියෝ පැරදුනාහු උතුරුදිග බලා පලා ගියාහු ම ය. අසු-රයෝ ඔවුන් ලුහු බැඳ ගියාහු ම ය. මහණෙනි, එකල්හි **සක්දෙවිඳු මාතලි** රියදුරුහට ගාථායෙන් කීය:

මාතලි, සිඹුල්වෙනෙහි (ගුරුළු) කැදලි වේ. (ඔවුන්) රියහිසින් දුරු කරව. ඒකාන්තයෙන් අසුරයන් කෙරෙහි ප්‍රාණය හරිමු. මේ පක්ෂීහු (ගුරුළු පොව්වෝ) තහමක් තට කැදලි ඇති වෙත්වා යි.

මහණෙනි “එසේය, මුඹට සෙතෙක් වේවා”යි මාතලි රියැදුරු සක්දෙවිඳු-හට පිළිතුරු දී සහස්‍රයුක්ත ආජන්‍යරථය වටාලා පැදවී.

මහණෙනි, එකල්හි අසුරයන්ට මේ සිත විය. දැන් සක්දෙවිඳුගේ සහස්‍ර-යුක්ත ආජන්‍යරථය වටා වැටිත. (එහෙයින්) දෙවනවට ද දෙවියෝ අසුරයන් හා යුද කරන්නාහ යි බියට පැමිණියාහු අසුරපුරට ම පිවිසියහ. මහණෙනි, මෙසේ සක්දෙවිඳුහට දැහැමින් ම ජය වී ය.

11. 1. 7.

නදුබ්භිය සූත්‍රය.

253 සැවැත්නුවර—

මහණෙනි, පෙර වූවක් කියමි. එකලා වූ විවේකයෙන් යුත් සක්දෙවිඳුහට “මාගේ යම් පසමිතුරෙක් වන්නේ නම් ඔහුට ද මම ද්‍රෝහ නො කරන්නෙමි”යි මෙබඳු චිත්තපරිවිතර්කයෙක් පහළ විය.

මහණෙනි, එකල්හි **වේපචිත්ති** අසුරිඳු තමසිතින් සක්දෙවිඳුගේ චිත්තපරිවිතර්කය දැන සක්දෙවිඳු වෙත එළඹියේ ය.

මහණෙනි, සක්දෙවිඳු එන්නා වූ වෙපචිත්ති අසුරිඳු දුරදී ම දැක්කෝ ය. දැක වේපචිත්ති අසුරිඳුහට “වෙපචිත්ති සිටුව (තෝ) ගන්නා ලද්දෙහිය”යි මෙය කී ය.

නිදුකාතෙනි, පෙර මුඹට යම් සිතෙක් වී ද, නිදුකාතෙනි, මුඹ ඒ සිත ම පහ කළහු ද? වෙපචිත්ති, මට ද්‍රෝහ නොකරණ. බවට දිවුරව.

යං මුසාභණතො පාපං යං පාපං[1] අරියූපවාදිනො,
මිත්තද්දුනො ච යං පාපං යං පාපං අකතඤ්ඤුනො,
තමෙව පාපං ඵුසති[2] යො තෙ දුබ්භෙ සුජම්පතීති.

11. 1. 8.

වෙරොචනඅසුරින්දසුත්තං

254 **සාවත්ථියං**—

තෙන ඛො පන සමයෙන භගවා දිවාවිහාරගතො හොති පටිසල්ලීනො. අථ ඛො **සක්කො** ච දෙවානමින්දො **වෙරොචනො** ච අසුරින්දො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා පච්චෙකං ද්වාරබාහං අට්ඨංසු. අථ ඛො වෙරොචනො අසුරින්දො භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

වායමෙථෙව පුරිසො යාව අත්ථස්ස නිප්පදා,
නිප්ඵන්නසොභිනො අත්ථා[3] වෙරොචනවචො ඉදන්ති.

[සක්කො:]

වායමෙථෙව පුරිසො යාව අත්ථස්ස නිප්පදා,
නිප්ඵන්නසොභිනො අත්ථා[3] ඛන්ත්‍යා භිය්‍යො න විජ්ජතීති.

[වෙරොචනො:]

සබ්බෙ සත්තා අත්ථජාතා තත්ථ තත්ථ යථාරහං,
සංයොගපරමාත්වෙව සම්භොගා සබ්බපාණිනං,
නිප්ඵන්නසොභිනො අත්ථා[3] වෙරොචනවචො ඉදන්ති.

[සක්කො:]

සබ්බෙ සත්තා අත්ථජාතා තත්ථ තත්ථ යථාරහං,
සංයොගපරමාත්වෙව සම්භොගා සබ්බපාණිනං,
නිප්ඵන්නසොභිනො අත්ථා ඛන්ත්‍යා භිය්‍යො න විජ්ජතීති.

11. 1. 9.

අරඤ්ඤායතනඉසිසුත්තං.

255. **සාවත්ථියං**—

භූතපුබ්බං භික්ඛවෙ සම්බහුලා ඉසයො සීලවන්තො කල්‍යාණධම්මා අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු සම්මන්ති. අථ ඛො භික්ඛවෙ සක්කො ච දෙවානමින්දො **වෙපචිත්ති** ච අසුරින්දො යෙන තෙ ඉසයො සීලවන්තො කල්‍යාණ ධම්මා තෙනුපසඞ්කමිංසු.

අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො අටලියො[4] උපාහනා ආරොහිත්වා ඛග්ගං ඔලග්ගෙත්වා ඡත්තෙන ධාරියමානෙන අග්ගද්වාරෙන අස්සමං පවිසිත්වා තෙ ඉසයො සීලවන්තෙ කල්‍යාණධම්මෙ අපබ්‍යාමතො කරිත්වා අතික්කාමි.

---

1. 'පාපං' ඉති නත්ථි - ස්‍යා 2. ඵුසතු - මජසං. - ස්‍යා. 3. නිප්ඵන්නසොභනො අත්ථො - මජසං - PTS 4. පටලියො - මජසං.

බොරු කියන්නාහට යම් පවෙක් වේ ද, ආයෙඕපවාද කරන්නහුට යම් පවෙක් වේ ද, මිත්‍රද්‍රෝහියාට යම් පවෙක් වේ ද, අකෘතඥයාට යම් පවෙක් වේ ද, සක්දෙවිඳුනි, යමෙක් මුබට ද්‍රෝහ කෙරේ නම් එබඳු පවක් ම (හෙ තෙමේ) ස්පර්ශ කෙරෙයි (ලබයි).

11. 1. 8.

වෙරෝචන අසුරින්ද සූත්‍රය.

254 **සැවැත්නුවර—**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ දිවාවිහරණයට වැඩ සේක් පිළිසලන ඇතිසේක. ඉක්බිති **සක්**දෙවිඳු ද **වේරෝචන** අසුරිඳු ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ. එළඹ වෙන වෙන දොරබා ඇසුරු කොට සිටියහ. එකල්හි වෙරෝචන අසුරිඳු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

අර්ථනිෂ්පත්තිය තෙක් පුරුෂ තෙමේ වෑයම් කරන්නේ ම ය. අර්ථයෝ නිෂ්පත්තිය නිසා හොබනසුලු වෙත්. මේ වෙරෝචන අසුරිඳුගේ බස යි.

[සක්දෙවිඳු:]

අර්ථනිෂ්පත්තිය තෙක් පුරුෂ තෙමේ වෑයම් කරන්නේ ම ය. අර්ථයෝ නිෂ්පත්තිය නිසා හොබනසුලු වෙත්. ඉවසීමට වඩා වැඩිසිටි අරුතෙක් නැත. (මේ සක්දෙවිඳුගේ බසයි.)

[වෙරෝචන:]

සියලු සත්ත්වයෝ ඒ ඒ තන්හි සුදුසු පරිද්දෙන් හටගත් කටයුතු ඇත්තෝ ය. සියලු සතුන්ගේ සම්භෝගයෝ සංයෝගය පරම කොට ඇත්තෝ ම ය. අර්ථයෝ නිෂ්පත්තිය නිසා බබලනසුලු වෙත්. මේ වෙරෝචන අසුරිඳුගේ බස යි.

[සක්දෙවිඳු:]

සියලු සත්ත්වයෝ ඒ ඒ තන්හි සුදුසු පරිද්දෙන් හටගත් කටයුතු ඇත්තෝ ය. සියලු සතුන්ගේ සම්භෝගයෝ සංයෝගය පරම කොට ඇත්තාහු ම ය. අර්ථයෝ නිෂ්පත්තිය නිසා හොබනාහු වෙත්. ඉවසීමට වඩා වැඩිසිටි අරුතෙක් නැත. (මේ සක්දෙවිඳුගේ බසයි).

11. 1. 9.

අරඤ්ඤායතනඉසි සූත්‍රය.

255. **සැවැත්නුවර—**

මහණෙනි, පෙර වූවක් කියමි. සිල්වත් කලණදහම් ඇති බොහෝ රුසිහු වනසෙනසුනෙක පන්සල්හි වෙසෙත්. මහණෙනි, එකල්හි **සක්**දෙවිඳු ද **වෙපචිත්ති** අසුරිඳු ද සිල්වත් කලණදහම් ඇති ඒ ඍෂීන් වෙත එළඹිය හ.

මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරිඳු කීප පටක් ඇති වහන් නැගී කඩුව එල්ලා ගෙණ දරණු ලබන ඡත්‍රයෙන් යුක්ත ව ප්‍රධාන දොරටුවෙන් අසපුවට පිවිස සිල්වත් කලණදහම් ඇති ඒ ඍෂීන්ට නිගරු කොට නික්ම ගියේ ය.

අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො අටලියො උපාහනා ඔරෝහිත්වා ඛග්ගං අඤ්ඤස්ස දත්වා ඡත්තං අපනාමෙත්වා ද්වාරෙනෙව අස්සමං පවිසිත්වා තෙ ඉසයො සීලවන්තෙ කල්‍යාණධම්මෙ අනුවාතං පඤ්ජලිකො නමස්සමානො අට්ඨාසි. අථ ඛො භික්ඛවෙ තෙ ඉසයො සීලවන්තො කල්‍යාණධම්මා සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසිංසු:

ගන්ධො ඉසීනං චිරදික්ඛිතානං[1] කායා චුතො ගච්ඡති මාලුතෙන,
ඉතො පටික්කම[2] සහස්සනෙත්ත ගන්ධො ඉසීනං අසුචි දෙවරාජාති.

ගන්ධො ඉසීනං චිරදික්ඛිතානං[1] කායා චුතො ගච්ඡතු[3] මාලුතෙන,
සුචිත්‍රපුප්ඵං සිරස්මිං ව මාලං ගන්ධං එතං පටිකඞ්ඛාම භන්තෙ,
න හෙත්ථ දෙවා පටික්කූලසඤ්ඤිනොති.

11. 1. 10.

ඉසයොසමුද්දකසුත්තං.

256. සාවත්ථියං—

භූතපුබ්බං භික්ඛවෙ සම්බහුලා ඉසයො සීලවන්තො කල්‍යාණධම්මා සමුද්දතීරෙ පණ්ණකුටීසු සම්මන්ති.

තෙන ඛො පන සමයෙන භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්බූළ්හො අහොසි. අථ ඛො භික්ඛවෙ තෙසං ඉසීනං සීලවන්තානං කල්‍යාණධම්මානං එතදහොසි. ධම්මිකා ඛො දෙවා, අධම්මිකා අසුරා. සියා පි නො අසුරතො භයං. යන්නූන මයං සම්බරං අසුරින්දං උපසඞ්කමිත්වා අභයදක්ඛිණං යාචෙය්‍යාමාති.

අථ ඛො භික්ඛවෙ තෙ ඉසයො සීලවන්තො කල්‍යාණධම්මා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව සමුද්දතීරෙ පණ්ණකුටීසු අන්තරහිතා සම්බරස්ස අසුරින්දස්ස පමුඛෙ[4] පාතුරහෙසුං. අථ ඛො භික්ඛවෙ තෙ ඉසයො සීලවන්තො කල්‍යාණධම්මා සම්බරං අසුරින්දං ගාථාය අජ්ඣභාසිංසු:

ඉසයො සම්බරං පත්තා යාචන්ති අභයදක්ඛිණං,
කාමං කරොහි[5] තෙ දාතුං භයස්ස අභයස්ස වාති.

ඉසීනං අභයං නත්ථි දුට්ඨානං සක්කසෙවිනං,
අභයං යාචමානානං භයමෙව දදම් වොති.

අභයං යාචමානානං භයමෙව දදාසි නො,
පටිගණ්හාම තෙ එතං අක්ඛයං[6] හොතු තෙ භයං.

යාදිසං වපතෙ බීජං තාදිසං හරතෙ ඵලං,
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං,
පවුත්තං තාත තෙ බීජං ඵලං පච්චනුභොස්සසීති.

1. චිරදික්ඛිතානං - සyා. 2. පටික්කමම - මජසං. සyා. PTS. 3. ගච්ඡති - සීමු සyා
4. සමමුඛෙ - මජසං. 5. කාමං කරොහි - සීමු. කරොසි - සyා. 6. අභයං - සyා.

මහණෙනි, ඉක්බිති සක්දෙව්රජ කීප පටක් ඇති වහනින් බැස කඩුව අන් කෙනකුන්ට දී ඡත්‍රය බහා තබා දෙරින් ම අසපුවට පිවිස සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂීන් නමදිමින් යටිසුළඟෙහි බඳැදිලි ව සිටියේ ය. මහණෙනි, එකල්හි සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂිහු සක්දෙවිඳුහට ගාථායෙන් කීහ.

බොහෝ කලක් මුළුල්ලෙහි සමාදන් වූ ව්‍රත ඇති සෘෂීන්ගේ කයින් වූ (සිරුරු) ගඳ සුළඟින් හමයි. ශක්‍රය, මෙයින් ඉවත් වව. දෙව්රජ, සෘෂීන්ගේ (සිරුරු) ගඳ අපවිත්‍ර ය.

බොහෝ කලක් මුළුල්ලෙහි සමාදන් වූ ව්‍රත ඇති සෘෂීන්ගේ කයින් වූ (සිරුරු) ගඳ සුළඟින් හමාවා. වහන්ස, මේ ගඳ හිසෙහි (පළඳනා ලද) විසිතුරු කුසුම් ඇති මල්දමක් මෙන් කැමැත්තමු. දෙවියෝ මෙහි පිළිකුල් ය යන හැඟීම් ඇත්තෝ නො ම වෙත්.

11. 1. 10.

සමුද්දක සූත්‍රය.

256. සැවැත්නුවර—

මහණෙනි, පෙර වූවක් කියමි. සිල්වත් කලණදහම් ඇති බොහෝ සෘෂිහු මුහුදුතෙර පන්සල්හි වෙසෙත්.

මහණෙනි, එකල්හි දේවාසුරසංග්‍රාමයෙක් එළඹ සිටියේ විය. මහණෙනි, ඉක්බිති සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂීන්ට "දෙවියෝ දැහැමිය හ. අසුරයෝ නො දැහැමිය හ. අපට අසුරයන්ගෙන් බියෙක් විය හෙයි. අපි සම්බර අසුරිඳු වෙත එළඹ අභයදානය යදින්නමෝ නම් මැනවැ"යි මේ සිත විය.

මහණෙනි, ඉක්බිති සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂිහු යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම මුහුදුතෙර පන්සල්හි අතුරුදන් වූවාහු සම්බර අසුරිඳු ඉදිරියෙහි පහළ වූහ. මහණෙනි, එකල්හි සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂිහු සම්බර අසුරිඳුහට ගාථායෙන් කීහ.

සෘෂිහු සම්බර වෙත පැමිණියාහු අභයදානය යදිත්. භය දෙන්නට හෝ අභය දෙන්නට හෝ (සමත් වූ) මුබට කැමැත්තක් කළ මැනව.

(අපට) විරුද්ධ වූ ශක්‍රයා සෙවුනා වූ සෘෂීන්ට අභයෙක් නැත. අභය ඉල්ලන්නාවූ තොපට බිය ම දෙමි.

අභය ඉල්ලන්නා වූ අපට බිය ම දෙන්නෙහි ය. තොපගේ මේ කීම පිළිගණිමු. තොපට බිය ක්ෂය නො වේවා.

යම් බඳු බිජුවටක් වපුරු ද, එබඳු පල හැර ගණී. යහපත් ක්‍රියා කරණ තැනැත්තේ යහපත් විපාක ලබයි. පාපක්‍රියා කරණ තැනැත්තේ ලාමක-විපාක ලබයි. දරුව, තා විසින් බිජුවටක් වපුරණ ලදී. එහි ඵලය විඳුනෙහි ය.

අථ ඛො භික්ඛවෙ තෙ ඉසයො සීලවන්තො කල්‍යාණධම්මා සම්බරං අසුරින්දං අභිසපිත්වා[1] සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය. එවමෙව සම්බරස්ස අසුරින්දස්ස පමුඛෙ අන්තරහිතා සමුද්දතීරෙ පණ්ණකුටීසු පාතුරහෙසුං.

අථ ඛො භික්ඛවෙ සම්බරො අසුරින්දො තෙහි ඉසීහි සීලවන්තෙහි කල්‍යාණධම්මෙහි අභිසපිතො රත්තියා සුදං තික්ඛත්තුං උබ්බිජ්ජතීති.[2]

සුවීරවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

සුවීරං සුසීමඤ්චෙව ධජග්ගං වෙපචිත්තිනො,
සුභාසිතං ජයඤ්චෙව කුලාවකං න දුබ්භියං,
වෙරොචන අසුරින්දො ඉසයො අරඤ්ඤකඤ්චෙව ඉසයො ච සමුද්දකාති.

---

2. සත්තවතවග්ගො

11. 2. 1.

දෙවා[සත්තවතපද]සුත්තං.[3]

257. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

තත්‍ර ඛො -පෙ- භගවා එතදවොච: **සක්කස්ස** භික්ඛවෙ දෙවානමින්දස්ස පුබ්බෙ මනුස්සභූතස්ස සත්ත වතපදානි[4] සමත්තානි සමාදින්නානි අහෙසුං, යෙසං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගා.

කතමානි සත්ත වතපදානි?: යාවජීවං මාතාපෙත්තිභරො අස්සං. යාවජීවං කුලෙජෙට්ඨාපචායී අස්සං. යාවජීවං සණ්හවාචො අස්සං. යාවජීවං අපිසුණවාචො අස්සං. යාවජීවං විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසෙය්‍යං, මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. යාවජීවං සච්චවාචො අස්සං. යාවජීවං අක්කොධනො අස්සං. සචෙපි මෙ කොධො උප්පජ්ජෙය්‍ය ඛිප්පමෙව නං පටිවිනෙය්‍යන්ති. සක්කස්ස භික්ඛවෙ දෙවානමින්දස්ස පුබ්බෙ මනුස්සභූතස්ස ඉමානි සත්ත වතපදානි සමත්තානි සමාදින්නානි අහෙසුං. යෙසං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගාති.

මාතාපෙත්තිභරං ජන්තුං කුලෙජෙට්ඨාපචායිනං,
සණ්හං සඛිලසම්භාසං පෙසුණෙය්‍යප්පහායිනං,
මච්ඡෙරවිනයෙ යුත්තං සච්චං කොධාභිභුං නරං,
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉතීති.

---

1. අභිසපෙත්වා - සීමු. සයා. PTS. 2. උබ්බිජ්ජීති - මජසං. PTS උබ්බිජි - සී 1, උබ්බිජි - සී 2. 3. වතපදසුත්ත - මජසං. 4 වත්තපදානි - සයා.

මහණෙනි, ඉක්බිති, සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂිහු සම්බර අසුරිඳුහට සාප කොට යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම සම්බර අසුරිඳුගේ හමුවෙහි අතුරුදන් වූවාහු මුහුදුතෙර පන්සල්හි පහළ වූහ.

මහණෙනි, ඉක්බිති සිල්වත් කලණදහම් ඇති ඒ සෘෂීන් විසින් සාප කරණ ලද සම්බර අසුරිඳු තෙමේ රෑ තුන්යලක් තැති ගෙණ තැගී සිටී.

සුවීර වර්‍ගය පළමුවැනි යි.

එහි උද්දානය:

සුවීර, සුසීම, ධජග්ග, වෙපචිත්ති, සුභාසිතජය, කුලාවක, නදුබ්භිය වෙරොචනඅසුරින්ද, ඉසයොඅරඤ්ඤක, ඉසයොසමුද්දක ය යි සූත්‍ර දශයෙකි.

---

2. සත්තවත වර්‍ගය.

11. 2. 1.

දෙවා [සත්තවතපද] සූත්‍රය.

257. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක:

එහිදී ... භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මහණෙනි, පෙර-මිනිස් වූ සක්දෙවිඳු විසින් සත්වතපද කෙනෙක් සමාදානයහ. සමාදන් කරණ ලදහ. ඔවුන් සමාදන් වූ බැවින් ශක්‍ර තෙමේ ශක්‍රබවට පැමිණියේ ය.

කවර සත්වත පද කෙනෙක් ද? යත්: දිවිහිමියෙන් මවුපියන් පුසින්-නෙම් වන්නෙමි. දිවිහිමියෙන් කුලදෙටුවන් පුදන්නෙම් වන්නෙමි. දිවිහිමියෙන් මිහිරිවදන් ඇත්තෙම් වන්නෙමි. දිවිහිමියෙන් පිසුණුවදන් නැත්තෙම් වන්නෙමි. මුදන ලද ත්‍යාග ඇත්තෙම්, දන් දෙනු පිණිස දෙවූ අත් ඇත්තෙම්, දීමෙහි ඇලුනෙම්, අනුන් විසින් ඉල්ලන්නට සුදුසු වූයෙම්, දනයෙහිත් සංවිභාගයෙහිත් ඇලුනෙම්, දිවිහිමියෙන් පහවූ මසුරු මලින් යුත් සිතින් යුක්ත ව ගිහිගෙයි වෙසෙන්නෙමි. දිවිහිමියෙන් සැබෑ තෙපුල් ඇත්තෙම් වන්නෙමි. දිවිහිමියෙන් ක්‍රෝධ නොකරන්නෙම් වන්නෙමි. ඉදිනුදු මට ක්‍රෝධය උපදනේ නම් වහා ම එය දුරු කරන්නෙමි යි. මහණෙනි, පෙර මිනිස් වූ සක්දෙව්රජ විසින් මේ සත් ව්‍රතපදයෝ මොනවට ගන්නා ලදහ. සමාදන් කරණ ලදහ. ඔවුන් සමාදන් කරණ ලද බැවින් ශක්‍ර තෙමේ ශක්‍රබවට පැමිණියේ ය.

මවුපියන් පුස්නා කුලදෙටුවන් පුදන මෘදු ප්‍රිය තෙපුල් බණන කේලමින් වැළකුනු මසුරුමල දුරුකිරීමෙහි යෙදුනු සැබෑ තෙපුල් බණන ක්‍රෝධය මැඩලන සුලු ඒ මනුෂ්‍ය සත්ත්වයා ඒකාන්තයෙන් සත්පුරුෂයෙකැයි තව්තිසාවැසි දෙවියෝ කියත්.

11. 2. 2.

[දුතිය] දෙවා[සත්තවතපද]සුත්තං.[1]

258. [2]එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා භික්ඛූ -පෙ-[3] එතදවොච:

සක්කො භික්ඛවෙ දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො **මඝො** නාම මාණවො අහොසි. තස්මා මඝවාති වුච්චති. සක්කො භික්ඛවෙ දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො පුරෙ පුරෙ[4] දානං අදාසි. තස්මා පුරින්දදොති වුච්චති. සක්කො භික්ඛවෙ දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො සක්කච්චං දානං අදාසි. තස්මා **සක්කොති** වුච්චති. සක්කො භික්ඛවෙ දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො ආවසථං අදාසි. තස්මා **වාසවොති** වුච්චති. සක්කො භික්ඛවෙ දෙවානමින්දො සහස්සම්පි අත්ථානං මුහුත්තෙන චින්තෙති. තස්මා **සහස්සක්ඛොති** වුච්චති. සක්කස්ස භික්ඛවෙ දෙවානමින්දස්ස **සුජා** නාම අසුරකඤ්ඤා පජාපතී. තස්මා **සුජම්පතීති** වුච්චති. සක්කො භික්ඛවෙ දෙවානමින්දො දෙවානං තාවතිංසානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙති.[5] තස්මා **දෙවානමින්දොති** වුච්චති.

සක්කස්ස භික්ඛවෙ දෙවානමින්දස්ස පුබ්බෙ මනුස්සභූතස්ස සත්ත වතපදානි සමත්තානි සමාදින්නානි අහෙසුං. යෙසං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගා.

කතමානි සත්ත වතපදානි: යාවජීවං මාතාපෙත්තිභරො අස්සං. යාවජීවං කුලෙජෙට්ඨාපචායී අස්සං. යාවජීවං සණ්හවාචො අස්සං. යාවජීවං අපිසුණාවාචො අස්සං. යාවජීවං විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසෙය්‍යං, මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. යාවජීවං සච්චවාචො අස්සං. යාවජීවං අක්කොධනො අස්සං. සචෙපි මෙ කොධො උප්පජ්ජෙය්‍ය ඛිප්පමෙව නං පටිවිනෙය්‍යන්ති. සක්කස්ස භික්ඛවෙ දෙවානමින්දස්ස පුබ්බෙ මනුස්සභූතස්ස ඉමානි සත්ත වතපදානි සමත්තානි සමාදින්නානි අහෙසුං, යෙසං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගාති.

මාතාපෙත්තිභරං ජන්තුං කුලෙජෙට්ඨාපචායිනං
සණ්හං සඛිලසම්භාසං පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡෙරවිනයෙ යුත්තං සච්චං කොධාභිභුං නරං
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉතීති.

11. 2. 3.

මහාලි[සත්තවතපද]සුත්තං[6].

259. එවං මෙ සුතං: එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො **මහාලි**[7] ලිච්ඡවි[8] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

---

1. සක්කනාමසුත්තං - මජසං. 2. සාවත්ථියං - මජසං 3. -පෙ-, න දිස්සති. මජසං, PTS. 4. පුරෙති සකිංදෙව වුත්තං - සයා මජසං PTS. 5. කාරෙසි - සීමු. 6. මහාලිසුත්තං - ම.ජ.සං. 7 මහාලී - සයා. 8. ලිච්ඡවී - මජසං. සයා.

11. 2. 2.

[දෙවන] දේවා [සත්තවතපද] සූත්‍රය.

258. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන්ට ... මෙය වදාළ සේක.

මහණෙනි, සක්දෙවිරජ පෙර මිනිස් වූයේ මඝ නම් මාණවකයෙක් වී ය. එහෙයින් "මඝවනතු"යී කියනු ලැබේ. මහණෙනි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ පළමු පළමු දන් දිනි. එහෙයින් "පුරින්දද"යී කියනු ලැබේ. මහණෙනි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ සකස් කොට දන් දිනි එහෙයින් "සක්ක"යී කියනු ලැබේ මහණෙනි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ ආවාස දිනි. එහෙයින් "වාසව"යී කියනු ලැබේ. මහණෙනි, සක්දෙවිඳු අරුත් දහසකුදු මොහොතින් සිතයි. (දකියි) එහෙයින් "සහස්සක්ඛ"යී කියනු ලැබේ. මහණෙනි, සක්දෙවිඳුහට සුජා නම් අසුර කන්‍යාවක් පජාපති (බිරිඳ) ය. එහෙයින් "සුජම්පති" යී කියනු ලැබේ. මහණෙනි, සක්දෙවිඳු තව්තිසා වැසි දෙවියන් පිළිබඳ ඉසුරු බව හා අධිපති බව ඇති රජය කරයි. එහෙයින් "දෙවානමින්ද" යී කියනු ලැබේ.

මහණෙනි, පෙර මිනිස් වූ සක්දෙවිඳු විසින් සත්වතපද කෙනෙක් මොනවට ගන්නා ලදහ. සමාදන් කරණ ලදහ. ඔවුන් සමාදන් කරණලද බැවින් ශක්‍ර තෙමේ ශක්‍රබවට පැමිණියේ ය.

කවර සත්වතපද කෙනෙක් ද යත්: දිවිහිමියෙන් මවුපියන් පුසින්නෙම් වන්නෙමි. දිවිහිමියෙන් කුලදෙටුවන් පුදන්නෙම් වන්නෙමි. දිවිහිමියෙන් මුදුවදන් ඇත්තෙම් වන්නෙමි. දිවිහිමියෙන් පිසුණුබස් නැත්තෙම් වන්නෙමි. මුදන ලද ත්‍යාග ඇත්තෙම්, පවිත්‍ර කරණ ලද අත් ඇත්තෙම්, දන් දීමෙහි ඇලුනෙම්, අනුන් විසින් ඉල්ලන්නට සුදුසු වූයෙම්, දනයෙහි හා සංවිභාගයෙහි ද ඇලුනෙම්, දිවිහිමියෙන් පහ වූ මසුරුමල ඇති සිතින් යුක්ත ව ගිහිගෙයි වෙසෙන්නෙමි. දිවිහිමියෙන් සබවස ඇත්තෙම් වන්නෙමි. දිවිහිමියෙන් ක්‍රෝධ නොකරන්නෙකිම් වන්නෙමි. ඉදිනුදු මට ක්‍රෝධය උපදනේ නම් වහා ම එය දුරු කරන්නෙමි යි. මහණෙනි, පෙර මිනිස් වූ සක්දෙවිඳු විසින් මේ සත්වතපදයෝ මොනවට ගන්නා ලදහ. සමාදන් කරණ ලදහ. ඔවුන් සමාදන් කරණ ලද බැවින් ශක්‍ර තෙමේ ශක්‍රබවට පැමිණියේ යි.

මවුපියන් පුස්නා, කුලදෙටුවන් පුදන, මුදුපියතෙපුල් බණන, පිසුණු-බසින් වැළකුනු, මසුරුමල දුරු කිරීමෙහි යෙදුනු, සබවස් බණන, ක්‍රෝධය මැඩලන සුලු ඒ මනුෂ්‍ය සත්ත්‍වයා ඒකාන්තයෙන් සත්පුරුෂයෙකැයි තව්තිසා වැසි දෙවියෝ කියති.

11. 1. 3.

මහාලි [සත්තවතපද] සූත්‍රය.

259. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීපයෙහි මහවෙනෙහි කූටාගාරශාලාවෙහි වැඩවසන සේක. එකල්හි මහාලි ලිච්ඡවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය.

එකමන්තං නිසින්නො ඛො මහාලි ලිච්ඡවි භගවන්තං එතදවොච: දිට්ඨො, වො[1] භන්තෙ සක්කො දෙවානමින්දොති. දිට්ඨො මෙ මහාලි සක්කො දෙවානමින්දොති.

සො හි නූන භන්තෙ සක්කපතිරූපකො භවිස්සති. දුද්දසො හි භන්තෙ සක්කො දෙවානමින්දොති.

සක්කඤ්චාහං මහාලි පජානාමි, සක්කකරණෙ ච ධම්මෙ. යෙසං ධම්මානං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගා, තඤ්ච පජානාමි.

සක්කො මහාලි දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො මඝො නාම මාණවො අහොසි. තස්මා "මඝවා"ති වුච්චති. සක්කො මහාලි දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො පුරෙ පුරෙ දානං අදාසි. තස්මා පුරින්දදොති වුච්චති. සක්කො මහාලි දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො සක්කච්චං දානං අදාසි. තස්මා සක්කොති වුච්චති. සක්කො මහාලි දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො ආවසථං අදාසි, තස්මා වාසවොති වුච්චති. සක්කො මහාලි දෙවානමින්දො සහස්සම්පි අත්ථානං මුහුත්තෙන චින්තෙති. තස්මා සහස්සක්ඛොති වුච්චති. සක්කස්ස මහාලි දෙවානමින්දස්ස සුජා නාම අසුරකඤ්ඤා පජාපතී. තස්මා සුජම්පතීති වුච්චති. සක්කො මහාලි දෙවානමින්දො දෙවානං තාවතිංසානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙති. තස්මා දෙවානමින්දොති වුච්චති.

සක්කස්ස මහාලි දෙවානමින්දස්ස පුබ්බෙ මනුස්සභූතස්ස සත්ත වතපදානි සමත්තානි සමාදින්නානි අහෙසුං, යෙසං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගා.

කතමානි සත්ත වතපදානි: යාවජීවං මාතාපෙත්තිභරො අස්සං. යාවජීවං කුලෙජෙට්ඨාපචායී අස්සං. යාවජීවං සණ්හවාචො අස්සං. යාවජීවං අපිසුණවාචො අස්සං. යාවජීවං විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසෙය්‍යං, මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. යාවජීවං සච්චවාචො අස්සං. යාවජීවං අක්කොධනො අස්සං. සචෙපි මෙ කොධො උප්පජ්ජෙය්‍ය, ඛිප්පමෙව නං පටිවිනෙය්‍යන්ති.

සක්කස්ස මහාලි දෙවානමින්දස්ස පුබ්බෙ මනුස්සභූතස්ස ඉමානි සත්ත වතපදානි සමත්තානි සමාදින්නානි අහෙසුං. යෙසං සමාදින්නත්තා සක්කො සක්කත්තං අජ්ඣගාති.

මාතාපෙත්තිභරං ජන්තුං කුලෙජෙට්ඨාපචායිනං
සණ්හං සඛිලසම්භාසං පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡෙරවිනයෙ යුත්තං සච්චං කොධාභිභුං නරං
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉතීති.

---

1 දිට්ඨො ඛො භන්තෙ භගවතා - ම.ඡ.සං., දිට්ඨො නො - PTS.

එකත්පසෙක හුන් මහාලි ලිච්ඡවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය: වහන්ස, මුබවහන්සේ විසින් සක්දෙවිඳු දක්නා ලද්දේ ද? මහාලි, මා විසින් සක්දෙවිඳු දක්නා ලද්දේ ය.

වහන්ස, හෙ තෙමේ ඒකාන්තයෙන් ශක්‍රප්‍රතිරූපක විය හෙයි. වහන්ස, සක්දෙවිඳු දැකීමට දුෂ්කර ය. එහෙයිනි.

මහාලි, මම ශක්‍රයා ද දනිමි ශක්‍රකාරක ධර්‍ම ද දනිමි. යම් දහම් කෙතකුත් සමාදන් වූ බැවින් ශක්‍රයා ශක්‍රබවට පැමිණියේ නම් එ ද දනිමි

මහාලි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ ම මඝ නම් මාණවකයෙක් විය. එහෙයින් "මඝවත්තු" යි කියනු ලැබේ. මහාලි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ ම පළමු පළමු දන් දිනි. එහෙයින් "පුරින්‍දද"යි කියනු ලැබේ. මහාලි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ ම සකසා දන් දිනි. එහෙයින් "ශක්‍ර" යි කියනු ලැබේ. මහාලි, සක්දෙවිඳු පෙර මිනිස් වූයේ ම ආවාස දිනි. එහෙයින් "වාසව" යි කියනු ලබේ. මහාලි, සක්දෙවිඳු අරුත් දහසකුදු මොහොතින් සිතයි. එහෙයින් "සහස්සක්ඛ" යි කියනු ලැබේ. මහාලි, සක්දෙවිඳුහට සුජා නම් අසුර කන්‍යාව පජාපති බිරිඳ ය. එහෙයින් "සුජම්පති" යි කියනු ලැබේ. මහාලි, සක්දෙවිඳු තව්තිසා වැසි දෙවියන් පිළිබඳ ඉසුරු බව හා අධිපති බව ඇති රජය කරයි. එහෙයින් "දෙවානමින්‍ද" යි කියනු ලැබේ.

මහාලි, පෙර මිනිස් වූ සක්දෙවිඳු විසින් සත්වතපද කෙනෙක් මොනවට ගන්නා ලදහ. සමාදන් කරණ ලදහ. ඔවුන් සමාදන් වූ බැවින් ශක්‍රයා ශක්‍රබවට පැමිණියේ ය.

කවර සත්වතපද කෙනෙක් ද යත්: දිවිහිමියෙන් මවුපියන් පුසින්-තෙම් වන්නෙමි. දිවිහිමියෙන් කුලදෙටුවන් පුදන්නෙම් වන්නෙමි. දිවි-හිමියෙන් මුදුවදන් ඇත්තෙම් වන්නෙමි. දිවිහිමියෙන් පිසුණුවදන් නැත්තෙම් වන්නෙමි. මුදන ලද ත්‍යාග ඇත්තෙම්, පවිත්‍ර කරණ ලද අත් ඇත්තෙම්, දීමෙහි ඇලුනෙම්, අනුන් විසින් ඉල්ලන්නට සුදුසු වූයෙම්, දානයෙ-හිත් සංවිභාගයෙහිත් ඇලුනෙම්, දිවිහිමියෙන් පහවූ මසුරුමල ඇති සිතින් යුක්ත ව ගිහිගෙයි වෙසෙන්නෙමි. දිවිහිමියෙන් සබවස ඇත්තෙම් වන්නෙමි. දිවිහිමියෙන් ක්‍රෝධ නැත්තෙම් වන්නෙමි. ඉදිනුදු මට ක්‍රෝධය උපදනේ නම් වහා ම එය දුරු කරන්නෙමි යි. මහාලි, පෙර මිනිස් වූ සක්දෙවිඳු විසින් මේ සත්වතපදයෝ සමාදානයහ. සමාදන් කරණ ලදහ. ඔවුන් සමාදන් කරණ ලද වන බැවින් ශක්‍රයා ශක්‍රබවට පැමිණියේ ය.

මවුපියන් පුස්නා, කුලදෙටුවන් පුදන, මුදු පියතෙපුල් බණන, කේලම්න් වැලකුනු, මසුරුමල දුරලීමෙහි යෙදුනු, සබවස් බණන, ක්‍රෝධය මැඩලනසුලු ඒ මිනුෂ්‍ය සත්ත්වයා ඒකාන්තයෙන් සත්පුරුෂයෙකැ යි තව්තිසා වැසි දෙවියෝ කියති යි.

11. 2. 4.

දලිද්දසුත්තං.

260 එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච: භූතපුබ්බං භික්ඛවෙ අඤ්ඤතරො පුරිසො ඉමස්මිං යෙව රාජගහෙ මනුස්සදලිද්දො අහොසි, මනුස්සකපණො මනුස්සවරාකො. සො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං සමාදියි. සීලං සමාදියි. සුතං සමාදියි. චාගං සමාදියි. පඤ්ඤං සමාදියි.

සො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං සමාදියිත්වා සීලං සමාදියිත්වා සුතං සමාදියිත්වා චාගං සමාදියිත්වා පඤ්ඤං සමාදියිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජි දෙවානං තාවතිංසානං සහබ්‍යතං. සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා ච

තත්‍ර සුදං භික්ඛවෙ දෙවා තාවතිංසා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: අච්ඡරියං වත භො අබ්භුතං වත භො අයං හි දෙවපුත්තො පුබ්බෙ මනුස්සභූතො සමානො මනුස්සදලිද්දො අහොසි, මනුස්සකපණො මනුස්සවරාකො. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නො දෙවානං තාවතිංසානං සහබ්‍යතං. සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා චාති.

අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි: මා ඛො තුම්හෙ මාරිසා එතස්ස දෙවපුත්තස්ස උජ්ඣායිත්ථ. එසො ඛො මාරිසා දෙවපුත්තො පුබ්බෙ මනුස්සභූතො සමානො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං සමාදියි. සීලං සමාදියි. සුතං සමාදියි. චාගං සමාදියි. පඤ්ඤං සමාදියි. සො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං සමාදියිත්වා සීලං සමාදියිත්වා සුතං සමාදියිත්වා චාගං සමාදියිත්වා පඤ්ඤං සමාදියිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නො දෙවානං තාවතිංසානං සහබ්‍යතං. සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා චාති.

අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ අනුනයමානො තායං වෙලායං ඉමා ගාථායො අභාසි:

යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා[1]
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං,

1. සුපතිට්ඨිතා - ස්‍යා.

11. 2. 4.

දළිද්ද සූත්‍රය.

260 එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්‍දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: මහණෙනි, පෙර වූවක් කියමි. මේ රජගහනුවර ම මනුෂ්‍යදරිද්‍ර (දිළිඳු මිනිසකු) වූ මනුෂ්‍ය කෘපණ (මනුෂ්‍යයින්ගේ කරුණාවට භාජන) වූ මනුෂ්‍යවරාක (ලාමක මිනිසකු) වූ එක්තරා පුරුෂයෙක් විය. හෙ තෙමේ තථාගතයන් වහන්සේ විසින් වදාළ ශාසනයෙහි ශ්‍රද්ධාව සමාදන් වූයේ ය. ශීලය සමාදන් වූයේ ය. ශ්‍රැතය සමාදන් වූයේ ය. ත්‍යාගය සමාදන් වූයේ ය. ප්‍රඥව සමාදන් වූයේ ය.

හෙ තෙමේ තථාගතයන් වහන්සේ විසින් වදාළ ශාසනයෙහි ශ්‍රද්ධාව සමාදන් ව ශීලය සමාදන් ව ශ්‍රැතය සමාදන් ව ත්‍යාගය සමාදන් ව ප්‍රඥව සමාදන් ව කාබුන් මරණින් මතු තව්තිසා වැසි දෙවියන්ගේ සහභාවයට, මනා ගති ඇති සවර්ගලෝකයට පැමිණියේ ය. හෙ තෙමේ ශරීරවර්ණයෙන් ද යශසින් ද අන් දෙවියන් ඉක්මවා බබලයි.

